323 වන කාණ්ඩය - 15 වන කලාපය
தொகுதி 323 - இல. 15
Volume 323 - No. 15

2025 දෙසැම්බර් 05වන සිකුරාදා
2025 டிசம்பர் 05, வெள்ளிக்கிழமை
Friday, 05th December, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රතිඥාව:**
ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා [තීරුව 2655]
**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2656]
**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 2657]
**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2659-2683]
**2025.09.10 දින ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය:**
ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර [තීරුව 2683]
**කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 2686]
**ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 2687]
**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) - [ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 2688]
**විසර්ජන පනත් කෙටුම්පත, 2026 - [විසිවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 116, 295, 297-302 (වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන); ශීර්ෂ 135, 293, 337 (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්); ශීර්ෂ 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන)] - කාරක සභාවේදී සලකා බලන ලදී
තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 2689-2923]
**සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරුව 2923]
**ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරුව 2926]
**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරුව 2927]
**මහජන ආරක්ෂක ආඥාපනත:**
**යෝජනා සම්මතය** [තීරුව 2929]
**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
යෝජනා සම්මතය [තීරුව 2929]
**කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත:**
නියෝග [තීරුව 2929]
**මුදල් පනත:**
නියෝගය [තීරුව 2930]
**එකතු කළ අගය මත බදු පනත:**
නියෝගය [තීරුව 2930]
**වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත:**
නියෝගය [තීරුව 2931]
**එකතු කළ අගය මත බදු පනත:**
නියෝග [තීරුව 2931]
**සුරාබදු ආඥාපනත:**
රීති [තීරුව 2931]
**ආනයන හා අපනයන (පාලන) පනත:**
රෙගුලාසි [තීරුව 2932]
**විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත:**
නියමය [තීරුව 2933]
**රේගු ආඥාපනත:**
යෝජනා සම්මත [තීරුව 2933]
**පරිපූරක මුදල:**
ශීර්ෂය 243 - වැඩසටහන 01 [තීරුව 2934]
**පරිපූරක මුදල:**
ශීර්ෂය 249 - වැඩසටහන 01 [තීරුව 2934]
**පරිපූරක මුදල:**
ශීර්ෂය 240 - වැඩසටහන 02 [තීරුව 2935]
**ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත:**
නියෝග [තීරුව 2936]
**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය:**
වාර්ෂික වාර්තාව (2023) [තීරුව 2936]
**ශ්‍රී ලංකා කජු සංස්ථාව:**
වාර්ෂික වාර්තාව (2019) [තීරුව 2936]
**ශ්‍රී ලංකා කජු සංස්ථාව:**
වාර්ෂික වාර්තාව (2020) [තීරුව 2937]
**සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම:**
වාර්ෂික වාර්තාව (2022/2023) [තීරුව 2937]


---

# பிரதான உள்ளடக்கம்


**உறுதிப்பிரமாணம்:**
மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர் [ப: 2655]
**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 2656]
**பொது மனுக்கள் பற்றிய குழுவின் அறிக்கை** [ப: 2657]
**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2659-2683]
**2025.09.10ஆம் திகதி மாண்புமிகு அஜித் பீ. பெரேராவால் விடுக்கப்பட்ட வினா:**
மாண்புமிகு பிரதம அமைச்சரினது விடை [ப: 2683]
**கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2686]
**இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2687]
**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை விவசாய நிறுவனம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 2688]
**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட இருபதாம் நாள்]:**
[தலைப்புக்கள் 116, 295, 297-302 (வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி); தலைப்புக்கள் 135, 293, 337 (பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள்); தலைப்புக்கள் 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி)] - குழுவில் ஆராயப்பட்டது
மூன்றாம்முறை மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2689-2923]
**சமூகப் பாதுகாப்பு உதவுதொகை அறிவீடு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2923]
**பந்தய, சூதாட்ட விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 2926]
**செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 2927]

பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:
தீர்மானம் [ப: 2929]
அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:
தீர்மானம் [ப: 2929]
கொழும்பு துறைமுக நகர பொருளாதார ஆணைக்குழுச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2929]
நிதிச் சட்டம்:
ஒழுங்குவிதி [ப: 2930]
சேர் பெறுமதி வரிச் சட்டம்:
ஒழுங்குவிதி [ப: 2930]
துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம்:
கட்டளை [ப: 2931]
சேர் பெறுமதி வரிச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2931]
மதுவரிக் கட்டளைச் சட்டம்:
விதிகள் [ப: 2931]
இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2932]
விசேட வியாபாரப் பண்ட அறிவீட்டுச் சட்டம்:
கட்டளை [ப: 2933]
சுங்கக் கட்டளைச் சட்டம்:
தீர்மானங்கள் [ப: 2933]
குறைநிரப்புத் தொகை:
செலவினத் தலைப்பு 243 - நிகழ்ச்சித்திட்டம் 01 [ப: 2934]
குறைநிரப்புத் தொகை:
செலவினத் தலைப்பு 249 - நிகழ்ச்சித்திட்டம் 01 [ப: 2934]
குறைநிரப்புத் தொகை:
செலவினத் தலைப்பு 240 - நிகழ்ச்சித்திட்டம் 02 [ப: 2935]
தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்:
ஒழுங்குவிதிகள் [ப: 2936]
தேசிய கூட்டுறவு அபிவிருத்தி நிறுவகம்:
ஆண்டறிக்கை (2023) [ப: 2936]
இலங்கை மரமுந்திரிகைக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2019) [ப: 2936]
இலங்கை மரமுந்திரிகைக் கூட்டுத்தாபனம்:
வருடாந்த அறிக்கை (2020) [ப: 2937]
களுபோவிட்டியான தேயிலை தொழிற்சாலை லிமிரெட்:
வருடாந்த அறிக்கை (2022/2023) [ப: 2937]

# PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Naina Thambi Marrikkar Mohamed Thahir [Col. 2655]
PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 2656]
REPORT OF THE COMMITTEE ON PUBLIC PETITIONS [Col. 2657]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 2659-2683]
QUESTION POSED BY HON. AJITH P. PERERA ON 10.09.2025:
Reply by Hon. Prime Minister [Col. 2683]
COLOMBO PORT CITY ECONOMIC COMMISSION (AMENDMENT) BILL:
Read the First time [Col. 2686]
INSTITUTE OF REAL ESTATE PROFESSIONALS, SRI LANKA BILL:
Read the First time [Col. 2687]
PRIVATE MEMBERS' BILLS:
Sri Lanka Institute of Agriculture (Incorporation) - [The Hon. (Prof.) L.M. Abeywickrama] - Read the First time [Col. 2688]
APPROPRIATION BILL, 2026 - [Twentieth Allotted Day]:
Considered in Committee - [Heads 116, 295, 297-302 (Trade, Commerce, Food Security and Co-operative Development); Heads 135, 293, 337 (Plantation and Community Infrastructure); Heads 102, 237-252, 280, 296, 323, 324, 329, 333, 338 (Finance, Planning and Economic Development)]
Read the Third time, and passed as amended [Cols. 2689-2923]
SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 2923]
BETTING AND GAMING LEVY (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 2926]
STRATEGIC DEVELOPMENT PROJECTS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Col. 2927]
PUBLIC SECURITY ORDINANCE:
Resolution [Col. 2929]
ESSENTIAL PUBLIC SERVICES ACT:
Resolution [Col. 2929]
COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT:
Regulations [Col. 2929]
FINANCE ACT:
Regulation [Col. 2930]
VALUE ADDED TAX ACT:
Regulation [Col. 2930]
PORTS AND AIRPORTS DEVELOPMENT LEVY ACT:
Order [Col. 2931]
VALUE ADDED TAX ACT:
Regulations [Col. 2931]
EXCISE ORDINANCE:
Rules [Col. 2931]
IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations [Col. 2932]
SPECIAL COMMODITY LEVY ACT:
Order [Col. 2933]
CUSTOMS ORDINANCE:
Resolutions [Col. 2933]
SUPPLEMENTARY SUM:
Head 243 - Programme 01 [Col. 2934]
SUPPLEMENTARY SUM:
Head 249 - Programme 01 [Col. 2934]
SUPPLEMENTARY SUM:
Head 240 - Programme 02 [Col. 2935]
NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT:
Regulations [Col. 2936]
NATIONAL INSTITUTE OF CO-OPERATIVE DEVELOPMENT:
Annual Report (2023) [Col. 2936]
SRI LANKA CASHEW CORPORATION:
Annual Report (2019) [Col. 2936]
SRI LANKA CASHEW CORPORATION:
Annual Report (2020) [Col. 2937]
KALUBOWITIYANA TEA FACTORY LIMITED:
Annual Report (2022/2023) [Col. 2937]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025* දෙසැම්බර් *05*වන සිකුරාදා**
*2025 டிசம்பர் 05, வெள்ளிக்கிழமை*
*Friday, 05th December, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ප්‍රතිඥාව: ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
## உறுதிப்பிரமாணம்: மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்
## AFFIRMATION: HON. NAINA THAMBI MARRIKKAR MOHAMED THAHIR

***ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***
*மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர் சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*
*The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*



## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් 2026 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(5)(ii) යටතේ (මුදල් වෙන් කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අනුකූල වන්නේද යන්න පිළිබඳව) වූ එකී කාරක සභාවේ වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඉදිරිපත් කරන අතර සිංහල සහ දෙමළ භාෂා පිටපත් හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට ද කටයුතු කරමි.

මේක අපි Institute of Policy Studies හරහා කළේ. ඔවුන්ට අපි ස්තුතිවන්ත වෙනවා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## II

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය 2024 වර්ෂයේ හතරවන කාර්තුව සහ 2025 වර්ෂයේ පළමුවන කාර්තුව තුළ අපගමනය වීම පිළිබඳ වාර්තාව;

(ii) මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය 2025 වර්ෂයේ පළමුවන සහ දෙවන කාර්තුවලදී අපගමනය වීම පිළිබඳ වාර්තාව; සහ

(iii) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 80 (2) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව "මහ බැංකුවේ කාර්යයන්" පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම - 2025 වර්ෂයේ දෙවන කාර්තුව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## III

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය 249 - වැඩසටහන 01, 2025 අංක 05 දරන පරිපූරක ඇස්තමේන්තුව; සහ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

(ii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ නියෝග

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## IV

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 71 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් නියෝග; සහ

(ii) 2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය 240 - වැඩසටහන 02 - 2025 අංක 06 දරන පරිපූරක ඇස්තමේන්තුව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, අද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සියලු සාමාජිකයන් සහ අපේ නිලධාරින් පාර්ලිමේන්තු රැස්වීම් පටන් ගන්න කලින් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඒ ව්‍යසනයට පත් වෙච්ච ජනතාවට අවශ්‍ය සහන සැලසීම සඳහා ඉදිරි සති 4ට රුපියල් බිලියන 72.5ක් වෙන් කිරීම සඳහා සහාය ලබා දුන්නා. ඔවුන් සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙනවා.

## මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## பொது மனுக்கள் பற்றிய குழுவின் அறிக்கை
## REPORT OF THE COMMITTEE ON PUBLIC PETITIONS

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

ගරු කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125(5) අනුව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් 2025.06.01 වන දින සිට 2025.08.31 දින දක්වා වූ කාල සීමාව සඳහා කාරක සභාවේදී විභාග කරන ලද පෙත්සම් 65ක් සම්බන්ධයෙන් වන කාරක සභාවේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වී ඇති අතර, පෙත්සම් 25ක් සම්බන්ධයෙන් සහන ලබා දීම සඳහා කාරක සභාව විසින් නිර්දේශ ලබා දී ඇත.

ගරු කථානායකතුමනි, කාරක සභාවේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා මාහට සහාය ලබා දුන් කාරක සභාවේ සියලු සාමාජික මන්ත්‍රීවරුන්ටත්, කාරක සභාවේ රැස්වීම් සඳහා දායකත්වය දැක්වූ සියලු රාජ්‍ය නිලධාරින්ටත්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලු නිලධාරින්ටත් ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, පන්නිපිටිය, බෝගහවත්ත පාර, 10 වැනි මාවත, අංක 1330 යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.එස්.කේ. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) කුරුණෑගල, තඹගල්ල, කැකුලාවල යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. සමන් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හොරොම්බාව, උඩගෙදර යන ලිපිනයෙහි පදිංචි එච්.ආර්.කේ. සුහසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගැටහැත්ත, මහදෙනිය, "සුනිල් විලා" අංක 262 යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. බර්ටි ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) නොච්චියාගම, හල්මිල්ලකුලම, ගම්මාන, අංක 02 දරන ලිපිනයෙහි පදිංචි වී.ඩබ්ලිව්.ටී. ලක්ෂ්මන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහව, බලල්ල, වඳුරැස්ස යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.අයි.ඩී.එම්. ප්‍රේමසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මහව, වතුපලගම, දෙවට පාර යන ලිපිනයෙහි පදිංචි ඊ.එම්. මුතුබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ජාතික පාසල් සහ පළාත් පාසල්වලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්: විස්තර
### தேசிய பாடசாலைகள் மற்றும் மாகாண பாடசாலைகளுக்குச் சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்கள்: விபரம்
### DEVELOPMENT OFFICERS ATTACHED TO NATIONAL SCHOOLS AND PROVINCIAL SCHOOLS: DETAILS

1309/2025

**1. ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික පාසැල්වලට හා පළාත් සභා පාසැල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලද වර්ෂ සහ එම එක් එක් වර්ෂයේදී අනුයුක්ත කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රජයේ ගුරු පුරප්පාඩු පිරවීමේදී ඉහත සංවර්ධන නිලධාරීන් සඳහා යම් සහනයක් ලබා දිය හැකිද;

(iv) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ ගුරු පුරප්පාඩුවලට බඳවාගැනීම සඳහා පැවැත්වීමට නියමිතව තිබූ තරග විභාගයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුව මේ වනවිට අවසන්වී තිබේද;

(ii) එසේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති නිර්දේශ/නියෝග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள தேசிய பாடசாலைகள் மற்றும் மாகாண சபை பாடசாலைகளுக்கு சேவை இணைப்புச் செய்யப்பட்டுள்ள அபிவிருத்தி உத்தியோகத்தர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி அபிவிருத்தி உத்தியோகத்தர்கள் சேவை இணைப்புச் செய்யப்பட்ட ஆண்டுகள் மற்றும் அந்த ஒவ்வோர் ஆண்டிலும் சேவை இணைப்புச் செய்யப்பட்டவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) அரச ஆசிரியர் வெற்றிடங்களை நிரப்பும்போது மேற்படி அபிவிருத்தி உத்தியோகத்தர்களுக்கு ஏதேனும் சலுகைகளை வழங்க முடியுமா என்பதையும்;

(iv) ஆமெனில், அச்சலுகைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரச ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்காக ஆட்சேர்ப்புச் செய்யும் பொருட்டு நடத்தப் படவிருந்த போட்டிப் பரீட்சைக்கு எதிராக உயர் நீதிமன்றத்தில் தாக்கல் செய்யப்பட்ட வழக்கு நடவடிக்கைகள் இன்றளவில் பூர்த்தி செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், உயர் நீதிமன்றம் வழங்கிய பரிந்துரைகள்/ கட்டளைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the total number of Development Officers who have been attached to National Schools and provincial council schools in Sri Lanka;

(ii) the years in which the said Development Officers were attached and the number of officers attached in each year, separately;

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

(iii) whether some relief could be given to the said Development Officers in filling the teacher vacancies in government schools; and

(iv) if so, what such relief is?

(b) Will she also inform this House -

(i) whether the case pending before the Supreme Court against the competitive examination scheduled to be held for the recruitment of teachers to fill the vacancies in government schools has been concluded by now; and

(ii) if so, the recommendations/ orders that have been issued by the Supreme Court?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ)(අ) (i) · ජාතික පාසල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 2,939කි.

· පළාත් සහා පාසල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව

| පළාත | අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 3,891 |
| දකුණ | 2,471 |
| මධ්‍යම | 2,974 |
| වයඹ | 2,416 |
| ඌව | 1,580 |
| උතුරු මැද | 1,337 |
| සබරගමුව | 2,235 |
| උතුර | 471 |
| නැගෙනහිර | 2,727 |
| **එකතුව** | *** 20,102** |

* මෙම සංඛ්‍යාව මඟින් දක්වා ඇත්තේ 1999 වර්ෂයේ සිට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් ප්‍රමාණය වේ.

(ii) එක් එක් වර්ෂයේදී ජාතික පාසල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව

| වර්ෂය | අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 2021ට පෙර | 517 |
| 2021 | 488 |
| 2022 | 1,934 |
| **එකතුව** | **2,939** |

කෙසේ වෙතත්, ස්ථාන මාරු මත හා ගුරු සේවය වැනි වෙනත් සේවාවලට මුදා හැරීම මත මේ වන විට ජාතික පාසල්වල සංවර්ධන නිලධාරීන් 1,992ක් පමණක් සේවය කරයි.

පළාත් සහා පාසල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව පහත ඇමුණුම මඟින් ඉදිරිපත් කර තිබෙනවා.

**එක් එක් වර්ෂයේදී පළාත් සභා පාසැල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව** **ඇමුණුම**

| පළාත | 1999 | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 19 | - | 06 | - | - | 01 | 03 | - | - | 02 | - | - | 02 | - | 127 | 04 | 64 | 79 | 01 | 32 | 06 | 04 | 54 | 3487 | - | - | - |
| දකුණ | - | - | - | - | - | - | 05 | - | - | - | - | - | - | - | 01 | 08 | - | - | 01 | - | 01 | 03 | 04 | 2183 | 26 | 23 | 216 |
| මධ්‍යම | 01 | - | - | - | - | - | 02 | - | - | - | - | - | - | - | 03 | - | - | - | - | - | 03 | 87 | 23 | 2855 | - | - | - |
| වයඹ | 01 | - | - | - | - | - | 02 | 01 | - | - | 01 | 03 | - | - | 03 | 02 | 04 | 11 | 28 | 16 | 62 | 18 | 111 | 2042 | 24 | 57 | 30 |
| ඌව | 01 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | - | 01 | 01 | 01 | - | 01 | 11 | 118 | 1382 | 23 | 6 | 34 |
| උතුරු මැද | 145 | - | - | - | - | - | 53 | - | - | 01 | - | - | - | - | 01 | - | - | - | - | 01 | - | - | - | 1136 | - | - | - |
| සබරගමුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2235 | - | - | - |
| උතුර | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 08 | 463 | - | - | - |
| නැගෙනහිර | - | - | - | - | - | - | 01 | - | - | - | - | - | - | - | 27 | 11 | 01 | - | - | - | - | 05 | 22 | 2660 | - | - | - |
| **එකතුව** | **167** | **-** | **06** | **-** | **-** | **01** | **66** | **01** | **-** | **03** | **01** | **03** | **02** | **-** | **163** | **25** | **70** | **91** | **31** | **49** | **73** | **128** | **340** | **18443** | **73** | **86** | **280** |

(iii) අධිකරණ නීති කෘත්‍යයෙහි අවසන් නියෝගයට යටත්ව හා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදනයන්ට අනුව සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට පිවිසීම සඳහා අවස්ථාව සලසා දිය හැකිය.

(iv) දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 77/2023 හා 88/2023 දරන නඩු 2025.08.06 දිනැතිව නිෂ්ප්‍රභ කරන ලද අතර, අංක 78/2023 හා 95/2023 දරන නඩු අනුව, අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනය අනුව, විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්කරුවන්ගේ උපරිම වයස අවුරුදු 40 යන්න, වයස අවුරුදු 45 දක්වා මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි දීර්ඝ කිරීමට නියම කර ඇත. ඒ අනුව එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අවසන් වුවද ඒ වන විට අභියාචනාධිකරණයේ පවතින CA 92/2023 (Writ) නඩුවේ අවසන් තීරණයක් ලබා දී නොමැති වූ බැවින් විභාගය පැවැත්වීමට මේ දක්වා නොහැකි වී තිබුණි. ඒ අනුව, උක්ත ශ්‍රේෂ්ඨාධිකරණ නඩු මඟින් ලබා දෙන ලද උපරිම වයස සංශෝධනය කිරීමේ නියෝගය පරිදි ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ 3 -I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරනු ලබන අය බඳවා ගැනීමට කටයුතු කිරීම පිණිස පාසල්වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් ද ඇතුළුව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා සෙසු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම මැයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් 2025.10.08 දිනැතිව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා 2025.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, එම තීරණය සම්බන්ධව නැවත අභියාචනාධිකරණය වෙත කරුණු වාර්තා කළ පසු එම අභියාචනාධිකරණ නඩුවද 2025.11.20 දින අවසන් කර ඇත. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව ප්‍රකාරව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා රාජ්‍ය සේවයේ නියුතු නොවන අනෙකුත් උපාධිධාරීන් සඳහා බඳවා ගැනීමේ වයස් සීමාව සංශෝධනය කරමින් වෙන වෙනම විභාගය පවත්වා ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

(ආ) (i) ඔව්.

(ii) ඒ අනුව, ඉදිරියේදී වයස් සීමාව සංශෝධනය කර විභාග පවත්වා ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිතය. (ඉහත (අ) (iv) යටතේ මේ පිළිබඳව වැඩි විස්තර දන්වා ඇත.)

(ඇ) අදාළ නොවේ.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමියට මා ස්තුතිවන්ත වෙනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය පිළිතුර ලබා දීමේදීත් සඳහන් කළා වාගේම ඉතිහාසයේ ඉඳන්ම, 1999 වර්ෂයේදීත්, ඒ වාගේම 2005 වර්ෂයේදීත්, ඉන් අනතුරුවත් -උපාධිධාරීන් බඳවා ගැනීමේ පදනම යටතේ- සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගත් උපාධිධාරීන් ජාතික සහ පළාත් පාසල්වලට වරින් වර අනුයුක්ත කර තිබෙනවා. නමුත් 1999 සහ 2005 වර්ෂවලදී පාසල්වලට අනුයුක්ත කළ, සංවර්ධන සහකාර, සංවර්ධන වැඩසටහන් සහකාර සහ මූල්‍ය සහකාර කියන තනතුරුවල හිටපු නිලධාරීන් 2007 වසර වනකොට සෘජුව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාවක් තිබුණා. එහෙම හැකියාවක් තිබුණේ, එවකට ඔවුන් අදාළ අමාත්‍යාංශයටම බඳවා ගැනීම සඳහා තිබුණු ව්‍යවස්ථාමය කාරණා අනුවයි. නමුත් 2012 වසරෙන් පසුව පාසල්වලට සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරද්දී ඒකාබද්ධ සේවය යටතේ බඳවාගෙන තමයි අනුයුක්ත කළේ. 2012 සිට මේ දක්වා ගුරු සේවයට එවැනි සෘජු අන්තර්ග්‍රහණය කිරීමක් කෙරිලා නැහැ. පසුගිය දවස්වල ගුරු විපක්ෂ නායකතුමාත් ඒ අය ගුරු සේවයට සෘජුව අන්තර්ග්‍රහණය කරන්න ආදී වශයෙන් වරින් වර ඉල්ලීම් කරනවා අපි දැක්කා. 2012 වසරේ සිට, විශේෂයෙන්ම 2015-2019 ආණ්ඩු කාලයේ පවා සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන්න කියලා අපි පාරේ සටන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
නමුත්, මගේ මතකය අනුව තරග විභාග ක්‍රමවේදය අනුව තමයි බඳවා ගත්තේ. ඒ නිසා තවදුරටත් එවැනි අන්තර්ග්‍රහණය කිරීමක් කරන්න හැකි විශේෂ අවස්ථාවක් තිබෙනවාද කියලා පළමු අතුරු ප්‍රශ්නය විධියට මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, අන්තර්ග්‍රහණය කිරීමට හැකියාවක් නැහැ. රාජ්‍ය සේවා කොමිසමේ තීරණත්, ශ්‍රේෂ්ඨාධිකරණය දීලා තිබෙන නඩු තීන්දු ගණනාවකුත් අනුව තමයි අපට ක්‍රියා කරන්න වෙන්නේ. කැබිනට් මණ්ඩලය හරහා ඉදිරිපත් කරපු ඒ තීරණය අනුව තමයි අපට මේ නඩුවලින් මේ අවුරුද්දේ නිදහස් වෙන්න පුළුවන් වුණේ.

ඒ නිසා ගුරු සේවා ව්‍යවස්ථාව අනුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව දීලා තිබෙන නිර්දේශ අනුවත් තරග විභාගයකින් ගුරු සේවයට බඳවා ගැනීමට තමයි සියලු පාර්ශ්ව මේ වනකොට එකඟ වෙලා තිබෙන්නේ. ඒක නඩු තීන්දුවේත් සටහන් වෙලා තිබෙනවා. ඒ අනුව තමයි ඉදිරියට බඳවා ගැනීමේ කටයුතු කරන්නේ. වයස් සීමාව සංශෝධනයට ඉඩ දීලා තිබෙනවා. ඒ අනුව අවුරුදු 45ක් දක්වා ඒ වයස් සීමාව වැඩි කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඉඩ දීලා තිබෙනවා.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැනට පාසල්වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් ගත්තොත්, 2013 සිට වසර 12ක විතර කාල සීමාවක් තුළ ඔවුන් ගුරු අධ්‍යයන කාර්යයන්වල, විෂය අධ්‍යයන කාර්යයන්වල

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

නියැළෙමින් සිටිනවා. විද්‍යාපීඨ වැනි පුහුණු ආයතනවල ලැබූ පුහුණු කාලයටත් වඩා වැඩි කාල සීමාවක් ඔවුන් ඉගැන්වීම් කටයුතුවල නිරත වෙනවා. ඒ නිසා සමස්ත උපාධිධාරින්ට සාධාරණයක් කරන අතර, පාසල්වල නියුතු සංවර්ධන නිලධාරින්ටත් මේ බඳවා ගැනීම් ක්‍රියාවලිය ඇතුළේ විශේෂ අවධානයක් යොමු කිරීමේ හැකියාවක් තිබෙනවාද කියන එක පිළිබඳවත් මම ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් දැනගන්න කැමැතියි. ඒ වාගේම, ඔබතුමිය මේ ප්‍රශ්නය නිරාකරණය කරමින් පාසල්වල පවතින ගුරු හිඟය කඩිනමින් අවසන් කිරීමට දරන උත්සාහය පිළිබඳවත් විශේෂයෙන්ම වෘත්තීය සමිති ව්‍යාපාරය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, විභාගයට අමතරව, බඳවා ගැනීමේ දෙවැනි පියවර හැටියට සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතයි. එතැනදී පාසල්වල ලබපු අත්දැකීම් ඉදිරිපත් කරලා ඒ අනුව කරන සාකච්ඡාව තුළ වැඩි වාසියක් පාසල්වල මෙතෙක් කල් ගුරුවරුන් හැටියට ක්‍රියා කරපු සංවර්ධන නිලධාරින්ට අනිවාර්යයෙන්ම ලැබෙනවා. අපි ඒක සලකා බලා තිබෙනවා. ඒ සම්මුඛ පරීක්ෂණයේදී පාසලක් තුළ ගුරුවරයකු හැටියට කටයුතු කළ යුතු විධිය ගැන ඔවුන් presentation එකක් කරන්න ඕනෑ. එතකොට ඒ අත්දැකීම තිබෙන ගුරුවරුන්ට අනිවාර්යයෙන්ම වාසියක් ලැබෙනවා.

## රජයේ විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීම: ක්‍රමවේදය

## அரச பல்கலைக்கழகங்களில் மாற்றுத்திறனுடைய மாணவர்களை இணைத்துக்கொள்ளல்: நடைமுறை

## ENROLMENT OF STUDENTS WITH DISABILITIES TO STATE UNIVERSITIES: METHODOLOGY

1322/2025

**2. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රජයේ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන ආබාධ සහිත සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන්ගේ ආබාධ වර්ග කවරේද;

(iii) එම එක් එක් ආබාධ වර්ගයට අදාළ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ආ) (i) රජයේ විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීමේ ක්‍රමය කවරේද;

(ii) එම ක්‍රමය යාවත්කාලීන සහ විධිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ විශ්වවිද්‍යාල සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේදී කෝටා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(iv) ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යයන ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(v) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) (i) අභිමත ඕනෑම විෂය ධාරාවක් හැදෑරීමට විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන්ට අවකාශ තිබේද;

(ii) එම සිසුන් මේ වන විට හදාරනු ලබන විෂය ධාරා කවරේද;

(iii) විවිධ විෂය ධාරා හැදෑරීමට ආබාධ සහිත සිසුන් යොමු නොවීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමිය සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அரச பல்கலைக்கழகங்களில் கல்வி பயிலும் மாற்றுத்திறனுடைய மாணவர்களின் எண்ணிக்கை ஒவ்வொரு பல்கலைக்கழக வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) மேற்படி மாணவர்களின் மாற்றுத்திறன்கள் எவ்வகையானவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு மாற்றுத்திறனுடைய மாணவர்களின் எண்ணிக்கை மாற்றுத்திறன் வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அரச பல்கலைக்கழகங்களில் மாற்றுத்திறனுடைய மாணவர்களை இணைத்துக்கொள்ளும் நடைமுறை யாது என்பதையும்;

(ii) மேற்படி நடைமுறையை இற்றைப்படுத்தவும் முறைப்படுத்தவும் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) அரச பல்கலைக்கழகங்களில் மாற்றுத்திறனுடைய மாணவர்களை இணைத்துக்கொள்வதில் இட ஒதுக்கீட்டு முறைமையொன்று செயற்படுத்தப்படுகின்றதா என்பதையும்;

(iv) மாற்றுத்திறனுடைய மாணவர்களுக்கான உள்ளடக்கக் கல்வி முறையியல் ஒன்று செயற்படுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அது செயற்படுத்தப்படும் முறை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மாற்றுத்திறனுடைய பல்கலைக்கழக மாணவர்களுக்குத் தாங்கள் விரும்பும் எந்தவொரு பாடப் பிரிவிலும் கல்வி கற்பதற்கான வாய்ப்புகள் உள்ளனவா என்பதையும்;

(ii) மேற்படி மாணவர்கள் தற்போது கல்வி கற்கும் பாடப் பிரிவுகள் யாவை என்பதையும்;

(iii) மாற்றுத்திறனுடைய மாணவர்கள் பல்வேறு பாடப் பிரிவுகளில் கல்வி கற்க முன்வராமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she state the -

(i) number of students with disabilities studying in each State university, separately;

(ii) types of disabilities of the aforesaid students; and

(iii) number of students with each type of disability mentioned above, separately?

(b) Will she also state -

(i) the methodology adopted for enrolling students with disabilities to State universities;

(ii) the measures that will be taken to update and streamline the aforesaid methodology;

(iii) whether a quota system is in place in enrolling students with disabilities to State universities;

(iv) whether an inclusive study methodology has been implemented for students with disabilities; and

(v) if so, the manner in which it is being implemented?

(c) Will she further state -

(i) whether there are opportunities in universities for students with disabilities to follow any subject stream of their choice;

(ii) the subject streams that the aforesaid students are currently studying; and

(iii) the reasons as to why students with disabilities do not opt to follow various subject streams?

(d) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් පිළිබඳ විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

* *පිළිතුර අවසානයේ පළ කර ඇත.*
* *விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of Answer.*

• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ කායික ආබාධයක් ඇති එක් විදේශීය සිසුවෙකු ඉගෙනුම ලබයි.

• ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රමයක් නොමැති අතර, ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීමක් සිදු කර නැත.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් පහත පරිදි වේ.

• දෘෂ්‍යාබාධිත සිසුන්

• කායික අශක්නුතා සහිත සිසුන්

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්

| අධ්‍යයන වර්ෂය | දෘෂ්‍යාබාධිත සිසුන් | කායික අශක්නුතා සහිත සිසුන් |
|---|---|---|
| 2023/ 2024 | 21 | 91 |
| 2022/ 2023 | 20 | 87 |
| 2021/ 2022 | 11 | 66 |
| 2020/ 2021 | 18 | 77 |

(ආ) (i) • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලීමේ දී ඔවුන් වෙනුවෙන්ම විශේෂ ප්‍රවේශයක් "දෘෂ්‍යාබාධිත හා කායික අශක්නුතා ඇති අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම" ලෙස භාවිත කරනු ලැබේ. එම විශේෂ ප්‍රවේශය යටතේ තෝරා ගනු ලබන සිසුන්ගෙන් කායික අශක්නුතා ඇති අපේක්ෂකයන් ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය හා කලා යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ද දෘෂ්‍යාබාධිත අපේක්ෂකයන් කලා උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ද විශ්වවිද්‍යාලවලට අනුයුක්ත කරනු ලැබේ. එහිදී කායික අශක්නුතා ඇති අපේක්ෂකයන්ගේ කායික අශක්නුතාවේ තීව්‍රතාව මත ශ්‍රේණිගත කර ලකුණු ලබා දී එම එක් එක් කාණ්ඩවල සිටින සිසුන්ගේ "Z" අගය සලකා බලා ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය හා කලා යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සඳහා අනුයුක්ත කරනු ලැබේ. අ.පො.ස. (උ.පෙළ) විභාගයට බ්‍රේල් ක්‍රමයෙන් පෙනී සිටි සිසුන් දෘෂ්‍යාබාධිත අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම යටතේ කලා උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට අනුයුක්ත කරනු ලැබේ.

• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පමණක් ඇතුළත් කර ගනී.

(ii) දැනට පවතින උපාධි පාඨමාලා 4ට අමතරව ඉදිරියේදී සියලු උපාධි පාඨමාලා සඳහා ආබාධ සහිත සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇතුළත් කර ගැනීමට නව ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මත කර ඇති අතර, එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

(iii) නැත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ජෛවීය විද්‍යා, භෞතීය විද්‍යා, වාණිජ්‍යය හා කලා යන උපාධි

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

පාඨමාලා 4 සඳහා එක් එක් විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ස්ථාන සංඛ්‍යාවක් සඳහා සිසුන් අනුයුක්ත කරනු ලැබේ.

(iv), (v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යයන ක්‍රම එක් එක් විශ්වවිද්‍යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. උදාහරණයක් වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලය විසින් දෘශ්‍යාබාධිත සිසුන්හට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යෑම සඳහා දෘශ්‍යාබාධිත සිසුන් සඳහාම වූ පහසුකම් සහිත විශේෂ මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත.

(ඇ) (i), (ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල "දෘශ්‍යාබාධිත හා කායික අශක්නුතා ඇති අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම" යන විශේෂ ප්‍රවේශය යටතේ තෝරා ගනු ලබන සිසුන්ගෙන් කායික අශක්නුතා ඇති අපේක්ෂකයන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, වාණිජ හා කලා යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ද, දෘශ්‍යාබාධිත අපේක්ෂකයන් කලා උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ද විශ්වවිද්‍යාලවලට අනුයුක්ත කරනු ලැබේ. කෙසේ නමුත්, අ.පො.ස (උසස් පෙළ) ප්‍රතිඵල මත පදනම්ව කිසිදු විශේෂකරණයකින් තොරව ආබාධ සහිත සිසුන්හට සාමාන්‍ය ප්‍රවේශය යටතේ ඔවුන්ගේ අභිමතය පරිදි ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවකාශ සලසා දී තිබේ.

(iii) 2024 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගය පදනම් කරගෙන දැනට මෙම සිසුන් ඇතුළත් කර ගන්නා ඉහත සඳහන් පාඨමාලා හතරට අමතරව තවත් පාඨමාලා සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලවලින් එකඟතාව ලබා ගනිමින් පවතී. ඒ අනුව 2024 අ.පො.ස (උසස් පෙළ) පදනම් කරගෙන තවත් ප්‍රථම උපාධි පාඨමාලා සඳහා මෙම ආබාධ සහිත සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

2025 අ.පො.ස (උසස් පෙළ) විභාගය පදනම් කරගෙන සියලු ප්‍රථම උපාධි පාඨමාලාවලට විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා දීමේ ප්‍රතිපත්තිමය තීරණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මේ වන විට ලබාගෙන ඇත. ඒ සඳහා නව ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. ඒ අනුව ආබාධ සහිත සිසුන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශ වරම් ඉදිරියේදී පුළුල් වනු ඇත.

(ඈ) පැන නොනඟී.

---

** සභාමේසය මත තබන ලද ඇමුණුම:*

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

**Annex tabled:*

ඇමුණුම

**විශ්වවිද්‍යාල ප්‍රවේශය - බඳවා ගන්නා ලද අන්ධ හා කායික අශක්නුතාවන් සහිත සිසුන්**

| විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය 2023/2024 | | | | | අධ්‍යයන වර්ෂය 2022/2023 | | | | | අධ්‍යයන වර්ෂය 2021/2022 | | | | | අධ්‍යයන වර්ෂය 2020/2021 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කායික අශක්නුතාවන් සහිත සිසුන් | | | | දෘෂ්‍යාබාධිත සිසුන් | කායික අශක්නුතාවන් සහිත සිසුන් | | | | දෘෂ්‍යාබාධිත සිසුන් | කායික අශක්නුතාවන් සහිත සිසුන් | | | | දෘෂ්‍යාබාධිත සිසුන් | කායික අශක්නුතාවන් සහිත සිසුන් | | | | දෘෂ්‍යාබාධිත සිසුන් |
| | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ්‍යය | කලා | කලා | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ්‍යය | කලා | කලා | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ්‍යය | කලා | කලා | ජීව විද්‍යාව | භෞතික විද්‍යාව | වාණිජ්‍යය | කලා | කලා |
| කොළඹ විශ්වවිද්‍යාලය | - | - | - | 15 | 10 | - | - | - | 12 | 10 | - | - | - | 12 | 3 | - | - | - | 27 | 5 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | - | - | 3 | 10 | - | - | - | 2 | 8 | - | - | - | 2 | - | 1 | - | - | 2 | - | 5 |
| කැළණිය විශ්වවිද්‍යාලය | - | 2 | - | 8 | 4 | 1 | - | - | 8 | 4 | 1 | 2 | - | 7 | 4 | - | - | 2 | 7 | 3 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 1 | 1 | - | 8 | 4 | 2 | 1 | - | 5 | 3 | - | 1 | - | 5 | - | - | - | - | 3 | 3 |
| යාපනය විශ්වවිද්‍යාලය | 1 | - | 1 | 16 | 3 | 2 | - | 6 | 12 | 2 | - | - | 5 | 9 | 2 | - | - | 3 | 10 | 1 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව | 1 | - | - | 3 | - | 4 | - | 7 | - | 1 | 1 | - | - | 7 | 1 | - | 2 | - | 5 | 1 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 3 | 2 | - | 9 | - | 2 | - | - | 8 | - | 1 | 1 | - | 7 | - | - | 2 | - | 7 | - |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 3 | - | 2 | 3 | - | - | - | - | 7 | - | - | - | - | 5 | - | 1 | - | 1 | 5 | - |
| එකතුව | 9 | 5 | 5 | 72 | 21 | 11 | 1 | 15 | 60 | 20 | 3 | 4 | 7 | 52 | 11 | 1 | 4 | 8 | 64 | 18 |

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමියට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමිය සඳහන් කළ විධියට විශ්වවිද්‍යාල සඳහා ආබාධ සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම, ඔවුන්ට පාඨමාලා හඳුන්වා දීම සහ ඔවුන්ගේ අධ්‍යයන පහසුව සඳහා ගෙන ඇති පියවර ගැන අපි සතුටු වෙනවා. ඒ එක්කම, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අන්තර්කරණ අධ්‍යාපන අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා සෙසු විශ්වවිද්‍යාලවලත් භෞතික සහ මානව සම්පත් සහිත එවැනි ඒකක පිහිටුවීමේ හැකියාවක් තිබෙනවාද කියලා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා දැන ගන්නට සතුටුයි. ඔබතුමිය උදාහරණයකුත් දුන්නා, කොළඹ විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථානයක් තිබෙනවා කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ඔව්, එවැනි ඒකක පිහිටුවීම පියවරෙන් පියවර කරන්න අපි තීරණය කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ආබාධිත සිසුන් බඳවා ගැනීම පමණක් නොවෙයි, ඔවුන්ට අවශ්‍ය සහාය සහ උපකාර ලබා දීමටත් විශ්වවිද්‍යාල සූදානම් විය යුතුයි. එම නිසා, එවැනි මධ්‍යස්ථාන විතරක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඔවුන්ට අවශ්‍ය equipment සහ devices ලබා දීම සඳහාත් අපි මුදල් වෙන් කරමින් යනවා. ආබාධිත සිසුන් බඳවා ගැනීම විතරක් නොවෙයි, ඉදිරියේදී ඒ කටයුතු තවත් දියුණු කරමින් ඔවුන්ගේ අධ්‍යයන කටයුතුවල සාර්ථකව නිරත වෙන්න අවශ්‍ය සහාය දෙන්න පුළුවන් වෙයි කියලාත් අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

බෙහෙවින්ම ස්තුතියි, ගරු අගමැතිතුමියනි.

ආබාධ සහිත ශිෂ්‍යයෙක් විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙනවාත් එක්කම ඔවුන්ට තව ප්‍රශ්න කීපයකට මුහුණ දෙන්න සිදු වෙනවා. එකක්, ඔවුන් භාවිත කරන මාධ්‍යයෙන් ස්වකීය අධ්‍යයන කටයුතු සිදු කිරීම. උදාහරණයක් විධියට බ්‍රේල් ක්‍රමය හෝ සංඥා භාෂාව. අනෙක් පැත්තෙන්, විශ්වවිද්‍යාල පරිශ්‍ර හා නේවාසිකාගාර තුළ ඔවුන්ට ස්වකීය චලන අවශ්‍යතා ඉෂ්ට කර ගැනීමට භෞතික ප්‍රවේශය නිර්මාණය කරන්න අනිවාර්යයෙන් සිද්ධ වෙනවා. මේ සඳහා ඔබතුමියගේ අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කොයි වාගේ පියවරක් ගන්න සූදානම්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ සඳහා හරි ප්‍රතිපත්තියක් සැකසිය යුතුයි කියලා අපි හිතනවා. අප අමාත්‍යාංශයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවත් එකතු වෙලා ඒකට අවශ්‍ය guidelines සහ minimum standards මොනවාද කියන එක ගැන කථා කරමින් සිටිනවා. විශේෂයෙන්ම අලුතින් හදන buildingsවලට access කියන එක ගැන විශේෂ අවධානයක් යොදවන්න කියන නිර්දේශය අපි දැනටමත් දීලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී මේ සියලු කටයුතු කරනකොට ආබාධිත සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව සිදු කරන්නය කියන නියෝගය අපි දැනටමත් දීලා තිබෙනවා. නමුත්, ඒකට අනුව ප්‍රතිපත්තියක් සහ guidelines අපි සකස් කරන්න ඕනෑ. ඉදිරි අවුරුද්ද තුළ අපි ඒක කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -1349/2025- (1), ගරු උපුල් කිත්සිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින්: ස්ථාන මාරුවීම්
## இலங்கை நிருவாக சேவை அலுவலர்கள்: இடமாற்றம்
## OFFICERS OF SRI LANKA ADMINISTRATIVE SERVICE: TRANSFERS

1506/2025

**4. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ බොහෝ නිලධාරින් වසර දහයකට අධික කාලයක් ස්ථාන මාරුවීම් නොමැතිව සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරින් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) නිසි ස්ථාන මාරුවීම් නොමැතිවීම හේතුවෙන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පරිපාලන අකාර්යක්ෂමතාව සහ පක්ෂග්‍රාහීත්වය වැනි ගැටලු මතුවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒවා විසඳීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නිර්දේශිත ස්ථාන මාරුවීම් කාලය ඉක්මවා සිටින නිලධාරින් හඳුනාගැනීමට විනිවිදභාවයෙන් යුතු, ස්ථිර වැඩපිළිවෙළක් තිබෙන්නේද;

(ii) නොඑසේ නම්, ස්ථාන මාරුවීම් ක්‍රියාවලියේ සාධාරණත්වය සහ වගකීම්සහගතභාවය සහතික කිරීමේ ක්‍රමවේදයක් ඇති කරන්නේද;

(iii) චක්‍රීය ක්‍රමයෙන් යුතු පත්කිරීම් වැනි ප්‍රතිසංස්කරණ යොදා ගැනීමේ හැකියාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තිය, නවීන පරිපාලන ප්‍රමිතීන්ට අනුකූලව සංශෝධනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ස්ථාන මාරුවීම් විධිමත් කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை நிருவாக சேவையிலுள்ள அநேகமான அலுவலர்கள் பத்து வருடங்களுக்கும் மேலாக இடமாற்றமின்றி இருப்பதை அறிவாரா;

[ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා]

(ii) ஆமெனில், அத்தகைய அலுவலர்களுக்காக இடமாற்றக் கொள்கையை நடைமுறைப்படுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(iii) இடமாற்றம் உரியவாறு அளிக்கப்படாததால், மாவட்ட மற்றும் பிரதேச மட்ட நிருவாகப் பணிகளில் வினைத்திறனின்மை, பக்கச்சார்பு போன்ற பிரச்சினைகள் ஏற்பட்டுள்ளதை அறிவாரா;

(iv) ஆமெனில், அதனைத் தீர்ப்பதற்கு எடுக்கும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) விதந்துரைக்கப்பட்ட இடமாற்றத்துக்கான காலத்தை விஞ்சியுள்ள அலுவலர்களைக் கண்டறிய வெளிப்படைத் தன்மையானதும் நிரந்தரமானதுமான ஒரு வேலைத்திட்டம் உள்ளதா என்பதையும்;

(ii) இன்றேல், இடமாற்ற செயன்முறையின் நியாயமான தன்மையையும் பொறுப்புணர் வையும் உறுதிப்படுத்துவதற்கான வழிமுறை உருவாக்கப்படுமா என்பதையும்;

(iii) சுழற்சி முறையிலான நியமனங்கள் போன்ற சீர்த்திருத்தங்களை கையாள்வதற்குள்ள வாய்ப்புகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இலங்கை நிருவாக சேவை அலுவலர்களுக்கான இடமாற்றக் கொள்கை நவீன நிருவாக தரநியமங்களுக்கு அமைவாக திருத்தப்படுமா என்பதையும்;

(ii) இன்றேல், குறித்த இடமாற்றங்களை ஒழுங்குறுத்த எடுக்கப்படும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) whether he is aware that a large number of officers of the Sri Lanka Administrative Service - SLAS - have been working without transfers for more than ten years;

(ii) if so, the measures that have been taken to implement the transfer policy for the said officers;

(iii) whether he is aware that the lack of proper transfers has resulted in issues such as administrative inefficiency and bias at district and regional levels; and

(iv) if so, the measures that will be taken to address those problems?

(b) Will he also inform this House -

(i) whether a transparent and fixed mechanism is in place to identify the officers whose recommended transfer periods have exceeded the stipulated duration;

(ii) if not, whether a mechanism will be introduced to ensure fairness and accountability in the transfer process; and

(iii) the possibility of adopting reforms such as rotational appointments?

(c) Will he further inform this House -

(i) whether the transfer policy of the SLAS officers will be amended to meet modern administrative standards; and

(ii) if not, the measures that will be taken to streamline the said transfers?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government**)**
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) එවැනි නිලධරයන් සිටින බව නිරීක්ෂණය වී ඇත.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීමේ හැකියාව පවතින අතර, ඒ අනුව අනුප්‍රාප්තික නිලධරයන් ගැළපීමේ හැකියාව සැලකිල්ලට ගෙන සෑම වර්ෂයකම ස්ථාන මාරුවීම් සිදු කරන අතර, ඊට අමතරව නිලධාරීන් බඳවා ගැනීම සිදු කරන අවස්ථාවලදී එකම සේවා ස්ථානයක උපරිම සේවා කාලයක් සේවය කර, ස්ථාන මාරු අපේක්ෂාවෙන් පසුවන නිලධරයන්හට ස්ථාන මාරුවීම් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද, යම් නිලධරයකු විසින් වාර්ෂික ස්ථාන මාරු යටතේ ඉල්ලුම් කරන ලද තනතුරෙහි සිටින වත්මන් නිලධරයා එම අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, පළාත් සභාව තුළ වසර 12ට වැඩි නම් ඔහු හෝ ඇය එම තනතුරින් ස්ථාන මාරු කර අනුයුක්ත නිලධරයාගේ සේවා ස්ථානයට අනුයුක්ත කරනු ලැබේ.

(iii) හැකි සෑම අවස්ථාවකදීම වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට කටයුතු කරන අතර, වාර්ෂික ස්ථාන මාරුවලට අමතරව සුහද ස්ථාන මාරු හෝ නිලධරයාගේ ඉල්ලීම මත කෙරෙන ස්ථාන මාරු සිදු කෙරේ. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ සිටින රජයේ නිලධරයන් පවතින නීති රීති රාමුව තුළ හිඳිමින් තම රාජකාරි කටයුතු ඉටු කරන අතර, එක් එක් නිලධාරියා සහ එම නිලධරයාගේ සහාය කාර්ය මණ්ඩලයේ ධාරිතාව හා කැපවීම අනුව යම් යම් කාර්යයන් ඉටු කර අවසන් කිරීම සඳහා වෙනස් වූ කාලයන් ගත විය හැක.

(iv) එවැනි ගැටලුවක් මතු වී ඇති විට මෙම අමාත්‍යාංශයේ දිස්ත්‍රික් පරිපාලනය භාරව ක්‍රියා කරන ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් විසින් අදාළ ගැටලුව පිළිබඳව සොයා බලා ඉදිරිපත් කරනු ලබන නිරීක්ෂණ හා නිර්දේශ සැලකිල්ලට ගෙන එම නිලධරයන් සම්බන්ධයෙන් අවශ්‍ය වේ නම් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමටත් පත් කිරීම් බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පරිපාලන බලධරයා වන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

(ආ) (i) නිලධරයන්ට ස්ථාන මාරු ලබා දීමෙන් පසු එම ස්ථාන මාරුවීම් අනුව නිලධරයන් සේවයට වාර්තා කිරීම සම්බන්ධව පසු විපරම් කිරීම සිදු කරන අතර, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට සිදු වේ. ඒ අනුව මෙම අමාත්‍යාංශය තුළ සකස් කරනු ලබන දත්ත පද්ධතිය මඟින් වාර්ෂික ස්ථාන මාරු සැලසුම් කිරීමේදී ඒ ඒ නිලධරයා අදාළ සේවා ස්ථානය තුළ සේවය කළ කාලය සලකා බලා කටයුතු කරනු ලැබේ.

(ii) තවදුරටත් මෙම ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කර ගැනීමට මේ වන විටත් අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර, ඒ අනුව මෙවැනි නිලධාරින් හඳුනා ගැනීමට හා එම නිලධාරින් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පහසු වනු ඇත. කෙසේ වුවද, වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කළ හැක්කේ සෑම විටම අනුප්‍රාප්තිකයෙකු සහිතව වන බැවින් දීර්ඝ කාලයක් එකම තනතුරක සිටියද ඉන් ඉවත් කිරීම අපහසු වී ඇත.

(iii) ඉතා ඵලදායී ක්‍රමවේදයක් යෝජනා කර ඇති අතර, නිසි ඉහළ තනතුරු දරන නිලධරයන් සඳහා සේවා ස්ථාන බණ්ඩ කිරීමෙන් පසු මෙවැනි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම වඩාත් සඵලදායී වේ.

අධ්‍යයනයකින් පසු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ඇ) (i), (ii) ඉහත පරිදි නිසි අධ්‍යයනයකින් පසු ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ, ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුමත කරනු ලබන නිලධරයා වශයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර තීරණයක් ලබා ගත යුතුව ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, முதலில் இயற்கை அனர்த்தத்தால் நாடு முழுவதும் பாதிக்கப்பட்டுள்ள மக்களுக்கும் உயிரிழந்தவர்களின் குடும்பத்தினருக்கும் எனது ஆழ்ந்த அனுதாபத்தையும் மனவருத்தத்தையும் தெரிவித்துக் கொள்கின்றேன்.

எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். மேற்படி இலங்கை நிருவாக சேவை அலுவலர்களுக்கு கடந்த காலங்களில் இடமாற்றம் வழங்கப்பட்டபோதும், அரசியல் செல்வாக்கைப் பயன்படுத்தி அவர்கள் தங்களது இடமாற்றத்தை இரத்துச்செய்து, தொடர்ந்தும் அதே மாவட்டங்களில் பணியாற்றுகின்றார்கள் என்பதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එහෙම සිදුවීම් නිල වශයෙන් වාර්තා වෙලා නැහැ. එහෙම වාර්තා වීමක් සිදු වුණොත්, අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා. ඒ වාගේම දේශපාලන සම්බන්ධතා මත හෝ වෙනත් කිසිදු පෞද්ගලික හේතුවක් මත ස්ථාන මාරුවීම් වෙනස් කිරීමට අවකාශ ලබා දෙන්නේ නැහැ. විධිමත් පරිදි ඒ ක්‍රියාවලිය දැන් අපි ආරම්භ කර තිබෙනවා.

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

தகுதியுள்ளவர்கள் இருந்தபோதும், அவர்களுக்குக் கீழ்நிலையில் உள்ளவர்களுக்கு கடந்த காலங்களில் நியமனங்கள் வழங்கப்பட்டுள்ளன. எதிர்வரும் காலத்திலாவது மாற்றங்களை ஏற்படுத்தக் கூடியதாக இருக்குமா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

වෙනස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි මේ වනවිට අරගෙන තිබෙනවා. සුදුසුකම් සහිත නිලධාරින්ට ඒ අවස්ථා ලබා දීමේ වැඩ පිළිවෙළ අපි රජය හැටියට ක්‍රියාත්මක කරමින් සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1554/2025- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## වී අලෙවි මණ්ඩලය: 2020-2024 දක්වා වී මිලදී ගැනීම

## நெல் சந்தைப்படுத்தல் சபை: 2020-2024 வரையான நெல் கொள்வனவு

PADDY MARKETING BOARD: PURCHASE OF PADDY FROM 2020-2024

1349/2025

**3. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු උපුල් කිත්සිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு உபுல் கித்சிறி சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon.Upul Kithsiri)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට 2024 දක්වා වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2025 වර්ෂය තුළදී වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය සහ ඒ සඳහා එම මණ්ඩලයට වෙන් කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(iii) වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයින්ට රජය විසින් මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දී තිබේද;

(iv) වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගනු ලබන වී ප්‍රමාණය වෙළෙඳ පොළට නිකුත් කිරීමට නිසි යන්ත්‍රණයක් සකස් කර තිබේද;

(v) ඉදිරි කන්නයේ වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ යන්ත්‍රණයක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை நெல் கொள்வனவுக்காக நெல் சந்தைப்படுத்தல் சபைக்கு ஒதுக்கப்பட்ட தொகை ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) 2025ஆம் ஆண்டில் நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்வதற்கு எதிர்பார்க்கப்பட்ட நெல்லின் அளவு மற்றும் அச்சபைக்கு ஒதுக்கப்பட்ட நிதி தொடர்பான விபரங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) நெல்லைக் கொள்வனவு செய்வதற்காக தனியார் வர்த்தகர்களுக்கு அரசாங்கத்தால் நிதி மற்றும் ஏனைய வசதிகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) நெல் சந்தைப்படுத்தல் சபையால் கொள்வனவு செய்யப்படும் நெல்லை சந்தைக்கு விநியோகிப்பதற்கு உரிய பொறிமுறையொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) எதிர்வரும் போகத்தில் நெல்லைக் கொள்வனவு செய்வதற்காக தனியார் துறையுடன் இணைந்து கூட்டுப் பொறிமுறையொன்றைத் தயாரிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the amount allocated to the Paddy Marketing Board for the purchase of paddy from the year 2020 to 2024, separately for each year;

(ii) the amount of paddy expected to be purchased by the Paddy Marketing Board in the year 2025 and the amount allocated to the Paddy Marketing Board for the said purpose, separately;

(iii) whether the Government has provided financial and other facilities to private businessmen for purchasing paddy;

(iv) whether a proper mechanism has been prepared to release the quantity of paddy purchased by the Paddy Marketing Board to the market; and

(v) whether steps will be taken to prepare an integrated mechanism with the private sector for the purchase of paddy in the upcoming season?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | විස්තරය | ණය මුදල (රුපියල් මිලියන) |
|---|---|---|
| 2020 | ලංකා බැංකුව | 3,390.0 |
| | මහජන බැංකුව | 1,840.0 |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 50.0 |
| 2021 | ලංකා බැංකුව | 2,500.0 |
| | මහජන බැංකුව | 1,500.0 |
| 2022 | ලංකා බැංකුව | 6,500.0 |
| 2023 | ගොවි භාරකාර අරමුදල | 250.0 |
| 2024 | ගොවි භාරකාර අරමුදල | 100.0 |
| | භාණ්ඩාගාරය (රේඛීය අමාත්‍යාංශය හරහා) | 577.0 |
| 2025 | භාණ්ඩාගාරය (රේඛීය අමාත්‍යාංශය හරහා) | 6,308.5 |
| මුළු එකතුව | | 23,015.5 |

(ii) මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 48,000

වෙන් කරන ලද මුදල - රුපියල් මිලියන 6,000

(iii) ඔව්. භාණ්ඩාගාරය විසින් සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට වී මිල දී ගැනීම සඳහා සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ණය මුදල් ලබා දෙනු ලැබේ.

(iv) ඔව්. වී අලෙවි මණ්ඩලය මගින් මිල දී ගන්නා වී තොගවලින් කොටසක් ආරක්ෂිත තොගයක් ලෙස තබා ඉතිරි වී තොග වෙළෙඳ පොළ අවශ්‍යතාව පරිදි සුළු හා මහා පරිමාණ වී මෝල් හිමියන් හරහා සහල් බවට පත් කර ලංකා සතොස සහ සමුපකාර ජාලය හරහා වෙළෙඳ පොළට නිකුත් කිරීමේ යන්ත්‍රණයක් සකස් කර ඇත.

(v) නැත.

(ආ) (අ) (v) වන කොටස සඳහා රජය විසින් වී මිලදී ගැනීමේ අරමුණ වන්නේ ආරක්ෂිත වී තොගයක් පවත්වා ගැනීම සහ වී ගොවීන්ට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා දීමයි.

ඉදිරියේදී මේ අරමුණු සාර්ථකව ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වී තොග වී අලෙවි මණ්ඩලය මගින් මිලදී ගැනීමටත්, වී තොග රැස් කිරීම නියාමනයටත් වී අලෙවි මණ්ඩලය ක්‍රියා කරන බැවින් පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව වී මිලදී ගැනීමේ යන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සැලසුමක් නොමැත.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස සහ ප්‍රා.ලේ. කොට්ඨාස: විස්තර
## திருகோணமலை மாவட்டத்திலுள்ள தேர்தல் தொகுதிகளும் பிரதேச செயலகப் பிரிவுகளும்: விபரம்
## ELECTORAL DIVISIONS AND DS DIVISIONS IN TRINCOMALEE DISTRICT: DETAILS

1554/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා ( ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு இம்ரான் மஹ்ரூப் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Imran Maharoof)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ -

(i) ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල කවරේද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය සහ ඒවායේ ජනවාර්ගික සංයුතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙන මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව සහ ඒවා කවරේද;

(ii) එම කොට්ඨාසවල ජනගහනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුතූර් සහ ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයන්ගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක බැගින්ද, සේරුවිල මැතිවරණ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක්ද පිහිටුවා ඇති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාව කථා කරන ජනතාව බහුලව ජීවත් වන ප්‍රදේශවලට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේදී, අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) ඉදිරියේදී, නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීමේදී, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවට, කින්නියා ප්‍රාදේශීය සභාව සහ තෝපූර් උප-ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ සඳහා, වෙන වෙනම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමට පියවර ගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) திருகோணமலை மாவட்டத்திலுள்ள -

(i) பிரதேச செயலங்கள் யாவை என்பதையும்;

(ii) ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் உள்ள சனத்தொகை மற்றும் இன விகிதாசாரம் வெவ்வேறாக யாது என்பதையும்;

(iii) ஒவ்வொரு பிரதேச செயலகத்துக்கும் உரித்தான கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) திருகோணமலை மாவட்டத்தில் அமைந்துள்ள தேர்தல் தொகுதிகளின் எண்ணிக்கை யாது என்பதையும், அவை யாவை என்பதையும்;

(ii) மேற்படி தொகுதிகளில் காணப்படும் சனத் தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மூதூர் மற்றும் திருகோணமலை தேர்தல் தொகுதிகளில் தலா இரண்டு பிரதேச செயலகங்களும் சேருவில தேர்தல் தொகுதியில் ஆறு பிரதேச செயலகங்களும் அமைந்துள்ளமையை அறிவாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) திருகோணமலை மாவட்டத்தில் தமிழ் பேசும் மக்கள் செறிந்து வாழும் பிரதேசங்களுக்கான பிரதேச செயலகங்களை நிறுவும்போது அநீதி இழைக்கப்பட்டுள்ளமையை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) எதிர்காலத்தில் புதிய பிரதேச செயலகங்களை நிறுவும்போது திருகோணமலை பட்டினமும் சூழலும் பிரதேச சபை, கிண்ணியா பிரதேச சபை மற்றும் தோப்பூர் உப பிரதேச செயலகப் பிரிவுக்குரித்தான பிரதேசங்களுக்குத் தனித்தனி பிரதேச செயலகங்களை அமைப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House the -

(i) names of the Divisional Secretaries' Divisions in the Trincomalee District;

(ii) population and the ethnic composition of each of those Divisional Secretaries' Divisions, separately; and

(iii) number of Grama Niladhari Divisions belonging to each of those Divisional Secretaries' Divisions, separately?

(b) Will he also inform this House -

(i) the number of electoral divisions in the Trincomalee District and the names of those divisions;

(ii) the population of each of those divisions separately; and

(iii) whether he is aware that two Divisional Secretaries' Divisions have been established in each of the Electoral Divisions of Mutur and Trincomalee and six Divisional Secretaries' Divisions have been established in the Seruwila Electoral Division?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(c) Will he further inform this House whether -

(i) he admits that some injustice has been caused in the establishment of Divisional Secretaries' Divisions for the areas where the majority are Tamil-speaking in the Trincomalee District; and

(ii) steps will be taken to establish separate Divisional Secretaries' Divisions for the areas coming under the Trincomalee Town and Gravets Pradeshiya Sabha, Kinniya Pradeshiya Sabha and Thopur Sub-Divisional Secretary's Division in the future when establishing new Divisional Secretaries' Divisions?

(d) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1. කන්තලේ
2. සේරුවිල
3. මොරවැව
4. වෙරුගල්
5. ගෝමරන්කඩවල
6. පදවි ශ්‍රී පුර
7. තඹලගමුව
8. ත්‍රිකුණාමලය නගර හා කඩවත්
9. කුච්චවේලි
10. මුතූර්
11. කින්නියා

(ii)

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජනගහනය | ජනවාර්ගික සංයුතිය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | ලංකා දෙමළ | ඉන්දියා දෙමළ | මුස්ලිම් | බර්ගර් | වෙනත් |
| කන්තලේ | 63,493 | 51,937 | 2,296 | 0 | 9,235 | 25 | 0 |
| සේරුවිල | 18,600 | 11,646 | 3,241 | 0 | 3,713 | 0 | 0 |
| මොරවැව | 9,532 | 6,421 | 1,460 | 1 | 1,641 | 0 | 9 |
| වෙරුගල් | 16,092 | 3 | 15,914 | 0 | 7 | 0 | 168 |
| ගෝමරන්කඩවල | 9,393 | 9,348 | 40 | 2 | 0 | 0 | 3 |
| පදවි ශ්‍රී පුර | 13,534 | 13,527 | 7 | 0 | 0 | 0 | 0 |
| තඹලගමුව | 38,274 | 8,753 | 6,529 | 0 | 22,992 | 0 | 0 |
| ත්‍රිකුණාමලය නගර හා කඩවත් | 115,308 | 20,961 | 74,336 | 36 | 18,366 | 1,481 | 128 |
| කුච්චවේලි | 43,869 | 905 | 13,307 | 0 | 29,657 | 0 | 0 |
| මුතූර් | 80,235 | 264 | 29,001 | 24 | 50,870 | 2 | 74 |
| කින්නියා | 92,321 | 5 | 4,335 | 0 | 87,949 | 0 | 32 |

(iii) ඔව්.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන |
|---|---|
| කන්තලේ | 23 |
| සේරුවිල | 16 |
| මොරවැව | 10 |
| වෙරුගල් | 10 |
| ගෝමරන්කඩවල | 10 |
| පදවි ශ්‍රී පුර | 10 |
| තඹලගමුව | 12 |
| ත්‍රිකුණාමලය නගර හා කඩවත් | 42 |
| කුච්චවේලි | 24 |
| මුතූර් | 42 |
| කින්නියා | 31 |

(ආ) (i) මැතිවරණ කොට්ඨාස ගණන - 03
1. සේරුවිල
2. ත්‍රිකුණාමලය
3. මුතූර්

(ii)

| | මැතිවරණ කොට්ඨාසය | ජනගහනය |
|---|---|---|
| 1 | සේරුවිල | 130,644 |
| 2 | ත්‍රිකුණාමලය | 197,451 |
| 3 | මුතූර් | 172,556 |
| | එකතුව | 500,651 |

(2024 දත්තවලට අනුව)

(iii) ඔව්.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අයත් මැතිවරණ කොට්ඨාසය |
|---|---|
| කන්තලේ | සේරුවිල |
| සේරුවිල | |
| මොරවැව | |
| වෙරුගල් | |
| ගෝමරන්කඩවල | |
| පදවි ශ්‍රී පුර | |
| තඹලගමුව කොටසක් | |
| ත්‍රිකුණාමලය නගර හා කඩවත් | ත්‍රිකුණාමලය |
| කුච්චවේලි | |
| තඹලගමුව කොටසක් | |
| මුතූර් | මුතූර් |
| කින්නියා | |
| තඹලගමුව කොටසක් | |

** ඉහත මැතිවරණ කොට්ඨාස 03 සඳහාම තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් කොටසක් අයත් වේ.

(ඇ) (i) පිළිනොගනී.

(ii) "2012 සහ 2021 වර්ෂයන්හි පැවති සීමා නිර්ණය කමිටු නිර්දේශයන් නැවත සලකා බැලීම සඳහා නව කමිටුවක් පත් කිරීම සහ එම කමිටුව විසින් ලබා දෙන නිර්දේශ අනුව, නව

පරිපාලනමය සීමාවන් ගැසට් කිරීම" සම්බන්ධයෙන් 2025 අගෝස්තු 04 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද සන්දේශය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති 2025 අගෝස්තු මස 12 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණ අංක අමප/25/1344/816/056 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2012 සීමා නිර්ණය කමිටු නිර්දේශයන්ද පදනම්ව 2021 වර්ෂයට අදාළව ක්‍රියාත්මක වූ සීමා නිර්ණය කමිටුව මඟින් ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් නැවත සලකා බැලීමට නියමිත අතර, එහිදී මේ සම්බන්ධයෙන් සලකා බැලිය හැකිය.

(ඈ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය, 2025.09.10වන දින ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## 2025.09.10 දින ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර

## 2025.09.10ஆம் திகதி மாண்புமிகு அஜித் பீ. பெரேராவால் விடுக்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது விடை

## QUESTION POSED BY HON. AJITH P. PERERA ON 10.09.2025: REPLY BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා විසින් අසනු ලැබූ ප්‍රශ්නයේ 1 සිට 4 දක්වා කොටස්වලට අදාළ පිළිතුරු ගරු අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනවා ඇති.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

01. ඔව්.

02. ඉහත සඳහන් නඩු සම්බන්ධයෙන් 2025 ජූලි 24 දිනැති නඩු තීන්දුව යටතේ එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ලියාපදිංචි හිමිකරු වන ESO RO (Pte.) Limited සහ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන Killiney Shipping (Pvt.) Limited සහ Sea Consortium (Pvt.) Limited යන සමාගම් විසින් මෙන්ම එහි දේශීය නියෝජිතයා වන Sea Consortium Lanka (Pvt.) Limited විසින්, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ සිද්ධිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසරයට සිදු වූ හානිය සඳහා එක්ව හා වෙන් වෙන්ව වගකීම දැරිය යුතු බවත්, සමුද්‍රීය හා වෙරළබඩ පාරිසරික හානිය මඟින් සිදු වූ පාඩුව සහ දූෂණයට පත් වූ පරිසරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන මූලික ගෙවීමක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියනයක වන්දි මුදලක් ගෙවන ලෙස නියෝග කර ඇති අතර, එම මුදල භාණ්ඩාගාර ලේකම් වෙත ගෙවන ලෙස වැඩිදුරටත් නියෝග කර තිබෙනවා.

ඒ අනුව, එහි දේශීය නියෝජිතයා වන Sea Consortium Lanka (Pvt.) Limited විසින් රුපියල් මිලියන 300ක (ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1ක) මුදලක් ගෙවා ඇති බව එහි කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් දිවුරුම් ප්‍රකාශයක් මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබෙනවා.
2025.07.24වන දින ලබා දුන් නඩු තීන්දුවේ සඳහන් නියෝගය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය විමසීමට 2025.09.25වන දින ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් ඉදිරියේ කැඳවූ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් MV X-Press Pearl වන්දි කොමිසම සහ MV X-Press Pearl සමුද්‍රීය සහ වෙරළබඩ පරිසරය ප්‍රතිස්ථාපනය සහ ආරක්ෂා කිරීමේ කමිටුව යන ආයතන දෙකට ස්වාධීන විශේෂඥයින් පත් කිරීමට නියෝග කර ඇත. ඒ අනුව, ඉදිරිපත් වී ඇති නාම යෝජනා මත වන්දි කොමිසමට විශේෂඥයින් පස්දෙනෙකුත්, සමුද්‍රීය සහ වෙරළබඩ පරිසරය ප්‍රතිස්ථාපනය සහ ආරක්ෂා කිරීමේ කමිටුවට විශේෂඥයින් හයදෙනෙකුත් පත් කරලා තිබෙනවා.

2025.07.24 දිනැති නඩු තීන්දුව මඟින් වන්දි කොමිසමේ සභාපති ලෙස විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මහතා සහ සමුද්‍රීය සහ වෙරළබඩ පරිසරය ප්‍රතිස්ථාපනය සහ ආරක්ෂා කිරීමේ කමිටුවේ සභාපති ලෙස පරිසර අමාත්‍යාංශයේ ලේකම් පත් කර තිබෙනවා.

තවද, පෙත්සම්කරුවන් විසින් ගොනු කරන ලද ඉල්ලීම් ද සලකා බලා තීන්දුවට අනුකූල වීම සහතික කිරීම පිණිස නීතියෙන් සුදුසු යැයි සැලකෙන නිශ්චිත පියවර ගන්නා ලෙසත්, 2026 ජනවාරි 25වන දින හෝ ඊට පෙර, ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට වාර්තා කරන ලෙසත් නීතිපතිවරයාට නියෝග කර තිබෙනවා.

ඒ අනුව මෙම නඩුව 2026 ජනවාරි 26වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේදී නැවත සලකා බැලීමට නියමිතයි.

03. පහත නම් සඳහන් විත්තිකරුවන් හයදෙනෙකුගෙන් වන්දි ඉල්ලා, ශ්‍රී ලංකා රජය විසින් 2023 අප්‍රේල් 25වන දින හෝ ඊට ආසන්න දිනයකදී සිංගප්පූරුවේ නඩු කටයුතු පවරා ඇති අතර, Sea Consortium (Pvt.) Limited ඇතුළුව විත්තිකරුවන් හයදෙනෙක් ඉන්නවා.

ඉන් අනතුරුව විත්තිකරුවන් විසින් 2024 ජූලි 01වන දින හෝ ඊට ආසන්න දිනකදී ඔවුන්ගේ විත්ති වාචක සහ හරස් ඉල්ලීම් ගොනු කර ඇති බවත්, ශ්‍රී ලංකා රජයේ හරස් උත්තරය සහ විත්තියේ හරස් ඉල්ලීම 2024 සැප්තැම්බර් 09වන දින හෝ ඊට ආසන්න දිනකදී ගොනු කරන ලද බවත්, ලන්ඩනයේ ගොනු කරන ලද සීමා කිරීමේ ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, 2024 නොවැම්බර් 15වන දින හෝ ඊට ආසන්න දිනකදී සිංගප්පූරුවේ විභාග වූ නඩුව තාවකාලිකව අත්හිටුවා ඇති බවත් ගරු නීතිපතිවරයා විසින් දන්වා තිබෙනවා.

04. එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර 2021.12.09වන දින හෝ ඊට ආසන්න දිනකදී පහත සඳහන් අයදුම්කරුවන් හයදෙනා විසින් අද්මිරාල්ටි අධිකරණයේ සීමා කිරීමේ නඩු කටයුතු ආරම්භ කර ඇති බව නීතිපති වාර්තා අනුව දන්වා තිබෙනවා. Sea Consortium (Pvt.) Limited ඇතුළු තවත් පස්දෙනෙකු විසින් මේ සීමා කිරීමේ නඩු පවරා තිබෙනවා.

[ගරු නිතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

මෙම නඩුව ගොනු කර තිබෙන්නේ, Bengal Tiger Line (Pvt.) Limited සහ 2021 මැයි 20වන දින සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ කොළඹදී MV X-Press Pearl නෞකාවෙන් සිදු වූ අනතුර හේතුවෙන් අලාභ හෝ හානි සිදු වූ බව පවසන අනෙකුත් සියලුම තැනැත්තන්ට එරෙහිවයි.

2023 ජූලි 27වන දින හෝ ඊට ආසන්න දිනකදී, එකී සීමා කිරීමේ ක්‍රියාමාර්ගයේදී එම අද්මිරාල්ටි අධිකරණය විසින් පොදු සීමා කිරීමේ නියෝගයක් නිකුත් කර ඇති අතර, එම නියෝගය පිළිබඳ දැන්වීම අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, 2024 ජනවාරි 27වන දින හෝ ඊට ආසන්න දිනකදී ශ්‍රී ලංකා රජය විසින් එකී තීන්දුව අවලංගු කරන ලෙස ඉල්ලීමක් ගොනු කර ඇති අතර, දැනට එය විභාග වෙමින් පවතින බවද තවදුරටත් දන්වා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයේ 5වන කොටසට පිළිතුර මෙසේයි.

05. මෙයට අදාළ කරුණු එම නඩු තීන්දුවේ උපදෙස් මඟින් ද ආවරණය වේ. (විශේෂයෙන්ම 897 (xiii) සහ 897 (xiv) පරිච්ඡේදවල සඳහන් කර ඇති පරිදි). ඉහත 02වන ප්‍රශ්නයට අදාළ පිළිතුරේ සඳහන් කළ පරිදි, මේ සම්බන්ධයෙන් ගත් පියවර පිළිබඳව 2025 සැප්තැම්බර් 25වන දින ශ්‍රේෂ්ඨාධිකරණයට වාර්තා කරන ලද අතර, සමුද්‍ර පරිසර ආරක්ෂණය, වෙරළ සංරක්ෂණය පිළිබඳ කටයුතු කරනු ලබන ආයතන වෙත ද, උක්ත නඩු තීන්දු මඟින් එකී සංරක්ෂණ සහ ආපදා වැළැක්වීමේ කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, පරිසර අමාත්‍යාංශය විසින් පහත පියවර ගෙන ඇත.

(i) නෞකා අනතුරුවලදී ප්ලාස්ටික් සමුද්‍රයට එකතු වීම නිසා සිදු වන සමුද්‍ර දූෂණය පාලනය සඳහා අන්තර්ජාතික ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධව ක්‍රියාත්මක වීමට අන්තර්ජාතික සමුද්‍රීය සංවිධාන මඟින් කමිටුවක් පත්කොට මේ වනවිට ඒ සඳහා කටයුතු කරමින් පවතී.

(ii) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා අදාළ පාර්ශ්වකාර ආයතන සමඟ සාකච්ඡා කර සංකල්ප පත්‍රිකාවක් සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

(iii) හදිසි තෙල් විසිරීමේ දී ක්‍රියාත්මක ජාතික සැලැස්ම වැඩිදියුණු කිරීම සඳහා එම සැලැස්මට රසායනික ද්‍රව්‍ය විසිරීමකට අදාළ කටයුතු ද ඇතුළත්කොට "හදිසි තෙල් හා රසායනික ද්‍රව්‍ය විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්ම" ලෙස සංශෝධනය කර එම කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කොට ඇත.

(iv) හදිසි තෙල් හා රසායන ද්‍රව්‍ය විසිරීමක දී ක්‍රියාත්මක ජාතික සැලැස්ම ඩිජිටල් පුවරුවක් - dashboard එකක් - ලෙස සකස් කිරීම.

(v) නෞකා අනතුරු සිදු වූ අවස්ථාවලදී කඩිනම් ප්‍රතිචාර දැක්වීමත්, අනෙකුත් සමුද්‍ර දූෂණ අවස්ථා අඛණ්ඩව අධීක්ෂණය කිරීමත් සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පැය 24 පුරා ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරියක් ආරම්භ කර ඇත.

(vi) සමුද්‍ර ආපදාවකට පත් වී ඇති නෞකාවක් ශ්‍රී ලංකා ජල තීරයට ඇතුළු කර ගැනීමට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.

(vii) දේශ සීමා හරහා සිදුවන ප්ලාස්ටික් සමුද්‍ර දූෂණය පාලනය සඳහා වැඩ පිළිවෙළක් සැකසීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, 03වැනි දා -පෙරේදා- ගරු ලක්මාලි මන්ත්‍රීතුමිය මගේ නම කියලා යම් ප්‍රකාශයක් කරලා තිබෙනවා. "දෙරණ" "Big Focus" වැඩසටහනේ විකාශය වෙච්ච දේ තමයි මම පැහැදිලි කර දුන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා නොවැම්බර් 12වැනි දා "දෙරණ" නාළිකාවේ ඒ වැඩසටහනට ඇවිල්ලා කාලගුණ තත්ත්වය ගැන විග්‍රහයක් කළා. මගේ කථාවේදී මම ඇහුවේ, ඒ කරපු ප්‍රකාශය ගැන රජය දැනුවත් වුණාද, නැද්ද කියන එක විතරයි, ගරු කථානායකතුමනි. එහෙම නැතුව රටේ ජනතාව නොමඟ යවන ප්‍රකාශයක් මම ඒ අවස්ථාවේදී කළේ නැහැ. ගරු ලක්මාලි මන්ත්‍රීතුමිය මගේ නම පාවිච්චි කරලා රටේ ජනතාව නොමඟ යවන විධියට කථා කළා. ඒක නිවැරදි කිරීමක් කරගන්න වෙනවා, ගරු කථානායකතුමනි. මම එහෙම ප්‍රකාශයක් කළේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත
### கொழும்புத் துறைமுக நகரப் பொருளாதார ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்
### COLOMBO PORT CITY ECONOMIC COMMISSION (AMENDMENT) BILL

"2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.***

***2026 ජනවාරි 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 சனவரி 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Anil Jayantha on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education;*

*to be read a Second time upon Tuesday, 06th January, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත
## இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்
## INSTITUTE OF REAL ESTATE PROFESSIONALS, SRI LANKA BILL

"ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය ප්‍රමිතීන් සහ විනය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා ද; තථ්‍ය දේපළ වෘත්තිය සම්බන්ධයෙන් වන ජනතාවගේ උනන්දුව ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2026 ජනවාරි 06වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப் பட்டது.*

*2026 சனவரி 06, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, Minister of Transport, Highways and Urban Development; to be read a Second time upon Tuesday, 06th January, 2026*

*and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.*

# පාර්ලිමේන්තුවේ කටයුතු
# பாராளுமன்ற அலுவல்
# BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සිට 25 දක්වා වන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානයන්ගෙන් සහ 2025 නොවැම්බර් 13 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 5, 6, 9, 10, 11, 17, 20 සහ 25 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
# பாராளுமன்ற அமர்வு
# SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2026 ජනවාරි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
# தனி உறுப்பினர் சட்டமூலங்கள்
# PRIVATE MEMBERS' BILLS

## ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இலங்கை விவசாய நிறுவனம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## SRI LANKA INSTITUTE OF AGRICULTURE (INCORPORATION) BILL

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Agriculture, Livestock, Land and Irrigation for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026 - කාරක සභා අවස්ථාව, විසිවන වෙන් කළ දිනය.

# විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-*
*[ප්‍රගතිය: දෙසැම්බර් 03]*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.[*

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: டிசம்பர் 03]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 03rd December]*
*[HON. SPEAKER in the Chair.]*

**116 වන ශීර්ෂය.- වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 500,000,000

**தலைப்பு 116.- வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 500,000,000

HEAD 116.- MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 500,000,000

**135 වන ශීර්ෂය.- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,668,000000,

**தலைப்பு 135.- பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 1,668,000.00

HEAD 135.- MINISTER OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs 1,668,000000,

**102 වන ශීර්ෂය.- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 242,642,000,000

**தலைப்பு 102.- நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 242,642,000,000

HEAD 102.- MINISTER OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 242,642,000,000

***ඉදිරිපත් කරන ලද සංශෝධනය: [දෙසැම්බර් 03] "වැඩසටහන රුපියල් 10කින් කපා හැරිය යුතුය." [ගරු ගයන්ත කරුණාතිලක මහතා]***

*எடுத்தியம்பப்பட்ட திருத்தம்: [டிசம்பர் 03] "நிழ்ச்சித்திட்டம் 10 ரூபாயால் குறைக்கப்படுமாக." [மாண்புமிகு கயந்த கருணாதிலக்க]*

*Amendment proposed: [03rd December] "That the Programme be reduced by Rs. 10" [The Hon.Gayantha Karunathilleka ]*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
2026.12.03 දින කල්තබන ලද විවාදය තවදුරටත් පැවැත්වීම, මෙතැන් සිට අපර භාග 6.00 දක්වා.

විවාදය ආරම්භ කිරීම, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.48]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, කාලය තව පොඩ්ඩක් වැඩි කරලා දෙන්න.

ඇත්තවශයෙන්ම රටේ ඇති වෙච්ච තත්ත්වය උඩ මේ අය වැය අදාළ වෙන්නෙත් නැහැ කියලා කියන්න පුළුවන්. නමුත් අය වැය සම්මත කර ගන්න වෙනවා. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් මතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඊළඟ tranche එක ලබා ගැනීම සඳහාත් වන එක කොන්දේසියක් තමයි මේ අය වැය සම්මත කර ගැනීම. ඒ නිසා මේක සම්මත කර ගන්න ඕනෑ. හැබැයි, මේ සභාවට, ආණ්ඩු පක්ෂයට, විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාට අපි මතක් කරනවා, අපට ඊළඟ වසරේ වියදම් කරන්න ඕනෑ ප්‍රතිපාදන සහ මේ තිබෙන ප්‍රශ්නයත් එක්ක බැලුවාම මේ අය වැය ප්‍රමාණවත් වෙන්නේ නැහැ; අදාළ වෙන්නේ නැහැ කියන එක. ඒ නිසා වහාම - හැකි ඉක්මනින් - පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න. ජනතාවට ඕනෑ වැඩ ටික කර ගන්න, ඒ වාගේම පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන මුදල් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. අපි විපක්ෂය හැටියට එයට උපරිම සහයෝගය ලබා දෙන්න සූදානම්. මේ වෙලාවේදී රට වෙනුවෙන් කරන්න ඕනෑ, එම කර්තව්‍යය ඉටු කරන්න අපි සූදානම්.

ගරු සභාපතිතුමනි, අපි දින කිහිපයකට කලින් මේ පාර්ලිමේන්තුව වර්ජනය කළා. ඒ, වෛරීය, දුෂ්ට අරමුණකින් නොවෙයි. අපි තහවුරු කරන්න කැමැතියි, ඇයි ඒ, වර්ජනය කෙරුවේ කියලා. විපක්ෂයට කාර්යභාරයක් තිබෙනවා. ආණ්ඩුවට අවශ්‍ය වේලාවල සහය දෙන්න විපක්ෂය බැඳී සිටිනවා. ඒක අපි දන්නවා. අපේ වගකීම් හරියට ඉටු කරන්න ඕනෑ. ඒ වාගේම වැරදි තීරණ, රටට අවාසි වෙන තීන්දු, තීරණ ගන්නකොට ඒවා පෙන්වා දීම, ඒවාට විරුද්ධවීමත් විපක්ෂයේ කාර්යභාරයක් වෙනවා. මෙතැනට ඇවිල්ලා රූකඩ හැටියට, පාපිසි හැටියට වාඩිවෙලා ඉන්න අපි සූදානම් නැහැ. අපේ job එක අපි කරන්න ඕනෑ.

එදා මම කිව්වා, අපි යම් යම් තීරණ හරි වෙලාවට අරගෙන තිබුණා නම් මේ ව්‍යසනය, විනාශය අපට අවම කර ගන්න තිබුණා කියලා. එකක් තමයි, ජලය කළමනාකරණය. ඒ ගැන මම කථා කළා. ඒ ගැන කථා කරපු නිසා රටේම ඒක සංවාදයක් බවට පත් වුණා. ඒ සංවාදය තුළ මම දැක්කා, දින කිහිපයකට කලින් ප්‍රධාන TV නාළිකාවකට වාරිමාර්ග ඉංජිනේරු මහත්මයෙක් - මට මතක විධියට සූරියබණ්ඩාර මහතා - ඇවිල්ලා කථා කළා. මම හිතන විධියට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා එතැන හිටියා. සූරියබණ්ඩාර මහත්මයාගේ වචනවලින්ම කිව්වොත්, එතුමා කියනවා, "ස්වයංක්‍රීයව වාන් දොරටු ඇරෙන්නේ නැහැ. හැබැයි, ගංවතුරක් එන වෙලාවක අපි දන්නවා නම්, විශාල වර්ෂාවක් එනවා කියලා automatically වෙනකම් හරියන්නේ නැහැ, සමහර විට manually හරි කලින්ම පුළුවන් ද කියලා අපි බලනවා. අරකත් එක්ක ගළපා ගන්නවා" කියලා. එතුමා එහෙම කිව්වා. එතකොට ඒ මහතා ඒ සාකච්ඡාවේදීත් කියනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 12වැනි දා යම්කිසි නාළිකාවකදී කරන ලද පුරෝකථනය එතැනදී සැලකිල්ලටත් ගත් බව. ඇත්තටම 12වැනි දා පුරෝකථනයක් කරනවා, මෙහෙම දෙයක් වෙන්න පුළුවන් කියලා. ඒකත් සැලකිල්ලට ගත්තා කියලා එතුමා කියනවා. නමුත්, red alert එකක් ආපු නැති නිසා මුකුත් කළේ නැහැ.

ඊළඟට එතුමා කියනවා, "නොවැම්බර් 17 සහ 18වැනි දා වෙනකොට මෙවැනි තත්ත්වයක් සම්බන්ධයෙන් යම්කිසි නැඹුරුවක් තිබෙන බව අපි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මෙන්ඩිස් මහතා සමඟ සාකච්ඡා කළා" කියලා. එතකොට නොවැම්බර් මාසයේ 17 සහ 18 දිනවල සාකච්ඡාවක් පවත්වලා තිබෙනවා මෙවැනි තත්ත්වයකට යම්කිසි නැඹුරුවක් තිබෙන බවට. එතකොටත්, යම්කිසි අවදානමක් තිබෙනවා කියලා ඒ ගැන සොයා බලන්න ඒගොල්ලන්ට වෙලාව තිබුණා. එතුමා නැවත කියනවා, 23වැනි දා -ඉරිදා- වෙනකොට වැඩි වර්ෂාපතනයක් එනවා කියලා දැනගත්තා කියලා. වැඩි වර්ෂාපතනයක් එනවා කියලා නොවැම්බර් මාසයේ 23වැනි දාත් දැන ගත්තා. ඒ වෙලාවේදී රජයේ වගකීම මොකක්ද? ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන එක නේද?

එතුමා ඊළඟට කියනවා, 24වැනි දා Disaster Management Centre එක එක්ක Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා කළා කියලා, "මෙන්න මේ වාගේ තත්ත්වයක් එනවා, මොකක්ද අපි කරන්නේ?" කියලා. පැහැදිලිව ඒ වන කොට BBC එකෙන් ප්‍රකාශයක් කරනවා, මිලිමීටර් 400ක, 500ක වර්ෂාවක් ශ්‍රී ලංකාවට එනවා කියලා. අනතුරු ඇඟවීමක් කරනවා. ජාත්‍යන්තර මාධ්‍යවලින්, ආයතනවලින් මේක කියනවා. හැබැයි, ඇයි අපි අක්‍රිය වුණේ? Why was there no action? නිලධාරින්ට යන්න පුළුවන් දුරක් තිබෙනවා. අපට නිලධාරින්ට දොස් කියන්න බැහැ. ඒගොල්ලන්ට තීරණ ගන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා.

මොකද, ඒගොල්ලන් එම වගකීම දැන් ගන්නේ නැහැ. දේශපාලන නායකත්වයයි මෙතැනට ඕනෑ. ඒ දේශපාලන නායකත්වය මේ රජයෙන් දුන්නාද, නැද්ද කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ක්‍රමවේදය ක්‍රියාත්මක වෙන්න ඕනෑ, ඒ දේශපාලන නායකත්වය තුළයි. රජය ඒ නායකත්වය දුන්නාද කියන ප්‍රශ්නය තිබෙනවා. මෙතැනදී විපක්ෂය හැටියට අපි සඳහන් කරන්න කැමැතියි, නැවත මෙවැන්නක් සිදු නොවන තැනට වැඩ කටයුතු කළ යුතු බව.

2005 වසරේදී ආපදා කළමනාකරණ පනත සම්මත කළා. ඒ කියන්නේ, මෙවැනි අවස්ථාවකදී කටයුතු කිරීම සඳහා වූ පනතක් සම්මත කළා. ඒ තමයි, 2005දී සම්මත කළ ආපදා කළමනාකරණ පනත. එම පනතට අනුව ආපදා කළමනාකරණ කවුන්සලය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් -National Disaster Management Plan එකක්- සකස් කළ යුතුයි. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා 2024 පෙබරවාරි මාසයේදී, 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගත්තා. මේ ආණ්ඩුව 2025 ජුනි මාසයේ එම සැලැස්ම ගැන වැඩමුළුවකුත් පැවැත්වූවා, ආරක්ෂක ලේකම්ගේ ප්‍රධානත්වයෙන්. ඒ කියන්නේ එම සැලැස්ම තිබෙනවා, ඒක අනුමත කරලා තිබෙනවා.

එතකොට ආපදා කළමනාකරණ කවුන්සලය; ආපදා පිළිබඳ ප්‍රධාන වගකීම් කමිටුව රටේ තිබෙනවා. ආපදා කළමනාකරණ කවුන්සලය - National Council for Disaster Management - තමයි මේ සම්බන්ධයෙන් රටේ තිබෙන ඉහළම යාන්ත්‍රණය. ඒකේ ප්‍රධානියා හැටියට ඉන්නේ ජනාධිපතිතුමා. එහි දෙවනුව ඉන්නේ අගමැතිවරිය. තුන්වනුව ඉන්නේ විපක්ෂ නායකතුමා. ඒකේ ඉන්නවා, ප්‍රධාන කැබිනට් ඇමතිවරුන් 20දෙනෙක්. ඊළඟට, ඒකේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 5දෙනෙක් ඉන්නවා. ඒ සංයුතියත් එක්ක, ඒ කවුන්සලයට තමයි වැඩිම බලය තිබෙන්නේ ආපදාවක් කළමනාකරණය කරන්න.

2018 යහ පාලන ආණ්ඩුව පැවැති කාලයේ තමයි අන්තිමට මේ ආපදා කළමනාකරණ කවුන්සලය රැස්වන්නේ. ඊට පසුව අවුරුදු 7කින් මේ කවුන්සලය රැස්වෙලා නැහැ. හැබැයි, 2025 අගෝස්තු මාසයේ අතිගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා

[ගරු කබීර් හෂීම් මහතා]

අවුරුදු 7කට පසුව මෙම කවුන්සලය කැඳෙව්වා. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. එතුමා එම කවුන්සලය කැඳවා, සාකච්ඡා කරලා ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම නැවත අනුමත කර තිබෙනවා, "මේ සැලැස්ම තිබෙනවා, මේක ක්‍රියාත්මක කරන්න, මේ සැලැස්ම තමයි භාවිත කරන්නේ" කියලා. ඒකත් ඒ විධියට සිදු වෙලා තිබෙනවා. එහෙමත් තිබියදී, පසුගිය 12වැනි දා මෙම ව්‍යසනය ගැන අනතුරු ඇඟවීමක් කර තිබියදී, අවදානම් තත්ත්වයක් තිබෙනවා කියන එක නොවැම්බර් මාසයේ 17 සහ 18 කියන දෙදින තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් කියා තිබියදී, අවදානම් තත්ත්වයක් පවතිනවා කියා නොවැම්බර් 23වැනි දාත් සඳහන් කර තිබියදී, ජනාධිපතිතුමා ආපදා කළමනාකරණ කවුන්සලය කැඳවා ඒ ගැන සාකච්ඡා කළේ නැත්තේ ඇයි?

එය කැඳෙව්වා නම් ජනාධිපතිතුමා, අගමැතිතුමිය, විපක්ෂ නායකතුමා, ඇමතිවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු ඒ අදාළ ආයතන ප්‍රධානින්, හමුදාවේ ප්‍රධානින් එකට හමු වෙනවා. එහෙම වුණා නම් මේ ආපදාව වළක්වා ගන්න, අවම කරගන්න අවශ්‍ය පියවර ගන්න තිබුණා. හැබැයි ඒක කළේ නැහැ. ගරු සභාපතිතුමනි, ඒක කරලා තිබුණා නම් හදිසි ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න තිබුණා. A state of disaster should have been declared. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත තුළ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තිබෙනවා. මම කියවන්නම්, ඒ පනතේ 11 වැනි වගන්තිය. එහි මෙසේ සඳහන් වී තිබෙනවා:

> "යම් අවස්ථාවක, ව්‍යසනයක හෝ ආසන්නතම ව්‍යසනයක ප්‍රමාණය හෝ බරපතලකම කොතෙක් විශාල වේ ද, නැතහොත්, විශාල විය හැකි ද යත්, ඒ ව්‍යසනය හෝ ආසන්නතම ව්‍යසනය මැඩපැවැත්වීම සඳහා අවශ විය හැකි ප්‍රතිපියවර කිසිවක් සාමාන්‍යයෙන් පරිපාලනයට ලබාගත හැකි සම්පත් හෝ වත්කම් ඉක්මවා යතොත්, ජනාධිපතිවරයා විසින්, ජනාධිපතිවරයාගේ මෙහෙයවීමෙන් ම හෝ සභාවේ උපදෙස් මත කරනු ලබන ප්‍රකාශනයක් මගින්, ඒ ප්‍රකාශනයේ සඳහන් යම් ප්‍රදේශයක් හෝ ප්‍රදේශ සම්බන්ධයෙන්, නැතහොත්, මුළු රටේම ව්‍යසන තත්ත්වයක් පවතින බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය."

මෙච්චර අවදානම් තත්ත්වයක් තිබියදී ව්‍යසන තත්ත්වයක්; emergency නොවෙයි, ව්‍යසන තත්ත්වයක් -a state of disaster- නොවැම්බර් 17වැනි දා, නොවැම්බර් 18වැනි දා, නැත්නම් නොවැම්බර් 23වැනි දා හෝ ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවා නම්, මේ ව්‍යසනයෙන් සිදු වෙච්ච හානිය අවම කර ගන්න අවස්ථාව තිබුණා කියන එකයි අපේ හැඟීම. එහෙම නම්, මේ සඳහා දේශපාලන නායකත්වයක් දීලා නැහැ කියන එක පැහැදිලිව පෙනෙනවා.

ගරු සභාපතිතුමනි, මේ 2005 පනතක්. නමුත් "a state of disaster" කියන එක හරියට ප්‍රකාශයට පත් කළේ නැහැ. ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න නම්, ජනාධිපතිතුමා ආපදා කළමනාකරණ කවුන්සලය කැඳවා තිබෙන්න ඕනෑ. එහෙම වුණා නම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානින් ඔක්කෝම ඒකට සහභාගි වෙනවා. ඒ නිලධාරින් දැන් කියන්නේ මොකක්ද? ඒගොල්ලන් තීරණ ගන්න පැකිළුණා. වාන් දොරටු අරිනවාද නැද්ද, මොකක්ද කරන්නේ කියලා ඒගොල්ලන්ට තනියෙන් තීරණය කරන්න බැහැ. හැබැයි ඒ කවුන්සලය කැඳෙව්වා නම් ජනාධිපතිතුමාට, ඇමතිවරුන්ට කියන්න තිබුණා, මෙන්න මේ පියවර ගන්න, මේ තත්ත්වය වළක්වා ගන්න මේ විධියට රට සූදානම් කරන්න කියලා. හැබැයි ඒක කළේ නැහැ.

එතකොට ඒකෙන් පැහැදිලියි, රජය ෆේල් වුණා කියන එක. ඒක තමයි අප මේ කියන්නේ. එය කැඳවා තිබුණා නම්, ජල කළමනාකරණය සිදු කරන්න තිබුණා; NBRO එක පෙන්වා තිබෙන නායයාමේ අවදානම සහිත ප්‍රදේශවල මිනිසුන් ඒ ස්ථානවලින් ඉවත් කරන්න තිබුණා; හමුදාව සූදානම් කරලා ස්ථානගත කරන්න තිබුණා; ඒ වාගේම, මිනිසුන් දැනුවත් කිරීම සඳහා මාධ්‍ය භාවිත කරන්න තිබුණා. මාධ්‍ය හරහා කිසිම පණිවුඩයක් ලබා දුන්නේ නැහැ. මාධ්‍ය භාවිත කරලා අනතුරු ඇඟවීම් ප්‍රකාශ සිදු කරන්න තිබුණා. ගරු සභාපතිතුමනි, මෙහි system එකක් තිබෙනවා. ඒ තමයි, Cell Broadcast කියන එක. Cell Broadcast කියන එක ලංකාවේ තිබෙනවා. It is a powerful system for sending urgent alerts like disaster warnings to all mobile phones in a specific geographic area instantly bypassing network congestion and Internet, appearing as a special text message with loud tones even on locked phones. කඳුකර ස්ථානවල ඉන්න, අවදානම් තැන්වල ඉන්න ජනතාවට මේ Cell Broadcast ක්‍රමය තුළ පණිවුඩ යවන්න තිබුණා, "ඉවත් වෙන්න, අයින් වෙන්න, මෙහෙම අනතුරුදායක තත්ත්වයක් ඇති වෙනවා" කියලා. නමුත්, ඒවා පාවිච්චි කළේ නැහැ; මාධ්‍ය භාවිත කළේ නැහැ; මිනිසුන් දැනුවත් කළේ නැහැ. මේක බරපතළයි. Prevention and mitigation action was not taken. That is what the Opposition was trying to say. That day we needed a debate to talk about it, because then you could have moved on to recovery. But, these issues led to an unprecedented destruction of both life and property. So, somebody has to take responsibility.

අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වෙන්න කලින් විපක්ෂයේ සිටියදී කොවිඩ්-19 වසංගතය පැවැති කාලයේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගෙන් ඇහුවා, කොවිඩ්-19 වසංගත තත්ත්වය ඇතිවී තිබියදීත් ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ නොකරන්නේ ඇයි කියලා. එසේ නොකිරීම ගැන එතුමා දිගටම විවේචනය කළා. ව්‍යසන තත්ත්වයක් - a state of disaster - ප්‍රකාශ කරන්න කියලා එතුමා කිව්වා; ඒක එතුමා දිගින් දිගටම කිව්වා.

ඊළඟට මම තව ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have two more minutes.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Could I have a few more minutes, Hon. Gayantha Karunathilleka?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Three more minutes.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Okay.

ගරු සභාපතිතුමනි, National Disaster Management Committee එක ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දෙවරක් රැස් වුණා, මේ ප්‍රශ්නයෙන් පසුව. දැන් අරමුදලක් පිහිටුවා, ඒ අරමුදලට පෞද්ගලික අංශයේ ලොක්කෝ කණ්ඩායමක් පත් කර

තිබෙනවා. ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒ පිළිබඳව දැන් කරුණු ඉස්මතු කළා. එහෙම අරමුදල් හදන්න බැහැ. අරමුදල් දෙකක් තිබෙනවා. අපේ ඒකාබද්ධ අරමුදල - Consolidated Fund එක - Central Bank එක යටතේ තිබෙන fund එකක්. ඒක private sector එකට කළමනාකරණය කරන්න දෙන්න බැහැ. මේ National Council for Disaster Management - NCDM - යටතේ ඇමතිවරු 20 දෙනෙක් ඉන්නවා. ඒ අය සිටියදී වෙනත් අය පත් කරන්නේ, එනම් private sector එකේ අය disaster management අරමුදලක ප්‍රධානීන් හැටියට පත් කරන්නේ තම ඇමතිවරුන් ගැන ජනාධිපතිතුමාට විශ්වාසයක් නැද්ද?

අපට පොඩි සැකයක් තිබෙනවා, disaster managementත් privatize කරන්න යනවාද කියලා; ආපදා කළමනාකරණයත් පෞද්ගලීකරණය කරන්න යනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ව්‍යාපාරිකයන්ට පුළුවන් සල්ලි හොයලා දෙන්න. හැබැයි, එම අරමුදල තිබෙන්න ඕනෑ පාර්ලිමේන්තුවේ oversight එක යටතේ. පාර්ලිමේන්තුව එය අනුමත කරන්න ඕනෑ. මෙහිදී එහෙම දෙයක් වෙලා නැහැ. මේ ආණ්ඩුවේ ආපදා කළමනාකරණය පිළිබඳව පැන නඟින ප්‍රශ්නයක් තිබෙනවා. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා 2022දී විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට සිටියදී ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 17වන වගන්තිය quote කරමින් කිව්වා, "ඒකාබද්ධ අරමුදලින් ව්‍යසනයකට වියදම් කරන මුදල් සභාවේ අරමුදලක් හරහා වියදම් කරන්න පුළුවන්. එතකොට ඒකෙන් ජාවාරම් කරන්න බැහැ" කියලා. එතුමාම 2022දී එහෙම කියලා අද එම අරමුදල ජාවාරම්කරුවන්ටම භාර දීලා තිබෙනවා. දැන් ඒක කොහොමද වෙන්නේ? මෙතැනදී ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා.

ගරු සභාපතිතුමනි, විපක්ෂය සූදානම් මේ කටයුතුවලට උපරිම සහාය දෙන්න. මොකද, මෙය ජාතික ප්‍රශ්නයක්. අපි එකට සිටගත යුතුයි. අපි මෙතැනදී පසුබහින්නේ නැහැ. හැබැයි, අපි එවැනි අදහසක සිටිද්දී, සහාය දෙන්න උත්සාහ කරද්දී ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආපදා තත්ත්වය ගැන සාකච්ඡා කරන කොට අපේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාම තමයි යෝජනා කළේ, හදිසි නීතිය පනවන්න කියලා. එතුමා එය අවංකව, නිහතමානීව කිව්වා රටේ ආපදා තත්ත්වයක් තිබෙන නිසා. ජනාධිපතිතුමාත් ඒක පිළිගෙන හදිසි නීතිය පනවලා ඒ ගැන රටට ප්‍රකාශ කරන කොට කියනවා, "මේක මිනිසුන් මර්දනය කරන්න පාවිච්චි කරන්නේ නැහැ" කියලා. හැබැයි එතුමා එහෙම කිව්වාට සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා පොලීසියට කියනවා අපි දැක්කා, "මේ මාධ්‍යකරුවන් ඔක්කෝම අපට රිදෙන්න ගහනවා. ඒක අපට ලොකු වේදනාවක්. ඒ නිසා ඔවුන් ඔක්කෝම අත්අඩංගුවට ගන්න, හදිසි නීතිය පාවිච්චි කරලා" කියලා. මේක පුදුම කථාවක් නේ. මේක, රාජ්‍ය ත්‍රස්තවාදය. සමාජ මාධ්‍යවල ඉන්නේ අරගළය වෙනුවෙන් සටන් කළ අය. අර "බුරවි" සුළි කුණාටුව එනකොට ඒ තරුණ සමාජ මාධ්‍යකරුවන් තමයි ඒ ගැන දැනුවත් කිරීම් කරලා, විශාල මෙහෙවරක් කරලා ජීවිත ගොඩක් බේරලා දුන්නේ. අදත් මේ ව්‍යසනයේදී සමාජ මාධ්‍යවල ඉන්න අය බිමට බැහැලා විශාල වශයෙන් වැඩ කරනවා. ඔවුන් මර්දනය කරන්නද ඔබතුමන්ලා උත්සාහ කරන්නේ? එතකොට මේක රාජ්‍ය ත්‍රස්තවාදයක් නේ. එතකොට අපි කොහොමද විපක්ෂයක් හැටියට ඒකට සහාය දෙන්නේ?

ඔබතුමන්ලා කියනවා, විපක්ෂය මේ අවස්ථාවේ දේශපාලනය කරනවා කියලා. හැබැයි, ඔබතුමන්ලා අද කෙළින්ම ඒකාධිපති බලයක් භාවිත කරනවා නේ. දැන් හදිසි නීතිය පනවා තිබෙන්නේ ඔබතුමන්ලාගේ වේදනාව පාලනය කර ගන්නද, එහෙම නැත්නම් ජනතාවගේ වේදනාව පාලනය කරන්නද? කා වෙනුවෙන්ද ඒක කරන්නේ? ඔබතුමන්ලා කියනවා "අපේ දේශපාලනඥයන්ට ගහනවා. අපට වේදනයි. ඒ වේදනාව අඩු කරන්න හදිසි නීතිය පාවිච්චි කරලා මිනිස්සු හිරේ දාන්න" කියලා. හැබැයි, ජනතාවගේ වේදනාව අඩු කරන්න හදිසි නීතිය පාවිච්චි කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, වේලාව ප්‍රමාණවත් නොවුණත් මම මේ අවස්ථාවේ මේ ගැන කියන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා 27වන දා පාර්ලිමේන්තුවට ආවා. අපි එතුමාට උපරිම සහයෝගය දුන්නා. 27වැනි දා රෑ මේ ප්‍රශ්නය දුර දිග ගිහිල්ලා cyclone එක ඇවිල්ලා ඉවරයි. Disaster Management Centre එකක් තිබුණා. ගරු ජනාධිපතිතුමා ආරක්ෂක අමාත්‍යාංශයේදී පක්ෂ නායකයන්ගේ රැස්වීමක් 28වැනි දා කැඳෙව්වා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කණ්ඩායමකුත් ඒකට ගියා. එතැනට ගිහිල්ලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කණ්ඩායමක් ජනාධිපතිතුමාට කිව්වා, "Emergency numbers දෙකක් තිබෙනවා, ඒවාට ගත්තාට emergency centresවලින් phone එක ගන්නේ නැහැ" කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is over.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, give me just one more minute.

එතකොට ගරු ජනාධිපතිතුමාත් try කරලා කිව්වා, "ඒ phones වැඩ කරන්නේ නැහැ" කියලා. ඒ වෙනකොට ආපදාව - disaster එක - වෙලා ඉවරයි. එදා තමයි ජනාධිපතිතුමා අලුත් phone numbers දහයක් දුන්නේ. එතකොට කඳුකරවල හිටපු මිනිස්සු, ගං වතුරට ගහගෙන ගිය මිනිස්සු කාටද කතා කරන්නේ? 27වෙනි දා වෙනකොට මේ ව්‍යසනය කළමනාකරණය කිරීම සඳහා තිබෙන emergency numbers ටික වැඩ කළේ නැහැ. එතැනදී පිළිගන්නවා, "ඔව් numbers වැඩ කරන්නේ නැහැ" කියලා. 28වෙනි දා තමයි අලුත් phone numbers ටික දුන්නේ. හරි නම් මේ කළමනාකරණ කවුන්සිලය 17, 18, 23 කැඳවලා ජනාධිපතිතුමා සම්පූර්ණ බලය අරගෙන මේ කමිටුව හරහා ව්‍යසන තත්ත්වයක් - a state of disaster - ප්‍රකාශ කරලා මේ මරණ, මේ විනාශය අවම කරන්න තිබුණා. දැන් මේ recovery එක වුණත් විපක්ෂය පැත්තකට තල්ලු කරලා කරන්න බැහැ. Recovery එක හරියට කරන්න ඕනෑ. තවම මිනිස්සු කඳවුරුවල ඉන්නවා. මේක හරියට කළමනාකරණය කරන්න ඕනෑ. මේක ජාතික ව්‍යසනයක්. ඒ නිසා මේක හරියට කරන්න. මේ හරහා දේශපාලනය කරන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Anil Jayantha.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, විපතට පත් ප්‍රදේශවල මන්ත්‍රීවරු විශාල පිරිසක් බලාපොරොත්තුවෙන් ඉන්නවා අද මේ විවාදයේ අවසාන

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

දවස නිසා අදහස් ඉදිරිපත් කරන්න. ඒ විපතට පත් ප්‍රදේශවල ජනතාවට කරන සේවයක් හැටියට සලකලා දිවා ආහාරය සඳහා තිබෙන වේලාවත් විවාදයට ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු සභාපතිතුමනි. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ගරු අනිල් ජයන්ත මැතිතුමනි, ඔබතුමා වුණත් වග කිවයුතු ඇමතිවරයකු හැටියට ඒකට එකඟත්වය ලබා දෙයි කියලා මම හිතනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ආණ්ඩු පක්ෂයේ එකඟතාව අපි ලබා ගනිමු. සභානායකතුමා,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අපට ඒ වෙලාව ලබා දෙන්න, ගරු සභාපතිතුමනි. මේ ඇමතිවරුන්ට පුළුවන් නේ, ඒකට අනුමැතිය දෙන්න. අපි කෑම වෙලාවත් විවාදයට යොදා ගනිමු කියලායි ඉල්ලන්නේ, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමනි. අද අය වැය විවාදයේ අවසාන දවස. විශාල පිරිසක් ඉන්නවා, කථා කරන්න. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට පුළුවන් නේ,-

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
අද සිකුරාදා දවස,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභාපතිතුමනි, මේ ඉල්ලීම ගැන සලකා බලා දෙපැත්තටම වෙලාව ලබා දෙන්න වෙනවා. විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු ඉන්නවා කථා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
පැය භාගයක්ම විපක්ෂයට විතරක් දෙන්න බැහැ නේ, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. අපේත් ඉන්නවා කිහිප දෙනෙක් කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අද සිකුරාදා දිනයක් නිසා දිවා ආහාරය සඳහා පැයක කාලයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ එකඟතාව මොකක්ද, ගරු අමාත්‍යතුමා?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, දෙපාර්ශ්වයටම පැය භාගය ගනිමු.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අද දිවා විවේකය සඳහා වෙන් කර තිබෙන පැයක කාලය පැය භාගයකට සීමා වෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
නැහැ, නැහැ,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දිගටම විවාදය පවත්වනවා. ආණ්ඩු පක්ෂය,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මට හිතෙන විධියට පැය භාගයක් පමණක් ගන්න වෙයි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඉන්නේත් නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දිවා ආහාර විවේකය නොතකා සභාවේ කටයුතු දිගටම කරගෙන යෑමට ආණ්ඩු පක්ෂය එකඟද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි, එහෙම කරමු.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Anil Jayantha. You have 16 minutes.

[පූ.භා. 10.09]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු සභාපතිතුමනි, 2026 විසර්ජන පනත් කෙටුම්පත තුන්වන වර කියැවීමට අදාළ ඡන්ද විමසීම අද පැවැත්වීමට නියමිතයි. තවත් අමාත්‍යාංශ කිහිපයක සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ අද විවාදයට ගන්නවා. අපි කවුරුත් දන්නා පරිදි අනපේක්ෂිත විධියට අපට මුහුණ දීමට සිදු වූ ආපදා තත්ත්වය හේතුවෙන් මතු වූ කරුණු කාරණා පදනම් කරගෙන විශේෂයෙන් විපක්ෂයෙන් අදහස් දැක් වූ ගරු මන්ත්‍රීතුමා චෝදනා කිහිපයක් ඉදිරිපත් කළා. එකක්, ආණ්ඩුව ක්‍රියාත්මක වුණේ නැහැ කියන එක. නමුත්, එය වැරදි චෝදනාවක්. සාමාන්‍යයෙන් වැසි සහිත කාලයක කාලගුණ වාර්තා කිරීම් හැම දාමත් සිදු කරනවා. ඒවාට අදාළ ආයතන විසින් ඒ ගත යුතු ක්‍රියාමාර්ග අනිවාර්යයෙන්ම අරගෙන තිබෙනවා. එහෙත් මේ ඇති වූ සුළි කුණාටුව මේ වාගේ එකක් කියන එක, මෙවැනි තත්ත්වයක් එනවා කියන එක නිශ්චිතව අදාළ ආයතනවලට දැනුම් දීමක් හෝ ආණ්ඩුවට දැනුම් දීමක් සිදු වෙලා නැහැ. පොදුවේ කාලගුණය සම්බන්ධයෙන් ඇති වෙච්ච වාර්තාවක් එතැනට සම්බන්ධ කර ගැනීමකුයි තිබෙන්නේ. මේ සුළි කුණාටුව ලංකාව හරහා ගිය එක වළක්වන්න බැහැ. හැබැයි, අපේ ආණ්ඩුව මේ දේ සිද්ධ වෙච්ච වහාම වේගයෙන් මැදිහත් වෙලා, ඒ ආපදාවට ලක් වුණු සියලු පවුල් ඉවත් කරලා ඒ අවශ්‍ය කටයුතු සිද්ධ කළා. අතීතයේ සිදු කරපු අනවසර ඉදිකිරීම්, ප්‍රමිතියෙන් තොර ඉදිකිරීම් වැනි ගැටලුසහගත තත්ත්ව නිසාත් අනතුරට ලක් වෙච්ච ප්‍රමාණයක් සිටින බව අපි දන්නවා. නමුත්, අපි වේගයෙන් මැදිහත් වෙලා පළමුකොටම ඔවුන්ට අවශ්‍ය ආහාර ටික ලබා දීගා, ඔවුන් රැක බලා ගැනීමට, බේරා ගැනීමට යුහුසුලුව ක්‍රියාත්මක වුණා. හැබැයි, සමාජයේ මතයක් හැදුවා, ආණ්ඩුව මොකුත් කරන්නේ නැහැ කියලා.

නමුත්, අපේ රජය මේ සඳහා ඉතා ඉක්මනින්ම මැදිහත් වුණා කියලා මේ වෙනකොට ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන පවා පිළිගනිමින් ඉන්නවා. ඒ වගේ ඉතාම හොඳ තත්ත්වයකින් අපි මැදිහත් වෙලා තිබෙනවා.

ඒ වාගේම, ජාතික ආපදා කළමනාකරණ අරමුදල පිළිබඳ ප්‍රශ්නයකුත් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මතු කළා. ඒක privatize කරන්න හදනවාද කියලා ඇහුවා. නමුත් ඒ විධියට රාජ්‍ය මූල්‍ය අවභාවිත කිරීම පිළිබඳ ප්‍රශ්නයක් කවදාවත් ඇති වෙන්නේ නැහැ. අපි මේ අය වැය පුරාවටත්, ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන හැම තැනකදීමත් මූල්‍ය විනය ඉහළින්ම ඔසවා තබා තිබෙනවා. අපි මේ කටයුත්තේදී කළේ මොකක්ද? ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හරහා ක්‍රියාත්මක වන ආයතන ඒ කටයුතු ක්‍රියාත්මක කරන ගමන්ම, ආපදාවෙන් වූ අලාභය ගැන දැන ගන්න එකත් අපට මේ මොහොතේ ඉතාම වැදගත් වෙනවා. ඇත්තටම අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර තිබුණු රටක් නම්, මේ සඳහා එකවර ආධාර, උපකාර ඉල්ලන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපට ශක්තිමත් ආර්ථිකයක් තිබෙන්නට ඕනෑ. හැබැයි, අපි ආණ්ඩුව භාර ගන්නකොට තිබුණේ කුඩුපට්ටම් කරලා විනාශ කරපු ආර්ථිකයක්. එය ස්ථායීකරණය කරමින් එනකොට තමයි මේ තත්ත්වය ඇති වුණේ. එහෙම නම්, මේ මොහොතේ තිබෙන ප්‍රායෝගික අවශ්‍යතාව තමයි, හැකි ඉක්මනින් අරමුදල් සම්පාදනය කර ගැනීම. අරමුදල් සම්පාදනය කර ගැනීමේ විවිධ මාර්ග සොයා බැලීමටත්, එම අරමුදල් කළමනාකරණය කිරීමේ කටයුත්ත සඳහාත් තමයි මේ අරමුදල ස්ථාපිත කළේ. ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය වහාම ලබා දුන්නා. ඒ වාගේම, ඉදිරියේදී අපි මේවාට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ගේන්නත් බලාපොරොත්තු වෙනවා. එහෙම නැතුව නීතියට පිටින් ගිහිල්ලා පෞද්ගලික අංශයේ කවුරුන් හෝ මැදිහත් වෙලා කරන වැඩක් නොවෙයි මේක. හොඳට බලන්න, එහි සිටින කණ්ඩායම කවුද කියලා. මොකද, විවිධ මූල්‍ය මාර්ග සොයනකොට ජාත්‍යන්තර සබඳතා තිබෙන පෞද්ගලික අංශයේ අයත් සම්බන්ධ කර ගන්න වෙනවා. ඒ වාගේම වගවීම පිළිබිඹු කිරීම සඳහා ඒ තුළ මාත් කටයුතු කරනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ඉන්නවා. එමෙන්ම, ජනාධිපති ලේකම් කාර්යාලයට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකුත් ඒ කමිටුවේ ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශය යටතේ වෙන් වෙලා තිබෙන මුදල් ප්‍රමාණය පිළිබඳව මම පුංචි අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. මුදල් අමාත්‍යාංශයට වෙන් වෙලා තිබෙන මුදල් ප්‍රමාණය ඇතුළේ, ණය සේවාකරණය සඳහා සහ පොලිය සඳහා අපට විශාල පංගුවක් වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, සමස්තයක් විධියට වෙන් වෙලා තිබෙන මුදල මෙම කාරක සභා අවස්ථාවේ සංශෝධනය වෙලා තිබෙනවා, පුනරාවර්තන වියදම රුපියල් බිලියන 2,945කුත්, ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 2,080කුත් විධියට. මේ වියදම් දෙක ගත්තොත්, පුනරාවර්තන වියදම් ඇතුළේ රුපියල් බිලියන 2,617ක පොලියක් තිබෙනවා. හැබැයි, ඔබට පෙනෙනවා ඇති, අපි 2024දී, පටන් ගත්ත දවසේ ඉඳලා මේ වෙනකල් ණය කළමනාකරණය හරහා ඒ පොලී ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කර ගන්න කටයුතු කර තිබෙන බව. ඒ වාගේම, අපි ණය ප්‍රමාණයත් කළමනාකරණය කරන්න කටයුතු කරලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශයට වෙන්වෙලා තිබෙන පුනරාවර්තන වියදමත්, ප්‍රාග්ධන වියදම් ඇතුළේත් විශේෂ ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා.

සමහර අවස්ථාවල සමාජය කිව්වා, මුදල් අමාත්‍යාංශයට වැඩිපුර මුදල් වෙන් කරගෙන කියලා. නමුත් එහෙම එකක් නැහැ. ඉතිරි වෙලා තිබෙන මේ මුදල් ප්‍රමාණයෙන් විශාලතම මුදල් පංගුව යන්නේ සමාජ සුබසාධනය සඳහා. ඒ සඳහා රුපියල් බිලියන 251ක් වෙන් වෙනවා. "අස්වැසුම" වැඩසටහනත් ඇතුළුව විවිධ ක්ෂේත්‍ර මේ තුළින් ආවරණය වෙනවා. අය වැය සංචිත විධියට පුනරාවර්තන ගිණුමේ රුපියල් බිලියන 37ක් තිබෙනවා. අපි ඉදිරියේදි කරන ලද සංශෝධනවලදී වාගේම, ආපදා තත්ත්වයේදී මුදල් කළමනාකරණය කර ගැනීමේදී අපට එයින් යම් කොටසකුත් භාවිත කිරීමේ ඉඩකඩක් තිබෙනවා.

ප්‍රාග්ධන වියදම්වලදී ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ අමාත්‍යාංශයේ වැඩකටයුතු කරනවා. පළමුවැනි එක තමයි, හිමිකම් - equity - දායකත්වය යටතේ රාජ්‍ය ව්‍යවසායයන් වඩා කාර්යක්ෂමතාවෙන් කළමනාකරණය කරන්න අවශ්‍ය, රාජ්‍ය ව්‍යවසායයන් වෙනුවෙන් ලබා දෙන හිමිකම් - equity - දායකත්වයට රුපියල් බිලියන 85කුත්, දේශීය අරමුදල් යොදා ගෙන පවත්වා ගෙන යන ව්‍යාපෘති සහ ප්‍රාග්ධන වියදම්වලට රුපියල් බිලියන 14.4කුත් තිබෙනවා. ඒක ඇතුළේ සෑම මන්ත්‍රීවරයෙකුටම වෙන් වෙන විමධ්‍යගත අරමුදල් සඳහා රුපියල් බිලියන 2.25කුත් තිබෙනවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පහසු කර ගැනීම සඳහා අපේ ප්‍රධාන ආදායම් ලබා දෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, රේගු දෙපාර්තමේන්තුවේ කටයුතුවලටත්, අනෙකුත් වැඩකටයුතුවලටත් තාක්ෂණය කැඳවීම සඳහා RAMIS එක, RASED එක නැවත නවීකරණය කර ගැනීමට රුපියල් බිලියන 6කට වැඩි මුදලකුත් වෙන් කරලා තිබෙනවා. ඒ එක්කම විදේශීය ව්‍යාපෘති ආශ්‍රයෙන් කරන ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 36ක් වෙන් කරලා තිබෙනවා, මේ මුදල් කළමනාකරණය ඇතුළේ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඊළඟට, ජාතික අය වැය දෙපාර්තමේන්තුව විශේෂ අවධානයක් යොමු කරලා නිසි පරිදි අදාළ සංශෝධන, විමර්ශන කරමින් මූල්‍ය විනය පවත්වා ගෙන යැමට 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් ඇති කරලා තිබෙන ප්‍රතිපාදන ඇතුළේ වැඩකටයුතු කරමින් තිබෙනවාය කියන කාරණයත් මම සඳහන් කරන්න කැමැතියි.

මුදල් අමාත්‍යාංශයේ ආයතන ගණනාවක් තිබෙනවා. එයින් කීපයක් පිළිබඳවත්, එහි ප්‍රගතිය පිළිබඳවත් අපට අදාළ වන කරුණු කීපයක් සාකච්ඡා කරන්න මම කැමැතියි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉතාම වැදගත් වෙනවා. ආර්ථික අර්බුදය හමුවේ අපට ප්‍රධාන අර්බුද දෙකකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ තමයි රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී ඇති වූ රුපියල් අර්බුදයත්, ඩොලර් අර්බුදයත්. රුපියල් අර්බුදය සහ ඩොලර් අර්බුදය පැන නඟිනකොට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලට සුවිශේෂී කාර්යභාරයක් පැවරෙනවා. එහිදී අංක එක බවට පත් වෙන්නේ අය වැය පරතරය කළමනාකරණය කරන්න පුළුවන්, පාලනය කරන්න පුළුවන් සීමාවක තියා ගන්නේ කොහොමද කියන එක. හැම තිස්සේම අතීතය අරගෙන බැලුවාම ඇස්තමේන්තු කරපු අය වැය පරතරයට වඩා වැඩි අය වැය පරතරයකින් තමයි ආණ්ඩු ඒ ඒ අවස්ථාවේදී වැඩකටයුතු කරලා තිබෙන්නේ. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අනවශ්‍ය ණය ගැනීම්වලට යන්න සිද්ධ වුණේ.

ගත්ත ණයත් අවභාවිත වුණා. නමුත් මේ කෙටි කාලය ඇතුළත අපට ඒක වෙනස් කර පෙන්වන්න පුළුවන් වුණා. අපි 2025දී අපේක්ෂා කරපු අය වැය පරතරයට වඩා අඩු අය වැය පරතරයකට ගේන්න දැන් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා; ලැබෙමින් තිබෙනවා. ඒ අනුව 2026 අය වැය පරතරයත් සියයට 5.1 දක්වා අඩු කර ගැනීමට කටයුතු යොදා තිබෙනවා. ඒ වාගේම යම් යම් ව්‍යාපෘති, ආයෝජන, සංවර්ධන කටයුතු සඳහා අදාළ දිරි දීමනා ලබා දෙනකොට, දිරිගැන්වීම් ලබා දෙනකොට හිතුමතේ අභිමතානුසාරිව දෙනවා වෙනුවට අපි යම් රීතියක් පාදක කරගෙන - rule-based - තමයි ඒ ප්‍රතිපාදන ලබා දෙන්නේ. වරාය සංවර්ධනයේදී, BOI කටයුතුවලදී ආදායම් කළමනාකරණය නිසි පරිදි කරනවා. මෙහි ප්‍රධානම මූල ධර්මය බවට පත් වෙන්නේ ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පවත්වා ගෙන යාමයි. ඒක මුළු වර්ෂය පුරාම අපි පවත්වාගෙන ගියා. ඒ අනුව ඉදිරියටත් එය පවත්වාගෙන යාම අපි සිද්ධ කරනවා.

ඒ වාගේම විනිවිදභාවය පෙන්නුම් කිරීමට විවිධ වූ වාර්තා නිසි වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අය වැය ආර්ථික මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, ආදායම් බදු අහිමි වීමේ ප්‍රකාශය, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය, අවසාන අය වැය තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා අධ්‍යයනය කිරීමෙන් මේ කටයුතු පිළිබඳ අපට තවදුරටත් තොරතුරු ලබා ගන්නට පුළුවන්.

ඊළඟ එක තමයි, රාජ්‍ය ණය කළමනාකරණය. අපි කවුරුත් දැන් දන්නවා, මහ බැංකුවේ ස්වාධීනත්වය හමුවේ ආණ්ඩුවේ මූල්‍යකරණයේදී හදිසි අවශ්‍යතාවකදී පවා සෘජුව මහ බැංකුවෙන් මුදල් ලබා ගැනීම, එහෙම නැත්නම් අපි සාමාන්‍යයෙන් පොදුවේ කියන මුදල් අච්චු ගැසීම සිදුවෙන්නේ නැති බව. ඒ නිසා රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධව ඉතාම භාරදූර කාර්යයක්, වගකීම් සහිත කාර්යයක් කරන්න සිද්ධ වෙනවා. මේ වෙනකම් - 2025 දෙසැම්බර් 1වැනි දා වෙනකම් - මේ කළමනාකරණ කාර්යයත් පැවරිලා තිබුණේ ප්‍රධාන වශයෙන් මහ බැංකුවට. දැන් ඒ කාර්යය මුදල් අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබෙනවා. කියන්න සන්තෝෂයි, අපි රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය 2024.12.02වැනි දා පිහිටුවා කටයුතු කරමින් ඇවිල්ලා, එහි පළමු ණය නිකුත් කිරීම දෙසැම්බර් 1වැනි දා අපේ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ සිද්ධ කළා. එහි ප්‍රතිඵල විධියට ණය කළමනාකරණය කිරීමේදී අපට තොරතුරු අවශ්‍ය වෙනවා. නිරන්තරයෙන් බලන්න සිද්ධ වෙනවා. ඒ අනුව දැනටමත් අපි පොදු රාජ්‍ය මණ්ඩලීය Meridian දත්ත පද්ධතිය හා සම්බන්ධ වෙලා තිබෙනවා. මේ Meridian දත්ත පද්ධතියෙන් කරන්නේ රාජ්‍ය ණය කළමනාකරණයට අවශ්‍ය කරන තොරතුරු එක් රැස් කරගෙන ඒ මත ගත යුතු ක්‍රියාමාර්ග කලින් ඉදිරිපත් කිරීමයි. ඒ පද්ධතියට මැදිහත් වෙලා ඔවුන්ගේ සමීක්ෂණයට අනුව මේ මොහොත වෙනකොට රාජ්‍ය ණය කළමනාකරණයේ අපේ අංකය, score එක, 10න් 9.7කට, ඒ කියන්නේ ඉතා විශිෂ්ට මට්ටමකට ගෙනෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඒ වාගේම, මේ ණය පිළිබඳවත් නිරන්තරයෙන් බියක් හැදුවා. අනවශ්‍ය විධියට ණය ගැනීම නිසා ප්‍රශ්න නිර්මාණය වුණු බව අපි දන්නවා. හැබැයි අපි ට්‍රිලියන ගණන් ණය අරගෙන ගැටලුවක් නිර්මාණය වුණු අදහසක් සමාජයේ තිබෙනවා. එහෙම වෙලා නැහැ. ඔබතුමන්ලා හොඳට බැලුවොත්, අපි මේ තිබෙන වැඩසටහන ඇතුළේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95ක් දක්වා ණය ප්‍රමාණයක් පවත්වා ගැනීමේ වැඩසටහන ක්‍රමිකව, අඛණ්ඩව ඉදිරියට අරගෙන යනවා කියලා ඔබතුමන්ලාට පෙනෙයි. විවිධ සංඛ්‍යා ඉදිරිපත් කළා. මම මේ සංඛ්‍යා දත්ත ටික ඉදිරිපත් කරන්න කැමැතියි. 2025 නොවැම්බර් අග වෙනකොට සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල්වලින් ගත්තොත්, ට්‍රිලියන 30.6යි. මේක රුපියල් ට්‍රිලියන 32යි, 33යි කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ විධියට අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනවා මම දැක්කා. ඉන් දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 19,480ක්. විදේශීය ණය ප්‍රමාණය ඩොලර්වලින් බිලියන 36.23ක්. එය රුපියල්වලින් බිලියන 11,160ක්. ඒ අනුව මෙන්න මේ ණය කළමනාකරණය කිරීම සිද්ධ වෙනවා. 2026දී අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට මේ ප්‍රමාණය සියයට 88.8ක්. මේ ණය කළමනාකරණය ඇතුළේ ඉතාම පහසුවෙන් - ලෙහෙසියෙන්- ඒ තිරසාර ණය අනුපාතය පවත්වාගෙන යන්න අපිට පුළුවන්.

ඒ වාගේම, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - Treasury Operations Department එක - තවත් වැදගත් විශේෂ කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ජනාධිපතිතුමා අය වැය කථාවේදීත් මේ පිළිබඳව ඉදිරිපත් කළා, ඔබතුමන්ලාට මතක ඇති. අතිරික්ත මුදල් ප්‍රමාණයක්; මුදල් ශේෂයක් පවත්වා ගන්න අපිට පුළුවන්කම ලැබුණා. හැබැයි එහෙම අතිරේකව මුදලක් තිබෙනවා නම් ඒක බෙදලා දාන්න කියලා සමාජයට මතයක් ඉදිරිපත් කළා. මෙතැනදී කරන්නේ මොකක්ද කියලා අපි තේරුම් ගන්න ඕනෑ. මේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් කරන්නේ අපි සැලසුම් කරන ආදායම නිසි පරිදි ලබා ගැනීම, නිසි වේලාවට ලබා ගැනීම, හිඟ වෙන්නේ නැතුව ලබා ගැනීම සහ රාජ්‍ය ණය ලබා ගැනීමේදී ශුද්ධ ණය ලබා ගැනීම, අතිරේක මුදල් තිබෙනවා නම් ණය ගෙවා දැමීම. ඇත්තටම මේක ඇතුළේ තිබෙන්නේ ආදායම්, වියදම් පමණක් නොවෙයි, මුදල් කළමනාකරණය, මුදල් ලබා ගැනීම සහ මුදල් වියදම් කිරීම.

මෙහි සාරාංශය මොකක්ද කියලා මම කියන්නම්. 2025 මේ වෙනකොට තිබෙන රුපියල් බිලියන 1,200ක ශේෂයේ සාරාංශය හැදෙන්නේ මේ විධියටයි. අපේ ආදායම් විධියට රුපියල් බිලියන 4,823කුත්, පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙනාපු ශේෂයක් වෙච්ච

රුපියල් බිලියන 736කුත් තිබෙනවා. ඊට අමතරව අපේ ගෙවීම් යටතේ පුනරාවර්තන වියදම් හැටියට රුපියල් බිලියන 2,282කුත්, ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් බිලියන 580කුත් තිබෙනවා. දැන් අපිට හොඳ ස්වාරක්ෂකයක් - buffer එකක් - තිබෙන නිසා දේශීය වෙළෙඳ පොළේ ණය පියවීමේදී මූල්‍ය වෙළෙඳ පොළේ සිටින ඉල්ලුම්කරුවන්ගේ පොලී අනුපාතයට ණය ගන්නවා වෙනුවට පාලනය කරන ලද පොලී අනුපාතයක් යටතේ ණය ගැනීමට අපිට පුළුවන්කම ලැබුණා. ඒ නිසා තමයි මේ අවුරුද්ද පුරාම පොලී අනුපාතය ස්ථාවරව එක තැනක පැවතිලා තිබෙන්නේ. අන්න ඒක ස්ථාවරභාවයේ ප්‍රධාන ලක්ෂණයක්.

ඒ අනුව අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, මේ වර්ෂයේදී ණය සේවාකරණය ඇතුළේ පොලී සහ වාරික වෙනුවෙන් රුපියල් බිලියන 1,482ක් ගෙවන්න. ඒ අනුව තමයි, රුපියල් බිලියන 1,214ක ශේෂයක් බවට පත් වෙන්නේ. ඒ ඇතුළේ රුපියල් බිලියන 14.3ක උපයෝජනය කරන ලද ප්‍රදානත් තිබෙනවා. ඒ අනුව තමයි රුපියල් බිලියන 1,200ක් ඉතුරු වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, අමතර විනාඩි පහත් සමඟ ඔබතුමාට තව විනාඩි හතක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

එයින් පෙන්නුම් කරන්නේ මොකක්ද? මෙන්න මේ මූල්‍ය විනය. ඒක තමයි අපි අගය කිරීමට ලක් කරන්න ඕනෑ. අතීතයේදී බැංකු අයිරාවක් - OD එකක් - මත ආණ්ඩුවේ කටයුතු මෙහෙයවන්න අපට සිදු වුණා. ඒක නිසා අධික පොලියක් ගෙවන්න සිදු වුණා. දැන් අපි ස්ථාවර අඩිතාලමක් යොදලා තිබෙනවා, මහා භාණ්ඩාගාරයේ මුදල් කටයුත්ත මෙහෙයවමින් ඉදිරියට අරගෙන යන්නේ කොහොමද කියලා. ඒ වාගේම ආණ්ඩුකරණයේදී රාජ්‍ය මූල්‍ය වගකීමේදී අපට වැදගත්වන ආයතනයක් තමයි, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන සීමිත සම්පත් ප්‍රමාණය නිසි පරිදි, සැලසුම් සහගතව මේ දෙපාර්තමේන්තුව විසින් ඒ අරමුණුවලට යොමු කරනවා. ඒ අනුව සමාජයීය යටිතල පහසුකම්, කෘෂි කර්මාන්තය, කර්මාන්ත, වෙළඳ ආයෝජන සහ සංචාරක, වාණිජ යටිතල පහසුකම්, පරිසර කළමනාකරණය, සමාජ ආරක්ෂණ සහ ප්‍රාදේශීය සංවර්ධනය යන විශාල ක්ෂේත්‍රයකට අපි රාජ්‍ය ආයෝජනය යොමු කළ යුතු වන්නේ කොහොමද කියන වැඩ කටයුත්ත සිදු කරනවා. ඒ අනුව, ව්‍යාපෘති යෝජනා 466ක් - එයින් ඇගයීම් කරලා අමාත්‍ය මණ්ඩල සන්දේශ 219ක් මඟින් නිර්දේශ සැපයීමටත්- ප්‍රතිපත්ති යෝජනා 13ක්, ඇගයීම් සහ සැලසුම් යෝජනා හතරක් ඉදිරිපත් කිරීමටත් මේ වෙනකොට අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒ අනුව රාජ්‍ය ආයෝජන කමිටුව අවස්ථා ගණනාවකදී රැස්වෙලා 2026ට අවශ්‍ය කරන රජයේ නව යෝජනා ව්‍යාපෘති ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව රාජ්‍ය ආයෝජන සැලසුම් 2026 - 2030 සකස් කරලා දැනට ක්‍රියාත්මක මට්ටමක පවතිනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය යටතේ සාකච්ඡා කළ යුතු විශේෂ කාරණයක් තිබෙනවා. අපි කවුරුත් නිරන්තරයෙන් කථා කරන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ණය අරගෙන වැඩ කටයුතු කරගෙන යද්දී ඔවුන්ට මුහුණ දෙන්න බැරි තත්ත්වයන්වලදී මේ ණය ගැටලුවට භාජන වෙනවා. සමහර අවස්ථාවලදී ව්‍යාපාර කටයුතු කරන්න අවශ්‍ය ණය පහසුකම් ලැබෙන්නේ නැහැ. යම් යම් ගැටලු, අඩුපාඩු ආයතනවල පවතිනවා. හැබැයි, 2025 වර්ෂයේදී අපට පුළුවන්කම ලැබුණා, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ ඒ ණය සංවර්ධන දිශාවකට යොමු කිරීමට. එහි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. එකක් තමයි, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය - Micro, Small and Medium-sized Enterprises Line of Credit Projects - කියන එක.

ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගොඩනැංවීම - Enhancing Small and Medium-sized Enterprises Finance Project - යටතේත්, ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ නඟාසිටුවීමේ ව්‍යාපෘතියේ චක්‍රීය සංචරණය යටතේ SMELOC2 කියන revolving ණය යෝජනා ක්‍රමය යටතේදීත් රුපියල් මිලියන 16,200ක් - බිලියන 16.2ක් - වටිනා ආයෝජන සහ කාරක ප්‍රාග්ධන ණය ලබා දීලා තිබෙනවා, මේ 2025 වර්ෂයේදී.

විවිධ ක්ෂේත්‍රවලින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍ර නැවත පණ ගැන්වීම සඳහා වන ණය පැකේජය යටතේ දේශීය අරමුදල් භාවිත කරමින් අපට හැකියාව ලැබිලා තිබුණා, දැනට පවත්වාගෙන යන ව්‍යාපාරත්, බිඳ වැටිලා තිබෙන ව්‍යාපාරත්, ගැටලුවලට මුහුණ දීලා තිබෙන ව්‍යාපාරත් වෙනුවෙන් ආයෝජන හා කාරක ප්‍රාග්ධනය සඳහා 2025 වර්ෂයේදී රුපියල් බිලියන 20ක් වෙන් කරන්න. ඒ ප්‍රමාණයෙන් නොවැම්බර් මාසය වනකොට පුද්ගලයින් 1,510කට රුපියල් බිලියන 13.4ක් දක්වා මුදල් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේත් මේ වනකොට රුපියල් මිලියන 1,648ක දේශීය ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා. ඉන් රුපියල් මිලියන 1,582ක් ණය පොලී සහනාධාර විධියට මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කරලා තිබෙනවා. එමඟින් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව 64,000ක් පමණ වනවා. මේ යටතේ 2025 වර්ෂයේදී පළමු කන්නයේදී රුපියල් මිලියන 14,723ක් පමණ වටිනා ණය ප්‍රමාණයක් ගොවීන් 49,000ක් අතරේ බෙදා හැරලා තිබෙනවා.

ඔඩපණ ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමට විශාල මුදල් ප්‍රමාණයක් අපි යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ඉතාම කාර්යක්ෂමව ජාතික තීරුබදු ප්‍රතිපත්තිය සකස් කළ බවත්, ඉදිරියේදී තීරු බදු වෙනස් කිරීම් සිදු කරනකොට නිසි ක්‍රමවේදය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික තීරු බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීමට අපට හැකි වන බවත්. ඒ වාගේම ආයෝජන ගෙන ඒමට සහ මේ අර්බුදයෙන් ඔබ්බට ගිහිල්ලා රට වර්ධනය කර ගෙන යාමට තිබෙන විවිධ බාධා ඇතුළේ එක් ප්‍රධාන බාධකයක් විධියට දිගින් දිගටම කථා කළා, ඒ ආයෝජන ගෙන ඒමේදී සහ විශේෂයෙන්ම අපනයන වෙළෙඳාම ප්‍රසාරණය කිරීමේදී අපනයනකරුවන්ට මුහුණ දෙන්න සිදුවන ගැටලු ගැන. තනි වෙළෙඳ කවුළුවක් නැති නිසා එක එක ආයතනවලට යන්න සිද්ධ වීම නිසා කාල පමාවක් සිදු වනවා. ඒ නිසා නැවතිලා තිබුණු වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය වේගයෙන් ක්‍රියාත්මක කරලා ඒ කටයුත්තත් ඉක්මනින් අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ අනුව දැනටමත් නියෝජිත ආයතන 18ක් සහ වෙනත් ආයතන ගණනාවක් සමඟ මේ සාකච්ඡා සිදු වෙමින් තිබෙනවා. මේ වනකොට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් දෙපාර්තමේන්තුත් මේ සම්බන්ධව විශාල වැඩ කොටසක් සිදු කරමින් තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුව භාර ගන්නකොට අපට මුහුණ දෙන්න තිබුණු අභියෝගය සුළුපටු අභියෝගයක් නොවෙයි. අපි ඒ අභියෝගයට නිසි පරිදි මුහුණ දීලා, රට ස්ථාවර කරගෙන සංවර්ධනයේ දිශාවට ඉදිරියට එනකොට තමයි මේ අනපේක්ෂිත ආපදාවට මුහුණ දෙන්න සිද්ධ වුණේ. අපේ ආණ්ඩුවේ දැක්ම තමයි, මොනම අභියෝගයක් ආවත් නොසැලී, අධිෂ්ඨානශීලීව, එකාවන්ම ඒ අභියෝගය ජයග්‍රහණය කරනවා කියන එක. අන්න ඒ කටයුත්තේදී තමයි "Rebuilding Sri Lanka" එන්නේ. හුදෙක්ම මේ අවදානම නිසා, ආපදාව නිසා මුදලින් හානිවීම් විතරක් නොවෙයි සිදු වී තිබෙන්නේ. එය ඔවුන්ගේ සමාජ ජීවිතයට, ඔවුන්ගේ පැවතුම්වලට විශාල කම්පනයක් ඇති කරලා තිබෙනවා. ඒ කම්පනයෙන් ඔවුන් බේරාගෙන නැවත ශ්‍රී ලංකාව ගොඩනැඟීමේදී කිසිම කෙනෙකු අත්නොහැරෙන ආකාරයට අපි කටයුතු කරනවා. ඉදිරියේදී ගෙන එන්නට යෝජනා කරලා තිබෙන අතිරේක මුදල් ප්‍රතිපාදන පිළිබඳව ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරාවි. කිසි කෙනෙකු මඟ නොහැරෙන ආකාරයට නැවත අපි මේ ලංකාව ගොඩනඟනවා, "Rebuilding Sri Lanka" යටතේ.

මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් මෙහි සාරාංශය මම අවසාන වශයෙන් ඉදිරිපත් කරනවා. අතීතයේ තිබුණු දූෂිත ක්‍රමවේදය වෙනුවට, වගවීමෙන් තොර ක්‍රමවේදය වෙනුවට අපි මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් පෙන්නුම් කළේ වෙන මොකක්වත් නොවෙයි. අපි පෙන්නුම් කළේ වියදම් නිසි පරිදි කළමනාකරණය කිරීම, නාස්තිය අවම කිරීම, ඒ වාගේම ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව යටතේ පාරදෘශ්‍යභාවයත්, විනිවිදභාවයත් පිළිඹිබු වන අයුරින් සමස්තයක් වශයෙන් මූල්‍ය විනය ප්‍රදර්ශනය කිරීමයි. ඒක තමයි මහජනතාව වෙනුවෙන් ආණ්ඩුවේ වගකීම. එය නිසියාකාරයෙන් අපි ඉෂ්ට කරලා තිබෙනවා කියන කාරණය සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Naina Thambi Marrikkar Mohamed Thahir. You have 10 minutes.

[පූ.භා. 10.30]

**ගරු නෛනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම අද රටේ ව්‍යසනයක් ඇති වෙලා තිබෙන මේ අවස්ථාවේදී, ශ්‍රී ලාංකිකයින් ඔක්කෝම කම්පාවෙන් ඉන්න වෙලාවේදී, රටේ ජනතාව මේ ව්‍යසනයෙන් ගලවා ගන්න පක්ෂ භේදයෙන් තොරව, ජාති භේදයෙන් තොරව අප සියලුදෙනා කටයුතු කරන්න ඕනෑ. මේ ව්‍යසනයේදී ඇති වූ ගංවතුර හා නාය යාම්වලදී අනතුරු සිදු වුණු, විශාල අලාභහානි වුණු, ඒ වාගේම ජීවිත හානි වුණු, ජීවිත පූජා කරපු සියලුදෙනාට මම පළමුවෙන්ම අවංකවම ශෝකය ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු වශයෙන් මා පත් කිරීමට කටයුතු කරපු, සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ ජාතික නායක, හිටපු අමාත්‍ය, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට මගේ අවංක ආදර ස්තුතිය පළමුවෙන්ම පුද කරනවා. ඒ වාගේම සමගි ජන බලවේගයේ - SJB - නායක වාගේම පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාටත් මගේ අවංක ආදර ස්තුතිය පුද කරන අතර, සමගි ජන බලවේගයේ මහ ලේකම් ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාටත් ස්තුතිය පුද කරනවා. ඒ වාගේම සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ උත්තරීතර මණ්ඩලය වාගේම ලංකාව පුරා ඉන්න අපේ පක්ෂයේ සාමාජිකයින් සියලුදෙනා එකඟ වෙලායි මට මේ අවස්ථාව ලබා දුන්නේ. ඒ වාගේම මට මේ අවස්ථාව ලබා දුන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඉස්මායිල් මුත්තු මොහොමඩ් මැතිතුමාවත් මම මේ අවස්ථාවේදී අවංකව මතක් කරනවා.

සමස්ත ලංකා මහජන කොංග්‍රසය නියෝජනය කරමින් ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා රට පුරා ගිහිල්ලා මේ ව්‍යසනයට පත් ජනතාවට එතුමාට පුළුවන් විධියට උදවු කළා. උතුරු, නැඟෙනහිර පළාත්වලටත්, පුත්තලම වාගේ ප්‍රදේශවලටත් ගිහිල්ලා අපේ නායකතුමා එක්ක අපිත් සම්බන්ධ වෙලා වැඩ කටයුතු කළා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, විශේෂයෙන්ම මේ ව්‍යසන අවස්ථාවේදී අපට ග්‍රාමීය මට්ටමේ හොඳ රාජ්‍ය යන්ත්‍රණයක් තිබෙනවා කියන එක. ග්‍රාම නිලධාරි මහත්වරුන්, සමෘද්ධි සංවර්ධන නිලධාරි මහත්වරුන්, DO මහත්වරුන් ඉන්නවා. ඒ වාගේම ක්ෂණිකව ඒ අයට බලය දුන්නා නම්, මීට වඩා ජනතාවට මේ අනතුර පිළිබඳව සන්නිවේදනය වෙලා, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සන්නිවේදනය වෙලා, මේ ව්‍යසනයෙන් ජනතාවට සිදුවන පීඩාව අවම කරගන්න තිබුණා. මේ ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළට විදේශ රටවල් පවා සහාය දෙනවා. මේ ව්‍යසනයෙන් විපතට පත් ජනතාවට උදවු කරන්න, මේ රට නැවත ගොඩ ගන්න ජාතියක් හැටියට අපි සියලුදෙනා මේ රට වෙනුවෙන් එකතු වෙලා කටයුතු කරමු කියන එක තමයි මගේ යෝජනාව, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම මගේ දේශපාලන ජීවිතය ගැනත් කථා කරන්න ඕනෑ. මම මුලින්ම 1991දී කල්පිටිය ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා, ඊට පස්සේ 1997දී කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට කටයුතු කරලා, ආයෙත් 2002දී ඒ ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ලෙස කටයුතු කළා. ඊට පස්සේ 2004දීත්, 2009 සිට 2013 දක්වාත්, 2013 සිට 2018 දක්වාත් අවස්ථා තුනකදී පුත්තලම දිස්ත්‍රික්කය නියෝජනය කරමින් වයඹ පළාත් සභාවේ කටයුතු කරලා, අපේ ප්‍රදේශයේ ජනතාවට පක්ෂ, පාට, ජාති භේදයෙන් තොරව වැඩ කරන්න ඒ අවස්ථාවලදී වයඹ පළාත් සභාවේ හිටපු මැති ඇමතිවරුන් මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ නිසා අධ්‍යාපනය වෙනුවෙන් මට අපේ ප්‍රදේශයේ ජනතාවට වැඩ කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. ඒ අනුව මම අද පාර්ලිමේන්තුවේදී පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුතිය පුද කරන්න ඕනෑ. අපේ ගරු රිසාඩ් බදියුදීන් නායකතුමාගේ පක්ෂයත්, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පක්ෂයත් යන පක්ෂ දෙකම එකතු වෙලා අපේ දිස්ත්‍රික්කයෙන් තරග කරලා, අපේ දිස්ත්‍රික්කයෙන් SJB එකට විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නා. ඒ විධියට ඡන්ද ලබා දුන් නිසා මටත් මේ අවස්ථාව ලබා දුන්නා. ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාව මගේ දේශපාලන ජීවිතයේදී අවුරුදු ගණනාවක් මාත් එක්ක කටයුතු කරලා තිබෙනවා. අවංකව කියනවා නම්, මම හොඳට අවංකව වැඩ කරලා තිබෙනවා සිංහල ජනතාව, මුස්ලිම් ජනතාව හා හින්දු ජනතාව සමග. අද වුණත් මට ගමට ගිහිල්ලා වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් උදා කරලා තිබෙනවා. ඒ ජනතාවට නැවත නැවත මා ස්තුතිය පුද කරනවා.

පුත්තලම අධ්‍යාපන කලාපය ගත්තොත්, අපි පුත්තලම නගරයේ ජීවත් වුණාට වටේටම තිබෙන්නේ දුෂ්කර ගම්මාන. ඒ

දුෂ්කර ගම්මානවල තිබෙන පාසල්වලට ගුරුවරු ඉන්නවා. නමුත්, විෂයය අනුව ගුරුවරු නැහැ. විෂයය අනුව ගුරුවරු ලබා දුන්නොත් තමයි ඒ ළමයින්ට අධ්‍යාපනය හරියාකාරව කරගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, ආණ්ඩුව හැටියට විශේෂයෙන්ම ගුරු පුරප්පාඩු පිරවීමේදී පුත්තලම අධ්‍යාපන කලාපයට විෂයය අනුව ගුරුවරු ලබා දෙන්න කියලා. දෙමළ මාධ්‍ය ජාතික පාසල් හැටියට පුත්තලම සහිරා ජාතික පාසල සහ කල්පිටිය අල් අක්සා ජාතික පාසල තිබෙනවා.

කල්පිටිය අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 44ක් තිබෙනවා. ඒ පාසල් 44 ඇතුළත විශේෂයෙන්ම සිංහල ළමයින්ට හොඳ පාසලක් තිබෙනවා. ඒ පාසල තමයි, තලවිල ශාන්ත ආනා මහා විද්‍යාලය. ඒ පාසල 1 AB පාසලක් කරන්න කියා ගරු අධ්‍යාපන ඇමතිතුමිය වන අග්‍රාමාත්‍යතුමියගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ ගැන විශේෂයෙන් සලකා බලන්න. කල්පිටිය අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 44 ඇතුළත හරිහමන් සිංහල පාසලක් තිබුණාට 1 AB පාසලක් හෝ ජාතික පාසලක් නැහැ. ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කර ඒ ජනතාව වෙනුවෙන් එම ඉල්ලීම ඉටු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

අපේ ගරු ජනාධිපතිතුමාත් පුත්තලම ජනතාවට පොරොන්දුවක් දුන්නා, Puttalam Base Hospital එක දියුණු කරනවා කියලා. ඒ සම්බන්ධයෙන් අපේ ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා විශාල වශයෙන් කැපවෙලා, Master Plan එකක් හදලා, හිටපු සෞඛ්‍ය ඇමති රාජිත සේනාරත්න මැතිතුමා යටතේ විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. එහි විශේෂ බලාපොරොත්තුව වුණේ මේකයි. පුත්තලම නගරයක් වුණාට කල්පිටිය, වනාතවිල්ලුව, කරුවලගස්වැව, මදුරන්කුලිය, මුන්දලම වැනි දුෂ්කර ප්‍රදේශවල ජනතාවත් එම රෝහලට එනවා. මේ hospital එක ආරම්භ කරලා අවුරුදු 75ක් වෙනවා. ලක්ෂ හතරහමාරක ජනගහනයක් ඉන්නවා, එහි ප්‍රයෝජන ගන්න. නමුත්, එම රෝහලට අවශ්‍ය පහසුකම් නැහැ. විටින් විට ඒ ගැන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට කථා කර කියා තිබෙනවා. නමුත්, එතුමන්ලාගේ මට්ටමින් කටයුතු කරන්න අවශ්‍ය ප්‍රතිපාදන නැහැ. මේ රෝහල සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම කෙරෙහි අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේත්, ගරු සභාපතිතුමාගේත් අවධානය යොමු කර ඒ රෝහල දියුණු කිරීමට කටයුතු කරන්න කියලා ඉතා කරුණාවෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම කල්පිටිය රෝහල ගැනත් කථා කරන්න කැමතියි. යහ පාලන ආණ්ඩුව කාලයේ රාජිත සේනාරත්න මැතිතුමා සෞඛ්‍ය ඇමතිතුමා වශයෙන් සිටියදී අපේ ගරු රිසාඩ් මැතිතුමා වෙහෙස මහන්සි වෙලා හොඳ ගොඩනැඟිලි හදලා තිබෙනවා. තට්ටු 6ක ගොඩනැඟිල්ලක් හදලා තිබුණාට ඒකට අවශ්‍ය උපකරණ නැහැ, අවශ්‍ය doctorsලා නැහැ. ඒ හදලා තිබෙන ගොඩනැඟිල්ලට function වෙන්න අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම කල්පිටිය ප්‍රදේශය ගත්තාම, නාවික හමුදාවේ පුහුණු කඳවුර, ගුවන් හමුදා පුහුණු කඳවුර, නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය, නොරොච්චෝල විදුලි බලාගාරය තිබෙනවා. ඒ hospital එක හදලා දෙනවා නම් ජනතාවට වටිනවා.

විශේෂයෙන්ම මම මේ කාරණය ගැනත් කථා කරන්න කැමතියි, ගරු සභාපතිතුමනි. පුත්තලම නගරයට පිටතින් කුණු කන්දක් ගෙනෙන්න හදනවා. ඒ සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ මුදලින් සියයට 10ක්වත් අපේ පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන් කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය ගරු නාමල් කරුණාරත්න මැතිතුමා මේ සභාවේ සිටිනවා. මම පළාත් සභාවේ ඉන්නකොට එතුමා මගේ හිතවතෙක්. එතුමාට මම යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. මම සභාපති වශයෙන් සිටියදී 2022 අවුරුද්දේ නොරොච්චෝල ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කළා. එය ආරම්භ කළාට පසු විවිධ සභාපතිවරු පත් වුණා, ආණ්ඩු පත් වුණා. දැන් එතැනට ගිහින් බලන්න. රට හරක් ලගින තත්ත්වයට එතැන දැන් පත් වෙලා තිබෙනවා. ඒ ආර්ථික මධ්‍යස්ථානය කල්පිටිය ප්‍රදේශයට හදවත වාගේ එකක්. දේශපාලනයෙන් තොරව ඔබතුමන්ලා ගිහින් ඒ පිළිබඳව සොයා බලන්න.

හිටපු ප්‍රධාන ඇමති වාගේම මගේ හිතවතෙක් වන අපේ ගරු දයාසිරි ජයසේකර මැතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ සිටිනවා. මට මහපෙන්වීම කළ ගරු තාහිර් මන්ත්‍රීතුමාටත්, නිලධාරි මණ්ඩලයටත් මගේ අවංක ස්තුතිය පළ කරනවා. පක්ෂ, පාට, ජාති භේදයෙන් තොරව අපි අවංකව සේවය කරනවා. හොඳ දෙයට අපි උදවු කරනවා. අපේ නායකතුමාත් අපට එහෙම කරන්න තමයි කියලා තිබෙන්නේ. ඒ කටයුත්ත අපි හරියාකාරව කරනවාය කියමින්, පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට සුබ පතමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Nalin Bandara Jayamaha. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.41]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු සභාපතිතුමනි, බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා, "දේවෝ වස්සතු කාලේන සස්ස සම්පත්ති හෝතු ච - පීතෝ භවතු ලෝකෝ ච රාජා භවතු ධම්මිකෝ" කියලා. ඒකෙන් කියන්නේ, රාජ්‍යය ධාර්මික නම් කලට වැසි වහිනවා, කෙත් වතු සාර වෙනවා, භවභෝග සම්පත් ලැබෙනවා කියන එකයි. හැබැයි, අද අපට මේ මහා ව්‍යසනයත් එක්ක මොකක්ද වුණේ? කලට නොවෙයි වැසි වැස්සේ; අපේ රටේ කෙත් වතු සාර වෙන්න නොවෙයි වැසි වස්සේ; භවභෝග සම්පත් වැඩි වෙන්න නොවෙයි වැසි වස්සේ. අපේ රටේ කෙත් වතු විනාශ වෙන්න වැසි වැස්සා; සම්පත් විනාශ වෙන්න වැසි වැස්සා; මිනිස් ජීවිත විනාශ වෙන්න වැසි වැස්සා. අපේ රටේ ආර්ථිකය විනාශ වෙන විධියටයි මේ කාලගුණය බලපෑවේ. හැම දෙයක්ම රජයට කළමනාකරණය කරන්න බැහැ කියලා අපි කියනවා. හැබැයි, රාජ්‍යය ධාර්මික වුණොත් තමයි මේවා වෙන්නේ කියලා තමයි බුදුහාමුදුරුවෝ දේශනා කළේ.

මට පෙනෙනවා, මේ දවස්වල මාධ්‍යයත් එක්ක මේ රජය පුදුම තරහක් තිබෙන්නේ කියලා. ඒක නිසා තමයි මට මේ කාරණය

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මතක් වුණේ. බුදුරජාණන් වහන්සේ මේ දවස්වල ලංකාවේ වැඩ හිටියා නම් උන්වහන්සේටත් වාරණයක් දමනවා, මේ වාගේ ධර්ම දේශනා සජ්ඣායනය කරන්න එපා කියලා. මොකද, මාධ්‍ය නිසා තමයි මේ රාජ්‍යයත් දැනගත්තේ යම් යම් තැන්වල වුණු අනතුරු, ගංවතුරෙන් වුණු නාය යෑම්, දේපළ හානිවීම්, පාරවල් අවහිරවීම්, කැඩුණු පාලම් සහ බෝක්කු ගැන.

ඔබතුමන්ලාට උදවු කරන "සිරස" වෙන්න පුළුවන්, "හිරු" වෙන්න පුළුවන්, "දෙරණ" වෙන්න පුළුවන්, "සියත" වෙන්න පුළුවන්, ජාතික රූපවාහිනිය වෙන්න පුළුවන්, ITN එක වෙන්න පුළුවන්, YouTubeවල ඉන්න මාධ්‍යකරුවන් වෙන්න පුළුවන්. ඒ අයගෙන් ලැබුණු තොරතුරු, ඒ අයගේ ප්‍රාදේශීය මාධ්‍යකරුවන් ගිහිල්ලා ජීවිත පරිත්‍යාග කරලා ලබා ගත්ත තොරතුරු, වීඩියෝ පට නිසා තමයි බොහෝ වෙලාවට රජයත් දැනගත්තේ මේ, මේ තැන්වල අනතුරු වෙලා තිබෙනවාය කියලා. එහෙම නම්, ඇයි මේ වාරණයක්? උවිඳු කියලා YouTube මාධ්‍යවේදියෙක් ඉන්නවා, චමින්ද මන්ත්‍රීතුමා. උවිඳු කියන්නේ, ඔබතුමන්ලා බලයට පත් කරන්න විශාල කාර්යභාරයක් කරපු කෙනෙක්. උවිඳු මොකක්ද කුණුහරුපයක් කියලා ඔයගොල්ලන්ට බැහැ කියනවා. සුජීව මන්ත්‍රීතුමනි, ඒ කුණුහරුපය මට කියන්න බැහැ. දැන් උවිඳුට පහර ගහනවා. උවිඳුට පහර ගහන එක නොවෙයි කරන්න ඕනෑ. මේ වෙලාවේ රජයක් විධියට ඔබතුමන්ලා මේ පිළිබඳව පශ්චාත් කළමනාකාරිත්වයක් කරන්න. මේ අනතුර පිළිබඳව දැන දැනත් ඔබතුමන්ලාට මේ ආපදා තත්ත්වය කළමනාකරණය කරන්න බැරිව ගියා. ආපදා අවස්ථාවට පෙර පාර්ලිමේන්තුව අන්තිම වතාවට රැස් වුණු අවස්ථාවේදී අපි කිව්වා, දැන්වත් a state of emergency declare කරන්න කියලා. නමුත්, declare කළේ නැහැ. ඒ වෙලාවේදී declare කළා නම් අඩුම ගාණේ යම් මට්ටමකට හරි මේ තත්ත්වය කළමනාකරණය කරන්න තිබුණා; standby ඉන්න තිබුණා.

ඔබතුමන්ලා ලබා දෙන පණිවුඩ මොනවාද? TV එකේ දෙන පණිවුඩවලින් දැඩි අවදානමක් කියන්න බැහැ, ගරු සභාපතිතුමනි. "වයඹ පළාතට අවදානම්" කියනවා. නමුත්, එහෙම කියන්න බැහැ. වයඹ පළාතේ හැම තැනටම දැඩි අවදානම් නැහැ. දැදුරු ඔය මීටියාවත දැඩි අවදානම්; මහ ඔය මීටියාවත දැඩි අවදානම්. ගිරිඋල්ල ටවුන් එකම ගහගෙන ගියා. නගරයේ තිබුණු දේපළ සේරම ඉවරයි. දැඩි අවදානම් තිබෙන ඒ නිශ්චිත ස්ථාන ගැන කියන්න ඕනෑ ගමට ගිහිල්ලායි. Loudspeaker එකක් බැඳගෙන පොලීසිය, ග්‍රාම නිලධාරින්, රජයේ නිලධාරින් ගිහිල්ලා ගමේ පාරවල් දිගේ මේ අවදානම ගැන කියද්දී ඒක මිනිස්සුන්ගේ ඇඟට දැනෙනවා; පපුවට දැනෙනවා. මිනිස්සු ඒවාට සවන් දෙනවා. එහෙම නැතුව TV එකෙන්, "වයඹ පළාතට අවදානම්", "මධ්‍යම පළාතට අවදානම්, නාය යනවා" කිව්වාට බැහැ. මාවතගම ආසනයේ ඉඳුල්ගොඩ කන්ද නාය ගියා. දොඩන්ගස්ලන්ද ආසනයේ උස්සාව ප්‍රදේශය නාය ගියා. කන්දහේන නාය ගියා. මිනිස්සු මැරුණා. ඒ ප්‍රදේශවලට ගිහිල්ලා ඒවා දැඩි අවදානම් කියලා කියනකොට තමයි මිනිස්සුන්ට දැනෙන්නේ. එහෙම නැතිව, වයඹ පළාත නාය යනවා කිව්වාම බිංගිරියේ මිනිස්සුන්ට හිනා යනවා. මොකද, එහේ කඳු නැහැ. ගල්ගමුවේ මිනිස්සුන්ට හිනා යනවා; එහේ කඳු නැහැ. පඩුවස්නුවර දයාසිරි මහත්තයාගේ ආසනයේ නම් පොඩි කඳු දෙක තුනක් තිබෙනවා. ඒ නිසා මේවා කියනකොට ඒ දැඩි අවදානම ගැන මිනිස්සුන්ට දැනෙන විධියට කියන්න ඕනෑ. එහෙම නැතුව පොදුවේ මේවා කියලා හරියන්නේ නැහැ. මාධ්‍ය මර්දනය කරලා ඔබතුමන්ලාට වෙච්ච මේ හානිය, ඔබතුමන්ලාට වෙච්ච damage එක cover කරන්න බැහැ.

අනික් කාරණය මේකයි. දැන් ඔබතුමන්ලා හිතන්න එපා, ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නවා කියලා. ඔබතුමන්ලා දැන් ඉන්නේ ආණ්ඩුවේ. දැන් ඔබතුමන්ලා "රතු තරුව" මානසිකත්වයෙන් එළියට යන්න. මම දැක්කා, ඊයේත් ඇමතිවරු බඩු මලු උස්සනවා.

දැන් ඇමතිවරුන්ට කරන්න තිබෙන්නේ, බඩු මලු උස්සන එක නොවෙයි, හාල් මිටි උස්සන එක නොවෙයි, ගිහිල්ලා පාර සුද්ද කරන එක නොවෙයි, කානු සුද්ද කරන එක නොවෙයි. දැන් ඔබතුමන්ලා හදන්න ඕනෑ පාලම්. රටවල් අතර පාලම් හදන්න පුළුවන්; ජනතාව සහ නිලධාරින් අතර පාලම් හදන්න පුළුවන්; රාජ්‍ය යන්ත්‍රණයයි, ගමයි අතර පාලම හදන්න පුළුවන්. ඒ වාගේම ව්‍යාපාරිකයා සහ අසරණ මනුෂ්‍යයා අතර පාලම හදන්න පුළුවන්. අන්න ඒවා හදන්න ඕනෑ. එහෙම නැතුව, ගිහිල්ලා බඩු මලු උස්සන එක නොවෙයි කරන්න තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, වාහනයක් කැඩිලා බාස්ලා දෙන්නෙක්, තුන්දෙනෙක් ඇවිල්ලා අරවා ගලවලා, මේවා ගලවලා හදන්න බැලුවා. නමුත් හදාගන්න බැරුව ගියා. ඊට පස්සේ තව බාස් කෙනෙක් ඇවිල්ලා, පොඩි තට්ටුවක් දැම්මා; වැඩේ හරි ගියා. ඒකට රුපියල් 50,000ක් ඉල්ලුවා. ඒ තට්ටුවට රුපියල් 50,000ක් ඇයි, කියලා ඇහුවා. බාස්උන්නැහේ කිව්වා, "තට්ටු නම් ඕනෑ කෙනෙකුට දාන්න පුළුවන්, හැබැයි, හරි තැනට තට්ටුව දාන්න නම්, ඒකේ තාක්ෂණය, ඒකේ දැනුම, අත්දැකීම තිබෙන්න ඕනෑ" කියලා. ඒ නිසා ආණ්ඩුවට අපි කියනවා, හරි තැනට තට්ටුව දාන්න. බඩු මලු උස්සන එකයි, පාරවල් සුද්ද කරන එකයි, කානු සුද්ද කරන එකයි, සැල්වීනියා අදින එකයි, පාසි අදින එකයි නොවෙයි, ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන්ගේ වගකීම. මම නම් කියන්නේ, මේ කැබිනට් ඇමතිවරු reshuffle එකක් කරන්න කියලායි. සමහර විට මේ පසු පෙළ, ඔය එහා පැත්තේ -159දෙනා අතර- හොඳ දක්ෂයෝ ඇති. මොකක්ද, මේ කරන්නේ?

අද ආණ්ඩුව බොහොම පැහැදිලිවම අසාර්ථකයි කියලා ගමේ මිනිහා කියනවා. ගමට කිසි දෙයක් යන්නේ නැහැ. ගමට පණිවුඩය යන්නේ නැහැ. කළමනාකාරිත්වය පහළට ගිහිල්ලා නැහැ. රාජ්‍ය නිලධාරින් මොනවාද කරන්න ඕනෑ කියලා දන්නේ නැහැ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, සමහර රාජ්‍ය නිලධාරින්ගේ කොඳු කඩලා දාලා. එදා මම පහළ තලම්පොළ ඉඳිද්දී, හමුදාවේ නිලධාරින් මාත් එක්ක කථා කළා; රාජ්‍ය නිලධාරින් මාත් එක්ක කථා කළා. හැබැයි, මම ඉන්නවා දැකලා, පොලීසියේ OIC හැරිලා ගියා. ගිහිල්ලා, telephone එකක් කනේ තියාගෙන ඉන්නවා, බිංගිරිය OIC. බිංගිරියේ එක තැනකවත් telephone එකක් වැඩ කරන්නේ නැහැ; ටෙලිකොම්, මොබිටෙල්, ඩයලොග් ඒ එකක්වත් වැඩ කරන්නේ නැහැ. නමුත් එතුමා telephone එක කනේ තියාගෙන ඉන්නවා, මාත් එක්ක කථා කරන්න වෙයි කියලා. මොකක්ද, මේ අයට කරලා තිබෙන්නේ? ආනන්ද විජේපාල මහත්තයලා පොලිස් නිලධාරින්ගේ කොඳු කඩලා. මේ වෙලාවේ දේශපාලනය වැඩක් නැහැ. හොඳට වැඩ කරන රාජ්‍ය නිලධාරින් ඉන්නවා. බිංගිරියේ ප්‍රාදේශීය ලේකම්, උඩුබද්දාවේ ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරිවරු හොඳින් වැඩ කරනවා. ඊයේ පහළ තලම්පොළ ග්‍රාම නිලධාරින් එක්ක අපි රෑ 9.00, 10.00 වෙනතුරු බඩු බෙදුවා. ඒ අයට ප්‍රශ්නයක් නැහැ, අපි ඇවිල්ලා බඩු බෙදුවාට. ඒ අයට ඕනෑ කාගෙන් හරි වැඩේ කරන්න. නමුත් අද රාජ්‍ය යන්ත්‍රණයේ කොඳු කඩපු ආණ්ඩුවක් තමයි ඔබතුමන්ලා. රාජ්‍ය යන්ත්‍රණයේ කොඳු කඩලා තිබෙන්නේ. ඒ අයට තීන්දු, තීරණ ගන්න බැහැ. ප්‍රාදේශීය ලේකම්ට වියදම් කරන්න බැහැ, බයයි. දිසාපතිට වියදම් කරන්න බැහැ, බයයි. ප්‍රාදේශීය සභාවේ ලේකම්ට වියදම් කරන්න බැහැ, බයයි. මොනවාද, මේ කරන්නේ?

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මේ දේවල් යථා තත්ත්වයට පත් කරන්න නම්, ඉස්සෙල්ලාම ගමේ මුදලාලිව ගොඩනඟන්න ඕනෑ. ගමේ ව්‍යාපාරිකයා වැටිලා. මම දැක්කා, බෝවත්ත හන්දියේ

විශාල කඩයක අය දැන් ඉතුරු වෙලා තිබෙන පොඩි බඩු ටික වෙළා ගන්නවා. ඔහු තමයි ව්‍යවසායකයා; ඔහු තමයි රස්සා දෙන මිනිහා. ඔහු තමයි ගමේ supply chain එක. අපේ බිංගිරිය ආසනයේ හෙට්ටිපොළ, පඩුවස්නුවර, නිකවැරටිය ප්‍රදේශවල ඇතුළුව දිස්ත්‍රික්කයේ කුකුළු ෆාම් විශාල ප්‍රමාණයක් මේ ගංවතුරට යට වෙලා. කුකුළන් ලක්ෂ 20ක්, 25ක් -බිත්තර දමන සතුන්- අද මැරිලා. මේ මිනිස්සු නඟා සිටෙව්වේ නැත්නම් රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වෙනවා. ඒ නිසා ඉක්සෙල්ලාම ඒ අයගේ ණය ටික කපා හරින්න. ඒ අයට moratorium එකක් දෙන්න කටයුතු කරන්න. ඔබතුමන්ලා ගමේ මුදලාලිව නඟා සිටුවන්න ඕනෑ. නමුත් ඔබතුමන්ලා හැමදාම ගමේ මුදලාලිව වට්ටපු කට්ටිය. 1988-89 කාලයේ ගමේ මුදලාලිට වෙඩි තිබ්බා; කප්පම් ගත්තා. "කඩේ වහපිය, නැත්නම් උඹව මරනවා" කිව්වා. ඒ නිසා අද මේ ආණ්ඩුව රට කෙළින් කරන්න නම් ඉක්සෙල්ලාම ගමේ මුදලාලිව නැඟිටවන්න; සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා නැඟිටවන්න. අද මේ කට්ටිය වැටිලා ඉන්නේ. ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ **table*** කරනවා, තේ අපනයනකරුවන්ගේ සංගමය විසින් කරන ලද ඉල්ලීමක්.

අද මේ ව්‍යාපාර වැටිලා. ඒ අයගේ එක ඉල්ලීමක් තමයි, වහාම ඔවුන්ට credit facility එකක් දෙන්න කියන එක. මොකද, වැල්ලම්පිටිය පැත්තේ තමයි ඔවුන්ගේ ගොඩක් stores තිබෙන්නේ. ඒ සේරම යට වෙලා. ඔවුන් credit facility එකක් ඉල්ලනවා.

ඊළඟ කාරණය මේකයි. SVAT එක අයින් කරලා VAT එක දැම්මා නේ. හැබැයි, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා කිව්වා, දවස් 45න් VAT refund කරනවා කියලා. දැන් දවස් 60ක් ගිහිල්ලා, තවම VAT refund එක නැහැ. වහාම VAT refund එක දීලා, ඒ මිනිස්සුන්ගේ අතට සල්ලි ටික ආපසු යන්න සලස්වන්න. ඒ වාගේම අපි දන්නවා, රුසියාවට විශාල තේ ප්‍රමාණයක් අපෙන් අපනයනය කරන බව. Honest Mark Certification කියලා ඒගොල්ලන්ගේ labelling එකක් තිබෙනවා. හැම pack එකටම ඒ label එක ගහන්න ඕනෑ. මේ අප්‍රේල් ඉඳන් ඒක apply කරන්න ඕනෑ. හැම එකටම විශාල වියදමක් දරන්න වෙනවා. අපි දැක්කා, පුටින් ජනාධිපතිතුමා කියනවා, ලංකාවට අපි උදවු කරන්න ලැහැස්තියි කියලා. ඉතින් ඔබතුමන්ලා ගිහිල්ලා ඉල්ලන්න, මේ Honest Mark Labelling එක ක්‍රියාත්මක කිරීම අවුරුද්දකටවත් කල් දමන්න කියලා. ඒක තමයි කරන්න ඕනෑ. අද මේ ඇමතිවරු කරන්න ඕනෑ දේවල් නොවෙයි කරන්නේ. නිකම් බඩු මිටි කරේ තියාගෙන යනවා. මේ රට රටවල්වලට කථා කරන්න ඕනෑ.

දැන් තානාපති සේවාව බලන්න. මම දැක්කා ඊයේ, ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තුවේ මේ ගැන කථා වෙලා පාර්ලිමේන්තුවේ ඇමතිවරියක් හෝ මන්ත්‍රීවරියක් කියා තිබෙනවා, ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 2.5ක් අපේ රටට පරිත්‍යාග කරනවා කියලා. හැබැයි, මේකට කථා කරලා තිබෙන්නේ කවුද? තානාපති සේවාවේ අයද? අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින්ද? නැහැ. එහේ ඉන්න Consulate General Pradeepa Saram වෙනම account එකක් දාගෙන සල්ලි එකතු කරනවා. හැබැයි, මේකට කථා කරලා තිබෙන්නේ ශිනන්ත ජයතිලක, Dr. Erandi, චන්ද්‍රා බමුණුසිංහ කියලා ඒ රටේ ඉන්න අපේ ශ්‍රී ලාංකිකයෝ තුන්දෙනෙක්. ඔවුන් තමයි මේක coordinate කරලා තිබෙන්නේ. ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවේ ඒ ඇමතිතුමිය කථා කරලා

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

ශිනන්ත ඇතුළු මේ තුන්දෙනාගේ නම් කියලා ඒ අයට ස්තුතිවන්ත වෙනවා.

ඉතින්, ඒ වාගේ අපේ රටේ මිනිස්සු කරන දේවත් මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ට කරගන්න බැහැ නේ. මේගොල්ලෝ බඩු උස්සනවා. බඩු උස්සන එක ඇමතිතුමෙක් යනවා. මොකද, මේවා ඇහෙනකොට ඉන්න බැහැ.

අපි දන්නවා, මේ ව්‍යසනය සම්බන්ධව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කලින් කිව්වා. මේකට කොච්චර බර තිබ්බාද කියන එක නොවෙයි ප්‍රශ්නය. හැබැයි මේක කිව්වු වෙනකොට, Disaster Management Centre එක දාලා, team එකක් දමලා යම් මට්ටමකට - අපි කියන්නේ නැහැ සියයට සියයක් කියලා - ආණ්ඩුවට මේ ව්‍යසනය කළමනාකරණය කර ගන්න තිබුණා. හැබැයි, එහෙම කළේ නැහැ. ව්‍යසනය වුණාට පස්සේ ව්‍යාපාරිකයෝ 10ක්, 15ක් පත් කරනවා. ව්‍යාපාරිකයින්ට disaster manage කරන්න පුළුවන්ද? ඒ අයට පුළුවන් වෙයි සල්ලි ටිකක් එකතු කරන්න. Disaster management කරන්න, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉන්න ඕනෑ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉන්න ඕනෑ, GAලා ඉන්න ඕනෑ, පළපුරුදු අය. ඒ වාගේම හමුදාව ඉන්න ඕනෑ, පොලීසිය ඉන්න ඕනෑ. ඒ අයගේ සහයෝගයත් එක්ක තමයි disaster management කරන්න පුළුවන් වෙන්නේ.

අපේ රටේ එක එක ප්‍රදේශවලට මීට වඩා disasters සිදු වුණු අවස්ථා තිබෙනවා. නමුත් මේකෙදි රටක් විධියට විශාල බලපෑමක් සිදුවෙලා තිබෙනවා. නමුත් ඒ කාරණා මුකුත් කළේ නැහැ.

අපි දන්නවා, කලා වැවේ ජලය යම්කිසි ප්‍රමාණයක් release කරලා තිබුණු බව. හැබැයි, දැදුරු ඔය, කොත්මලේ ජලාශය - ඒවා - manage කළේ නැහැ. අපේ කබීර් හෂීම් මැතිතුමා කිව්වා, ගම්පොළට ඒ විනාශය වුණේ ඒ නිසා කියලා. මේ ව්‍යසනය යම් මට්ටමකට අවම කර ගන්න තිබුණා; සියයට සියයක් නොවෙයි, සියයට 50කින් අඩු කරන්න තිබුණා. ඒක කළේ නැහැ. ඒක කරන්න බැරි වුණේ ඇයි? නිලධාරින් හයවෙලා ඉන්නේ. නිලධාරින් තීන්දු, තීරණ ගන්නේ නැහැ. මේ විනාශයට අමතරව, මේ ආණ්ඩුව මේ රටට කරපු ලොකුම විනාශය තමයි නිලධාරින්ගේ කොන්ද කඩපු එක, නිලධාරින්ගේ බලය හැල්ලු කරපු එක, නිලධාරින්ට අභීතව තීන්දු ගන්න තිබුණු හැකියාව නැති කරපු එක. මොකද, හැම දෙයකටම ඒ මිනිස්සුන්ව අල්ලාගෙන යනවා නේ. එහෙම කරලා තමයි අද මේ විනාශය කර තිබෙන්නේ. මම කියන්නේ මේක murder එකක් කියලායි. ඒ නිසා මේ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරලා, පරීක්ෂණ පවත්වන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ ජලාශවල ජලය release කරනකොට අපි දන්නවා කැබිනට් මණ්ඩලයේ සිටින ඇමතිවරයාගෙන් අනුමැතිය ගන්න ඕනෑ බව. ඒ නිසා මේ water management කරන්න ඉඩ දුන්නේ නැත්තේ කවුද කියන එක හොයන්න වහාම කමිටුවක් පත් කරන්න ඕනෑ. මේවා නිසා තමයි හානිය උපරිම වුණේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Nalin Bandara Jayamaha, your time is up.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම ඉක්මනින් අවසන් කරන්නම්. ගරු ගයන්ත මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

මධ්‍යම කඳුකරයට මිලිමීටර් 300කට වැඩි වර්ෂාපතනයක් එනකොට නාය යාම් සිදුවෙනවා කියන එක අපිටත් තේරෙනවා. මිලිමීටර් 400ක, 500ක වර්ෂාපතනයක් එනකොට අනිවාර්යයෙන්ම නාය යනවා. හැබැයි ඒක ගමේ ඉන්න මිනිහාට තේරෙන්නේ නැහැ. කන්ද පාමුල ඉන්න මිනිහා හිතනවා, කවදාවත් මේ කන්ද නාය ගිහිල්ලා නැහැ, ගලක්වත් වැටිලා නැහැ, මේ කන්ද කඩා වැටෙන්නේ නැහැ කියලා. හැබැයි, මේ වාගේ rainfall එකක් එනකොට නාය යනවා කියන එක දැනගෙන කටයුතු කරන්න NBRI එක තිබෙනවා, අනෙකුත් ආයතන තිබෙනවා, දිසාපතිවරු ඉන්නවා. හැබැයි, ඒ අය මේක manage කළාද? ඒ වෙනුවෙන් කටයුතු කළේ කවුද? මොන ඇමතිවරයාද මේ අවදානම දැක්කේ? මොන නිලධාරියාද මේ සඳහා අවශ්‍ය කාරණා ඇමතිවරු එක්ක එක මේසයේ ඉඳගෙන කථා කළේ? ඒ සතියෙම මොනවාද කළේ? ජනාධිපතිතුමා තැන් තැන්වලට ගිහිල්ලා, වැඩසටහනකට ලැහැස්ති වුණා. තවත් එක එක දේවල් කළා. මේගොල්ලෝ දේශපාලනය කළා. වෙන එකක්වත් කළේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේ අය වැය වෙනස් කරලා, අලුත් අය වැයක් ගෙනැල්ලා කටයුතු කරන්න. අපි බිලියන 7ක්, 8ක් හොයා ගන්න ඕනෑ. ඔය පිට රටකින් හම්බවෙන ඩොලර් මිලියන 2කින්, 3කින් මේක ගොඩ දමන්න බැහැ. අඩුම ගණනේ බිලියන 7ක් ඕනෑ. ඒ නිසා මේ වැඩේ කරන්න ගතයුතු ක්‍රියාමාර්ග වහාම ගන්න. කළ යුතු වෙනස්කම් සිදු කරලා, විපක්ෂයත් එක්ක එකතුවෙලා ඒ වාගේම ජාත්‍යන්තරයත් එක්ක සම්බන්ධ වෙලා, ගිහිල්ලා කථා කරලා කටයුතු කරන්න, මුට්ට කරගහන්නේ නැතිව.

පසුගිය කාලයේ ADB එක ස්වාභාවික විපත් අවම කර ගැනීමට ණය ලබා දුන්නා. ඒ ණය මුදල්වලට මොකද වුණේ, ඒවායින් මොනවාද කරන්නේ, විපතක් වෙලා තිබෙන මේ වෙලාවේ අපිට තව කොහේටද යන්න පුළුවන්, අපි කොහොමද IMF එකත් එක්ක ගනුදෙනු කරන්නේ, ලෝකයේ අනෙක් රටවල් එක්ක තිබෙන ණය ගනු දෙනු කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන මේ සියල්ලම ගැන හොයා බලන කටයුතු කරන එක තමයි කැබිනට් ඇමතිවරුන්ගේ වගකීම. ඒවා ගැන හිතන්න. එක තැනක ඉඳගෙන calls ටික ගන්න. මුට්ට කරගහන එක නවත්වන්න. ඔබතුමන්ලා ඉන්නේ විපක්ෂයේ නොවෙයි, මේක රතු තරුවට කරන්න පුළුවන් වැඩක් නොවෙයි කියන එක මතක් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Ananda Wijepala. You have five minutes.

[පූ.භා. 10.55]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු සභාපතිතුමනි, මේ ඇති වෙච්ච ජාතික ව්‍යසනය හමුවේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු විශාල වශයෙන් ව්‍යාජ ප්‍රකාශ සමාජගත කරන්න උත්සාහ කරනවා. මේ ව්‍යසනයේදී එතුමන්ලා ආණ්ඩුවට සහාය ලබා දෙනවා නම්, ඉටු කළ යුතු කාර්යය වන්නේ, ව්‍යාජ තොරතුරු, බොරු ප්‍රචාර සමාජගත නොකර සිටීමයි.

ගරු සභාපතිතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ සුළි කුණාටුව පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම කළ 25වන දා උදේ 10.00 සිට අපි රජයක් හැටියට ගත යුතු සියලු විධිවිධාන ගෙන තිබෙනවා. අපේ ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, පූර්ව දැනුම් දීම් කළේ නැහැ කියලා. පොලීසියත්, ඒ වාගේම අපගේ මහජන නියෝජිතයෝත් ප්‍රාදේශීය සභා ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගෙන ජනතාව අවදානම් ස්ථානවලින් ඉවත් කිරීම සඳහා විශාල වශයෙන් කටයුතු කළා. ඒ ආකාරයට අවස්ථා දෙකතුනකදී බොහෝ ප්‍රදේශවල පිරිස් ඉවත් කළා. යම් පිරිසක් ඔවුන්ගේ කැමැත්තෙන් රැඳී සිටි බව ඇත්තයි. එහෙත් රජයක් හැටියට ගන්න පුළුවන් සෑම ක්‍රියාමාර්ගයක්ම අප විසින් ගනු ලැබුවා.

25වන දා උදෑසන 10.00ට තමයි මේ අනතුරු ඇඟවීම ආවේ. එතැන් සිට ඒ සියලු රාජ්‍ය ආයතන සක්‍රියව ක්‍රියාත්මක වුණා. ගරු සභාපතිතුමනි, එම රජයේ නිලධාරින්ට විශේෂ ස්තුතියක් කරන්නත් මම මේ අවස්ථාව යොදා ගන්නවා. ග්‍රාම නිලධාරිවරයාගේ ඉඳලා අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා වූ සියලු නිලධාරින්; මේ කටයුත්තට බද්ධ වුණු සියලු ආයතනවල නිලධාරින් සක්‍රියව වැඩ කළා. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි චක්‍රලේඛ සම්පූර්ණයෙන්ම ලිහිල් කරලා නව චක්‍රලේඛ නිකුත් කළා. ඒ වාගේම පූර්ව දැනුවත්වීම් හරහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජල කළමනාකරණ අංශය ජල කළමනාකරණ කාර්යය ආරම්භ කර තිබුණා, ඒ දින කිහිපය පුරාම. ජල මූලාශ්‍රවල අවම වශයෙන් තබා ගත ජල ප්‍රමාණවලට අදාළව ඒ ආකාරයෙන් කටයුතු කර තිබුණා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාවත් විශේෂ කාර්යභාරයක් සිදු කළා. විශේෂයෙන්ම නාවික හමුදාව බෝට්ටු ස්ථානගත කර තිබුණා. ත්‍රිවිධ හමුදාවම ඒ සඳහා සූදානමින් සිටියා. ඒ වාගේම පොලීසියත් ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරලා, ඒ ඒ පළාත්වල ජනතාව දැනුවත් කරමින් එම පිරිස් ඒ තැන්වලින් ඉවත් කරන්න කටයුතු කළා, ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි.

ඒ ආපදා අවස්ථාවේත්, ඒ වාගේම ඊයේ පෙරේදාත් මම ආපදා තත්ත්වයට ගොදුරු වුණු නිකවැරටිය ආසනය සහ ගල්ගමුව ආසනය පුරා ගමන් කළා. ඒ පළාත්වල මුදා ගැනීමේ කටයුතු සිදු කළා. ඒ පළාත්වල විතරක් නොවෙයි, රට පුරාම මුදා ගැනීමේ කටයුතු සඳහා නාවික හමුදාවේ බෝට්ටු වාගේම පෞද්ගලික අංශයට අයත් බෝට්ටු විශාල වශයෙන් යොදා ගන්න අපට හැකියාව ලැබුණා. මේ කාර්යයට ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉඳලා ප්‍රාදේශීය වශයෙන් ඉන්න සියලු නිලධාරින්ගේ සක්‍රිය දායකත්වය ලැබුණා. නිලධාරින් බියෙන් පසු බැස සිටියේ නැහැ. ඔවුන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළා. ඒ රාජකාරියේදී නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනෙකුගේ ජීවිත අහිමි වුණා, පොලිස් නිලධාරියෙකුගේ ජීවිතය අහිමි වුණා, ඒ වාගේම ගුවන් හමුදා නිලධාරියෙකුගේත් ජීවිතය අහිමි වුණා. එහෙම ජීවිත පරිත්‍යාගයෙන් තමයි එම නිලධාරින් කටයුතු කළේ. නිලධාරින් බිය වෙලා, පසුබට වෙලා කටයුතු කළේ නැහැ. පූර්ව අනතුරු ඇඟවීම සිදු කළ දිනයේ සිට මේ ආපදාව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ඒ අය ගත්තා. අවුරුදු 7ක් තිස්සේ එක රැස්වීමක්වත් පවත්වා තිබුණේ නැති ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය අගෝස්තු මාසයේ 05වන දා රැස් වුණා. විපක්ෂයේ මන්ත්‍රීවරුත් ඒකට සහභාගි වෙලා හිටියා. එම සභාව රැස් වෙලා තීන්දු තීරණ ගත්තා; අවශ්‍ය පසුබිම හදා තිබුණා. ඒ අනුව අගෝස්තු මාසයේ ඉඳලාම අපි ආපදා කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කර තිබුණා. අපි ඒ ආකාරයට කටයුතු කරලා තිබුණා.

ඒ වාගේම, මෙම ව්‍යසනයෙන් පසුව, මේ ආපදාවෙන් පසුව ආපදාව කළමනාකරණය කරලා අපි සහන වැඩ පිළිවෙළක්

ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන් සුරක්ෂා මධ්‍යස්ථාන 1,433ක පමණ පවුල් 410,000කට වැඩි පිරිසක් රැඳී සිටියා. ඒ සියලු දෙනාට නැවත නිවෙස් වෙත යනකොට අවශ්‍ය වන මුළුතැන්ගෙයි උපකරණ ඇතුළු මූලික උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් 25,000 බැගින් අද දිනයේ සහ හෙට දිනයේ ලබා දෙනවා. අපි පෙර දිනයේත් ගෙවීම් කටයුතු කළා. ඒ සඳහා රුපියල් බිලියන 10ක් මේ වනකොට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යවා තිබෙනවා. මේ දින 2 තුළ එම බිලියන 10ක මුදල එම පවුල් 410,000ට ගෙවීමට අවශ්‍ය සියලු විධිවිධාන යොදා තිබෙනවා. සෙනසුරාදා දිනය වන හෙටත් ඒ මුදල ගෙවනවා. අපි එය මුදලින්ම ගෙවන්න තීන්දු කර තිබෙනවා. මොකද, සමහර අයගේ හැඳුනුම්පත් නැහැ; සමහර අයට බැංකු ගිණුම් ද නැහැ. ඒ හින්දා එය මුදලින්ම ගෙවන්න අපි කටයුතු කර තිබෙනවා. කිසි කෙනෙකු අත් හරින්නේ නැතුව ඒ සහන සැලසීමේ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ඒ හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම තක්සේරු කමිටුවක් හදලා තිබෙනවා. ආපදාවට ලක් වුණු නිවෙස්වලට ගිහිල්ලා ඒ නිවාසවල මොන ආකාරයේ අලාභයක්ද වෙලා තිබෙන්නේ කියා පරීක්ෂා කිරීමේ කටයුතු එම කමිටුව හරහා අපි මේ වනකොට ආරම්භ කර තිබෙනවා. වගා හානිත් විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. එසේ වගා හානි හැම එකකටම අදාළව වන්දි ලබා දෙන්න මේ වනකොට රජය යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා; එම සංගණන කටයුතු කරමින් ඉන්නවා. රජය හැටියට අපි සියලු ආකාරයේ මැදිහත්වීම් කරමින් ඉන්නවා.

විපක්ෂය මෙතැනට ඇවිල්ලා මොන ආකාරයේ ව්‍යාජ; බොරු ප්‍රචාර සිදු කළත් මේ රටේ බිමේ ජනතාව දන්නවා, මොන ආකාරයෙන්ද මේ කටයුතු සිද්ධ වෙන්නේ කියලා; රජය මේ ව්‍යසනයට මොන ආකාරයෙන්ද මුහුණ දුන්නේ කියලා; ගලවා ගැනීමේ කටයුතු මොන ආකාරයෙන්ද කළේ කියලා. ගරු සභාපතිතුමනි, ජාත්‍යන්තර සංවිධාන පවා අප විසින් කරන මේ ක්‍රියාවලිය පැසසුමට ලක් කර තිබෙනවා.

අවස්ථාවාදී දේශපාලනයක් නොවෙයි අපට වුවමනා. අපි විපක්ෂයට ආරාධනා කරනවා, මේ ජාතික ව්‍යසන අවස්ථාවේ ඒකාබද්ධව කටයුතු කරන්න කියලා. මොකද, ව්‍යාජ තොරතුරු හරහා සිද්ධ වෙන්නේ මේ ව්‍යසනයෙන් බැට කාපු මිනිසුන් තව තවත් භීතියට සහ නොසන්සුන්තාවට පත් වීමයි. රජයක් හැටියට ගත යුතු සියලු ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා. ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත් කිව්වා වාගේම ව්‍යාපාරික ප්‍රජාවටත් විශාල වශයෙන් හානි සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර නැවත ගොඩනැඟීම සඳහා මොන ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන කාරණය සම්බන්ධවත් මේ වනකොට විශේෂ අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම වී වගාව විතරක් නොවෙයි, එළවලු වගාව සම්බන්ධවත්, මිරිස් වගාව සම්බන්ධවත්, බඩ ඉරිඟු වගාව සම්බන්ධවත් දැන් සංගණන කටයුතු සිදු කරනවා; දත්ත එක් රැස් කරමින් යනවා. ඒ සියලුදෙනාට සහන සලසා දීමේ වැඩසටහනක් කෙරෙහි රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා.

ඊළඟට, අනාරක්ෂිතව, අවතැන්ව ඉන්න සියලු පිරිස් ප්‍රතිස්ථානගත කිරීම සඳහා, ඒ කියන්නේ නැවත පදිංචි කිරීමට වඩා වෙනත් ස්ථානයක පදිංචි කිරීම සඳහා අප විශේෂ අවධානය යොමු කර තිබෙනවා. ඒ සඳහා වන සියලු උපදෙස් දිස්ත්‍රික් ලේකම්වරුන්ටත්, ප්‍රාදේශීය ලේකම්වරුන්ටත් මේ වනකොට ලබා දී තිබෙනවා. මම නැවතත් ස්තුතිවන්ත වෙනවා, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්ගේ සිට ඉහළට, ඒ කියන්නේ දිසාපතිවරයා, අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා සියලු නිලධාරින්ට, ඒ වාගේම පොලීසියේ සහ ත්‍රිවිධ හමුදාවේ සියලු නිලධාරින්ට. මොකද, ඒ සියලු රාජ්‍ය නිලධාරින් ජීවිත පරිත්‍යාගයෙන් දවසකට පැය 18-20 වැඩ කරමින් මේ ජාතික ව්‍යසනය කළමනාකරණය කරන්නත්, මේ ජාතික ව්‍යසනයෙන් අවතැන් වූ ජනතාව සුරක්ෂා කරලා රැක බලා ගන්නත් අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා ඇතැම් අයගේ මේ බොරු ප්‍රචාරයන්ට නොරැවටී ඇත්ත ඇති සැටියෙන් දකින ලෙස තමයි මම මේ අවස්ථාවේ අවධාරණය කර සිටින්නේ.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. R.M. Ranjith Madduma Bandara. You have 15 minutes.

[පූ.භා. 11.02]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු සභාපතිතුමනි, මේ ජාතික ව්‍යසන අවස්ථාවේ, ඒ ව්‍යසනයෙන් පීඩාවට පත් අහිංසක ජනතාව වෙනුවෙන් උදව් කරන්න, සහයෝගය දෙන්න විපක්ෂය විධියට අපි සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා තමයි ගරු විපක්ෂ නායකතුමා මේ ව්‍යසනය වෙච්ච අවස්ථාවේදීම කිව්වේ, ව්‍යසන අවස්ථාවක්, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරන්න කියලා. ඒ නිසා තමයි එතුමා විදේශීය තානාපතිවරුන් හමු වෙලා කිව්වේ, අපේ රටට උදව් කරන්න කියලා. අපේ මන්ත්‍රීවරු විවාදයක් ඉල්ලුවා, මේ තත්ත්වය සම්බන්ධව තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න. මේ ඒකාධිපති ආණ්ඩුව ඒකට අවස්ථාවක් දුන්නේ නැහැ.

මහජන ආරක්ෂක ඇමතිතුමා දැන් කියනවා, ආණ්ඩුව මේ ගැන දන්නේ 25වැනි දායි කියලා. මේ රටේ මේ කාලගුණය සම්බන්ධව ප්‍රකාශ කිරීමේ අයිතිය තිබෙන්නේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටයි. අපි පැහැදිලිව කියනවා, එතුමා කියන විධියට, එතුමාගේ දත්ත අනුව ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ කියලා. මේ "දිට්වා" සුළි කුණාටුව දකුණු ඉන්දියාවටත් බලපෑවා; එහි තුන්දෙනකු පමණයි ජීවිතක්ෂයට පත් වුණේ. කුණාටුවක් නවත්වන්න පුළුවන්කමක් නැහැ. නමුත් හානිය අවම කර ගන්න පුළුවන්. සති දෙකකටත් ඉස්සෙල්ලා ඉඳන් තමයි ඒ ගැන කියන්න පටන් ගත්තේ. මේ රටේ කාලගුණය සම්බන්ධව තොරතුරු ලබා දෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පසුගිය 11වැනි දා මාධ්‍ය හමුවකදී කියා තිබෙනවා, "බෙංගාල බොක්කේ කැලඹුම් ස්වභාවයක් තිබෙනවා, අපට ඒක බලපාන්න පුළුවන්, එහෙම වුණොත් වැස්ස වැඩි වෙනවා, අවශ්‍ය පියවර ගන්න" කියලා. එතුමා ඒ ප්‍රකාශය කළාම එතැනදී මාධ්‍යවේදියෙක් ඇහුවා, "මේ තත්ත්වය අ.පො.ස. (උසස් පෙළ) විභාගයට බලපායිද?" කියලා. "ඔව්, බලපාන්න පුළුවන්" කිව්වා. 12වැනි දා ආයෙත් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වූවා. එතැනදීත් එතුමා කිව්වා, "නැඟෙනහිර කලාපයේ, නිරිතදිග කලාපයේ අඩු පීඩන තත්ත්වයක් තිබෙනවා, වහාම ප්‍රවේශම් වෙන්න" කියලා. ආපහු 14වැනි දාත් කියනවා. මා අහන්නේ, එහෙම කියන්නේ ඇයි කියලායි. ප්‍රශ්නයක් තිබෙන නිසායි එහෙම කියන්නේ. නමුත් ආණ්ඩුවට ඒක දැනිලා තිබෙන්නේ, 25වැනි දායි. 17වැනි දා ආපහු කියනවා, මිලිමීටර 100ට වැඩි වර්ෂාපතනයක් අපේක්ෂා කරනවා කියලා. ආණ්ඩුවෙන් මම අහනවා, "කන් ඇහෙන්නේ නැද්ද, ඇස් පෙනෙන්නේ නැද්ද, බිහිරි මිනිස්සුද ඉන්නේ?" කියලා. දිගින් දිගටම මේ ගැන කිව්වා. එතුමා විතරක් නොවෙයි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මලිත් ප්‍රනාන්දු කියන විද්‍යාඥයාත් නොවැම්බර් 21වැනි දාත්, 22වැනි දාත් කිව්වා, "ප්‍රවේශම් වෙන්න"

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

කියලා. නමුත්, ආණ්ඩුව කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. ඒ විතරක් නොවෙයි. නොවැම්බර් 25වැනි දා "දෙරණ" නාළිකාවත්, "හිරු" නාළිකාවත් සැටලයිට් ඡායාරූප ආශ්‍රයෙන් කිව්වා, සුළි සුළඟක් එනවා කියලා.

ආපහු කියනවා 24වැනි දා එක සුළියක් අරාබි මුහුදට යනවා, අනෙක් සුළිය අපේ ප්‍රදේශයට එනවා කියලා. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවක මොකක්ද කරන්නේ? මාත් ආපදා කළමනාකරණ ඇමතිවරයකු විධියට හිටියා. මෙවැනි අවස්ථාවකදී අදාළ කණ්ඩායම් කැඳවලා සාකච්ඡා කරනවා. මම අහනවා, ආණ්ඩුව එක සාකච්ඡාවක්වත් නොවැම්බර් 27වැනි දාට ඉස්සෙල්ලා තිබ්බා ද කියලා. නිරිතදිග මෝසම එනකොට, ඊසානදිග මෝසම එනකොට සාමාන්‍යයෙන් අපි කරන්නේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් කැඳවලා සාකච්ඡා කරන එක. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අංශ කැඳවලා අවශ්‍ය උපදෙස් දෙනවා. අපි ගමට ගිහිල්ලා ග්‍රාම නිලධාරි දක්වා උපදෙස් දෙනවා මේවා කොහොමද කළමනාකරණය කරන්නේ කියලා. මේ ආණ්ඩුවට ඒක කරගන්න බැරි වුණා. මොකක්ද මේකට හේතුව? කවුද ආපදා කළමනාකරණ ඇමති? මේ රටට සුනාමියක් ආවා. නියඟ ආවා. සුළි සුළං ආවා. ඒක නිසා එදා හිටපු රාජ්‍ය පාලකයෝ ආපදා කළමනාකරණය සම්බන්ධ ඇමතිවරයෙක් පත් කළා. මේ ජනාධිපතිතුමා මොනවාද කළේ? ආරක්ෂක ඇමතිත් එතුමා, මුදල් ඇමතිත් එතුමා, ඩිජිටල් පහසුකම් ඇමතිත් එතුමා, ආපදා කළමනාකරණ ඇමතිත් එතුමා. ආයතන 171ක් එතුමා යටතේ තිබෙනවා. මොකක්ද එතුමා කියන්නේ? එතුමා දොඩම් ගොඩ බදාගත්තා වාගේ හැමදේම බදාගෙන ඉන්නවා, වැඩක් කරන්නේ නැහැ. මම එතුමාගෙන් මේ කාරණය අහනවා. ව්‍යසන කළමනාකරණ ජාතික සභාව මේ වෙනකම් තවම කැඳවලා නැහැ. මෙන්න, ඔබතුමන්ලාගේ පාලනය.

ගරු සභාපතිතුමනි, මෙච්චර තත්ත්වයක් ඇති වෙලා තිබියදීත් මේ ලේකම්වරයා පළමුවැනි චක්‍රලේඛය නිකුත් කරන්නේ නොවැම්බර් 27වැනි දා. හරි නම් මේ ලේකම්වරයා මීට ඉස්සෙල්ලා අදාළ අංශ කැඳවලා, මේ පිළිබඳ තොරතුරු එනකොට අවශ්‍ය පියවර ගන්න ඕනෑ. අවශ්‍ය පියවර ගත්තේ නැති නිසා තමයි මෙච්චර හානියක් සිද්ධ වුණේ. මේ ව්‍යසනය සම්පූර්ණයෙන්ම නවත්වන්න බැහැ. නමුත්, හානිය අවම වෙන්න ඕනෑ; මරණ සංඛ්‍යාව අවම වෙන්න ඕනෑ. රටේ අහිංසක මිනිසුන්ට මේ පණිවුඩය ගියේ නැහැ. මෙතුමා මොකක්ද කීන්නේ? මෙතුමා චක්‍රලේඛයක් යවනවා. ඒකෙන් කියැවෙන්නේ මොකක්ද? "අපි ඊයේ රැස්වීමක් තිබ්බා. මේ රැස්වීමේදී විපක්ෂයේ මන්ත්‍රීවරුයි අනෙක් කට්ටියයි මෙහෙම කිව්වා, ඒ නිසා මේකට පියවර ගන්න" කියන එකයි තිබුණේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බීබීසී එකෙන්, ජාත්‍යන්තරයෙන් ආපු කාරණා සම්බන්ධයෙන් නිසි පියවරක් ගත්තේ නැහැ. අමාත්‍යාංශ ලේකම්වරයෙක් චක්‍රලේඛයක් යවන්නේ මෙහෙමද කියලා මම අහනවා. මේ උදවිය මොනවාද කළේ? පසුගිය මැයි මාසයේ විශාල වියදමක් දරලා මැරියට් හෝටලයේ මේවාට සම්බන්ධ සම්මන්ත්‍රණයක් තිබුණා. මේ තොරතුරු එද්දී කවදා හරි, කොහේදී හරි ඒ ගැන සාකච්ඡාවක් තිබුණා ද කියා මම අහනවා. මේක තමයි ආණ්ඩුවේ කළමනාකරණය. මේක තමයි ආණ්ඩුවේ වැරැද්ද. අපි ඇත්ත කියන්න ඕනෑ. මේක තමයි තමුන්නාන්සේලාට තිබුණු පෙර සූදානම. එතකොට පසු සූදානම ගැනත් බලන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මේ තොරතුරු එන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට කියන එකත් මට ආරංචියි. ආරක්ෂක ලේකම්වරයා ඊයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කැඳවලා තර්ජනය කරලා තිබෙනවා, "මාධ්‍යයට යන්න එපා, මොකුත් කියන්න එපා" කියලා. අධ්‍යක්ෂ ජනරාල්වරයා මේවා රටට කියපු එකද වැරැද්ද? තමුන්නාන්සේලා මේ රට අද ඒකාධිපති පාලනයකට ගෙනියන්නයි හදන්නේ. මෙන්න මේකයි අද රටේ තත්ත්වය. ආණ්ඩුව මේකට වග කියන්න ඕනෑ කියන එක අපි තරයේම කියනවා. මොකද, මෙච්චර තොරතුරු ඇවිල්ලාත් ආණ්ඩුව මේ සම්බන්ධයෙන් පියවරක් ගත්තේ නැහැ.

විපක්ෂය විධියට අපේ නායකතුමාට පුළුවන්කම ලැබුණා, 27වැනි දා රැස්වීමට ගිහිල්ලා හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරවාගන්න. හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන්න අපි උදව් කරනවා. ආණ්ඩුව ඒක කළේ නැහැ. අපි ජනාධිපතිවරයාගෙන් මේ කාරණයත් අහනවා. මේක තමුන්නාන්සේ යටතේ තිබෙන අමාත්‍යාංශයක කාර්යභාරයක්. නමුත්, තමුන්නාන්සේ මේක මඟ හැර තිබෙනවා. තමුන්නාන්සේ දන්නේ මෙතැනට ඇවිල්ලා හයියෙන් කෑ ගහන්නයි, අසත්‍ය කියන්නයි විතරයි. මේ තත්ත්වය පාලනය කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ එක්කම මම මේකත් අහනවා. මොන ආණ්ඩුවක් ද මෙහෙම කරන්නේ? මෙවැනි හදිසි තත්ත්වයක් තිබියදීත් නොවැම්බර් 28වැනි දා රජයේ නිවාඩු දිනයක් කරනවා. මම දන්නේ නැහැ, කාගේ උපදෙස් අනුව ද ආණ්ඩුව මේ විධියට වැඩ කරන්නේ කියලා. මේක ජනාධිපතිවරයාගේ මොන අත්දැකීමක් ද? රජයේ නිලධාරි යන්ත්‍රණයම එක තැනක හිටියා.

ගරු සභාපතිතුමනි, මෙවැනි අවස්ථාවක රටේ රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත්, රාජ්‍ය යන්ත්‍රණයට නිවාඩු දීලා. නිලධාරීන් ගෙවල්වල. ටෙලිෆෝන් වැඩ කරන්නේ නැහැ; විදුලිය නැහැ. එවැනි තත්ත්වයක් තමයි රටේ ඇති කළේ. අද විදේශ මාධ්‍ය මේ රජයේ දුර්වලකම ගැන කියනවා. මෙතුමන්ලා මේ රටේ මාධ්‍යවලට තර්ජනය කරනවා. එදා ජනාධිපතිවරයා පැහැදිලිව කිව්වා, "හදිසි නීතිය පනවන්නේ ආපදා තත්ත්වය පාලනයට විතරයි" කියලා. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, "ජනාධිපතිට පහර ගහනවා, ආණ්ඩුවට පහර ගහනවා. මේගොල්ලෝ අත්අඩංගුවට ගන්න ක්‍රියාමාර්ග ගන්න" කියලා. මේකද රජයේ ප්‍රතිපත්තිය? වැරැද්දක් දැක්කාම ඒ ගැන කථා කරන්න ඕනෑ. වැරැද්දක් දැක්කාම වැරැද්දක් බව කියන්න ඕනෑ.

ඒ දවස්වල අපි ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වැඩ කරද්දී වේලාසනම අවශ්‍ය කටයුතු කළා. නිරිතදිග මෝසම, ඊසානදිග මෝසම එද්දී මේ රටේ ආපදා ඇති වනවා. ඒ නිසා අපි බෝට්ටු ගෙනැල්ලා ස්ථානගත කරනවා. අවශ්‍ය ටෙන්ට් ටික, විදුලි කියත් ටික අපි ස්ථානගත කරනවා. මේ ගැන 11වැනි දා ඉඳලාම කිව්වා. නමුත්, කිසිම පෙර සූදානමක් වුණේ නැහැ. ආණ්ඩුව මර නින්දේ හිටියේ. ඒ නිසා ආණ්ඩුව මේකට වග කියන්න ඕනෑ. අපි දැන් බලමු, පසු සූදානම මොකක්ද කියලා.

යහ පාලන ආණ්ඩුව කාලයේ ස්වාභාවික ව්‍යසන වෙනුවෙන් අපි පිහිටෙව්වා ජාතික රක්ෂණ භාර අරමුදල. අපි රක්ෂණයක් කළා. මට මතකයි, ඒ දවස්වල අපි බිලියන ගණනක් ගෙව්වා. ඒක ජාත්‍යන්තරවත් රක්ෂණය කළා ඊට පස්සේ. ගෙයක් කැඩුණොත් රුපියල් ලක්ෂ 25 දක්වා ගෙව්වා. ආපදාවලදී බිස්නස්වලට රුපියල් ලක්ෂ 25ක් දක්වා ගෙව්වා. මරණයකදී රුපියල් ලක්ෂ 10ක් ගෙව්වා. තව කාරණාවලට ගෙව්වා. සමහර වෙලාවට limits නැතිව ගෙව්වා. අපි බිලියන එකහමාරක් ඒ වාරිකය ගෙව්වා. ඒවා මේ ආණ්ඩුව යටතේ නවත්වා තිබෙනවා. දැනට වාර්තා වෙලා තිබෙන විධියට ගෙවල් 400ක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. අද මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිවරයා කථා කළා. හැබැයි, මේ ගැන විනාඩි දෙකක් කථා කළේ නැහැ. අපි ආණ්ඩුවෙන් අහනවා, සම්පූර්ණයෙන් විනාශ වුණු නිවාසවලට කීයක් ගෙවනවාද කියලා. ගෙවල් 30,000ක් විතර අර්ධ හානියට පත් වෙලා තිබෙනවා. ඒවාට කීයක් ගෙවනවාද? ඒවාට රුපියල්

25,000ක් ගෙවලා හරියනවා ද? අපි දන්න විධියට මරණ 1,000කට වැඩියි. පවුල් ලක්ෂ හතරහමාරක් අනාථ වෙලා තිබෙනවා. පුද්ගලයන් ලක්ෂ 16,000ක්. මට ආරංචියි, බියගම පැත්තේ ග්‍රාම නිලධාරි මහතා ගිහින් කෑම බෙදනවා ලු, ඡන්ද නාමලේඛනයට අනුව. බියගම පැත්තේ ඇඟලුම් කර්මාන්තශාලා තිබෙනවා. ඒවායේ වැඩ කරන්න වෙනත් පළාත්වලින් ආපු කට්ටිය ඉන්නවා. ඒගොල්ලන්ට කෑම දෙන්නේ නැහැ. ඒකද මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය? ඌවපරණගම කඳවුරුවල ඉන්න අයට කියනවා ලු, දැන් ගෙවල්වලට යන්න කියලා. අපි ආණ්ඩුවෙන් මේවාට උත්තර අහනවා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කථා කරද්දී අපි හිතුවා, මේවා ගැන එතුමා කථා කරයි කියලා.

ගරු සභාපතිතුමනි, අපේ පළාතේ ගොවියෝ අවුරුද්දම ජීවත් වෙන්නේ ගොවිතැනින්. ඒ ගොවි බිම් සියල්ල පාලු වෙලා. මේ රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා අපට පෙන්වුවා නුවරඑළියේ ගොවි බිම් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙන්නේ කොහොමද කියලා. කන්නය අවසාන වෙන්න ඉස්සෙල්ලා ආණ්ඩුව කල් ගන්නේ නැතුව වන්දි ලබා දෙන්න ඕනෑ. ගොවීන් අතේ දැන් මුදල් නැහැ. ඒ නිසා ගොවීන්ට බීජ ටික, පොහොර ටික ගන්න අවශ්‍ය මුදල් ටික ලබා දෙන්න කටයුතු කරන්න. ඒ වෙනුවෙන් මොකක්ද තමුන්නාන්සේලාගේ සැලැස්ම? අඩු තරමින් අද මේ ගරු සභාවේ කෘෂිකර්ම ඇමතිතුමා ඉන්නවාද? නියෝජ්‍ය ඇමතිවරයා නම් ඉන්නවා. තව සති දෙකක් පහු වුණොත් ආපහු වගා කටයුතු කරන්න වෙන්නේ නැහැ. මට මතකයි, 2018දී උතුරු ප්‍රදේශයට ගංවතුර උවදුර ආපු අවස්ථාවේ අපි දවස් තුනක් ඇතුළත එතැනට ගිහිල්ලා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගත්තා. මට ආරංචියි ඊයේ රෑ, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා ලු, වෙන අයට සෞඛ්‍ය කඳවුරු තියන්න එපා කියලා. ආණ්ඩුවට විතරයි තියන්න පුළුවන්. මට ආරංචි, "නෙත් එෆ්එම්" මාධ්‍ය ආයතනයටයි-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. R.M. Ranjith Madduma Bandara, you have only two more minutes.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
සෞඛ්‍ය අමාත්‍යාංශය චක්‍රලේඛයක් යවලා තිබෙනවා.

මේ වෙලාවේ ඔක්කෝම එකතු වෙලා වැඩ කරන්න ඕනෑ. "නෙත් එෆ්එම්" එකයි, ලංකා හොස්පිට්ල් එකයි, ඩී.එස්.සේනානායක විද්‍යාලයයි එකතු වෙලා සෞඛ්‍ය කඳවුරු පවත්වනවා. ආණ්ඩුව කියනවා, "මේවා තියන්න එපා" කියලා. මේ වෙලාවේ සියල්ලන්ගේම උදව් ඕනෑ. මම අහනවා, මෙහෙමද ආණ්ඩුවක් කටයුතු කරන්නේ කියලා. ඒක තමයි තමුන්නාන්සේලාගේ ඒකාධිපතිවාදය කියලා කියන්නේ; ඒක තමයි ව්‍යවස්ථාපිත ඒකාධිපතිවාදය කියලා කියන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. 2019දීත් අපේ සංචාරක කර්මාන්තය විනාශ වුණා. ලක්ෂ ගණනක් ඒ කර්මාන්තයේ රැකියා කරනවා. ඒකෙන් රටට ආදායම එනවා. සංචාරක කර්මාන්තය ආරක්ෂා කරන්න ආණ්ඩුවේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා අපි අහනවා. විදේශයෙන් එන සංචාරකයන් ඔවුන්ගේ පැමිණීම අවලංගු කරලා තිබෙනවා. ආණ්ඩුව මේවා සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා අපි අහනවා. ගරු ජනාධිපතිතුමනි, කරුණාකරලා දැන්වත් ව්‍යසන කළමනාකරණ ජාතික සභාව කැඳවන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. මේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගරු ජනාධිපති, අගමැති, විපක්ෂ නායක, ඇමතිවරු, විපක්ෂයේ මන්ත්‍රීවරු එහි ඉන්නවා. මම අද අහගෙන හිටියා, අපේ මන්ත්‍රීවරු නුවරට ගියාම ලාල් කාන්ත මැතිතුමා කිව්වා ලු, "ආණ්ඩුවේ අපි ඒක බලා ගන්නම්" කියලා. විපක්ෂයේ කට්ටිය ඕනෑ නැහැ. මෙහෙමද, ආණ්ඩුව කටයුතු කරන්නේ? අපි උදව් කරන්න සූදානම්. අපි මේකෙන් දේශපාලන වාසි ගන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, 2019දී සිදු වුණු පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වාසිය ගත්තා, 2024දී තමුන්නාන්සේලා වාසිය ගත්තා. අපි ඒ වාගේ නරක චේතනාවෙන් බාල වැඩ කරන්නේ නැහැ. මේ ජාතික ව්‍යසනයේදී අපි උදව් කරන්න ලැහැස්තියි. කරුණාකරලා අපිවත් එකතු කරගෙන මේ කටයුත්ත කරන්න. ජනාධිපතිතුමා තවමත් රැස්වීමක් කැඳවලා නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. R.M. Ranjith Madduma Bandara, your time is up now.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ, රක්ෂණ භාරකාර අරමුදල නැවත වරක් ස්ථාපිත කරන්න කියලායි. මොකද, මෙවැනි ස්වාභාවික ව්‍යසන සම්බන්ධව ජනතාව රක්ෂණය කරන්න කියලා ආණ්ඩුවෙන් අපි ඉල්ලා සිටිනවා. අපි එදා කෝටි ගණනක් ගෙව්වා. මගේ ආසනයේ වතු කිහිපයක් තිබෙනවා. දෙයියනේ කියලා මේ සැරේ ආපදාවෙන් කරදරයක් වුණේ නැහැ. දෙහිගල වත්තත්, ගමේවෙල වත්තත් ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයෙන් අවදානම් කලාප විධියට දක්වලා තිබෙනවා. අපි එදා මුදල් වෙන් කළා. නමුත්, අපට ආණ්ඩු බලය නැති වුණා. ඒ වතුවල අවදානම් කලාපයේ සිටින කම්කරුවන් ගැන නැවත වරක් සිතා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ එක්කම මම මේ කාරණයත් ආණ්ඩුවට කියන්න කැමතියි. අපි දන්නවා උඩරට දුම්රිය මාර්ගය නඩත්තු කරන්න, පස් කඩා වැටීම නවත්වන්න චීනයේ AIIB එකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 110ක ණයක් අරගෙන තිබෙන බව. මේවා හරියට පාවිච්චි වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. ඒ ගැන අපට ආරංචියි, මේ වෙලාවේ ඒ ණය මුදල පාවිච්චි කරන්න කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ජනාධිපතිතුමාටත්, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාටත්, කැබිනට් ඇමතිවරුන්ටත් මම කියනවා, තමුන්නාන්සේලා මේ සම්බන්ධයෙන් මීට වැඩිය කල්පනා කරලා, අනෙක් අයගේත් අදහස් අරගෙන කටයුතු කරන්න කියලා. කීදෙනෙක් මැරුණාද, කීදෙනෙක් අතුරුදහන් වුණාද කියලා හරියට කියන්න ආණ්ඩුවේ අයට තවම බැරි වෙලා තිබෙනවා. කරුණාකරලා ඒ සංඛ්‍යාලේඛනවත් හරියට දෙන්න. මේ සම්බන්ධයෙන් මීට වැඩිය කටයුතු කරන්න කියලාත් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have 18 minutes.

[மு.ப. 11.19]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தவிசாளர் அவர்களே, இப்போது ஏற்பட்டிருக்கின்ற அனர்த்தத்தின் காரணமாக முழு நாடுமே அதிர்ச்சிக்குள்ளாகி இருக்கின்ற அதேநேரத்தில், பல குடும்பங்கள் நிர்க்கதிக்குள்ளாகியதோடு, பலர் உயிரிழந் திருக்கின்ற மிகவும் மோசமான சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. அவர்களுக்கு எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றோம்.

எங்களுடைய மாகாணத்தில், விசேஷமாக நான் வசிக்கின்ற நுவரெலியா மாவட்டத்திலும் அதேபோன்று பதுளை, கண்டி போன்ற மாவட்டங்களிலும் வசிக்கின்ற மக்கள் பல்வேறு துன்பங்களுக்குள்ளாகிச் சொல்லொணாத் துயரங்களை அனுபவித்துக் கொண்டிருப்பதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில், நுவரெலியா மாவட்டத்தில் ஏற்பட்ட அனர்த்தம் தொடர்பாகப் பின்வரும் விஷயங்களை நான் சொல்ல வருகின்றேன். நுவரெலியாவில் இதுவரை 38 முகாம்கள் அமைக்கப்பட்டுள்ளன. அதுபோல், நோர்வூட்டில் 34, நில்தண்டாஹின்னவில் 63, வலப்பனையில் 36, ஹங்குரன்கெத்தையில் 35, கொத்மலையில் 48, தலவாக்கலையில் 29 என மொத்தமாக 283 முகாம்கள் அமைக்கப்பட்டிருக்கின்றன. இந்தப் பகுதிகளிலுள்ள 6,959 குடும்பங்களைச் சேர்ந்த 24,681 மக்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். மரணங்களின் எண்ணிக்கை 89; காணாமல் போனவர்களுடைய எண்ணிக்கை 73. ஆகவே, இந்த நேரத்தில் மக்களுக்கு எந்த வகையான உதவிகளைச் செய்ய அரசாங்கம் எண்ணியிருக்கின்றது என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். இந்த அனர்த்தத்துக்கு அரசாங்கத்தினுடைய அசமந்தப்போக்கே முழுக் காரணம் என்று சொல்லலாம். அரசாங்கம் தகுந்த நேரத்தில், உரிய நடவடிக்கையை எடுத்திருந்தால், இழப்புகளைத் தவிர்த்து, பாதிப்புகளைக் குறைத்திருக்கலாம் என்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது.

அதுபோல், விசேஷமாக பதுளை பகுதி மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அதனை மீளக் கட்டியெழுப்பு வதற்கு இன்னும் எத்தனை வருடங்களாகுமோ எங்களுக்குத் தெரியாது. பதுளையைப் பிரதிநிதித்துவப்படுத்தும் அமைச்சர் அவர்கள் இங்கே இருக்கின்றார். அவருக்கும் இந்த நிலைமைகள் புரியும். இருந்தாலும்கூட, அந்த மக்களுக்கான உடனடித் தேவைகளை இந்த அரசாங்கம் பூர்த்திசெய்து கொடுக்க வேண்டுமென நாங்கள் எதிர்பார்த்திருக்கின்றோம் என்பதைக் கூற விரும்புகிறேன். அந்த வகையில் அரசாங்கத் தினுடைய கொள்கைப்படி, உடனடித் தேவைகளுக்காக ஒரு கிராம அலுவலருக்கு 50,000 ரூபாய் கொடுப்பதாகவும், GAக்கு 5,000,000 ரூபாய் கொடுப்பதாகவும் சொல்லியிருந்தார்கள். இதுவரையில் அந்தக் காசு கிடைக்கப் பெறவில்லை. உதாரணமாக, கந்தப்பளை முகாமில் இருக்கின்ற மக்களுக்கு நாங்கள் அங்கு போகும்வரை - கடந்த 29ஆம் திகதிதான் எனக்கு இங்கிருந்து போகக்கூடிய சூழ்நிலையேற்பட்டது - அரசாங்கத்தினுடைய எந்தவிதமான உதவிகளும் நிவாரணங்களும் கிடைக்கவில்லை. அங்கிருந்த 850 பேருக்கும் வர்த்தகப் பிரமுகர்கள்தான் உதவிகளைச் செய்தார்கள். அதுபற்றி நான் அங்கிருந்த கிராம அலுவலரிடம் கேட்டபோது, "எங்களுக்கு இன்னும் காசு அனுப்பவில்லை. பொருட்களை 'சதொச'இல் வாங்கும்படி சொல்லப்பட்டது. 'சதொச'வுக்குப் போனால், அங்கு சாமான்கள் இல்லை. இருக்கின்ற சாமான்களை வசதிபடைத்தவர்கள் வாங்கிச் சென்று விட்டார்கள். வீதியிலும் பயணம் செய்ய முடியாது. இந்தச் சூழ்நிலைதான் ஏற்பட்டிருக்கின்றது" என்று மிகவும் மனவருத் தத்துடன் அவர் சொன்னதை நாங்கள் அவதானிக்கக் கூடியதாக இருந்தது.

விசேஷமாக, எங்களுடைய நுவரெலியா பகுதியில் மக்களின் வருமான வழியை மூன்றாகப் பிரிக்கலாம். ஒன்று, தோட்டத் தொழில் - plantation; இரண்டாவது விவசாயம்; மூன்றாவது tourism. இதில் முதலாவதாக plantation communityஐ எடுத்துக்கொண்டால், நான் நினைக்கின்றேன் அங்கு அதிகமான தோட்டங்கள் பாதிக்கப்பட்டுள்ளன. கந்தப்பளைக்கும் இராகலைக்கும் இடையில் போக்கு வரத்துச் செய்ய முடியாது. பாதை முழுவதும் வெள்ளம் சூழ்ந்துள்ளது. கந்தப்பளையில் ஒரே குடும்பத்தைச் சேர்ந்த 4 பேர் இறந்திருக்கின்றார்கள்; இன்னும் உடல்கள்கூட கண்டுபிடிக்கப்படவில்லை. டொனால்ட் என்ற ஆசிரியரின் குடும்பம் அப்படியே நிர்க்கதியாகிவிட்டது. இப்பொழுது campஇல் இருக்கின்ற தோட்டப்புறத் தொழிலாளர்களுக்குச் சொல்லப்படுகின்றதாம், "நீங்கள் வீட்டுக்குப் போங்கள், அங்கு உங்களுக்கு எல்லா வசதிகளையும் செய்து தருகின்றோம்" என்று. அனர்த்தம் ஏற்பட்டதன் காரண மாகத்தான் அவர்கள் campஇல் தங்கவைக்கப்பட்டுள்ளார்கள். அவ்வாறு campஇல் இருப்பவர்களிடம் "திரும்பவும் அங்குபோய் இருங்கள்! அப்படியென்றால்தான் உங்களுக்கு வீடு கட்டிக் கொடுப்போம்" என்றால், அது எந்தளவுக்கு யதார்த்தம் என்பது எனக்குத் தெரியவில்லை.

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, මගේ අදහස්වලට පොඩ්ඩක් අවධානය යොමු කරන්න. මිනිස්සුන්ට දැනට ගෙවල්වල ඉන්න බැරි නිසා තමයි camp එකට ගෙනැල්ලා ඉන්නේ. පොලීසියත්, වතු superintendentsලාත් කියනවා ලු, "ඔයගොල්ලන් ගෙවල්වලට යන්න, අපි හදලා දෙන්නම්" කියලා. ආපසු හෙට අනිද්දාට වැස්ස ආවොත්, නැත්නම් ලබන සතියේ වැස්ස ආවොත් ඒගොල්ලන් කොහේද ඉන්නේ? දැන් ගෙවලුත් නැහැ. ගෙවල් සුද්ද කරන්න රුපියල් 25,000ක් දෙන්නම්, එතැනට යන්න කියලා කියනවා ලු. ගෙවල් සුද්ද කරන්න ඉස්සෙල්ලා ඒගොල්ලන් ආරක්ෂා කර ගන්න ඕනෑ නේ. මම නම් කියන්නේ අනිවාර්යයෙන්ම මේගොල්ලන්ට ඉඩම් කොටසක් - පර්චස් 10ක්, පර්චස් 15ක් හෝ පර්චස් 20ක් - දීලා මේගොල්ලන් වෙනම පදිංචි කරන්න කටයුතු කරන්න කියලායි. ඉඩම් දෙන්න, ඉස්සෙල්ලාම. ඒගොල්ලන් පුළුවන් නම් ඒකේ ගෙවල් හදා ගනිවි. නැත්නම්, ඔබතුමන්ලාට ගෙවල් හදලා දෙන්න පුළුවන්. ඒගොල්ලන්ට ප්‍රමුඛතාව දෙන්න කියලා තමයි මම ඉල්ලන්නේ; the first priority should be given to the refugees.

අනෙක් එක, ඒගොල්ලන්ට වත්තේ වැඩට යන්නත් බැහැ. ඒ නිසා ආදායමකුත් නැහැ. ගෙවල් නැත්නම් කොහොමද වැඩට යන්නේ? ඒ නිසා කරුණාකරලා ඒගොල්ලන්ට ආදායම් මාර්ග හොයලා දෙන්න. ආදායම් මාර්ග හොයලා දෙන්න කියන්නේ, ආධාර තමයි දෙන්න වෙන්නේ. ඒ ආධාර දෙන්න කටයුතු කරන්න කියලා මම කියනවා.

මම නම් කියන්නේ ඉස්සෙල්ලාම නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාරවල් ටික හදන්න, ලයිට් ටික දෙන්න. ඒ ටික දුන්නා නම් ඒ මිනිස්සු කොහොම හරි ජීවත් වෙයි. කොහොම හරි ගෙයක් හදා ගනියි, යම් කිසි දෙයක් කර ගන්න පුළුවන් වෙයි. දැන් පාරවල් නැහැ, ලයිට් නැහැ, කෑම නැහැ, වතුර නැහැ. Nuwara Eliya Municipal Council එක දවස් 3ක් වතුර දුන්නේ නැහැ. මේකයි අපේ තත්ත්වය. මම වතුකරයේ ජනතාව වෙනුවෙන් කථා කරන්නේ. කොහොම හරි ඒගොල්ලන්ට ඉඩම් කෑල්ලක් දීලා

පදිංචි කරවන්න කටයුතු කරන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. නැත්නම් GSලා, DSලා, superintendentsලා ඇවිල්ලා මේගොල්ලන්ට කියනවා, "ගෙවල්වලට යන්න, අපි සල්ලි දෙන්නම්" කියලා. මිනිස්සු මැරුණාට පස්සේ සල්ලි මොකටද? යන්න ගෙවල් තිබෙනවාද?

අනෙක් එක තමයි, Nuwara Eliya Racecourse. මම හිතන විධියට අවුරුදු 200කට ඉස්සර සුද්දෝ හදපු නුවරඑළිය ප්‍රධාන racecourse එකේ කට්ටිය තවම ඉන්නේ අර ලැයිමේ. ලැයිම කියන්නේ, පට්ටිය වාගේ තමයි ඉන්නේ. පොඩි වැස්සක් ආවොත් ඒගොල්ලන්ට හානි වෙනවා. ඒ හානි වුණු නිසා එදා රෑ ඔක්කොම Cinecitta stadium එකේ හිටියා. අපි තමයි ඔක්කොටම කෑම දුන්නේ. එන ආණ්ඩු ඔක්කොම ඒ මිනිස්සුන්ට කියනවා, ගෙවල් හදලා දෙන්නම්, යන්න කියලා. අපි මෙහෙම කියන්නේ JVP එකට විතරක් නොවෙයි. කලින් ආණ්ඩුත් මේගොල්ලන්ට කිව්වා ගෙවල් හදලා දෙන්නම්, යන්න කියලා. නමුත්, අද වනකල් හදලා දුන්නේ නැහැ. මේගොල්ලන්ට යන්න විධියකුත් නැහැ. මට හිතෙනවා, මේගොල්ලන්ට මැරෙන්න වෙන්නෙත් එතැනම තමයි. ඒ අදහස ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා සලකා බලන්න.

ඊළඟට, tourism sector එක. අපි tourism ගැන කථා කරනකොට නුවරඑළියට නැත්නම්, ලංකාවටම වැඩි ආදායමක් එන්නේ tourism නිසා. අද tourism අඩපණ වෙලා තිබෙනවා. මොකද, railways නැහැ. ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ බදුල්ල, ඇල්ල පළාත්වලට කෝච්චි දිව්වොත් තමයි සංචාරකයන් එන්නේ. නමුත්, දැන් කෝච්චිවලට යන්න බැහැ. මොකද, කෝච්චි පාරවල් ඔක්කොම කැඩිලා. අවුරුදු 150කට ඉස්සෙල්ලා හදපු කෝච්චි පාර තමයි ලංකාවේ තවම තිබෙන්නේ. ඒ කෝච්චි පාරවල් හදලා tourism develop කිරීමට කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා. මොකද, බස් එකක් විතරක් ගමන් කරලා යන්න එන්න පහසුකම් මදි. අනිවාර්යයෙන්ම කෝච්චියක් ඕනෑ වෙනවා.

புகையிரதப் போக்குவரத்துச் சேவை கட்டாயம் எங்களுக்குத் தேவை. புகையிரதச் சேவை இல்லாவிட்டால் நாட்டில் உல்லாசப் பிரயாணத்தை - tourism - மேற்கொள்ளுவதற்கான வசதிகள் மிக மிகக் குறைவாக இருக்கின்றது. உல்லாசப் பிரயாணத் துறையை அபிவிருத்தி செய்வதானால், நிச்சயமாகப் புகையிரதப் பாதைகள் அபிவிருத்தி செய்யப்பட வேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன்.

இந்த இடத்தில் நான் ஒரு முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, இந்த அனர்த்தத்தின்போது ஏனைய நாடுகள் உதவிபுரிய வருவதற்கு முன்னரே எங்களுடைய அயல் நாடான இந்தியா உடனடியாக எமது நாட்டுக்கு வந்து பல உதவிகளைச் செய்துள்ளது. நான் நினைக்கின்றேன், 10 பாலங்களை அமைப்பதற்கான பொருட்களைக்கூட கொண்டுவந்திருக்கிறது. அவ்வாறு உடனடியாக உணவுப் பொருட்களை இந்த நாட்டுக்குக் கொண்டுவந்து உதவி செய்த இந்தியாவிடம் நீங்கள் மலையக ரயில் பாதைகளை அபிவிருத்தி செய்து தருமாறு ஒரு கோரிக்கையை முன்வைக்கலாம் என்ற விடயத்தைச் சொல்லிக் கொள்ள விரும்புகின்றேன். ஏனென்றால், இந்தியாவிலிருந்து தான் உல்லாசப் பிரயாணிகள் அதிகமானோர் வருகை தருகின்றார்கள்.

ஆகவே, உல்லாசப் பிரயாணிகளைக் கவர்வதற்கு எங்களுக்குப் புகையிரதப் பாதை அத்தியாவசியம். வட, கிழக்கில் எவ்வாறு புகையிரதப் பாதையை அமைத்துக் கொடுக்கப்பட்டதோ அதேபோன்று மலையகப் பிரதேசத்துக்கான புகையிரதப் பாதைகளையும் அமைப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் என்ற விடயத்தை நான் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதேவேளை, அயல் நாட்டுக்கு உதவ வேண்டும் என்ற அடிப்படையில் உடனடியாக உதவிகளைச் செய்திருக்கின்ற இந்தியப் பிரதமர் கௌரவ மோடி அவர்களுக்கும் எமது நாட்டுக்கான இந்திய உயர் ஸ்தானிகர் சந்தோஷ் ஜா அவர்களுக்கும் எங்களுடைய மனமார்ந்த வாழ்த்துகளையும் நன்றியையும் நாங்கள் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள வேண்டும்.

அடுத்து, விவசாயத்தை எடுத்துக்கொண்டால், நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற விவசாயிகள் இன்று அநாதரவாகி இருக்கின்றார்கள்.

ගරු ඇමතිතුමනි, නුවරඑළිය ප්‍රදේශයේ කෘෂි කර්මාන්තයේ අද තත්ත්වය ගැන ඔබතුමාත් දන්නවා. මම පසුගිය දවස්වලත් ඔබතුමාට කථා කළා. ඒ කථා කරපු දේවල්වලින් දැන් වැඩක් නැහැ. දැන් අලුතින් කථා කරන්න වෙනවා. මොකද, නුවරඑළිය සම්පූර්ණයෙන්ම ඉවරයි. මා ළඟ වීඩියෝ තිබෙනවා, පින්තූරත් තිබෙනවා. ඕනෑ නම් වට්ස්ඇප් මඟින් මම ඔබතුමන්ලාට එවන්නම්. බලන්න, කොච්චර හානිවෙලා තිබෙනවාද කියලා. මගේ විතරක් ඉඩම් අක්කර 5ක් විනාශ වෙලා තිබෙනවා. ඒ වාගේම මිනිසුන් දහස් ගණනකට මේ හානිය සිදුවෙලා තිබෙනවා. මම හිතන විධියට පස් පුරවලා, භූමිය හදලා අරගෙන කෘෂි කර්මාන්තය නැවත ගොඩනඟන්න අවුරුදු 5ක්, 6ක් යනවා. එම නිසා ඒ ගොවීන්ට වන්දි ගෙවන්න අවශ්‍ය වෙනවා. එළවලු ගොවීන්ටත් වන්දි ගෙවනවා කියලා ගරු ඇමතිතුමා දැන් කිව්වා. ඒ ගැන සන්තෝසයි. වන්දි ගෙවනවා නම්, අවශ්‍ය කාලයට ඒ වන්දි මුදල් ගෙවන්න. ඔක්කෝම කළාට පස්සේ, නැත්නම් අපි භූමිය හදාගත්තාට පස්සේ වන්දි ගෙවලා වැඩක් නැහැ. ඒ වාගේම පොහොර සහනාධාරයත් දෙන්න. භෝග වවන්න සහනාධාර දෙන්න, bank loans දෙන්න. ඒ සඳහා මොනවා හරි ක්‍රමයක් හදන්න. ඒ ක්‍රමය හදාගත්තොත් තමයි අපට ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. නැත්නම් ඉදිරියේදී මේ රටට එළවලු හම්බවෙන්නේ නැහැ. එළවලු import කරන්න වෙනවා. දැන් ඔබතුමන්ලා අල import කරනවා. මම හිතන විධියට, එහෙම කරන එක වාසි නිසා තමයි ඔබතුමන්ලා අල import කරන්නේ. ඒ විධියට එළවලු import කරන තත්ත්වයකුත් ඉදිරියේදී ඇති වෙයි කියන බය අපට තිබෙනවා. ඒක කරන්න එපා. මේ රටේ සිටින ගොවීන් ආරක්ෂා වන විධියට කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒකයි අපට ඕනෑ වෙන්නේ.

ගරු ඇමතිතුමනි, කොත්මලේ ප්‍රදේශයට සිදුව ඇති විනාශය බලන්න. විශේෂයෙන්ම කොත්මලේ ගත්තොත්, දැනටමත් කොත්මලේ ජීවත් වූ බොහෝ දෙනෙකුගේ ජීවිත නැති වෙලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආසනයේ තමයි පීඩාවට පත් ජනතාව සිටින camps වැඩිපුරම තිබෙන්නේ. කොත්මලේ එවැනි camps 48ක් තිබෙනවා. ඒවායේ පවුල් 2,400ක් සහ ඒ පවුල්වල සාමාජිකයෝ 19,573ක් ඉන්නවා. කොත්මලේ ප්‍රදේශයේ රම්බොඩ කියලා area එකක් තිබෙනවා. ඒ Ramboda area එක තමයි වැඩිපුරම නාය ගිහිල්ලා තිබෙන්නේ. විශේෂයෙන්ම වතු තමයි ඒ area එකේ වැඩියෙන්ම තිබෙන්නේ. ඒ වතුවල සිටින මිනිස්සුන්ට දැන් ගෙවලුත් නැහැ, යන්න තැනකුත් නැහැ. මම හිතන විධියට, මීට කලින් වතාවේත් එම ප්‍රදේශයේ ගෙවල් 10ක් විතර කැඩිලා පස්සේ ඒවා හදලා දුන්නා. මෙවරත් ඒ ප්‍රදේශය විනාශ වුණා. ඉදිරියේදී නැවතත් මේ වාගේ දෙයක් සිද්ධ වෙන්න පුළුවන්. මොකද, පහළ ප්‍රදේශයේ ජලාශ තිබෙනවා. පහළින් කොත්මලේ ජලාශයත් තිබෙනවා. අපි හරියට දන්නේ

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

නැහැ, එම ජලාශ නිසා ඉහළ භූමි ප්‍රදේශය පහළට ඇදගෙන යනවා කියලා තමයි මිනිස්සු කියන්නේ. හැමදාම මේ විධියට කරන්න බැහැ. ඒක නිසා ඒ ජනතාවට උදවු කිරීම සඳහා යම් කිසි දෙයක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි කලට වේලාවට එම ප්‍රදේශවලට ග්‍රාම නිලධාරිවරුන් යන්න ඕනෑ, ගිහිල්ලා බලන්න ඕනෑ. තවමත් වතුවලට ගිහිල්ලා පීඩාවට පත් වුණු ජනතාවගේ විස්තර ඒ නිලධාරීන් ගත්තේ නැහැ. කියන්න හරිම කනගාටුයි, තවමත් ඒ විස්තර ගත්තේ නැහැ. ඒ විස්තර ගන්න කියන්න. ඒගොල්ලන්ටත් උදවු උපකාර කරනවා නම්, අවශ්‍ය වෙලාවට කරන්න. එහෙම නැත්නම් වැඩක් වෙන්නේ නැහැ.

වතු කම්කරුවන්ගේ පඩිය ගැන අපි පසුව කථා කරමු. මේ අවස්ථාවේ පඩි ගැන කථා කරලා අපට ඔබතුමන්ලාව අමනාප කර ගන්න බැහැ. පොරොන්දු වුණු විධියට ඔබතුමන්ලා පඩි ගෙවනවා නම් හොඳයි කියලා අපි හිතනවා. පොරොන්දු වුණු විධියට පඩි ගෙවයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. නාය ගියා, අරක වුණා, මේක වුණා, ඒක නිසා පඩි දෙන්න බැහැ කියලා කියන්න එපා. එහෙම කියන්න එපා. කොහොම හරි ඒ පඩිය දෙන්න බලන්න.

විශේෂයෙන්ම රටේ ඇති වූ ආපදා තත්ත්වය පිළිබඳව කථා කරන්න තමයි අද පාර්ලිමේන්තුවේ විශේෂයෙන් අපි රැස්වෙලා තිබෙන්නේ. ජනතාව වෙනුවෙන් කළ යුතු ඉදිරි වැඩ කටයුතු මොනවාද කියලා තමයි අපි විශේෂයෙන් කථා කරන්නේ. අපට උදවු කරන්න අපේ රටට අල්ලපු රටට ඕනෑ තරම් හැකියාව තිබෙනවා. ඒගොල්ලන් උදව් කරනවා. ඒ වාගේම පාකිස්තානය, ජපානය, මලයාසියාව, ඉන්දුනීසියාව කියන ඒ ඔක්කෝම රටවල් අපට උදවු කරනවා. ඒ උදවු ටික ගන්න; වැඩ කරන්න. සුනාමියෙන් පසුවත් අපි මේ රට හදාගත්තා. කවදාවත් මේ රට බිඳ වැටුණේ නැහැ. මේ රටට කියන්නේ "රාවණා භූමිය" කියලා. අපට මේ භූමිය හදාගන්න පුළුවන්. අපි කවදාවත් නැති වෙන්නේ නැහැ. මේක, "ඊශ්වර භූමිය". මේ භූමිය හදාගන්න අපි කටයුතු කරන්න ඕනෑ.

ඒ සඳහා ඔක්කෝම එකතු වෙන්න ඕනෑ. දේශපාලනය වෙනයි, රට හදන එක වෙනයි. මම නම් කියන්නේ ඒකයි. අපි දේශපාලනය පස්සේ කරමු, පුළුවන් මිනිහාට දේශපාලනය කරන්න කියමු. අපි ඉස්සෙල්ලා රට හදන්න කටයුතු කරමු. ඒක අපට විතරක් කරන්න බැහැ; විපක්ෂයට විතරක් බැහැ. විපක්ෂයේ සම්පූර්ණ සහයෝගය ඔබතුමන්ලාට දෙන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුව තමයි රට හදන්න ඕනෑ. ආණ්ඩුවත් අපි කියන එක පිළිගන්න ඕනෑ. පිළිගෙන කටයුතු කරන්න ඕනෑ. එහෙම නැත්නම් ආණ්ඩුව අහක බලාගෙන විපක්ෂය කියන එක අපට කරන්න බැහැ කියලා කිව්වොත් අපට මේ ගමන ඉදිරියට යන්න බැහැ, අපේ රට හදන්න බැහැ. මේ රට හදන්න ඕනෑ. එම නිසා මේ රට හදන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

ඊළඟට, මම tourism ගැන තමයි වැඩියෙන්ම කථා කරන්නේ. මොකද, කොවිඩ් වසංගතයෙන් පසුව අපේ රට නැඟිට්ටේ tourism නිසා; වෙන මොකුත් නිසා නොවෙයි, tourism නිසා. එම නිසා tourism හදන්න කටයුතු කරන්න ඕනෑ. අපේ පළාත විතරක් නොවෙයි, නුවරත් සම්පූර්ණයෙන් ඉවරයි. ගම්පොළ නගරය දැන් සම්පූර්ණයෙන් යට වෙලා තිබෙන්නේ. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. කාලයක් යනවා, ගම්පොල නගරය හදන්න. ගම්පොල නගරය වාගේම උලපනේ, නාවලපිටිය, කොත්මලේ කියන areas තමයි වැඩියෙන් නාය ගිහිල්ලා තිබෙන්නේ. ඒකට හේතුව තමයි, අර ජලාශ. ජලාශ දැන් ඉවත් කරන්න බැහැ. හැබැයි, පිට රටවල නම් ඒ වාගේ ප්‍රශ්නවලටත් විසඳුම් ගේනවා. Chinese අය ඕනෑ එකක් හදනවා. මෙවැනි ආපදාවකට නැවත ලක්නොවන විධියට මේ මිනිස්සු ආරක්ෂිත තැනක පදිංචි කරවන්න කටයුතු කරන්න ඕනෑය කියලා මම හිතනවා. ඒ වාගේම තමයි හල්දුම්මුල්ල කියන ප්‍රදේශයත් හැමදාම නාය යන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශ සම්බන්ධවත් කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

இந்த நாட்டினுடைய பொருளாதாரத்தை வளர்ச்சியடையச் செய்தால் மாத்திரமே எங்களால் இங்கு வாழ முடியும். நாடு வளமாக இருக்க வேண்டுமானால் இவ்வாறான அனர்த்த நிலைமைகளில் நாங்கள் அனைவரும் ஒன்றுசேர்ந்து சேவை செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். පාස්කු ඉරිදා - Easter Sunday - தாக்குதல் காரணமாக மைத்திரிபால சிறிசேன அவர்களுடைய ஆட்சிக்கு நெருக்கடி ஏற்பட்டது; அதனால் அவருடைய ஆட்சி இல்லாமற்போனது. உரக் கொள்கை மற்றும் 'கொவிட்' போன்றவற்றால் கோட்டாபயவின் ஆட்சி இல்லாமற்போனது. அதேபோன்று, இந்த அனர்த்தத்தினால் அநுர அரசாங்கம் இல்லாமற்போய்விடக் கூடாது என்பதை நாங்கள் சொல்லிக்கொள்ள விரும்புகிறோம். அப்படி நடந்தால் யாராலும் காப்பாற்றவும் முடியாது. ஆகவே, இந்த அனர்த்தம் தொடர்பான மீட்புப் பணிகளை ஒழுங்காகச் செய்யாவிட்டால், உங்களுக்கும் அதே நிலைமை ஏற்படும் என்பதைத் தெரிவித்து, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Nimal Palihena. You have seven minutes.

[පූ.භා.11.38]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු සභාපතිතුමනි, අද 2026 අය වැය ලේඛනය පිළිබඳව අවසන් වශයෙන් සාකච්ඡාවට භාජන කරන දිනයයි. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්න අවශ්‍ය කරුණු කීපයක් තිබෙනවා. මොකද, ඉතිහාසයේ කවදාවත් නොවූ විරූ ආකාරයට මේ රට වෙළා ගත් ආපදාවෙන් විපතට පත්, ආපදාවට ලක් වූ අපේ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරමින් සිටින මොහොතක් තමයි, මේ. අපි සංවේදී මිනිසුන් වශයෙන් දුකට, අගතියට පත් වෙච්ච, ඒ වාගේම අප අතරින් සමු ගත් ප්‍රජාව වෙනුවෙන් අපේ කනගාටුව මේ වෙලාවේදී ප්‍රකාශ කරනවා. ඒ වාගේම ආපදාවට පත් වූ ජනතාව වෙනුවෙන් රජයක් විධියට අපි කටයුතු කරන්න සූදානම් කියන කාරණයත් සඳහන් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන්ම ඉතිහාසයේ ඇති වුණු ව්‍යසනයන් හා සලකන විට අපට හොඳටම මතක තිබෙන ව්‍යසනය තමයි, සුනාමිය. මේ ව්‍යසනයෙන් ඊටත් වඩා බරපතළ බලපෑමක් වුණා කියන කාරණාව තමයි අද වනකොට අපි තක්සේරු කරලා තිබෙන්නේ. රටේ ජාතික නිෂ්පාදිතය හා සාපේක්ෂව සලකනකොට සියයට 3ක් හෝ සියයට 5ක් අතර ප්‍රමාණයක අලාභයක් මේ ව්‍යසනය තුළින් අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අපිත් එක්ක එදිනෙදා කථා බහ කරපු අපේ රටේ ආදරණීය මිනිස්සු සෑහෙන

පිරිසක් අපට අහිමි වෙලා තිබෙනවා. දේපළ හානිවලට අතිරේකව මිනිසුන්ගේ වගාවන්, එදිනෙදා ජීවනෝපාය අද වනකොට අහිමි වෙලා තිබෙනවා. මේ කාරණා සියල්ල සලකා බලනකොට පෙනෙනවා, අපි අය වැය ඇතුළේ යම් ආකාරයකට ආපදාවකට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කරනු ලැබුවද, අද වනකොට ඇති වෙලා තිබෙන ව්‍යසනයේ තත්ත්වය අනුව ඒ මුදල ගැන කිසිසේත්ම සෑහීමකට පත් වෙන්න බැහැ කියන එක. එම නිසා රජය මේ වෙලාවේදී ඉතා ඉක්මනින් ඒ සඳහා අවශ්‍ය කරන සහන සපයන ගමන් මිනිසුන්ගේ ජීවිත සුරක්ෂිතව රැක බලා ගැනීම සඳහා රාජ්‍ය යන්ත්‍රණය සහ රජයේ නිලධාරීන් ක්‍රියාත්මක කරමින්, ඒ වෙනුවෙන් අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන ලබා දීමටත් කටයුතු කරමින් සිටිනවා. මම මේ වෙලාවේදී කියන්න කැමැතියි, මුදල් අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද ඇස්තමේන්තුවලට අනුකූලව අපට ආසන්න වශයෙන් ඒ වෙනුවෙන් රුපියල් බිලියන 72ක් අවශ්‍ය වන බව.

දැන් ගොඩක් අය කරපු විවේචනයක් තමයි, "භාණ්ඩාගාරය පිරී ඉතිරිලා යනවා. ඔය තිබෙන සල්ලි මේවාට පාවිච්චි කරන්න" කියන එක. භාණ්ඩාගාරය පිරී ඉතිරී ගියේ අපි ඇවිල්ලා ප්‍රතිපත්ති දේශපාලනයක සහ ආණ්ඩුකරණයක යෙදුණු නිසාත්, හොරකම්, දූෂණ, වංචා නැති නිසාත්, කලට වේලාවට ආදායම් එකතු කරගත්ත නිසාත් සහ විනයක්, විනිවිදභාවයක් ඇතුව ඒ මුදල් වියහියදම් කරපු නිසායි. විපක්ෂයේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම මේ වෙලාවේදී මතක් කරන්න කැමතියි, ධර්මය දේශනා කරනවාට වැඩිය ධර්මයේ හැසිරෙන එක වැදගත් කියා බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන බව. දැන් ඔය විධියට ධර්මය මෙතැන දිග හරින අයගේ පැටිකිරිය ගත්තාම, ඒ අය බැංකුවලට කොච්චර පොලු තියලා තිබෙනවාද කියන එක ගැන හොයා බලන්න ඕනෑ, නඩු තීන්දුත් එක්ක. මම මේ අවස්ථාවේදී මතක් කරනවා, මේ ව්‍යසනයට පත් වෙච්ච වෙලාවේ චෝදනා එල්ල කරන්නේ නැතුව, වැරැදි අර්ථ කථන දෙන්නේ නැතුව, අපි මුට්ට කර ගැහුවාද එහෙම නැත්නම් බඩු බෙදුවාද කියන කාරණාව විශේෂ කරන්නේ නැතුව සහයෝගීතාව තුළ මේක ජාතික ව්‍යසනයක් වශයෙන් සලකා සියලුදෙනා එක්වී ඇවිත් බැහැලා වැඩ කරන්න කියලා.

අපි පක්ෂයක් විධියට වාගේම මහජන නියෝජිතයින් විධියට බිම් මට්ටමින් වැඩ කරන්න ගියාම කරන්න ඕනෑ වැඩේ මොකක්ද, තමන් කොයි තරාතිරමේද කියන එක අපට අදාළ නැහැ. ඒ මොහොතේ කරන්න අවශ්‍ය ඕනෑම වැඩක් කිරීමට අපි සූදානම් කියන එක පක්ෂයක් විධියටත්, ආණ්ඩුවක් විධියටත් මා මේ වෙලාවේදී අවධාරණයෙන් යුක්තව සියලු දෙනාට මතක් කරන්න කැමතියි.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී තව කාරණයක් මතක් කරන්න ඕනෑ. අපි 2025 වසර සඳහා අය වැය ඉදිරිපත් කළා. ඒ අය වැය ඇතුළේ යම් යම් ප්‍රතිපාදන විවිධ අමාත්‍යාංශ යටතේ වෙන් කරනු ලැබුවත්, මේ වෙලාවේදී අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා, මේ ව්‍යසනය සඳහා අවශ්‍ය කරන මුදල් මේ අය වැය තුළම සංවිධානගතව යම් ආකාරයකින් වැය ශීර්ෂ තුළින් වෙන් කරගෙන කටයුතු කරන්න. ඒ අනුව රජය මේ වෙනකොට යම්, යම් අමාත්‍යාංශවල ශේෂ වෙච්ච මුදල්, ඒ කියන්නේ මේ වර්ෂය තුළ වියදම් නොවී ඉතුරු වන මුදල් මේ සඳහා වෙන් කරගන්න අවශ්‍ය කටයුතු කිරීම වෙනුවෙන් මැදිහත්වීම ඉතා ඉක්මනින් සහ සාධනීය විධියට කරමින් ඉන්නවා.

ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේදී තව කාරණයක් මතක් කරන්න කැමතියි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අදහස් දක්වන විට අපට කියනවා, දැන් රට හදන්න කියලා. දේශපාලනය කරන්න එපා කියලා අපට යෝජනා කරපු අය මෙච්චර කාලයක් කළේ දේශපාලනය කළ එක විතරයි. මේ රටේ මිනිසුන් වැරැදි දේවල්වලට පාවිච්චි කරලා තමන්ගේ දේශපාලනය කරගෙන ගියා මිස රට හදපු විධියක් නම් අපි කොහේවත් දැක්කේ නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ සදාදරණීය නායකයා වන විජේවීර සහෝදරයා 1970 අගෝස්තු 10වැනි දා අපට කිව්වා, අඩි 5,000ට වඩා උස් භූමිය යම් ආකාරයකට ඔබ ගොවිතැන, ඉදිකිරීම් කටයුතු සහ වෙනත් කටයුතු සඳහා භාවිත කළොත්, තව අවුරුදු තිහ, හතළිහකින් ගිලා බැසීම් සහ කඳු නාය යාම් වැනි ව්‍යසන තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වන තත්ත්වය කොයි තරම්ද කියලා කියන්න බැහැ කියලා. ඒ තත්ත්වය අදට කලින් ඔහු දැක්කා, අපේ පක්ෂයේ නායකයෙක් විධියට. අද අපි ඒවා අත්විඳිනවා.

මම දන්න විධියට උඩරට, නුවර වැව සහ ග්‍රෙගරි වැව කියන ජලාශ විතරයි තිබුණේ. ඉන් පසුව මේ විවෘත ආර්ථිකය යටතේ ජලාශ ඉදිකිරීමෙන් පරිසර පද්ධතියට හානි කිරීමම එක හේතුවක් වෙනවා, මේ නාය යාම්වලට. අපි අද ඒ ඇත්ත දකිනවා. සමාජ වුවමනාව නිසා පරිසර පද්ධතියට හානි කිරීම සහ අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම් සමඟ කරන ලද ඉදිකිරීම් හේතුවෙන් මේ සියල්ල සිදු වුණා කියන එකට සාක්ෂි ඕනෑ තරම් තිබෙනවා. උදාහරණයක් විධියට මම ජීවත් වන අනුරාධපුරය, හොරොව්පතාන නගරය අනවසර ඉදිකිරීම් නිසා සුළු වැස්සකට පවා අඩි ගණනක් යට වෙනවා. එවැනි තත්ත්වයන්ට අවශ්‍ය මැදිහත්වීම කරපු, ඉතිහාසයේ දේශපාලනය කරපු, රට නහදපු මිනිසුන් තමයි අද අපට ඇවිත් කියන්නේ, රට හදන්න කියලා. අපි නැවත වටයකින් ඔබට ආරාධනාවක් කරනවා. මේක ජාතික ව්‍යසනයක්, රටේ වුවමනාවක්. රටේ ජනතාව ඔබ අප සියලු දෙනා වෙනුවෙන් හැම දාම පෙනී සිටියා; අවශ්‍ය අවස්ථාවේදී බලය ලබා දුන්නා, අද ඔබට බලය අහිමි වුණත්. මා රටේ ජනතාවටත් කියන්නේ, සියලුදෙනා එකතු වෙලා මේ ගමන යන්න ආශීර්වාදයක් වෙන්න, මේ ව්‍යසනයෙන් රට ගලවා ගන්න වාගේම ජනතාවට තමන් හිටපු ජීවන තත්ත්වය ළඟා කරගන්න අවස්ථාව, අවකාශ සලසා දෙන්න උදවු කරන්න කියායි. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් හැම දෙනාටම ඒ ආරාධනය කරන්න මම මෙය අවස්ථාවක් කරගන්නවා. බොහොම ස්තූතියි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, what is your point of Order?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කථාවක් කිව්වා, මහවැලිය ගැන. ඒක ආණ්ඩුවේ මතයද එහෙම නැත්නම් ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මතයද කියලා මට පොඩ්ඩක් පැහැදිලි කරගන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. D.V. Chanaka. You have ten minutes.

[පූ.භා.11.46]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, මම පළමුවෙන්ම මේ වෙලාවේ ගං වතුරින් ඒ වාගේම නායයෑම්වලින් ජීවිතය නැති වෙච්ච සියලුදෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ වාගේම, තමයි මේ වෙලාවේ මේවායින් ජීවිත ගලවා ගන්න විශාල කාර්ය භාරයක් කරන ඒ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම රජයේ නිලධාරින්, ඒ වාගේම ත්‍රිවිධ හමුදාව, ස්වේච්ඡාවෙන් වැඩ කරන සංවිධාන, YouTubersලා ඇතුළු සියලුදෙනාට අපි පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තමයි පක්ෂයක් විධියට අපි මේ ආපදාව වෙච්ච වෙලාවේ ඉඳන් අපිට ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිමය කරමින් ඉන්නවා. අපි මුලින්ම ආරම්භ කළා, ආහාර ලබා දෙන්න. මොකද, රජය එනකම් ඉන්නේ නැතුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් එනකම් ඉන්නේ නැතුව අපේ පක්ෂය මැදිහත් වීමෙන්, අපේ ජාතික සංවිධායක නාමල් රාජපක්ෂ මැතිතුමාගේ දැනුවත් කිරීමෙන් පස්සේ අපේ ආසන සංවිධායකතුමන්ලා ඇතුළු අපි ආහාර දෙන වැඩ පිළිවෙළ ආරම්භ කළා. සමහර ප්‍රදේශ තිබුණා දවස් දෙකක්, දෙකහමාරක් තිස්සේ එක වේලකටවත් කෑම හම්බ නොවුණු ප්‍රදේශ. ඒ ප්‍රදේශ තෝරාගෙන තමයි අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. අපි දැක්කා බිමල් රත්නායක මහත්මයා බෝට්ටු ඕනෑ කියලා සමාජ මාධ්‍යයේ දානකොටත් අපේ පක්ෂය මැදිහත්වීමෙන් කොළොන්නාවට අවශ්‍ය බෝට්ටු ටික ලබා දීලා අපේ සංවිධායකවරු මෙහේ ඇවිල්ලා වැඩ කළා. වෙනස තිබෙන්නේ අපි ලේබල් ගහගන්නේ නැති එක. තරුව ලකුණ වාගේ පොහොට්ටුවේ ලකුණ අපි ගහගන්නේ නැහැ. මොකද, නාමල් රාජපක්ෂ මැතිතුමා කිව්වා වාගේ ඔබතුමන්ලා චෝදනාවක් එල්ල කළාම Facebook එකට ගිහිල්ලා බලනවා වාගේ වැඩ කරපු අයගේ Facebookවලට ගිහිල්ලා බැලුවා නම් බලාගන්න පුළුවන් මොන තරුවෙන්ද වැඩකටයුතු කළේ කියලා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, අපි කනගාටු වෙනවා, සමහර තැන්වල ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම ගැන. කඩුවෙල ස්වාධීන මන්ත්‍රීතුමියක් -මේ එක පක්ෂයකවත් නොවෙයි - තමන්ගේ ගෙදර කෑම පැකට් 200ක් හදාගෙන ගිහිල්ලා බෙදන්න යනකොට මාලිමාවේ මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා අතත් විකලා, "කෑම පැකට් ටික මගේ ප්‍රදේශයේ බෙදනවා නම් මම හරහා තමයි බෙදන්න ඕනෑ" කියලා කියා තිබෙනවා. සමාජ මාධ්‍යයේ video පවා තිබෙනවා. හැබැයි ප්‍රශ්නය ඒක නොවෙයි. එක පැත්තකින් එහෙම කරනවා. අනෙක් පැත්තෙන් අද ඒකට පොලීසියේ පැමිණිලි දෙකක් කරලා තිබෙනවා, මේ වෙනකම් කිසිම විභාගයක් වෙලා නැහැ. අර අහිංසක මිනිස්සු එකතු කරන කෑම ටිකට පවා ලේබල් ගහගන්න යනවා හැරෙන්න වෙන වැඩ පිළිවෙළක් අපිට පෙනෙන්නේ නැහැ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මම හිතන්නේ කැබ් රථ ගේනවා කිව්වා 225දෙනාටම. 225දෙනාටම ගේනවා කියන්නේ මටත් කැබ් රථයක් ගේනවා කියන එක නේ. නමුත් මම වෙනුවෙන් වෙන් කරලා තිබෙන කැබ් රථයට යන මුදල -මම දැක්කා, ටෙන්ඩරය අනුව රුපියල් ලක්ෂ 210ක් කැබ් එකකට -එක වාහනයකට- වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි insurance එකත් දාලා දෙනවා කියලා තිබෙනවා. එතකොට insurance එකටත් තව රුපියල් ලක්ෂ 10ක් විතර අවරුදු 4ට යනවා ඇති නේ. ඒ සියලුම මුදල- මේ වෙද්දි මේ ආපදා තත්ත්වයත් එක්ක කටයුතු කරන සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය බෙහෙත් ටික ගේන්න ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම මේක ලිඛිතවත් ගරු කථානායකතුමාට දෙන්නම්. දැනටත් අත්‍යවශ්‍ය බෙහෙත් 60ක් නැහැ කියලා අපිට Parliament එකේ Research Division එකෙන්ම දැන ගන්න ලැබුණා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විමසීමක් කළායින් පස්සේ බෙහෙත් 60ක් මේ ආපදාවට කලින්නුත් නැතුව තිබිලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මට දෙන කැබ් එකට යන සල්ලි ටික සම්පූර්ණයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම, නාමල් රාජපක්ෂ මැතිතුමා අපේ මාස කිහිපයක පඩිය යොදවලා "ආදරය" වැඩසටහන යටතේ ළමයින්ට පොත්පත් ලබා දීම හෙට දිනයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වතුර බැහැලා ගියපු තැන්වලින් ආරම්භ කරනවා. මොකද, ඒ ගං වතුර තත්ත්වය ගෙවල්වලට ආපු අය වෙනුවෙන් තමයි මේ වැඩසටහන පටන් ගත්තේ. අපි හෙට ළමයි 1,500කට පොත්පත් දීලා ඒක හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරලා ඊට පස්සේ ලංකාව වටේම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තමයි අපි පක්ෂයක් විධියට මේ වෙලාවේ සතියක් දේශපාලනයක් නැතුව, කිසිම විවේචනයක් නැතුව නිශ්ශබ්දව ආණ්ඩුව සහ රට වෙනුවෙන් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ගරු සභාපතිතුමනි, අය වැය ගත්තත්, අපි සාමාන්‍යයෙන් විරුද්ධව තමයි ඡන්දය දෙන්නේ. මේ රජය ආපු වෙලාවේ ඉඳන් හැමදාම ඒ ඇස්තමේන්තු වෙන්න පුළුවන් ඒවාට විරුද්ධවයි ඡන්දේ දුන්නේ. හැබැයි මේ පරිපූරක ඇස්තමේන්තුවට අපේ කිසිම විරෝධතාවක් නැහැ. ඒ වාගේම තමයි අපි පළමුවැනි වතාවට මෙවර මේ අය වැයට විරුද්ධව ඡන්දය ලබා දෙන්නේ නැහැ. හැබැයි විරුද්ධව ඡන්දය ලබා දෙන්නේ නැහැ කියන්නේ ආණ්ඩුවට සහයෝගය ලබා දෙනවා කියන එක නොවෙයි. මේ අය වැය වෙනස් විය යුතුමයි. මොකද, අද මේ අය වැය අනුමත කිරීමේ කිසිම තේරුමක් නැහැ.

මොකද, මේ අය වැය ගංවතුරට, නායයෑම්වලට කලින් හදපු අය වැයක් නිසා. මේ අය වැයෙන් නිවාස අමාත්‍යාංශයට වෙන් වෙච්ච මුදල් ප්‍රමාණය මේ වෙලාවේ ප්‍රමාණවත් නැහැ. ඒ වාගේම මේ අය වැය සම්පූර්ණයෙන්ම මේ ආපදාවට, මේ හානියට සුදුසු ආකාරයට වෙනස් විය යුතුයි. හැබැයි, එහෙම දෙයක් අපි දකින්නේ නැහැ. ඒක නිසා අපට අය වැයට පක්ෂව ඡන්දය දෙන්න හැකියාවක් නැහැ. අපට පෙනෙන එකම කාරණය මෙයයි. අපි දවස් දෙකක සාකච්ඡාවක් ඉල්ලුවා, ආපදා තත්ත්වය ගැන කථා කරන්න. හැබැයි, ඒ අවස්ථාවත් අපට ලැබුණේ නැහැ. ඒ අවස්ථාව ලැබුණා නම් සමහර විට අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමන්ලාට, ඒ ආපදාව සිදු වුණු දිස්ත්‍රික්කවල මන්ත්‍රීතුමන්ලාට ඒ ප්‍රශ්න ටික පාර්ලිමේන්තුවේදී කියන්න තිබුණා. ඒවාවලට ඔබතුමන්ලාට attend වෙන්න තිබුණා. ඒ අවස්ථාවේත් ඔබතුමන්ලාට හදිස්සියක් තිබුණා, වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයයි, තව වැය ශීර්ෂ කිහිපයකුයි සම්මත කර ගන්න. පුදුම හදිස්සියක් තමයි ඒ වැය ශීර්ෂ සම්මත කර ගන්න තිබුණේ. හැබැයි, අය වැය හරි විධියට හදන්නේ නැතුව මොකක්ද තිබෙන හදිස්සිය?

ලබන අවුරුද්දට නම් අය වැය ඉදිරිපත් වන්නේ මීට කලින් දාපු එක ටෙන්ඩරයයි තිබෙන්නේ. කැබ් ටෙන්ඩරටය විතරයි.

දූෂිත කැබ් ටෙන්ඩරය ඇරෙන්න වෙන කිසිම හේතුවක් නැහැ, ආපදාව ගැන සාකච්ඡා කරන්නේ නැතුව ඒ වැය ශීර්ෂ අනුමත කර ගන්න. එහෙම වුවමනාව තිබෙන්නේ දෙන්නාටයි. කවුරු හරි දූෂිත කැබ් ටෙන්ඩරය වෙනුවෙන් වැඩ කරන මනුස්සයාටයි, කැබ් හම්බ වෙන අයටයි විතරයි හදිස්සියක් තිබෙන්නේ. එහෙම නැත්නම් මේක revise කරලා මේ ආපදාවට සුදුසු විධියට හදලා තිබුණා නම්, කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු සභාපතිතුමනි, මම මේ ගැන කථා කරන්න නොවෙයි බලාපොරොත්තු වුණේ. ආණ්ඩු පක්ෂයේ අය මේ ආපදාව ගැන කථා කරන කොට විපක්ෂයට චෝදනා කරන අවස්ථාත් අපි දැක්කා. හැබැයි, ඇත්තටම මේ ආපදාව මීට වැඩිය අඩුවෙන් බේරා ගන්න තිබුණේ නැද්ද? මේකට සූදානම් වුණා ඇතිද? අපි ඒ කාරණය මේ රටේ ජනතාවගෙන් අහන්න කැමැතියි. අපි දැක්කා, නුවර මන්ත්‍රීතුමා එදා පාර්ලිමේන්තුවේ ඇවිල්ලා ප්‍රශ්න ටික කියන කොට ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා එතුමාගේ පිළිතුරේදී කියනවා, "අපි සියයට 100ක් සූදානම් වෙලා හිටියේ" කියලා. ඒ වාගේම මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිවරයා කිව්වා, "මෙහෙම ප්‍රශ්නයක් කලින් දැන ගෙන හිටියා නම්, නිලධාරින්ගේ තමයි වරද" කියලා. හැම දාම වාගේ ආණ්ඩුව මේ පාරත් ඔක්කෝම නිලධාරින්ගේ ඇඟට දාලා අත හෝදා ගන්න යනවා වාගේ පෙනෙන නින්දා තමයි ගරු සභාපතිතුමනි, අපට මේවා කථා කරන්න වෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි දැක්කා ඔබතුමාගේ රූපවාහිනී වැඩසටහන.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු සභාපතිතුමනි, -

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සමාජ මාධ්‍යයේ එල්ලෙන්න එපා. "Turning Point" වැඩසටහනේ මගේ සම්පූර්ණ කථාව බලන්න. ඔබතුමන්ලාගේ මඩ බලකායක් ඉන්නවා. ඒ මඩ බලකාය අපේ හැම කෙනෙකුගේම කථාවල අග මුලින් කෑල්ලක් අල්ලාගෙන ඒක වැරදි විධියට විග්‍රහ කරනවා. ඒවාට අපි උත්තර දෙන්න යන්නේ නැහැ. ඔබතුමා මේ වෙලාවේ මගේ නම කියපු නිසායි මම මේ කාරණයත් කියන්නේ. මම පැහැදිලි කරපු එක නිවැරදිව බලන්න. එහෙම නැතුව සමාජ මාධ්‍යවල යන කෑලි අල්ලාගෙන ඒවා ඔස්සේ යන්න එපා කියලා මම ඉල්ලනවා.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මහින්ද ජයසිංහ මැතිතුමා කියනවා නම්, නිලධාරින්ගේ වැරැද්දක් නැහැ කියලා, මම පිළිගන්නම්. මම දැක්කේ ඔබතුමාගේ වීඩියෝ එකක් යනවා, නිලධාරින්ගේ වරද කියලා. ඔබතුමා දැන් ඉන්න ස්ථාවරයේ තමයි මමත් ඉන්නේ. ඔබතුමා දැන් හරි කියනවා නම්, නිලධාරින්ගේ වැරැද්දක් නැහැ කියලා මම ඒක උඩින්ම පිළිගන්නවා. මොකද, අතුල කරුණානායක මහත්තයා 11වැනි දා ඉඳන් press briefings තිය තියා කියනවා, මෙහෙම අනතුරක් වෙන්න පුළුවන් කියලා. 22, 23, 24, 25 ගැන press briefing තිය තියා කිව්වා. මම හිතන්නේ මහින්ද ජයසිංහ මැතිතුමාත් දැන් මගේ මතයේ ඉන්නේ. හොඳයි.

ගරු සභාපතිතුමනි, press briefing තිය තියා කියලා තිබෙද්දී මොකක්ද මේ ආණ්ඩුව ගත්ත පියවර? ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඊයේ කියනවා, "25වැනිදා වෙද්දී අපි දැන ගත්තා" කියලා. හරි, 25වැනි දා දැන ගත්තා නේ. 25වැනි දා දැන ගත්තා නම් ආපදා කළමනාකරණ අමාත්‍යවරයා ඇයි මේ නිලධාරින් හම්බ වුණේ නැත්තේ? ඇයි, මේකට වැඩ පිළිවෙළ හැදුවේ නැත්තේ? රටේ ජනාධිපතිතුමා නම් ආපදා කළමනාකරණ අමාත්‍යවරයා, ඇයි මේකට වැඩ පිළිවෙළ හැදුවේ නැත්තේ? එතුමා 24වැනි දා ඉන්නේ මම හිතන්නේ සංගීත් එක්ක ඔවුන්ගේ ප්‍රශ්නයක් සාකච්ඡා කරමින්. 25වැනි දා රන්ජන් රාමනායක මහත්තයලාත් එක්ක ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු කථා කරනවා. 26වැනි දා පඩි ප්‍රශ්නයක් කථා කරනවා. මෙවැනි ආපදා තත්ත්වයක් ගැන, මිලිමීටර් 400කට, 500කට වැඩි වැස්සක් වැටෙනවා කියලා BBC එක පැහැදිලිවම කියනවා නම්, ඒකේ report එකක් ජනාධිපති මාධ්‍ය අංශයෙන් අනිවාර්යයෙන් එතුමන්ලාට ලැබෙනවා. ඇයි මේකට පිළිතුරු දුන්නේ නැත්තේ?

කොත්මලේ ජලාශය වෙලාවට විවෘත කළේ නැත්තේ ඇයි? අද කියනවා, "මේක technical කාරණයක්. එහෙම කරන්න බැහැ" කියලා. ගරු සභාපතිතුමනි, ජල කළමනාකරණ කමිටුව අපි නිතරම COPE එකට ගෙනැල්ලා තිබෙනවා. ඒකේ කිසිම technical කාරණයක් නැහැ. ඒක technical තමයි.

අධික වැස්සක් වැටෙනවා නම්, එක පාරට වාන් දොරටු automatically ඇරෙන කල් හිටියේ ඇයි? ඒ ජලාශය හදලා තිබෙන්නේ ජලාශයේ dam එකට damage එකක් වෙනවා නම් වාන් දොරටුව automatically open වෙන්නයි. ඒ වෙලාවට කලින් තමයි හැම තිස්සේම එය open කළ යුත්තේ. හැබැයි එය open කරන්න කලින් ඉබේ ඇරුණා. ඒකෙන් වැඩිම damage එක වුණේ උඩ පළාතට. එහි ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට, එහෙම නැත්නම් සංවර්ධන කමිටුවේ සභාපතිතුමන්ලාට වගකීමක් තිබුණා ඒ කමිටුව කැඳවන්න, ඒ ජනතාව දැනුවත් කරන්න, announcement එකක් යවන්න, එය සමාජ මාධ්‍යයේ පළ කරන්න. නමුත්, මේ කිසිම දෙයක් කළේ නැහැ, කොත්මලේ dam එකේ දොරවල් ටික automatically ඇරෙන කල්. කොහේද ආණ්ඩුව හිටියේ? කිසිම පණිවුඩයක් ලබා දුන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, පාස්කු ඉරුදින ප්‍රහාරය වෙලාවේත් ඔය වාගේමයි වුණේ. ඒ බව මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. හැබැයි පාස්කු ඉරුදින ප්‍රහාරය වෙලාවේ හිටපු ජනාධිපතිවරයාට අන්තිමේදී මිලියන 100කුත් ගෙවන්න සිදු වුණා. ඒ කාලයේ පොලීසිය භාරව හිටපු පොලිස්පතිතුමාට, ආරක්ෂක ලේකම්තුමාට අදටත් නඩු; හිරේත් ගියා. ඊට සමාන කාරණයක් තමයි අද මේ සිදු වෙලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ තත්ත්වයෙන් රටේ ජනතාව මුදා ගත්තාට පසුව අපි බලාපොරොත්තු වෙනවා මේ කාරණය සම්බන්ධව විශේෂයෙන්ම තේරීම් කාරක සභාවක් පත් කරගෙන මේ පිළිබඳව ප්‍රශ්න කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Rauff Hakeem. You have 12 minutes.

[පූ.භා. 11.57]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුවෙන්ම ලබා දීලා තිබෙන දත්ත ආශ්‍රයෙන්, සුනාමි ව්‍යසනයට සහ මේ ආපදාවට අදාළ දත්ත සංසන්දනය කරමින්, assets loss එක ගැන කථා කරන්න මම අදහස් කරනවා.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Fasmin Sharif, what is your point of Order?

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මම තමයි උඩ පළාතේ සංවර්ධන කමිටුවේ සභාපතිවරයා. ඒ ගරු මන්ත්‍රීතුමා මගේ නම කිව්වා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Fasmin Sharif, you have been listed to speak today. So, you can clarify yourself at that time.

Hon. Rauff Hakeem, you may proceed. We have to manage the time very economically as there are a lot of speakers.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Thank you, Sir.

මම දැන් සංසන්දනය කරනවා සුනාමි ව්‍යසනයෙන් වුණු අලාභයත්, මේ ව්‍යසනයෙන් වෙන්න යන අලාභයත් පිළිබඳව රජයෙන් නිකුත් කර තිබෙන, අද දින අපට ලබා දීලා තිබෙන Supplementary Estimate එකට අනුව. The assets loss was over US Dollars 1 billion during the tsunami. But, as far as the assets loss projected due to this particular climate disaster is concerned, it is estimated to be US Dollars 6 billion to US Dollars 7 billion, six times the impact of the tsunami! Then, the assets loss as a share of GDP during the two disasters was almost the same - almost 4.5 per cent of GDP was needed to restore coastline infrastructure during the tsunami and the destruction due to this climate disaster we have faced is 3 to 5 per cent of GDP.

Therefore, අපි විපක්ෂය පැත්තෙන් ධනාත්මක යෝජනා ඉදිරිපත් කරන කොට, පුළුවන් නම් ඔබතුමන්ලා ඒවා භාර ගන්න. හැබැයි අපව නිකරුණේ විවේචනය කරන්න එපා. අපි දන්නවා දෙපැත්තේම මඩ බලකායක් ඉන්නවා කියලා. ඒ අය මඩ ගහ ගන්නවා. ඒවාට අපි යන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මා කියන්නේ මේ අවස්ථාව ඉතාම වැදගත් කියලායි. තව සුමාන දෙකක් ගියාම ජාත්‍යන්තර අවධානය අපෙන් ගිලිහිලා වෙනත් කොහේට හරි යනවා. එම නිසා මේ කාලය තුළ ගරු ජනාධිපතිතුමා ජාත්‍යන්තර ආධාර සමුළුවක් වහාම කැඳවීම සඳහා රාජ්‍ය නායකයන්ට කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඉන්දියානු අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාට, ඒ වාගේම ජපානයේ අගමැතිතුමාට කථා කරන්න. ඒ වාගේම, ජර්මනියේ Presidentටත්, UAE Presidentටත් කථා කරන්න. මොකද, ජනාධිපතිතුමා ජර්මනියට ගියා; UAE වලටත් ගියා. ඒ වාගේ කිහිපදෙනෙකු කැඳවා, ඒ ගොල්ලන්ට දුරකථනයෙන් කථා කරලා, ජාත්‍යන්තර ආධාර සමුළුවක් හරහා මේ මොහොතේ අපට ඩොලර් බිලියන 2ක්, 3ක් එකතු කර ගන්න අවශ්‍යයි. ඒ සඳහා වූ ප්‍රයත්නයක් රජය ගත යුතුයි කියලා මම කියා සිටිනවා.

ඒ විතරක් නොවෙයි, අපේ විශ්‍රාම ගිය පළපුරුදු ජනාධිපතිවරුත් සම්බන්ධ කර ගන්න. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉන්නවා. ඒ අය පළපුරුදු අය. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ඉන්නවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්නවා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉන්නවා. ඒ සියලුදෙනා එකතු කරගෙන මේ වෙලාවේ මේ ජාතික ව්‍යසනය පිළිබඳව කථා කරන්න. ඒක මම පක්ෂ නායකයෙකු හැටියට කරන ඉල්ලීමක්. නඩු කියන එක අපි පසුවට තියා ගනිමු, නඩු කියන එක නවත්තගන්න අවශ්‍ය නැහැ. ජනාධිපතිවරුන්ට විරුද්ධව නඩු පැවරුවාට අපට ප්‍රශ්නයක් නැහැ; ඒක කරන්න. නමුත් ඒ අතරතුර මේ ව්‍යසනයේදී විපක්ෂයත්, රටේ ඉන්න නායකයෝ සියලුදෙනාත් එකතු කර ගන්න. ගරු ජනාධිපතිතුමාගෙන් මම බැගෑපත්ව කරන ඉල්ලීමක්, මේක. මොකද, මේ තත්ත්වයට ඔරොත්තු දෙන්න අමාරුයි. කිසිම ආණ්ඩුවකට මෙවැනි මුදලක් සොයා ගන්න තනිවම බැහැ.

එහෙම නැත්නම්, අඩුම වශයෙන් IMF එක කැඳවලා, ඒ අය එක්ක කථා කරලා, ණය ආපසු ගෙවීම තවත් වසර තුනක්වත් කල් දමා ගන්න. විශේෂයෙන්ම ද්විපාර්ශ්වික ණය පිළිබඳව කථා කරන්න පුළුවන්. ඉතින්, ඒ විකල්පවලින් එකක් දෙකක් අපි තෝරා ගත යුතුමයි.

I ask that an international donor conference be summoned. During the tsunami, of course, there was a peace process and also a Donor Conference convened. I participated as a negotiator in the peace process and also in the Donor Conferences. We aimed to get US Dollars 4.5 billion and almost US Dollars 3 billion was committed during the Donor Conference that was held in Oslo and New York. We must call a donor conference in Colombo for our people to see. I am sure the President has the goodwill internationally. He must take the phone and speak to the international leaders, at least, of the countries he had visited only recently. Since he has that goodwill, he must talk to them and summon a donor conference in Colombo. Also, bring together all the former retired Presidents because this is a national disaster. Do not look at it from a political angle. I am making this request because there is no other way.

Of course, the bureaucrats in the current administration are not very experienced. I must say that even with reluctance. There are experienced bureaucrats who had retired. Against some of them, you may have even filed action. But, they are experienced people. There are several such people. Former Secretary to the Ministry of Finance is there; Mr. Faiz Mohideen, retired Deputy Secretary to the Treasury, is also there. Like that there

are several other experienced people. So, call them. They all will get together, commit themselves and assist the Government in raising this massive amount of money that is required.

The reason why I suggested India and Japan is because they worked together on many issues. Geopolitically, there are issues. Of course, China will not engage with them. The President has to speak to President Xi Jinping personally. I am sure he, too would come in. As for President Putin, let our President speak to him personally. Then, things will happen. This is the time that we must bring the international community's attention to the serious debacle we have faced. This disaster that had affected our coutry is of unprecedented magnitude. Therefore, I make this humble plea that the Government must immediately call for an international donor conference. Of course, Europe would not be interested because Europe's attention is on Ukraine and other places. Even Arab countries' attention is on Gaza and other places. I am sure that the UAE would work together with India and Japan and come and assist us. Of course, you could also ask Qatar and Saudi Arabia to join the group of countries to call for an international donor conference and that must happen in Colombo within the next two weeks. I am sure if a concerted effort is made by the President, it would happen

Having said that, now, I must refer to the serious impact of the cyclone. I am sure the floods had affected areas all over the country. Mutur is under water; Kinniya is under water; even Kannattota is under water; every town I enqired about has gone under water. In Malwana, a few days ago, I saw a massive flood. That always happens to that area when floods come. But, what has happened in Kandy is unprecedented. We have to have a special plan to rebuild the entire Kandy District. Particularly, the Gampola urban area is totally inundated. Everything is gone. People are in such a destitute position. Therefore, things have to take place without delay to ensure that some corrective action is taken immediately.

If you look at the landslides alone in Kandy, in Rambuke Ela and Vilana in the Akurana area of the Akurana GS Division, almost 29 people had died and only eleven bodies had been recovered and the rest had been allowed to remain under the mud. In Mawathura-Udagama in Gampola Udapalatha area also, there were massive floods and several bodies had been unrecovered. In excess of fifteen houses had been completely destroyed with the entire population buried under due to the landslide in Mawathura. Again, the entire uplands in Hadabima in Gampola Udapalatha, an area just one-and-a-half kilometres away from where I live in Kandy, had been swept away by a landslide. More than fifteen people had died due to that landslides and several bodies are still to be recovered. So, that is the situation in the uplands in Hadabima, Mawathura in Udugama and Rambuke Ela in Vilana with the entire villages gone and there are several houses to which people cannot go back and live. So, they have to be found alternate accommodation.

මේ විකල්ප ඉඩම් සොයා ගැනීමේදී LRC එකේ ඉඩම්, ඒ වාගේම ජනවසම - JEDB - සහ SLSPC වතුවල තිබෙන ඉඩම් පිළිබඳව සොයන්න ඕනෑ. නමුත්, ඒ ඔක්කොටම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් සහතිකයක් ඕනෑ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිලධාරින් නැහැ, නිලධාරින් අඩුයි. ඒ පිළිබඳව වහාම රජය මැදිහත් වෙලා, පේරාදෙණිය, මොරටුව, කැලණිය හා රුහුණ වාගේ අපේ විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨවල සිටින විශේෂඥයන් කැඳවලා, ඔක්කොම එකතු වෙලා මේ කටයුත්ත කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේක කරන්න බැහැ. සිය ගණන්, දහස් ගණන් මිනිස්සු අනාථ වෙලා ඉන්නවා. ඒ අයගේ ගෙවල්වලට යන්න බැහැ. ඒ ගෙවල්වලට යන්න ඉස්සෙල්ලා යම් පර්යේෂණයක් කරන්න ඕනෑ. එහෙම කරන්න ඕනෑ වුණත් අපේ NBRO එකේ දැන් සිටින නිලධාරි මහත්වරුන්ට ඒක කරන්න බැහැ, කොහේවත් ගිහිල්ලා report එක දෙන්නත් බැහැ.

ගරු සභාපතිතුමනි, මම දෙල්තොට ප්‍රදේශයට ගියා. එතැන විශාල නාය යාමක් සිදු වෙලා තිබෙනවා. දෙල්තොට නගරයට යාබදව තිබෙන පියසේනපුර ගම පැත්තෙන් උඩින් හෙල කඩා ගෙන ඇවිල්ලා, දෙල්තොට මුස්ලිම් විද්‍යාලයේ ක්‍රීඩා පිටිය අසළ විශාල කඩා වැටීමක් එක්ක, Anura Daniel Hospital එක ළඟින් එහෙම පිටින්ම ගිහිල්ලා ගෙවල් සම්පූර්ණයෙන්ම හානියට පත් වෙලා තිබෙනවා. හොඳ වෙලාවට එහිදී ජීවිත හානියක් වුණේ නැති වුණාට, විශාල දේපළ හානියක් සිදු වෙලා තිබෙනවා. නමුත්, ගෙවල්වලට යන්න විධියක් නැහැ. මිනිස්සු තවමත් ඒ ගෙවල්වල ජීවත් වෙනවා. ඔවුන්ට යන්න බැහැ, වෙන තැනක් නැහැ. ඒ කාරණයත් මම විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඒ වාගේම, නාරන්හේන, Pattiyagama Estate එකේ ලයින් කාමරවලට යන්නම බැහැ. අපිට ඒ මිනිස්සුන්ගේ අඳෝනාව අහගෙන ඉන්න විතරයි පුළුවන්. නමුත්, ඒවාට තීරණයක් දෙන්න. ඒවාට පිළිතුරක් දෙන්න අපි වහාම විකල්ප ඉඩම් සොයන්නට ඕනෑ. ඒ පිළිබඳව වහාම කටයුතු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, පාරවල් වුණත් එහෙමයි. දැන් මහනුවරට යනවා නම්, ගලගෙදර මාර්ගයෙන් විතරයි යන්න පුළුවන්කම තිබෙන්නේ. කඩුගන්නාව පාර වැහිලා. ගලගෙදර මාර්ගයෙන් ගියත් තැන් තැන්වල විශාල ලෙස පාර ගිලා බැහැලා තිබෙනවා. එක මංතීරුවක් විතරයි තිබෙන්නේ. වහාම ඒවා හදන්න ඕනෑ. ඒවා හදන්න අපිට කාල වේලාව මදි. නමුත්, ඒවා කරන්න විශේෂඥ දැනුම තිබෙන අය ඕනෑ. ඉංජිනේරු පීඨවල සිටින හැමදෙනාම එකතු කරලා, සමුළුවක් පවත්වලා හෝ මේවා ගැන කථා කරන්න. ඒ විශේෂිත දැනුම අපි පාවිච්චි කළ යුතුයි. ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ සිටියත්, ආණ්ඩු පක්ෂයේ සිටියත්, ඒ දැනුම තිබෙන හැමදෙනාම එකතු වෙලා කළ යුතු විශාල කාර්යභාරයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒකට අවශ්‍ය මුදල් සොයා ගන්න අපි ජාත්‍යන්තර ආධාර සමුළුවක් වහාම කැඳවිය යුතුයි. ඒක ජනාධිපතිතුමා පෞද්ගලිකව මැදිහත් වෙලා කළ යුතුයි. ඒ සඳහා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, මගේ කථාව සමාප්ත කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Thilanka U. Gamage. You have seven minutes.

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
What is it, Hon. Member?

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා අකුරණ ගැන පොඩි කාරණයක් කිව්වා. ඒ නාය යාමට ලක් වුණු ප්‍රදේශයේ මළ සිරුරු 29ත්, 11ක් අපි සොයා ගත්තා. ඉතිරි ඒවා ඒ familiesවල අය එහෙමම වළ දමන්න තමයි කැමැති වුණේ. දැනටමත් UAE හමුදාවෙන් ඇවිල්ලා එතැන වැඩ කරගෙන යනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Thilanka U. Gamage, your time starts now. ඔබතුමාට මිනිත්තු 7ක් තිබෙනවා.

[අ.භා. 12.10]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු සභාපතිතුමනි, මීට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරද්දී, විශේෂයෙන්ම බණ කියලා තමයි කථාව ආරම්භ කළේ. ඔවුන් බණ කියලා කියනවා, හරි තැනට තට්ටුව දැම්මා නම් වැඩේ හරියට වෙනවා කියලා. ඒක නිසා හරි තැනට තට්ටුව දමන්න අපිට ඉගෙන ගන්න කියලා තමයි, ඒගොල්ලෝ කියන්නේ. ඒගොල්ලෝ දමපු තට්ටුව ගැන මේ රටේ ජනතාව හොඳටම දන්නවා. ඒගොල්ලෝ තට්ටුව දැම්මා මහ බැංකුවට, ඒගොල්ලෝ තට්ටුව දැම්මා මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් වැඩ කරන්න තිබෙන මුදල් ටිකට. මහා ණය කන්දක් ගත්තා. මේ රට සම්පූර්ණයෙන්ම විනාශ කරලා දැම්මා. ඒ නිසා ඒගොල්ලන්ගේ තට්ටුව ගැන අපිට කියන්න දෙයක් නැහැ, ඒක මේ රටේ ජනතාව දන්නවා.

ඒ වාගේම අපි දන්නවා, 2016දී ලංකාපුත්‍ර බැංකුවේ වෙන්නප්පුව ශාඛාවෙන් ණයක් අරගෙන තිබෙන බව. RDB එක යටතේයි මේ ණය අරගෙන තිබෙන්නේ. මේ අවස්ථාවේදී උසාවියේ නඩුවකුත් තිබෙනවා. ඒ නඩුවෙන් රුපියල් ලක්ෂ 450කට වඩා ගෙවන්න තිබෙනවා. ඒගොල්ලෝ දාපු තට්ටුව තමයි, ඒ. අද වන විට මේ රටේ ජනතාවට මහා විපතක් වෙලා තිබෙනවා. මෙතැන කෑ ගහලා, පැයක් වැනි කාලයකුත් දීර්ඝ කරගෙන, බැලුවාම බුලක් ගහන්න තමයි මේ කාලය දික් කරගෙන තිබෙන්නේ.

මේ වෙලාවේදී මේ ජනතාව සැබෑ ලෙසම මේ ඛේදවාචකයෙන් ගොඩ ගන්නේ කොහොමද කියන එක වෙනුවෙන් කථා කරනවා වෙනුවට, මේ වෙලාවේ මේ විපතට පත් වෙච්ච ජනතාව ගැන කථා කරනවා වෙනුවට, සම්පූර්ණයෙන්ම ව්‍යාකූල තත්ත්වයක් ඇති කරන එක තමයි මේ කරන්න හදන්නේ.

ඇත්තටම ගත්තොත්, අපි රජයක් විධියට මෙකෙදි සෑම පැත්තෙන්ම මැදිහත් වෙලා තිබෙනවා. මූලිකවම ගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධයෙන් නව චක්‍රලේඛ නිකුත් කර තිබෙනවා, නිලධාරින්ට කිසිදු ආකාරයක බයකින් සැකයකින් තොරව වැඩ කරන්න අවශ්‍ය කරන තීන්දු තීරණ ගන්න. ඕනෑම ආකාරයක මැදිහත්වීමක් කිරීම සඳහා අවශ්‍ය කරන තීන්දු තීරණ ටික මේ වෙලාවේ ඉතා ක්ෂණිකව අරගෙන තිබෙනවා. අපි ඉතිහාසයේ මෙවැනි ඛේදවාචකයක් දැකලා තිබුණේ නැහැ. අපි දැකපු ලොකුම ඛේදවාචකය තමයි සුනාමි උවදුර. සුනාමිය එක්ක විපතට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් එවකට අපි පක්ෂයක් විධියට මැදිහත් වෙලා ඉතා ඉක්මනින් ඒ වෙනුවෙන් සහන සපයන්න, රේල් පාරවල් නැවත ඉදි කරන්න, බස් නැවතුම්පොළවල් ඉදි කරන්න කටයුතු කළා. අපි විශාල මැදිහත්වීමක් කළා, ඒ වෙලාවේ පැවැති ආණ්ඩුවට ලොකු හයියක් වෙන්න. හැබැයි, මේ වෙලාවේ අපට විපක්ෂයෙන් එහෙම දෙයක් දකින්න ලැබෙන්නේ නැහැ. විපක්ෂය අද විපතට පත් වෙලා ඉන්නවා. අපේ රටේ ජනතාව අද ආණ්ඩුවේ සියලු දෙනාම එක්ක අත්වැල් බැඳගෙන ඉන්නවා. මේ සියලු ජනතාව අද සහන සේවා බලකායක් බවට පත් වෙලා ඉවරයි. මේ රටේ ජනතාව ඒ හැම ප්‍රදේශයකටම යන්න විශාල වශයෙන් එකතු වී සිටිනවා. අපි දන්නවා, ඒ ප්‍රදේශවල තිබෙන සියලු යන්ත්‍ර සූත්‍ර අරගෙන ඒ මිනිස්සු අද පෝලිමට එනවා. ඒ ප්‍රදේශවල ජනතාව මෙහෙම එකක් ජීවිතේ කවදාවත් දැකලා තිබුණේ නැහැ. මේක තමයි රටක් ගොඩනඟන සාමූහිකත්වය. අන්න ඒ සාමූහිකත්වය මේ රට තුළ ඇතිවෙලා තිබෙනවා, ඒ අලුත් දේශපාලන සංස්කෘතියත් එක්ක. හැම ප්‍රදේශයකින්ම අහනවා, කවදාද අපි එන්න ඕනෑ, අපි මොනවාද අරගෙන එන්න ඕනෑ, මේ විපතට පත් වෙච්ච මොහොතේ ඒ ජනතාවට උදව් කරන්නේ කොහොමද, ඒ ජනතාව මේ විපතෙන් ගලවා ගන්නේ කොහොමද කියලා.

හානියට පත් වුණු මාර්ග පද්ධතිය පිළිසකර කරන්න අපි කටයුතු කරනවා. ඒ සඳහා ලෝකයේ විවිධ රටවල් ඇතුළු සියලු දෙනා මේ වෙලාවේ රජයට ආධාර උපකාර කරන්න මැදිහත් වෙමින් ඉන්නවා. සියලු ජනතාව ඒ සඳහා මැදිහත් වෙමින් සිටිනවා. හැබැයි, විපක්ෂයත් ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ වෙලාවක ඔවුන් කරන්නේ මේ ක්‍රියාවලිය කඩාකප්පල් කරන එකයි, ඒක ඇතුළේ දේශපාලනය තෝරන එකයි; දේශපාලනය කරන එකයි. ඒ නිසා, විශේෂයෙන්ම අපි මේ රටේ ජනතාවට කියනවා, මේ කියන දේවල්වලට අහු වෙන්න එපා කියලා. අපි සෑම දෙනාම සාමූහිකව මේ රට ගොඩනඟන්න මැදිහත් වෙන්න ඕනෑ. එහෙම මැදිහත් වුණොත් ඉතාම ඉක්මනින් මේ රට තිබුණු මට්ටමටත් වඩා එහාට අරගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

දැන් අපි එක් එක් දිස්ත්‍රික්ක පිරිසිදු කරන්න භාර ගත්තා. ගාල්ල දිස්ත්‍රික්කය විධියට අපි මහනුවර දිස්ත්‍රික්කය භාර ගත්තා. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20, අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා 20ට බෙදලා ඒ හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ගිහිල්ලා අපි වැඩ කළා. විවිධාකාරයේ චෝදනා එල්ල කරනවා අපි දැක්කා. තරාතිරම්, අනම්මනම් අපේ ළඟ නැහැ. අපි සියලු දෙනාම සාමූහිකව ජනතාව එක්ක එකතු වෙලා බිමට බැහැලා වැඩ කළා. මමත් අද උදේ තමයි ආවේ. පසුගිය දවස්වල අපි දවස් 5ක් මහනුවර නැවතිලා වැඩ කළා. ඒ ජනතාව වෙනුවෙන් අපි හැම තැනකටම ගියා. කඳුවුරුවලට පවා ගිහින් සොයා බැලුවා. සමහර ප්‍රදේශවල ජනතාවට කිසිසේත්ම එළියට එන්න බැරිව සිටියා. හැම පැත්තකින්ම කඳු කඩා වැටිලා පාරවල් වැහිලා තිබුණා. විශේෂයෙන්ම අපේ තරුණ පිරිස හමුදාවේ teams දෙකක් එක්ක එකතු වෙලා ඒ ජනතාව ගැන සොයා බැලුවා. ඒ අය අතර ගැබිනි මාතාවන් හිටියා. ඒ වාගේම, අත පය ආබාධවලට ලක් වෙච්ච, ඇවිදින්න බැරි මිනිස්සු හිටියා. අපේ තරුණයෝ ඔවුන්ගේ දෑත්වලින් කිලෝමීටර 10, 12 ඒ අය ඔසවාගෙන ආවා. ඒ වාගේ කැප කිරීම් කළා. අපි සියලු දෙනාටම මේ රට ගොඩ ගන්න පුළුවන්.

විශේෂයෙන්ම අද දවසේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් කථා කරන කාරක

සභා විවාදයේ දී මට පෙර කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ අය වැය පිළිගන්න බැහැ කියලා. මේ අය වැය පිළිබඳව ඔයගොල්ලන් ගැටලුවක් ඇති කර ගන්න එපා. අපි මේ රටේ අනවශ්‍ය වියදම් නතර කරලා, මේ රටට අවශ්‍ය කරන මුදල් ඕනෑවටත් වඩා ඉතිරි කරමින් තිබෙනවා. ඒ ඉතිරි කරන මුදල් කිසිදු ගැටලුවකින් තොරව මේ ජනතාව වෙනුවෙන් අපට වියදම් කරන්න පුළුවන්. ඒකම තමයි මේ වෙලාවෙත් වියදම් කරන්නේ. භාණ්ඩාගාරයේ එහෙම මුදල් ඉතිරි කරගෙන නොතිබුණා නම්, මේ වෙලාවේ අපි විශාල අර්බුදයකට යනවා. එහෙම වුණා නම් අපට අධික පොලියකට ණය ගන්න වෙනවා. මහ බැංකුවට මේ අර්බුදය කළමනාකරණය කර ගන්න බැරි වෙලා, ආර්ථිකය බංකොලොත් වෙනවා. නමුත්, මෙවැනි ඛේදවාචකයක් ඇති වෙලාත් ජනතාවට ආර්ථිකය පිළිබඳව කිසිදු සැකයක් නැහැ. අපට මේක කළමනාකරණය කර ගන්න පුළුවන්. ආර්ථික ස්ථායිකරණය හදලා තිබෙනවා. විශේෂයෙන්ම ණය කළමනාකරණයත් අපි මේක ඇතුළේ සිදු කරගෙන තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා දන්නේ නැති වුණාට, අය වැයෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවනවා නම් අපට ඒ වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න පුළුවන්; අවශ්‍යතාව අනුව අතුරු අය වැයක් වුවත් ගෙනෙන්න පුළුවන්.

ඒ නිසා අවශ්‍ය පරිදි සහන දෙන්න මේ අය වැයෙනුත් අපට පුළුවන්, අවශ්‍යතාව අනුව වැඩ කටයුතු කරන්නත් පුළුවන් කියන එක විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

අපි පසුගිය දවස්වල දැක්කා, මේ ව්‍යසනය අවස්ථාවේ එක එක දේවල් බෙදන එක, ඒ වැඩ කටයුතු කරන එක මුලින්ම ආරම්භ කළේ එතුමන්ලාය කියලා කිව්වා. ඒ වාගේම බංකු උඩ පොත් ටිකක් තියලා photos ටිකක් ගහනවා, අපි දැක්කා. හරිම ලජ්ජයි. පසුගිය කාලයේ මෙවැනි තත්ත්වයන් ඇති වුණු අවස්ථාවල කෙසෙල් ගෙඩියෙත් සීල් එක ගහලා බෙදපු ආකාරය අපට මතකයි. එහෙම මන්ත්‍රීවරු තමයි හිටියේ. හැබැයි, අපි සියලුදෙනාම එකට එකතු වෙලා ඒ සංස්කෘතිය නැති කර තිබෙනවා. අද ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා, දිසාපති කාර්යාල හරහා සියලු බඩු භාණ්ඩ බෙදන ක්‍රමවේදයක් හදලා තිබෙනවා. එම ක්‍රමවේදය තුළින් හැම කෙනෙකුටම අවශ්‍ය දේවල් ලබා දෙන වැඩ පිළිවෙළක් හදා තිබෙනවා. සුරක්ෂිත මධ්‍යස්ථාන හරහා සෑම ජනතාවක්ම බලාගන්න කටයුතු කර තිබෙනවා. මේ අර්බුදය ඉතා ඉක්මනින් සමනය කරලා මේ රට යථා තත්ත්වයට පත් කරගන්න අපට හැකියාව තිබෙනවා. අප සියලුදෙනාම ඒ වෙනුවෙන් එකට එකතු වෙමු; සාමූහික වෙමු. රට ගොඩ නැඟීම සඳහා අපි ජාතික වශයෙන් මැදිහත් වෙමු කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. (Dr.) Harsha de Silva? I can see you on your feet.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, it is with dismay that I bring to your notice a certain point made by the speaker who just finished his speech and sat down.

Under Standing Order No. 91.(h), we are not supposed make reference to the personal affairs of another Member. Here, I heard even a case number being specified. A person may be challenged in court, but that does not necessarily mean that that person is guilty. So, Sir, I think that reference should be expunged. Such personal details should not be mentioned in this House. There is a certain decorum here. Let me tell you, Sir, I am a senior Member in this Parliament and we never hear such instances or such references here. So, It is not correct.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Harsha de Silva, I will bring that to the notice of the Hon. Speaker.

Next, the Hon. Upali Samarasinghe. You have eight minutes.

[අ.භා. 12.18]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)
ගරු සභාපතිතුමනි, අද දවසේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැනත් සාකච්ඡා කරනවා. ඒ ගැන කථා කරන්න පෙර, රටේ සිදු වී තිබෙන විශේෂ තත්ත්වය ගැන සියලුදෙනාම අදහස් දක්වන මොහොතක, වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් වවුනියාව, මන්නාරම, මුලතිව් කියන දිස්ත්‍රික්ක තුනේම දිස්ත්‍රික් කමිටු සභාපතිවරයා ලෙස මා එම ප්‍රදේශවල වූ සිදුවීම් සම්බන්ධයෙන් සහ ඒ ප්‍රදේශයේ සිටින දිසාපතිවරු තුන්දෙනා, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන් ඇතුළු රාජ්‍ය පද්ධතිය බොහොම කැපවීමෙන්, දේශපාලන කණ්ඩායම් සමඟ -අප සමඟ- මැදිහත් වෙමින් වෙහෙස නොබලා දිවා රාත්‍රී වැඩ කළා කියන එක මුලින්ම මේ සභාවට මතක් කර දෙන්නට ඕනෑ. මොකද, මේ කාරණයේදී රාජ්‍ය නිලධාරීන්ට වැඩ කටයුතු කිරීම චක්‍රලේඛ මඟින් හිර කළා, දේශපාලන අධිකාරිය බලපෑම් කළා කියන අභූත චෝදනාව විපක්ෂය පැත්තෙන් නිතරම මතු කරනවා. ඇත්තවශයෙන්ම මේ දිස්ත්‍රික්ක තුළ විදුලිබල මණ්ඩලය, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, Irrigation Department කියන හැම ආයතනයක්ම බොහොම සමීපව වැඩ කළා. මුදා ගැනීමේ කටයුතුවලදී ශ්‍රී ලංකා පොලීසිය, නාවික හමුදාව, ගුවන් හමුදාව ඇතුළු විවිධ සහන සේවා කණ්ඩායම් ඉතා ඉක්මනින් -කඩිනම්ව- මැදිහත් වුණා.

ගරු සභාපතිතුමනි, වාසනාවකට, වවුනියාව හා මුලතිව් දිස්ත්‍රික්කවලට වෙච්ච ආපදාව අඩුයි. නමුත්, මන්නාරම

[ගරු උපාලි සමරසිංහ මහතා]

කියන්නේ, මේ ව්‍යසනයෙන් දැඩි හානියට පත් වෙච්ච දිස්ත්‍රික්කයක්. මෙතැනදී, මන්නාරම දිස්ත්‍රික්කය භාරව සිටින අපේ මන්ත්‍රීවරු මේ කටයුතුවලට මැදිහත් වුණේ නැහැ කියන කාරණය මතු වුණා. මන්නාරම දිස්ත්‍රික්කය භාරව සිටින ගරු ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා දින 5ක් තිස්සේ මන්නාරමේ අඛණ්ඩව රැඳී සිටිමින් ඒ කටයුතු මෙහෙයවූවා. අපි දන්නවා, හැමෝටම ඒ දිස්ත්‍රික්කවලට යන්න එන්න බැරි වුණු බව. දුරකථන සම්පූර්ණයෙන්ම විසන්ධි වුණා, විදුලිය විසන්ධි වුණා. ඒ අවස්ථාවේ එම මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම බොහොම අමාරුවෙන් බෝට්ටුවලින් ගිහිල්ලා ඒ දිස්ත්‍රික්කයේ පරිපාලනයත් එක්ක බද්ධ වෙලා දවස් 5ක් තිස්සේ දැවැන්ත මැදිහත්වීමක් කළා. එම දිස්ත්‍රික්කය නියෝජනය කරන වෙනත් මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීම ගත්තොත්, එය ඉතාම අඩුයි කියලා මම හිතනවා. ඇත්තවශයෙන්ම, 145දෙනෙක් විතර ගුවන් යානා මඟින්, නාවික හමුදාව මඟින් මුදා ගත්තා. ඒ විතරක් නොවෙයි. සමහර ගම්මානවලට ගුවන් මඟින් දවස් දෙක තුනේ කෑම අරගෙන ගියා.

මේ සියලු අවස්ථාවලදී මුලතිව් දිස්ත්‍රික්කයේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වෛද්‍ය තිලකනාදන් මන්ත්‍රීතුමා දවස් කිහිපයක් රැඳී සිටිමින්, මුලතිව් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ප්‍රශ්නවලට මැදිහත් වුණා. ඒ සඳහා ත්‍රිවිධ හමුදාවේ මැදිහත්වීම, රාජ්‍ය නිලධාරින්ගේ මැදිහත්වීම ඉතා ඉහළ මට්ටමින් තිබුණා. ඒ වාගේම මේ කාරණයේදී විශේෂයෙන් කියන්න ඕනෑ, මොන තත්ත්වයන් තුළ, මොන මතවාද තිබුණත්, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව, ඒ වාගේම බහුජන නායකයින් මේ කටයුත්තේදී ඉතාම විශිෂ්ට සේවාවක් කළ බව. මේ පාර්ලිමේන්තුව තුළත් උතුරු පළාත නියෝජනය කරන මන්ත්‍රීවරු නිතරම කියනවා අපි දැක්කා, උතුරෙන් හමුදාව ඉවත් කරන්න, සීමා කරන්න කියලා. හැබැයි, මේ සිද්ධියේදී අතිබහුතරයක් -සියයට 80ක්- මේ වැඩකටයුතුවලට මැදිහත් වුණේ හමුදාව බව අපි දැක්කා. සමහර දෙමළ ජනතාව කිව්වා, කඳවුරු ඉවත් නොකර තිබුණා නම්, අපට මීට වඩා සහන ගන්න තිබුණා කියලා. අපි බොහෝ වෙලාවලදී තමන්ගේ දේශපාලන ජයග්‍රහණ වෙනුවෙන්, දේශපාලන අරමුණු වෙනුවෙන් ප්‍රකාශ නිකුත් කරනවා. නමුත් අපේ දිස්ත්‍රික්ක ඇතුළේ අපේ ප්‍රදේශවලට මේ වාගේ දැවැන්ත විපතක් වුණාම, ඒ විපත්වලින් ජනතාව මුදා ගැනීම කියන කාරණයේදී ඇත්තටම ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය කරන කාර්යභාරය අතිමහත්. මේ මොහොතේදී උතුරු පළාතේ ජනතාවට දැඩිව එය දැනුණා; ළෙන්ගතුව දැනුණා. ඔවුන් ඒ සහෝදරත්වය ඉතාම හොඳින් වැළඳ ගත්තා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මෙතැන සාකච්ඡා කරමින් ගොඩක් අය කිව්වා, තවමත් අවතැන් කඳවුරු පවත්වාගෙන යනවා, විපතට පත් ජනතාව සඳහා තවමත් සහන සලසලා නැහැ කියලා. ඇත්තටම මේ වෙද්දී මන්නාරම දිස්ත්‍රික්කයේ කඳවුරුවලින් සියයට 50ක් ඉවත් කර තිබෙනවා. ඒ ජනතාව ගෙවල්වලට ගිහිල්ලා තිබෙනවා. ඒගොල්ලන්ට පහසුකම් සපයා තිබෙනවා. ඒ වාගේම වවුනියාව දිස්ත්‍රික්කය ගත්තොත්, කඳවුරු 58ක් තිබුණා. එම සුරක්ෂිත මධ්‍යස්ථාන 58න් දැනට පවතින්නේ 5යි. ඒ සියලු ජනතාව තම තමන්ගේ ගම්වලට ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටුවා ඔවුන්ට බෝ වන රෝග සම්බන්ධයෙන් කළ යුතු ප්‍රතිකාර සියල්ල කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට මේ වෙනකොටත් වියළි සහනාධාර පාර්සල් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම අද දවසෙත් අපේ දිස්ත්‍රික්ක තුළ 300ක කණ්ඩායමක් ස්වේච්ඡාවෙන් ඒ ගම්වලට ගිහිල්ලා, ගෙවල් සුද්ද කරමින් ඉන්නවා. හෙට දවසේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 150ක කණ්ඩායමක් යනවා, මන්නාරම දිස්ත්‍රික්කයට. ගිහිල්ලා, ඒ නිවාස සුද්ද කිරීමට අවශ්‍ය කටයුතු කරනවා. මේ වෙනකොට රාජ්‍ය යන්ත්‍රණයට වඩා මේ රටේ සිවිල් ජනතාව සහ අපට හිතවත් සංවිධාන එකතු වෙලා අපේ ජනතාවගේ යටිතල පහසුකම් ටික නැවත රැක දෙන්න මහන්සි වෙනවා.

ගරු සභාපතිතුමනි, වවුනියා දිස්ත්‍රික්කයේ වැව් 119ක් කැඩිලා තිබුණා. මේ වෙනකොට වැව් 43කට කිට්ටු සංඛ්‍යාවක් වැලි කොට්ට ගහලා පිළිසකර කරලා, මේ කන්නය වගා කරන්න පුළුවන් වන තැනට සැලසුම් කරනවා. මේ සම්බන්ධයෙන් ගුවන් හමුදාව, පොලීසිය, යුද හමුදාව මැදිහත් වෙලා තිබෙනවා. විපක්ෂය මොනවා කිව්වත්, අපට වෙච්ච මේ බරපතළ හානිය මේ වෙනකොට යම් අවම මට්ටමකට අපි පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඒ දිස්ත්‍රික්කවලට සිදු වූ වගා හානිය ගත්තොත්, ඉතා බරපතළයි. නමුත් අවම වශයෙන් මේ කන්නය කරගෙන යාමට අවශ්‍ය වන්දි ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම බිත්තර වී දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ වැව්වල තිබෙන තත්ත්වයන් තුළ තාවකාලිකව වැලි කොට්ට ගහලා, ඇළවේලි ටික හදලා, බෝක්කු ටික දාලා, මේ කන්නයේ වගා කටයුතු කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. මේ වෙනකොට වන්නි දිස්ත්‍රික්කයට අයත් දිස්ත්‍රික්ක තුනේම පානීය ජල ප්‍රශ්නය, විදුලිය ප්‍රශ්නය, මාර්ග පද්ධතිවල ප්‍රධාන ප්‍රශ්න ටික විසඳලා තිබෙනවා. අපට ඉතා ඉක්මනින් මේ තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, විපක්ෂය පුන පුනා කියන්න මහන්සි වෙන බොහෝ කාරණා නොවෙයි, මහපොළොවේ තිබෙන්නේ කියන එක. අපේ දිස්ත්‍රික්ක තුනේම රාජ්‍ය නිලධාරින්ට අවශ්‍ය ශක්තිය, ධෛර්යය හැම දේම රජය චක්‍රලේඛ හරහා ලබා දීලා තිබෙනවා. දේශපාලන අධිකාරිය උදවු කරලා තිබෙනවා. අපි එකට වැඩ කරලා තිබෙනවා. මහජනතාව ජාති, ආගම් භේදයෙන් තොරව එකතු වෙලා මේ මොහොතේ විපතට පත් ජනතාව වෙනුවෙන් වැඩ කරනවා. මේ වෙනකොට දේශීය වශයෙනුත්, විදේශීය වශයෙනුත් රජයට සහයෝගය ලැබෙනවා. ඒ සහයෝගය, ඒ සහනාධාර ඇතුළු බොහෝ දේවල් පදනම් කරගෙන අපට ඉතා ඉක්මනින් මේ තත්ත්වයෙන් මිදෙන්න පුළුවන් වෙයි. ඒ වාගේම මේ ඇති වෙච්ච විපත පදනම් කරගෙන අපේ රට තිබුණාට වඩා හොඳ තැනකට ගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

ඒ සඳහා සහයෝගය ලබා දෙන්න කියලා රටට ආදරය කරන සියලු ජනතාවගෙනුත්, විශේෂයෙන්ම විදේශීය රටවල ඉන්න ශ්‍රී ලාංකිකයින්ගෙනුත්, විපක්ෂයෙනුත් මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Rohana Bandara. You have ten minutes.

[අ.භා. 12.20]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු සභාපතිතුමනි, අපි අද සහභාගි වෙන්නේ 2026 වසරට ඉදිරිපත් කරපු අය වැය සම්බන්ධ විවාදයේ අවසාන දවසට. අද දවසේ කථා කරපු සෑම කථිකයෙකුගේම කථාවලට අපි ඇහුම්කන් දුන්නා. කිසිදු කෙනෙක් අය වැය ලේඛනය සම්බන්ධව වචනයක්වත් කථා කළේ නැහැ. ඔක්කෝම කථා කළේ, අපේ රට මුහුණ දුන් ව්‍යසනය පිළිබඳවයි. ඒ වාගේම පසුගිය ආණ්ඩුවලට

චෝදනා කරමින් තමන්ගේ කෙරුවාව පෙන්වන එක තමයි ආණ්ඩු පක්ෂයෙන් විවාදයට එක් වුණු සෑම කථිකයෙකුගෙන්ම අපි දැක්කේ. ඒ නිසා තමයි අපේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වේ, පසුගිය වසරවල ඉදිරිපත් කරපු අය වැයවල් වාගේම මේ අය වැයත් පුස් ලියවිල්ලක් බවට පත්වනවා කියලා. මේ ආකාරයෙන් අපි මේ අය වැය සම්මත කරගෙන කටයුතු කරන්න ගියොත්, කරගෙන ආපු වියදම් රේඛා අපට ඒ විධියටම කර ගන්න පුළුවන්ද? බලාපොරොත්තු වුණු ඉලක්කවලට අපට යන්න පුළුවන්ද? අපට ඒ කිසිම ඉලක්කයකට යන්න බැරි වනවා, අද අපේ රට මුහුණ දීලා තිබෙන මේ තත්ත්වයත් එක්ක. මෙතුමන්ලා කයිවාරු ගහපු, මෙතුමන්ලා ප්‍රකාශ කරපු භාණ්ඩාගාරය පිරිලා තිබෙන මුදල් ටික යොදවා, ගංවතුර නිසා අවතැන් වෙච්ච ජනතාවට සහන සලසන එක, විනාශ වුණු දේපළ ටික නැවත ගොඩ නඟන්නට මේක විශේෂ අය වැයක් බවට පත් කරන එක නොවෙයි ද ප්‍රායෝගික වන්නේ කියන එක මගේ කථාව පටන් ගන්න කලින් මම අහන්න කැමැතියි. ඒ නිසා මේ අය වැය ගැන කථා කිරීම තවදුරටත් ප්‍රායෝගික නොවන නිසා මම හිතුවා, අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළුව මුළු රටම මුහුණ දුන් මේ ව්‍යසනයෙන් අපහසුතාවට පත් වී තිබෙන ජනතාව වෙනුවෙන් අප ගත යුතු පිළියම් මොනවාද, මේ වන විට අරගෙන තිබෙන පිළියම් මොනවාද, අපට මුහුණ දෙන්න තිබෙන අභියෝග මොනවාද කියන එක පිළිබඳව අවධානය යොමු කරන්න.

අපට මීට පෙර තිබුණු මෙවැනි පූර්වාදර්ශයක් තමයි, සුනාමි ව්‍යසනය. සුනාමි ව්‍යසනයේදීත් ලැබුණු විදේශ ආධාර වාගේම සක්‍රිය වෙලා දායකත්වය ලබා දුන් අපේ රටේ පරිත්‍යාගශීලින්ගෙන් ලැබිච්ච ධනය අපි නිසි පරිදි කළමනාකරණය කර ගත්තා නම්, අපේ රට නැවත ගොඩ නඟන්නට තිබුණා. ඒ තරම් වත්කම් ප්‍රමාණයක් ගලාගෙන ආවා කියන එක සුනාමි ව්‍යසනය අවස්ථාවේදීත් අපට අහන්න, දකින්න ලැබුණා. සුනාමි ව්‍යසනයට මුහුණ දුන්නේ වෙරළාසන්නයේ තිබෙන දිස්ත්‍රික්ක පමණයි. නමුත් අද දිස්ත්‍රික්කයක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් පාසා -මුළු රටම- එකම විධියට මේ ව්‍යසනයට මුහුණ දෙන වෙලාවේ, අපි දෙපැත්තට බෙදිලා තර්ක විතර්ක කිරීමෙන්, බොරු චෝදනා එල්ල කිරීමෙන් ඔබ්බට ගිහිල්ලා, පක්ෂ විපක්ෂ විධියට, මේ රටේ ව්‍යවස්ථාදායකයට වගකියන කණ්ඩායම විධියට මේ රට ගොඩ නඟන්නේ කොහොමද කියන එක සම්බන්ධව මේ සංවාදය ගෙනියන්න ඕනෑ. ඒකට නායකත්වය ගත යුත්තේ කවුද කියන එක මම කියන්න ඕනෑ නැහැ, ගරු සභාපතිතුමනි. ඒකට නායකත්වය දිය යුත්තේ ආණ්ඩු පක්ෂය. බහුතරයක් සහිත ආණ්ඩු පක්ෂයක් තිබෙනවා. හැබැයි, අපි මේක හොඳට කළමනාකරණය කළා, ඉස්සරහටත් අපට මේක කරගෙන යන්න පුළුවන් කියලා හිතාගෙන කටයුතු කරනවාට වඩා, පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව අපි හැමදෙනාම එකතු වෙලා මේ ව්‍යසනයෙන් ගොඩ එන්නට ක්‍රියාමාර්ග ගත යුතුයි. එක එක්කෙනා සතුව තිබෙන්නා වූ දක්ෂතා එකිනෙකට වෙනස්. එක්කෙනෙකුට තිබෙන හැකියාව නොවෙයි තව කෙනෙකුට තිබෙන්නේ. දේශපාලන යන්ත්‍රණයේ ඉන්න අපි කණ්ඩායම් වශයෙන් නොබෙදී, රටක් විධියට එකට එකතු වී, ව්‍යවස්ථාදායකය විධියට, මේ රටට වගකියන කණ්ඩායම විධියට තමන්ට තිබෙන දක්ෂතා මත, හැකියාව මත මේ දේවල් මෙහෙයවන්න කටයුතු කළා නම් අද දවසේ පාර්ලිමේන්තුවේ කාල වේලාවත් ඉතා වටිනා තැනකට ගෙනියන්න හැකියාව තිබෙනවා කියා මම හිතනවා.

හැබැයි, අවාසනාවට, අද කථා කරපු හැම කථිකයෙකුගේම කථාවලට ඇහුම්කන් දුන්නාම අපට ඉතිහාසයට යන්න වනවා. මේ සුළි කුණාටුවට දීපු නම බලන්නකෝ. ඒ තමයි, "දිට්වා" සුළි කුණාටුව කියන එක. බෞද්ධයෝ විධියට අපි දන්නවා, දිට්ඨ ධම්ම වේදනීය කර්මය ගැන. මෙතැනදී අපි ආණ්ඩුවට චෝදනා කරන්න ඕනෑ නැහැ. මේ ආණ්ඩුවේ ඉන්න ජනාධිපතිවරයා ඇතුළු ඇමතිවරුන් සියලුදෙනාටම විපක්ෂය විධියට අපි චෝදනා කළ යුතු නැහැ. ජනාධිපතිවරයා සහ ඇමතිවරුන් ඇතුළු කණ්ඩායමට කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බැලුවාම, එහෙම නැත්නම් මුහුණුපොතේ සංසරණය වෙන තමන්ගේ පරණ වීඩියෝ ටික බැලුවාම, තමන් විපක්ෂයේ සිටිමින් කටයුතු කරපු කාලයේ මෙවැනි ඛේදවාචකයකදී, ස්වාභාවික උවදුරකදී දේශපාලනික වශයෙන් තමන් හැසිරුණු විධිය අධ්‍යයනය කර ගන්නට හැකියාව තිබෙනවා.

ඒ නිසා තමන් තල වපුරා වෙන මොනවත් බලාපොරොත්තු වෙන එකේ ප්‍රශ්නයයි මේ තිබෙන්නේ. තමන් දිට්ඨ ධම්ම වේදනීය කර්මයට මුහුණ දෙන ගමන්, තමන් හරි කෙරුමෝ කියන එක නම් අමතක කළ යුතුම වෙනවා. ඒ නිසා අපි ඔක්කෝම සමස්ත රටවැසියන් විධියට, දේශපාලනයේ නියැළෙන්නන් විධියට, ඡන්ද දායකයින් ඇතුළු මේ රටේ සමස්ත රටවැසියන්ට වගකියන අය විධියට මේ උද්ධච්චකම පැත්තකින් තබා මේ උවදුරින් ගොඩ එන්නට කටයුතු කළ යුත්තේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව සාකච්ඡා කරන තැනකට එනවා නම්, මම හිතන විධියට එය ඉතා වැදගත් වනවා. එහෙම නැතුව මෙසේ චෝදනා කර ගැනීමේ තේරුමක් නැහැ. තමන් කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා මේ ගැන හිතලා බලන්න. මේ ඉන්නා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ගොඩක්දෙනා ඒ කාලයේ වෙනත් දේශපාලන පක්ෂවල සිටි නිසා, වෙනත් දේශපාලනයක නියැළුණු අය නිසා ජනතා විමුක්ති පෙරමුණේ කතිකාවලට ඇහුම්කන් දීලා නැතුව ඇති. ඒ නිසා මේ ගරු මන්ත්‍රීතුමන්ලාට මම යෝජනා කරනවා, මෙසේ චෝදනා කරනවා වෙනුවට ඔබතුමන්ලාගේ නායකතුමාගේ ඉඳලා ඉතිහාසයේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු -ඇමතිකම් පවා දරපු- අය කටයුතු කළ ආකාරය බලන්න කියලා, ඒ අය සිදු කර තිබෙන කථා බලන්න කියලා.

එක මන්ත්‍රීතුමියක් කථා කළ ආකාරය අපි දැක්කා. අකුණු ගහනකොට එළියට දමන යකඩය වාගේයි එතුමියත්. හැම වෙලේම හෝදන්නට ඉදිරිපත් කරන්නේ එතුමිය. අපි දැක්කා, එතුමිය "දෙරණ" නාළිකාවට චෝදනා එල්ල කළ ආකාරය. "දෙරණ" නාළිකාවෙන් පක්ෂයක් ඉලක්ක කරගෙන, දේශපාලනයක් ඉලක්ක කරගෙන කිසිදු කටයුත්තක් කළේ නැහැ. ඒ අය ආම්ප්‍රදායිකව කරගෙන යන, සතිපතා කරගෙන යන වැඩසටහනකට අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ගෙන්වා සංවාදයක් සිදු කර තිබුණා. ඒ සංවාදයේදී එතුමා කියපු කථාව අල්ලා ගෙන -එම නාළිකාවේ අයිතිකාරයාත් මුල් කරගෙන, ඒ අවස්ථාවේ නිවේදන කටයුතු කළ නිවේදකයාත් මුල් කරගෙන- තමන්ගේ මඩ සෝදා ගන්න, තමන්ගේ නොහැකියාව වහගන්න කථා කළ ආකාරය අපි දැක්කා. මේකද විය යුත්තේ? එතකොට, "දෙරණ" නාළිකාව විතරද ඒ ගැන නිල වශයෙන් ප්‍රකාශ කර තිබෙන්නේ? BBC එක මේ ගැන ප්‍රකාශයට පත් කර නැද්ද? මේකේ වැරැද්ද තිබෙන්නේ කොතැනද? මෙවැනි උවදුරක් එනවා නම්, කොයි විධියටද මේක කළමනාකරණය කළ යුත්තේ කියා සොයා බැලීමට ආපදා කළමනාකරණ කමිටුව රැස්වෙලා ඊට නායකත්වය දෙනවා වෙනුවට දැන් ඇවිල්ලා තමන්ගේ නොහැකියාව වහගන්නට අරයාට මෙයාට දොස් කිය කියා කටයුතු කරන ආකාරයක් තමයි අපි දැක්කේ. මේක නොවිය යුතු දෙයක්. ඒ නිසා අකුණුවලට එළියට දමන යකඩ කැල්ල වාගේ කටයුතු නොකර මේ මොහොතේ වගකීමෙන් යුතුව කටයුතු කරන්න කියා ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් අපි ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, අනුරාධපුර දිස්ත්‍රික්කය ගැනත් මම මේ අවස්ථාවේ වචනයක් කථා කරන්න ඕනෑ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කළ භූමි ප්‍රමාණයෙන් තුනෙන් එකක් මේ

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

වනකොට විනාශ වෙලා. අපේ දිස්ත්‍රික්කය තුළ වී වගාව විතරක් අක්කර දෙලක්ෂ ගණනක කළා. එයින් අක්කර 71,000කට වඩා ප්‍රමාණයක්, ඒ කියන්නේ තුනෙන් එකක් පමණ විනාශ වෙලා. එසේ විනාශයට පත් වුණු භූමියෙනුත් තුනෙන් දෙකක්ම පූර්ණ වශයෙන්ම හානියට පත් වෙලා. රාජාංගනයේ තොරතුරු නැතුවයි මම මේ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන්නේ. රාජාංගනයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් අදාළ තොරතුරු ලැබෙනකොට විනාශයට පත් මේ භූමි ප්‍රමාණයේ එකතුව තවත් ඉහළ යනවා, ගරු ඇමතිතුමනි. මේ ආකාරයට කෘෂි කර්මාන්තය අඩාළවීමත් එක්ක අපේ ආහාර සම්බන්ධයෙන් ඉදිරියේදී අපි ලොකු බේදවාචකයකට මුහුණ දෙන්නත් ඉඩ තිබෙනවා.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් පූර්ණ වගා හානියකට සාම්ප්‍රදායිකව ගොවි මහත්වරුන්ට ලබා දෙන්නේ රුපියල් 40,000යි. නමුත් දැන් වෙලා තිබෙන බොහොමයක් අර්ධ හානි. එතකොට රුපියල් 8,000ක, 16,000ක අතර මුදලක් තමයි මේ ගොවි මහත්වරුන්ට ලැබෙන්න තිබෙන්නේ. ඒ අයගේ කුඹුරු දිහා බැලුවාම අපට පෙනී යනවා, සමහර කුඹුරු අඩි 4ක් විතර පොළොව යටට හාරාගෙන ගිහින් බව. ඒ තැන්වල කුඹුරක් නැහැ. සමහර තැන්වල මඩ පිරිලා, වැලි පිරිලා. එහෙම තත්ත්වයක් තිබෙන්නේ. ඒ කුඹුරු නැවත වගා භූමි බවට පත් කිරීමේදී මේ රුපියල් 8,000න්, රුපියල් 16,000න් සෑහීමකට පත් වෙන්න බැහැ, ගරු සභාපතිතුමනි. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ නිර්ණායක පසෙක තබා ප්‍රායෝගික ඇස්තමේන්තු මත කටයුතු කර, මේ කුඹුරු ඉක්මනින් යථා තත්ත්වයට පත් කරගෙන භෝග නිෂ්පාදනය කිරීම සඳහා එම ගොවීන්ට සාධාරණ වන්දියක් ලබා දීමට කටයුතු කරන්න කියා.

අනෙක් පැත්තෙන්, ආපදාවට පත් නිවාසවලට යන ජනතාවටත් වන්දි ලබා දීමක් කරනවා. මාධ්‍ය තුළ කියනවා අපි දැක්කා, එසේ පදිංචියට යන අයට රුපියල් 10,000 වෙනුවට රුපියල් 25,000ක් ලබා දීමට කටයුතු කරන බව. හැබැයි මම තවම ඇස් දෙකෙන් දැක්කේ නැහැ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාටවත් එසේ ලබා දුන් බවක්. එවැනි මුදලක් ලැබුණා කියා කාගෙන්වත් පණිවුඩයක් ලැබුණේත් නැහැ. එසේ රුපියල් 25,000ක් ලැබුණු කිසිම කෙනෙක් තවම අපේ ප්‍රදේශයෙන් හමු වුණේත් නැහැ. දැන් බොහෝදෙනෙක් ගෙවල්වල පදිංචියට ගිහිල්ලා. ලංකාවේ ඉන්නේ තව කෙනෙකුට උපකාර කරනා -පරෝපකාරී- මිනිසුන් පිරිසක්. ඒ නිසා එසේ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණු අයත් එක්ක එකතු වෙලා තමතමන්ට පුළුවන් විධියට ඒ ජනතාව ගෙවල් සුද්ධ කරගෙන පදිංචියට ගිහිල්ලා තිබෙනවා. රජය මේ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා නම්, ඒ ජනතාව වෙනුවෙන් මුදලක් වෙන් කර තිබෙනවා නම් කවදාද ඒවා ලබා දෙන්නේ? මේ මුදල් ඉක්මනින් ලබා දෙන්න සැලැස්මක් සකස් කරන්න ඕනෑ නැද්ද, මෙහෙම විවාද කර කර ඉන්නවාට වඩා? ඒක දෙනකොටත් සමහර අයගෙන් අහනවා, ඔබට නම් මේක අවශ්‍ය නැහැ නේද කියලාත්. මොකද, ඒ කෙනාගේ ආර්ථික තත්ත්වය පිළිබඳව එම නිලධාරි මහත්වරුන්ට යම් අවබෝධයක් තිබෙනවා.

හැබැයි, ඒ නිලධාරි මහත්ම මහත්මීන් දන්නේ නැහැ, මේ ව්‍යසනය නිසා, තිබුණු ආර්ථික තත්ත්වය කඩාගෙන වැටිලා, මානසිකව බිඳ වැටිලා, හෙට දවස ගැන අවිනිශ්චිතතාවකින් යුක්ත පිරිසක් ඉන්න බව. ඒ නිසා මේ බේදවාචකයට කවුරු හරි මුහුණ දුන්නා නම්, ඒ අයගේ තරාතිරම නොබලා ඒ හැම කෙනෙකුටම රජයෙන් ලබා දෙන මූල්‍ය සහනාධාරය ලබා දීමට කටයුතු කරන්න කියලා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

දිස්ත්‍රික්ක ඇතුළු සමස්ත රට ගැනම කථා කළ යුතු කරුණු කාරණා බොහොමයක් තිබෙනවා. නමුත්, මට බොහොම කනගාටුයි, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු දේශපාලනයක් ඇදාගෙන, ඒ දේශපාලනය තුළ ඉඳගෙන අර පරණ සුපුරුදු විධියටම උඩ පැන පැන, තල තලා කටයුතු කරන එක ගැන. ඒ වෙනුවට අපි වෙනසක් ඇති කරමු. අපට මේ අය වැය සම්මත කර ගන්න තිබුණා. මේ අය වැය ඒකමතිකව සම්මත වෙච්ච අය වැයක් බවට පත් කර ගන්න අවස්ථාව තිබුණා. ඔබතුමන්ලා තවත් සතියක් අරගෙන මේ අය වැය විශේෂ අය වැයක් බවට පත් කරලා කටයුතු කළා නම් අපට මේ පාර්ලිමේන්තුව විධියට ඉතිහාසයට එකතු වන පූර්වාදර්ශයක් දෙන්න තිබුණා. නමුත්, ඔබතුමන්ලාගේ උද්ධච්චකම සහ හිතුවක්කාරකම නිසා ව්‍යසනකාරී අවස්ථාවක රට ගොඩනඟන්නට පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව ඒකමතිකව අය වැය සම්මත කරලා ආදර්ශයක් දුන් රටක් විධියට, පාර්ලිමේන්තුවක් විධියට අපට ඉතිහාසගත වෙන්නට තිබුණු අවස්ථාව අහිමි වුණු බව ප්‍රකාශ කරමින්, මේ බේදවාචකයට මුහුණ දුන් සියලුදෙනාට මාගේ කනගාටුව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Next, the Hon. Wasantha Samarasinghe. You have 16 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 12.37]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 2026 අය වැය පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේ අවසාන දිනය අදයි. අද දින විවාදයට ගැනෙන වැය ශීර්ෂවලට අදාළ අමාත්‍යාංශ පිළිබඳව කථා කරන්න සූදානම් වෙලා සිටියත්, මේ අයහපත් කාලගුණ තත්ත්වය නිසා අපේ රටේ සිද්ධ වෙච්ච බේදවාචකය පිළිබඳව කථා කිරීම අපට අත්හළ නොහැකි දෙයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අය වැය සම්මත කර ගැනීම පිළිබඳව විපක්ෂය එක මතයක නැහැ කියාත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අදහස්වලින් පෙනෙනවා. මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, මේ විවාදය තවත් සතියකින් කල් දමලා ඒකමතිකව සම්මත කර ගන්න තිබුණාය කියලා. හැබැයි, මේ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය. ඒ මොන තත්ත්වය තිබියදී වුණත් අපේ අමාත්‍යාංශයේ

ලේකම්තුමා ඇතුළු සියලු ආයතන ප්‍රධානීන් මේ සඳහා සූදානම් වෙලා වැඩ කළා. අය වැයට අදාළව ඉදිරිපත් කළ යුතු බොහෝ කාරණා තිබුණත් නොවැළැක්විය හැකි ලෙස අද අපේ සංවාදය, සාකච්ඡාව බවට පත්වෙලා තිබෙන්නේ මේ "දිට්වා" සුළි කුණාටුව විසින් අපේ රටට සිදු කරන ලද හානිය, ඒ ස්වාභාවික ව්‍යසනය, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ ගැන කියන ගමන් "එකතු වෙලා වැඩ කරමු" කියලා කියනවා. එකතු වෙලා වැඩ කරන්න කිසිදු ලෙසකින් බාධාවක් තිබුණේ නැහැ. හැබැයි, එකතු වෙලා වැඩ කරන තැන්වලට පැනලා බාධා කරනකොට තමයි මේ ප්‍රශ්න වැඩි වෙන්නේ. මොකද, මේ ව්‍යසනයේ ස්වභාවය, මේ ව්‍යසනයේ තත්ත්වය පිළිබඳව විපක්ෂය රූප රාමුවලින් දැක්කාට අඩුම තරමින් සංඛ්‍යාලේඛනවලින්වත් හරියට බලලා තිබෙනවාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ කථාව කියන්නේ මෙන්න මේ නිසායි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

දැන් ටිකකට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, රාජ්‍ය සේවයට නිවාඩු ලබා දීම ගැන. විශේෂයෙන්ම කබීර් හෂීම් මන්ත්‍රීතුමා නම් කරලා මේ කාරණය කියන්න ඕනෑ. මොකද, එතුමා කිව්වා, රාජ්‍ය සේවයට නිවාඩු ලබා දුන්නාය කියලා. ඇයි, අපි එහෙම රාජ්‍ය සේවයට නිවාඩු ලබා දුන්නේ? නොවැම්බර් 26වැනි දා පටන් ගත්ත වැස්ස 27වැනි දාත් ඇද හැලුණා. සමහර ප්‍රදේශවල නාය යාම් වාර්තා වෙලා, ගමනාගමනයට බාධා එල්ල වෙලා තිබුණා. මිනිස් ජීවිත හානි, අවතැන්වීම් තවදුරටත් සිදු වුණා. ඒ පිළිබඳව වඩා සැලකිලිමත් වෙලා තමයි ඒ නිවාඩුව ලබා දීමට තීරණය කළේ. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා ඊට අදාළව නිකුත් කළ 2025.11.27 දිනැති 30/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ බොහොම පැහැදිලිව ඒ පිළිබඳව කියා තිබෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "පවතින හදිසි ආපදා තත්ත්වය මත සාමාන්‍ය කාර්යාල කටයුතු පවත්වාගෙන යාමේ දී මුහුණ දෙන ගැටලු සැලකිල්ලට ගෙන 2025.11.28 සිකුරාදා දිනය රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දිනයක් ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇත."

එතකොට කාටවත් එහා මෙහා යන්න එන්න බැහැ. මොකද, මාර්ග පද්ධතිය බිඳ වැටිලා; වාහනවලට එහා මෙහා යන්න එන්න බැහැ; ගංවතුර හැම තැනම. එතකොට ජීවිත සම්බන්ධයෙන් අවදානමක් තිබෙනවා. ඒ වාගේම එම චක්‍රලේඛයේ දෙවැනි කරුණ වශයෙන් මෙසේ සඳහන් වෙනවා:

> "තවද, රජයේ අත්‍යවශ්‍ය සේවාවන් හා ආපදා සහන සේවාවන්ට අදාළ නිලධරයන් සේවයට කැඳවීමට ඉහත නිවාඩුව බාධාවක් නොවිය යුතු ය."

ඒකත් කියන්නේ, "සේවයට කැඳවීමට" කියලා; "අවශ්‍යතාව මත අදාළ නිලධරයන් සේවයට කැඳවීමට" කියලා කියන්නේ. ඒ පිළිබඳව බොහෝ දේවල් කියන්න වේලාව මදි නිසා 2025.11.27 දිනැති 30/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ "දිට්වා" සුළි කුණාටුව විසින් අපට කළ හානිය අතිමහත්. මේ ව්‍යසනයෙන් අපේ රටේ 500කට ආසන්න පිරිසක් මේ වෙනකොට මිය ගිහිල්ලා තිබෙනවා. 350කට ආසන්න පිරිසක් අතුරුදන් වෙලා තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක ගත්තාම මේක අතිවිශාල ඛේදවාචකයක්. අපි උත්සාහ කළේ අපේ රටේ ජනතාව මේ ඛේදවාචකයෙන් මුදා ගැනීමටයි.

මේ අවුරුද්දේ අවසාන පොහොය වන උඳුවප් පොහොය ඊයේ දිනට තමයි යෙදී තිබුණේ. මේ පොහොය අනුරාධපුරයට විශේෂ පොහොයක්. අනුරාධපුරයේ අටමස්ථානාධිපති නායක ස්වාමීන් වහන්සේ බැතිමතුන්ගෙන් ඉල්ලීමක් කළා, "අනුරාධපුරයට එන්න එපා, ඔබ මෙවර ගෙවල්වල ඉඳගෙන වත් පිළිවෙත් කරගන්න." කියලා. මොකද, මේ අවදානම විසින් බරපතළ තත්ත්වයන් ඇති කරලා තිබෙන්නේ. පිරිසිදු කිරීමේ ක්‍රියාවලියේ සිට අපි මුහුණ දෙන තත්ත්වයන් පිළිබඳව බොහොම හොඳින් තේරුම් ගත්ත අටමස්ථානාධිපති ආචාර්ය පල්ලේගම හේමරතන නායක ස්වාමීන් වහන්සේ ජනතාවගෙන් ඉල්ලීමක් කළා, "අනුරාධපුරයට එන්න එපා." කියලා. ඇයි, ඒ? මේ මාසයේ 4වැනි දා, අතිවිශාල ලෙස ආපදාවට පත් වෙච්ච තවත් ප්‍රදේශවල ප්‍රතිසංවිධාන කටයුතු, සුද්ද කරන කටයුතු විශාල ප්‍රමාණයක් කරන්න තිබෙනවා. ඒ අස්සේ මිනිස්සු වන්දනාවේ යන එන එක වුණත් මේ කටයුතු කරගන්න බාධාවක් වෙනවා. ඒකයි මේ ප්‍රශ්නය. ඒ නිසා මේ තත්ත්වය විපක්ෂය වුණත් හරියට තේරුම් ග, එහෙම නැත්නම් කන්දක් දෙකක්, නාය ගිහිල්ලා ඇති වෙච්ච තත්ත්වයක්වත් නොවෙයි. මෙවර තමයි, ලංකා ඉතිහාසයේ වැඩිම වර්ෂාපතනය ලැබුණේ. මේ වර්ෂාපතනය විසින් ඇති කරපු ආපදාවේ බලපෑම සම්බන්ධයෙන් අපි තවම ගණන් හදලා නැහැ. හැබැයි, දැන් එක එක්කෙනා ඒ සම්බන්ධයෙන් ගණන් හදලා කියනවා. දැන් ටිකකට කලිනුත් පාර්ලිමේන්තුවේදී කිව්වා, මේ ව්‍යසනයෙන් වුණු හානිය සුනාමි ව්‍යසනය වාගේ 6, 7 ගුණයක් විශාලයි කියලා. ඔව්, සුනාමිය එක ප්‍රදේශයකට විතරයි බලපෑවේ. නමුත්, මේ ව්‍යසනය ලංකාවේ දිස්ත්‍රික්ක 22කට බලපෑවා. අපේ රටේ දිස්ත්‍රික්ක 22ක් ආපදාවට ලක් වෙලා තිබෙනවා කියලා නම් කර තිබෙනවා. ඒ වාගේම, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කර තිබෙනවා, කටයුතු පහසු කර ගැනීම සඳහා.

දැන් මේ තත්ත්වය යටතේ මොකක්ද වුණේ? මම අනුරාධපුර දිස්ත්‍රික්කය ගැන විතරක් කියන්නම්. වෙනදා අපට මුළු රටින්ම අහන්න වුණු හානියට වඩා වැඩි හානියක් අද එක දිස්ත්‍රික්කයකින් අහන්න සිද්ධ වෙලා තිබෙනවා. ඊයේ දවස වෙනකොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක් පවුල් 21,557ක් අවතැන් වෙලා තිබෙනවා. මේ, අද දවසේ update එක නැතුවයි. මේ ප්‍රමාණය දවස ගාණේ වෙනස් වෙනවා. මොකද, වතුර තිබුණු සමහර ප්‍රදේශවලට, කඳු කඩාගෙන වැටුණු ප්‍රදේශවලට අපි තවමත් යනවා. ඒ විතරක් නොවෙයි, අවතැන් වුණු ජනතාව 70,882ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටිනවා. ඒ වාගේම පූර්ණ හානි වුණු ගෙවල් 147කුත්, අර්ධ හානි වුණු ගෙවල් 1,584කුත් තිබෙනවා. මේ ප්‍රමාණය දැන් ටිකක් වැඩිවෙලා තිබෙන්නේ. මේක තමයි තත්ත්වය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අනුරාධපුරය තමයි, අපේ රටේ වැඩියෙන්ම වැව් තිබෙන දිස්ත්‍රික්කය. මහවිලච්චිය වැවේ වාන් දොරටුව කපන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සිද්ධ වුණා. මොකද, නැත්නම් වැව කඩාගෙන යනවා. ඒ නිසා ඒක නවත්වන්න අපට වාන් දොරටුව කපන්න වුණා. තව වැව් 3ක වාන් දොරටු ආසන්නයේ වාන් සීමාව වැඩි කරන්න ඒ වැව් බැම්ම ඉවත් කරන්න ඕනෑ කියලා තීරණ ගත්තා. හැබැයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බොහොම වෙහෙස වෙලා නාච්චාදූව, පදවිය වාගේ වැව් කපන්නේ නැතුව බේරා ගන්න උත්සාහ කළා. ඒක තමයි මේ බරපතළ බලපෑමේ ස්වභාවය. අපේ නිලධාරීන් එහෙම තමයි කටයුතු කළේ. ඒ විතරක් නොවෙයි, ප්‍රධාන මහා වාරිමාර්ග යටතේ තිබෙන විලච්චිය වැව කපනකොට, මධ්‍යම වාරිමාර්ග වැව් 4ක් කැඩී ගියා. ඒ වැව් තමයි, කිරිගොල්ලෑව, මහනිකවැව, නොච්චිකුලම සහ ඇලයාපත්තුව කියන ඒවා. ඒ වැව් 4 කැඩිලා යනකොට මධ්‍ය වාරිමාර්ගයට අයත් තවත් වැව් 36ක් කපා දැම්මා. ඒ විතරක්

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු වසන්ත සමරසිංහ මහතා]

නොවෙයි, කුඩා වැව් 64ක් කැඩුණා. ඒ වෙනුවට කුඩා වැව් 372ක් මිනිස්සු කැපුවා, ඒ වැව් කඩාගෙන යන එක නවත්වන්න. ඒ වැව්වල වාන් කපලා වතුර ඇරියා. තව වැව් 151කට සුළු හානි වුණා. අමුණු 3ක් කඩාගෙන ගියා. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ විතරක් වැව් 631ක් විනාශයට පත් වෙලා තිබෙනවා. මම මේ කිව්වේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ විතරක් වෙච්ච ආපදාව. මේ ආපදාව නිසා සිද්ධ වුණු මරණ ගණන 7යි. දිස්ත්‍රික්කයෙන් පිටත තව 4දෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවා. මේ වෙනකොටත් අපි සුරක්ෂිතතා මධ්‍යස්ථාන 24ක් පවත්වාගෙන යනවා. ඒ මධ්‍යස්ථානවල පවුල් 663ක පුද්ගලයින් 1,924ක් ඉන්නවා. මේ අය අතර පූර්ණ හානියට පත් වුණු ගෙවල් 147කට අයත් මිනිසුන්ට ඒවාට යන්න විධියක් නැතුව මේ මධ්‍යස්ථානවල ඉන්නවා.

ඒ වාගේම, මේ ආපදාව නිසා ඇති වුණු වගා හානියත් අතිවිශාලයි. හෙක්ටෙයාර 70,000කට විතර ගංවතුර තත්ත්වය බලපෑවා. හෙක්ටෙයාර 70,000ක් කියන්නේ, විශාල ප්‍රමාණයක්. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී වගා කරපු මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 50කට මේ ව්‍යසනය බලපෑවා. හැබැයි, ඒ බලපෑමට කොටසක් නාස්තිම වෙලා ගියා. දැන් ඒවායේ යළි වගා කරන්න ඕනෑ. විශේෂයෙන්ම මධ්‍ය වාරිමාර්ග යටතේ සහ සුළු වාරිමාර්ග යටතේ තිබෙන භූමි ප්‍රමාණයෙන් සියයට 50ක්, 60ක් විතර විනාශ වෙලා තිබෙන්නේ. ඒවායේ නැවත වගා කරන්න ඕනෑ. මේ නිසා රටේ නිෂ්පාදනයට බලපෑමක් සිද්ධ වෙනවා. ඒ නිසා මේ පිළිබඳව අපි සාකච්ඡාවට ගන්න ඕනෑ. අපි විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. මේ පිළිබඳව බොහෝ අය බොහෝ කථා කියන්න හදනවා. මේ ගැන කලින් කිව්වත් මේ ආපදාවෙන් ජනතාව බේරා ගන්න බැරි වුණා වාගේ කථා දැන් කියනවා. ඒ කලින් කියපු ප්‍රමාණයට අදාළව පියවර ගන්න තිබුණා කියන කාරණයත් බොහොම පැහැදිලිව කිව්වා.

තැන් තැන්වල ගිහින් කියපුවා නොවෙයි, රජයේ නිල සාකච්ඡාවලදී කියපු කථාවලට අදාළව ඒ කථාව කිව්වේ. මේ සිදු වුණු ආපදාව, උවදුර නිසා රටට සිදු වුණු හානිය පිළිබඳ මුළු ලෝකයම කම්පා වනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අය වැය අවසාන වන දවසේ පාර්ලිමේන්තුවේ අපට සාකච්ඡා කරන්න සිදු වෙලා තිබෙන්නේ එම ව්‍යසනයේ බරපතළකම ගැනයි.

සමහර අය අහනවා, ආණ්ඩුව මොකද කළේ කියලා. විශේෂයෙන් කියන්න ඕනෑ, ගංවතුර තත්ත්වය වැඩි වෙන්න පටන් ගත්ත මොහොතේ සිට පාර්ලිමේන්තුවේ සමහර අයත්, ඇතැම් ජනමාධ්‍යත් එකට බොරු කිව්වා. කලා වැවේ පාලම මත සිරවී තිබුණු බස් එකේ සිටි 60දෙනා දැන් ගහගෙන යනවා, තව ටිකයි කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයේ කවුරු හරි අඩුම ගණනේ බලන්න ආවා නම් දැක ගන්න තිබුණා එම මෙහෙයුමට මහන්සි වුණු ආකාරය. නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක සේවාවල සියලුදෙනා ඒ 60දෙනා බේරා ගන්න වුණු මහන්සිය මේගොල්ලෝ නොදැකයි ඒ කථාව කිව්වේ. හරි පහසුවෙන් එය කිව්වේ. අඩුම ගණනේ කලා වැවේ වතුර දැම්මාට පස්සේ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා නොදැන මෙහේ ඉඳන් බොරු කිව්වා. ලංකාවේ තිබෙන ලොකුම හෙලිකොප්ටරය වන Mi-17 යානය ගෙනාවා. එතැනට හෙලිකොප්ටරය බා ගන්න බැරි වුණා. හෙලිකොප්ටරය පහළට ගන්නකොට වහලය උඩ හිටපු මිනිසුන් ටික හුළඟට යනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉස්සෙල්ලාම බස් එක පාලම උඩ නතර වුණාම නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනෙකුට පොඩි බෝට්ටුවකින් එතැනට යන්න පුළුවන් වුණා. එම බෝට්ටුව තව පැයක් පරක්කු වෙලා ගියා නම්, ඒ 60දෙනාගේම ජීවිත නැති වනවා. වතුර වැඩි වෙනවා කියල දැන ගත්ත ගමන් ඒ අය ගත්ත තීරණය තමයි, කඩිනමින් ඒ ළඟ තිබුණු වහලක් උඩට ඒ 60දෙනාම ගනිපු එක. ඒ 60දෙනාම කඩිනමින් වහල උඩට අරගෙන තිබුණා. ඒ 60දෙනාගෙන් එක්කෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. තව එක්කෙනෙක් hospital එකට ගෙනාවාට පසුව මිය ගියා. අනෙක් සියලුදෙනා බේරා ගන්න පුළුවන් වුණා. විදේශීය කාන්තාවකුත් එතැන හිටියා. පැය 48කට ආසන්න operation එකක් කරලා තමයි ඒ කට්ටිය බේරා ගත්තේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, 27වැනි දා පාන්දර 3.00ට ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරෙන් විශේෂ කණ්ඩායමක් ගෙනැල්ලා එතැනට යනකොටත් ජනාධිපතිතුමා ගුවන් හමුදාවේ base එකේ ඉඳගෙන ඒ මෙහෙයුමට අවශ්‍ය කරන සියලු උපදෙස් ආරක්ෂක අංශවලට ලබා දෙමින් කටයුතු කළා. ඒවා නොදැන, අඩුම ගණනේ මොකද වෙන්නේ කියලා සොයා නොබලා, එතැනට ඇයි යන්න බැරි, බෝට්ටුවක යන්න බැරි ඇයි කියලාවත් නොහිතා, විවිධ news ප්‍රචාරය කරමින් රටට බොරු කිව්වා. ආපදාවකට ලක් වෙච්ච කෙනෙක් එම ආපදාවෙන් මුදා ගන්න උත්සාහ කරනවා මිසක් එතැනින් යනවාද? හෙලිකොප්ටර් තුනක් ආවා. බෝට්ටු ආවා. ඒ එකකටවත් කිට්ටු වෙන්න බැරි වුණා ජල පහරේ වේගවත් බව නිසා. අවසානයේ විශේෂ පුහුණුවක් ලැබූ නාවික හමුදාවේ කණ්ඩායමක් ඇවිත් දැවැන්ත වෙහෙසක් ගත්තා. එම ජල පහර අතරින් ඒගොල්ලෝ ගියේ පයින්. කඹ දදා, ගැට ගහමින් ඒ අය ගියේ පයින්. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මෙහෙයුම පටන් ගන්නකොට පාන්දර 3.00යි. එතැනට ගිහින් එක්කෙනෙක් අරගෙන එනකොට උදේ 8.30යි. එය එතරම් විශාල මෙහෙයුමක්. ඒ අයගේ ජීවිත බේරා ගන්න එහෙමයි කටයුතු කළේ. පළමුව ගිය නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනා සිටියෙත් එම වහලයේ. මොකද, වතුර වැඩි වුණු නිසා අඩුම ගණනේ ඒගොල්ලන්ටවත් ආපහු එන්න බැරි වුණා. ඒ මිනිස්සු 60දෙනා බේරා ගන්න එම නිලධාරින් එවැනි වීර ක්‍රියාවකුයි කළේ. මේ සා විශාල ව්‍යසනයක් සිදු වුණු අවස්ථාවේ විපක්ෂය ඒකෙනුත් news හදලා, ඒකෙනුත් දේශපාලන වාසි ගන්න හැදුවා. අපි කියන්නේ මෙයයි. ඉස්සෙල්ලා මෙම ව්‍යසනයේ තරම හඳුනා ගන්න තිබුණා. ව්‍යසනයේ තරම හඳුනා නොගෙන තමයි ඒ බොරු කිව්වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් බොහෝ ප්‍රමාණයක් ආපදාවට ලක් වුණා. ගෙවල් විනාශ වුණා. වගා හානි වුණා. ඒ විතරක් නොවෙයි, සත්ව හානි වුණා. කිරි හරක්, මී ගවයන්, එළුවන්, කුකුළන් හා ඌරන් විශාල ප්‍රමාණයක් මිය ගියා. පශු සම්පත අපට නැති වුණා. එළවලු වගාව විශාල වශයෙන් විනාශ වුණා. එම ගොවීන්ව නැවත ශක්තිමත් කරන්න ඕනෑ. සමහර බඩඉරිඟු හේන් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. කුඹුරු සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. ඒ අයට ජීවත් වෙන්න තිබුණු ආර්ථික ක්‍රම සම්පූර්ණයෙන්ම නැති වෙලා. මෙහිදී ආණ්ඩුව හැටියට අපි තීරණයක් අරගෙන තිබෙනවා, ඒ සියලු දෙනා නැවත ගොඩනඟන්න. ඒ වෙනුවෙන් තමයි අපි "Rebuilding Sri Lanka" වැඩසටහන හැදුවේ. අපි එම කාර්යය කරන බවත් මේ අවස්ථාවේ කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අපි එය අත හැරලා නොවෙයි ඉන්නේ. නැවත ගොඩනැඟීම වෙනුවෙන් අරමුදලක් හැදුවා. මුදල එකතු කරන්න තමයි පෞද්ගලික අංශයේ කට්ටිය යොදා ගත්තේ.

ආපදාව කළමනාකරණය කරන්න ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙනම තිබෙනවා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒ කටයුතු කරගෙන යනකොට, රාජ්‍ය නිලධාරින් සහ පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් එකතු කරගෙන "Rebuilding Sri Lanka" fund එක හදලා මේ කටයුත්ත කළේ ඇයි? මේක ලෝකයට අරගෙන ගිහිල්ලා රට ගොඩ නඟන වැඩේට අපි උදවු ඉල්ලන්න ඕනෑ. ලෝකයේ රටවල් මේක

දැකලා අපට උදවු කරන්නේ. ආසන්නයේ ඉන්න ඉන්දියාව, පාකිස්තානය වාගේ රටවල් අපට උදවු කරනවා. කුඩා දිවයිනක් වූ මාලදිවයිනේ පවා මිනිස්සු මුදල් එකතු කරලා අපට ආධාර එව්වා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද අය වැය ගැන කථාව කරන්න වෙන්නේ නැහැ. ඒ වෙනුවට "දිට්වා" අපට දුන් දැවැන්ත අභියෝගය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් අපිට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. සමහර තැන්වල ජනතාව තවත් සහන අපේක්ෂා කරමින් ඉන්නවා. ඒ ජනතාවට අපි ඒ සහන ලබා දෙනවා. පාසල් දරුවෙකුට රුපියල් 25,000ක් දෙනවා, උපකරණ ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ලක්ෂ 4කට වඩා පවුල් මේ හේතුවෙන් ආපදාවට ලක් වෙලා තිබෙනවා. දරුවන්ගේ පාසල් බෑග්, නිල ඇඳුම් ඔක්කොම විනාශ වෙලා තිබෙනවා. මේ ලක්ෂ 4කට වැඩි පවුල්වල පීඩාවට පත් වෙච්ච පාසල් දරුවන් අඩුම තරමින් ලක්ෂ 4කට, 5කට වඩා ඉන්නවා. ඒ පීඩාවට පත් වෙච්ච, අවශ්‍යතාව ඇති සියලුදෙනා බලලා ඒ සහනය ලබා දෙන්න ආණ්ඩුව කටයුතු කර තිබෙනවා.

ගෙවල් ටික සුද්ද කරගන්න රුපියල් 10,000ක්ව තිබුණු දීමනාව රුපියල් 25,000ක් දක්වා වැඩි කර ලබා දෙනවා. ඊට අමතරව, පළාත් පාලන ආයතන -නගර සභා, ප්‍රාදේශීය සභා- ඒකාබද්ධව ළිං ටික, වැසිකිළි ටික, පාරවල් ටික සුද්ද කරන දැවැන්ත ශ්‍රම මෙහෙයුමක් මේ රටේ හදවත් තිබෙන මිනිස්සු එක්ක එකතු වෙලා අපි කරමින් ඉන්නවා. ඒ නිසා මේක ගිහිල්ලා ඇඟිල්ලෙන් ඇනලා හොයාගෙන යන්න එන්නේ නැහැ.

තඹුත්තේගමටත් විපක්ෂයේ මන්ත්‍රී කෙනෙකු ගිහිල්ලා තිබුණා. හැබැයි තඹුත්තේගම ගිහිල්ලා ගල්නෑවට තමයි ශ්‍රමදානය වැඩේට ගිහිල්ලා තිබුණේ. තඹුත්තේගම ගොඩක් යට වුණේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. රාජාංගනයෙන් කෙළවරේ "කුඩාගම" කියලා අපේ තෙලිඟු ජනතාව ජීවත් වන ගම්මානයක් තිබෙනවා. රාජාංගනයේ වතුර දැම්මාම ඒ හරියේ පවුල් 40ක් විතර යට වුණා. සමහර අය තඹුත්තේගමට ගිහිල්ලා තිබුණා, තඹුත්තේගමත් යට වුණා කියලා හිතලා. වාන් දොරටු විවෘත කළාම වතුර වැඩි වුණාට පස්සේ රාජාංගනයෙන් එහා පැත්ත, වැවෙන් පල්ලෙහා කොටස ඒ පැත්තෙන් යට වුණා. විශාල හදවත් සහිත මේ රටේ මිනිස්සු තමන්ගේ අතේ තිබුණු දේ දුන්නා, මේ ව්‍යසනයට පත් ජනතාවට උදවු කරන්න; ගෙදර තිබුණු බඩු ටික දුන්නා; ගෙදර තිබුණු උපකරණ ටික දුන්නා. එහෙම උදවු කරන්නේ ඇයි? මේ ව්‍යසනයේ තරම, විශාලත්වය ඒ මිනිස්සු දැකපු නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අකුණු ගහනකොට මිනිස්සු භය වෙන තරමට මේ වැස්ස අපිව භය කළා. ඒක මේ දවස්වලත් කඳවුරුවලට ගිහිල්ලා බලන්න පුළුවන්. ඒ තරම් වැස්සක්, ඒ වැස්ස. ඒ කුණාටුව විසින් ඒ තරම් බිය වැද්දීමක් අපට කර තිබෙනවා. හැබැයි, ඒ බිය වැද්දීමට මේ රට ආපසු හරවන්න බැහැ. ඒක තමයි මේ ඔප්පු කරමින් තිබෙන්නේ. ආරක්ෂක අංශවල සාමාජිකයන් විශාල පිරිසක් අපට මේ සේවාවන් සපයන්න උදවු කළා. ත්‍රිවිධ හමුදාව, පොලිසිය, සිවිල් ආරක්ෂක බලකාය දැවැන්ත කැප කිරීමක් කළා. ඒ ජීවිත අහිමි වෙච්ච සියලු නිලධාරින්ට අපේ මාතෘ භූමියේ ගෞරවය පිරිනමන්න ඕනෑ. ඔවුන් කටයුතු කළේ මේ ව්‍යසනයෙන් තවත් ජීවිතයක් බේරාගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හෙලිකොප්ටරය ගිහිල්ලා කඹය දැම්මාම ආවේ නැති අය හිටියා, සමහර තැන්වල. වැඩිම හානිය සිද්ධ වෙලා තිබෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මල්වතු ඔය ආශ්‍රිතව නාච්චාදුව මනුප සහ නැනුප කියන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආසන්නයේ. මේ ව්‍යසනය ඇතුළේ චෝදනා කරනවා වෙනුවට මේ වැඩේට බහින්න ඕනෑ, විපක්ෂයත් එකට. දැන් චෝදනා කර කර ඉන්නවා වෙනුවට එකට වැඩ කරන්න බහින්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙන්නේ. මොකද, දැන් ශ්‍රමදාන වැඩකටයුතු පටන් අරගෙන තිබෙනනේ. එන්න ශ්‍රමදානවලට. ඇති තරම් තිබෙනවා, වැඩ. යමු බඳින්න, වැව් ටික. අනුරාධපුරයේ වැව් 640ක්ම බඳින්න තිබෙනවා. වෙලි කැඩිලා, අමුණු කැඩිලා මිනිස්සුන්ට දැවැන්ත විනාශයක් සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම අවසන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

මේ කටයුත්ත වෙනුවෙන් උදවු කළ සියලුදෙනාට අප ස්තුතිවන්ත වනවා. විශේෂයෙන් මේ රටට වෙච්ච උවදුර දැකලා ඉස්සෙල්ලාම උදවු කරන්න ජාත්‍යන්තරයේ ඉන්න අපේ ශ්‍රී ලාංකික ප්‍රජාව මැදිහත් වුණා. ඒ වාගේම තවදුරටත් ලංකාව ශක්තිමත් කරන්න Sri Lankan diaspora එක හැටියට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලුදෙනා, විදේශික ජාතිකයන් එක්ක එකතු වෙලා අපට උදවු කරනවා. ඒ අයටත්, ජාත්‍යන්තරයේ අපට උදවු කරන සියලු රටවල්වලටත් අපි ස්තුතිවන්ත වෙනවා, මේ කාරණයේදී අපේ ලංකාව එක්ක අත්වැල් බැඳගෙන ඉන්න නිසා. ඒ වාගේම මේ රටේ ජනාධිපති ලේකම්වරයාගේ සිට සියලු ලේකම්වරු, ආරක්ෂක අංශයේ සියලු නිලධාරින්, තානාපති කාර්යාලවල සියලුදෙනා, මේ රටේ සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරිවරු ඇතුළු කාර්යාලයේ වැඩ කරන කාර්යාල කාර්ය සහායක ඉඳන් සියලු දෙනා එක දිගට පැය 24ක් වැඩ කරපු තැන් තිබුණා. ඒ සියලුදෙනා රට මුහුණ දුන් අර්බුදයෙන් රට ගොඩ නැඟීම වෙනුවෙන් ඒ අයගේ වෙහෙම මහන්සිය නොබලා, නිදි නොලබා වැඩකටයුතු කළා. ඒ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. නමුත්, තවම වැඩේ අවසන් නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

දවස් තුනක කුණාටුව විසින් ඇති කරපු බලපෑමෙන් තවත් දවස් ගණනාවක් තුළ සුද්ද පවිත්‍ර කිරීම සහ ගොඩ නැඟීම වෙනුවෙන් අපට කටයුතු කරන්න වෙලා තිබෙනවා.

ඒ නිසා අපි විපක්ෂයට කියන්න ඕනෑ, ඔබ තෝරාගත් පාර මේ රට ගොඩ නැඟීම නම්, ඒ පාර ඔබට තවමත් විවෘත බව. ඒ පාර තෝරාගෙන යද්දී "ගෙදර නාය ගියාද?" කියලා අහන කොට "බිත්තිත් ගියාද?" වාගේ ප්‍රශ්න අහන්න එපා. නිවස නාය ගිය මනුස්සයා කියනවා, "ගෙදරම නාය ගියා" කියලා. එතකොට මන්ත්‍රීතුමෙක් අහනවා, "බිත්තිත් ගියාද" කියලා. බිත්ති ඉතුරු කරලා ගෙවල් නාය යන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. අඩුම ගණනේ සිහියෙන් යන්න; මිනිසුන් මුහුණ දීලා තිබෙන තත්ත්වය පිළිබඳව අවබෝධ කර ගන්න; ජනතාව ඉන්න පීඩාව තේරුම් ගන්න. මේ රට ගොඩ නඟන වැඩ පිළිවෙළට ගරු ජනාධිපතිතුමා නායකත්වය දෙනවා. මේ ආණ්ඩුව මේ කටයුතු ටික කරනවා. ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය සහ මේ රටට ආදරය කරන සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සහයෝගය, ඒ වාගේම මේ රටේ රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, මේ රටේ සියලු සිවිල් සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සියලුදෙනාගේ සහයෝගය ඇතිව මේ රට ආපසු හැරවිය නොහැකි ලෙස ගොඩනැඟීම මේ ආණ්ඩුව විසින් සිදු කරනවා කියන කාරණය මතක් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 12.57]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, என்னுடைய தேசத்தின் தெய்வங்களினதும் அவர்களின் வழிவந்தவர் களினதும் உதவியால் இன்றைய தினம் என்னால் மறுபடியும் இந்தப் பாராளுமன்றத்தில் உரையாற்றக்கூடியதாக இருக்கின்றதென நான் நினைக்கின்றேன். இந்த நேரத்தில் தங்களுடைய உறவுகளை இழந்து, நிலங்களை இழந்து, வீடுகளை இழந்து, வாழ்க்கையில் நம்பிக்கையில்லாமல் போயிருக்கின்ற ஒவ்வொருவருடனும் நான் இருப்பேன் என்பதைச் சொல்லிக்கொள்வதுடன், என்னை நேசிக்கும் உறவுகள் அனைவருக்கும் எனது வணக்கத்தையும் தெரிவித்துக் கொள்கின்றேன்.

அண்மையில் வடக்கு மாகாணத்துக்கு 36 கோடி ரூபாய் அனுப்பப்பட்டு இருக்கின்றது. Equity என்றால் என்ன, equality என்றால் என்ன என்றுகூட தெரியாமல் அரசாங்கம் செயற்பட்டுக்கொண்டு இருப்பது மிகவும் கவலையாக இருக்கின்றது. அதாவது, முழங்கால் அளவுக்கு வெள்ளநீர் வந்தவர்களுக்கும் 25,000 ரூபாய்தான் வழங்கப்படுகின்றது; வீடு முழுமையாகப் பாதிக்கப்பட்டவர்களுக்கும் 25,000 ரூபாய்தான் வழங்கப்படுகின்றது; வீட்டின் addressகூட இல்லாமல் முழுமையாகப் பாதிக்கப்பட்டவர்களுக்கும் 25,000 ரூபாய்தான் வழங்கப்படுகின்றது; NPPக்கு வேலைசெய்தவர் களுக்கும் 25,000 ரூபாய்தான் வழங்கப்படுகின்றது. கடந்த மாதம் 30ஆம் திகதி மழை குறைவடைந்துவிட்டது. இந்த மாதம் 02ஆம் திகதிதான் இடைத்தங்கல் முகாமொன்றை அமைத்திருக்கிறார்கள். நான் இது சம்பந்தமாகக் கதைக்க விரும்பவில்லை. ஏனென்றால், எனக்கு முன்னால் நிறையப் பேர் இருக்கிறார்கள். சில செம்மறிகளுக்குச் சொல்லியும் விளங்குவதில்லை. படித்தவர்களுக்குச் சொல்லலாம்; ஆனால், இவ்வாறானவர்களுக்குச் சொல்ல முடியாது. கிளிநொச்சியில் போய் அடிவாங்கி, ஓடியிருக்கிறார்கள். இதற்கு மேல் சொல்ல விரும்பவில்லை.

நான் முக்கியமான விடயமொன்றைக் குறிப்பிட வேண்டும். இப்பொழுது சீரற்ற வானிலை காரணமாக வடக்கு, கிழக்கில் மட்டுமல்லாது, நாட்டின் எல்லாப் பிரதேசங்களிலும் படுமோசமான நிலைமையே காணப்படுகின்றது. வெள்ள நிலைமை காரணமாக என்னால் இரண்டு நாட்கள் வெளியே வரமுடியாமல் இருந்தது. ஆனால், இங்கு அரசாங்கம்தான் பிழை, எதிர்க்கட்சிதான் பிழை என்று விமர்சனம் நடைபெறுகின்றது. இந்த மாதிரியான ஒரு பாராளுமன்றம் இந்த நாட்டில் இருப்பதையிட்டு வெட்கப்படுகின்றேன். இன்றைய தினம் பாராளுமன்ற அமர்வுக்காகச் செலவழிக்கின்ற நிதியை, வீடுகளை இழந்த, தந்தையை இழந்த, தாயை இழந்த ஒவ்வொரு குடும்பத்துக்கும் 10 இலட்சம் ரூபாய் வீதம் கொடுத்தால், அவர்கள் சாகும்வரை இந்த அரசாங்கத்தை மறக்க மாட்டார்கள். ஆனால், இங்கு நாங்கள் ஒருவரை ஒருவர் மாறி மாறி குற்றஞ்சாட்டிக்கொண்டு இருக்கிறோம்.

புத்தளம், அருவக்காட்டில் குப்பை கொட்டும் பிரச்சினை சம்பந்தமாக இங்கு கதைக்கப்பட்டு இருக்கிறது. அது சம்பந்தமாக பிறிதொரு சந்தர்ப்பத்தில் ஆறுதலாகக் கதைக்கிறேன். ஒருசில அமைச்சர்கள் cowboy மாதிரி capஐயும் போட்டுக்கொண்டு திரிகிறார்கள். ஐயா, நீங்கள் ஓர் அமைச்சர் என்பதை தயவுசெய்து விளங்கிக் கொள்ளுங்கள்! ஒவ்வொரு நாளும் ஒவ்வோர் உடுப்போடு போய் நின்றுகொண்டு கோமாளித்தனம் பண்ணாமல், தயதுசெய்து வடக்கு மாகாணத்துக்கு இருக்கின்ற மரியாதையைக் காப்பாற்றுங்கள்! நான் சில விடயங்களைச் சிங்களத்தில் சொல்ல விரும்பு கின்றேன்.

මම ස්තුතිවන්ත වෙනවා මාව බේරගත්තු රණ විරුවන්ට. මම අද එක දෙයක් කියන්න ඕනෑ. මම අද පාර්ලිමේන්තුව ඇතුළේ මේ mike එක අල්ලාගෙන කියන්නේ එදා කියපු එකමයි. ඔබලා හැමදාම කියනවා නේ, "සෙබළු" කියලා. මම හැමදාම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, "රණවිරුවෝ" කියලා. නමත් එක්කම කියන්නම්. ගංවතුරට අහු වෙච්ච මාව බෙල්ලෙන් අල්ලලා බේරගත්තේ අල්විස් කියන පුද්ගලයා. මගේ කාර් එක සම්පූර්ණයෙන්ම ගංවතුරට ගහගෙන ගියා. පස්සේ කුඹුරක තිබිලා ඒක හොයා ගත්තා. 27වැනි දා මගේ රණ විරුවෝ මාව බේරගත්තා. මම දැන් මෙහේ ඇවිල්ලා බොරු කියන්නේ නැහැ ඔබලා වාගේ. "සෙබළු" කියලා, අරවා කියලා, මේවා කියලා මට බොරු කරන්න බැහැ මේ පාර්ලිමේන්තුව ඇතුළේ. මම අද වෙනකල් කිව්වේ "රණවිරුවෝ" කියලා. මගේ භූමියට ඇවිල්ලා මේ රට වෙනුවෙන් කවුරු හරි මැරිලා ඉන්නවා නම්, ඒ මිනිස්සුන්ට "රණවිරුවෝ" කියන තරමට, ඒ මිනිස්සුන්ගේ කකුල් අල්ලලා වඳින තරමට මට කොන්ද පණ තියෙනවා. ඔබලාට නැති වුණාට මගේ කොන්ද පණ තියෙනවා.

මාදිවෙලට ගිහිල්ලා බලන්න, ඔබලා cabs park කරලා තිබෙන තරම. එහෙම තිබියදීත් ඔබලා තවත් අලුත් cabs ගන්න බලාගෙන ඉන්නවා. ඔබලාට පරණ cabs ටික තියාගෙන ඉන්න බැහැ. ලජ්ජයි බං, underwear ඇඳගෙන මේ පාර්ලිමේන්තුවට එන්න. මං දෙන්නම් ඔයගොල්ලන්ට.

මට මතකයි, මම 27වැනි දා රෑ වතුරට වැටුණා. එතැන navy truck එකකුත් වැටිලා තිබුණා. මගේ වාහනය ගිහිල්ලා ඒකට හේත්තු වුණා. ඊට පස්සේ එක්කෙනෙක් මගේ බෙල්ලෙන් අල්ලලා navy boat එක ඇතුළට දැම්මා. Boat එක කියන්නේ, navy truck එක ඇතුළේ boat එක තිබුණේ. මාව ඒක ඇතුළේ තිබ්බා. ඊට පස්සේ ගංවතුර ඇවිල්ලා ඒකත් පෙරළෙන්න යනකොට, recovery vehicle එකක් ඇවිල්ලා ඒකට ලණුවක් දාලා ඇද්දා. එහෙම යනකොට මම සම්පූර්ණයෙන්ම යට වුණා. මම එක අතකින් ලණුවේ එල්ලිලා හිටියේ. Navy එකේ කොල්ලෙක් වේගයෙන් වතුරේ ගහගෙන ගියා. එයා කොහොම හරි ගිහිල්ලා බේරුණා ගහක එල්ලිලා. එහෙම වුණේ නැත්නම් එයාව අද හොයාගන්නත් බැරි වෙනවා. ඒ කොල්ලා හිටියේ නැත්නම් එදා- තමුන්නාන්සේලාගේ ජනාධිපති ඇවිල්ලා නේ කිව්වේ, navy හමුදාව අඩු කරනවා, ගුවන් හමුදාව අඩු කරනවා කියලා. ලජ්ජයි ඔබලා! ලජ්ජා වෙන්න ඕනෑ මේ වගේ ආණ්ඩුවක් කරන්න. අර ළමයි මාව බේරලා යනකොට මට jacket එකකුත් දීලා ගියේ. එයාගේ නම අල්විස් වෙන්න ඕනෑ. නම කියන්න බැහැ කිව්වා, මම පාර්ලිමේන්තුවේදී කියයි කියන බය නිසා. එයා වතුරේ ගහගෙන ගියා. එයාගේ body එක තමයි අද ගන්න තිබ්බේ- මේ වෙනකොට හමුදාවේ 6ක්, 7ක්, 8ක් විතර මැරිලා තියෙනවා. දැන් මෙතැන තමුන්නාන්සේලාගේ Deputy Minister ඉන්නවා නේ. ඒ අයට life jacket එකක්වත් නැහැ.

ඊට පස්සේ මාව හොයන්න ඇවිල්ලා, තව truck එකක්. ඒක ඇවිල්ලා පෙරළුණා. එතැන හමුදාවේ 30ක් හිටියා. ඒ 30 දෙනාටම life jackets නැහැ; අපිව හොයන්න එන, අපිව බේරාගන්න එන ඒ අයට life jackets නැහැ. තමුන්නාන්සේලා coats ඇඳගෙන, watches දාගෙන ඉන්නවා. තමුන්නාන්සේලාගේ attire එක කණ්ණාඩියෙන් බලන්න. ලජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා නේද කිව්වේ, බස්වල යනවා කියලා? මම අද ආවේ PickMe එකක් දාගෙන. මගේ කාර් එකත් ගිහිල්ලා. හැබැයි, මම එකක් කියන්නම්. මට ඔයගොල්ලන් ගන්න cab එක ඕනෑ නැහැ. තමුන්නාන්සේලාම පදින්න ඒක. එහෙම නැත්නම්, ඒ ලක්ෂ 225 මට දෙන්න. අර ගම්වල ගෙවල් නැති මිනිස්සු ඉන්නවා. මම ගිහිල්ලා ලක්ෂ 10ක් ගාණේ බෙදන්නම්. හැබැයි, තමුන්නාන්සේලා විශ්වාස කරලා මම ලියුමක් දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා බෙදන්නම් කියලා NPP එකට වැඩ කරපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ ඒක දෙන්නේ. ඒ නිසා කරුණාකරලා ඒ සල්ලි මට දෙන්න; මම ගිහිල්ලා ලක්ෂ දහය, දහය බෙදන්නම්.

ගෙවල් නැති වෙච්ච අය ඉන්නවා. ඒගොල්ලන්ට දීලා තිබෙනවා, රුපියල් 25,000ක්. ලජ්ජා වෙන්න. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විපක්ෂයට බණිනවා; ආපහු ආණ්ඩුවට බණිනවා. ලජ්ජයි!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, වචන භාවිතයේදී පරිස්සම් වෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම දන්න වචන පාවිච්චි කරන්නේ. හොඳ නැත්නම් හැන්සාඩ් එකෙන් අයින් කරන්න. කිසි අවුලක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔව්, හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න, අනවශ්‍ය වචන පාවිච්චි කරන ඒවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තේරෙන සිංහල මෙච්චරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හරි, හරි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමියට අවුල්ද, මම සිංහලෙන් කථා කරන එකට?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
නැහැ. "බල්ලා" වගේ වචන භාවිත කිරීමේදී,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
"බල්ලා" කියන්නේ බල්ලා; "බල්ලා" is dog. Dogට "dog" තමයි කියන්න ඕනෑ. ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න, ඒ වචන. ජනතාවට එහෙම ආමන්ත්‍රණය කරන එක සුදුසු නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමියට ඕනෑ නම් හැන්සාඩ් එකෙන් අයින් කරගන්න. මට කිසි අවුලක් නැහැ. මට කථා කරන්න පුළුවන් සිංහල මෙච්චරයි. ඔබතුමිය හැම දාම මට කරදර කරනවා. කරදර කරන්න එපා. මට ලජ්ජාවේ බැහැ, ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ගැන. දැන් ඔයගොල්ලන් ඇඳගෙන ඉන්න attire එක බලන්න. එක MP කෙනෙක්වත් අමාරුවේ වැටුණාද කියන්න. ඔක්කොම ගොඩ ගිහිල්ලා. හැබැයි, කොත්මලේ dam එක බේරන්න වතුර ඇරලා ගම්වල මිනිස්සු ඔක්කොම යට වෙලායි තියෙන්නේ. හැබැයි, මට මෙතැනට ඇවිත් කියන්න බැහැ, ඔබලා වරදක් කළා, මේගොල්ලෝ වරදක් කළා කියලා. මොකද, තමුන්නාන්සේලා "L" බෝඩ් නේ. "L" බෝඩ්කාරයෙක් ඇවිල්ලා මගේ කාර් එකේ වැදුණා නම්, මම ඌට වැඳලා යන්න දෙනවා, "පලයන් බං යන්න" කියලා. ඒ වාගේ තමයි මටත් යන්න දෙන්න වෙලා තිබෙන්නේ ඔයගොල්ලන්ට. ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ.

අර navy truck එක ගහගෙන ගියා නම් දැන් වෙනකොට රණවිරුවෝ 30ක් නැහැ. මාව බේරාගත්තේ, බුද්ධික කියලා කර්නල් කෙනෙක්; රුවන් කියලා අයියා කෙනෙක්. ඒගොල්ලන් ඇවිල්ලා මට "සර්" කිව්වා. දවස් දෙකක් ඒගොල්ලෝ camp එකේ ඇතුළේ තියලා, එයාගේ කාමරේ මාව තිබ්බා, "Doctor, ඔයා ඉන්න මගේ පෞද්ගලික කාමරයේ" කියලා. එයා එළියට ගිහිල්ලා බුදියගත්තා. ඒ වගේ රණ විරුවන්ට ඔයගොල්ලෝ කිව්වේ "සෙබළු" කියලා. ලජ්ජා වෙන්න ඕනෑ. මිනිස්සු කී දෙනෙක් මැරිලාද? ඔයගොල්ලන් කිව්වේ, "Jeep එපා, බස්වල යනවා" කියලා නේ. දැන් බස් එකේ යන කවුරු හරි ඉන්නවා නම්, අත උස්සලා කියන්න. ලජ්ජා වෙන්න ඕනෑ.

ඊට වඩා දෙයක් මම කියන්න ඕනෑ. Jaffnaවලට රුපියල් කෝටි 36ක් දීලා තිබෙනවා. ඒ රුපියල් කෝටි 36 ඔයගොල්ලන්ගේ NPP එකට වැඩ කරපු මිනිසුන්ට නේ බෙදන්නේ. ඇයි, මිනිස්සුන්ගේ සල්ලිවලට ආණ්ඩුව ඔහොම අපරාධ කරන්නේ? ඒ ඔක්කොම අරගෙන ගිහින් බෙදන්න, වතුකරයේ ජනතාවට. ඔයගොල්ලෝ මාර ජරා වැඩක් කරන්නේ. ජරා ආණ්ඩුවක්. මේ පාර්ලිමේන්තුවට එනකොට ලැජ්ජයි. මම ඇතුළට එනකොට ඇත්තටම මට ලජ්ජා හිතුණා. මේක ඇතුළට එනකොට ලජ්ජා හිතුණා. ඒක ඔයගොල්ලන් කරන ජරා වැඩක්.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

කොච්චර ජරාද? Army එකේ සමහරුන්ට සපත්තු නැහැ; සෙරෙප්පු නැහැ. ඔවුන්ට ඉන්න තැනක් නැහැ. ඒගොල්ලන් පානුයි, පරිප්පුයි කන්නේ camp එකේ. හැබැයි, ඔබලා ඇවිල්ලා coats අරවා, මෙවා දාගෙන කොච්චර ලස්සනට වාහන, වත්කම් බැරකම් හොරට,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මේ ඉස්සරහා ඉන්නවා එක්කෙනෙක්, හොරට ගෙයක් ලියනවා, රුපියල් ලක්ෂ 50ට. ලියපු එක්කෙනා මාව වීඩියෝ කර කර ඉන්නවා, පිටිපස්සේ ඉඳන්. ඒ ඔප්පුවත් එහෙන් මෙහෙන් ගැහුවා, අනුරාධපුරේ. මට ඊට වඩා කියන්න දෙයක් නැහැ. හැබැයි, මම ඔයගොල්ලන්ට එකක් කියන්නම්. ඔයගොල්ලෝ දෙමළ සිංහල සමගිය ගැන කටින් කියන්නේ. අපි හදවතින් කියන්නේ; අපි හෘදය සාක්ෂියෙන් කියන්නේ. මාව එදා බේරා ගත්තේ සිංහල කොල්ලෙක්; සිංහල රණ විරුවෙක්. හැබැයි, ඔයගොල්ලෝ ඒ කට්ටියට කිව්වා, "සෙබළු" කියලා. කරුණාකරලා මේ අය වැයෙන් ලොකු ගණනක් වෙන් කරලා ඒ මිනිසුන්ට දෙන්න. ඒගොල්ලන් ඕනෑ වෙනකොට තමයි ඔයගොල්ලෝ සොයා බලන්නේ, ඒගොල්ලෝ ඉන්නවාද, නැද්ද කියලා. කුලියාපිටියේ pilot කෙනෙක් නැති වුණා. ඔයගොල්ලන්ගෙන් කී දෙනෙක් ඒගොල්ලන්ගේ ගෙවල්වලට ගියාද? ලජ්ජා වෙන්න ඕනෑ.

මම තව දෙයක් කියන්න කැමතියි. මෙහිදී මම කර්නල් බුද්ධිකව මතක් කරලා, එයා ඇතුළු කණ්ඩායමට ස්තුති කරනවා. අනෙක් අතට මම දැක්කා, Kuliyapitiya Hospital එකේ මම වාගේ MS කෙනෙක් doctorsලා පරක්කු වෙලා එනකොට, ඒගොල්ලන්ට ලියුමක් ගහපු සිද්ධියක්. ඔයගොල්ලන්ගේ සෞඛ්‍ය ඇමති දැන් මෙතැන ඉන්නවාද දන්නේ නැහැ. සෞඛ්‍ය ඇමති නේ ඊළඟ ජනාධිපතිතුමා. කුලියාපිටියේ MSව අයින් කරලා තිබෙනවා. අනේ කරුණාකරලා එහෙම වැඩ කරන්න එපා. කවුරු හරි එහෙම කොන්ද පණ තියාගෙන VOP එකක් ගහනවා නම් එයාව බේර ගන්න. නැත්නම් එයාත් පාර්ලිමේන්තුවට එයි. එයාත් පාර්ලිමේන්තුවට ඇවිත් විපක්ෂයේ වාඩි වෙලා ඉඳියි. කරුණාකරලා එහෙම කරන්න එපා, අයියේ. ඒක ගැන පොඩ්ඩක් බලන්න.

තව දෙයක් මට කියන්න තිබෙනවා. අර කැබ් එකේ සල්ලි මම දෙන්න කැමතියි. ඔයගොල්ලන්ට පුළුවන් නම් කියන්න. DS එක හරහා හෝ වතුකරයේ ජනතාවට මගේ කැබ් එකේ සල්ලි බෙදනවා නම්, මම ලියුමක් දෙන්නම්. හැබැයි, ඒ ඔක්කොම සල්ලි ටික බෙදන්න ඕනෑ, මිනිසුන්ගේ ගෙවල්වලට ලක්ෂ 10 ගණනේ. තමුන්නාන්සේලාගේ කැබ් එක මට එපා. මට දැන් කාර් එකත් නැහැ; bike එකකුත් නැහැ. මට මොකුත් නැහැ. හැබැයි, මම අද බස් එකේ යන්නේ Jaffnaවලට වැඩ කරන්න. තමුන්නාන්සේලා කවුරු හරි යනවාද කියන්නකෝ, බස් එකේ. ලජ්ජා වෙන්න ඕනෑ.

මම තව දෙයක් කියන්න කැමතියි. මම දන්නවා ඔබතුමිය කියන්න හදන දේ. මම වෙලාව බලාගෙන ඉන්නේ. ඒ නිසා ඔබතුමිය කාලය ඉවරයි කියලා කියන්න එපා. මම දන්නවා කාලය ඉවරයි කියලා.

මේ අය වැය විවාදය ඉවර වුණාට පස්සේ ඔයගොල්ලෝ කවුරු හරි උතුරට එනවා නම්, අපිට කියන්න. අපි දෙන්නම් support එකක්. ඕනෑ නම් මම මගේ ඩයස්පෝරාවෙන් සල්ලි ගෙනැල්ලා බෙදන්නම් උතුරටයි, නැගෙනහිරටයි. ඕනෑ නම් දකුණටත් බෙදන්නම්. මම දැන් හා කිව්වොත්, සල්ලි වැටෙනවා ඕනෑ තරම්. තමුන්නාන්සේලා නිකම් රටවලට ගිහින් හිඟා කනවා වගේ,- *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ වත්කම්, බැරකම් හොයා ගෙන,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මම අවසන් කරන්නම්. මට තත්පර දෙකක් දෙන්න.

තමුන්නාන්සේලාගේ වත්කම්, බැරකම් හොයා ගෙන බලා ගන්න. හැබැයි, පිටරට ඉඳන් සීතලේ හම්බ කරන මිනිස්සුන්ගේ සල්ලි අරගෙන රට හදනවා කියලා සල්ලි ගහගන්න එපා. ඕනෑ නම් කියන්න. මම ඩයස්පෝරාවෙන් සල්ලි අරගෙන, උතුරටයි, නැගෙනහිරටයි දෙන්නම් ඇති වෙන්න.

Thank you so much.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.07]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, யாழ். மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், முதலில் இந்த 'தித்வா' புயல் அனர்த்தத்தினால் உயிரிழந்த அனைத்து உறவுகளுக்கும் எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம், இந்த அனர்த்தின்போது மீட்புப் பணியில் களத்தில் இறங்கிச் செயற்பட்ட முப்படை உறுப்பினர்கள் சிலரும் அரச உத்தியோகத்தர்களும் தமது உயிர்களை இழந்துள்ளார்கள். அவர்களுக்கும் எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற யாழ். மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்கு வசிக்கின்ற குடும்பங்களின் மொத்த எண்ணிக்கை 213,391; அங்கத்தவர்களின் எண்ணிக்கை 634,904. இவர்களில் 16,918 குடும்பங்கள் - மொத்தச் சனத்தொகையில் 53,828 அங்கத்தவர்கள் - இந்த அனர்த்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இதன்போது துரிதமாகச் செயற்பட்ட எங்களுடைய அமைச்சர் அவர்களைப் பாராட்ட வேண்டும். அவருடைய வீடு கொழும்பில் இருந்தும், அங்கு சென்று தனது குடும்பத்தவருடன்கூட கதைக்காமல், தனக்கென ஓர் உடுப்பைக்கூட எடுத்து வராமல், வீதிகளில் காணப்பட்ட இடர்களின் மத்தியிலும் பாராளுமன்ற அமர்வு முடிவடைந்தவுடன் உடனடியாகவே அவர் எங்களுடன்

யாழ்ப்பாணத்துக்குப் புறப்பட்டு வந்தார். யாழ்ப்பாணத்தில் இரவு பகலாக அமைச்சருடன் சேர்ந்து பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்களும் பாதிக்கப்பட்ட மக்களுக்குத் தேவையான உதவிகளைச் செய்தோம். யாழ். மாவட்டத்தில் மொத்தமாக 59 இடைத்தங்கல் முகாம்களை உடனடியாக அமைத்தோம். இப்போது வரையில் 8 முகாம்களில் மக்கள் இருக்கின்றார்கள். பலர் யாழ்ப்பாணத்துக்கு அதிகமான நிதி ஒதுக்கப்பட்டுள்ளதாகக் கூறுகின்றார்கள். ஆனால், நாங்கள் ஒன்றைக் கூறுகின்றோம், மாண்புமிகு சனாதிபதி அவர்கள் அனைத்துப் பிரதேசங்களுக்கும் சம அளவிலான நிதிகளை ஒதுக்கியிருக்கின்றார். யாழ். மாவட்டத்தில் 8.48 சதவீதமான மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்.

கிளிநொச்சி பிரதேசம் 135,000 மக்கள் தொகையைக் கொண்டுள்ளது. அங்கே 50,752 குடும்பங்கள் இருக்கின்றன. அதில் 8,778 குடும்பங்களைச் சேர்ந்த 28,093 நபர்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அது அங்கிருக்கும் சனத்தொகையில் 20.8 சதவீதமாகும். அந்த வகையில், அனைத்துப் பிரதேசங்களிலுமுள்ள மக்களையும் ஒரேமாதிரியாகவே, இந்த நாட்டின் தலைவர்கள் பார்க்கின்றார்கள். அதற்காக நாங்கள் அவர்களை வாழ்த்த வேண்டும். உண்மையாகவே நாட்டின் தலைவரான மாண்புமிகு சனாதிபதி அவர்கள் அன்றைய தினம் காலையில் பாராளுமன்றுக்கு வருகைதந்து, எங்களுக்கு உத்வேகம் அளித்ததன் நிமித்தமாகத்தான் அந்தந்தப் பிரதேசங்களுக்குச் சென்று பணியாற்றக்கூடிய தற்றுணிபு எங்களுக்கு ஏற்பட்டிருந்தது. மாண்புமிகு சனாதிபதி அவர்கள் மூன்றுவேளை உணவை மக்களுக்கு உடனடியாக விநியோகிக்கும்படி உத்தரவிட்டிருந்தார். ஏனென்றால், முன்னைய காலத்தில் இயற்றப்பட்ட சட்டங்களின்படிதான் அரச கட்டமைப்புகள், அரச இயந்திரம் இயங்க வேண்டியிருந்தது. அந்தச் சட்டங்கள் காரணமாக ஒரு சில பொருட்களை உடனடியாகக் கொள்வனவு செய்ய முடியாது. அந்த வகையில், கிளிநொச்சியில் சமைப்பதற்கு விறகு இல்லாமல் இருந்த நிலையில், அந்த மாவட்ட அரசாங்க அதிபரிடம் “சமைப்பதற்கு உடனடியாக gas cylinderஐ வாங்கிக் கொடுங்கள்” என்று கூறியிருந்தோம். அப்போது சில அதிகாரிகள், உடனடியாக gas cylinderஐ வாங்க முடியாது” எனக் கூறினார்கள். “இல்லை, வாங்கிக் கொடுங்கள்! பிறகு பார்ப்போம், அல்லது ஏதாவது வழியில் அதற்கான பணத்தைத் தருகிறோம்” என்று நாங்கள் சொல்லி, அதற்கான நடவடிக்கையை அமைச்சரினூடாகச் செய்திருந்தோம்.

இன்று பலர் விமர்சனங்களைச் செய்கிறார்கள். அவ்வாறு விமர்சனம் செய்பவர்களுக்கு நாங்கள் ஒன்றைக் கூறுகின்றோம். அதாவது, எமது நாட்டின் சனாதிபதி அவர்கள் நாங்கள்கூட நினைக்காத ஒன்றைக் கவனத்திலெடுத்து, பாதிக்கப்பட்ட மாணவர்களுக்கும் 25,000 ரூபாய் கொடுக்க வேண்டுமென்று கூறியிருந்தார். அதுபோன்று உண்மையாகவே முப்படை வீரர்களும் இன, மத பேதமின்றி செயற்பட்டதோடு, எதிர்க்கட்சி உறுப்பினர்களைக்கூட காப்பாற்றியிருக்கிறார்கள். உயிரிழந்தவர்களை நினைவுகூர யாழ்ப்பாணத்துக்கு வந்த உறுப்பினர் ஒருவர், கொழும்பில் இருக்கும் அவரது குடும்பம், அவரது வீடு மழை வெள்ளத்தால் பாதிக்கப்படும் என்பதற்காக அந்த மக்களைக் கைவிட்டுவிட்டு அந்த மழையிலும் திரும்பிக் கொழும்புக்கு வந்து, புலம்பெயர் தேசக் காசில் வாங்கிய அதிசொகுசு வீட்டின் மாடியில் நிம்மதியாக இருந்ததை நான் video ஊடாகப் பார்த்தேன். அவர் அந்த மாடி வீட்டில் இருப்பதையிட்டுப் புலம்பெயர் தேச உறவுகளுக்குத்தான் அவர் நன்றி சொல்ல வேண்டும். நான் நினைக்கிறேன், இந்தப் பாராளுமன்ற உறுப்பினர் பதவி இல்லையென்றால் அவர் மாடி வீட்டில் இருந்திருக்க மாட்டாரென்று. அவர் Chavakachcheri Base Hospital பிரச்சினையை மையமாக வைத்துப் பாராளுமன்றம் வந்தவர். ஆனால், அவரால் இன்றுவரை அந்த மக்களுக்கு எந்த உதவியும் செல்லவில்லை. அவ்வாறான ஒருவர்தான் சொல்கிறார், “யாழ்ப்பாணத்தில் எந்தவிதப் பாதிப்பும் இல்லை” என்று. யாழ்ப்பாண மக்களின் வாக்குகளைப் பெற்று இங்கே வந்த அவர், இப்போது அவர்களைத் தூற்றித் திரிகிறார்; கேவலப்படுத்துகிறார். இது எதிர்க்கட்சிகளின் சூழச்சியோ அல்லது agendaவோ தெரியவில்லை. அவர் அதை எதிர்வரும் காலத்தில் வெகுவிரைவில் உணருவார்.

அதேநேரம், நாங்கள் பக்கபலமில்லாது இருந்தபோது கௌரவ அமைச்சர் எங்களுக்கு உதவியாக இருந்தார். அவரை நாங்கள் வாழ்த்த வேண்டும். உண்மையாகவே, அவர் மலையகத்துக்குச் சென்று சேவைசெய்ய வேண்டியவர். அங்கு சென்று சேவை செய்யும்போது அவருக்கு இன்னும் உத்வேகம் ஏற்படும். ஏனென்றால், அங்கு அவரது classmates இருப்பார்கள், நண்பர்கள் இருப்பார்கள். அவர்களின் உதவிகள் அவருக்குக் கிடைத்திருக்கும். அந்த வகையில், நாங்கள் கௌரவ அமைச்சர் அவர்களைக் கடவுளாகவும், அதேநேரம் அவரை ஓர் அப்பா ஸ்தானத்திலும் நினைக்கின்றோம். யாழ்ப்பாண மக்கள்மீது அவர் கொண்டிருக்கின்ற தனிப்பிட்ட அபிப்பிராயத்தை வைத்து, அவர் அண்மையில் அங்கே சென்றிருந்தார். ஆனால், ஒரு சிலர் அரசியல் நோக்கத்துக்காக, அவர் அணிந்திருந்த உடையை வைத்துக் கேலி செய்கிறார்கள். ஓர் உடுப்புக்கூட எடுத்துவராமல் அங்கு வந்திருந்த அவர், அங்கு கிடைத்த உடுப்புகளைத்தான் அணிந்துகொண்டு திரிந்தார்.

அதுபோல், புலம்பெயர் தேசத்தில் இருந்துகூட பலர் உணவுப் பொதிகளை எமது கட்சிக் காரியாலயத்தில் தந்திருக்கின்றார்கள். நாங்கள் அந்த உணவுப் பொதியில் ஒன்றைக்கூட கட்சிக் காரியாலத்தில் மீதம் வைக்காமல் அவற்றை மக்களுக்கு விநியோகித்திருந்தோம். நான் அவற்றை வழங்கும்போது எங்களுடைய சக உறுப்பினருக்குச் சொன்னேன், "எங்களுடைய கட்சிக் காரியாலயத்துக்குத்தான் நிவாரணம் தரவேண்டும் என நான் நினைக்கின்றேன்" என்று. ஏனென்றால், நாங்கள் சாப்பிடுவதற்குக்கூட எங்கள் கட்சிக் காரியாலயத்தில் உணவுப் பொருட்கள் இருக்கவில்லை. நாங்கள் மக்களின் பணத்தில் ஒரு சதத்தையேனும் வீண் விரயம் செய்யவில்லை. மக்களுக்கென்று வந்த நிதியை மக்களுக்கே கொடுத்தோம்! புலம்பெயர் தேசத்தில் இருந்து பலர் நிதியை அனுப்பியிருக்கிறார்கள். அதைக்கூட எமது கட்சிக்காகப் பெறவில்லை. மாண்புமிகு சனாதிபதி அவர்களின் பணிப்பின்பேரில் அரச திணைக்களத்தில் ஒரு கட்டமைப்பை உருவாக்கித் துரிதமாக அந்த நிதியை அரச திணைக்களத்திடம் ஒப்படைக்க நடவடிக்கை எடுக்கப்பட்டிருக்கிறது. அந்த வகையில், மாண்புமிகு சனாதிபதி அவர்களை வாழ்த்துகின்றோம். நீங்களாக இருந்தால், அவற்றை உங்களுடைய தனிப்பட்ட accountஇல் போட்டிருப்பீர்கள்! அந்த வகையில், இந்த அனர்த்த நேரத்தில் மக்களின் பணத்தைத் திருடாத அரசாங்கம் இது என்பதை இவ்விடத்தில் நான் உறுதியாகக் கூறி, சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி தெரிவித்து, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.14]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දින අය වැය පිළිබඳව කරනු ලබන කථාවට අමතරව අද රටේ පවතින ව්‍යසනය පිළිබඳවත් කථා කරන්න ඕනෑ. අද පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලා විශාල වශයෙන් මේ පිළිබඳව කථා කළා. "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ජල ගැලීම් සහ නායයෑම් නිසා මේ රටේ ලක්ෂ පහළොවකට අධික අපේම ජනතාවක් මේ වනවිට පීඩාවට පත්වෙලා සිටිනවා. දහසකට අධික ප්‍රමාණයක් මිය ගිහිල්ලා තිබෙනවා. නිවාස 4,000කට වැඩි ප්‍රමාණයකට පූර්ණ හානි, අර්ධ හානි වෙලා තිබෙනවා. විශාල ව්‍යසනයක් ඇති වෙලා තිබෙන මොහොතක්, මේක. මම මේ අවස්ථාවේ දී ඒ සියලු පවුල්වලට මගේ කනගාටුව හා මිය ගිය අය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි දන්නවා පසුගිය මාසයේ 20වැනි දා පැවැති වර්ෂාව නිසා විශාල වශයෙන් හානි සිදු වුණු බව. ඊට පසුව 27, 28වැනි දා වාගේ දිනවල පැවති අධික වර්ෂාවත්, සුළි කුණාටු තත්ත්වයත් මත විශාල පිරිසක් මේ ව්‍යසනයට මුහුණ දුන්නා. ඒ අවස්ථාවේ දී මේ රටේ ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය නිලධාරින්, පොලීසිය වාගේම අනෙකුත් සියලු දෙනා එකතු වෙලා මේ අයගේ ජීවිත ගලවා ගෙන දේපොළ ආරක්ෂා කර දීම සඳහා විශාල වෙහෙස මහන්සියක් ගත්තා, අපි දැක්කා. ඒ කැපකිරීම අපි මේ අවස්ථාවේ දී අගය කරන්නට ඕනෑ. ඒ වාගේම තමයි මේ පාර්ලිමේන්තුවේත් පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් ඒ වෙනුවෙන් විශාල වෙහෙස මහන්සියක් ගත්තා; තමන්ගේ ප්‍රදේශවල සිටින, ව්‍යසනයට ලක් වෙච්ච අය වෙනුවෙන් කටයුතු කළා. අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා පසුගිය කාලය පුරාම ඒ ව්‍යසනයට පත් වූ අය අතරට ගිහිල්ලා, ඒ අය වෙනුවෙන් විපක්ෂයක් විධියට කරන්න පුළුවන් හැම දෙයක්ම කළා. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් අපේ ආසන සංවිධායකවරු, පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු දැනුවත් කරලා, ඒ ජනතාවට උපරිමයෙන් සේවයක් ඉටු කිරීම සඳහා විපක්ෂයක් වශයෙන් කටයුතු කරලා, විශාල වැඩ කොටසක් ඉටු කළා. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට අපි මේ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

විපක්ෂයට, ආණ්ඩු පක්ෂයෙන් විවිධ දේවල් කිව්වා කියලා අපි දන්නවා. විවිධ දේවල් කථා කළා. අද මේ රටේ ව්‍යසනයක් ඇති වෙලා තිබෙන අවස්ථාවේ විපක්ෂය වශයෙන් අපි මූලිකත්වය අරගෙන ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර තිබෙනවා. අපි ගම්වලට යනකොට, සමහර ස්ථානවලට ආණ්ඩු පක්ෂයේ කිසි කෙනෙක් ඇවිල්ලා නැහැ. ග්‍රාම නිලධාරිතුමා, සංවර්ධන නිලධාරි මහත්මිය හෝ මහත්මයා, ප්‍රාදේශීය ලේකම්තුමා ඇවිල්ලා තිබුණා. ඒ වාගේ අවස්ථාවක දී විපක්ෂයේ මැදිහත්වීම විශාල වශයෙන් දකින්නට ලැබුණා.

අද ඔබතුමන්ලා ප්‍රධාන මාධ්‍ය නාළිකා කිහිපයක් අල්ලා ගෙන මාධ්‍යයට මඩ ගහමින් යනවා. එතුමන්ලාත් විශාල කර්තව්‍යයක් කළා. මාධ්‍ය තුළින් මේ ගැන දැනුවත් කළා. විශේෂයෙන් "සිරස", "හිරු", "දෙරණ" නාළිකාවලින් කළ දැනුවත් කිරීම තුළින් ජීවිත සහ දේපොළ විශාල ප්‍රමාණයක් ආරක්ෂා කර ගැනීමට අවස්ථාව ලැබුණා. ඒ අයගේ නාළිකා මඟින් ප්‍රචාරය කරලා විශාල භාණ්ඩ ප්‍රමාණයක් ඒක රාශි කරලා අවතැන් වූ ජනතාව වෙනුවෙන් බෙදා හරිනවා අපි දැක්කා. ඒක මේ රටේ ජනමාධ්‍ය තුළ අපි අගය කළ යුතු දෙයක්. මේ අවස්ථාවේ දී අපි ඒ අයට දෝෂාරෝපණය කරනවාට වඩා ඒ අය අගය කළ යුතුයි. යම් යම් ප්‍රශ්න හා ගැටලු තිබෙන්න පුළුවන්. දිලිත් ජයවීර මැතිතුමාත් මේ රටේ අවතැන් වූ අය වෙනුවෙන් නිවාස හදා දෙන්න, විශාල වැඩ කොටසක් කරන්න පොරොන්දු වෙලා තිබෙනවා අපි දැක්කා. එතුමා ගිහිල්ලා කථා කළා. ඒ තත්ත්වය තේරුම් අරගෙන තමයි අපි කථා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න, රක්වාන, වැලිගෙපොල, බලන්ගොඩ, නිවිතිගල වාගේ ආසන ජල ගැලීම්වලට ලක් වෙලා අද විශාල පිරිසක් අවතැන් වෙලා සිටිනවා.

ඒ වාගේම කඳු නාය යෑමට ලක් වෙලා තිබෙනවා. නාය යෑමේ අවදානමක් සහිත කඳු විශාල ප්‍රමාණයක් හඳුනා ගෙන තිබෙනවා. එම ප්‍රදේශවල ජීවත් වන අය ඉවත් කරලා තිබෙනවා. ඒ අය මේ වෙනකොට පාසල්වල, පන්සල්වල, එහෙම නැත්නම් වෙනත් ස්ථානවල රඳවා තිබෙනවා. නමුත්, මේ වනතුරු ඒ අය වෙනුවෙන් රජය ආධාර ලබා දීම සිදු කරලා නැහැ කියලා මම කියන්න ඕනෑ. මම සිටින ප්‍රදේශයේම පුපුලකැටිය කියන ග්‍රාම නිලධාරි වසමේ කැලිකන්ද කියන ගමේ පවුල් 16ක් අවතැන් වෙලා ඉන්නවා. ඒ අය ඉන්නේ වෙන වෙන ස්ථානවල; පන්සලේ, එහෙම නැත්නම් ඥාති නිවාසවල. මේ වෙනකොට ඒ අයට ලබා දීලා තිබෙන්නේ සතියකට රුපියල් 3,100ක් පමණයි. නොවැම්බර් 22වැනි දා තමයි ඒ අය පදිංචි ප්‍රදේශය නාය යෑමට ලක් වුණේ. සති දෙකකටම ඒ මුදල් ප්‍රමාණය -රුපියල් 3,100ක්- තමයි ලැබිලා තිබෙන්නේ. ඉතින්, ඒ අයට අවශ්‍ය ආහාර ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දෙනවා වාගේම ඒ අයට සුදුසු ස්ථානයක නිවසක් ලබා දීම සඳහාත් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

සූරියකන්ද, අලුත්කැල්ල ප්‍රදේශයට අපි ගියා. ඒ ප්‍රදේශයේ අවතැන් වෙලා සිටින අයට පර්චස් 7යි ලැබී තිබෙන්නේ. අවුරුදු 20කට ඉස්සෙල්ලා නාය යෑමට ලක් වුණු අවස්ථාවේ ඔවුන් එම ස්ථානවලින් ඉවත් වුණත්, හැම අවුරුද්දකම ඉන්නේ ඒ පාසලේ. පර්චස් 7ක් වාගේ ඉතා සුළු ප්‍රමාණයක් තමයි ඔවුන්ට වෙන් කරලා තිබෙන්නේ. හිස් ඉඩම් විශාල ප්‍රමාණයක් වතුකරයේ තිබෙනවා. ඒ අයට පර්චස් 7ක් වාගේ ප්‍රමාණයක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අඩුම තරමේ පර්චස් 15ක් හෝ 20ක් වෙන් කරලා, ඒ අයට නිවසක් සාදා ගන්න අවස්ථාව සලසා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ඒ අයට නිවාස හදා ගන්න අවශ්‍ය කටයුතු මේ වෙනකොට සකස් කර දිය යුතුයි. මොකද, වැස්සක් එනකොට හැමදාම ඒ අය පාසලට යනවා, එහෙම නැත්නම් පන්සලට යනවා. නැවත පායනකොට -දින 7ක් යනකොට- ඒක අමතකයි. යළිත් මේ වාගේ තත්ත්වයක් උදා වුණාම නැවත ඒ ස්ථානවලට යනවා. ඉතින්, ඒ තත්ත්වය තුළ ඒ අයට පදිංචියට සුදුසු ඉඩම් හොයා දීලා ඒ අයව පදිංචි කරවලා, වැඩි ඉඩක් නොමැති තැන්වල නම් අඩුම තරමේ මහල් නිවාස හෝ සකස් කරලා ඒ අයට අවශ්‍ය පහසුකම් සලස්වා දෙන්න කියලා මම මේ අවස්ථාවේදී ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි දැක්කා, ආධාර ලබා දීමේදී අර්ධ හානි වූ නිවාසවලට ලබා දෙන්නේ රුපියල් 10,000යි, එහෙම නැත්නම් රුපියල් 15,000යි, රුපියල් 20,000යි. එහෙම මුදලකින් අඩු ගණනේ ෂීට් 4ක්, 5ක්වත් මිලදී ගන්න බැහැ. අවදානමට ලක්වෙලා විනාශ වුණු; අර්ධ හානියට ලක් වුණු නිවාසවල අයට උපරිම මුදලක් ලබා දීම සඳහා කටයුතු කරන්න. නිවසක් ඉදිකිරීමට රුපියල් ලක්ෂ 25ක් ප්‍රමාණවත්. ඒ වාගේම අර්ධ හානි වුණු නිවාසවල ඇති වී තිබෙන තත්ත්වය නිසා ඒ මුදලට වඩා වැඩි මුදලක් වෙන් කර දෙන්න කටයුතු කරන්න කියා ඉල්ලා සිටිනවා. මේ ව්‍යසනය නිසා ජීවිත හානි වුණු සියලුදෙනාගේ පවුල්වලටත්, ඒ වාගේම දේපළ හා උන් හිටි තැන් අහිමි වුණු සියලුදෙනා වෙනුවෙනුත් මේ අවස්ථාවේදි නැවත වතාවක් අපේ කනගාටුව

හා ශෝකය ප්‍රකාශ කරනවා. මට කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.22]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, 'தித்வா' புயல் காரணமாக உயிர்நீத்த அனைவரினது குடும்பத்தினருக்கும் இந்த நேரத்தில் எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்தப் புயலால் மட்டக்களப்பு மாவட்டத்தில் கிட்டத்தட்ட 12,469 குடும்பங்களும் 37,389 தனிநபர்களும் பாதிக்கப்பட்டுள்ளனர். நாங்கள் அவர்களைப் பாதுகாப்பதற்கான முன்னெச்சரிக்கை ஏற்பாடுகளை மேற்கொண்டு இருந்தோம். மட்டக்களப்பு மாவட்டத்தின் 14 பிரதேச செயலாளர் பிரிவுகளிலும் வெள்ளப் பாதிப்புக்கள் ஏற்பட்டிருக்கின்றன. ஏறாவூர்பற்று பிரதேச செயலாளர் பிரிவுக்கு உட்பட்ட பிரதேசங்களிலுள்ள 64 குடும்பங்களை 8 இடைத்தங்கல் முகாம்களில் தங்கவைத்திருக்கிறோம். அதேபோல், வாழைச்சேனைப் பிரதேசத்தில் 2 இடைத்தங்கல் முகாம்களில் 235 குடும்பங்களையும் கோறளைப்பற்று மேற்கில் ஓர் இடைத்தங்கல் முகாமில் 179 குடும்பங்களையும் கிரான் - கோறளைப்பற்று தெற்கு பிரதேச செயலாளர் பிரிவில் 4 இடைத்தங்கல் முகாம்களில் 107 குடும்பங்களையும் வாகரை பிரதேச செயலாளர் பிரிவில் ஓர் இடைத்தங்கல் முகாமில் 20 பேரையும் நாங்கள் தங்கவைத்திருக்கிறோம். மேலும், கிழக்குப் பல்கலைக்கழகத்தில் தங்கியிருந்த மாணவர்களுக்கு உணவைப் பெற்றுக்கொள்ள முடியாத ஒரு நிலைமை ஏற்பட்டது. அப்போது நாங்கள் அரசாங்கம் என்ற ரீதியில் அவர்களுக்கான உணவைப் பெற்றுக்கொடுப்பதற்கான வசதிகளை ஏற்படுத்திக் கொடுத்தோம்.

இந்தப் புயலால் பாரிய அனர்த்தம் ஏற்பட்டு இருக்கின்றது. குறிப்பாக, மண்சரிவு காரணமாக மலையகப் பகுதியில் கூடுதலான மக்கள் உயிர்நீத்து இருக்கிறார்கள். நாங்கள் அரசாங்கம் என்ற வகையில், அவர்களைப் பாதுகாப்பதற்கான முன்னெச்சரிக்கை ஏற்பாடுகளைச் செய்திருந்தோம். அதன் காரணமாகத்தான் மிகக் குறைந்தளவான இறப்புகள் பதிவுசெய்யப்பட்டு இருக்கின்றன. இதுதவிர, மக்களுக்கான அவசர தேவைகளை நிறைவேற்றுவதற்குத் தேவையான நிதியையும் விடுவித்து இருக்கிறோம். இந்த அரசாங்கத்தின் காலப்பகுதியில்தான் அனர்த்த நிவாரணத்துக்கென அதிகளவு நிதி விடுவிப்புச் செய்யப்பட்டு இருக்கிறது. பாதிக்கப்பட்டவர்களுக்குத் தேவையானவற்றை உடனடியாகப் பெற்றுக்கொடுப்பதற்காக பிரதேச செயலகங்களுக்கு தலா ஐந்து இலட்சம் ரூபாய் முற்கொடுப்பனவு வழங்கப்பட்டு இருக்கிறது. அதேபோல், உடனடியாகச் செலவழிப்பதற்காக கிராம உத்தியோகத்தர்களுக்கு தலா 50,000 ரூபாய் முற்கொடுப்பனவு வழங்கப்பட்டு இருக்கிறது.

இவ்வாறு மிகக் குறுகிய காலத்துக்குள் அனர்த்த நிவாரணங்களை மேற்கொள்வதற்குத் தேவையான நிதியை அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் வழங்கியிருக்கிறோம். அதனூடாக அவர்கள் இலகுவாக அந்த விடயங்களை மேற்கொள்ளக்கூடியதாக இருக்கிறது. அவர்கள் அந்தச் செலவுகளை மேற்கொண்டதன் பின்னர் குறித்த Billsஐச் சமர்ப்பித்து கணக்குகளைச் சரிபார்த்துக் கொள்ளலாம். இவ்வாறு அனர்த்த நிவாரண செயற்பாடுகளை இலகுபடுத்தும் விதமாக சுற்றுநிருபங்களையும் மாற்றியமைத்து இருக்கிறோம்.

இந்த அனர்த்தம் இடம்பெறுவதற்கு முன்னரே, மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்றத்தில் ஒரு கூட்டத்தைக் கூட்டி எங்களுடன் பேசினார். அப்போது அவர், மக்களைப் பாதுகாக்கின்ற விடயத்தில் எந்தவிதத் தடங்கலையும் ஏற்படுத்த வேண்டாமென்றும், அதற்குத் தேவையான நிதியைத் தான் வழங்குவதாகவும், உடனடியாகச் சென்று மக்களைக் காப்பாற்றுவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளுமாறும் கூறினார். அந்த நேரத்தில் பல இன்னல்களுக்கு மத்தியில்தான் நான் மட்டக்களப்புக்குச் சென்றேன். அதற்கு முன்னர், கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்கள் உடனடியாக அங்கு விரைந்து சென்று, அதிகாரிகளுக்கு ஆலோசனைகளை வழங்கி, சில கட்டுப்பாடுகளை விதித்து, வெள்ள அனர்த்தத்தின் தாக்கத்தைக் குறைத்து, அதிலிருந்து மட்டக்களப்பு மாவட்ட மக்களைப் பாதுகாப்பதற்கான முயற்சிகளை மேற்கொண்டிருந்தார். அவர் அங்கு 3-4 நாட்கள் தங்கிநின்று, வருகின்ற பிரச்சினைகளை உடனடியாகத் தீர்ப்பதற்கான ஆலோசனைகளை அரச அதிகாரிகளுக்கு வழங்கி, அனர்த்தத்தின் பாதிப்பிலிருந்து எங்களுடைய மக்களைப் பாதுகாத்தார். அதற்காக அவருக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த காலத்தில் வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது சில அரசியல்வாதிகள் தாங்களாகவே முன்வந்து மக்களுக்கு noodles packets வழங்கியதாகவும், அதற்குக் கோடிக் கணக்கான ரூபாய் செலவழிந்ததாகவும் கூறி, இப்போது அதற்கான கணக்குகளைக் காட்டிக்கொண்டு இருக்கிறார்கள். அவர் கோடிக்கணக்கான ரூபாயைச் செலவழித்தது, வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்காக அல்ல! மாறாக, கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில் மஞ்சள் நிறத்திலான அந்தப் packetsஐ வழங்குவதற்குத்தான் அதனைச் செலவழித்திருந்தார். அதற்காகச் செலவழித்த நிதியை இப்போது மக்களுக்குச் செலவழித்ததாகக் குறிப்பிட்டு பெற்றுகொள்ள முயற்சி செய்கின்றாரா என்று தெரியவில்லை! மக்கள் அவரிடம் உதவிகளைப் பெறும்போது கொஞ்சம் அவதானமாக இருப்பது நல்லது. ஏனெனில், அவர் இன்னுமொரு சந்தர்ப்பத்தில் அதற்கான நிதியைக் கேட்பாரோ தெரியாது. அதிலிருந்தும் மக்களைப் பாதுகாத்துக் கொள்ளவேண்டிய தேவை இருக்கின்றது.

அனர்த்தத்தால் ஏற்படுகின்ற இறப்புக்களை நாங்கள் படுகொலையாகச் சித்தரிக்க முடியாது. இந்த அனர்த்தம் இலங்கையில் மாத்திரமல்ல, தாய்லாந்து உட்பட ஆசியா கண்டத்திலுள்ள பல நாடுகளிலும் இடம்பெற்றிருக்கிறது. அங்கும் பலர் இறந்திருக்கிறார்கள். இதற்கு முன்னர் இடம்பெற்ற அனர்த்தங்களிலும் நாங்கள் உயிரிழப்புகளைச் சந்தித்திருக்கிறோம். அதை நாங்கள் படுகொலையெனக் கூற முடியாது. படுகொலைக்கான அர்த்தத்தைப் புரியாமல் அவர் இந்தக் கருத்தை முன்வைத்தாரோ தெரியவில்லை. அவர் எனது நண்பர்.

[ගරු කන්දසාමි ප්‍රභු මහතා]

அவர் தனது கருத்தைத் திருத்திக்கொண்டு, தனது அரசியல் பயணத்தை முன்னெடுப்பாரென எதிர்பார்க்கின்றேன். அவரைப் பற்றி மட்டக்களப்பு மக்களுக்கு நன்கு தெரியும். அவர் நல்லதொரு விடயத்தைத் தவறான புரிதலுடன் வெளிப்படுத்தி இருக்கிறார். கட்சி என்ற ரீதியில், அவருடைய செயற்பாடு அரசாங்கத்தை வீழ்த்துவதற்காக இருக்கலாம். சில நேரம் அவர் தனது பழைய நண்பர்களோடு இணைந்துகொண்டு இந்த அரசாங்கத்தை தோற்கடித்து, மீண்டும் அரசியல் இலாபம் தேடும் நோக்கில் செயற்படுகின்றாரோ தெரியவில்லை. அவர் வட மாகாணத்தைச் சேர்ந்த ஒருவரைக் கூட்டிக்கொண்டு, இப்பொழுது ஊர்வலம் வந்துகொண்டு இருக்கிறார். நல்லது! மக்களின் பிரச்சினைகளைக் கண்டறிந்து, அதற்கான தீர்வுகளைப் பெற்றுக் கொடுங்கள்! இந்த அரசாங்கத்தைத் தாண்டி, நீங்கள் இன்னுமோர் அரசாங்கத்தின் செயற்பாடுகளின் ஊடாக எங்களைக் கட்டுப்படுத்த முடியாது. நாங்கள் நீதியாகவும் நேர்மையாகவும் நடக்கின்றோம். எங்களுடைய அரசாங்கமானது, வெளிநாடுகளிலிருந்து கிடைக்கப் பெறுகின்ற அத்தனை உதவிகளையும் நேரடியாக மக்களிடம் கொண்டுபோய்ச் சேர்க்கின்றது. ஊழல், மோசடிகள் அற்ற விதத்தில் அனைத்து விடயங்களிலும் நேரடியாகச் செயற்படுகின்ற ஓர் அரசாங்கமாக எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் இருக்கின்றதெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු දැන් කරුණු දැක්වූවා, මේ ආපදාවෙන් පීඩාවට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් ගෙවන මුදල් සම්බන්ධව. ඒ පිළිබඳව යම් නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මොකද, ඒ කියපු කාරණය සම්පූර්ණයෙන් අසත්‍යයි. සාමාන්‍යයෙන් අපි ගෙවන්නේ අර්ධ හානි, එහෙම නැත්නම් පූර්ණ හානි වුණු නිවාසවලට. ජලයෙන් යට වුණු ඒවාට රුපියල් 10,000යි. නමුත් රුපියල් 25,000ක් ගෙවන්නේ මූලිකව ගිහිල්ලා සුද්ධ පවිත්‍ර කරගන්න. ඊට පස්සේ නිවාස පූර්ණ/අර්ධ හානි වුණු අයවලුන්ට ඇස්තමේන්තු කරලා රුපියල් ලක්ෂ 25ක් දක්වා උපරිමයකට යටත්ව ගෙවීම් කරනවා. ඒ නිසා ජනතාවට වැරදි අවබෝධයක් ලබා දෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.30]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ප්‍රථමයෙන්ම මම මගේ කනගාටුව, ශෝකය පළ කර සිටිනවා, මේ ව්‍යසනයෙන් ජීවිත අහිමි වෙච්ච සියලුදෙනාගේ පවුල්වලට, ඒ වාගේම දේපළ අහිමි වෙච්ච, රෝගාතුර වෙලා සිටින අපේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන්. ඒ වාගේම කතෝලිකයෙකු හැටියට මා මේ නිසා ජීවිත අහිමි වෙච්ච අයට මොක් සුව ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී අපි දැක්කා, ශ්‍රී ලාංකීය ජනතාව ගෞරවනීය, ඉතාම සුන්දර ජනතාවක් බව. විශේෂයෙන්ම ඔවුන්ගේ හදවත් උණු වෙලා තමන්ට තිබෙන දේ මේ අහිංසක, නැති බැරි මිනිස්සු වෙනුවෙන් බෙදාගත්තා. ඒ වාගේම අපි දැක්කා, අපේ අසල්වැසි රටවලින් ද අපට ඒ වාගේම සහයෝගයක් ලබා දීපු ආකාරය. මම ස්තුතිවන්ත වනවා, ඒ සියලු රටවලින් ලබා දුන් සහයෝගයට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ව්‍යසනය නිසා අපේ රටේ සිටි දසදහස් ගණනකගේ ජීවිත අහිමි වුණා. ඒකේ වගකීම වර්තමාන රජය භාර ගත යුතුයි. ඒ වාගේම මේ වෙච්ච ව්‍යසනයෙන් දසදහස් ගණනකගේ දේපළ අහිමි වුණා. ඒ වගකීමත් වර්තමාන රජය භාර ගත යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ ව්‍යසනයේ සම්පූර්ණ වගකීම මේ රජය භාර ගත යුතුයි. ඇයි මම එහෙම කියන්නේ? අදාළ අංශවලින් මේ සම්බන්ධව දිගින් දිගටම සාක්ෂි සහිතව අනතුරු ඇඟවීම් කළා, දැනුවත් කළා, ආණ්ඩුවට ඕනෑ තරම් තොරතුරු ලබා දුන්නා. හැබැයි ආණ්ඩුව අපොහොසත් වුණා, මේ මහා පාරිසරික විනාශය සහ ජීවිත විනාශය අවම කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම මේ ව්‍යසනය වුණාට පස්සේ ආණ්ඩුවට බැරි වුණා, මේ දේවල් හරියට කළමනාකරණය කරගන්න. අපි දැක්කා, ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ග්‍රාම නිලධාරිගේ රාජකාරිය කරන්න යන අකාරය, දිසාපතිගේ රාජකාරිය කරන්න යන ආකාරය, ප්‍රාදේශීය ලේකම්ගේ රාජකාරිය කරන්න යන ආකාරය. බූරුවාගේ වැඩේ බල්ලා කරනවා වාගේ මේක අනාගෙන, හාගෙන ඇඟේ ගා ගත්තා. මේ අයට වැඩේ හරියට කරගන්න බැරි වුණා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ අය උත්සාහ ගත්තේ පැලවත්තේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්නයි. ඒ විතරක් නොවෙයි. මේ ආපදාව පිළිබඳව පූර්ණ දැනුවත්කමක් තියෙද්දී මේ දේවල් හරියට කළමනාකරණය කළේ නැහැ. ඒ වාගේම මේ ආපදාවෙන් පස්සේ ජනතාවට වෙන්න ඕනෑ සේවය ලබා දීම සඳහා රජය ගන්නා වූ ක්‍රියාමාර්ගවල දැවැන්ත අඩුපාඩු ගණනාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. විශේෂයෙන්ම අපි මේ කාරණය කියන්න කැමැතියි. Sri Lanka Disaster Management Act, No 13 of 2005 තිබෙනවා. අපට මතකයි, 2004 වසරේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න හිටියේ. ඊට පස්සේ 2005දී මහින්ද රාජපක්ෂ මහත්මයා ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

The National Disaster Management Plan was not activated on 27th November. Instead, Friday, 28th November, the most crucial day for the operations, was

declared a public holiday. පසුගිය නොවැම්බර් 28වැනි දා ඉතා වැදගත් දවසක්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මේ දවස නිවාඩු දිනයක් බවට පත් කළා. මේ වාගේ ව්‍යසනයක් වුණාම විශේෂයෙන්ම රාජ්‍ය සේවකයින්, රාජ්‍ය අංශ වැඩ කරන්න ඕනෑ. හැබැයි, මොකක්ද මේ අය කළේ? මේ දිනය නිවාඩු දිනයක් බවට පත් කළා. ඒ විතරක් නොවෙයි, under Sections 11 and 12 of the Sri Lanka Disaster Management Act, No. 13 of 2005, the President has the power to declare a state of disaster. The President failed to do so. The Sri Lanka Disaster Management Act was never put into operation.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ විධියට සිදු වුණු ව්‍යසනය කළමනාකරණය කර ගැනීමේ දැඩි දුර්වලතාවක් එක පැත්තකින් අපි දැක්කා. ඒ විතරක් නොවෙයි, Sri Lanka Disaster Management Act එකට අමතරව අපේ රටේ National Disaster Management Plan - 2023-2030 තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ plan එකේ පිටු 140කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව ආණ්ඩුව කටයුතු කළා නම් මේ ප්‍රශ්නය කළමනාකරණය කරගන්න තිබුණා. මාතලේට විතරක් මිලිමීටර් 496ක වර්ෂාවක් ලැබිලා තිබෙනවා. මේ ආණ්ඩුව National Disaster Management Plan එක අධ්‍යයනය කළා නම් මේ තත්ත්වය අවම කර ගන්න තිබුණා. ඒකේ මොකක්ද කියන්නේ? ඒ සැලැස්මේ මෙසේ සඳහන් වෙනවා:

> "About 87% of Sri Lanka's population live in moderate or severe hotspots for disasters."

මොකක්ද මේ කියන්නේ? ලාංකිකයෝ සියයට 87ක් ජීවත් වෙන්නේ යම් ආකාරයේ පාරිසරික අවදානමක් තිබෙන කලාපවල කියන එක. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ සැලැස්මේ පැහැදිලිව මෙසේ ද සඳහන් වෙනවා:

> "Based on the Global Climate Risk Index, Sri Lanka is considered among the top 30 countries impacted by climate change"

මොකක්ද මේ කියන්නේ? පාරිසරික හානිවලට පත් වෙන්න පුළුවන් ලෝකයේ රටවලින් 30වැනි තැනට ලංකාව තිබෙනවාය කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එම සැලැස්මේ පැහැදිලිව තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Sectors such as tourism, fisheries, plantations and agriculture which contribute significantly to Sri Lanka's economy are climate sensitive and impacted..."

මේ රටේ ආර්ථිකය ඉවරයි. මේ රටේ අහිංසක මිනිසුන්ගේ ජීවිත ඉවරයි. මේ රටේ දේපළ ඉවරයි. මේ පිළිබඳව අවබෝධයකින් සහ අවධානයකින් මේ ආණ්ඩුව කටයුතු කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, අපේ රටේ disaster management හරියට නොකරපු නිසා අපට ආර්ථික වශයෙන් සහ සමාජයීය වශයෙන් සිදු වෙලා තිබෙන හානිය එමටයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒ වාගේම අපි පැහැදිලිව මේ කාරණයත් කියනවා. මේ රටේ සියයට 30කට ආසන්න දරුවන් හා තරුණ වියේ අය - adolescents - ඉන්නවා. ඒ අයගේ සෞඛ්‍ය, nutrition, water, sanitation, education, protection පිළිබඳව අවධානය යොමු කරලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, එම සැලැස්මේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Sri Lanka experience disaster losses amounting to LKR 50 billion (US$ 313 million) annually in housing, infrastructure, agriculture..."

World Bank එකේ දත්ත අනුව ගත්තොත්, natural disaster එක්ක මෙන්න මේ sectorsවලින් අවුරුද්දකට අපේ රටට රුපියල් බිලියන 50ක් අහිමි වෙනවා. මේ ආණ්ඩුව සූදානම් වෙන්න තිබුණා, මේ වාගේ තත්ත්වයක් රටේ උද්ගත වෙනවා කියන එකට. ඒ විතරක් නොවෙයි, එම සැලැස්මේ මෙසේ ද සඳහන් වෙනවා:

> "Out of the total estimated losses an amount of LKR 32 billion (US$ 200 million) incurred has been attributed to floods. Damages from cyclones and high winds accounts to LKR 11 billion..."

වාර්ෂිකව අපේ රටේ ජනතාවගේ මුදල්, දේපළ මෙච්චර ප්‍රමාණයක් අහිමි වෙනවා කියන එක පැහැදිලිව මේ සැලැස්මේ තිබියදී ආණ්ඩුව ඒ පිළිබඳව අවධානය යොමු කළේ නැහැ. ගංවතුර - floods - නිසා සිදු වන හානිය ගැන ඒ සැලැස්මේ පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "The annual average loss due to floods has been estimated as US$ 240 million."

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ භූමි ප්‍රමාණයෙන් සියයට 30ක් පමණ landslidesවලට අවදානමක් තිබෙනවා කියන එක පැහැදිලිව සඳහන් වෙනවා. එහෙම තිබෙද්දී තමයි 2016 ජුලි මාසයේ,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
තත්පර කීපයකින් මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මම කියපු National Disaster Management Plan එක පිළිබඳව workshop එකක් තිබෙනවා. Secretary to the Ministry of Defence, Air Vice Marshal Sampath Thuyacontha එක්ක ඒ workshop එක පවත්වන්නේ Courtyard by Marriottහිදීයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පැහැදිලිව මේ තොරතුරු තිබියදී මේගොල්ලන් රුපියල් කෝටි ගණන් වියදම් කරලා workshop පවත්වන්න කටයුතු කළත් මේ වාගේ ව්‍යසනයක් වළක්වා ගන්න කටයුතු කළේ නැත්තේ ඇයි? ඒ වාගේම වළක්වා ගන්න කටයුතු නොකරපු ව්‍යසනය හරියට කළමනාකරණය කර ගත්තේ නැත්තේ ඇයි? ඒ නිසා තමයි අපේ රටේ අහිංසක මිනිස්සු ජීවිතවලින් වන්දි ගෙව්වේ. මේ ආණ්ඩුව ඒ නැති වුණු ජීවිත වෙනුවෙන් වග කියන්න ඕනෑ කියන එකත් පැහැදිලිව මම කියනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නීතිඥ සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. මගේ කථාව ආරම්භ කරන්න මත්තෙන්, අතිවිශාල ලෙස මේ ස්වාභාවික ව්‍යසනයට මුහුණ දුන්නු දිස්ත්‍රික්කයක් නියෝජනය කරන මන්ත්‍රීවරියක් ලෙස මම විශේෂයෙන් මේ ආපදාවෙන් පීඩාවට පත් වුණු, මිය ගිය සහ දේපළ හානි වුණු සියලු ජනතාව වෙනුවෙන් කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද උදෑසන ඉඳලා මේ විවාදය අහගෙන ඉන්න විට පැහැදිලි වුණු එක කාරණයක් තමයි, විපක්ෂය මේ ආපදාව සුළු ස්වාභාවික විපතක් විධියට තමයි අර්ථ දක්වන්න උත්සාහ කරන්නේ කියන එක. නමුත්, මේ ආපදාව ඉතිහාසයේ සිදු වුණු විශාලම ස්වාභාවික විපත. මිලිමීටර් 500ක් ඉක්ම වූ වර්ෂාපතනයක් ලැබෙනවා කියලා වාර්තා පළ වෙලා තිබෙනවා. මේ ආපදාවෙන් වැඩිපුර ජනතාව මිය ගිහින් තිබෙන්නේ නාය යාම් ආශ්‍රිත හේතු නිසායි. දිස්ත්‍රික්කයක් විධියට අපිත් මුහුණ දුන්නු මේ අත්දැකීම ගැන කථා කරද්දී විපක්ෂය කියන කාරණා ගැන ඇත්තටම කනගාටුයි. ඔවුන් නොදැකපු දේවල් මවාපාන්න උත්සාහ කරනවා. අපි ඒ මිනිසුන්ව ආරක්ෂා කරන්න කොපමණ වෙහෙසක් ගත්තාද කියන කාරණය දන්නේ අපි විතරයි. 27වැනි දා අපි දිස්ත්‍රික්කයක් විධියට ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙලා, එක් එක් ආයතනවලට වගකීම් භාර දීලා, අවදානම් සහගත ප්‍රදේශවල සිටින ජනතාව ඒ ස්ථානවලින් අයින් කරන්නේ කොහොමද කියන එක තීරණය කළා. එදා ඉඳලා රෑ දවල් කියා බලන්නේ නැතුව අනාරක්ෂිත ප්‍රදේශවලින් ජනතාව අපි ඉවත් කළා. ඔවුන්ව හැකි තරම් ඥාති නිවාසවලට භාර දුන්නා වාගේම තවත් පිරිසක් ආරක්ෂිත ස්ථානවලට භාර දුන්නා. තවදුරටත් අනාරක්ෂිත වන ස්ථාන තිබෙනවා නම් එවැනි ස්ථානවලින් ජනතාව ගෙනෙන්න අවශ්‍ය ආරක්ෂිත කඳවුරු සකස් කරමින් රෑ දවල් කියා බලන්නේ නැතුව රාජ්‍ය නිලධාරින්, දේශපාලන අධිකාරිය, ස්වේච්ඡා කණ්ඩායම් කියන සියලුදෙනා එකතු වෙලා ඒ කාර්යයන් කළේ අපේ රටේ මිනිස්සුන්ගේ ජීවිත අපට වටිනා නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, සමහර ප්‍රදේශවලට මිලිමීටර් 500ක පමණ වර්ෂාපතනයක් ලැබුණා. එවැනි වර්ෂාපතනයක් මහ පොළොවට එකවර දරා ගන්න අමාරු වෙලා, කඳු පහත් වෙද්දී අපිට අතින් අල්ලලා දේපළ හානි සිදු වන එක නවත්වන්න බැහැ. ඒ මොහොතේදී අපට කරන්න පුළුවන්කම තිබුණු පළමුවැනි කාර්යය තමයි, ඒ මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම. ඒ අනුව අපිට පුළුවන් වුණා, දිස්ත්‍රික්ක 22ක් පුරා ඇති වුණු මෙවැනි විශාල ව්‍යසනයකින් සිදු වන ජීවිත හානි ප්‍රමාණය අවම කර ගන්න.

මා ළඟ තිබෙනවා, දෙසැම්බර් මාසයේ 01වැනි දා වෙනකොට කෑගල්ල දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් වන සංඛ්‍යාලේඛන. ඒ අනුව, පවුල් 11,884ක පුද්ගලයින් 42,898ක් ආපදාවට පත් වෙද්දී, මරණ 22ක් වාර්තා වෙලා තිබෙනවා. මීට වඩා සුළු ප්‍රමාණයක් මේ වනවිට එහේ මෙහේ වෙලා ඇති. හැබැයි, අපි විශ්වාසයෙන් කියනවා, දිස්ත්‍රික්ක විධියට ගත්තොත්, අපේ දිස්ත්‍රික්කයේ ආපදා හේතුවෙන් සිදු වුණු මරණ ප්‍රමාණය අවම කර ගන්න කරන්න පුළුවන් හැම කාර්යයක්ම කරමින්, අප රෑ දවල් නොබලා ඒ වෙනුවෙන් වැඩ කළ බව. අවදානමක් තිබෙන හැම ස්ථානයකම සිටින මිනිසුන් ඒ ස්ථානවලින් ඉවත් කරන්න ඒ නිලධාරින් කටයුතු කළා පමණක් නොවෙයි, අපිටත් අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. එහෙම යන්න බැරි තැන්වලට පොලීසියෙන් හා හමුදාවෙන් යවලා තමයි ඒ මිනිස්සු ඒ ස්ථානවලින් ඉවත් කර ගත්තේ. උදාහරණයක් විධියට ගත්තොත්, අනාරක්ෂිත බව නිසා රෑ යන්න බැරි සමහර තැන්වලට පණිවුඩ යවලා නිලධාරින් ගියත්, ඔවුන්ටත් යන්න බැරි වෙනකොට පොලීසියෙන් යවලා තමයි ඒ ජනතාව ඒ තැන්වලින් ඉවත් කළේ. එවැනි තැන්වල හිටපු ජනතාවගේ පවා ජීවිත බේරා ගන්න අපි කටයුතු කළා.

කෑගල්ල දිස්ත්‍රික්කයේ තිබුණු ප්‍රධාන රජයේ ආයතනයක් නාය ගියා. රෑ 12.00ට, 1.00ට එතැනින් නිලධාරින් ඉවත් කරලා මොහොතකින් ඒ ආයතනය තිබුණු තැනක්වත් හොයා ගන්න බැරි විධියට තමයි නාය ගියේ. එවැනි කැප කිරීම් කරලා තමයි, අපි ඒ මිනිසුන්ගේ ජීවිත බේරා ගත්තේ. එවැනි මහන්සියක් දරලා, රාජ්‍ය නිලධාරිනුත් එකතු වෙලා තමයි, මේ මරණ සංඛ්‍යාව අපි අඩු කර ගත්තේ. එවැනි දේවල් කරලා තිබියදී වැස්ස පායලා, සියල්ල නිරාකරණය වුණාට පස්සේ අපි ආපදා කළමනාකරණය කරපු හැටි ගැන මේගොල්ලන් කථා කරනවා. නමුත්, අපි එතැනින් නවතින්නේ නැතුව, මේ කඳවුරුවලට එක් කරගෙන ගිය ජනතාව තුන්වේල බඩගින්නේ තියන්නේ නැතුව, ඔවුන්ට කෑම බීම ටික ඇතුළු අවශ්‍යතා සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීලා, ඒ කඳවුරුවල ඔවුන්ට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් තත්ත්වය සකස් කළා විතරක් නොවෙයි, අද වෙනකොට ඒගොල්ලන්ගේ මානසික ඒකාග්‍රතාව පවත්වාගෙන යන්න අවශ්‍ය මානසික උපදේශන වැඩසටහන් පවා අප සංවිධානය කරලා තිබෙනවා. එවැනි විධිමත් ආකාරයකින් තමයි අපි කටයුතු කරන්නේ. අපි එතැනින් පිරිසක් ගෙවල්වල රඳවා තැබුවා. ඒගොල්ලන් අතුරින් සුරක්ෂිතව ස්වකැමැත්තෙන් ඥාති නිවෙස්වල රැඳුණු කණ්ඩායමක් හිටියා. ඒගොල්ලන්ට අවශ්‍ය වියළි සලාක ටික නිවැරදි විධියට ලබා දීලා, අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන, මේ වෙනකොටත් දිස්ත්‍රික්කයක් විධියට ඒ අය වෙනුවෙන් අවශ්‍ය ඉදිරි පියවර සියල්ල සංවිධානය කරලා තිබෙනවා. අපි අලුත් ආරම්භයක් එක්ක ඉදිරියට යන්න සූදානම් වාගේම අපට අලුත් ආරම්භයක් එක්ක ඉදිරියට යන්නත් පුළුවන්. ස්ථිර කඳවුරු වෙනුවෙන් අවශ්‍ය කාර්යභාරයන් ඉටු කරමින්, සුරක්ෂිත ස්ථානවල ඉන්න අයට තවදුරටත් පහසුකම් දෙන්නේ කොහොමද කියන මේ කාරණා සියල්ල පිළිබඳව සාකච්ඡා කරලා, ඒ වෙනුවෙන් සැලසුම් සකස් කරමින් සිටියදී, මේ අය කඳවුරුවල කෑම නැහැ කියලා තවදුරටත් ප්‍රචාරය කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විහිළුවට කාරණය මේකයි. කඳවුරු එකින් එක නිරීක්ෂණය කරද්දී පෙනෙනවා, තව දින, සති ගණනාවකට කෑම සහ වියළි ද්‍රව්‍ය තිබෙන බව. ඊළඟට, අපි මේ අයගේ ආහාර සම්බන්ධයෙන් අවශ්‍ය වන සියලු කාර්යභාරයන් සකස් කරලා තිබෙනවා. ඉදිරියේදී අපේ කාර්යභාරය වන්නේ මේ කණ්ඩායම අත් නොහැර, ඔවුන් නැවත ජාතික ආර්ථිකයේ සක්‍රිය පුරවැසියෝ විධියට ඉක්මනින් මේ ක්‍රියාවලියට දායක කර ගැනීමයි. ඒගොල්ලන් සිතිවිලිවලින් කඩා වැටිලා ඉන්නවා නම් දැන් අපේ කාර්යය වන්නේ ඒගොල්ලන් එක්ක ඉස්සරහට යන්න අවශ්‍ය පියවර ගන්න සූදානම් වන එකයි. ඒ වාගේම, මේ ආපදාවට ලක් වෙලා දවස් දෙකක් ඇතුළත කෑගල්ල දිස්ත්‍රික්කයේ මාර්ග ටික යථාවත් කර ගන්න අපට පුළුවන් වුණා. ජල පහසුකම් සහ විදුලිය පහසුකම් ලබා දෙන්න පුළුවන් වුණා. ඒ ආකාරයට සෑම ස්ථානයකටම ඒ පහසුකම් ඉක්මනින් ලබා දෙන්න පුළුවන් වුණේ මේ නිලධාරින්, ස්වේච්ඡා සංවිධාන කියන සියලුදෙනාම එකම කණ්ඩායමක් විධියට කටයුතු කරපු නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. මම පෞද්ගලිකව දැක්කා, තමන්ගේ අම්මා ICU එකේ මැරෙන බව දැන-දැන කඳවුරක් භාර ගෙන කටයුතු කරන ග්‍රාම නිලධාරිතුමියක්. ඒ වාගේම එම කඳවුරේම හිටපු අනෙක්

ග්‍රාම නිලධාරිතුමා තමන්ගේ ගෙදර ගිහිල්ලා දරු පවුල ඥාති ගෙදරක නවත්වලා ඊ දවල් නොබලා සේවය කරනවා. අපි මැදිහත් වෙලා, ප්‍රාදේශීය ලේකම්තුමියගේ මැදිහත්වීමෙන් ඒ ග්‍රාම නිලධාරිවරියට නිවාඩු අරගෙන දෙනකොට අවාසනාවට එතුමියගේ අම්මා මිය ගිහිල්ලා. එතුමිය අඬමින් කථා කළා, "අම්මා මැරුණා, Madam" කියලා. ඒක තමයි, මේ මිනිස්සුන්ගේ කැපවීමේ ස්වභාවය. එවැනි මිනිස්සුන්ගේ කැපවීම අවතක්සේරු කරන්න එපා.

ඔය චක්‍රලේඛ ගැන කියලා, බොරු කියලා ඔබ මවන්න හදන බිල්ලා භූමිය තුළ අපි දැක්කේ නැහැ. නිලධාරින්, අපි ඔක්කොම එකට එකතු වෙලා වැඩ කළේ මේ රට හදන්න ඕනෑ, වැටුණු තැනින් නැඟිටින්න නම් අපි ඔක්කොම එකතු වෙන්න ඕනෑ කියන අදහසත් එක්ක. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මගේ කථාව අවසන් කරන්නම්, ඉන්දීය ජනාධිපති අබ්දුල් කලාම් මැතිතුමාගේ ප්‍රකාශයක් එක්ක. "දුෂ්කරතා පැමිණෙන්නේ ඔබව විනාශ කිරීමට නොව, ඔබේ සැඟවුණු ශක්තිය සහ බලය අවබෝධ කර ගැනීමට ඔබට උපකාර කිරීමටයි" කියන මතකය නැවතත් ආවර්ජනය කරමින්, "දිට්වා" කියන සුළි කුණාටුවේ තේරුම දිට්ඨධම්ම වේදනීය කර්මය නම් නොවෙයි, ඒක යේමනයේ කළපුවක නමක් කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමියට ස්තුතියි, අවස්ථාව ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.46]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ වෙලාවේ මම ප්‍රායෝගික දේශපාලකයෙක් විධියට අර අපේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ වැස්ස පැව්වාට පස්සේ එළියට බැහැලා සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන මන්ත්‍රීතුමෙක් නොවෙයි. මේ ව්‍යසනය වුණු දවසේ ඉඳලා මම හිටියේ එළියේ. මම හිටියේ අපේ දිස්ත්‍රික්කයෙන් පිට. දෛවයේ හේතුවකට අපේ දිස්ත්‍රික්කයට -කළුතර දිස්ත්‍රික්කයට- එච්චර ලොකු බලපෑමක් වුණේ නැහැ. මම ගියා කඩුවෙල ආසනයට. කඩුවෙල ආසනයට බෝට්ටු අරගෙනයි මම ගියේ. ගිහින් අවශ්‍ය කරන පහසුකම් සලසා දුන්නා. මම ගියා තඹුත්තේගමට. මම තඹුත්තේගමට ගියේ ජනාධිපතිතුමාගේ ගම නිසා නොවෙයි. මගේ එහා පැත්තේ පුටුවේ ඉන්න සුරංග රත්නායක මන්ත්‍රීතුමා අසරණ වෙලා සිටි නිසායි. ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට වෙලා තිබෙන දේ ඇස් දෙකින්ම දැක්කා. මම 400ක් පමණ මගේ පෞද්ගලික හිතවතුන් එක්ක තමයි ගියේ. අවශ්‍ය කරන සියලු දේවල් අපි අරගෙන ගියා. අරගෙන ගිහින් යුතුකම් ඉටු කළා. මම කනගාටුවෙන් වුවත් කියනවා, මේ ගම්වල කටයුතු කරන රාජ්‍ය නිලධාරින් ගැන. මම දවස් තුනකට පසුව තමයි එහෙට ගියේ. රාජ්‍ය නිලධාරින් ඒ පැත්ත පළාතේ හිටියේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පලුගස්වැව, රාජාංගනය, රාජාංගනය - යාය 2, මල්බෙලිගල යන ප්‍රදේශවල රාජ්‍ය නිලධාරින් පැත්ත පළාතේ ගිහිල්ලා තිබුණේ නැහැ. ඇඳි වත විතරයි ඒ මිනිස්සුන්ට ඉතිරි වෙලා තිබුණේ. හිතට හරිම දුකයි. ඊට්ත් වඩා දුකක් තිබෙනවා.

ගරු අගමැතිතුමියත් මේ සභාවේ ඉන්න නිසා මම මේ කියන්නේ. අපේ රටේ මේ ක්‍රමය වෙනස් වෙන්න නම්, අපි ඉස්සෙල්ලාම අපේ රටේ තිබෙන ඉඩම් ටික හඳුනා ගන්න ඕනෑ. නේවාසික ඉඩම් මොනවාද, කෘෂි කාර්මික ඉඩම් මොනවාද, වාණිජ ඉඩම් මොනවාද කියලා ගැසට් කරන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවේ, පළාත් සභාවේ සිට පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීවරයෙක් විධියටයි මම මේ කියන්නේ. ඕනෑම ඉඩමක් අරගෙන ඇවිල්ලා ප්‍රාදේශීය සභාවට දාලා අනුමැතිය ගත්තාට පස්සේ ඒක නේවාසික ඉඩමක් වෙනවා. එහෙම වෙන්න බැහැ. එහෙම වුණු එකේ ප්‍රතිඵලය තමයි අද මේ භුක්ති විඳින්නේ. තඹුත්තේගම ආසනයේ, කලා ඔයේ වැව් බැම්ම එහෙම නැත්නම් ඒ සොරොව්ව පෙනෙන තෙක් මානයේ ගම්වලට ඊ වෙනකොට වතුර ආවා. ඒ වතුර මහා ජල කඳක් වුණා. ඒ වතුරේ ගහගෙන ගියේ ඒගොල්ලන්ගේ ජීවිත විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ඒගොල්ලන්ට තිබෙන්නේ වැවිලි ආර්ථිකයක්. කුඹුරු ගොවිතැන කරන්නේ. ඒගොල්ලන්ගේ කුඹුරුවල මඩ ටික ඔක්කෝම හෝදාගෙන ගිහිල්ලා, ගල් විතරයි තිබෙන්නේ. ගලුයි, වැලියි ඉතිරි වෙලා තිබෙනවා. ඒගොල්ලන්ට ඒවා සංවර්ධනය කරන්න බැහැ කවදාවත්. ඒක මම වගකීමෙන් කියනවා. ආණ්ඩුවට උදව් කරන්නත් බැහැ, අපිට උදව් කරන්නත් බැහැ. අපිට කන්න බොන්න දීලා හැමදාම ඔවුන් බලා ගන්නත් බැහැ. එහෙමනම් ඒගොල්ලන්ට ජනාවාස ක්‍රමයක් ඇති කරලා, ඒගොල්ලන්ට දැනට තිබෙන ඉඩමට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් ලබා දෙන්න වෙනවා. මම දන්නවා, රජය සතු ඉඩම් ප්‍රමාණය වැඩියි, පෞද්ගලික අංශයට වඩා. මේ රටේ ඉඩම්වලින් තුනෙන් දෙකක් විතර තමයි අපේ රටේ පෞද්ගලික අංශයයි, රජයයි පාවිච්චි කරන්නේ. පාවිච්චි නොකරන ඉඩම් තිබෙනවා හෙක්ටෙයාර සැහෙන ප්‍රමාණයක්. එහෙමනම්, ඒවායේ ජනාවාස ඇති කරලා, ඒගොල්ලන්ට ඒ වැවිලි ආර්ථිකය දියුණු කර ගන්න අතහිත දුන්නොත් හැර මේ ව්‍යසනයෙන් බේරෙන්න බැහැ.

මේකෙන් පස්සේ ආයෙත් එන්නේ නැද්ද ගං වතුර? ආයෙත් එන්නේ නැද්ද මේ වාගේ ව්‍යසනයක්? නැවතත් එනවා. මේවා ආණ්ඩු පිට පටවන්න බැහැ. මේ ආණ්ඩුවටයි, පසුගිය ආණ්ඩුවලටයි කර ගන්න බැරි වුණු දේ ගැන තමයි මේ මම කියන්නේ. ඔයගොල්ලන්ට මේ රටේ ජනතාව තුනෙන් දෙකක බලයක් දීලා තිබෙනවා. ඇයි මේවා කරලා දෙන්නේ නැත්තේ? එහෙම කළොත් නේවාසික ඉඩමක නේවාසික කටයුතු සඳහා විතරයි අවසර ලැබෙන්නේ; කෘෂි කාර්මික ඉඩමක කෘෂි කාර්මික කටයුතුවලට විතරයි අවසර ලැබෙන්නේ; වාණිජ ඉඩමක කර්මාන්තශාලාවලට විතරයි අවසර ලැබෙන්නේ. මෙන්න මේ ක්‍රමය ක්‍රියාත්මක කළොත් විශේෂයෙන්ම මේ රටේ තිබෙන මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙයි. මේ බලන්නකෝ, IMF එකෙන් අපිට ඩොලර් බිලියන 1.5ක ණය මුදලක් ලැබෙනවා තව සුමාන දෙකකින්. මේ සුළි කුණාටුවෙන් වෙලා තිබෙන හානිය ඩොලර් බිලියන 6ක් විතර වෙනවා. සමහරවිට ඊට්ත් වැඩි ඇති. කොහොම වුණත් තවම හරියට තක්සේරුවක් ගන්න බැරි වුණා. මැරුණු ප්‍රමාණය, නිවාස හානි වෙච්ච ප්‍රමාණය සහ පස්වලට යට වෙච්ච ජීවිත සංඛ්‍යාව පිළිබඳව නිවැරදි අර්ථකථනයක් තවම නැහැ. එහෙමනම් අනිවාර්යයෙන්ම අපට සිද්ධ වෙනවා මේ වාගේ ක්‍රමයකට යන්න. එහෙම නැතිව, අර කිව්වා වාගේ වැස්ස පැව්වාම එළියට බහිනවාලු, ඇවිල්ලා සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරනවාලු. එහෙම දේශපාලකයෝ ඉන්නවා ඇති. මම දන්නේ නැහැ.

හැබැයි, අපට වගකීමක් තිබෙනවා. මම නම් හිතන්නේ දිස්ත්‍රික්කයකට, ආසනයකට සීමා වෙච්ච පුද්ගලයෙක් විධියට නොවෙයි. මම එහෙම කවදාවත් හිතන්නේ නැහැ. මම හිතන්නේ අපි 225දෙනාම ලංකාවේ මන්ත්‍රීවරු විධියට. අපට අයිතියක් තිබෙනවා, කොහේ හරි ව්‍යසනයක් වුණා නම් ගිහිල්ලා තමන්ට හැකි ශක්ති ප්‍රමාණයෙන් ඒ වෙනුවෙන් වියදම් දරන්න. අපට පාර්ලිමේන්තුවෙන් කප්පාදු කරන්න පුළුවන් වියදම් තිබෙනවා. දෙසැම්බර් කවදාද මම දන්නේ නැහැ, මොකක්දෝ දිනයක් සමරන්න හදනවා. ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා, රුපියල්

[ගරු ජගත් විතාන මහතා]

මිලියන 300ක්. මේ ව්‍යසනයෙන් පීඩාවට පත් වෙච්ච කට්ටිය වෙනුවෙන් ඒ මුදලුත් පාවිච්චි කරන්න. ආපහු දිනයක් ඕනෑ නැහැ නේ. දැන් කැබ් ගෙන්වන්න එපා. 225ටම කැබ් ගෙන්වනවා. 225ක් ගෙනාවත් කමක් නැහැ. හැබැයි ගෙන්වන්නේ, එක්දහස් නවසිය ගණනක්. එතකොට පුළුවන්ද, මේ රටේ තිබෙන ණය බරත් එක්ක, මේ ව්‍යසනයත් එක්ක, මේ වෙච්ච හානියත් එක්ක මේ රට දියුණු කරන්න දායක වෙන්න? බොරු නේ. නැඟිටලා මේවා කියන්න. සංඛ්‍යා ලේඛන අනුව කථා කරනවාට වඩා ඇත්ත තත්ත්වය බැලුවාට පසුව සැහෙන්න වෙනස්.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගත්ත දවසේ මට එන්න බැරි වුණා. හැබැයි මම මේ කාරණය වගකීමෙන් කියනවා. මම සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා වශයෙන් කටයුතු කළා, මතුගම දොඩන්ගොඩ ආසනයේ. ඒ දවස්වල චක්‍රලේඛනයක් තිබුණා. අදත් ඒ චක්‍රලේඛනය තිබෙනවා. 2017දී කටුපොල් වගාව තහනම් කළා. කටු පොල් වගාව තහනම් කළාම මම ඒ චක්‍රලේඛනය අකුරටම පිළිපැද්දා. ඒ අකුරටම පිළිපැදීමේ ප්‍රතිඵලය වශයෙන් මට ලැබුණේ, මහාධිකරණයෙන් දඬුවම් ලැබීමයි. අවුරුදු 10කට අත්හිටවූ සිර දඬුවම් ලැබුණා, මාස හයකට. ඒ ලැබුණේ මම ඒ චක්‍රලේඛනය අනුව කටයුතු කරන්න ගිහිල්ලා. අද මම පාර්ලිමේන්තුවේ ඉඳලා මුළු රටටම කියනවා, කටු පොල් භෝගය නැවතත් අනුමත කළ යුතුයි කියලා. ලෝකයේ කිසිම රටක කටු පොල් තහනම් කරලා නැහැ. ලංකාවේ විතරයි තහනම් කර තිබෙන්නේ. ඒ, තෙත් කලාපයට කිසිම හානියක් නැති වගාවක්. කටු පොල්වලින් කොයි තරම් දේවල් හදන්න පුළුවන්ද? දැන් ඔය පොල්තෙල් කියලා කන්නේ palm oil. ඇති පොල්තෙලක් නැහැ; palm oil තමයි කන්නේ. අපේ පළාත්වල තේ වගාව වාගේ ව්‍යාප්ත කරන්න පුළුවන්. බලන්නකෝ, අවුරුදු ගණනාවකින් බීජ ගෙන්වලා නැහැ. බීජ ගෙන්වන්න ඕනෑ. එහෙම නැතුව මේ වගාව ව්‍යාප්ත කරන්න බැහැ. ඒකෙන් අපේ ආර්ථිකයට හොඳ ගැම්මක් ගන්න පුළුවන්. ඒ නිසා මේක අනිවාර්යයෙන්ම කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. රාජ්‍ය නිලධාරින් රැඳී සිටින කුටිවල ඉන්නවා, ඒ කටයුතුවලට අදාළ අමාත්‍යාංශවල ලේකම්වරු ඒ අදාළ නිලධාරින්. මම ඒ අයට කියනවා, මේ පිළිබඳව අධ්‍යයනය කරලා කටයුතු කරන්න කියලා.

අපි තේ වගාව ගැන කොයි තරම් බලාපොරොත්තු තියාගෙන හිටියාද? තේ වගාවේ හෙක්ටෙයාර් 3,000ක් දැන් නැති වෙලා. දැන් තේ වවන්නේ නැහැ. ඇයි ඒ? පොහොරවලට VAT එක වැදිලා. VAT එක වැදුණාට පසුව පොහොර මිල ඉහළ ගියා. ගොවීන් පොහොර දමන්නේ නැහැ. ගොවීන් තේ වගාවට දිරිමත් වෙන්නේ නැහැ. මේ, කෘෂි ආර්ථිකය මත යැපෙන රටක්. ඒ නිසා මෙහෙම කරන්න එපා, මෙහෙම වෙන්න දෙන්න එපා.

දැන් අපට යුතුකමක් තිබෙනවා, මේ ආපදාවට පත් වූ ජනතාවට පිහිට වෙන්න නම්, අපි සියලුදෙනාම කැප කිරීම් කරන්න ඕනෑ. ඒ කැප කිරීම් කරන්න මම ඉහළින්ම සූදානම්. ඒ නිසා මම අර කියපු කාරණා ගැන ආණ්ඩු පක්ෂයක් විධියට සලකා බලා ඒවා අනුමත කර දී ඒ මිනිස්සුන්ව ඒ ස්ථානවලින් ඉවත් කරන්න. ඒ මිනිස්සු ඒ ස්ථානවලින් ඉවත් නොවුණොත්, ආපහු වතාවක් මේ ප්‍රශ්නයම ආවොත් ආයෙත් අපි එතැනමයි. ඒ මිනිස්සුන්ගේ ජීවිතත් නැති වෙනවා. ඒ නිසා බොහොම සමබරව ඒගොල්ලන්ට අවශ්‍ය කරන පහසුකම් ටික දීලා ඒ ස්ථානවලින් ඉවත් කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මම මේ කියන්නේ දේශපාලනය ගැන නොවෙයි. දේශපාලනය කරනවා නම් අපට ගෙදරට වෙලා ඉන්න පුළුවන්. අපි එහෙම නොකර, එළියට බැහැලා, මහ වැස්සේ ගිහිල්ලා මේ කටයුතු කළා. බලන්න, අපි සමාජ මාධ්‍යයේ ඒ ඔක්කොම පළ කළා. මහ වැස්සේ අපි ගිහිල්ලා මිනිස්සුත් එක්ක ඉන්න විධිය බලන්න. එහෙමනම් අපටත් පුළුවන් නේ මේක ආණ්ඩුවේ වැඩක් කියලා ඉවත බලාගෙන ඉන්න. අපි එහෙම ඉන්නේ නැහැ. මට ලැබී තිබෙන කාලය අවසානයි. බොහොම ස්තුතියි, මට මේ කාලය ලබා දුන්නාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

මීළඟට, ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.54]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපි ආණ්ඩුව අරගෙන ඉදිරිපත් කරන දෙවැනි අය වැය ලේඛනය තුන්වැනි වර කියවා සම්මත කර ගන්න ඉන්න මේ මොහොත, මෑත ඉතිහාසයේ සිදු වුණු දැවැන්තම ස්වාභාවික ව්‍යසනයට අපේ රට මුහුණ දී එයින් හෙම්බත් වෙලා ඉන්න මොහොතක්. අපි මේ කථා කරන මොහොතේත් ඒ ව්‍යසනයට මුහුණ දුන් ජනතාව අනෙකුත් දිස්ත්‍රික්කවල ජනතාවත් එක්ක එකතු වෙලා තම ජීවිත යථාවත් කරගන්න පොර බදනවා.

මම ජීවත් වෙන්නේ, මොනරාගල දිස්ත්‍රික්කයේ. අපට පුළුවන් වුණා මේ ආපදාවෙන් අපේ දිස්ත්‍රික්කයේ අවම හානි වාර්තා කරගන්න. ඒක ඉබේ සිදුවුණු දෙයක් නොවෙයි. අපේ දිස්ත්‍රික්කයේ මහ දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා තුමියන්ලා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂතුමා ඇතුළු නිලධාරි මණ්ඩලය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සියලුම ප්‍රාදේශීය සභාවල සභාපතිතුමන්ලා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමන්ලා ඇතුළු කාර්ය මණ්ඩලය, අනෙකුත් රාජ්‍ය ආයතනවල -විදුලිබල මණ්ඩලය, ජලසම්පාදන මණ්ඩලය, වනජීවී සම්බන්ධ ආයතනය ආදී- නිලධාරින් සමඟ එකතු වෙලා, බිම් මට්ටමේ ඉන්න සියලු නිලධාරින් -ග්‍රාම නිලධාරිතුමන්ලා තුමියන්ලා, සමෘද්ධි සංවර්ධන නිලධාරින් ඇතුළු සියලු නිලධාරින් - සමඟ එකතු වෙලා නිදි වර්ජිතව රෑ ගණනක් මහන්සි වෙලා මොනරාගල දිස්ත්‍රික්කයේ හානිය අවම කර ගන්න සමත් වුණා.

ඒ සම්බන්ධයෙන් ඒ සියලු දෙනාට දේශපාලන අධිකාරිය වෙනුවෙන් මගේ ගෞරවය පිරිනමන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නොවැම්බර් මාසයේ 07වන දා මේ අය වැය ඉදිරිපත් කරලා, 08වන දා ඉඳලා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් විවාද කරලා, 15වන දායින් පසුව අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවේ විවාද කරලා, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියලාගේ සාධනීය අදහස් හා යෝජනාත් එකතු කරගෙන හොඳ අය වැයක් හදාගෙන ලබන අවුරුද්දට මුහුණ දෙන්න තමයි අප සූදානම් වුණේ. නමුත් මේ ස්වාභාවික විපතත් එක්ක අපට ඒක ඒ මට්ටමින් කර ගන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අප මේ දුවන්නේ රිලේ එකක්. ලෝකයේ රටවල් ඔක්කෝම මේ තරගයේ අපිත් එක්ක ඉන්නවා. අපේ රට වාගේම අනික් රටවල් හැම එකකමත් ජනතාව අවුරුදු 4කට, 5කට පත් කරනවා, මේ රිලේ එක දුවන්න කණ්ඩායමක්. එහෙම නම්, මේ වෙලාවේ මේ රිලේ එක දුවන්නේ

ජාතික ජන බලවේගයේ, අපි. නමුත් අපි මේ රිලේ එක දුවන්නේ අපට කලින් දුවපු කට්ටිය අපට බැටන් එක ගෙනැල්ලා දුන්නු පරතරය සහිතව. මීට කණ්ඩායම් දෙකකට කලින් තහනම් උත්තේජක ගහලා වාගේ ට්‍රැක් එකෙන් පැනලා එහාටත් නැති, මෙහාටත් නැති, පාලනයකුත් නැති පාලන කණ්ඩායමක් පත් වෙලා, අපේ රටේ ආර්ථිකය මේ අගාධයට ගෙන ඒම ඉක්මන් කරන්න පටන් අරගෙන තිබුණා. ඊළඟට, මේ බැටන් එක ගත්තු කෙනා කාබනික පොහොර කියන යහපත් සංකල්පය අවභාවිතාවේ යොදවලා කකුල් පැටලිලා ට්‍රැක් එක මැද වැටිලා මූණ කට සමතලා කරගෙන ඉන්න කොට, ට්‍රැක පැනපු තව මහත්මයෙක් බැටන් එක අරගෙන 2002 "Regaining Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක කරපු විධියටම ආයෙමත් මේ මහ පොළොවත් එක්ක ඓන්ද්‍රිය සම්බන්ධයක් නැතුව, දේශීය නිෂ්පාදනත් එක්ක බැඳුණු ආර්ථිකයක් ගොඩ නගන්නේ නැතුව, අපේ රටේ ආර්ථිකය පාලනය කරගෙන ඇවිල්ලා, අන්තිමට බොහොම අමාරුවෙන් ලෝකයේ අනිකුත් තරගකරුවන් එක්ක අන්තිම කෙළවරේ ඉන්න තැනකදී තමයි අපට මේ බැටන් එක දීලා තිබෙන්නේ.

ඒ නිසා මේ වාගේ ව්‍යසනයකට මුහුණ දෙන එක අපට ලෙහෙසි නැහැ. ඉතින් අපේ රටේ ජන ජීවිතය යථාවත් කිරීම, අපේ ආර්ථිකය ශක්තිමත් කිරීම අතින් අප මේ කථා කරන තරම් පහසු තැනක සිට නොවෙයි අප මේ බැටන් එක භාර ගත්තේ. ඒ වුණත් අප මේ වගකීම භාර අරගෙන පළමුවෙනි අවුරුද්ද අපේ උපරිම ශක්තිය යොදවා, ඉතාම සාර්ථකව රාජ්‍ය නිලධාරින් සහ දේශපාලන අධිකාරියේ හැම දෙනාගේම කැප කිරීම මත ආදායම් උත්පාදනය, ආදායම් එකතු කර ගැනීම යහපත් මට්ටමකට අරගෙන ආවා. ඒ වාගේම අය වැය පරතරය අඩු කරගෙන, ණය කළමනාකරණය කරගෙන, ප්‍රශස්ත මට්ටමකින් අපි මේ ආර්ථිකය ගොඩනගා ගෙන ආවා. මීට කලින් කොරෝනා වසංගතය එද්දී, ඒ වාගේම මීට පෙර ගං වතුර ආ වේලාවල අපේ රටේ පැවැති ආණ්ඩු OD එකකින් තමයි කටයුතු කරගෙන ගියේ. ඒ ආණ්ඩුවලට මුදල් තිබුණේ නැහැ. නමුත් අද අපි යම් ශක්තිමත්භාවයක ඉන්නවා; මේ මොහොතේ අපේ ආණ්ඩුව කරගෙන යන්න පුළුවන් තැනක අපි ඉන්නවා. ඒ, නිසි කළමනාකරණය නිසයි. ඒ වාගේම මූල්‍ය විනය කියන එක අපි ඉතාම ඉහළින් පවත්වාගෙන ගියා. රට බංකොලොත්භාවයෙන් ඉවත් කරගෙන, ඩොලරය ස්ථාවර අගයක තියාගෙන අපි මේ රට කරගෙන යනවා. 2026දීත් අපි මීට වඩා ඉහළ තැනකට අපේ ආර්ථිකය අරගෙන එන්න සැලසුම් සකස් කරලා තිබෙනවා.

ඉතින් මෙහෙම යන අතරේ තමයි අපට මේ ආපදාව ආවේ. විපක්ෂයේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් චෝදනා කරනවා, මීට පෙර අවස්ථාවලදී ඒ ගොල්ලන්ගේ ආණ්ඩු ගත්තු ක්‍රියා මාර්ග අපි විපක්ෂයේ සිටියදී විවේචනය කළා කියලා. 2004 සුනාමි එනකොට "Helping Hambantota" කියලා ගිණුම් හදාගෙන, පෞද්ගලික ගිණුම්වලට සල්ලි දා ගන්න කොට අපි ඒවා විවේචනය කළා තමයි. සුනාමි සහන මණ්ඩල හදාගෙන බෙදුම්වාදයට උඩගෙඩි දෙනකොට අපි ඒවා විවේචනය කළා තමයි. හැබැයි, අපි ඒ විවේචනයෙන් ඔබ්බට ගිහිල්ලා, අපේ සම්පූර්ණ දේශපාලන හැකියාව යොදමින්, අපේ ව්‍යාපාරය සම්පූර්ණයෙන් බිමට බැහැලා ඒ සියල්ලට මැදිහත් වෙලා පවතින ආණ්ඩුවලට උදවු කළා, අපේ රටේ ජනතාවට සහන සැලසීම සඳහා. 2004 සුනාමි ආ වෙලාවේ හම්බන්තොට චිත්‍රපට ශාලාවේ තමයි අපේ ආපදා සහන මධ්‍යස්ථානය පිහිටුවා තිබුණේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, හම්බන්තොට නගරයම මළමිනීවලින් පිරිලායි තිබුණේ. අතින් අල්ලලා අදින කොට අත ගැලවිලා ආවා. කකුලෙන් අල්ලන කොට කකුල ගැලවිලා ආවා. ඒ මළමිනී අයින් කරලා අපි හම්බන්තොට නගරය පිරිසිදු කළා. ඉන්දීය විශේෂඥයන්ට හදන්න අවුරුදු දෙකක් යනවා කියපු රේල් පාර දවස් 54කින් හදන්න අපට හැකියාව ලැබුණා. එහෙම කැපකිරීම් කරමින් අපි ඒ අවස්ථාවල මැදිහත් වුණා. කොරෝනා වසංගතය ආපු වෙලාවේත් අපි ලක්ෂ ගණනක් මාස්ක් දාගෙන, ටැපටා රෙදිවලින් ආරක්ෂිත කබා මහගෙන සියලු සෞඛ්‍ය අංශවලට උදවු කළා. ඒ කාලවල අපි කට වහගෙන නිකම් හිටියේ නැහැ. බිමට බැහැලා හැමෝටම උදවු කරමින් සක්‍රියව මැදිහත් වුණා. මේ වෙලාවේ රාජ්‍ය නිලධාරීන්ට භය, භීතිකාව හදන්න විපක්ෂය කොච්චර උත්සාහ කළත්, ග්‍රාම නිලධාරිවරයාට රුපියල් 50,000කුත්, ප්‍රාදේශීය ලේකම්තුමාට රුපියල් ලක්ෂ 500කුත්, දිසාපතිතුමාට රුපියල් ලක්ෂ 1,000ක් දක්වාත් වියදම් කරන්න නීතිමය බලය ලබා දුන්නා; ඒ අවස්ථාව හදලා දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මට තව තත්ත්පර කිහිපයක් ලබා දෙන්න.

ඉතින් සහන සියල්ල ලබා දෙන අතරේ අපි සපථ කරලා කියනවා, මිය ගිය අයගේ ජීවිත හැර ඉතිරි සියල්ල යථාවත් කරන බව. අපි මේ අභියෝගය භාර ගන්නවා. නැති වුණු ජීවිත අපට ආපසු ලබා දෙන්න බැහැ. නමුත් ඉතිරි සියල්ල අපි යථාවත් කරනවා.

සුනාමියෙන් අපේ රටට ලැබුණු අවස්ථාව, යුද ජයග්‍රහණයෙන් අපේ රටට ලැබුණු අවස්ථාව, කොරෝනා වසංගතයෙන් අපේ රටට ලැබුණු අවස්ථාව මඟ හැර ගත්තා වාගේ මේ අවස්ථාව අපි මඟ හැර ගන්නේ නැහැ. අපේ ආණ්ඩුව මේ වගකීම, මේ අභියෝගය භාරගෙන මේ රට තිබුණු තැනින් පියවර ගණනක් ඉහළට ඔසවා තබන්න මෙය අවස්ථාවක් කර ගන්නවා කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 2.02]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

මට පෙර කථා කරපු මන්ත්‍රීවරයා කියපු කථාවකින් මගේ කථාව පටන් ගන්න ලැහැස්තියි. එතුමා කිව්වා, "ජීවිත ටික නම් අපට දෙන්න බැහැ" කියලා. ඔව්, අපි ඒක දන්නවා. ජීවිත ටික තමයි මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. දේපොළ ටික නම් හෙට අනිද්දා වෙනකොට බිලියනවලින් තක්සේරු කරයි. හැබැයි, නැති වුණු ජීවිත ආපසු ගන්න බැහැ. වෙන මොකුත් නොවෙයි, ඒක තමයි අපිත් මේ කියන්නේ.

මේ සුළි කුණාටුවෙන් වැඩියෙන්ම හානියට ලක් වුණු තවත් දිස්ත්‍රික්කයක් තමයි මා නියෝජනය කරන පුත්තලම දිස්ත්‍රික්කය. විශේෂයෙන්ම වෙන්නප්පුව ආසනය -මා සංවිධානය කරන ආසනය- කවදාවත් නොවුණු විධියට ආපදාවට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා මමත් ඒ සම්බන්ධයෙන් වචන කීපයක් කිව යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආපදාවක් වළක්වන්න බැහැ. එන එක එනවා. නමුත්, අපට ඒකට සූදානම් වෙන්න පුළුවන්. දවස් තුනහතරක් තිස්සේ ආණ්ඩුවේ සහ විපක්ෂයේ ඇමතිවරු, මන්ත්‍රීවරු ආපදා තත්ත්වයට සූදානම් වීම සම්බන්ධයෙන්, පුරෝකථනය සම්බන්ධයෙන් විවිධ අදහස් පළ කළා. ඒ නිසා මමත් ඒ සම්බන්ධයෙන් අදහස් පළ කරන්න යන්නේ නැහැ. මොකද, මම ඒ සම්බන්ධයෙන් අදහස් පළ කළත් ආණ්ඩුව ඒවා පිළිගන්නේ නැහැ. මට මොකක් හරි කියලා නැවතත් ඒක වහන්න හදයි.

මම කථා කරන්න හදන්නේ, මේ ව්‍යසනය වුණාට පස්සේ සම්බන්ධීකරණය - coordination - සිද්ධ වුණේ කොහොමද කියන එක ගැනයි. ඒ සම්බන්ධයෙන් අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා නියෝජනය කරන වෙන්නප්පුව ආසනය තුළ ඒ ආපදාව සිදු වුණු දා ඉඳලා අද වනකල් ආපදා කමිටුවක් රැස් වෙලා නැහැ. ඒ බිමේ වැඩ කරන මන්ත්‍රීවරයෙකු විධියටයි මම මේ කථා කරන්නේ. ඒ වාගේම, මේ ආපදාව ගැන සාකච්ඡා කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් විධියට අපට අද වනකල් කථා කරලා නැහැ.

මම වෙන්නප්පු ආසනය පුරා ගියා. ඒ වාගේම, නාත්තන්ඩිය ආසනයේ බොහෝ තැන්වලටත් ගියා. ඒ දිස්ත්‍රික්කයේ අමාත්‍යවරු දෙන්නෙක් ඉන්නවා. හැබැයි, මම මේ වනකල් ඒ දෙදෙනාගේ මුහුණවත් දැක්කේ නැහැ. ඒ වාගේම ඒ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු පස්දෙනෙක් හෝ හයදෙනෙක් ඉන්නවා. මම ඒ අයව දැක්කේත් නැහැ. මේක තමයි සම්බන්ධීකරණයේ තත්ත්වය. ලබන සතියේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නම් කැඳවා තිබෙනවා. ඒක සාමාන්‍යයෙන් කැඳවන එක. මේ ආපදාව සම්බන්ධයෙන් තිබෙන coordination එකේ තත්ත්වය ඔන්න ඕකයි. කෙටින්ම ගමේ භාෂාවෙන් කියනවා නම්, coordination බින්දුවයි. මම මේ කථා කරන්නේ, මේ ව්‍යසනයෙන් පස්සේ සිදු වුණු දේවල් ගැන. නිසි සම්බන්ධීකරණයක් - coordination එකක් - තිබුණා නම් මේ ව්‍යසනය මීට වඩා අවම කර ගන්න තිබුණා, මිනිසුන්ට සහන සලසන්න තිබුණා කියන මතයේ ඉඳගෙනයි මම මේ කථා කරන්නේ. මන්ත්‍රීවරුන් දකින්න නැහැ කියලා මිනිස්සු නම් කොහොමත් බණිනවා. ආණ්ඩුව ඒක ගණන් ගන්න එපා. මොකද, හැමෝම එහෙම බණිනවා. හැබැයි, මම මේ කියන්නේ ඇත්ත. ඒ ආසනය තුළ දවස ගණනේ දුවපු මනුස්සයෙකු විධියට මට මේ වනකල් හමු වෙලා නැහැ, ඒ දිස්ත්‍රික්කයේ ඉන්න ඇමතිවරුන් දෙදෙනාවත්, එක මන්ත්‍රීවරයෙකුවත්. මම මේ චෝදනාව එල්ල කරන්නේ, අපට තිබෙන අදහසවත් අහන්නේ නැති නිසායි. මොන coordination ද? අඩුම ගණනේ අපට තිබෙන අදහස මොකක්ද කියලාවත් අහපල්ලකෝ; "මන්ත්‍රීතුමා, ආසනය විනාශයි, මිනිසුන්ගේ ජන ජීවිතය විනාශයි. මොකක්ද මන්ත්‍රීතුමා, අපි මේකට කරන්නේ?" කියලාවත් අහපල්ලාකෝ. එහෙම අහන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාස කරන්න, සමහරුන්ගේ ගෙවල් වීතරක් නොවෙයි, ඉඩම් පවා නැහැ. මාඔය දෙපස තිබුණු ඉඩම් පවා නැහැ. ගෙවල් නම් හදා ගන්න පුළුවන් කියමු. හැබැයි, ඉඩම් කොහෙන්ද? එහෙමයි coordination සිද්ධ වුණේ. මම බෙහෙවින්ම කනගාටු වෙනවා, ඒ සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෲප් කැප්ටන් නිර්මාල් සියඹලාපිටිය මැතිතුමා ගැනත් මා වචනයක් කථා කළ යුතුයි. එතුමා, මගේ විදුහලේ මට වඩා අවුරුද්දක් පහළ පන්තියේ හිටපු සහෝදරයෙක්. එතුමාගේ ගමේ, එතුමා හැමදාම ඉස්කෝලේ යද්දී එහා මෙහා ගිය පාලමෙන් පහළට වැටිලා තමයි එතුමාගේ ජීවිතය නැති වුණේ. මම මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අවධානය යොමු කරන්න හේතුවක් තිබෙනවා. මමත් එදා උදේ ඉඳන් හවස් වනකල්ම ඒ පාලම අසලින් ලොරියකින් බඩු අරගෙන එහා මෙහා ගියා, ඒ බඩු මිනිසුන්ට ලබා දෙන්න. ඒ කටයුතුවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වුණා කියා මම දන්නවා. ඒ ලොරියත් පෞද්ගලික සමාගමකින් ලබා දීපු ලොරියක්. අපි ඒකෙන් එහාට මෙහාට ගියා. අන්තිමේදී නැසීගිය ගෲප් කැප්ටන් නිර්මාල් සියඹලාපිටිය මැතිතුමාගේ දේහය අප ගෙනාවේත් ඒ ලොරියෙන්.

ඒක එතැනට පහත් කරන්න හදපු හේතුව මොකක්ද කියන එක අදටත් රහසක්. අපි ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, ඒ සම්බන්ධව investigation එකක් යනවා, Sri Lanka Air Force එකෙන්. අපි ඒ කටයුතු එතැනට භාර දෙමු. හැබැයි, මට කියන්න තිබෙන්නේ මේකයි. බඩු පාර්සලයක් දැම්මා කියලා කියනවා. ඒක දැකපු අය ඉන්නවා. මොකක්ද, මේ coordination එක? එසේ බඩු පාර්සල් දැම්මාට, කොහේ ඉන්න මිනිස්සුද ආපදාවට ලක් වෙලා ඉන්නේ, කොහේ ඉන්න අයටද කන්න නැත්තේ, කොහේ ඉන්න අයටද වතුර නැත්තේ කියන එක ගැන කිසිම data එකක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා එම සම්බන්ධීකරණය ගැන මම සෘජුවම ආණ්ඩුවට චෝදනාව එල්ල කරනවා. මම මේ කියන්නේ predict කරපු එකක් ගැනවත්, වාන් දොරටු ඇරපු එකක් ගැනවත් නොවෙයි. පුළුවන් නම් මේකටත් මට බැණලා මේ කාරණාත් වහගන්න උත්සාහ කරන්න. මම කථා කරන්නේ පුත්තලම දිස්ත්‍රික්කය ගැන. මම දැක්කා, සමහර තැන්වල ආපදා කමිටු කැඳවා තිබෙනවා. හර්ෂ ද සිල්වා මැතිතුමා දැනුත් AGA Office එකට යන්න ඕනෑය කියලා ගියා, කෝට්ටේ වැඩ කටයුතු බලන්න. අපට කෝ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බලෙන් තුන්-හතර වතාවක් ගිහිල්ලා තමයි වැඩ කළේ. අන්තිමට ඒ මිනිස්සුන්ට මම කරදරයක් වෙන්නත් ආවා. ඒ නිසා මම මගේ වැඩක් බලාගෙන අපට දෙන්න පුළුවන් සහනයක් දී ගෙන හිටියා. නැත්නම් ඒකටත් බැණුම් අහන්න වෙනවා. අපි දැක්කේ නැහැ, ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් ඇවිල්ලා මේ දේවල් සමනය කරන්න වැඩ කරනවා. ඒක නිසා මම ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, දැන්වත් ඒක කරන්න කියලා. ඒ වාගේම එදා සිදු වුණු අනතුරින් මිය ගිය ගෲප් කැප්ටන් නිර්මාල් සියඹලාපිටිය මැතිතුමාට මගේ පාසල වෙනුවෙනුත්, මගේ ගම වෙනුවෙනුත්, මගේ ප්‍රදේශය වෙනුවෙනුත් මොක්සුව ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපට මේ ආපදාව සමනය කරගන්න තිබුණා, ඒ වෙලාවේ හොඳ communication එකක් තිබුණා නම්. නමුත් සන්නිවේදනය බිඳ වැටීමෙන් විශාල හානියක් සිද්ධ වුණු බව අපි දන්නවා. ඒ හිටපු තැන්වලින් මිනිස්සු හොයා ගන්න දවස් ගණන් ගත වුණා. මගේ එක ලේකම්වරයෙක් සොයා ගත්තේ පෙරේදා. මොකද, ඒ වෙනකම් නිසි පරිදි සන්නිවේදනය තිබුණේ නැහැ. අපි පෙරේදා වාහනයකින් ගිහින් ඔහුව සොයා ගත්තේ. එතෙක් ඔහු උඩට, උඩට ගිහිල්ලා අන්තිමට එක ගෙදරක නතර වෙලා හිටියා.

දැන් digital economy එකක් නේද හදන්න යන්නේ? එතකොට මොකක්ද මේ සන්නිවේදන ආයතනවලින් වන සේවය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා Facebook එකේ මේ සන්නිවේදන ආයතනය සම්බන්ධයෙන් පළ කර තිබුණු එකක්. එහි ලියා තිබුණේ, "ආපදාවක් වුණාම මුලින්ම හැර යන මිතුරා" කියලායි. ජනාධිපතිතුමා මේකේ ලොකු ලොකු මිනිස්සු තමයි උපදේශකයන් විධියට තියාගෙන වැඩ කරන්නේ. අපි අහනවා, මේකද උපදෙස් දෙන විධිය කියලා. මේකද ඩිජිටල් ආර්ථිකය හදන්න යන විධිය? අපි දන්නවා, ප්‍රායෝගිකව ප්‍රශ්න එන්න පුළුවන් බව. ඇමතිතුමන්ලාත් කියා තිබුණා, වැඩ කරන්න ගිය සමහර මිනිස්සුන්ට දැදුරුඔය ආශ්‍රිත කැලේ රෑ දෙකක් පමණ ඉන්න වුණා කියලා. අපි පිළිගන්නවා, ඒ මිනිස්සු ඒ වෙනුවෙන් මහන්සි වුණා. ඒ මිනිස්සුන්ට අපේ උපහාරය පුද කරනවා. හැබැයි, ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? මේ ආපදාව සිදු වුණේ 2025දී. එතකොට ඩීසල් නැහැ කියලා මුළු සන්නිවේදන ජාලයම බිඳ වැටුණොත් ඒක හරිද? මේ යන විධියට නම්, නැවතත් මේ වාගේ මොකක් හරි දෙයක් වුණොත්, මිනිස් ජීවිත නැති වීම මේ ප්‍රමාණයෙන් නතර වෙන්නේ නැහැ කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියාත් මා කාරුණිකව ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මාධ්‍යයේ හැසිරීම ගැනත් කථා කළ යුතුයි. ආපදා කළමනාකරණය කියන විෂයයේ එක අංශයක් තමයි ජනමාධ්‍ය හැසිරවීම through governance. ඒක කළාද කියලා මම අහන්න කැමැතියි. මම දැක්කා, මාධ්‍යවලට පලු යන්න බණිනවා; සමාජ මාධ්‍යවලට ලියන මිනිස්සු අත්අඩංගුවට ගන්න බලනවා. හැබැයි, මාධ්‍ය හැසිරීම විවේචනය කරන එකද කරන්න ඕනෑ, නැත්නම් මාධ්‍ය හසුරුවන එකද කරන්න ඕනෑ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් මෙහෙම cyclones ආවාම, - සුනාමි ව්‍යසනය වෙලාවේ, වෙනත් ව්‍යසන සිදු වුණු වෙලාවේ - ආණ්ඩුවෙන් මාධ්‍ය මධ්‍යස්ථානයක් හැදුවා. එහෙම හදලා එම මධ්‍යස්ථානය හරහා ඒ වෙලාවේ වන සියලු කටයුතු ජනතාවට දැනුම් දුන්නා. නමුත් අද වෙනකම් මීට අදාළ මාධ්‍ය මධ්‍යස්ථානයක් හදලා තිබෙනවාද? මාධ්‍ය මධ්‍යස්ථානය යකාට ගියත්, අඩු ගණනේ ජනාධිපතිතුමා කර්තෘ සංසදය සහ විකාශකයන්ගේ සංසදය - Editors' Guild එක සහ Broadcasters' Guild එක - හම්බ වෙලා තිබෙනවාද? ඒ අය කැඳවා තිබෙනවාද? මේ විධියට මාධ්‍ය හසුරුවන්න කියලා ඔවුන්ට උපදෙස් දීලා තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පැමිණියාට පසුව මට ලබා දෙන වේලාව ගැන කථා කරගන්න පුළුවන්. ඒ නිසා කරුණාකරලා මට තව විනාඩියක් ලබා දෙන්න.

මම සඳහන් කරමින් සිටියේ මාධ්‍ය හැසිරවීම ගැනයි. මේ වෙනකම් නිසි විධියට මාධ්‍ය හසුරුවා නැහැ. අද දෙරණටයි, අරකටයි, මේකටයි බණිනවා. ඊළඟට, මොකක් හරි prediction එකක් කළාය කියලා මෙතැන ඉන්න මන්ත්‍රීවරයෙක් අල්ලා ගෙන ඒකටත් බණිනවා. ඒකද කළ යුත්තේ? ආණ්ඩුවෙන් මේ වෙනකම් මාධ්‍ය හසුරුවා තිබෙන්නේ කොහොමද? මේ වෙලාවේ මාධ්‍යයට සම්බන්ධ ඇමතිවරු සභාවේ නැහැ. මම කියන්න කැමැතියි, කරුණාකරලා ආපදා කළමනාකරණය කියන කාරණය දැන්වත් හිතට ගන්න කියලා. ඒ වාගේම මාධ්‍ය හරහා ඒ සම්බන්ධ වැඩ කටයුතු කරන්න කියන එකත් මා මතක් කරනවා. මොකද, මාධ්‍ය ආයතන ටික තමයි මිනිස්සුන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ ටිකවත් එකතු කරලා ගම්වලට ගිහින් දුන්නේ. නමුත් ඔබතුමන්ලා තවම මෙතැනට වෙලා කෙහෙල් ගෙඩියක නම ගහපු එකක් ගැන කියවා කියවා ඉන්නවා. අඩු ගණනේ ඔබතුමන්ලා කෙහෙල් ගෙඩියක්වත් දුන්නේ නැහැ නේ. ඇත්ත කථාව ඒක නේ. ඒක නිසා එහෙම කථා කරන්න එපා. කෙහෙල් ගෙඩියක්වත් ලැබුණේ නැති මිනිස්සු මේ වෙලාවේ ගෙවල්වල හිරවෙලා ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඇමෙරිකා එක්සත් ජනපදයට Hurricane "Katrina" ආපු වෙලාවේ coordination තිබුණේ නැහැ කියන එක තමයි අවසානයේ කිව්වේ. මේ White House Paper එකේ coordination ගැන හොඳට ලියා තිබෙනවා. මේක කියවලා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක **සභාගත*** කරනවා. කියවා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ජෝර්ජ් එච්.ඩබ්ලිව්. බුෂ් මැතිතුමා මෙන්න මෙහෙමයි අවසානයේදී කියලා තිබෙන්නේ. "This Government will learn the lessons of Hurricane "Katrina. We are going to review every action and make necessary changes so that we are better prepared for any challenge of nature or act of evil men that could threaten our people." අඩු ගණනේ මේවා කියවලාවත් lesson එකක් ඉගෙන ගෙන අපි ඉදිරියට මුහුණ දෙමු. ඒකට අපිත් පුළුවන් විධියට උපකාර කරන්නම් කියමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 2.11]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று முழு நாடும் சோகத்தில் ஆழ்ந்திருக்கக்கூடிய நேரத்திலே, அனர்த்தத்தினால் பாதிக்கப்பட்டு உயிரிழந்த உறவுகளுக்கும், அவர்களின் இழப்பையிட்டுச் சோகத்தினால் வாடும் குடும்ப அங்கத்தவர்களுக்கும் எனது ஆழ்ந்த இரங்கலைத் தெரிவித்துக்கொண்டு, எனது உரையைத் தொடங்கலாம் என்று நினைக்கின்றேன். உண்மையிலே, இந்தப் புயலானது யாரும் எதிர்பாராவண்ணம் ஒரு பாரிய சேதத்தை எமது தேசத்திலே ஏற்படுத்தியிருக்கிறது. விசேடமாக, இரவு நேரத்திலே தூங்கிக்கொண்டிருந்த மக்கள் கண் விழித்துப் பார்ப்பதற்குள் அவர்களுடைய உயிர் இந்த மண்ணைவிட்டுச் சென்றிருக்கிறது.

நான் இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்ட பல மாவட்டங்களுக்கு நேரடியாகச் சென்று, அங்குள்ள மக்களைப் பார்வையிட்டபொழுது, மிகவும் பாதிப்படைந்த நிலையிலே இருக்கின்ற அவர்களுடைய உணர்வுகளைப் புரிந்துகொள்ளக்கூடியதாக இருந்தது. பொறுப்புவாய்ந்த அரசாங்கம் என்ற அடிப்படையிலே, அந்த மக்களுக்காக இரவு பகலாகத் தூக்கமின்றிச் சேவை செய்துகொண்டிருக்கின்ற முப்படையினர், பொலிஸார் மற்றும் அரச உத்தியோகத்தர்களுக்கு முதலாவதாக நான் நன்றி தெரிவித்துக் கொள்கிறேன். அதேபோல், அனர்த்தம் நடந்த நாளிலிருந்து இன்றுவரை பல்வேறுபட்ட வெளிநாடுகள் எமது நாட்டுக்கு உதவிக் கரம் நீட்டி ஆதரவளித்து வருகின்றன. அதேபோல, அரச சார்பற்ற நிறுவனங்களும் எமக்கான உதவிகளை வழங்கிவருகின்றன. இந்நேரத்திலே அவர்கள் வழங்கிவரும் உதவிகளுக்கும் நான் நன்றி கூறிக் கொள்கிறேன்.

எமது நாடு மனித நேயமிக்கவர்கள் நிறைந்த நாடாக இருக்கின்றது. எங்களுக்குள் எவ்வகையான முரண்பாடுகள், பிரச்சினைகள் இருந்தாலும், ஆபத்து நேரத்திலே இனம், மதம், மொழி பேதமின்றி அனைத்து மக்களும் ஒன்றிணைந்து பாதிக்கப்பட்ட மக்களுக்கு உதவுவதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. உண்மையில் எங்கள் நாட்டு மக்களின் இத்தகைய மனநிலையை, உதவும் மனப்பாங்கையிட்டு நாங்கள் பெருமை கொள்ளக்கூடியதாக இருக்கின்றது.

குறிப்பாக, இந்த வெள்ளத்தால் அதிகம் பாதிக்கப்பட்ட மக்களாக எமது மலையக உறவுகள் இருக்கின்றார்கள். இன்று அந்தப் பகுதிகளை எடுத்துக்கொண்டால், ஒரு வீட்டிலே 2-3 குடும்பங்கள் வாழ்கின்றன. கடந்த காலத்திலே அனர்த்தம் ஏற்படப் போகின்றதென முன்கூட்டியே அறிவித்தாலும்கூட, அவர்கள் சென்று தற்காலிகமாகத் தங்கியிருப்பதற்கு வேறு இடங்கள் இருக்கவில்லை. அந்த மக்கள், "எங்களைச் செல்லச் சொல்கின்றார்கள், நாங்கள் எங்கே செல்வது? எங்கே எங்களுக்குப் பாதுகாப்பு இருக்கின்றது?" என்று கேட்கின்றார்கள். எனவே, அனர்த்த நிலைமைகளின்போது, அவர்களைத் தற்காலிகக் கூடாரங்களுக்குள் அமர்த்திவிட்டு, மீண்டும் அந்த மக்களை அனர்த்தத்துக்கு முகங்கொடுக்கக்கூடிய சூழலிலே இருத்தாமல், அவர்களுக்கு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும். நிச்சயமாக இந்த மக்களுக்கு நிரந்தரமான, பாதுகாப்பான வீடுகளை அல்லது காணிகளை வழங்குவதற்கு எங்களுடைய அரசாங்கம் மிக விரைவிலே நடவடிக்கை எடுக்குமெனக் கூறிக் கொள்கின்றேன். *[இடையீடு]* நன்றி, கௌரவ மனோ கணேசன் அவர்களே! எங்களுடைய மக்களுக்கு இன்று மிக முக்கியமானது நிலம். "எங்களுக்கு வீடு கட்டிக்கொடுக்காவிட்டாலும் பரவாயில்லை. எங்களுக்கான நிலத்தைத் தாருங்கள்!" என்று மக்கள் கேட்கிறார்கள். எனவே, தோட்டப் பகுதிகளில் இருக்கின்ற பாதுகாப்பான நிலங்களை அந்த மக்களுக்கு வழங்குவது மிக முக்கியமானதாகும்.

இன்று இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற நிலைமையை வைத்து, மக்களுடைய சடலத்தின்மீது ஏறி நின்று எதிர்க்கட்சியினர் அரசியல் செய்துகொண்டு இருக்கிறார்கள். விசேடமாக, இந்த நேரத்திலே அரசாங்கம் செய்யும் நல்ல செயல்களுக்கு, முன்னெடுகின்ற நடவடிக்கைகளுக்கு எங்களோடு சேர்ந்து ஒத்துழைப்பு வழங்கி, அவற்றை முன்னோக்கிக் கொண்டு செல்லாமல், இவர்கள் பின்னோக்கி இழுத்து அதைக் கெடுத்துவிட நினைக்கிறார்கள். யார் என்ன நினைத்தாலும், யார் என்ன செய்தாலும் பீனிக்ஸ் பறவை போல எமது நாடு குறுகிய காலத்திலே மீண்டெழும்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப்)
(The Hon. Sundaralingam Pradeep)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இவ்விவாதத்தின்போது, நாங்கள் இந்த அமைச்சினூடாகப் பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு இருக்கிறோம் என்பதைக் கூற வேண்டும். அடுத்த வருடத்துக்கான வீட்டுத் திட்டம் மற்றும் பல்வேறு உட்கட்டமைப்புச் செயற்றிட்டங்களைச் செயற்படுத்தத் தீர்மானித்திருக்கின்றோம். விசேடமாக, உலக நாடுகளிலிருந்து பல்வேறு தலைவர்கள், சொந்தங்கள் அனைவரும் இந்த நேரத்திலே எங்களுடைய மக்களுக்கு உதவ முன்வந்திருக்கிறார்கள். அவர்களுக்கும் நான் மீண்டும் நன்றி தெரிவிப்பதோடு, முன்பைவிட பலமாய் மீண்டு வருவோமெனக்கூறி, விடை பெறுகிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම මේ ව්‍යසනය හේතුවෙන් ජීවිත අහිමි වූ සියලුදෙනා වෙනුවෙන් මාගේ කනගාටුව, සංවේගය මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. විශාල පිරිසකගේ දේපළවලට හානි සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම රෝගාතුරව සිටින සියලුදෙනාටත් මම ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා. ඇත්තටම ඉතාම කනගාටුයි. අනෙක් දිස්ත්‍රික්ක හා සංසන්දනය කරනකොට, මා නියෝජනය කරන ගම්පහ

දිස්ත්‍රික්කයේ මරණ සංඛ්‍යාවේ යම් අඩුවක් තිබුණත්, සිදු වූ විනාශයත්, දේපළ හානියත් අතිමහත්. ඊයේ දිනයේ දීත් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා සමඟ අපි ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පේ, බියගම ස්ථාන කිහිපයකට ගියා. අද දිනයේදීත් තවත් ස්ථාන කිහිපයකට යන්න බලාපොරොත්තු වෙනවා. ඉතාම කනගාටුයි කියන්න, මේ බලපෑම අවම කර ගැනීම තුළින් මේ ප්‍රශ්නය විසඳා ගන්න තිබුණා. ඇත්තටම මේ ආණ්ඩුවේ නොහැකියාව නිසා, මේ ආණ්ඩුවේ අදක්ෂතාව නිසා, ඒ වාගේම අත්දැකීමක් නැතිකම නිසා තමයි මේ බලපෑම අවම කර ගන්න බැරි වුණේ.

අපට මතකයි, 2017 වර්ෂයේ අපේ ආණ්ඩු කාලයේදී එක පැත්තකින් රටේ නියඟයක්, අනෙක් පැත්තෙන් ගංවතුරක් ඇති වුණු ආකාරය. අපි ඒ තත්ත්වය ඉතා සාර්ථක ලෙස කළමනාකරණය කළා. ඒ නිසා ජීවිත හානි අවම වුණා. හැබැයි අද ඉතා පැහැදිලියි, මේ 200යි, 300යි, 400යි කිව්වාට දහස් ගණනක් ජීවිත අහිමි වෙලා තිබෙන බව. ඒ ගැන මේ රටේ ජනතාව දන්නවා; හැබැයි, ආණ්ඩුව දන්නේ නැහැ. මේ වාගේ විපතක් වෙන්න යනවාය කියලා මේ මුළු ලෝකයම දැනගෙන හිටියා. හැබැයි, ආණ්ඩුව දැන ගෙන හිටියේ නැහැ. දැන් මේ ආණ්ඩුව උත්සාහ කරනවා එක එක පුද්ගලයන්ට චෝදනා කරලා, ඒ පුද්ගලයන් වැරදිකරුවන් බවට පත් කරන්න. නමුත් මම ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මේ පිළිබඳව දැනුවත් කළ බව. නමුත් රජය අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ නැහැ. BBC වාගේ ජාත්‍යන්තර මාධ්‍ය ආයතන මේ පිළිබඳව සඳහන් කළා. "The Indian Express" dated 03.12.2025 ඉතා පැහැදිලිව මේ ගැන කියා තිබෙනවා, I quote:

> "The IMD had first predicted the formation of a depression as early as November 13, and issued an alert over the possibility of cyclogenesis on November 20. From November 23 onwards, IMD issued three-hourly and six-hourly weather updates of the system, indicating its development around November 26. All the information was shared with Sri Lanka in a routine manner.

මේ තොරතුරු - information - සියල්ල සම්බන්ධව "The Indian Express" ලංකාව දැනුවත් කරලා තිබෙනවා.

එතකොට, "දැනගෙන හිටියේ නැහැ, මේ පිළිබඳව අවබෝධයක් තිබුණේ නැහැ, මේ පිළිබඳව දැනුවත් කළේ නැහැ" කියලා තමුන්නාන්සේලා කියන්නේ කොහොමද? ඒක නිසා ඒ වාගේ විහිළු කථා කියන එක නතර කරන්න. තමුන්නාන්සේලා මේ රටේ ජීවිත දහස් ගණනක් විනාශ කරලා; මරණයට පත් කරලා දැන් අත සෝදා ගන්න හදනවා. ඒක නිසා ඉතා පැහැදිලිව අපි කියනවා, මේ වගකීම තමුන්නාන්සේලා බාර ගන්න ඕනෑ කියලා. ඒ විතරක් නොවෙයි. එක පැත්තකින් ජීවිත දහස් ගණනක් නැති වෙනකොට, අනෙක් පැත්තෙන් කෝටි ගණනක දේපළ මිනිසුන්ට අහිමි වෙලා තිබෙනවා. මේ රටේ අහිංසක ජනතාව අමාරුවෙන් හම්බ කරලා හදාගත්ත ගෙදර, හදාගත්ත ව්‍යාපාරය අති දැවැන්ත ලෙස විනාශ වෙලා තිබෙනවා. අද උදෑසනත් මම ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික ස්ථාන ගණනාවකට ගියා. ඒ වෙලා තිබෙන දේ දැක්කාම දරාගන්න බැහැ. හිතාගන්න බැරි තරමට විනාශයක් සිද්ධ වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මොනවාද කරන්නේ? ඊයේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එක්ක අපි බියගම ප්‍රදේශයේ පාසලක පවත්වාගෙන යන අවතැන් කඳවුරකට ගියාම එහි සිටින ජනතාව කියනවා, "මැලිමාවේ මන්ත්‍රීවරු දැන් හොයා ගන්නත් නැහැ" කියලා. ග්‍රාම නිලධාරි මහත්මියක් කියනවා, ඒ ප්‍රදේශයට තවම කවුරුවත් ඇවිල්ලාවත් නැහැ කියලා. අද මාලිමාවේ මන්ත්‍රීවරුන්ට ගමට යන්න බැරිවෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලා මෙතැන කෑ ගහලා වැඩක් නැහැ. මෙතැන කෑ ගහලා වැඩක් නැහැ. කරුණාකරලා ඒ තැන්වලට යන්න; ගිහිල්ලා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා සොයා බලන්න. මේක හදිසි අවස්ථාවක් හැටියට ප්‍රකාශයට පත් කරන්න කියලා කිව්වාම, තමුන්නාන්සේලා ඒ හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරන්නත් ප්‍රමාද වුණා. ඒ වාගේම, තමුන්නාන්සේලා Emergency law එක පාවිච්චි කළේ නැහැ. මෙන්න මේ වාගේ ලොකු අඩුපාඩු ගොඩක් තිබෙනවා.

ඉතාම කනගාටුවෙන් වුණත් මේ කාරණය මම කියන්න ඕනෑ. අද අපේ රටේ ජීවිත දහස් ගණනක් නැති වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ නොහැකියාව නිසායි. තමුන්නාන්සේලා ඒ අවශ්‍ය කළමනාකරණය සිදු කරපු නැති නිසා තමයි මේ තරම් ජීවිත ප්‍රමාණයක් අහිමි වුණේ. මේ අවස්ථාවේදී පක්ෂ, පාට භේදයකින් තොරව අපි හැමෝම මේ රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් උපරිම සේවය ලබා දෙනවා. මේ වෙනකොට මගේ කාර්යාලයෙන් දවස් 4ක්, 5ක් තිස්සේ එක දිගට අපි කෑම උයලා පුළුවන් තරම් ඒ මිනිසුන්ට ලබා දෙනවා. අද දිනයේ දීත්, හෙට දිනයේ දීත්, ඉදිරියේ දීත් අපට කරන්න පුළුවන් සෑම දෙයක්ම අපි කරනවා. එතැන දේශපාලනයක් නැහැ. මෙතැනදී අපි කිසිම දේශපාලනයක් නැතිව තමුන්නාන්සේලාට කියනවා, කරුණාකරලා ඒ වැරැද්ද නිවැරදි කර ගන්න කියලා. ඉදිරියේදී ඒ වරද නිවැරදි කර ගනිමු. අඩු ගණනේ මේකෙන් තේරුම් ගන්න; මේකෙන් ඉගෙන ගන්න. දැන් අපි ඉල්ලීමක් කරනවා, ආපදා කළමනාකරණ අරමුදලක් ඇති කරන්න කියලා. අද පැවති රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. මේ, "Rebuilding Sri Lanka" අරමුදල කියන එක නොවෙයි. ඒකත් හරි. ඒක මේ අවස්ථාවට විතරයි. නමුත්, එහෙම නොවෙයි, ස්ථිර වශයෙන් ආපදා කළමනාකරණ අරමුදලක් ඇති කරන්න. ඒ විධියට ආපදා කළමනාකරණ අරමුදලක් ඇතිකළොත් අදට විතරක් නොවෙයි, තමුන්නාන්සේලාට ස්ථිර වශයෙන්ම ඒක තිබෙනවා. අනෙක් කාරණය මේකයි. මේ "Rebuilding Sri Lanka" අරමුදල වෙනුවෙන් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ "Rebuilding Sri Lanka" අරමුදල වෙනුවෙන් පත් කරපු කමිටුවේ පිරිමි පමණයි ඉන්නේ. මේ සම්බන්ධයෙන් අපේ රටේ ලොකු විවේචනයක් තිබෙනවා. මේ රටේ ජනගහනයෙන් සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. අපේ රටේ දක්ෂ කාන්තාවන් ඉන්නවා. මේ "Rebuilding Sri Lanka" අරමුදලේ සාමාජිකයන් හැටියට ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන් විශාල පිරිසක් පත් කර තිබෙනවා. ඒක හොඳයි. නමුත්, කාන්තාවන් කිහිප දෙනෙක් හරි ඒකට ඇතුළත් කළ යුතුයි. කරුණාකර ඒක නිවැරදි කරන්න.

මම මේ වෙලාවේදී විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ රටට 2016 -2017දීත් මේ වාගේ ව්‍යසනයක්, natural disaster එකක්, ඇති වුණා. එතකොට අපි රටක් විධියට රක්ෂණය කරලායි තිබුණේ. ඒ වාගේ රක්ෂණයක් පිළිබඳවත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න. එදා ඒ රක්ෂණය තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට, එහෙම නැත්නම් SMEsවලට, සාමාන්‍ය ජනතාවට, ගෙවල්වලට අතිදැවැන්ත මුදල් ප්‍රමාණයක් ලබා දුන්නා, තමන්ගේ ව්‍යාපාර ඇතුළු නිවාස යළි ගොඩ නඟාගන්න. එම නිසා ඒ පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න. අවසාන වශයෙන්, අපේ රටට සහයෝගය ලබා දුන් සෑම රටකටම සහ සෑම කෙනෙකුටම මම මේ වෙලාවේදී ස්තුතිවන්ත වෙනවා. ජාත්‍යන්තරයේ රටවල් ගණනාවක් අතිදැවැන්ත ලෙස අපට අනුකම්පා කරලා සහයෝගය ලබා දී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පෞද්ගලික අංශයත්, අපේ මාධ්‍ය ආයතනත් මෙහිදී විශාල කැප කිරීමක් සිදු කළා. අපේ රටේ පෞද්ගලික අංශයත් අපේ අහිංසක ජනතාව ශ්‍රී ලාංකිකයන් කියන හැඟීමෙන් යුතුව ජාති, ආගම් භේද හැම දෙයක්ම අමතක කරලා හැම කෙනෙකුටම විශාල වශයෙන් සහයෝගය ලබා දුන්නා.

ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ග්‍රාම නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් මේ අවස්ථාවේදී ලොකු සහයෝගයක් ලබා දුන්නා. අනේ පව්, එම ග්‍රාම නිලධාරින් කියනවා, "සර්, මේ රටේ ජනතාවට සහන සලසන්න ඉස්සෙල්ලා අපට boots දෙකක් දෙන්න" කියලා.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
– (மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

සමහර තැන්වල ග්‍රාම නිලධාරින්ට අද boots දෙකක්වත් නැහැ. ඊයේ මම මල්වාන ප්‍රදේශයට ගියා. ඇත්තටම මට සතුටුයි, මල්වානේ මහ පල්ලිය, නබියතුල් කාදිරිය්යාහ් සංවිධානයේ තරුණ පිරිස එකතු වෙලා සියලුදෙනාගේම සහයෝගය ඇතිව ආපදාවට පත් ජනතාවට සහන සැලසීම වෙනුවෙන් දැවැන්ත සේවාවක් කිරීම පිළිබඳව. මේ රටේ අහිංසක ජනතාව වෙනුවෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණු ඒ සියලුදෙනාට ගෞරවය සහ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.28]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි කාලය අඩු වෙලා තිබෙන්නේ? මට විනාඩි 7ක් වෙන් කරනවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ හෝ, මට කාලය වෙන් කළාට බොහොම ස්තුතියි.

මෙම ව්‍යසනයෙන් ඇත්තටම ලංකාවේ වැඩියෙන්ම හානියට පත් වුණේ මහනුවර දිස්ත්‍රික්කය. ඒකෙනුත් වැඩියෙන්ම හානි වුණේ ගම්පොල ආසනයට. අපේ ජනතාවට එදා දවසේ බොන්න වතුර ටිකක්වත් තිබ්බේ නැහැ. ඒ වාගේම ඒ වෙලාවේ අපට ලොකු ප්‍රශ්නවලට මැදිහත් වෙන්න වුණා. මමත් ආපදාවට පත් වෙලා තමයි ඉන්නේ. ඒ වුණත්, අපි ජනතාව වෙනුවෙන් වැඩ කරන්න කැපවී සිටිනවා.

මම තව කාරණයක් කියන්න ඕනෑ. මහනුවර දිසාපති ඉන්දික උඩවත්ත මැතිතුමාත්, මමත් නුවරට ගිහින් ඒ පැත්තේ හිර වෙලා හිටියා. එදා මට ගම්පොලට එන්න හම්බ වුණේ නැහැ. මමත් දිසාපති කාර්යාලයට ගිහිල්ලා එදා රෑ අපි එළිවෙනකල් මේ මෙහෙයුම දියත් කළා. ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමාටත් අපි ස්තුති කරන්න ඕනෑ. තනුර දිසානායක මන්ත්‍රීතුමා ගම්පොලට බෝට්ටු ටික ගෙනෙන්න ලොකු උත්සාහයක් ගත්තා. රෑ 1ට ආපු බෝට්ටු ටික උදේ 6 වනකොට තමයි ගම්පොලට ගෙන්වා ගන්න අපට පුළුවන් වුණේ. අපේ හමුදාව, පොලිසිය, ඒ වාගේම ගමේ ඉන්න තරුණ ළමයි අපේ ගම්පොල ජනතාවගේ ජීවිත බේරාගන්න ලොකු උත්සාහයක් දැරුවා.

උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව ආපදාවට ලක් වූ ස්ථානවල තොරතුරු, සහන ලැබීම් පිළිබඳ තොරතුරු, සුරක්ෂිත මධ්‍යස්ථානවල තොරතුරු ඇතුළු බොහෝ තොරතුරු මා ළඟ තිබෙනවා. එම තොරතුරු ඇතුළත් ලේඛන මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මේ වෙලාවේ අපේ ඔළුවේත් ලොකු බරක් තිබෙනවා, ආපදාවට පත් වුණු ජනතාව කොහොමද බේරාගන්නේ කියලා. ඇත්තටම අපි ලොකු මෙහෙයුමක් කළා. නමුත් පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයෙක් කිව්වා, උඩපළාත ප්‍රාදේශීය සභාව විධියට අපි කිසි දෙයක් කළේ නැහැ කියලා. අපේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය උදේ 6.30 වනකොට මේ සම්බන්ධව ජනතාව දැනුවත් කළා. අපි බැබිල ප්‍රදේශයේ, සාලිඇල පන්සල පිටුපස ඉන්න ජනතාව දැනුවත් කළා. ඇත්තෙන්ම කිව්වොත්, 1947න් පස්සේ තමයි ගම්පොලට මෙච්චර ගංවතුරක් ඇවිල්ලා තිබෙන්නේ. ඒක වුණේ එම ජනතාවගේ වැරැද්දක් නිසා නොවෙයි. එම ජනතාවට මේ ගැන අවබෝධයක් නැහැ. මමත් නුවර හිටියේ. මගේ wifeට හා ළමයින්ට මම කිව්වා, කඳවුරකට යන්න කියලා. මගේ ළමයින්වත් ගියේ නැහැ. අපි තට්ටු තුනක් තිබෙන ගෙදරක ඉන්නේ, අපට ගංවතුර එන්නේ නැහැ කියලා තමයි මිනිස්සු ඇත්තටම හිතාගෙන හිටියේ.

අපි සහන සේවා ක්‍රියාත්මක කළේ නැහැ කියලා ඊයේ පෙරේරා දිනක ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා. එතුමාට වැරදි තොරතුරක් ලැබිලා, වැරදි අවබෝධයක් ඇතිවෙලා තිබෙනවා. එතුමා People's Leasing එක ගැන කිව්වා. ඇත්තටම ඒක ගම්පොලට අයිති ස්ථානයක් නොවෙයි. ඒක අයිති වෙන්නේ නාවලපිටියට. ගංවතුරෙන් ගම්පොල ආසනයේ එක පුද්ගලයෙක් තමයි මිය ගියේ. නාය යෑම් වෙලා තමයි හුඟක් අය මිය ගියේ. උඩපළාත ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය අසනීපයෙන් සිටියේ. නමුත් අපේ ලේකම්තුමිය, එම නිලධාරින් ඇතුළු අප සියලුදෙනා එදා ඉඳලා අද වනකල් පැයක් හෝ දෙකක් පමණයි නිදාගන්නේ. එහෙම තමයි මේ සියලු මෙහෙයුම් කටයුතු ටික අපි කරන්නේ.

ඒ වාගේම පොලිසියත් ලොකු වැඩක් කළා. අපේ නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාල්ල "රතු තරුව" සහන සේවා බලකායේ 500ක වාගේ විශාල පිරිසක් ගම්පොලට ඇවිල්ලා සහන සේවාවන් විශාල ලෙස කරනවා. ඇත්තටම අපි සතුටු වෙන්න ඕනෑ, හමුදාව, විදුලිබල මණ්ඩලය, National Water Supply and Drainage Board එක රෑ දවල් නැතිව අපට වැඩ කරන එක ගැන. මට වැඩි විස්තර කියන්න කාල වේලාව නැති නිසා ඒ අයටත්, රජයේ සියලු නිලධාරින්ටත් මේ වෙලාවේ ස්තුති කරන්න ඕනෑ. අපි ඇත්තටම Facebook වීරයෝ වුණේ නැහැ. ඇත්තම කියනවා නම් මම යන්න පුළුවන් සියලු ආපදා කඳවුරුවලට ගියා. ඒ මිනිස්සුන්ට තිබෙන අඩුපාඩු තමයි අපි බැලුවේ. ඔවුන්ට වතුර ලබා දෙන්නේ කොහොමද, කෑම ටික ලබා දෙන්නේ කොහොමද කියන එකයි අපි බැලුවේ. ඒ මිනිස්සු එක්ක අපි photo ගැහුවේත් නැහැ, මාධ්‍යයට දැම්මේත් නැහැ. සමහර විරුද්ධ පක්ෂයේ අය නොයෙකුත් දේවල් කියනවා. ඇත්තටම අපි වීඩියෝ කරලා කිසිම දෙයක් මාධ්‍යයට දැම්මේ නැහැ. අපට ඕනෑ ඒ මිනිස්සුන්ගේ ජීවිත ටික බේරා ගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්පොල නගරයේ තවත් ලොකු ප්‍රශ්නයක් මතුව තිබෙනවා. එම ප්‍රදේශයේ මේ වන විට කුණු ටොන් ගණනක් ගොඩ ගැසී තිබෙනවා. ඒ කුණු එතැනින් ඉවත් කරලා ඒ නගරයයි, ගම් ටිකයි සුද්ධ කරන්නේ කොහොමද කියන එක පිළිබඳ ලොකු ප්‍රශ්නයක් දැන් තිබෙනවා. ඒකට හේතුවකුත් තිබෙනවා. කලින් පාලනය කරපු සියලු රජයයන් අඩුම ගණනේ කුණු කළමනාකරණය කරන්න හෝ ඉඩමක් වෙන් කරපු නැති ප්‍රශ්නය තිබෙනවා. ඇත්තටම ගම්පොල තිබෙන ලොකු ප්‍රශ්නයක්, ඒක.

බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිදු වූ අවාසනාවන්ත සිදුවීම් මාලාව ඇතුළේ තමන්ගේ ජීවිතය දෙවැනි කරලා අනෙක් අයගේ ජීවිත බේරාගන්න උත්සාහ කරලා තමන්ගේ ජීවිත දන් දීපු ත්‍රිවිධ හමුදාවේ ඒ ආදරණීය සහෝදරයන්ටත්, ඒ වාගේම මේ රුදුරු ව්‍යසනයේදී ජීවිත අහිමි වෙච්ච අපේ රටේ පුරවැසියන් වෙනුවෙනුත් ඔවුන්ගේ පවුල්වලට ශෝකය ප්‍රකාශ කර සිටීමට මම මේ අවස්ථාව යොදා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ වැව් ආකාර දෙකක් තිබෙනවා කියලා අපි දන්නවා. එකක් තමයි, ස්වාභාවික වැව්. අනෙක, මිනිසා විසින් සාදන ලද වැව්. අපේ රට පුරාම ව්‍යාප්ත වෙලා තිබෙන්නේ මිනිසා විසින් සාදන ලද වැව්. මිනිසා විසින් සාදන ලද වැව් ආකාර දෙකක් තිබෙනවා. එකක් තමයි, වාරිමාර්ග වැව්. අනෙක, ගංවතුර පාලනය කිරීම සඳහා තනන ලද වැව්. අපේ රටේ ගංවතුර පාලනය කිරීම සඳහා කිසිදු වැවක් ඉදිකරලා නැහැ. ඒ වාගේම අපේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2,000ක් වුණත්, මේ රුදුරු ව්‍යසනයේදී දින 4ක්, 5ක් ඇතුළත මිලිමීටර් 400ක්, 500ක් ඉක්මවපු වර්ෂාපතනයක් ලැබුණා. ඒ නිසා අපේ වැව්වල ජල ධාරිතාව ඉක්මවා ගියා. ඒ නිසා ඒ ජල කඳ ගම් නියම් ගම් සිසාරා ගලන්නට ගත්තා. මේ විපක්ෂය කියනවා, වැව් හිස් කළේ නැහැ, වාන් දොරටු ඇරියේ නැහැ කියලා. ඔවුන් අතිශයින්ම බොරු මතයක් නිර්මාණය කරන්නට හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඉංජිනේරුවන් දක්ෂ වෙලා තිබෙනවා, විශේෂයෙන්ම විශාල වැව්වල බැම්ම ආරක්ෂා කර ගන්නට. මොකද, ඒ බැම් කඩාගෙන ගියා නම් මීට වඩා ව්‍යසනයක් සිද්ධ වනවා.

විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු විධියට මම මතක් කරන්නට ඕනෑ, අපේ දිස්ත්‍රික්කයේ පවුල් 11,300ක පුද්ගලයින් 40,000කට ආසන්න පිරිසක් මේ ව්‍යසනය නිසා අවතැන් වුණා කියන එක. මීට දිනකට පෙරාතුව කථා කළ පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමෙකු කිව්වා, පොළොන්නරුව දිස්ත්‍රික්කයට වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 8යි කියලා. ඒ ගරු මන්ත්‍රීතුමාට මම මතක් කරන්නට ඕනෑ, අපේ දිස්ත්‍රික්කයට විශාල මුදල් ප්‍රමාණයක් මේ ව්‍යසනය වෙනුවෙන් වියදම් කරන්නට ලබා දීලා තිබෙන බව.

විශේෂයෙන්ම ඒ ව්‍යසනයට පත් වූ නිවාස සෝදා පවිත්‍ර කර ගැනීම සඳහා රුපියල් 25,000 බැගින් ලබා දීමට රුපියල් ලක්ෂ 2,280ක් වෙන් කර දිස්ත්‍රික්කයට එවා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගේ ඉල්ලීම මත පිසූ ආහාර, වියළි සලාක සහ කඳවුරු කළමනාකරණයට අද වනකොට රුපියල් ලක්ෂ 270ක් ලබා දී තිබෙනවා.

අද මේ ගරු සභාවේදී මන්ත්‍රීවරයෙකු කිව්වා, මේ තැන්වල මාලිමාවේ මන්ත්‍රීවරු පෙනෙන්න හිටියේ නැහැ කියලා. ඔව්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂය විධියට අපිව ඒගොල්ලන්ට පෙනෙන්නේ නැතුව ඇති. ඒගොල්ලන්ට තිබුණේ කඳවුරකට, දෙකකට ගිහිල්ලා බොරුවට අඬලා වේදනාව පෙන්වලා එන එක විතරයි. රුදුරු ජල කඳ කරපු විනාශයට වඩා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු හිත් පිත් නැතුව බොරු අවලාද නඟමින් ඉන්නවා. අපට තිබුණේ media shows දමන්න නොවෙයි, Facebook එකට ගිහිල්ලා වෙන වෙන විකාර කරන්න නොවෙයි. අපි පවරා ගත්ත වගකීමක් තිබුණා. ඒ වගකීම තමයි, කඳවුරුවල ඉන්න අහිංසක, අසරණ ජනතාවට වෙලාවට ආහාර ටික යවන එක, ඒගොල්ලන්ට අවශ්‍ය බෙහෙත් හේත් ටික යවන එක, ඒ කඳවුරුවල සනීපාරක්ෂක කටයුතු පිළිබඳව සොයා බලන එක. රාජ්‍ය නිලධාරින් එක්ක උරෙන් උර ගැටිලා මේ කටයුත්තට දායකත්වය ලබා දීමට අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම තමයි අපි කළේ. අදත් අපි ඒ දේ තමයි කරමින් ඉන්නේ. ඒ නිසා අපි media shows දමන්න ගියේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. අද වනවිට ඇලහැර අමුණ කඩාගෙන ගිහිල්ලා. ඊයේත් විශාල පිරිසක් එකතු වෙලා අපේ අත්වලින් වැලි තාච්චි ඇදලා නැවත ඒක පිළිසකර කරන්න කටයුතු කළා. කුමාර ඇල්ල කන්ද කඩාගෙන ගිහිල්ලා, පාලම් දෙක අතර කොටසත් කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. දින 14ක් ඇතුළත ඒවා ප්‍රතිසංස්කරණය කරන්න අපි කටයුතු කරමින් ඉන්නවා. මේ ව්‍යසනයෙන් බිඳ වැටුණු පොළොන්නරුව නැවත හුස්ම ගනිමින්, පණ ගනිමින් සිටිනවා කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.39]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சுனாமி அனர்த்தத்திற்குப் பிற்பாடு மழை, சூறாவளி அனர்த்தத்தினால் எதிர்பாராத வகையில் இந்தத் தீவு மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்ற சூழலிலே நாங்கள் இன்றைய அமர்விலே கலந்துகொண்டிருக்கின்றோம். இந்த அனர்த் தத்தினால் பாதிக்கப்பட்ட மக்களை அந்தப் பாதிப்பிலிருந்து ஏதோவொரு வகையிலே மீட்டெடுப்பதற்காகக் கடுமையாக உழைத்த அனைத்துத் தரப்பினர்களுக்கும் எங்களுடைய பாராட்டுகள்!

உண்மையிலே இவ்வகையான மோசமான இயற்கைப் பாதிப்புகள் ஏற்படுகின்றபோது, அந்தப் பாதிப்பை எந்தளவு தூரத்திற்குக் குறைக்கலாம் என்பது பற்றி கவனத்திலெடுக்க வேண்டியது ஓர் அரசினுடைய பொறுப்பு; ஓர் அரசிடம் அதனையே நாங்கள் எதிர்பார்க்கலாம். அதிலிருந்து முற்று முழுதாக மக்களைக் காப்பாற்றலாம் என்பது சாத்தியமில்லாத ஒரு விடயம். அந்த வகையிலே, பல வாரங்களுக்கு முன்பதாகவே பாதிப்புகள் வரும் என்று எச்சரிக்கை விடுக்கப் பட்டும் ஏன் அதற்கேற்ற நடவடிக்கைகள்

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

எடுக்கப்படவில்லை? என்பதை அரசாங்கம் ஆழமாகத் தேடிப் பார்க்க வேண்டும். இது நாங்கள் விமர்சனக் கண்ணோட்டத்தில் சொல்லுகின்ற ஒரு விடயமல்ல. ஆனால், பெருமளவு உயிரிழப்புகள் ஏற்பட்டுள்ளதால், அந்த உயிரிழப்புகளைக் குறைக்காமல் விட்டதற்கான தேடலை நிச்சயமாகச் செய்தேயாக வேண்டும். நான் இதைச் சொல்வதற்குப் பிரதான காரணம், வடக்கு, கிழக்கைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற உறுப்பினர்கள் என்ற வகையிலே எங்களுக்கு இந்த அனர்த்தங்கள் சம்பந்தமாகப் போதியளவு அனுபவம் இருப்பதனாலாகும். சுனாமி அனர்த்தங்களைத் தாண்டி, போரால் மிக மோசமாக மக்கள் பாதிக்கப்பட்ட நிலைமை இருந்தபோது, அதிலிருந்து மக்களைக் காப்பாற்றியதன் அடிப்படையில் இந்த அனர்த்தங்களின் பாதிப்புகளை ஏதோ ஒரு வகையில் குறைப்பதற்குரிய போதிய அனுபவம் இருக்கிறது.

அப்படி இருக்கும்போது, நான் முன்வைக்கின்ற விடயம் என்னவென்றால், நாட்டின் ஏனைய பிரதேசங்களுடன் ஒப்பிட்டுப் பார்க்கின்றபோது இப்போது நிகழ்ந்திருக்கின்ற அனர்த்தத்தினால் வட மாகாணத்தில் பாதிப்புகள் சற்றுக் குறைவாக இருந்தாலும் - கிளிநொச்சி, வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களில் பாதிப்புகள் அதிகமாக இருந்தது - அந்த அனர்த்தங்கள் நடைபெற்றுக்கொண்டிருந்த காலப்பகுதியில் இந்த அரசாங்கம் நடந்துகொண்ட விதம் சம்பந்தமாகப் பலத்த விமர்சனங்கள் இருக்கின்றன என்பது தான். ஏனென்றால், மிகவும் குறைவாகப் பாதிக்கப்பட்ட ஒரு மாவட்டமான யாழ்ப்பாணத்துக்கு முன்னுரிமை வழங்கப்பட்டுத்தான் அங்கு இது சம்பந்தமான கூட்டங்கள் நடைபெற்றன. வட மாகாணத்தில் இருக்கக்கூடிய மற்றைய மாவட்டங்களில் அந்தக் கூட்டங்கள் நடைபெறவில்லை. அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் யாழ்ப்பாண மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவர் என்ற வகையில் அவருடைய தலைமையில் அந்தக் கூட்டம் நடைபெற்றது. வட மாகாண ஆளுநருடைய ஏற்பாட்டிலே மற்றைய மாவட்டங்களிலும் இருக்கக்கூடிய நிலைமைகளை அந்த மாவட்டங்களைச் சேர்ந்தவர்களும் வந்து பேசுவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுத்ததனால் அந்தக் கூட்டம் குழம்பியது. ஆகவே, வட மாகாணத்தைப் பொறுத்த வரையிலே, ஒருங்கிணைக்கப்பட்ட வேலைத்திட்டமொன்றை முன்னெடுப்பதற்கு அரசாங்கம் விரும்பவில்லை என்பது தெளிவாகின்றது. அதுபற்றி நாங்கள் தேடிப் பார்க்க வேண்டும்.

தற்போதைய வட மாகாண ஆளுநர் யுத்தம் நடைபெற்ற காலத்தில் முல்லைத்தீவு மாவட்டத்தில் அரசாங்க அதிபராக இருந்தவர். அவருக்குப் போதிய அனுபவம் இருக்கின்றது. அவருடைய தலையீட்டால்தான் உண்மையில் மற்றைய மாவட்டங்களை ஒருங்கிணைப்பதற்கான முயற்சி நடைபெற்றது. ஆனால், அந்த முயற்சி தோல்வியில்தான் முடிந்தது. அந்தக் கூட்டத்தில் நானும் நேரடியாகக் கலந்துகொண்டிருந்தேன். அதிலே கணிசமான எதிர்ப்பு அரச மட்டத்திலிருந்து வந்திருந்தது. வெளிமாவட்டங்கள் சார்பாக - மன்னார், வவுனியா, முல்லைத்தீவு சார்பாக - பேசியவர்கள் எங்களுடைய கட்சியைச் சார்ந்தவர்கள் அல்லர்; தமிழரசுக் கட்சி உறுப்பினர்களும் அல்லர்; ஜனநாயக தமிழ்த் தேசிய கூட்டணியின் உறுப்பினர்களும் அல்லர். அரச தரப்பு உறுப்பினர்களும் அரச நிர்வாகிகளும் அங்கு வந்து பேசி, விஷயங்களைப் பதிவு செய்வதற்கு முற்பட்டவேளையில், அவர்களை மட்டந்தட்டி அந்தக் கூட்டத்தை மட்டுப்படுத்தியதுதான் மிச்சம்.

அந்த வகையில், நான் இன்னுமொரு விடயத்தைச் சுட்டிக்காட்ட வேண்டும். யாழ்ப்பாணத்தில் ஒட்டுமொத்தமாக 14,459 வீடுகள் ஏதோவொரு வகையில் பாதிக்கப்பட்டிருப்பதாகவும் அதற்காக 25,000 ரூபாய் வீதம் வழங்க நிதி ஒதுக்க வேண்டுமென்றும் சொல்லி, 361,475,000 ரூபாய் ஒதுக்கப்பட்டதாகச் சொல்லப்படுகின்றது. இது சம்பந்தமாக நாங்கள் கொஞ்சம் ஆழமாக யோசிக்க வேண்டும். ஏனென்றால் கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நெடுந்தீவை எடுத்துக்கொண்டால் அங்கு 2024ஆம் ஆண்டு பாதிப்படைந்ததாகப் பதிவுசெய்யப்பட்ட வீடுகளுடைய தொகை 893. ஆனால், இன்றைக்கு நெடுந்தீவில் 1,216 வீடுகள் பாதிப்படைந்திருப்பதாகக் கோரி நிதி ஒதுக்கீடு கேட்கப்பட்டிருக்கின்றது. அந்த அடிப்படையில், 30,400,000 ரூபாய் ஒதுக்கப்பட்டிருப்பது கொஞ்சம் முரண்பாடாக இருக்கிறது. அதற்காக இந்த நிதியை உண்மையிலே பாதிக்கப்பட்ட தரப்பினருக்கு வழங்கக்கூடாது என்று நான் சொல்ல வரவில்லை! கட்டாயம் பாதிக்கப்பட்ட அனைவருக்கும் இந்த நிதி போய்ச் சேர்ந்தேயாக வேண்டும்; அதில் மாற்றுக் கருத்து இல்லை. ஆனால், பாதிக்கப்பட்ட மக்களுடைய நிதியில் ஊழல் நடைபெறக்கூடாது என்பதுதான் எமது நிலைப்பாடு! அந்த வகையில், இந்த விடயத்தில் ஒரு வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்த வேண்டுமென நான் இந்த அரசாங்கத்திடம் தயவுடன் கேட்டுக் கொள்கின்றேன். இது நான் என்னுடைய அறிவின்படி இங்கே வந்து கதைக்கின்ற விஷயமல்ல, பத்திரிகைகளில் வந்திருக்கின்ற ஒரு விஷயம்! 'யாழ் தினக்குரல்' மற்றும் 'உதயன்' பத்திரிகைகளில் இந்த விஷயத்தில் ஊழல் இடம்பெற்றிருப்பதாகச் சந்தேகங்கள் வெளிப்படுத்தப்பட்டிருக்கின்ற ஒரு சூழலிலேதான் இந்த விஷயத்தில் வெளிப்படைத்தன்மை இருக்கவேண்டும் என நான் கோருகின்றேன்.

அந்த வகையில், பாதிக்கப்பட்டதாகக் கூறப்படுகின்ற 14,459 குடும்பங்களுடைய பெயர்ப் பட்டியல் விபரம் அந்தந்தப் பிரதேச செயலகத்தினூடாக வெளியிடப்பட வேண்டும்; அதை அவசரமாகச் செய்யவேண்டும். ஏனென்றால், எதிர்வரும் திங்கட்கிழமை வெள்ளத்தால் பாதிக்கப்பட்டவர்களுக்கான 25,000 ரூபாய் நிதி ஒதுக்கப் படவிருக்கின்றது. ஆகவே, அரசாங்கம் இந்த விடயத்தில் கவனம் எடுத்து ஒரு வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்த வேண்டும். ஏனென்றால், எங்களைப் பொறுத்தவரையில் ஊழல் நடைபெறுவது - பாதிக்கப்படாதவர்களுக்குக் காசு போய்ச் சேருவதும், பாதிப்படைந்தவர்களுக்குக் காசு போய்ச் சேராமல் இருப்பதும் - ஏற்றுக்கொள்ளக்கூடிய விஷயமல்ல! இந்த விபரங்களைத் தவறாக நிரப்புவதில் தேசிய மக்கள் சக்தியுடைய தலையீடும் இருப்பதாக எங்களுக்குத் தகவல் கிடைத்திருக்கின்றது என்பதை இந்தச் சபைக்கு நான் பொறுப்போடு சொல்கின்றேன். அந்த வகையில், உங்களுடைய அரசாங்கத்தின் நேர்மைத் தன்மையை உறுதிப்படுத்துவதற்குத் தயவுசெய்து இந்த விபரங்கள் அனைத்தையும் அவசரமாக வெளியிடுமாறு நான் கேட்கிறேன்.

இறுதியாக நான் சொல்லவிரும்புவது என்னவென்றால், எங்களைப் பொறுத்தவரைக்கும் பாதுகாப்புக்கான அதிக நிதி ஒதுக்கீடு மற்றும் வட, கிழக்கிற்கு வழங்கப்பட்ட நிதியினுடைய பற்றாக்குறை என்பவற்றுக்கு எங்களுடைய எதிர்ப்பைத் தெரிவிப்பதற்கு இந்த வரவு செலவுத்திட்ட 3ஆம் வாசிப்பின் போது எங்களுடைய கட்சி சார்பாக ஒரு வாக்கெடுப்பைக் கோருவோம் என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். நன்றி!

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික වශයෙන් ඉතා වැදගත් වන කරුණක් පාර්ලිමේන්තුවේ අවධානයට ලක් කරනවා. 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව, ජනාධිපතිතුමා විසින් ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කළාම, එම පනතේ 11 (3) වගන්තිය ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් අනුමත කිරීම සඳහා එම ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළ දිනයට ඉක්බිතිවම පැවැත්වෙන ප්‍රථම රැස්වීමට ඉදිරිපත් කළ යුතුයි. අද මේ පාර්ලිමේන්තු සැසිවාරයේ අවසාන දිනය. නමුත් අද එය ඉදිරිපත් වුණේ නැහැ. ඒ වාගේම කලින් ඉදිරිපත් වුණෙත් නැහැ. එතකොට ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ජනාධිපතිතුමා විසින් 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කළාද කියලා. එහෙම කළේ නැත්නම්, අනෙක් නියෝගවලට බලපානවා, මේක. ඒ වාගේම පාර්ලිමේන්තුව මේක අනුමත කළ යුතුයි. අන්තිම මොහොතේ හෝ මේක මගේ අවධානයට ලක් වුණා. මම මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරවනවා. මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම වැදගත්. එය ජාතික වශයෙන් වැදගත් කරුණක් නිසායි මම මේ අවස්ථාවේ එය මතු කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. අපි ඒ කරුණ ආණ්ඩු පක්ෂයේ අවධානයට යොමු කරනවා.

මීළඟට, ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.49]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඇති වූ මේ ස්වාභාවික විපතේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ආසනයේ, නැඟෙනහිර කලාපයේ මේ මහ පොළොවත් සමඟ කටයුතු කරමින් අතිවිශාල කාර්යභාරයක් කළ, මේ මහ පොළොවට බරක් නැතිව ජීවත් වුණු, අපේ අහිංසක මිනිස්සු විශාල ප්‍රමාණයක් ජීවිත පරිත්‍යාග කර තිබෙනවා. ඔවුන් සියලුදෙනාට නුවරඑළිය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරියක වශයෙන් මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ, හඟුරන්කෙත සහ නුවරඑළිය ආසනයේ අතිවිශාල ප්‍රමාණයක් අවතැන් වෙලා ඉන්නවා. රජයක් විදියට අපි ඔවුන් සියලුදෙනාව බලා ගන්නවා. මේ අවස්ථාවේදී කොත්මලේ නැඟෙනහිර කලාපය ඉතිහාසයේ දැවැන්තම අනතුරකට තමයි මුහුණ දීලා තිබෙන්නේ. මෙම අවස්ථාව වනකොටත් ශ්‍රී ලංකා පොලීසිය, ත්‍රිවිධ හමුදාව සියලු රාජ්‍ය ආයතනවල නිලධාරින්, රෝහල් සහ වෙනත් සියලු කාර්ය මණ්ඩල තමන්ට හැකි ප්‍රමාණයෙන් සියලු දායකත්වය ලබා දෙමින් කටයුතු කරමින් ඉන්නවා. ඔවුන්ගෙන් සමහර නිලධාරින් සතියකට ආසන්න කාලයක් තිස්සේ ඒ ඇඳගත් ඇඳුම පිටින්ම විශාල කාර්යභාරයක නිරත වෙමින් ඉන්නවා, සාමාන්‍ය ජනතාවගේ ජීවිත යථා තත්ත්වයට පත් කිරීම සඳහා.

ඒ නිසා මම මේ වෙලාවේ සියලුම ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටිනවා, මේ ව්‍යසනකාරී අවස්ථාවේ කිසිදු දේශපාලනික වුවමනාවක් වෙනුවෙන් මිනිසුන්ගේ මනෝභාවයන් වෙනස් කරන්න එපා කියලා. ඔවුන්ගේ ජීවිත අඩියටම වැටිලා තිබෙන්නේ. එම නිසා මේ වෙලාවේ අපි සියලුදෙනාම එකතුවෙලා ඔවුන් නඟා සිටුවිය යුතුයි, ඔවුන්ගේ ජීවිත සාමාන්‍ය තත්ත්වයට පත් කළ යුතුයි. ඔවුන්ට සාමාන්‍ය ජීවිතය අහිමිවෙලා තිබෙනවා, තමන්ගේ ළඟම ඥාතියා අහිමිවෙලා තිබෙනවා. තමන්ගේ දරුවා අහිමි වුණු දෙමව්පියෝ ඉන්නවා, තමන්ගේ දෙමව්පියෝ අහිමි වුණු දරුවෝ ඉන්නවා. ඔවුන්ගේ ජීවිත ආපහු කොතැනින් ආරම්භ කළ යුතුද කියන කාරණය අපි සියලුදෙනා ඉස්සරහා තිබෙන ලොකු ගැටලුවක්. අපි ඔවුන්ගේ මානසිකත්වය නඟා සිටුවිය යුතුයි. ඒ නිසා මේ වෙලාවේ පහත් දේශපාලනය කරන්න ලැහැස්ති වෙන්න එපා. මම සියලුම ශ්‍රී ලාංකිකයන්ගෙන්, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවට වග කියන සියලුම මන්ත්‍රී සහෝදර සහෝදරියන්ගෙන් ඉල්ලා සිටින්නේ, ඔබ ඇත්ත හැඟීමෙන්, තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඒ මිනිසුන්ට උදව් කරන්න කියලායි. ඔවුන් ලංකාවේ පෝෂණය වෙනුවෙන්, ලංකාව පවත්වාගෙන යෑම වෙනුවෙන් දහඩිය, කඳුළු හෙළපු මිනිස්සු. එම නිසා අපට වගකීමක් තිබෙනවා. දැන් විපත්තිය වෙලා අවසන්. අපි දැන් ඒ ඉතිරි වෙලා තිබෙන ජීවිත, කොටු වෙලා ඉන්න ඒ ජනතාව ආරක්ෂා කළ යුතුයි. ඒ අයට කන්න, අඳින්න දෙන එක විතරක්ම නොවෙයි, ඒ අය නැවත නඟා සිටුවීමේ වගකීම අපි සියලුදෙනාටම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කනගාටුයි කියන්න, සමහර නාළිකාවලට විශේෂ අමුත්තෝ කැඳවා සාකච්ඡා පවත්වලා, කොත්මලේ මිනිසුන්ගේ ව්‍යාකූල වෙලා තිබෙන මානසිකත්වය තව තවත් ව්‍යාකූල කරනවා. ඒක කරන්න එපා. මම ඉල්ලා සිටිනවා, ඒ නාළිකාවලට වෙන වැඩක් නැත්නම්, දේශපාලනය කරන්න ඕනෑ නම්, කරුණාකරලා ඒ සඳහා වෙන වෙලාවක් තෝරා ගන්න කියලා. මේ වෙලාවේ මිනිස්සු අවුස්සන්න එපා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමහර නිලධාරින් උදේ, දිවා, රාත්‍රී බලන්නේ නැතුව වැඩ කරනවා. අපි ඒ තැන්වලට ගිහිල්ලා බලනවා, ඒ මිනිස්සු ජීවිතේ කරන්න පුළුවන් සියලුම කැප කිරීම් ටික කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොත්මලේ රම්බොඩගම කියන ගම්මානයේ නාය යෑම නිසා මිනිස්සු 28කට ආසන්න පිරිසකගේ ජීවිත අහිමි වුණා. 22ක පමණ පිරිසක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඔවුන්ගේ ජීවිත සම්බන්ධයෙන් අපට විශ්වාසයක් තබාගත නොහැකි තත්ත්වයක් තමයි තිබෙන්නේ. මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, මේ වෙනකොට මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිද්ධ වෙන බව. ඒ වාගේම, කැඩී ගිය පාලම්, බෝක්කු ප්‍රතිසංස්කරණය කරනවා. මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පොලීසිය ඇතුළු ඒ හැම දෙනාම එක්ක එකතුවෙලා, කොත්මලේ නැවත නඟා සිටුවීම වෙනුවෙන්, කොත්මලේට නැවත ජීවය ලබා දීම වෙනුවෙන් කිසිදු වාද භේදයකින් තොරව, ආගම්, ජාති, කුල, මේ කිසිවක් නොසලකා අත්වැල් බැඳගන්නා

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

මෙන් මා සියලුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. නැති වුණු ජීවිතවලට පණ දෙන එක විතරයි අපට කරන්න බැරි. ආණ්ඩුවක් විධියට අපි ඉතිරි සියලු දේවල් ලබා දෙනවා කියන විශ්වාසය තබා ගන්න. කොත්මලේ නැඟෙනහිර කලාපයේ අවතැන් වුණු, ඒ වාගේම බටහිර කලාපයේ කඳු මුදුන් දිහා බලාගෙන හුල්ලන ජනතාවට මම කියනවා, විශ්වාසයෙන් ඉන්න, ඔබේ ඒ විශ්වාසය රකිමින්, ඔබේ ජීවිත නැවත නඟා සිටුවීම වෙනුවෙන් අපට කරන්න පුළුවන් හැමදේම අපි කරනවා කියන එක. ඒ කාරණයත් මතක් කරමින්, මිය ගියා වූ අපේ ආදරණීය සහෘදයන්ට ඔවුන් බලාපොරොත්තු වුණා වූ සුගතිගාමී ජීවිත නැවත අත් පත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.ජී. විජේරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද 2026 සඳහා වූ අය වැය පිළිබඳ විවාදයේ අවසන් දිනය. ලංකාව තුළ ඇති වූ මහා ව්‍යසනයේදී සැලකිය යුතු විනාශයක් අත් පත් වුණු නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අදහස් දැක්වීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිය පළ කරනවා.

මේ ව්‍යසනයේදී උතුර ද, දකුණ ද, මොන දිසාවේද කියලා වෙනසක් වුණේ නැහැ; මධ්‍යම කඳුකරය ද, පහත රට තෙත් හෝ වියළි කලාප ද කියලා වෙනසක් වුණේ නැහැ, ඒ වාගේම සිංහල, දමිළ, මුස්ලිම්ද ද කියලා භේදයක් වුණේ නැහැ, මුළු රටටම බලපෑ ව්‍යසනයක් බවට පත් වුණා, මේක. නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තාම, මේ ව්‍යසනය නිසා පුද්ගලයින් 71දෙනෙකුගේ ජීවිත අහිමිවෙලා තිබෙනවා. 35දෙනෙකු අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ සියලුම ආදරණීයයන් වෙත ශෝකය පළ කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මෙහිදී 40,000කට ආසන්න පිරිසක් අවතැන් වුණා.

මේ වන විටත් කඳවුරු 185ක පුද්ගලයින් 24,000කට ආසන්න පිරිසක් සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා ඉන්නවා. ඒ සියලුදෙනා රැක බලා ගැනීම සඳහා දිසාපතිතුමිය පෙරටු කොට ගත් රජයේ සියලු නිලධාරින් මහත් කැපවීමක් කරනවා. ඒ සියලුදෙනාටම ස්තුතිය පළ කරන්න, ඒ කැපකිරීම අගය කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම තමයි, ළඟා විය නොහැකි ප්‍රදේශවලට ගුවන් හමුදාවේ සහ ඉන්දියානු හෙලිකොප්ටර් යානා 33ක් මඟින් ආධාර සපයන්න අපට හැකියාව ලැබුණා. ඒ නිසා මේ වන විට ඒ ජනතාව යම් සුරක්ෂිත තැනකට ගෙනෙන්න, අවතැන් වුණු අතිවිශාල ජනතාවක් සුරක්ෂිත කර ගන්න, ඔවුන්ගේ ජන ජීවිතයට යම් බලාපොරොත්තුවක් ඇති කර දෙන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි විනාශයට පත් වුණු මාර්ග පද්ධතිය, විදුලිය, ජලය වාගේ දේවල් නැවත ලබා දීම සඳහා RDA, PRDA, විදුලිබල මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය වැනි ආයතනවල නිලධාරින් දිවා රෑ නොබලා තමන්ගේ රාජකාරියට එහා ගියපු මහා මෙහෙයක් ඉෂ්ට කරනවා. මේ වන විට සියයට 70කට ආසන්න ප්‍රමාණයකින් මේ සියලු දේවල් යථා තත්ත්වයට පත් කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. එම නිසා ඔවුන්ටත් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් සුන්දර කඳුකරයට ආදරය දක්වන මේ රට පුරා විවිධ ප්‍රදේශවල ජීවත් වන ජනතාව රොද බැඳ ගෙන ඔවුන්ගේ උපකරණ අරගෙන, ආධාර උපකාර අරගෙන නුවරඑළියට සේන්දු වුණා. ඒ අය ඇවිල්ලා අවතැන් වුණු අපේ ආදරණීයයන් වෙනුවෙන් සියලු පහසුකම් සලසන්න, යම් හෝ උපකාරයක් කරන්න දැඩි වෙහෙසක් ගත්තා. මම ඒ සියලුදෙනාටත් ස්තුතිය පුද කරනවා. විශේෂයෙන් "කළුතරින් නුවරඑළියට" කියන තේමාව පදනම් කර ගෙන කළුතර දිස්ත්‍රික්කයේ 380කට ආසන්න පිරිසක් නුවරඑළිය දිස්ත්‍රික්කයට ඇවිල්ලා අද වන කොටත් ඉන්නවා. ඒ අය අද දවසේ මේ මොහොත වනකොටත්, සම්පූර්ණයෙන්ම විනාශයට පත් වුණු, වතුරෙන් යට වුණු නුවරඑළිය නගරය යථාවත් කිරීම සඳහා දැඩි වෙහෙසක් දරමින් ඉන්නවා. එම නිසා කළුතර දිස්ත්‍රික්කයේ අපේ ආදරණීය සගයන්ට අපගේ උත්තමාචාරය මේ වෙලාවේ පුද කරනවා.

ඒ වාගේම මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ, ඒ සුන්දර කඳුකරය, එහෙම නැත්නම් අපේ දිස්ත්‍රික්කය මෙවැනි ආපදාවලට ලක් වෙන්න, මහා විනාශයක් ඇති වෙන්න හේතු කාරක වූ කරුණු ගණනාවක් තිබෙන බව. අපි දන්නවා, පසුගිය කාලය පුරාවටම අපේ වන රක්ෂිත ප්‍රදේශ බොහොමයක් දේශපාලන අධිකාරියේ වුවමනා මත එළිපෙහෙළි කරලා ඒගොල්ලන්ගේ නිජ භූමි බවට පත් කර ගත් බව. ඒ ප්‍රදේශවල නොගැළපෙන නොයෙකුත් ඉදි කිරීම් කළා, නොගැළපෙන තැන්වල පාරවල් ඉදි කළා. ඒ විතරක් නොවෙයි. මීට කලිනුත් ඒ ප්‍රදේශ නාය ගියා. ඒ නාය ගිය අවස්ථාවලදී නැවත පදිංචි කිරීම සඳහා ඉඩ කඩම් ලබා දුන්නත් ඒවා දේශපාලන වුවමනා මත තමයි සිද්ධ වුණේ. ඒ වාගේම නාය ගිය ඉඩම් වෙනුවෙන් තවත් ඉඩමක් දෙනකොට නාය ගිය ඉඩම රජයට පවරා ගැනීමේ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, ඒ පිළිබඳව ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබුණේ නැහැ. එම නිසා තමයි නැවත වතාවක් ඒවා නාය යාමට ලක් වෙලා තිබෙන්නේ. මේ මොහොත වනකොටත් ඒ ප්‍රදේශයට මහා ධාරානිපාත වර්ෂාවක් ඇද හැලෙමින් පවතිනවා. ඊයේ හවස වනකොට ග්‍රාම නිලධාරි වසම් හතරක ජනතාව 480ක් වාගේ පිරිසක් සුරක්ෂිත මධ්‍යස්ථානවලට නැවත ගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ආපදාවේ තරම සුළු පටු එකක් නොවෙයි. අපි දන්නවා, මේ තත්ත්වය මේ තරමින් හෝ වළක්වා ගන්න පුළුවන්කම ලැබුණේ රාජ්‍ය නිලධාරින්ගේ සහ ප්‍රජාවක් විධියට ජනතාවගේ මැදිහත් වීම නිසා බව.

අද බොහෝ දෙනා කියන කාරණාවල යම් පරස්පරභාවයක් තිබෙනවා. නිකමට කල්පනා කරලා බලන්න, විනාශ වුණු නිවාස සංඛ්‍යාව, අතුරුදහන් වූ සහ මිය ගිය පුද්ගලයින්ගේ සංඛ්‍යාව අතර සම්බන්ධය ගැන. අවම වශයෙන් ගෙදරක තුන්දෙනෙකුවත් හිටියා නම් නිවාස විනාශ වුණු ප්‍රමාණය වාගේ තුන් ගුණයක ප්‍රමාණයක් මිය යන්නට හෝ අතුරුදහන් වෙන්නට ඕනෑ. නමුත්, එවැන්නක් සිදු වුණේ නැහැ. එයින් කියාපාන්නේ කුමක්ද? ඒ අවදානම තේරුම් අරගෙන වේලාසනින් අපි ඒවාට ක්‍රියාත්මක වුණේ නැති බවක් කියනවා. හැම තැනම ගිහිල්ලා; ගෙයක් ගෙයක් ගාණේ ගිහිල්ලා ඒ සියලුදෙනා කඳවුරුගත කරපු නිසා තමයි මේ විනාශය අවම කර ගන්න අපට පුළුවන්කම ලැබුණේ. මේ අවස්ථාවෙන් කාලකණ්ණි සතුටක් ලබන්නේ නැතිව මේ රට නැවත ගොඩ නැඟීමේ මහා කාර්යයට සද්භාවයෙන් දායක වෙන්න කියන ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.01]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මම මෙතැන කථා කරන්නේ විශේෂිතයෙකු හැටියටයි. මොකද, මමත් මේ ගංවතුරට යට වුණු මන්ත්‍රීවරයෙක්; සාමාන්‍ය පුරවැසියෙක්. මගේ ගෙදරත් ගංවතුරෙන් යට වුණා. එම නිසා මම, මේ සිද්ධිය හොඳට දැනෙන කෙනෙක්.

මෙහිදී අප හැමදෙනාම මතක තබා ගන්න ඕනෑ පළමුවැනිම කාරණාව මේකයි. මම විශේෂයෙන්ම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, උද්ධච්චකම, අහංකාරකම ඕනෑවට වඩා තියා ගන්නත් එපා, අනෙක් අයව පහත් කරලා සලකමින් රටේ තිබෙන සමඟිය, සමාදානය නැති කරන විධියට හැසිරෙන්නත් එපා, ඒ විධියේ වචන පාවිච්චි කරන්නත් එපා කියලා.

ඔබතුමන්ලා කරපු සමහර ක්‍රියා නිසා අද සමහර තැන්වල රාජ්‍ය නිලධාරින් වැඩ කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, ඔබතුමන්ලා හැම මොහොතකම මේ රටේ සියලු දෙනා හොරු බවට පත් කළා. දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින්, විශේෂයෙන් ව්‍යාපාරිකයන්, රාජ්‍යයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන අනෙකුත් ව්‍යාපාර, සංවිධාන ආදි සියල්ල දිහා ඔබතුමන්ලා බැලුවේ හොරු හැටියට. අද ඒ අය වැඩ කරන්න පස්සට යනවා; වැඩ කරන්න තිබෙන භයිය ඉදිරියට ගන්නේ නැහැ; තීන්දු තීරණ ගන්නේ නැහැ. ඇයි ඒ? ගන්නා තීන්දු තීරණවල යම්කිසි වැරැද්දක් සිද්ධ වුණොත්, ඒක නිවැරැදි කරන්න කෙනෙක් නැහැ; ඒ අයව ආරක්ෂා කරන්න පිටුපසින් ඉන්න කෙනෙක් නැහැ. අද ග්‍රාම නිලධාරින් ගිහිල්ලා ආපදාවට ලක් වුණු, ප්‍රශ්න තිබෙන ගෙවල්වලට අදාළ ලැයිස්තු සකස් කරන කොට, ගෙවල් සුද්ද කරන්න, පිරිසිදු කරන්න අවශ්‍ය කරන මුදල් දෙන්න බලන කොට සමහර වෙලාවට ගෙවල්වල මිනිස්සු නැහැ. හැබැයි, ඒක ලියන්න බයයි. ලිව්වාට පස්සේ ඒක දෙන්න බැරුව ගියොත් ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමන්ලා කියා තිබෙනවා, නැවත ඒ සල්ලි ගන්නේ නැහැ, අනිවාර්යයෙන් ඒ සල්ලි දෙන්න ඕනෑ කියලා. දැන් ඒ අය බරපතළ ප්‍රශ්නයක ඉන්නවා. මතක තියාගන්න, එතැනදී ඔබතුමන්ලා කරපු ලොකු වැරැද්දක් තිබෙන බව. මේ ව්‍යසනය අවස්ථාවේ ගංවතුරට යට වුණේ මේ රටේ දුප්පත්, අහිංසක මිනිසුන් විතරක් නොවෙයි. මධ්‍යම පාන්තිකයන් ඇතුළු සියලු දෙනා ගංවතුරට යට වුණා. ඒක අත්දැකපු කෙනෙකු හැටියටයි මම මේ කියන්නේ. මම එදා රාත්‍රි 11.00ට පමණ තමයි අනෙක් අය බේරා ගැනීමේ කටයුතු පටන් ගත්තේ. ඒ සඳහා අවශ්‍ය බෝට්ටු හොයලා, එන්ජින් ආදිය හොයලා අවශ්‍ය වැඩ කටයුතු කරද්දී, ඒ වෙලාවේ වෙන්නප්පුව බල ප්‍රදේශයේ උල්හිටියාව, කම්මල යනාදි ප්‍රදේශවල ධීවර ජනතාව විශාල මෙහෙවරක් කළා; ශ්‍රී ලංකා පොලීසියත් විශාල මෙහෙවරක් කළා.

මම පළමුවැනි දවසේ රාත්‍රියේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට කථා කරලා කිව්වා, "මෙහේ පිරිසක් ආපදාවට ලක් වෙලා ඉන්නවා, මේ අයව බේරා ගන්න ඕනෑ, බේරා ගන්න විධියක් ගැන කථා කරන්න ඕනෑ" කියලා. ඒකට පිළිතුරු දෙන්න ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මට කථා කළේ ඊට දවස් දෙකකට පසුවයි. ඒ අය මට කථා කරලා ඇහුවා, "ඔබතුමා කියපු අය බේරා ගත්තයි අහන්නේ, ඒ අය තවම ඉන්නවාද" කියලා. මන්ත්‍රීවරයෙකු හැටියට මට එතැනදී ලජ්ජා හිතුණා. එහෙම නම්, මතක තියාගන්න, මේ system එකේ බරපතළ ප්‍රශ්නයක් තිබෙන බව.

මම මේ වෙලාවේ විශේෂයෙන් සිහිපත් කරනවා, මගේ පාසලේ ඉගෙන ගත්තු, වින්ග් කමාන්ඩර් නිර්මාල් සියඹලාපිටිය මහත්මයා. එතුමා දක්ෂ pilot කෙනෙක්. ගංවතුර නිසා සිරවී සිටි අය බේරාගන්න ගිය වැඩසටහනකදී තමයි එතුමා මිය ගියේ. ඒ නිසා එතුමා වීරයෙකු හැටියට සලකන්න. රණ විරුවෝත්, පොලීසියත්, අනෙක් සියලු දෙනාත් මේ වැඩ කටයුතු හරියට කළා. ඒ අයට නිසි සැලකිල්ල ලබා දෙන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

අපේ දිස්ත්‍රික්කයේ කල්පිටිය බල ප්‍රදේශය, ආනමඩුව බල ප්‍රදේශය, කරුවලගස්වැව බල ප්‍රදේශය, නීලබැම්ම බල ප්‍රදේශය ඇතුළු හැම තැනකම කුඹුරු සහ අනෙකුත් වගාවන් සියල්ල විනාශ වෙලා තිබෙනවා. මධ්‍යම පාන්තිකයන් විනාශ වෙද්දී ඒ අයගේ කර්මාන්තත් විනාශ වෙලා තිබෙනවා. මා දන්නා මගේ හිතවතුන් ඉන්නවා, ඒ අයගේ ඒ දේපළ විනාශයේ ප්‍රමාණය රුපියල් ලක්ෂ 900යි; 1,000යි. සමහර අය අඬනවා. ඒ අයගේ ඒ දේපළ ආදිය විනාශයත් එක්ක සිද්ධ වන දේ මොකක්ද? එමඟින් රටේ ගැවසෙන සල්ලි ටික නැතිව යනවා; උත්පාදනය කරන දේවල් ටික නැතිව යනවා; නිෂ්පාදනය අඩු වෙනවා; ලබා දෙන රැකියා ටික අඩු වෙනවා; අපනයන ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් විනාශ වෙනවා. මොකද, අපනයන ක්ෂේත්‍රයේ හිටපු විශාල පිරිසකට අද බරපතළ හානියක් සිදු වෙලා තිබෙනවා. මතක තියාගන්න, මේ ගැටලු නිරාකරණය කරද්දී තමුන්නාන්සේලාට මේ සියලු දෙනාම අවශ්‍ය වන බව. තමුන්නාන්සේලා එක එක්කෙනාට වෙනස් ලෙස සලකා කථා කරලා මේ වැඩේ කරන්න බැරි බව මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

දේශගුණික විපර්යාස සම්බන්ධව මුළු ලෝකයම කථා කරන කොට තමුන්නාන්සේලා මොනවාද කළේ? සමස්තයක් හැටියට ගත්තාම, ඒ කාරණයට අදාළව කලින් තිබුණු ආණ්ඩුවලටත් මම ඇඟිල්ල දිගු කරනවා. ලෝකයේ දේශගුණික විපර්යාස බරපතළ විධියට සිදු වන කොට ඒ සම්බන්ධව ලෝකය වෙනම ක්‍රියාකාරකම් කළා.

අද අපේ ආපදා කළමනාකරණ ආයතන ගෙන බලන්න. ඒවායේ ලොකු බිල්ඩින් තිබෙනවා, ලොකු කණ්ඩායම් ඉන්නවා. හැබැයි, අපට දැනුම අවශ්‍ය බව මතක තියාගන්න. දැනුම අවශ්‍ය වෙද්දී අපට expertsලා තියාගන්න බැහැ, නිකම් ආවාට ගියාට. අපි ඒ අයට විශාල වශයෙන් ගෙවන්න ඕනෑ. ඒගොල්ලන්ගේ දැනුම ඒක රාශි කරගෙන, ඒ දැනුමෙන් තමයි අපට මේ දේවල් ගැන දැනගන්න පුළුවන් වෙන්නේ. කෝ, අපට early warning system එකක්? එහෙම warning system එකක් නැහැ. තමුන්නාන්සේලාට warning එකක් කරන්න බැරුව ගියා.

තමුන්නාන්සේලා ඉන්දියාව ආදර්ශයට ගන්න. ඉන්දියාව මේ සුළි සුළඟ මෙහෙන් යන්න පෙර සහන මධ්‍යස්ථාන 250ක් හදලා ඉවරයි; ඒකට අවශ්‍ය කරන වාහන ටික එකතු කරලා ඉවරයි; ඒකට අවශ්‍ය කරන පිරිස් බලය එකතු කරලා ඉවරයි. ඊළඟට, රතු නිවේදන නිකුත් කරලා කණ්ඩායම් වෙන් කරලා, අවදානම් සහිත ගෙවල්වල ඉන්න අයව එළියට අරගෙන ඒ අය වෙන තැනක තියලා ඉවරයි; කෑම බීම storesවල දාලා ඉවරයි. නමුත්, තමුන්නාන්සේලාට බැරුව ගියා මේ ව්‍යසනය සිදු වන කොට ඒ වාගේ සහන අවස්ථා, සහන මධ්‍යස්ථාන හදන්න.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මේ ආපදා අවස්ථාවේදී අඩුම ගණනේ දුරකථනයෙන්වත් කථා කරන්න පුළුවන් වුණාද? මේ ඩයලොග්, මොබිටෙල් සම්බන්ධතා ආදිය වැඩක් තිබෙනවාද කියලා හිතන්නකෝ. ඒවා කිසි එකක් වැඩ කළේ නැහැ. මේ අවස්ථාවේ ඒගොල්ලන් ලබා දුන්නු සේවාව මොකක්ද? ඒ සම්බන්ධතා එකක්වත් වැඩ කළේ නැහැ. මේ ආපදාව අවස්ථාවේ අවශ්‍ය සම්බන්ධතා ඇති කර ගන්න, කාටවත් කථා කර ගන්න බැරි වුණා. අපට ඒක විශාල ප්‍රශ්නයක් වුණා.

එතකොට ඔබතුමන්ලා දැනගන්න ඕනෑ, අඩු ගණනේ මේ වාගේ සහන මධ්‍යස්ථාන හදලා ඒ සහන මධ්‍යස්ථානවල සන්නිවේදන කටයුතු වෙනම සම්බන්ධීකරණය කරන්න. හැබැයි, ඒක කළේ නැහැ. මෙතැනදී මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මම බෝට්ටු ටික අරගෙන කරන්න පුළුවන් හැම දෙයක්ම කළා. මම මගේ ගේ ගැන අදහස අතහරියා. ඒ ආසාව අතහැරලා පාරට බැහැලා අවශ්‍ය වැඩ කටයුතු ටික කළා. හැබැයි මම ඒවා ෆොටෝ ගැහුවේත් නැහැ, වීඩියෝ කළේත් නැහැ, Facebook දාන්න ගියේත් නැහැ. මොකද, මම දන්නවා, මම මේ කරන්නේ සේවයක් කියලා. ඒ සේවය හරියට කරන්න ඕනෑ නිසා තමයි මම ඒ විධියට වැඩ කළේ.

තමුන්නාන්සේලාට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. නිකම් ආවාට ගියාට නොවෙයි, අපට අවශ්‍යයි ආපදාවක් වෙන්න පෙර එය හඳුනා ගැනීම. ආපදාවෙන් පස්සේ මොන තරම් කථා පැවැත්වූවත්, කාගෙන් සල්ලි ඉල්ලා ගත්තත්, ලෝකයට කථා කරලා සල්ලි එකතු කළත් වැඩක් නැහැ. එතකොට ආපදාව වෙලා ඉවරයි. ඒක recover කරන්න බැහැ, ඒ විධියට. එය නැවත වතාවක් යථා තත්ත්වයට ගේන්න බැහැ. අපට පුළුවන් දෙයක් නැවත හදන්න විතරයි. ඒ නිසා මතක තියාගන්න, අපි කළ යුතු දේ මොකක්ද කියලා. අපි ආපදාව හඳුනා ගැනීම සිද්ධ කළ යුතුමයි. ආපදාව හඳුනා ගැනීමේදී ලංකාව දැනුම කේන්ද්‍රස්ථානයක් කරගන්න ඕනෑ. ලංකාව ලෝකයත් එක්ක බද්ධ කරගන්න ඕනෑ. මේ සඳහා අපට විශේෂ උපකරණ අවශ්‍යයි. මේ සියල්ල ඒක රාශි කරගෙන මේ වැඩ කටයුතු අපි නිවැරදිව කරන්න ඕනෑ. ඒ කාරණය විශේෂයෙන් මතක තියාගන්න ඕනෑ.

ලෝකය ගත්තාම, ඉන්දියාව තමයි අපට ළඟම තිබෙන රට. ඉන්දියාවේ ගුජරාටිවල තමයි medicine නිපදවන හොඳම ආයතන හැදුවේ. ඒගොල්ලෝ private company එකක් විධියට ඒක හැදුවේ. ඒක හදලා දවසින් දවස, පැයෙන් පැය ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් ටික සපයලා දුන්නා. ලෝකයටම පාඩමක් ඉගැන්වූවා ඒගොල්ලෝ. අපට අඩු ගණනේ බෙහෙත් ටිකවත් දෙයිද කියලා ප්‍රශ්නයක් එනවා ඉස්සරහට. මේ ආපදාවෙන් පස්සේ තිබෙන විෂබීජ සියල්ලත් එක්ක ඊළඟට මේ රටේ බරපතළ ප්‍රශ්න එනවා. මේ රටේ හැම කෙනෙක්ම ප්‍රකාශ කරලා තිබෙනවා, මේ ආපදාවෙන් පස්සේ තමයි ඊළඟ ප්‍රශ්න එන්නේ කියලා. රටේ මිනිස්සුන්ට මේ විනාශයට වඩා විනාශයක් එනවා, විෂබීජත් එක්ක ඇති වෙන ලෙඩ රෝග නිසා. ඒ ලෙඩ රෝග එක්ක මේ සමාජය සම්පූර්ණයෙන්ම විනාශ වෙන්න පුළුවන් කියන එක මතක තියාගන්න, තමුන්නාන්සේලා ඉදිරියටත් ආණ්ඩුව කරනවා නම්. ඒ සමහර තැන්වලට අපේ අය ආවාම තමුන්නාන්සේලා කියනවා, "එන්න එපා අපි කරගන්නම්" කියලා. එහෙම කියන තැන් තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේ කටයුතු අනිවාර්යයෙන් හරි විධියට කරන්න ඕනෑ. නොකර ඉන්න බැහැ. ඒකට අපෙන් ඕනෑ සහයෝගයක් ඉල්ලන්න. අපි ඒ සහයෝගය දෙන්න ලෑස්තියි. අපි කවුරුත් තමුන්නාන්සේලාට පිටින් ඉඳගෙන වැඩ කරන්න සූදානම් නැහැ. තමුන්නාන්සේලා ආණ්ඩුව නම්, ඒ ආණ්ඩුවට අවශ්‍ය සහයෝගය දෙන්න පුළුවන්. හැබැයි ඒ සහයෝගය ලබා ගන්නා විධියට තමුන්නාන්සේලාගේ වැඩ කටයුතු ටික කරන්න කියලා ඉල්ලනවා.

ඒ වාගේම විශේෂයෙන්ම, පෞද්ගලික අංශය මේකට එකතු කරගන්න. පෞද්ගලික අංශය එකතු කරගන්නේ නැතුව මේ වැඩේ කරන්න බැහැ. දැන් පරණ JVP අදහස් ටික අයින් කරන්න. මාලිමාවේ අලුත් අදහස් තිබෙන කණ්ඩායම් ඉන්නවා. ඒගොල්ලෝ ඒක රාශි කරගෙන තමුන්නාන්සේලා වෙනස් වෙන්න, පක්ෂයක් හැටියට. වෙනස් වුණේ නැත්නම් තමුන්නාන්සේලාට මේ රට කරන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලාට බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා. මොකද, දැන් හම්බ වෙන සල්ලි ප්‍රමාණය හම්බ වෙයි. හැබැයි ඊට පස්සේ ඉදිරි කාලය තුළ තමුන්නාන්සේලාට සල්ලි හම්බ වෙන්නේ නැති වුණොත් බරපතළ ප්‍රශ්නයක් වෙයි. විශේෂයෙන්ම පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිවයා හැටියට මම මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාටත්, මේ රටටත් පොරොන්දුවක් දෙනවා. ගරු කථානායකතුමාගෙනුත්, ආණ්ඩුවෙනුත් ඉල්ලනවා, මේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභාව තුළ හොඳට අත දිග හැරලා වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ බලය නිවැරදි ආකාරයෙන් ලබාදෙන්න. අපි තිබෙන සංවිධාන සියල්ලත් එක්ක ලෝකයේ රටවල් ටික තමුන්නාන්සේලාගේ නායකත්වයෙන් සම්බන්ධ කරන්නම්. අපි දෙන්නේ සහයෝගය පමණයි. ඒකට අවස්ථාව ලබාදෙන්න කියලා ඉල්ලනවා. රටේ සමස්ත ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරනවා. මේ අවස්ථාවේදී මේ සඳහා කැප වෙච්ච පෞද්ගලික අංශය ඇතුළු රටේ සියලු ජනතාවට විශේෂ ස්තුතියක් මා පිරිනමනවා. ඒගොල්ලෝ තමයි රට රැකගත්තේ. නැතිව ආණ්ඩුවවත්, තමුන්නාන්සේලාවත්, අපිවත් නොවෙයි ඒක කළේ. මේ තාක් වෙනකල් සමස්ත සිවිල් වැසියෝ ටික තමයි එකතු වෙලා මේ රට රැකගත්තේ. ඉස්සරහටත් රැකගන්නේ ඒගොල්ලෝ තමයි. ඒගොල්ලන් ඉදිරියෙන් තියාගෙන ඒගොල්ලන් එක්ක අත්වැල් බැඳගෙන අපි මේ ගමන යමු. අපි සූදානම්, මේ රට වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක් කරලා තමුන්නාන්සේලාට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව ඇතුළේ විපක්ෂයේ සංවාදය තුළ රැව් පිළිරැව් දෙන දේ මේකයි. මට හිතෙන විධියට, මට තේරෙන විධියට එක පැත්තකින් කියමින් යනවා, අපේ රටේ රාජ්‍ය නිලධාරින් කිසිවක් කරලා නැහැ කියලා. අනෙක් පැත්තෙන් කියමින් යනවා, ඒගොල්ලෝ හොරකම් කරනවා සහ ඒකට අදාළ කරන මැදිහත්වීම කරන්න හැදුවා කියලා.

අපට එහෙම අසනීපයක් තිබුණේ නැහැ. අපි දන්නවා, ලංකාවේ දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, සහකාර ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු අනෙකුත් රාජ්‍ය නිලධාරි

පද්ධතියම කොතරම් වැඩ කොටසක් කළාද කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරු දන්නවා, මේක දිස්ත්‍රික්ක 21ටම සිදු වුණු ව්‍යසනයක් බව. දිස්ත්‍රික්ක හතරයි මේකෙන් බේරුණේ. අපි කවුරුත් දන්නා ඉතිහාසය තුළ සිදුවුණු දැවැන්තම විනාශය අපේ රටට දැන් සිදුවෙලා අවසන්. හැබැයි, අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු පාරම්බාමින් මතු කරන්න උත්සාහ කරමින් තිබෙන්නේ, මේ ඛේදවාචකය ඇතුළේ රටක් විධියට අපි ගොඩනැඟෙනවා, එකට නැඟී සිටිනවා වෙනුවට, ඒක ඇතුළේ මරණ කීයක් තිබෙනවාද කියලා බලන්නයි. Newsවලින් බලන්නේ කී දෙනෙක් මැරිලා තිබෙනවා ද කියලායි; කී දෙනෙක් මේ තුළින් පීඩාවට පත් වෙලා තිබෙනවාද කියලායි. එහෙම හිතන තත්ත්වයක් ඇතුළේ රටක් ගොඩනඟන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොත වෙද්දී කොළඹ දිස්ත්‍රික්කයේ විතරක් පවුල් 80,000කට වැඩි ප්‍රමාණයක් ගංවතුර නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා. ලක්ෂ තුනකට වැඩි පුද්ගලයන පිරිසක් අවතැන් වෙලා තිබෙනවා. ඒකෙනුත් කොළොන්නාව ආසනය ගත්තොත් පවුල් 50,000කට වැඩි පිරිසක් ගංවතුර නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා. කොළොන්නාව ආසනයේ ලක්ෂ දෙකකට වැඩි පිරිසක් අවතැන් වෙලා තිබෙනවා.

මේක ආපදා තත්ත්වයක්. ආපදා තත්ත්වයක් කියන්නේ මොකක්ද? මේක කවුරුවත් සැලසුම් කරලා -plan කරලා- කරන ක්‍රියාවලියක් නොවෙයි. හැබැයි, විපක්ෂයේ අපේ සමහර මන්ත්‍රීවරු උත්සාහ කරනවා, පාස්කු ඉරුදින ප්‍රහාරයයි, මේකයි සම්බන්ධ කරන්න. පාස්කු ඉරුදින ප්‍රහාරය කියන්නේ මොකක්ද? පාස්කු ඉරුදින ප්‍රහාරය කියන්නේ ඒ සියලු සැලසුම් දැනගෙන තිබුණු සිද්ධියක්. ඒක live විතරයි දුන්නේ නැත්තේ. හැබැයි, මේක මොකක්ද?

එක නාළිකාවක් අල්ලාගෙන, බොරු තොරතුරු ටිකක් හදාගෙන විපක්ෂය විසින් දැන් සමාජයේ මතයක් හදමින් යනවා, "තොරතුරු තිබුණා. ආණ්ඩුව මොකුත් කළේ නැහැ" කියලා. අපේ පැත්තෙන් නිරන්තරව කියනවා, ඒ තොරතුරු තිබුණා නම් ඉදිරිපත් කරන්න කියලා. නමුත් ඒ මොකක්වත් නැහැ. ඒවා කියන්නේ නැතුව, ඒවා ඉදිරිපත් කරන්නේ නැතුව, "ඒ වාගේ විනාශයක් අත්පත් විය හැකියි" කියන කාරණය අල්ලාගෙන දේශපාලන හැකියාව තිබෙන සමහර මාධ්‍ය ආයතන පාවිච්චි කරමින් "ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ" කියලා පාර්ලිමේන්තුව තුළත්, එළියේත් මතයක් හදන්න උත්සාහ කරමින් යනවා. හැබැයි, ඒ විපක්ෂයේ මන්ත්‍රීවරු අපටත් කියනවා, අපි ඔක්කෝම එකතු වෙන්නම් ලු. අපි ඔක්කෝම මැදිහත් වෙන්නම් ලු. නමුත් මම කියන්නේ බොරුවට වැලමිටෙන් අල්ලන්න එපා කියලායි. අපෙන් නොවෙයි, මිනිසුන්ගේ හදවතින් අල්ලා ගන්න; මිනිසුන් බදාගන්න. සියලුදෙනා එකතු වුණොත් අපට පුළුවන් මේ රට ගොඩනඟන්න. එහෙම නැතුව බොරුවට වැලමිටෙන් අල්ලන්න ලෑස්ති වෙන්න එපා. ඒ විනාශය අත්පත් කරන ගමන් ඔවුන් අපට කියනවා, "අපි යෝජනා දෙන්නම්. අපි එකතු වෙන්නම්. අපි ඔක්කෝම එකතු වෙලා කටයුතු කරමු" කියලා. නමුත් එහෙම කරන්නේ නැහැ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා, ඇත්තටම මේ වැඩේ මිනිස්සුත් එක්ක එකතු වෙලා කරන්න ඕනෑය කියලා කියන. ඒ අයට මම ගරු කරනවා. ඒ වාගේම දේශපාලන කෝණයකින් විතරක් බලමින් විනාශය විතරක්ම අත්පත් විය යුතුයි කියලා බලාපොරොත්තු වෙන විපක්ෂයේ මන්ත්‍රීවර කණ්ඩායමකුත් ඉන්නවා. මේ විනාශය ඇතුළේත් අපේ රටේ මිනිස්සු පෙන්නමින් ඉන්නවා, කොපමණ විනාශයක් වුණත් යළි ගොඩනැඟිය හැකියි කියලා. කොළඹ දිස්ත්‍රික්කයේ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාම අපිත් එක්ක එකතු වුණා.

අපේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී මේ පිළිබඳව අවධානය යොමු කළාට පස්සේ අපේ සැලැස්ම වුණේ මොකක්ද? විපක්ෂයේ මන්ත්‍රීවරුත් එකතු කරගෙන හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ඒ වෙලාවේම ආපදා කමිටු කැඳෙව්වා. ඊට පස්සේ ග්‍රාම නිලධාරි වසම් ඇතුළේ තිබෙන ආපදා කමිටු සක්‍රිය කළා. ඊට පසුව හමුදාවට, පොලීසියට, විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාට ඒ තැන්වලට එන්න කියලා කථා කළා; ඒකට මැදිහත් වුණා. ඒ මැදිහත් වීමේ ක්‍රියාවලිය ඇතුළේ තමයි අපට මෙවැනි තත්ත්වයකදී පවා ඒ මිනිස්සු බේරා ගන්න පුළුවන් වුණේ. මේක ඇතුළේ තිබෙන සමහර දේවල් අපටම plan කරලා බේරා ගන්න බැහැ. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජන ඝනත්වය අතිශයින්ම වැඩියි. කොළොන්නාවත් එවැනි තැනක්. ඒ ප්‍රදේශයට ගංවතුර කියන්නේ පුරුදු දෙයක්. ඒ මිනිස්සු වුණත් තට්ටු දෙකටයි ගෙවල් හදාගෙන තිබෙන්නේ. අපි ඉවත් වෙන්න කියලා කොච්චර කිව්වත් ඔවුන් එහෙම යන්නේ නැහැ. ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරු ඒක දන්නවා. ඒ මිනිසුන්ට ආරක්ෂිත තැනකට එන්න කියලා කොච්චර කිව්වත් එන්නේ නැහැ. මිනිසුන්ගේ පැත්තෙනුත් ප්‍රශ්න තිබෙනවා. ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේ ආපදා අවස්ථාවකදී මිනිසුන්ට ඉන්න සුවපහසු තැනක් ලෝකයේ කිසිදු රටකට හදා ගන්න බැරි වෙලා තිබෙනවා. අපටත් බැරි වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ මිනිස්සු එන්නේ නැහැ. ඒ වතුර වැඩි වෙන්න, වැඩි වෙන්න මහා ගංවතුරක් ඒවි කියලා අපි පුරෝකථන කරමින් තිබුණා. අපි කවුරුත් කිව්වා, 2016 ගංවතුරට වඩා වැඩි ගංවතුරක් එමින් තිබෙන්නේ කියලා. ඒ පුරෝකථනය කරලාත් මිනිස්සු ඉවත් වුණේ නැහැ. ගඟක, මුහුදක වාගේ ගිහිල්ලා ඒ ප්‍රදේශවල මිනිස්සු බේරා ගන්න බැහැ.

ඒක තමයි ආපදා තත්ත්වය. මම කියන්නේ, පොදුවේ මේ රටේ ජනතාව බේරා ගැනීමේ ක්‍රියාවලිය ඇතුළේ මිනිස්සු කී දෙනෙකු අද hospitalsවල ඉන්නවාද? මිනිස්සු කීදෙනෙකු අද ආපදාවට පත් වෙලා තිබෙනවාද, මේ බේරා ගැනීම ඇතුළේ? මිනිස්සු විපතට පත් වුණු වෙලාවක, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු වාගේ අපි විනාශය බලාපොරොත්තුවෙන් ඉන්න කට්ටිය නොවෙයි. අපි රාජ්‍ය පද්ධතිය විශ්වාස කරනවා. අපි දන්නවා ප්‍රාදේශීය ලේකම්ලා, දිසාපතිලා, ගමේ ඉන්න සමහර නිලධාරින් සැලකිය යුතු ප්‍රමාණයකගේ ගෙවල් පිටින් යට වෙලා තිබුණ බව. මා දන්නා සමහර නිලධාරින් ඉන්නවා, ඔවුගේ දරුවන් වෙනත් තැන්වල තියලා, තමන්ගේ ගෙදර කටයුතු පැත්තක තියලා තවමත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, ග්‍රාම නිලධාරී වසමේ වැඩ කරනවා. එහෙම රාජ්‍ය පද්ධතියක් තිබෙන්නේ. ඒ නිසා අපි ඒක විශ්වාස කරනවා. ඒ වාගේම අපි මේ රටේ මහජනතාව විශ්වාස කරනවා. ඒ වාගේම ස්වේච්ඡාවෙන් කටයුතු කරන මිනිසුන් විශ්වාස කරනවා. බලන්න, අද ජාතික තරුණ සේවා සභාවේ තරුණ පිරිස් එකට එකතු වෙලා වැඩ කරනවා. විපක්ෂය වාගේ වැළමිටෙන් අල්ලා ගන්නේ නැතිව හදවතින් අල්ලාගෙන ඒ අය වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා.

ඛේදවාචකයක් වෙලා තිබෙනවා තමයි; විනාශයක් වෙලා තිබෙනවා තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අපි හැම දාම විනාශය බලාපොරොත්තු වෙන මිනිස්සු නොවෙයි. අපි සුබවාදය විශ්වාස කරන මිනිස්සු. ඒ විතරක් නොවෙයි. ඒ සුබවාදය මත යථාර්ථය විශ්වාස කරන මිනිස්සු.

ජනාධිපතිතුමා කිව්වා වාගේ දැන් මේ රට තිබෙන්නේ බින්දුවේ නම්, මේ රටේ ජනතාවත් එක්ක, සියලුදෙනා එක්ක එකතු වෙලා බින්දුවේ සිට මේ රට ගොඩ නඟන්න අපි ලැහැස්තියි. ඒ වෙනුවෙන් සියලුදෙනාම එකට අත්වැල් බැඳගෙන, වැළමිටෙන් අල්ලාගෙන නොවෙයි හදවතින් ආදරයෙන් අල්ලාගෙන වැඩ කරමු කියන ආරාධනය කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 3.19]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැය ආපදාවක් බවට පත් වුණු මොහොතක් මේක. බදුල්ල දිස්ත්‍රික්කය තමයි ලංකාවේ වැඩිම ආපදාවට පත් වුණු දිස්ත්‍රික්කය. ඉතුරු වුණේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොනරාගල, කළුතර වාගේ දිස්ත්‍රික්ක. දකුණේ මිනිස්සු හැම දාම මේ රට බේරා ගත්තා, දකුණේ මිනිස්සු හැම දාම මේ රටට උදවු කරනවා. ඉතින් මම මුලින්ම ඒ මිනිස්සුන්ට ස්තුතිවන්ත වෙනවා. අද වෙනකොට දකුණේ කඩවල වතුර බෝතල් නැහැ, අද දකුණේ කඩවල හාල් නැහැ, ලූනු නැහැ. හැබැයි ඒ මිනිස්සුන්ට කන්න නැති වුණත් බදුල්ල, නුවර, නුවරඑළිය දිස්ත්‍රික්කවල මිනිස්සුන්ව දකුණේ මිනිස්සු බලා ගත්තා, අපට උදවු කළා. ප්‍රධාන වශයෙන්ම මාතර, ගාල්ල, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවලින් තමයි අපට උදවු කළේ. අනෙක් දිස්ත්‍රික්කවලිනුත් උදවු කළා. ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්කවලින් බදුල්ලට ගිහිල්ලා දැන් මේ වෙනකොට ගමක් ගාණේ ඉඳගෙන ශුද්ධ කරනවා, වැඩ කරනවා, බෙදනවා, උයනවා, කන්න දෙනවා. ඒ නිසා දකුණේ මිනිසුන්ටත්, රටේ අනෙක් මිනිසුන්ටත්, අපි වෙනුවෙන් කරන ඒ සේවයට මම වැඳ නමස්කාර කර අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා.

හැබැයි, ඒ අතර අද දකුණේ මිනිස්සුන්ටත් එන එක එපා කරවන වැඩක් වෙනවා; එතැනත් දේශපාලනය තිබෙන්නේ. මේ බලන්න, මේ පින්තූරයේ තිබෙන්නේ හක්මන ප්‍රාදේශීය සභාවේ කැබ් එක. ඒකේ ගහලා තිබෙනවා, "රතු රතුව". ඒ කැබ් දෙකම එළියට එනවා හක්මන ප්‍රාදේශීය සභාවෙන්. රජයේ වාහනවල රතු තරුව ගහගෙන. ආණ්ඩුව මේ තත්ත්වයට පත් වෙන්න එපා. රතු තරුව ගහලා තිබෙන මේ වාහන දෙකේ photos දෙක මම සභාගත* කරනවා.

ආණ්ඩුවට මම කියනවා මේ තත්ත්වයට වැටෙන්න එපා කියලා. දේශපාලනය කරන්න. ගේන ඒවා, බෙදන ඒවා දේශපාලනමය වශයෙන් කරන්න. මම බදුල්ල දිස්ත්‍රික්කයේ හැම centre එකකටම ගියා. කිසිම දෙයක් මම ඉල්ලලා බෙදා ගත්තේ නැහැ. ලුණු පැකට් එකක් හරි මගේ අතින් අරගෙන දෙන්න පුළුවන් නම් මම අරගෙන දුන්නා. ඒ හැරෙන්න මම කාගෙන්වත් ගන්නවත්, ඒ එන මිනිස්සුන්ට කරදර කරන්නවත් ගියේ නැහැ. මම මේ වෙලාවේ ආණ්ඩුවට කියනවා, දෙකයි පණහේ වැඩ කරන්න එපා කියලා. දෙකයි පණහේ වැඩ කියන්නේ ඕවාට.

මම යනකොට හිඳගොඩ පන්සලේ සමන්ත විද්‍යාරත්න මහත්තයා හිටියා. 300කට වඩා නවත්වලා ඉන්නවා, හිඳගොඩ පන්සලේ. මම ඇවිදගෙන යනකොට ඒ මිනිස්සු මට කථා කළා. මම ඇහුවා ඔබතුමන්ලා "රතු තරුවද" කියලා. "නැහැ, අපි තරුව නොවෙයි. අපිව එච්චර මාතරින්. අපි ඇවිල්ලා ඉන්නේ වැඩ කරන්න" කිව්වා. "බොහෝම හොඳයි. වෙන්න ඕනෑ මොනවාද, වුවමනා මොනවාද?" කියලා මම ඇහුවා. මම ඒ ගැන වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟ එක, බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රධාන පාලම දෙමොදර ස්ප්‍රින්වැලි පාලම. සුද්දෝ ඒ පාලම හදලා අවුරුදු 150ක් වෙනවා. අද ඒ පාලම නැහැ. ඒ වාගේම පස්සර, නමුණුකුල, කනවරල්ල පාලම. සුද්දෝ ඒ පාලම හදලා අවුරුදු 150ක් වෙනවා, තේ ෆැක්ටරි පටන් ගන්න කාලයේ. අද ඒ පාලම නැහැ.

ඒ වාගේම, ලුණුගල ජනතාපුර පාලම නැහැ. බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගලට තවම යන්න බැහැ, බිබිලට ගිහිල්ලා තමයි යන්න ඕනෑ. පස්සරට ගිහිල්ලා යන්න බැහැ. ඒ වාගේම තවම හක්ගල මල්වත්ත ළඟින් පාර හදන්න බැහැ. ඒ වාගේම, සිල්මියාපුර පාර උඩින් ආපු අඹේවෙල පාරට වැටිලා, අඹේවෙල පාරෙන් ආපු නාය කිලෝමීටර 6ක් පහළට ඇවිල්ලා අඹේවෙල පාර තවම ඇරගන්න බැහැ. ඒ වාගේම නුවරඑළිය-බදුල්ල ප්‍රධාන පාර අරින්න බැහැ. කෝච්චි පාර මාස හයකින්වත් අරින්න බැහැ. මේක සෙල්ලමකට ගන්න එපා, මේක සෙල්ලමකට ගත්තොත් ලොකු ප්‍රශ්නයක් වෙනවා. නමුණුකුල කන්ද දෙපැත්තකට පිපිරුවා. එක පැත්තක් පස්සර පැත්තට පුපුරලා පස්සර පැත්ත ඉවර වුණා. අනෙක් පැත්ත ස්ප්‍රින්වැල්ල පැත්තට වැටිලා, බදුල්ල නගරයත් එක්ක ඉවර වුණා. නමුණුකුල කන්දේ බලපෑම තමයි. ගල් පිපිරුවා, මේගොල්ලෝ ගහපු බොරුවලට. ගල් පුපුරන බොරු නේ කිව්වේ. "ගල් පැළෙන බොරු" කියලා ඉස්සර කියනවා නේ. ඒ නිසා ගල් පැළුණා. කඳු පැළුණා. කඳු විනාශ වුණා. ඒ නිසා මේක සෙල්ලමකට ගන්න එපා.

ඊළඟට, මම කියන්න යන්නේ මහියංගනය ගැන. මහියංගනයේ ඇමතිතුමා සභාවේ ඉන්නවා. මහියංගනය ඉස්පිරිතාලය ගැන කියන්නේ. ගාමිණී දිසානායක මැතිතුමා කඩිනම් මහවැලි ව්‍යාපාරය පටන් අරගෙන අවුරුදු 46ක් වෙනවා. රන්ටැඹේ, රන්දෙණිගල ජලාශවල වාන් දොරටු හරියට වෙලාවෙන් වෙලාවට ඇරලා තිබුණා නම් මේක වෙන්නේ නැහැ. අද මහියංගනය රෝහලට වුණු පාඩුව කියන්න බැහැ. මහියංගනය රෝහලට නුවර, මාතලේ, අම්පාර, මොනරාගල, බදුල්ල, පොළොන්නරුව වාගේ දිස්ත්‍රික්ක හයක මිනිස්සු බෙහෙත් ගන්න එනවා. මහියංගනය රෝහල ඉවරෙටම ඉවරයි. මහියංගනය රෝහලේ යන්ත්‍ර ඉවරයි, ගන්න දෙයක් නැහැ. උසාවිය ඉවරයි. පොලීසිය ඉවරයි. පූජා නගරය ඉවරයි. බුදුන්ගේ කාලයේවත් වුණේ නැහැ. මහියංගනයට බුදුන් වැඩම කළාට පසු හදපු මහියංගනය විහාරස්ථානයට මෙච්චර කල් වුණේ නැති දෙයක් මෙවර වුණා. මේ වගකීමෙන් ඇමතිවරුන්ට බැහැර වෙන්න බැහැ. මන්ත්‍රීවරු මේක හොඳට අහගන්න. මේවා වෙලාවට කලාවට කරමින්, ටික ටික, ටික ටික වතුර ඇරලා තිබුණා නම් මේ ප්‍රශ්නය වෙන්නේ නැහැ. අද මහියංගනය උසාවියේ එක නඩුවක් අහන්න බැහැ. උසාවියේ ෆයිල් සම්පූර්ණයෙන් ඉවරයි. මේවා පිළිගන්න වෙනවා. කඩිනම් මහවැලි ව්‍යාපාරය පටන් ගෙන අවුරුදු 46යි. හැබැයි, ඒ 46 අවුරුද්දට වෙච්ච නැති දෙයක් මෙවර වුණා. නාය ගිය ඒවාට අපි මොනවත් කියන්නේ නැහැ. නාය ගිය ඒවාට මොනවත් කියන්න බැහැ. ඒක මේ ඉන්න 159දෙනාට අතින් අල්ලා නවත්වා ගන්න බැහැ. ඒවා නවත්වන්න බැහැ. හැබැයි,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වතුර අරින එක එහෙම නොවෙයි. කවුද, වාරිමාර්ග ඇමති? වාරිමාර්ග ඇමතියි, නියෝජ්‍ය ඇමතියි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අනෙක් ඇමතියි, - *[බාධා කිරීමක්]* භාගයක් ගහන්න නොවෙයි; බෝතලයක් ගහන්න නොවෙයි, ඉල්ලා අස් වෙන්න කියන්න. වාරිමාර්ග ඇමතිට බයිලා ගහන්න එපා කියන්න. වාරිමාර්ග ඇමති ඉල්ලා අස් වෙන්න ඕනෑ. ආණ්ඩුව නොවෙයි, වාරිමාර්ග ඇමති ඉල්ලා අස් වෙන්න ඕනෑ. වාරිමාර්ග ඇමති නිකම් හරි මේ ගැන හොයලා බලලා තිබුණා නම්, මේක ටිකක් හරි විසඳා ගන්න තිබුණා. මේ වගකීමෙන් බැහැර වෙන්න බැහැ. කවුරුත් ඇමතිවරුන්ට මම කියනවා, වගකීම පැහැර හරින්න බැහැ කියන එක. මේක ලොකු ප්‍රශ්නයක්.

මේ වෙලාවේ සභාවේ ඉන්නවා, වැවිලි කර්මාන්ත ඇමති. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා, මේක පොඩ්ඩක් අහගන්න. ඔබතුමා බදුල්ල දිස්ත්‍රික්කයේ. ඔබතුමා වැවිලි කර්මාන්ත ඇමතිතුමා. ඇමතිතුමනි, කැනවරැල්ල ඉඩම් ටික දෙන්න අවුරුදු තුනක් ගියා; පර්චස් 15ක් දෙන්න අවුරුදු තුනක් ගියා. හැබැයි, දැන් ඒ සෙල්ලම් කරන්න බැහැ. වතු සමාගම්වලට කියන්න. ආණ්ඩුවට මම කියනවා, වතු ඉඩම් බලෙන් ගන්න ඕනෑ. ආයෙත් අරවා මේවා කර කර ඉන්න බැහැ. වතු ඉඩම් එහෙම අම්මාගේ අප්පාගේ බූදලය නොවෙයි නේ. වතු බලෙන් ගන්න ඕනෑ.

ඊළඟට කියන්න ඕනෑ, Forest Conservation Department එක ගැන. Forest Conservation Department එකේ මහත්වරු DDC එකට ආවාම බලන්න එපායැ, එයාලාගේ respect එක! පරිසර ඇමතිතුමා, Forest Conservation Department එකට කියන්න. ගස් හදමු පස්සේ. ඉඩම්වල ඉන්න අය ජීවත් කරවන්න ඕනෑ. ගස් හදන්න ඕනෑ තමයි. නාය ගිය ඉඩම්වල ගස් හදන්න දෙන්න. දෙපැත්තට මාරු කරන්න. එහෙම නැත්නම් Forest Conservation Department එකෙන් මේවා ගන්න වෙන්නේ නැහැ. DDC එකට එන මහත්වරුන්ගේ respect එක බලන්න එපායැ. ඒ සෙල්ලම් කරන්න බැහැ මේ සැරේ. දැන් බදුල්ලේ ඉඩම් ගත්තාම, පස්සර ඉඩම් ගත්තාම, ගෙයක් හදා ගන්නම තැනක් නැති වෙනවා. පස්සර ආසනයේ කඳවුරුවල අටදහස් ගණනක්, දහදහස් ගණනක් විතර ඉන්නවා. මුළු දිස්ත්‍රික්කයේම ලක්ෂයකට වැඩිය ඉන්නවා. කොහේද ඒ මිනිස්සුන්ට ගෙවල් දෙන්නේ?

ඊළඟ කාරණය මේකයි. ඇමතිවරු මේක අහගන්න. දීර්ඝ කාලීන බදු යටතේ අක්කර 50, 100 තියා ගෙන ඉන්නවා. ඊළඟට, LRC ඉඩම් සල්ලිකාරයෝ අල්ලාගෙන ඉන්නවා. ඒවා ඔක්කොම ගන්න ඕනෑ. ඒවා අරගෙන හැකි ඉක්මනින් මේ නිවාස ව්‍යාපෘති පටන් ගන්න වෙනවා.

නැත්නම් ආයෙත් වැහි කාලය එනකොට මේක අමතක වෙයි. මිනිස්සු ආයෙත් ඒ ගෙවල්වලටම යයි. ඊළඟ වැස්සට ආයෙත් ඒ මිනිස්සුන්ව කඳවුරුවලට ගේන්න වෙයි. මේ, දෙසැම්බර් මාසය. තවම වහින්න පටන් ගත්තේ නැහැ. මේ මාසයේ තමයි හරියටම වහින්නේ, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි. මේ, වහින මාසය. වහින මාසයක නොවෙයි වැස්සේ. ඒ නිසා අපට මේවා ඔක්කෝම ගැන කල්පනා කරලා වැඩ කරන්න වනවා.

විශාල පිරිසක් බැංකුවලින් ණය - loans - අරගෙන තිබෙනවා. බැංකුවලින් දැන්මම මිනිස්සුන්ගේ cheques return කරනවා. මුදල් ඇමතිතුමාට කියලා ඒවාට සහනයක් අරගෙන දෙන්න. බැංකුවලින් පොලියට ගත් මිනිස්සු, ණය ගත් මිනිස්සු, ලීසිං ගත් මිනිස්සු මේ වෙලාවේ අනාථ වෙලා තිබෙනවා. එම නිසා මේ වෙලාවේ ඒ අය ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ.

ඒ වාගේම මේ වෙලාවේදී මම තව කාරණයක් කියන්න ඕනෑ. පන්නල ප්‍රදේශයේ තිබුණු වැඩිහිටි නිවාසයේ හිටපු 11දෙනෙකු මැරුණා. ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න තැනක් නැති නිසා තමයි වැඩිහිටි නිවාසයට ගිහිල්ලා තිබෙන්නේ. අපටත් තව ටික කාලයකින් වැඩිහිටි නිවාසයකට යන්න වෙයි. ඒ 11දෙනාම මැරුණා. ආණ්ඩුවට ඒ ගැනත් බලන්න වනවා. අපේ පළාතේ ගෙදරක අම්මයි, දුවයි සිටියා, ඒ අය මේ ව්‍යසනයට ගොදුරු වුණා. ඊට පස්සේ මම ගියා, තිසර මල්ශාලාවට. දෙන්නාගේම මරණ දෙක තියලා තිබුණා. බලාගෙන ඉද්දි වතුර පිරිලා මැරිලා. සංවේදී කථාවක්. බලාගෙන ඉද්දි වතුර පිරිලා තිබෙන්නේ. ඒ වාගේ සිදුවීම් ගොඩක් වෙලා තිබෙනවා.

අනෙක් කාරණය මෙයයි. කවුරුහරි උදවු කරන්න ආවාම අපි මොකටද ඒකට විරුද්ධව චක්‍රලේඛ ගහන්නේ, ඇමතිතුමනි? Neth FM එකයි, Lanka Hospitalsයි එකතු වෙලා සායන පවත්වා මේ අසරණ මිනිස්සුන්ට බෙහෙත් ලබා දෙනවා කියලා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ලියුමක් ගහලා ඒක නතර කරනවා, පෞද්ගලික රෝහල්වලට පෞද්ගලික සායන පවත්වන්න එපා කියලා. මොකක්ද මේ කරන්නේ? මිනිස්සු අමාරුවේ වැටිලා ඉන්න වෙලාවක කවුරුහරි දොස්තර කෙනෙක් ගිහිල්ලා ඒ මිනිස්සුන්ට බෙහෙත් ටිකක් දෙනවා නම් අපට මොකෝ? සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, ඊයේ චක්‍රලේඛයක් ගහලා තිබෙනවා, Neth FM එකයි, Lanka Hospitalsයි එකතුවෙලා කරගෙන යන වැඩසටහන නතර කරන්න, බෙහෙත් දෙන්න එපා කියලා. මේ වාගේ වැඩ කරන්න එපා. මේ වෙලාවේ අපි ඕනෑම මිනිහෙකුගෙන් උදවු ගන්න ඕනෑ. මේ වෙලාවේ උදවු ගන්නේ නැත්නම් කවදා උදවු ගන්නද? ඒ විධියට අපි ඔක්කෝම එකතුවෙලා මේ ව්‍යසනයට මුහුණ පෑ මිනිස්සුන්ට උදවු කරන්න ඕනෑ. ඒකයි මම අද දකුණේ මිනිස්සුන්ට වැඳ නමස්කාර කළේ.

සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණයත් කියන්නම්. ගරු ඇමතිතුමනි, සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ සභාපතිතුමිය ලියුමක් යවලා තිබෙනවා, ලක් රුවන් එන්ටර්ප්‍රයිසස් (පෞද්ගලික) සමාගමට. මා ළඟ ඒ ලියුම තිබෙනවා. ඔබතුමා හාල් සම්බන්ධයෙන් ලක් රුවන් සමාගමට විරුද්ධව CID එකට ගිහින් පැමිණිල්ලක් දැම්මා නේ. හැබැයි, දැන් ඒ කොම්පැනියටම දුඹුරු සීනි කිලෝව රුපියල් 183 ගණනේ දෙන්න හදනවා. මා ළඟ ඒ ලියුම තිබෙනවා. ඒ සභාපතිතුමියගේ නමත් මම කියන්නම්. සීනි අවශ්‍යතාවෙන් සියයට 85ක් ලංකාවට ගෙන්වද්දි, ලංකාවේ පැල්වත්තේ සීනි - දුඹුරු සීනි- කිලෝව රුපියල් 183 ගණනේ ඩුබායිවලට යවන්න හදනවා. මා ළඟ තිබෙනවා, සභාපතිතුමියගෙන් ඒ සඳහා ඉල්ලීමක් කරන ලද ලිපිය. මේ ලියුමේ සභාපතිතුමියගේ නම තිබෙනවා, අත්සන තිබෙනවා. සභාපතිතුමියගේ නම සඳමාලි චන්ද්‍රසේකර. මොකක්ද, අනේ මේ විහිළුව? අපට සීනි පිට රටින් ගෙන්වනවා. මෙහේ සීනි ටික -දුඹුරු සීනි- කිලෝව රුපියල් 183 ගණනේ ඩුබායිවලට යවන්න හදනවා. මේ ලියුමේ ඒ විස්තර ටික තිබෙනවා. මේ අවස්ථාවේදී මම මේ ලියුම් දෙකම **සභාගත*** කරනවා.

අද මේ ව්‍යසනයට අපි ඔක්කෝටම මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. මේ ව්‍යසනය නිසා විශේෂයෙන් බදුල්ල දිස්ත්‍රික්කයට

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

දැඩි හානියක් වෙලා තිබෙනවා. අද ඇකිරිය, මැටිගහතැන්න මිනිස්සු අසරණ වෙලා. පිටමාරුවට ඊයේ හෙලිකොප්ටරයෙන් බඩු යැව්වේ. මම දැක්කා, සමන්ත විද්‍යාරත්න මහත්මයාත් බොහොම සන්තෝසයෙන් හෙලිකොප්ටරයට හාල් පටවනවා. ඊයේ බදුල්ල වින්සන්ට් ඩයස් පිට්ටනියේදී තමයි හාල් පටවනවා මම දැක්කේ. ඒක හොඳයි. පිටමාරුව ප්‍රදේශයේ ජනතාවට කන්න මොකුත් තිබුණේ නැහැ. ඒ වාගේ හොඳ දේවල්වලට අපි හොඳයි කියනවා. අද ඇකිරිය, මැටිගහතැන්න මිනිස්සුන්ට කන්න නැහැ. මම ඇකිරියට, මැටිගහතැන්නට බඩු යැව්වේ, ලුණුගල ප්‍රාදේශීය සභාවට කියලා පාරවල් කපාගෙන. අපි බඩු එකතු කරලා ඇකිරියට, මැටිගහතැන්නට යැව්වා. ඒ වාගේ ප්‍රදේශ ගොඩක් හානියට පත්වෙලා තිබෙනවා. මේක ගොඩ දමනවා කියන එක ලෙහෙසි සෙල්ලමක් නොවෙයි.

අද මිනිස්සුන්ට වුවමනාව තිබෙන්නේ කඳවුරුවල ඉන්න නොවෙයි, තමන්ගේ තේ දලු ටික ගේන්නයි. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, අහගන්න. මේ ඊයේ පෙරේදා තව සිද්ධියක් වුණා, ආගරතැන්න, වැල්ගොල්ලේ, ඔයගොල්ලන්ගේ පස්සර සභාපතිතුමාට. ඉතින් මිනිස්සු මේ වෙලාවේ බණිනවා. සමන්ත විද්‍යාරත්න මහත්තයාට දොස් කිව්වාම, එතුමා එදා ආවා, මොනවත් කියන්න ගියේ නැහැ. ගරු ඇමතිතුමා, ඔබතුමා රණ්ඩු වෙන්න යන්නේ නැහැ. කඳවුරුවලට ගියාම, අපටත් දොස් කියනවා. මිනිස්සු ආවේශ වෙලා ඉන්නේ; මිනිස්සු ගහගන්න එනවා; බණින්න එනවා. ඒ මිනිස්සු අපේ වැල්ගොල්ලේ, පස්සර සභාපතිතුමාට බැණලා. පස්සර සභාපතිතුමා චණ්ඩි වගයක් පස්සරින් අරගෙන ගිහිල්ලා අර නාය ගිය අය ඉන්න කඳවුරට ගහන්න. ඒක හොඳ දෙයක්ද බලන්න? නාය ගිය අය ඉන්න කඳවුරට ගහන්න පස්සර නගරයේ චණ්ඩි ටිකක් අරගෙන ගිහිල්ලා. මිනිස්සු දුකට මොනවා හරි කියනවා. පොඩ්ඩක් ඉතින් දන්නේ නැද්ද, හවස් වෙනකොට කඳවුරුවල පොඩි දේවල් වනවා. කඳවුරුවල ඉන්නකොට ඒ ප්‍රශ්න තිබෙනවා. ඒ තැන්වලට අපි ගියාම, ඔව්" කියලා දෙකට නැමිලා අහගෙන ඉඳලා එන්න ඕනෑ. මිනිස්සුන්ට ඇහුම්කන් දෙන්න ඕනෑ. මිනිස්සු හිතේ අමාරුවට එක එක දේවල් කියනවා. ඉතින් එතැනට ගිහිල්ලා, සමහරු චණ්ඩිකම් පෙන්වන්න හදනවා. එහෙම චණ්ඩිකම් පෙන්වන්න එපා කියන්න. එහෙම වුණොත් මේ වැඩේ කරන්න බැරි වෙනවා. මොකද, ගහ මරාගෙන මේ වැඩේ කරන්න බැහැ, ගරු සෞඛ්‍ය ඇමතිතුමනි. ගහ මරාගෙන මේක කොහොමත් කරන්න බැහැ. මොකද, මේක අපි අතින් වෙච්ච වැරැද්දක් නොවෙයි. වැස්සා, කඳු නාය ගියා. බදුල්ල-මහියංගන පාරට ගල් වැටිලා. දෙවි හාමුදුරුවනේ! අලින්ටවත් ඒ ගල් ගේන්න බැහැ. අලින්ට ගේන්න පුළුවන් ගල් පාරට වැටිලා තිබෙනවා. ඒ තරම් ව්‍යසනයක් වෙලා තිබෙනවා. දුන්හිඳෙන් ගලපු ජලකඳ නිසා අනික් පැත්තේ කුඹුරු ඔක්කෝම විනාශ වුණා. පස්සර ගමක් තිබෙනවා, මඩුගස්තලාව කියලා. ඒ ගමේ කුඹුරු යායක් තිබුණේ. දැන් ඒ ගමේ කුඹුරුවල බෙත්තාරාම පිට්ටනිය හදන්න පුළුවන්, වැස්සට එච්චර වැලි පිරිලා. අන්න ඒ තත්ත්වයට මේ රට දැන් පත් වෙලා තිබෙනවා.

අද මම ආවේ බදුල්ලේ ඉඳන්. මම උදේ 9.00ට ආවේ. අද මම මෙතැනට ආවේ ඇයි? අපට කන්න දීපු මිනිස්සුන්ට ස්තුතියක් කරන්න. අදින් පසු පාර්ලිමේන්තුව මාසයකට වහනවා. ඒකයි මම අද ආවේ. දකුණේ මිනිස්සුන්ට අපි මේ වෙලාවේ ස්තුති කරන්න ඕනෑ. අපි ඒ අයට ගරු කරන්න ඕනෑ. ඒක නිසා මම කියනවා, මෙතැන දේශපාලනය කරන්න එපා, වැඩ කරන්න කියලා. *[බාධා කිරීමක්]* මට තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි දෙකක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දේශපාලනය කරන්න ඕනෑ වෙලාවල් තිබෙනවා. දැන් බලන්න, Clean Sri Lanka වැඩසටහන. Clean Sri Lanka වැඩසටහන කියලා මොකක්ද එකක් හැදුවාට දැන් තිබෙන්නේ මොන ශ්‍රී ලංකා ද? “Rebuilding Sri Lanka” වැඩසටහන. එහෙම නම් මොකටද, Clean Sri Lanka වැඩසටහන හැදුවේ? සල්ලි වියදම් කරලා, බෙර ගහලා, ජනාධිපති ලේකම් කාර්යාලයේ ලස්සන huts ගහලා කරපු Clean Sri Lanka දැන් “Rebuilding Sri Lanka” වෙලා. මොන ශ්‍රී ලංකාව හරි කමක් නැහැ, මේ ඉන්න මිනිස්සුන්ගේ ගෙවල් ටික හදලා දීලා, පාලම් ටික හදලා, කෝච්චි පාර හදලා දුන්නේ නැත්නම් මොකුත් කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දේවල් යථා තත්ත්වයට පත් කළේ නැත්නම් අපේ රටේ සංචාරක ව්‍යාපාරය නැති වෙනවා. දිගට හරහට පිට රටින් හාල් ගේන්නත් වෙනවා. හැබැයි, ඉතින් මේකෙන් වාසිය එන්නේ එක්කෙනෙකුට. කාටද? *[බාධා කිරීමක්]* අන්න අර පුටුවේ ඉන්න කෙනාට තමයි; දිගටම හාල් එනවා නේ. ලංකාවේ හාල් නැති වෙනකොට අරයාට බඩු හම්බ වෙනවා. ඉන්දියාවෙන් බඩු එනවා. ඩං, ඩං ගාලා හාල් ගෙනැත් දෙයි. ඩං, ඩං ගාලා ලූනු ගෙනැත් දෙයි. එතුමා ගොඩ යයි. මිනිස්සු ඉවරයි. ඒක තමයි වෙන්නේ. දැන් කොහේද කුඹුරු ඉතිරි වෙලා තිබෙන්නේ? මහියංගනය ඉවරයි, පොළොන්නරුව ඉවරයි, අම්පාර ඉවරයි, මඩකලපුව ඉවරයි. ඔහොම වෙනකොට කොහෙන්ද හාල් හම්බ වෙන්නේ? මේ නිසා අපේ හිතට හරිම අමාරුයි. සමහර ප්‍රදේශවලට ගියාම බඩ පපුව දාලා යනවා. තේ වතු පිටින් -අක්කර 500- නාය ගිහිල්ලා. නමුණුකුල කන්ද බැලුවාම පොඩ්ඩයි පේන්නේ. නමුත් පහළට බැලුවාම කියුබ් 5,000ක් විතර ඇවිල්ලා තිබෙනවා, පාරට. ඩෝසර් දාලා දවස් 50ක් අයින් කළත් අයින් කරලා ඉවර කරන්න බැරි landslips ඇවිල්ලා තිබෙනවා. එහෙම landslips තමයි ඇවිල්ලා තිබෙන්නේ.

මේ සමහර තැන් බැලුවොත්, දැන් මට ලුණුගලට යන්න බැහැ. අපි ලුණුගලට යන්නේ කොහේට ගිහිල්ලාද? ලුණුගලට යන්න ඕනෑ, රිදීමාලියද්දට ගිහිල්ලා සමන්ත විද්‍යාරත්නගේ ගෙදරින් තේ එකක් බීලා. ඊට පස්සේ යන්න ඕනෑ, බිබිලට. බිබිලට ගිහිල්ලා, බිබිලෙන් යන්න ඕනෑ, අරවාකුඹුර හරහා ලුණුගලට. කොහොමද, රවුම?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කොහොමද, රවුම? *[බාධා කිරීමක්]* එතුමා තේ දෙන්නේ නැහැ. එතුමා මට ගුටි දෙයි. කොහොමද, රවුම? ලුණුගලට යන්න කිලෝමීටර සිය ගාණක් යන්න වෙනවා. සෞඛ්‍ය ඇමතිතුමනි, මම පස්සරට ගියේ කොහොමද කියලා දන්නවාද? ඇල්ලට

ගිහිල්ලා, ඇල්ලෙන් වැල්ලවායට ගිහිල්ලා, වැල්ලවායෙන් බුත්තලට ගිහිල්ලා, බුත්තලින් බඩල්කුඹුරට ගිහිල්ලා, බඩල්කුඹුරෙන් පස්සරට ගියේ. කොහොමද, දුර? කිලෝමීටර 100ක් වැඩියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි පයින් ගියා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔයගොල්ලන් පයින් බැරි නම් හෙලිකොප්ටරයේ හරි යන්න. අපට ඒකට කමක් නැහැ. අපි මේ සත්‍යය කියන්නේ. මම මේ දවස් 6ට නොගිය ගමක් නැහැ, නොගිය තැනක් නැහැ. මම හැම තැනකටම ගිහිල්ලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපට ආණ්ඩුවට කියන්න පුළුවන්, මෙන්න මෙතැන මේ ප්‍රශ්නය තිබෙනවා කියලා. අපිට මේවා කරන්න කියලා නොවෙයි අපි කියන්නේ. සිල්මියාපුර මුස්ලිම් ගම්මානය නාය යනකොට මුස්ලිම් මිනිස්සු හොඳ වෙලාවට හිටියේ අට දෙනායි. සිල්මියාපුර බොරගස් ප්‍රදේශයේ මුස්ලිම් මිනිස්සු පදිංචි වෙලා ඉන්න ගෙවල් තිබෙන්නේ එක ළඟ. ඒ අය හිටියා නම් ඔක්කොම විනාශ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම ආණ්ඩුවට කියනවා, මේ වෙලාවේදී මේ වැඩේ අතට ගත්තේ නැත්නම් මේ ව්‍යසනය කොරෝනා වසංගතයටත් වඩා දරුණු වෙයි කියලා. මට මේ කාරණය කියන්න පොඩි වෙලාවක් දෙන්න. මම මේ කියන්න යන කාරණය හොඳට අහගන්න. 1983දී ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුව කාලයේ ජූලි කලබල ඇති වුණා. ප්‍රේමදාසට, LTTE සහ JVP දෙගොල්ලන්ම ගැහුවා. චන්ද්‍රිකාගේ කාලයේ සුනාමිය ආවා. මහින්දගේ කාලයේ යුද්ධය තිබුණා. මෛත්‍රීපාලගේ කාලයේ පාස්කු ප්‍රහාරය ඇති වුණා. ඊට පස්සේ ගෝඨාභයගේ කාලයේ කොරෝනා වසංගතය ආවා. දැන් අනුර කුමාරගේ ආණ්ඩුව කාලයේ ගංවතුර සහ නාය යාම් ආවා. පෝලිමට නායකයින්ට ප්‍රශ්න ඇවිල්ලා තිබෙන්නේ. නායකයින්ට ගාණට ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා.

හැබැයි, මම එක කාරණයක් කියනවා. වාරිමාර්ග ඇමතිතුමනි, ඔබතුමාට ජම්පර් අඳින්න වෙනවා. වාරිමාර්ග ඇමතිතුමාට ජම්පර් අඳින්න වෙනවා. මොකද, වාරිමාර්ග ඇමති ජම්පර් අඳින්න ඕනෑ. ඔබතුමාට ජම්පර් අන්දනවා. වාරිමාර්ග ඇමතිතුමා නිසා තමයි මිනිස්සු ගොඩක් මැරුණේ කියන එක මේ වෙලාවේදී ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් ඇමතිතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා, මේ ආපදා තත්ත්වයත් එක්ක හදිසි නීතිය ප්‍රකාශ කළේ කොහොමද කියන එක සම්බන්ධව. එතුමන්ලාත් ඉල්ලීමක් කළා, හදිසි නීතිය ප්‍රකාශයට පත් කරන්න කියලා. හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ 1959 මහජන ආරක්ෂක ආඥාපනත යටතේයි. රටේ ඇති වෙච්ච ආපදා තත්ත්වය සැලකිල්ලට ගෙන ජනාධිපතිවරයාගේ බලතල අනුව තමයි හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. අද හදිසි නීතියට අදාළ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි අද දිනයේ ඒවා සම්මත කරනවා. ඒවා සම්මත කර ගැනීමෙන් පසුව ඒවා නීත්‍යනුකූල වෙනවා. එතකොට ගරු මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ. එතුමන්ලාත් ඉල්ලීමක් කරපු නිසා තමයි හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ තමයි අපි ඒක කරලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
චාමර සම්පත් මන්ත්‍රීතුමාත්, අද උදෑසන රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් සභාවේදී කියා තිබුණා, සෞඛ්‍ය කඳවුරු පවත්වන්න එපා කියලා සෞඛ්‍ය අමාත්‍යාංශයත් නිවේදනය කළාය කියලා. ඒක වැරදි ප්‍රකාශයක්. පෞද්ගලික රෝහල් හෝ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පෞද්ගලික ආයතන මඟින් සෞඛ්‍ය කඳවුරු පැවැත්වීමේදී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය සහිතව එය ලබා ගන්න කියන එක තමයි කියා තිබෙන්නේ. මම හිතනවා, ඒක සාධාරණයි කියලා. එහෙම නැත්නම් මේ වාගේ ආපදා අවස්ථාවකදී එහෙම සෞඛ්‍ය කඳවුරු පවත්වාගෙන යනකොට තවත් අර්බුදයක් පැන නඟිනවා. ඒ නිසා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හරහා MOH එකේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ට දැනුම් දීලා කටයුතු කළාම ඒක අපේ සෞඛ්‍ය පද්ධතියට ඒකාබද්ධ කර ගැනීමට පහසුයි. එහෙම නැතුව අපි ඒවා නතර කරන්න නොවෙයි හදන්නේ. ප්‍රශ්න ඇති වන එක වළක්වා ගැනීම සඳහා තමයි ඒ විධියට කටයුතු කරන්නේ. ඒ නිසා එතුමන්ලා කියපු මතය නිවැරදි නොවන බව මම කියන්න කැමැතියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Madam, I rise to a point of Order. මගේ නම කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තත්පර 30කින් කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තත්පර 20යි මට ඕනෑ. ගරු ඇමතිතුමනි, අධ්‍යක්ෂ ජනරාල්ට කියන්න, ලියුම ගහනකොට වචන හරියට ගළපලා ගහන්න කියලා. ඔය වචනය ඇති, එක එක ආයතනවලට අල්ලා ගන්න. ඕක කිව්වේ වෙන කවුරුවත් නොවෙයි, Neth FM එකෙනුයි, Lanka Hospitals එකෙනුයි. මම ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේවත් ඔබතුමාට මඩ ගැහුවේ නැහැ නේ. ඒ දෙන්නාගෙන්ම ඔබතුමා ඒ ගැන හරියට අහගන්නකෝ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, Lanka Hospitals එකත් රජයට සම්බන්ධ රෝහලක් නේ. ඒ නිසා ඒක ප්‍රශ්නයක් වෙන්න හේතුවක් නැහැ. මීට කලින් එහෙම අවස්ථා කිහිපයකදීම එක එක තැන්වල සෞඛ්‍ය කඳවුරු පවත්වන්න ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ඉන්න රජයේ රෝහල්වල වෛද්‍යවරු සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් අතර ප්‍රශ්න පැන නැඟිලා තිබෙනවා. ඒ නිසා තමයි මේ උපදෙස නිකුත් කරලා තිබෙන්නේ. ඒ අනුව කටයුතු කළාම කාටත් පහසුයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අදහස ඉතාම කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ආණ්ඩුවෙන් යම් කාරණයක් දැනගන්න අවශ්‍යයි. මම ඒ ගැන ඉතාම කෙටියෙන් අහන්නේ. ඔබතුමන්ලා ආපදාවට පත් පුද්ගලයෙකුගේ දිනක උදේ, දවල් සහ රාත්‍රී කෑම වේල් 3ට වෙන් කර තිබෙන්නේ රුපියල් 600ක මුදලක්. ඒ මුදල ඉදිරියටත් කාලයක් යනකම් ලබා දෙනවාද නැත්නම් දැනට නතර කරලාද තිබෙන්නේ? ඒ කියන්නේ, වතුර බැස ගියාට පසුව ඒ මුදල ලබා දීම නතර කළාද කියා මා දැනගන්න කැමැතියි. තවම ඒ එක ගෙදරකවත් කෑම හදා ගන්න තරම් වාතාවරණයක් නැහැ. ඒ නිසා අඩු ගණනේ ඒ මිනිස්සුන්ට අවශ්‍ය කෑම ටිකවත් හදලා දෙන්න ඕනෑ. දැන් පෞද්ගලික අංශයෙන් නම් ඕනෑ තරම් කෑම දෙනවා. ඒක හරි. හැබැයි, පෞද්ගලික අංශය දිහා බලාගෙන හිටපු නිසා සමහර තැන්වලට කෑම හම්බ වෙලාත් නැහැ. එම නිසා ඒ සම්බන්ධව වැඩ පිළිවෙළක් තවම තිබෙනවාද නැත්නම් ඒක නතර කරලාද කියලා පොඩ්ඩක් කියන්න පුළුවන්ද? එහෙම නතර කරනවා නම් නතර කරන්නේ කවදාද කියලා ඒ ගැන විස්තර දෙන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.42]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ජීවත් වන මේ යුගයේ විශාලම විනාශයක් සිදු වුණු, දැවැන්ත වූ ස්වාභාවික ආපදාවකට තමයි මේ මුහුණ දීලා ඉන්නේ කියන කාරණය මේ රටේ සිටින වැඩිහිටියන් ඇතුළු අප සියලු දෙනාම දන්නවා. මේ අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේදීත් වැඩි අවධානයක් යොමු වෙලා තිබෙන්නේ එම ආපදා තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නයි.

පළමුවෙන්ම මම සඳහන් කරන්න කැමැතියි, මෙම ආපදා තත්ත්වය නිසා අපේ රටේ සිටි ආදරණීය ජනතාවගෙන් විශාල ප්‍රමාණයකට ජීවිත අහිමි වුණු බව. ඒ වාගේම තව කොටසක් අතුරුදහන් වෙලා. එමෙන්ම මෙම ආපදා තත්ත්වය නිසා විශාල පිරිසක් පීඩාවට පත් වෙලා ඉන්නවා. එසේ පීඩාවට පත් සියලු දෙනා වෙතත්, මෙම ආපදාවෙන් ජීවිත හානි වුණු සහ අතුරුදහන් වුණු සියලුම දෙනාගේ පවුල්වල අයටත් මේ මොහොතේදී මගේ ශෝකයත්, අපේ පක්ෂයේ ශෝකයත් මා පළ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා හැටියට මා මේ අවස්ථාවේදී මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මහනුවර තිබෙන ක්‍රේග් හෙඩ් වතු යායේ ජීවත් වුණු 15දෙනෙකුට මේ ආපදා තත්ත්වය හේතුවෙන් ජීවිත අහිමි වුණා. ලැයිම් 2ක් සම්පූර්ණයෙන්ම නාය ගිහිල්ලා විනාශයට පත් වුණා. බදුල්ලේ කහගොල්ල ප්‍රදේශයේ එක පවුලක මරණ 3ක් සිදු වුණා. බදුල්ලේ රෝබේරිය වතුයායේ මරණ 4ක් සිදු වුණා. බදුල්ලේ දික්වැල්ල වතුයායේ මරණ 4ක් සිදු වුණා. අපේ රටේ පළමු තේ පැළය හිටවපු ලූල්කඳුර වතුයායේ ලැයිමක් නාය ගිහිල්ලා මේ වනකොට 12දෙනෙකුට ජීවිත අහිමි

වෙලා තිබෙනවා. මම සඳහන් කරන්න කැමැතියි, මේ ආපදාවට හසු නොවුණු කිසිම විෂය පථයක් නැති බව. හැම දෙයටම මේ තත්ත්වය බලපා තිබෙනවා. ඒ නිසා මම හිතන විධියට මේ ඛේදවාචකයේ බරපතළකම විවිධ මත දරන ඔය කණ්ඩායම් තේරුම් ගන්න ඕනෑ.

අපේ යුගය තුළ මීට පෙර අපි දැක තිබුණු ලොකුම ඛේදවාචකය තමයි, සුනාමිය. එම ව්‍යසනය අපේ රටේ යම් මුහුදු තීරයකට බලපෑවා. නමුත් මේ ව්‍යසනය රටේ විශාල භූමි භාගයකට බලපෑ ඛේදවාචකයක්. මේක මගේ පෞද්ගලික අදහස. මේ ව්‍යසනයෙන් සුනාමියට වඩා 30-40 ගුණයක බලපෑමක් රටට වුණා දෝ කියලා මට හිතෙනවා. තැන්නක පාරක් හදන්න යන වියදමට වඩා කන්දක පාරක් හදන්න යන වියදම විශාලයි. තැන්න ගොඩ ගත්තාට, කන්දක් විනාශ වුණොත් ඒක ආපසු ගොඩ ගන්න එක ලෙහෙසි නැහැ. ඒ නිසා මම හිතනවා, ලෝකයේ බලවත්ම ආණ්ඩුවක් තිබුණත් මෙවැනි විපතක් සිදු වුණොත් ඒක කළමනාකරණය කරලා ක්ෂණිකව සහන දෙන්න පුළුවන්කමක් නැහැ කියා.

ලෝකයේ බලවත් රටවලට මෙවැනි ස්වාභාවික විපත් පැමිණ තිබෙනවා. එවැනි අවස්ථාවල ඔවුන් ඒවා කළමනාකරණය කරගෙන තිබෙන්නේ ඉතා අපහසු තත්ත්වයන් යටතේ. මේ විපත සිදු වෙලා අද වෙනකොට ගෙවී තිබෙන්නේ දින 9යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 26වැනි දා මහ වැසි ඇද හැළුණා. ඊට පසුව දා උදෑසන 9.00ට ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 1හි රැස්වීමක් පැවැත්වූවා. එතුමා එනකොට මම හිටියා. අනුර දිසානායක ජනාධිපතිතුමා ඇවිල්ලා මමත් ඉන්න තැන ඇහුවා, "විපක්ෂ නායක කෝ?" කියලා. විපක්ෂ නායකතුමාට පණිවුඩය ගියේ නැහැ කියලා ජනාධිපතිතුමාම දුරකථනයෙන් විපක්ෂ නායකතුමාට කථා කරලා කිව්වා, "ඉක්මනින් එන්න. මේ තත්ත්වය ගැන සාකච්ඡා කරන්න තිබෙනවා" කියලා. ඒ අවස්ථාවේදී කිහිප දෙනෙක් ජනාධිපතිතුමාට කිව්වා, "විපක්ෂ නායකතුමා එනකම් මූලාසනයට යමු" කියලා. නමුත්, ජනාධිපතිතුමා විපක්ෂ නායකතුමා ආවට පසුව තමයි ගිහිල්ලා මූලාසනයේ වාඩි වුණේ. එතුමා විපක්ෂයත් එක්ක එක ගමනක් යමින් මේ ආපදා තත්ත්වය කළමනාකරණය කරන්න තමයි මහන්සි ගත්තේ. හැබැයි, විපක්ෂය කළේ මොකක්ද? එසේ දිගු කරපු අත විපක්ෂය පැත්තකට දැම්මා. ඔවුන් මේ රටට සිදු වුණු ආපදාව කළමනාකරණය කරන එක පැත්තකට දමා, ඔවුන්ගේ ආපදා තත්ත්වය කළමනාකරණය කරගන්න මේක පාවිච්චි කරන්න පටන් ගත්තා. ඕක තමයි ඇත්ත කථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටට වෙලා තිබෙන්නේ ඕකයි.

අපේ රටට "දිට්වා" ආපදාව ආවා. තව ඇවිල්ලා තිබෙනවා, දිට්ඨධම්ම වේදනීය කර්මය කියලා ආපදා තත්ත්වයක්. ඒක බලපා තිබෙන්නේ විපක්ෂයට. ඒකෙන් නම් බේරෙන්න බැහැ. "දිට්වා" ඇවිල්ලා ගියා. නමුත්, දිට්ඨධම්ම වේදනීය කර්මය බලපා තිබෙන විපක්ෂයට දැන් ආපදා මධ්‍යස්ථානයක් දමන්නවත් විධියක් නැහැ. ඒකත් හතර අතේ කැඩිලා තිබෙන්නේ. ඒ නිසා එක තැනකට අරගෙන කන්න දෙන්න විධියකුත් නැහැ. හතර අතේ කැඩිලා නිසා මධ්‍යස්ථානයක් ඇති කර ආපදාව කළමනාකරණය කරන්නත් බැහැ. ඒ කට්ටිය කරපු දේවල් තවම අවසන් වෙලා නැහැ. ඒ කට්ටිය මේ රට අපට භාර දෙනකොට ඩොලර් බිලියන ගණනක දැවැන්ත ණයක් එක්ක භාර දුන්නා. ඒ ගත් ණයෙන් කොටසක් යොදවා හදපු සංවර්ධනයත් දැන් විනාශයි. දැන් අපිට බර දෙකක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මොවුන් ගත් ණය ටික අපි ගෙවන්නත් ඕනෑ. මොවුන් ගත් ණය කොටසක් යොදවා අවිධිමත්ව, පාරිසරික විරෝධී විධියට සිදු කර තිබුණු සංවර්ධනය නිසා විනාශ වුණු රට හදන්නත් තිබෙනවා.

දැන් ඒක කළමනාකරණය කරලා මේ රට ගොඩ නඟන කාර්යය භාරයට රජයක් හැටියට අපි කටයුතු කරන්න සූදානම් කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මේ උදවිය තව තර්කයක් ගෙනාවා. මේ විපත ගැන නොවැම්බර් 12වැනිදා කිව්වා ලු; මේ විපත එන බව දන්නවා ලු. මේ විපක්ෂය රටේ අහු මුළුවල තිබෙන ඔක්කෝම කේළාම් ටික, ඔක්කෝම සුන්බුන් ටික එකතු කරලා ගොඩබාන තැනක් තමයි මෙතැන - පාර්ලිමේන්තුව. ඔක්කෝම දන්න මිනිස්සුන්ට තිබුණා නේ, නොවැම්බර් 12වැනිදා මෙහෙම විපතක් වෙනවා කියලා කිව්වා නම්, මේ පාර්ලිමේන්තුවේ අය වැය විවාද කාලයේ වගකීමෙන් කියන්න. මෙහෙම ප්‍රශ්නයක් එනවා කියලා කියන්න තිබුණා නේ. එයාලාට දැන්ද මේක පේන්නේ? මේකේ ඇත්ත තත්ත්වය ඕනෑ තරම් මාධ්‍යය පැහැදිලි කරලා තිබෙනවා. එහෙම නම් විපක්ෂයත් මේකට වග කියන්න ඕනෑ. මේක දැනගෙන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අය වැය විවාදවලදී කථා කරන කාලය අතරතුර මේ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු කරුණු කාරණා මතු කළේ නැත්තේ ඇයි? මෙහෙම දෙයක් ගැන දන්නවා නම් ඒ ගැන කරුණු කාරණා මතු කළේ නැත්තේ ඇයි? එදා නොකියා දැන් මේක කියන්නේ ඇයිද කියලාත් අපි අහන්න කැමැතියි.

ඊළඟට, මේ ගරු සභාවේදී බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් විශේෂයෙන්ම සාකච්ඡා වුණු නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. මේ සභාවේදී එවැනි සාකච්ඡාවක් මතු වුණා. අපේ රටටම මේක බලපෑවා. ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ කාමරයකදී මේ සම්බන්ධයෙන් 27වැනිදා රැස්වීම පැවැත්වූවා. පාර්ලිමේන්තුව දවස් 2ක් වහලා සියලු පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ට ජනතාව සොයාගෙන ගොස් සහන සපයන්න කිව්වා. 27වැනිදා රාත්‍රී 7.00ට බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව කැඳවන්න තීරණය කළා. මම දිස්ත්‍රික් ලේකම්තුමාට කිව්වා, ඒ ගැන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න කියලා. විපක්ෂයේ එක්කෙනෙක්වත් මේ වෙනකම් ආපදා කළමනාකරණ කමිටුවට ආවේ නැහැ මේ ගැන කථා කරන්න. ඕක තමයි ඇත්ත තත්ත්වය. හැම දිනකම රාත්‍රී 7.00ට ආපදා කළමනාකරණ කමිටුව කැඳෙව්වා. 27වැනිදා සිට ඊයේ වෙනකම් හැම දිනයකම කැඳෙව්වා. සියලු නිලධාරින් උදේ 7.00ටත් කැඳෙව්වා; රාත්‍රී 7.00ටත් කැඳෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම කරලා තමයි අපි මේ ප්‍රශ්නය කළමනාකරණය කළේ. ඊයේ රාත්‍රී වාර්තාවට අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ මිනිස් ජීවිත 90ක් අහිමි වෙලා තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ අවතැන් වෙලා ඉන්න පවුල් සංඛ්‍යාව 15,008ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ පවුල්වල පුද්ගලයන් සංඛ්‍යාව 51,457ක්. ඒ වාගේම, දැනට සුරක්ෂිතතා මධ්‍යස්ථාන 159ක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා. මේ වෙනකොට ඒ මධ්‍යස්ථානවල පුද්ගලයන් 24,396ක් අපි පෝෂණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මෙන්න මේ කාරණයත් ඔබතුමියට පැහැදිලි කරන්න කැමැතියි. මේ ආපදා තත්ත්වයේදී අපේ රටේ රාජ්‍ය නිලධාරින්, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු සියලු දෙනාම මිනිස් ජීවිත බේරා ගැනීම වෙනුවෙන් විශාල සේවාවක් සිදු කළා. සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ මාතර දිස්ත්‍රික්කයෙන් ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයෙන්, මොනරාගල සහ අම්පාර දිස්ත්‍රික්කවලිනුත් අද වෙනකොට 1,326ක පිරිසක් "සෙනෙහසේ සහන යාත්‍රාව" වැඩපිළිවෙළේ කණ්ඩායම් අපේ බදුල්ල දිස්ත්‍රික්කයට ඇවිල්ලා තිබෙනවා. අපේ පක්ෂයේ අය විතරක් නොවෙයි, හදවතක් තිබෙන දකුණේ ජනතාව ඇතුළු රටේම මිනිස්සු දැන් උදව් කරන්න බැහැලා තිබෙනවා. ඔවුන් සියලු දෙනාටම අපි හිස නමනවා, ආචාර කරනවා, ගෞරව කරනවා කියන එකත් මතක් කරන්න කැමැතියි.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 27වැනිදා බදුල්ල දිස්ත්‍රික්කයේ රාත්‍රී වැඩකටයුතු පටන් ගන්නකොට මම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ඇහුවා, ජල සම්පාදනයේ තත්ත්වය කොහොමද කියලා. ඔක්කෝම ජල සැපයුම් බිඳ වැටිලා තිබුණේ. පාරිභෝගිකයන් 95,915ක් හිටියා. කිසිදු කෙනකුට වතුර නැති වුණා. ඒවා සුළුපටු හානි නොවෙයි. ඒවා දැවැන්ත හානි. ජල පවිත්‍රාගාර ගැලවිලා ගිහිල්ලා කිලෝමීටර් ගණනක් ඈත තිබුණේ. ඒ හැමදේම විනාශ වුණා. හැබැයි මම කියන්න සතුටුයි, අද වෙනකොට අපි බදුල්ල දිස්ත්‍රික්කයේ සියයට 89.5කට අපි වතුර දීලා ඉවරයි. ඒ කියන්නේ, පවුල් 95,915න් විශාල පිරිසකට අපි මේ වෙනකොට වතුර දීලා තිබෙනවා. අපි 27වැනි දා මේක භාර ගන්නකොට මම ලංකා විදුලිබල මණ්ඩලයේ ඉංජිනේරු සමන් මහත්මයාගෙන් ඇහුවා, කොච්චර විදුලිය විසන්ධි වෙලා තිබෙනවා ද කියලා. අපේ සිටින පාරිභෝගික සංඛ්‍යාව 299,222යි. 27වැනි දා රාත්‍රිය වෙනකොට 197,798කට විදුලිය නැහැ. 197,798කට විදුලිය නැහැ. ට්‍රාන්ස්ෆෝමර් 844ක් බිම තිබුණේ. වැලිමඩ ට්‍රාන්ස්ෆෝමර් 04ක් ගැලවිලා, ගහගෙන ගිහිල්ලා තිබුණේ. ඒවා කඳු සමතලා කරලා වැටුණා වාගේ තමයි වැටුණේ. මම ලංකා විදුලිබල මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. රට වටින්ම ස්වේච්ඡා බලඇණි ආවා; අපේ වෘත්තීය සමිති ආවා. කණ්ඩායම් ඇවිල්ලා රාත්‍රී 8.00 වෙනකොට මේ දේවල් නැවත සකස් කරන්න උදව් උපකාර කළා. අර බිඳ වැටුණු ට්‍රාන්ස්ෆෝමර් 844 අතරින් තව හදන්න ඉතිරි වෙලා තිබෙන්නේ ට්‍රාන්ස්ෆෝමර් 124ක් විතරයි. අපි සියයට 80කට මේ වෙනකොට විදුලිය ලබා දීලා තිබෙනවා. නිලධාරින් වැඩ කළා; වැඩ කරන මිනිස්සු වැඩ කළා. ඔය කට්ටිය කළේ කථා කර කර, කේළාම් හොය හොයා, අහුමුළුවල ගිහිල්ලා අහුකොන් අවුස්ස, අවුස්සා හිටපු එක විතරයි කියලා මම මතක් කරන්න කැමැතියි.

අපේ RDA මාර්ග 36න්, 25ක් විනාශ වුණා. අද වෙනකොට මාර්ග 7ක් විතරක් හැරෙන්න අනෙක් සියලුම මාර්ග සේවා සැපයුම් මාර්ග හැටියට ආරම්භ කරලා තිබෙනවා. මහියංගනය සිට බදුල්ලට යන්න පුළුවන්. අද වෙනකොට බදුල්ල, වැලිමඩ, කැප්පෙටිපොළ, ගවරම්මාන දක්වා යන්න පුළුවන්. හෙට රේන්දපොළට පාර අරිනවා. අද බදුල්ලේ ඉඳන් පස්සරට යන්නත් පුළුවන්. ලුණුගල පාරේ 151 කිලෝමීටර් කණුව දක්වා යන්න පුළුවන්. එතැනයි, එහා පැත්තයි යා කර ගන්න බැරුව ඉන්නේ. දෙපැත්තෙන් වාහන ගේන තැනට පත් කර තිබෙනවා. අද වෙනකොට ඇල්ල-වැල්ලවාය පාර ඇරලා තිබෙනවා. මේවා දවස් 9ක් යනකොට අපේ මිනිස්සු කළා; ස්වේච්ඡා බලඇණි කළා, හමුදාව කළා, නිලධාරින් කළා.

මේවා කරන්න නිලධාරින්ට බාධාවක් තිබුණා කිව්වා. ඔබතුමන්ලාගේ කාලයේ මේ වාගේ විපතක් වුණා නම් ඔබතුමන්ලා අනා ගන්නවා; නැති කර ගන්නවා; විනාශ කර ගන්නවා කියන එකත් අපි මතක් කර ගන්න කැමැතියි. හැබැයි, මම තව එකක් කියන්න කැමැතියි.

මේ වාගේ විපත්, මීට වඩා අඩු විපත් ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ ඇති වුණා. ඒ විපත් ආපු කාලයේ විපක්ෂය හැටියට අපි කටයුතු කළේ නම් මෙහෙම නොවෙයි. අපේ රතු තරුව සහන සේවා බලකාය ආපදා තත්ත්වය ඇති වුණු මොහොතේම ආවා. කැම ඉව්වා, ගෙවල් හැදුවා, පාරවල් හැදුවා, දුම්රිය මාර්ග හැදුවා, ඔක්කෝම කළා. එහෙම කටයුතු කරපු පක්ෂයක් තමයි අද ආණ්ඩුව කරන්නේ.

මේ සිදු වුණු විනාශයෙන් රට ගොඩනඟන්න අද දැවැන්ත බලවේග දෙකක් එකතු වනවා. එකක් තමයි, මේ රටේ රාජ්‍ය බලවේගය. අනෙක තමයි, මේ රටේ ස්වේච්ඡා බලවේගය. ඒ දෙකම එකතු වෙලා, මේ රට හදනවා; මේ රට ප්‍රති නිර්මාණය කරනවා. විනාශ වුණු RDA මාර්ග හැදුවා; PRDA මාර්ග හැදුවා. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මාර්ග 497ක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එයින් 165ක් සම්පූර්ණයෙන් විනාශ වුණා. ඒ 165න් අපට තව පාදන්න තිබෙන්නේ, විවෘත කරන්න තිබෙන්නේ මාර්ග 30ක් පමණයි. අද වෙනකොට අපි ඒවාත් පටන් ගත්තා. බැකෝ යන්ත්‍ර හයයි තිබුණේ. අද වනකොට බැකෝ යන්ත්‍ර 36ක් යොදා තිබෙනවා. රට පුරා තිබුණු ඒවා ගෙනාවා. දකුණු පළාතෙන් ගෙනාවා. කුලියට ගත්තා. ඒවා ඔක්කෝම කළේ නිලධාරින්. අපි දුන්නේ මඟ පෙන්වීම. අපි දුන්නේ සහාය. නිලධාරින් ඒවා කළා. පළාත් මාර්ග ඔක්කෝම හදලා තිබෙන්නේ. මේ වනකොට RDA එකට අයිති පාලම් 6ක් සුනුවිසුණු වෙලා තිබෙනවා. PRDA එකට අයිති පාලම් 10ක් විනාශ වෙලා තිබෙනවා. දැන් ඔබතුමා කියපු අර ජනතාපුර පාර මාතර ප්‍රදේශයෙන් ගිය අපේ සහන කණ්ඩායම් එකතු වෙලා පෙරේදා පාන්දර 3.00 වනකොට පාලමෙන් වාහන යන්න පුළුවන් තත්ත්වයට තාවකාලිකව හැදුවා. ඒවා හදලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ සභාපතිලා ගිහින් ඒවාට බාධා කළා. ඒ බාධා ඔක්කෝම මැඩගෙන අපි වැඩ කරනවා.

එම ප්‍රදේශවල සන්නිවේදන කටයුතු සම්පූර්ණයෙන් බිඳ වැටුණා. අපේ ශ්‍රී ලංකා ටෙලිකොම් එකට අයිති කුලුනු 175ක් තිබෙනවා. ඒ 175න් කුලුනු 76ක් බිඳ වැටුණා. ඊයේ රාත්‍රිය වනකොට ඒ 76න් 70ක් හදලා, තව 6යි අපට හදා ගන්න බැරි වෙලා තිබෙන්නේ. ඒ ගණනටම ගෙනාවා. දවස් 09කින් මේවා කළේ. මේවා විස්මකර්ම වැඩ. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ මෙහෙම දෙයක් වුණා නම් මේ රට තවම සුන්බුන් ගොඩක්. ඒක මේ රටේ ජනතාව තේරුම් ගනීවි කියලා මම හිතනවා.

අපේ රෝහල් 14ක් අකර්මණ්‍ය තත්ත්වයට පත් වුණා. බදුල්ල මහ රෝහලට පසුව ඌව පළාතේ තිබෙන ප්‍රධාන රෝහල තමයි මහියංගනය රෝහල. මහියංගනය රෝහලේ පහළ වාට්ටුවල ලෙඩ්ඩු 263දෙනෙක් හිටියා. ගංවතුර එනකොට රෝහලේ සිටි වෛද්‍යවරු, කාර්ය මණ්ඩලය එකතු වෙලා ඒ 263දෙනාම උඩ තට්ටුවට ගත්තා. වටිනා මැෂින් ඔක්කෝම උඩ තට්ටුවට ගත්තා. පහළ තිබුණු ඒ ඔක්කෝම ගත්තා. එම රෝහලේ පහළ වාට්ටු විනාශයෙන් විනාශයට පත් වුණා. හැබැයි, මට කියන්න සතුටුයි වාගේම ලංකා ඉතිහාසයට, ලෝක ඉතිහාසයටත් එකතු වෙයි කියලා මම හිතනවා, පැය 72ක් යනකොට මහියංගනය රෝහලේ අපි නැවත ප්‍රතිකාර කටයුතු ආරම්භ කළා. කවුරුත් කිව්වා, මාස ගණනක් යන කල් එම රෝහලේ ප්‍රතිකාර කටයුතු ආරම්භ කරන්න බැහැ කියලා. අපි මොකද කළේ? ප්‍රධාන ලේකම්තුමිය, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ඔක්කෝම මහියංගනයට ගියා. හමුදාවෙන් 350ක් දැම්මා. අපේ කාර්ය මණ්ඩල දැම්මා. දවස් ගණනක් සුද්ද කළා. තිබෙන මැෂින් ඔක්කෝම ගෙනාවා. ඇයි? මහියංගනයේ ලෙඩෙක් බදුල්ලට ගෙනෙන්න බැහැ, පාර වැහිලා. දඹගට වංගුව පාර වැහිලා, නුවරට ගෙන යන්න බැහැ. රෝගීන් ආරක්ෂා කරන්න ඕනෑ. මහියංගනය රෝහලේ dialysis කරන රෝගීන් 137දෙනෙක් හිටියා. එම රෝහලේ කටයුතු ඉක්මනින් ආරම්භ කරන්න බැරි වුණා නම් ඇති වුණු ආපදා තත්ත්වයෙන් නැති වුණාට වඩා අපේ මිනිසුන් මැරෙනවා. මේ වනකොට dialysis machines ඔක්කෝම ක්‍රියාත්මකයි. පෙරේදා රාත්‍රියේ ලෙඩ්ඩු 30දෙනෙක් dialysis කළා. ඒ තත්ත්වයට ගෙනාවා මේ ආණ්ඩුව. එවැනි ජයග්‍රහණයක් ලබා තිබෙන්නේ.

කන්දෙගෙදර රෝහල නාය ගියා. කන්දෙගෙදර නගරයේ අලුත් තැනක් අරගෙන පැය 72ක් ඇතුළත ඒ රෝහල අපි ආරම්භ කළා. එහෙමයි අපි කටයුතු කළේ. මගේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, රටේම කෙරුණු දේවල් තිබෙනවා. ඒවා සැඟවෙලා තිබෙන්නේ. මේවා රටේ ජනතාව තේරුම් ගනියි කියලා අපි විශ්වාස කරනවා.

අපේ වැව් අමුණු 250ක් විනාශ වෙලා තිබෙනවා. ඇළ මාර්ග 550ක් විනාශ වෙලා තිබෙනවා. වැව් 12ක් විනාශ වෙලා තිබෙනවා. අපි ලබන සතියේ පටන් ගන්නවා දැවැන්ත සංග්‍රාමයක්. ඌව පළාතේ තිබෙන කැඩී බිඳී ගිය වැව් අමුණු ඔක්කෝම සති දෙකක් ඇතුළත ප්‍රතිසංස්කරණය කරලා වතුර ටික දෙන තැනට අපි සූදානම් කරලා තිබෙනවා. ඒවා ඔක්කෝම සැලසුම් කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට අමතරව තව විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
SLTB එකට අයිති බස් රථ තිබෙන්නේ 335යි. ඊයේ වනකොට 221ක් ධාවනය වනවා. පෞද්ගලික අංශයේ බස් රථ 618ක් තිබෙනවා. ඒවායින් 344ක් ඊයේ වනකොට ධාවනය කරවනවා. මිනිසුන්ට කන්න නැතිව මැරෙන්න දුන්නේ නැහැ. එක පැත්තකින් අපට කොස් උදවු වුණා, දෙල් උදවු වුණා. ඊළඟට, ගම් වැසියෝ උදවු කළා, රට වැසියෝ උදවු කළා. ඒ වාගේම රජය පුළුවන් උපරිම පහසුකම් ලබා දුන්නා.

රෝබේරිය අපි මුදා නොගත් ප්‍රදේශයක් හැටියට දවස් පහක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. රෝබේරියට කිලෝමීටර් 16ක් තිබෙනවා, යන්න බැහැ. පළමුවැනි දවසේ හමුදාවේ 350කුයි, අපේ සහන සේවාවේ 250කුයි එකතු වෙලා කිලෝ 10ක් බර දේවල් කිලෝමීටර් 16ක මහා කන්දක් නැඟගෙන අරගෙන ගියා. රෝබේරිය රෝහලේ 20දෙනෙක් හිටියා. කන්න නැහැ කියන ආරංචියට ඒවා යැව්වා. දෙවැනි දවසෙත් යන්න ඕනෑ නිසා එයාලටත් ධෛර්යයක් වෙන්න මමත් ඒ කිලෝමීටර් 16ම ගියා. ඇමති වශයෙන් නිකම් පයින් ගියේ නැහැ. මමත් මල්ලක් කරේ තියාගෙන රෝබේරියට අරගෙන ගියා මිනිසුන්ට ධෛර්ය දෙන්න.

ඊට පස්සේ අපි choppers හතර පාරක් යවලා රෝබේරියට ආහාර දුන්නා. ඒ chopper එක අඹගස්දෝවේ පිට්ටනියට බැස්වුවා. අද ගලනිය දක්වා පාර කැප්පෙව්වා. ඒ ඔක්කොම කළා. මම හිතනවා මේ විපතට පත් වූ රටේ ජනතාව දවසෙන් දෙකෙන් නැඟිටුවන්න බැහැ කියලා. කැබ් එකේ තරුවත් පෙන්වනවා. කැබ් එකේ නම් තරු තිබුණේ නැහැ, සමහරුන්ගේ තොප්පියේ නම් රතු තරුව තිබුණු බව ඔබතුමාට මතක් කරන්න කැමැතියි. කැබ් එකේ තරු ගහගෙන ආවේ නැහැ. අපට පටු දේශපාලන වුවමනාවන් තිබුණේ නැහැ. මේ විධියට මිනිසුන් කැප වෙච්ච ඒවාට අවනම්බු කරන්න එපා කියලා අපි කියනවා. විශිෂ්ට කාර්ය භාරයක් ඒ මිනිසුන් කරලා තිබෙනවා කියන එක ඔබතුමුන්නාන්සේලාට මම මතක් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මම මේ මාතෘ භූමියේ ආදරණීය ජනතාවට කියනවා, නුඹලා රකින්න මේ වත්මන් රජය කැප වෙලා, ඇප වෙලා ඉන්න බව තේරුම් ගන්න කියලා. හොඳ සැලසුමක්, හොඳ කැපවීමක් රජයත් කරනවා, නිලධාරිනුත් කරනවා, සමස්ත ජනතාවම කරනවා. සුළු පිරිසක් අකුල් හෙළනවා. එයාලාගේ ආපදාවට මේකේ උත්තර නැහැ කියලා මම කිව්වේ ඒකයි.

මම ස්තුතිවන්ත වෙනවා, රෑ දවල් නැතිව මේ කාර්යයට කර උර දෙන හැමෝටම. සමහර දවස්වල අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී රාත්‍රි හතට පටන් ගත්තු සාකච්ඡාව අවසන් වුණේ පාන්දර එකහමාරට. ඒ වනකල් ඒ නිලධාරින් හිටියා; වැඩ බෙදා ගත්තා; ඒ කාර්යය අතට ගත්තා. ඒ අය ආපහු උදේ හයේ, හතේ ඉඳන් වැඩ පටන් ගත්තා. වැඩ ගානට කෙරෙනවා. ඒවාට විපක්ෂයට රිදෙනවා. ඒ විතරක් නොවෙයි, ඊයේ දවස වනකොට බදුල්ල මුතියංගන රාජමහා විහාරස්ථානයේදී ස්වාමීන් වහන්සේලා වැඩම කරවා, ආපදාවෙන් මිය ගිය අයගේ photos තියලා ඒ අයගේ ඥාතීන් අතින් පාංශුකූලය දීලා, පැන් වඩවා, අටපිරිකර පූජා කරවා, ඔවුන් වෙනුවෙන් පින් අනුමෝදන් කිරීමේ අවස්ථාව සැලසීමේ නායකත්වය අප ලබා දුන්නා කියන එකත් මම මතක් කරන්න කැමැතියි. ඊට අදාළ සර්වාගමික වතාවත් සියල්ල සිද්ධ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කන්න දුන්නා, පාර හැදුවා. නමුත්, ඔක්කොම ඉවර නැහැ. ඒ අයගේ මානසික ශක්තියත් හදන්න අවශ්‍ය වැඩසටහන් අපි රට පුරා ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ කාර්යට උරදෙන ගරු ජනාධිපතිතුමාට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. එතුමා අදාළ චක්‍රලේඛ ගහලා, දෙන්න ඕනෑ ප්‍රතිපාදන දීලා ඒවාට උදව් පදව් කළා. අධිවේගී මාර්ගයක ගමන් කරන ආකාරයට මේ ආපදාවට අධිවේගීව කටයුතු කළාට ස්තුතියි. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක කමිටු, ආගමික නායකයන් සියලු දෙනා ඒ කටයුතුවලදී කර උර දුන්නා. ස්වේච්ඡා කණ්ඩායම් විශාල මෙහෙවරක් ඉටු කළා; මානුෂීය මෙහෙවරක් කළා. ඒ වාගේම, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්, විදෙස් රාජ්‍යයන් ඇතුළුව හැමෝම දේශපාලනයකින් තොරව විශාල ලෙස උදව් කරනවා. විපක්ෂයේ සුළු පිරිසක් මේ කර්තව්‍යයට උදව් කළ අතරේ කුහකකම් තිබෙන මේ තත්ත්වය තුළ ආපදාවට ලක් වෙලා ඉන්න කණ්ඩායම මේකට අකුල් හෙළුවා. තවත් ටික කාලයක් යන කොට -ඉදිරියේදී- තිබුණාට වඩා හොඳ තත්ත්වයකට මේ රට අනිවාර්යෙන්ම ගෙන යනවා කියා පොරොන්දු වෙමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.00]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ව්‍යසනය වෙලාවේ මිය ගිය තැනැත්තන්ගේ පවුල්වල අයගේ ඥාතීන් ඇතුළුව විපතට පත් සියලු දෙනාට මගේ කනගාටුව පළ කරනවා. ඒ වාගේම මේ ව්‍යසනය වෙලාවේ උදව් කරපු සියලු දෙනාට -දකුණු පළාතෙන් පැමිණි සියලු දෙනාටත්- විශේෂ ස්තුතියක් කරන්න කැමැතියි.

අද දවසේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැනත් කථා කිරීමට නියමිතව තිබුණත් සියලු දෙනා කථා කළේ මේ ගංවතුර ආපදා තත්ත්වය ඇතුළේ

[ගරු වම්පික හෙට්ටිආරච්චි මහතා]

වෙච්ච සිදුවීම් සම්බන්ධයෙනුයි. හැබැයි අපට මතකයි, 2025 අයවැය විවාදයේදීත් මේ වාගේම සමුපකාර විෂය අයත් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරලා ජාතික ජන බලවේගය විධියට අපි සමුපකාර ගොඩනඟපු ආකාරය. ඒ නිසා මේ ව්‍යසනය වෙලාවේත් අවතැන් වූ අයට සමුපකාර හරහා උදව් උපකාර කිරීමේ තත්ත්වයට, අපි සමුපකාර යම් ප්‍රමාණයකට ගොඩ නඟලා තිබුණා. එය විශේෂ අවස්ථාවක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දැක්කා විපක්ෂයේ මන්ත්‍රීවරු තැන තැන මාධ්‍ය සාකච්ඡා පවත්වමින් ප්‍රකාශ කළා, මේ අනතුර ගැන 12වන දා ප්‍රකාශ කළා කියලා. විශේෂයෙන්ම මුජිබුර් රහුමාන් මන්ත්‍රීවරයා බංකොලොත් වෙච්ච යූටියුබ් නාලිකාවකට ගිහිල්ලා 12වන දා, 17වන දා වාගේ දින කිහිපයක් උපුටා දක්වමින් රෙකෝඩින් එකක් දාලා කිව්වා, මේ සම්බන්ධව අනතුරු ඇඟෙව්වා කියලා. ඒ recording එක අහන කොට ඕනෑම කෙනෙකුට තේරෙනවා එහි සාමාන්‍ය කාලගුණ වාර්තාවකට එහා ගිය දෙයක් නැහැ කියන එක. මිලිමීටර් 70කට එහා වර්ෂාපතනයක් ලැබෙන්නේ නැහැ කියලා කියනවා. එක තැනකදී කියනවා, මිලිමීටර් 100යි කියලා. ඒ වාගේ කථාවක් තමයි කියන්නේ. මේ සා විශාල වශයෙන් කඳු නාය ගිහිල්ලා ජලාශ උතුරා යන බවට අනතුරු අඟවපු නිවේදනයක් එතැනදී කරන්නේ නැහැ. ඒ නිසා අප කියනවා, ඔවුන් ඒ බංකොලොත් දේශපාලනය ඇතුළේ මාධ්‍යවල යන සාමාන්‍ය ප්‍රවෘත්ති මහා බිල්ලන් බවට පත් කරලා කියමින් රටේ ජනතාව නොමඟ යවන්න කටයුතු කරනවා කියලා බොහොම පැහැදිලිව පෙනෙනවා.

පළමුවැනි වතාවේ ඒ නාළිකාවේ කිව්වේ 12වන දා කියලායි. ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ බව මතක ඇති. ඊට පස්සේ මාධ්‍ය සාකච්ඡා තියන කොට ඒක 11වන දා බවට පත් වෙලා තිබෙනවා. ඒ බොරුව එළිවෙන්න වැඩි කල් ගියේ නැහැ. ගංවතුර බැහැලා යනකල්වත් මේ විපක්ෂයට ඒ බොරුව රැක ගන්න බැරි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි. විපක්ෂයේ එක්තරා මන්ත්‍රීවරයෙක් ආපදා සැලැස්මක් ගැන කථා කළා. එනම්, 2016 වසරේ වෙච්ච ආපදාවක් සම්බන්ධව එතුමා සාකච්ඡාවක් කළා. 2016 වසරේ ආපදා සම්බන්ධ තොරතුරු මා ළඟ තිබෙනවා. මේ සා ව්‍යසනයක් එදා වුණේ නැහැ. හැබැයි, මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කය තුළ මරණ 11ක් සිදු වෙලා තිබෙන බව අපි දන්නවා. මේ ව්‍යසනයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මරණ සිදු වෙලා තිබෙන්නේ 13යි. මේ ව්‍යසනය තමයි මෑත ඉතිහාසයේ දැවැන්තම විනාශය. මේ දැවැන්ත විනාශය හමුවේ පවා ගම්පහ දිස්ත්‍රික්කයේ 2016 වසරේ ගංවතුරෙන් සිදු වුණාට වඩා හානිය අඩු වන පරිදි අපි මේ ආපදාව කළමනාකරණය කර ගත්තා.

ඒ වාගේම, ඔය කෑ ගහන සමහර අයට මම කියනවා, 2017 වසරේත් මේ වාගේ ගංවතුරක් ආ බව. අපට මතක නැති වුණත් එහෙම ඉතිහාසයක් තිබෙනවා. ඒ ගංවතුර ආපදාව හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මරණ 7ක් සිද්ධ වෙලා තිබෙනවා, 4දෙනෙකු අතුරුදහන් වෙලා තිබෙනවා. එදා එවැනි විනාශයක් වන විධියට වැඩ කරපු අය තමයි අද අපට කියන්නේ, මේ ගංවතුර ආපදාව වෙලාවේ ඒ අය සම්බන්ධ කරගෙන උපදෙස් ගන්න කියලා. පසුගිය කාලයේ මෙතුමන්ලා කරලා තිබෙන්නේ ආදරයෙන් කරපු වැඩ නොවෙයි කියලා අපි දන්නවා.

මේ ගංවතුරට හසු වුණු ප්‍රදේශ ගත්තොත්, පසුගිය ආණ්ඩු කාලවල බලෙන් බෙදලා දුන්නු ඉඩම්, ඔප්පු නැතිව ජනතාව පදිංචි කරවපු තැන්, සමහර දේශපාලනඥයන් තමන්ගේ හිතවතුන්ට ඉඩම් කඩන්න අවසර දීපු ස්ථාන, එහෙමත් නැත්නම් අනවසර ඉදිකිරීම්වලට අවසර දීපු තැන් තමයි විශේෂයෙන්ම අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ අවදානමට ලක් වුණේ; හානියට පත් වුණේ. ඒ හිතවත් සංග්‍රහය තමයි ඒ කාලයේ ඉඳලා දකින්න තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව යටතේ මහා භාණ්ඩාගාරයේ මුදල් සංචිතයක් තිබෙනවා කියලා පසුගිය දවස්වල කියන කොට, විපක්ෂය ඒකටත් හිනා වුණා. මේ වාගේ ව්‍යසනයක් හමුවේ එය මනා ලෙස කළමනාකරණය කරන්න අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා දෙන්න අද අපට පුළුවන් වුණේ ඒ මුදල් තිබුණු නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්තරා පක්ෂයක මන්ත්‍රීතුමෙක් කියනවා මම දැක්කා, "ආදරය" කියලා වැඩසටහනක් තිබෙනවා, ඒකට මුදල් දෙන්න කියලා. එතුමාගේ ඔය ආදරය කලින් තිබුණා නම් බොහොම හොඳයි. ඒ ආදරය දැන් අලුතින් ඇවිල්ලායි තිබෙන්නේ. මට සැකයි, ඒ ආදරයත් අර පරණ ආදරයමද කියලා. එය පරණ ආදරයම වුණොත් ආයෙත් ජනතාවට බොරු ආදරයක් තමයි ලැබෙන්නේ. ඒ නිසා අපි ජනතාවට කියන්නේ මුළා වෙන්න එපා කියලායි. "ආදරය" කියලා අද ඔය වෙස් වළාගෙන එන්නේත් පරණ දේශපාලනයම තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අවසාන වශයෙන් තවත් කාරණයක් කියන්න කැමැතියි. මෙච්චර කෑ මොර දෙන විපක්ෂ නායකවරයා පසුගිය ගංවතුර පැමිණි අවස්ථාවේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා ලබා දෙන සහන සම්බන්ධයෙන්. එම ප්‍රකාශයෙන් කොටසක් මම දැන් උපුටා දක්වන්නම්. 2016 මැයි 20 දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 372හි මෙසේ සඳහන් වනවා:

> "ගරු කථානායකතුමනි, මා මේ උත්තරීතර සභාවේ සියලු දෙනාටම පැහැදිලි කරන්න කැමැතියි, සිදු වුණු මහා ව්‍යසනය තුළින් විපතට පත් සියලු ජනතාවට අපි සහන සලසන බව. අර්ධ නිවාස හානි, පූර්ණ නිවාස හානි සිදුවී තිබෙන සියලු දෙනාටත්, රාජ්‍ය සේවකයන් වාගේම රාජ්‍ය සේවක නොවන අයගෙනුත් විපතට පත්වූවන් සියලු දෙනාටත් තරාතිරම නොබලා යළි නිවාස ගොඩ නඟා ගන්නට සහන සලසනවා. නාය යෑම්වලට පත් වුණු ප්‍රදේශවල පුද්ගලයන්ට විකල්ප ඉඩම් ලබා දීලා ඒ ඉඩම්වල නිවාස තනා ගන්නට අපේ රජයත් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයත් පූර්ණ ශක්තිය ලබා දෙනවා..."

මෙසේ කියන්නේ වර්තමාන විපක්ෂ නායකවරයා; එවකට නිවාස හා ඉදිකිරීම් ඇමතිවරයා. හැබැයි අපි දන්නවා, ඒ නිවාස, ඒ සහන ඇතුළු ඒ කියපු කිසි දෙයක් තවම ලබා දීලා නැති බව.

විපක්ෂය බොරු බේගල් කියලා ජනතාව රවට්ටලා නොමඟ යවන්න හැදුවත් ඒ දේ සිද්ධ වුණේ නැහැ. මේ ව්‍යසනය රටටම වුණු ව්‍යසනයක්. ඒ නිසා ආගම්, පාට, පක්ෂ භේදයෙන් තොරව අපි ඔක්කෝම එකතුවෙලා වැඩ කරලා මේ රට ගොඩනඟමු කියා අවසාන වශයෙන් ඉල්ලමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මට විනාඩි 10ක කාලයක් තිබෙනවා නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

නැහැ, විනාඩි 8යි.

[අ.භා. 4.06]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ රටේ ඇති වූ ආපදාව ගැන මට කලින් කරුණු දැක්වූ ඇමතිවරු කිහිපදෙනෙකුගේ අදහස් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලාම මගේ කථාවට එන්නම්.

ඇත්තටම, අද මම සෘණාත්මක - negative - පැත්ත ගැන කථා නොකර මගේ කථාව කරනවා කියලා හිතුවත්, ආණ්ඩුවේ ඇමතිවරු කිහිපදෙනෙක් දිගින් දිගටම ඉදිරිපත් කළ යම් කාරණා ගැන කථා නොකරම බැහැ. ඇමතිවරු කිහිපදෙනෙක්ම කිව්වා, මේ ආපදාව එන බවට හරියට දැනුවත් වීමක් වුණේ නැහැ, එක් නාළිකාවක් මඟින් පමණක් මේ ගැන දැනුවත් කළා කියලා. මේ පිළිබඳව අපි දිගටම ප්‍රකාශ කරලා වැඩක් නැහැ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා එක් නාළිකාවකට ඇවිල්ලා ඉතා පැහැදිලිව සඳහන් කළා, කුණාටු තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, BBC එක කරපු ප්‍රකාශයකට මම ඔබතුමියලාගේ අවධානය යොමු කරවනවා. මේ කටයුතු තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ තිබෙන අමාත්‍යාංශයට අදාළව. ඒ නිසා මේවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටවත්, සාමාන්‍ය නිලධාරින්ටවත් කරන්න පුළුවන් දේවල් නොවෙයි. ඒ නිසා, ලැබෙන තොරතුරු අනුව එතුමා අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මෙහිදී මම, -

***(මේ අවස්ථාවේදී හඬ පටයක් ඇසෙන්නට සලස්වන ලදී.)***
*( இச்சந்தர்ப்பத்தில் ஒலிப்பதிவொன்று கேட்கச்செய்யப்பட்டது.)*
*(At this stage, an audio recording was played.)*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සන්නිවේදන උපකරණ මේ සභාවේ භාවිත කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එහෙම එකක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝග අනුව, මේ සභාව තුළ සන්නිවේදන උපකරණ භාවිත කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ ගැන මම විවාදයක් ඇති කර ගන්නේ නැහැ, මට ලැබී තිබෙන කාලය අඩු නිසා.

BBC එක දවස් කිහිපයකට පෙර ඉතා පැහැදිලිව දක්වනවා, මිලිමීටර් 600ක, 500ක, 400ක වගේ වර්ෂාපතනයක් ඇති වෙන්න පුළුවන් කියලා. කුණාටු, ඒ වාගේම ජල ගැලීම් ඇති වෙනවා කියලා නොවැම්බර් 12වැනි දා ඉඳලා දිගටම දැනුවත් කරද්දී, ජනාධිපතිතුමා සහ ආණ්ඩුව ඒ සඳහා කිසිම පිළියමක් ඉදිරිපත් කළේ නැහැ. කුණාටු තත්ත්වය ළංවෙනකොට, ඒ කියන්නේ නොවැම්බර් 23, 24, 25, 26 වාගේ දවස්වල ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ වාගේම, ඒ සඳහා කිසිදු පිළියමක් යෙදුවේත් නැහැ. විශේෂයෙන්ම අපි විපක්ෂයේ හින්දා මේ කරුණු ඉදිරිපත් කරනවා කියලා ඇමතිවරු කියයි. මම ඉදිරිපත් කරනවා මේ පිළිබඳ ජාත්‍යන්තරයේ තොරතුරු. "The Times of India"හි සඳහන් වෙනවා, "Sri Lanka cyclone tragedy exposes government failures" කියලා. ඒ වාගේම Al Jazeera එකේ විකාශය වුණා, "Public anger mounts over Sri Lanka's flood disaster response" කියන ප්‍රවෘත්තිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහි සඳහන් වෙනවා, ආණ්ඩුව මේ සම්බන්ධයෙන් දිගින් දිගටම ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. ඒ වාගේම, මට මතක විධියට නොවැම්බර් 28වැනි දා රජයේ සියලු ආයතනවලට නිවාඩු ලබා දුන්නා. මෙය හදිසි ආපදා අවස්ථාවක් ලෙස නම් කරන්න කියලා විපක්ෂ නායකතුමා කිව්වත්, ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ ඒ දේ කළේ නැහැ. 27වැනි දා වෙනකොට විශාල ප්‍රදේශයක් ගංවතුරින් යට වෙලා ඉවරයි; බදුල්ල ඇතුළු උඩරට ප්‍රදේශ විනාශ වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 28වැනි දා ආණ්ඩුවේ කාර්යාලවලට නිවාඩු දුන්නාට පස්සේ රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මේ ආපදාවට පිළියම් යොදන්න බැරි වුණා වාගේම, ඊට පස්සේ සෙනසුරාදා සහ ඉරිදාත් එක්ක දවස් තුනක් නිවාඩු. ඒ නිසා රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක වුණේ නැහැ. මහනුවර ප්‍රදේශයේ මගේ මිත්‍රයන් මට ප්‍රකාශ කළා, විශේෂයෙන්ම ඉස්පිරිතාලේ හිටපු දොස්තරවරු කිව්වා, දවස් තුනකට පස්සේ පාරේ පොලිස් නිලධාරියෙක්වත් සොයා ගන්නට නැහැ කියලා. මේ විධියට දිගින් දිගටම මේ ආපදාව ගැන ජනතාව දැනුවත් නොකිරීම නිසා සිද්ධ වුණ දේ අපි දන්නවා. ඒ වාගේම අපි දන්නවා මේ වාගේ වර්ෂාවක් පතිත වෙනකොට අපට ඒක නවත්වන්න බැහැ කියලා. ඒක අපි පිළිගන්නවා. ස්වාභාවික විපත් නවත්වන්න බැහැ. හැබැයි, ආණ්ඩුව විසින් මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමක් අනිවාර්යයෙන්ම කරන්න තිබුණා. ඒ දැනුවත් කිරීම සිදු වුණේත් නැහැ, ඒ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගයක් වන වේලිවල ජලය මුදා හැරීමේ කටයුත්තවත් හරියාකාරව සිදු වුණේ නැහැ. මම හිතන විධියට, ඇත්තටම ජනාධිපතිතුමාගේ ඇස් ඇරුණේ 27වැනි දා. ජනාධිපතිතුමා ප්‍රමාද වෙලා 28වැනි දා ප්‍රකාශයක් කරනකොට, ආපදා තත්ත්වය වැඩි වෙලා අනෙකුත් ප්‍රදේශවලත් ජල ගැලීම් ඇති වෙලා තිබුණා. සාමාන්‍යයෙන් මිලිමීටර් 120ක වර්ෂාවක් ඇති වෙනකොට කොළඹ යට වෙනවා. මිලිමීටර් 200, 300, 400 වාගේ ප්‍රමාණවල වැසි මුළු ලංකාවටම ඇති වෙනවා කියලා BBC වැනි ආයතනවලින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලුදෙනාම දැනුවත් කළත්, ඒ සඳහා එතුමාට ක්‍රියාත්මක වෙන්න බැහැ. ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව රැස් කරලා ඒ සම්බන්ධ තීන්දු තීරණ ගත්තා නම්, මේ ආපදාවෙන් වූ හානිය අපට අවම කර ගන්න තිබුණා.

කරන්න තිබුණු අවස්ථාවේ ඒක කළේ නැහැ. අපි ඒකයි කියන්නේ. ඒ කෙසේ වුවත්, negative පැත්ත ගැන දිගටම කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මේකේ ධනාත්මක පැත්ත, ඉදිරියේදී කරන්න ඕනෑ පැත්ත නොකෙරෙන හින්දා මම ඒ ගැන කථා කරන්න ඕනෑ. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා විශාල ක්‍රියාදාමයක් ගැන කථා කළා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ත්‍රිවිධ හමුදාව, රජයේ නිලධාරින් මේ කටයුතුවලදී අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම තමයි ඉස්පිරිතාලත්. මම දන්නවා, ඒ හැම තැනකටම දවස් තුන, හතරක් යනකල් රජයෙන් කිසිම උපදෙසක් ආවේ නැහැ කියලා. ඒ ආයතනවල ඉන්න නිලධාරින් තනියම ක්‍රියාත්මක වෙලා කටයුතු කළා. ඒ ආයතන හොඳයි. ඒ ආයතන අවුරුදු ගණනක් තිස්සේ දියුණු වෙලා තිබෙනවා. හැබැයි, අපි

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

කියන කළමනාකරණය සහ සම්බන්ධීකරණය ඒ අවශ්‍ය ස්ථානවල දිසාපතිවරු හරහාත්, ඒ කණ්ඩායම් හරහාත් සිද්ධ වුණේ නැහැ. ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ඉස්පිරිතාල, ග්‍රාම නිලධාරින් ඇතුළු මේ සියලුදෙනා එකතු වෙලා war room එකක් හදලා මේ සඳහා දිගින් දිගටම ප්‍රතිචාර දැක්වූයේ නැහැ. මෙන්න මෙතැනයි අඩුපාඩුව තිබෙන්නේ. මම මේ දේ ඔබතුමියට ඉදිරිපත් කරනවා, මේ අවස්ථාවේදී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැනටමත් 1,000කට ආසන්න ප්‍රමාණයක් මිය ගිහින් තිබෙනවා කියලා දැනුවත් වෙලා තිබෙනවා. ඒ වාගේම, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මට විනාඩි 10ක් තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විනාඩි 8ක කාලයක් පමණයි ඔබතුමාට වෙන් කර තිබෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මිය ගිය ඒ පිරිස් ගොඩගන්නා ක්‍රියාදාමයක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේමයි ඉඩම්. පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා ඒ පිරිසට ඉඩම් ලබා දෙන්න ඕනෑ. ඇඳගෙන සිටි ඇඳුම විතරයි තිබෙන්නේ ඒ බොහෝ දෙනාට. ඒ වාගේම, ඒ අයට ඇඳ, පුටු, ඇඳුම්, පොත්පත් සපයන්න ඕනෑ. ඒ වාගේම ව්‍යාපාරත් සෝදාගෙන ගිහිල්ලා. මේ ව්‍යසනයෙන් මේ රටේ, ඩොලර් බිලියන 7කට අධික දේවල් ආපදාවට ලක් වෙලා තිබෙනවා. අපි දන්නවා, ඇමෙරිකාවෙන් ඩොලර් මිලියන 2ක් ලැබුණු බව. මිලියන 10ක්, මිලියන 15ක් ආවත් ඩොලර් බිලියනයක් සම්පූර්ණ කරන්න තව ඩොලර් මිලියන නවසිය ගණනක් ඕනෑ. ඩොලර් බිලියන 7 සම්පූර්ණ කරන්න, තව ඩොලර් මිලියන 6,000ක්, 5,000ක් පමණ ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව ක්‍රියා කරන ආකාරය තුළ විශේෂයෙන්ම අපට පෙනෙනවා, ආණ්ඩුවට මේ සම්බන්ධයෙන් අත්දැකීමක් නැහැ කියලා. ආණ්ඩුව අපි කියන දේ ගණන් ගන්නේ නැහැ. විපක්ෂය කියන දේ ගණන් ගන්නේ නැහැ. ඒ අයට ඕනෑ විධියට තමයි කටයුතු කරන්නේ. මම හිතන විධියට, කලින් ජේවීපී එක කටයුතු කරපු විධියටම දිගින් දිගටම කර ගෙන යන්න හදනවා. එහෙම කරන්න බැහැ. මේකට සියලුදෙනා එකතු කර ගන්න ඕනෑ. ඔබතුමන්ලා ආණ්ඩු කරලා නැහැ. හැබැයි, මාලිමාවේ ඉන්න මන්ත්‍රීවරු හෝ එකතු කරගෙන, ඒ අදහස් අරගෙන සම්බන්ධීකරණය කරලා ඉදිරි අනාගතයේදී මේ රටේ ජනතාවට, ව්‍යාපාරවලට, කෘෂිකර්මයට ආධාර කරන්න ඕනෑ. කුඹුරුවල වැලි පිරිලා. කෘෂිකර්මය සඳහා තිබෙන හැම බිම් ප්‍රමාණයකම වැලි පිරිලා. ඒ කුඹුරුවල ආයෙත් වගා කරන්න බැහැ, තව අවුරුදු ගණනක් යනතුරු. මේ විනාශය කළමනාකරණය කර ගත්තේ නැත්නම්, හරියට සම්බන්ධීකරණය කර ගත්තේ නැත්නම් රට ඉවර වෙයි. රටේ නිලධාරින් යම් දෙයක් රටට කරයි. හැබැයි, විශාල පාඩුවක් වෙනවා. සියයට 3.2කට තිබුණු ආර්ථික වර්ධන වේගය වාහන ගෙන්වලා සියයට 4.7ක් කර ගත්තා. හැබැයි, මේ ආර්ථික වර්ධන වේගය සියයට 1ක්, 2ක් වාගේ ප්‍රමාණයකට ආවොත් අපේ රට ඉතාම අමාරු තැනකට පත් වෙනවා.

ඒ වාගේම අපි ජාත්‍යන්තරයෙන් ඉල්ලා සිටිනවා, ලංකාවේ ණය ටික කපා හරින්න පුළුවන් නම් - we urge all foreign countries, if you could, cut off the debt - මේ ව්‍යසනයෙන් අපට ගොඩ එන්න පුළුවන් කියලා. අපේ ආත්ම ශක්තිය, ධෛර්යය පාවිච්චි කරලා, දේශපාලනයෙන් තොරව සියලුදෙනාම එකතු වෙලා වැඩ කරලා, මේ ව්‍යසනයෙන් ගොඩ එන්න කටයුතු කරමු. අපි එකමුතු වුණේ නැත්නම් ආයෙත් ගොඩ එන්න බැරි තත්ත්වයකට මේ රට පත් වෙන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එහෙම වුණොත් මේ ආපදාවෙන්ම මේ රට විනාශ වෙන්න පුළුවන්. ජනාධිපතිතුමා ගණන් ගන්නේ නැහැ, සැලකිල්ලක් දක්වන්නේ නැහැ අපි කියන දේවල්වලට. විපක්ෂය, ඒ වාගේම අනෙකුත් අය කියන දේ ගැන කිසිම අවබෝධයකින් සැලකිලිමත් වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, අමාත්‍යවරුන්ගෙන්, ජනාධිපතිතුමාගෙන්, සියලුදෙනාගෙන්ම, මේ අවස්ථාවේදී ජාත්‍යන්තරය, ඒ වාගේම මේ රටේ විපක්ෂය ඇතුළු සියලුදෙනාම එකතු කරගෙන කටයුතු කරන්න කියලා. මම නැවතත් කියනවා, අපි විපක්ෂයක් ලෙස ඉතාම හොඳට, සියලුදෙනාම එකතු කර ගෙන ආණ්ඩුවට අවශ්‍ය සහයෝගය ලබා දුන් බව. නැද්ද, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා?

මම දැක්කා, ආණ්ඩුවේ අමාත්‍යවරයෙක් කියනවා, හදිසි නීතිය පිළිබඳව. හදිසි නීතිය පාවිච්චි කරන්න එපා. ඒක ලබා දුන්නේ මේ ව්‍යසනයෙන් ජනතාව මුදා ගන්නයි. කවුරු හෝ YouTube channelsවල නැත්නම්, මාධ්‍යවල තොරතුරු දැම්මාට ඒකට දඬුවම් කරන්නේ නැහැ. නමුත් නියෝජ්‍ය ඇමතිවරයා මොකක්ද කියන්නේ මේ ව්‍යසනය අස්සේ? මෙච්චර විනාශයක් වෙලා තිබියදී, ජීවිත ගණනාවක් බිලිවෙලා තිබියදී මොකක්ද නියෝජ්‍ය අමාත්‍යවරයා කියන්නේ? අපට මේ නීතිය පාවිච්චි කරන්න පුළුවන්, සැකකරුවෙක් කරන්න ඕනෑත් නැහැ, වූදිතයෙක් බවට පත් කරලා හිරේ දමන්න පුළුවන් කියනවා. මොකක්ද දැන් තිබෙන ප්‍රශ්නය? අපට මඩ ගහනවා. දේශපාලනය කරනකොට මඩ ගහයි. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ රටේ ජනතාවට සහන සලසන්නයි ඒ නීතිය පාවිච්චි කරන්න ඕනෑ. එහෙම නැත්නම් ජනතාව මඬින්න, CID එක පාවිච්චි කරලා ජනතාවට නැවත පහර දෙන්න, විරුද්ධ පක්ෂයට පහර දෙන්න, මාධ්‍යයට පහර දෙන්න මේ නීතිය පාවිච්චි කරන එක නොවෙයි කළ යුත්තේ. ඒක නොවෙයි කරන්න ඕනෑ. මාධ්‍යයෙන් හරියට මේ ගැන දැනුවත්වීම් කළා. මාධ්‍යයෙන් කරපු දැනුවත් කිරීම් සාධනීය ලෙස ගන්න. ඒ නිසා ඒ මාධ්‍යයට පහර ගහන්න යන්න එපා. "දෙරණ" සහ "හිරු" ආයතන වාගේම අනෙකුත් ආයතනත් මේ ගැන දැනුවත් කළා.

ඒ දැනුවත් කිරීම හරියට ලබා ගත්තා නම්, අපට මේ ව්‍යසනයෙන් සියයට 80ක් බේරා ගන්න තිබුණා. ඒ නිසා රටක් වශයෙන් අපේ උපරිම සහයෝගය දෙන්න මේ අවස්ථාවේ අපි සූදානම් කියන එක නැවතත් සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේ මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.16]

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයට සම්බන්ධ වීමට වෙලාව ලබා දීම සම්බන්ධව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රටක් විධියට අපි මේ ඉදිරිපත් කරන්නේ 80වැනි අය වැයයි. ඒ වාගේම ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි ඉදිරිපත් කරන දෙවන අය වැය. අපි පසුගිය අය වැය විවාදයට සම්බන්ධ වුණා. එහෙම සම්බන්ධ වුණු අවස්ථාවේ ලංකා ඉතිහාසයේ සිදු නොවුණු කාරණා ඒ අය වැය විවාදයේදී අපි දැක්කා. අවුරුදු 78ක් තුළ 78 වාරයක් අය වැය ඉදිරිපත් කළේ මේගොල්ලන් තමයි. 78වැනි අය වැය ඉදිරිපත් කරනකොට එදා ඒගොල්ලන්ට ඉදිරිපත් කරන්න අය වැයක් තිබුණේ නැහැ. මේගොල්ලන් එදා 78වෙනි අය වැය ඉදිරිපත් කරනකොට, මේ රට පාලනය කරන්න බැරි තැනටත්; ජනතාවට මේ රටේ ජීවත් වෙන්න බැරි තැනටත් මේ රටේ ආර්ථිකය වට්ටලා තිබුණා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා විශ්‍රාම යන වෙලාවේ කිව්වා, රුපියලුත් නැතිව, ඩොලරුත් නැතිව මේ රට නන්නත්තාර වෙලා තිබුණා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි පසුබිමක් ඇතුළේ තමයි ජාතික ජන බලවේගයේ අපිට මේ රට ලැබුණේ.

එහෙම තත්ත්වයක් තුළ අපේ දෙවැනි අය වැය ඉදිරිපත් කරනකොට මේ ගොල්ලන් කරන්න ඕනෑ මොකක්ද? ඇත්තටම විපක්ෂයේ කාර්ය භාරය වෙලා තිබුණේ ජනතාවට මොනවා හෝ සහන දෙන යෝජනා ඉදිරිපත් කිරීමයි. හැබැයි, මේ ගොල්ලන් මොනවාද කළේ? ලංකා ඉතිහාසයේ විපක්ෂයේ කාර්ය භාරය අපි දැක්කේ එහෙමයි. හැබැයි, කම්කරුවෙකුට රුපියල් 200ක් වැඩි කළ එකට විරුද්ධ වුණු ලංකා ඉතිහාසයේ පළමු විපක්ෂය තමයි මේ විපක්ෂය. ඒ වෙලාවේ අපේ පලනි දිගම්බරම් මන්ත්‍රීතුමා, මනෝ ගනේෂන් මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් පළමු වතාවට මේ ගොල්ලන්ව, එහෙම නැත්නම් සජබයේ විපක්ෂ නායකතුමාව පැත්තකට දමලා ආණ්ඩුවට ශක්තිය දුන්නා. අපි ඒක ගැන එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කටයුතු කරගෙන යනකොට අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු විධියට මේ පොදු ව්‍යසනය සිද්ධ වුණා. මුහුද ගොඩ ගලපු එක ගැන අපි කියවලා තිබුණේ අපේ ඉතිහාසය පොතේ. හැබැයි, අපි ඒක හැබැහින් දැක්කා. හැබැයි, අපේ රටේ **එකවර** කඳු නාය යාම පිළිබඳව අපි අහලා තිබුණේ නැහැ. දිස්ත්‍රික්ක 22ක්ම **එකවර** අනතුරට පත් වෙච්ච ලංකා ඉතිහාසයේ පළමු වතාව මේක. ඒ ව්‍යසනය ආවා. ඒ වෙලාවෙත් අර ඉස්සෙල්ලා වාගේම - අය වැය විවාදයේ මුල් අවස්ථාවේ වාගේම - මේ ගොල්ලන්ගේ සියලු කථාවල අන්තර්ගත වෙලා තිබුණේ මොකක්ද? මනෝ ගනේෂන් මන්ත්‍රීතුමාට, දිගම්බරම් මන්ත්‍රීතුමාට, තොණ්ඩමන් මන්ත්‍රීතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ වැඩි දෙනෙකු තුළ තිබුණේ ඊර්ෂ්‍යාව, කුහකත්වය, වේදනාව. ඒ ගොල්ලන්ගේ ඊර්ෂ්‍යාව, වේදනාව සහ කුහකත්වය මේ පොදු ව්‍යසනය වෙලාවේදී නැවත වතාවක් අද ඉස්මතු වෙලා තිබෙනවා. ඉතිහාසය පුරා අපි අහපු කතාන්දර දැන් අපේ ඇස් පනාපිට සිද්ධ වෙනවා. ගරු ජනාධිපතිතුමා පක්ෂ නායකතුමන්ලා කැඳවලා; මේ පාර්ලිමේන්තුව කැඳවලා, 27 වෙනිදා සියලු මන්ත්‍රීවරුන්ට කිව්වා, "පොදු ව්‍යසනයක් සිදු වෙලා තිබෙනවා. මේක අපි බලාපොරොත්තු වුණේ නැති දෙයක්. ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන් ගම් බිම්වලට ගිහිල්ලා සේවය කරන්න" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගාල්ල දිස්ත්‍රික්කයට ගිහිල්ලා ඒ අවශ්‍යා කරන වැඩ කටයුතු ටික කළා. ඊට පස්සේ පළමුවැනිදා ජාතික ජනබලවේගය විධියට අපේ පක්ෂයෙන් අපට දිස්ත්‍රික්ක භාර දුන්නා. ගාල්ල දිස්ත්‍රික්කයට, නුවර දිස්ත්‍රික්කය භාර දුන්නා.

අපි මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණට ගියා. එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ක් තිබෙනවා. අපි එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20ට අයත් ප්‍රදේශවලට යද්දි 1,500කට වැඩි පිරිසක් උදලු, කැති, වතුර, තෙල්, කෑම බීම, ඉඳුම්-හිටුම් ඇතුළු සියලු දේවල් අරගෙන මහනුවරට ගිහිල්ලා අකුරණට ගියා. අකුරණට යනකොට අපි ප්‍රාදේශීය ලේකම්තුමියත් එක්ක සාකච්ඡා කළා. අපි ගිහිල්ලා නතර වුණේ කොනකලගල ශ්‍රී විජිත මහා විහාරයේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩ කටයුතු සඳහා අපි 140දෙනෙක් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම ඉක්මනින් අවසන් කරනවා. විපක්ෂයට බලය තිබෙන ප්‍රාදේශීය සභාවක් තමයි අකුරණ ප්‍රාදේශීය සභාව. අකුරණ නගරයේ කුණු ගොඩවල්, පස් ගොඩවල් ගඳ ගහමිනුයි තිබුණේ. හැබැයි මේ ගොල්ලන් - විපක්ෂය - මහා තර්ක ඉදිරිපත් කරනවා. අපි ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු රජයේ නිලධාරීන් සියලුදෙනා එක්ක දින 1,1/2ක් ඇතුළත ටවුන් එක ශුද්ධ කරලා, සියලු දේවල් කරලා පාරත් හෝදලා දීලා අවසන් කරන්න සමත් වුණා. ඒ වාගේම, අකුරණ ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 35ක් තිබෙනවා. අපි එම ග්‍රාමසේවා වසම් 35ටම ගිහිල්ලා පාරවල් හදලා, ගෙවල් ශුද්ධ කරලා සියලු දේවල් කළා. ගමේ පන්සල අපිට නවාතැන් පහසුකම් දුන්නා. පල්ලිය අපිට කෑම දුන්නා. ජාති භේදයක් නැතුව, ආගම් භේදයක් නැතුව මිනිස් පවුලක් විධියට අකුරණ ගොඩනඟන්න අපි වැඩ කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය මේ චෝදනා කළාට මේ වෙනකොටත් 95ක පිරිසක් එම විහාරයේ වැඩ කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වෙලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 26ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.23]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டில் மிகப் பெரியதோர் அனர்த்தம் ஏற்பட்டு, நூற்றுக்கணக்கானோர் இந்த மண்ணில் இறந்து, அவர்களுடைய ஆத்மாக்கள் சுற்றிக்கொண்டு இருக்கின்ற இந்த நேரத்தில், எனக்குப் பேசுவதற்கு வாய்ப்பு வழங்கியமைக்கு நன்றிகள்!

மிக முக்கியமாக, இந்த நாட்டைத் தாக்கிய 'தித்வா' புயல் மற்றும் வெள்ள அனர்த்தம் காரணமாக இறந்துபோன ஒவ்வொரு தனிமனிதனது குடும்பத்தினருக்கும் இந்த உயர்ந்த சபையில் என்னுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். கிளிநொச்சி மாவட்டத்தின் சுண்டிக்குளம் பகுதியில் மக்களுடைய பாதுகாப்புக்காக சாலையை வெட்டுகின்ற பணியில் ஈடுபட்ட 5 கடற்படையினர் வெள்ளநீரில் அடித்துச் செல்லப்பட்டு இறந்திருக்கிறார்கள். அவர்களையும் நாங்கள் இந்த நேரத்தில் நினைவுகூருகின்றோம். அவர்கள் எங்களுக்கு எதிரிகளாக இருந்தாலும்கூட - எங்கள் மக்கள்மீது நடத்தப்பட்ட இனப் படுகொலைக்குக் காரணகர்த்தாக்களாக கடற்படையினரும் விமானப் படையினரும் இருந்தாலும்கூட - புயலின்போதும் பாரிய வெள்ள அனர்த்தத்தின்போதும் தங்களுடைய பணியை ஆற்றும்போது இறந்திருக்கிறார்கள். இதைத் தமிழர்களாகிய நாங்கள் மனிதாபிமான ரீதியில் நோக்கி, அவர்களுடைய குடும்பத்தினருக்கும் எங்களுடைய அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றோம்.

நெடுங்கேணி, வவுனியா வடக்குப் பிரதேச சபையின் மேனாள் தவிசாளராக இருந்த கிராம அலுவலர் மதிப்புக்குரிய தணிகாசலம் ஐயா அவர்களின் மகனும் வங்கி ஊழியருமான பத்மநிகேதன் அவர்கள் பயணித்த பஸ் வண்டி அநுராதபுரத்தில் வெள்ளத்தில் சிக்கியபோது, அவர் அந்த பஸ்ஸில் இருந்த 60 பேரைக் காப்பாற்ற உதவியபோதிலும், இறுதியில் அவர் தன்னுடைய உயிரை இழக்க வேண்டிய நிலை ஏற்பட்டது. நேர காலத்தோடு மீட்புப் பணியை மேற்கொண்டிருந்தால், அவரையும் காப்பாற்றியிருக்க முடியும். அவருடைய குடும்பத்தினருக்கும் இந்த உயர்ந்த சபையில் என்னுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டைத் தாக்கிய புயல் மற்றும் ஏற்பட்ட வெள்ளம் இலங்கையை ஒரு வகையில் புரட்டிப்போட்டு இருக்கிறது. இது 50 ஆண்டுகளுக்குப் பிறகு ஏற்பட்டிருக்கின்ற பாரிய அனர்த்தமென எல்லோரும் சொல்கிறார்கள். 1958ஆம் ஆண்டிலும் இலங்கையில் பெரு வெள்ளமொன்று ஏற்பட்டது. அந்தப் பெரு வெள்ளம் ஏற்பட்டு கிட்டத்தட்ட 70 ஆண்டுகளாகின்றது. அந்தப் பெரு வெள்ளக் காலத்தில் இரணைமடுக் குளம் உடைப்பெடுத்ததாக என்னுடைய மூதாதையர்கள் சொல்வதை நான் கேட்டிருக்கிறேன். அதேபோல், 1983ஆம் ஆண்டிலும் இலங்கையில் பெரு வெள்ளமொன்று ஏற்பட்டது. 1982ஆம் ஆண்டு கார்த்திகை மாதத்தில் தொடங்கிய அந்த வெள்ளப்பெருக்கின் தாக்கங்கள் 1983ஆம் ஆண்டு பங்குனி மாதம் வரை இருந்தன. அந்தக் காலத்தில் வயல்களிலிருந்து ஒரு பிடி நெல்லைக்கூட அந்த மக்கள் எடுக்கவில்லை. குறிப்பாக, நான் வாழுகின்ற வட்டக்கச்சி, இராமநாதபுரம் உட்பட வடக்கு, கிழக்குப் பகுதிகளில் இருந்த மக்களுடைய வயல் நிலங்கள் பூரணமாக அழிந்திருந்தன. அந்த நேரம் நான் 15 வயதுடைய பாடசாலை மாணவனாக இருந்தேன். அந்த மண்ணில் வாழ்ந்தவன் என்ற அடிப்படையில் நேரடியாக அதனைப் பார்த்திருக்கிறேன். அதே நிலைமையை நான் இந்த ஆண்டும் பார்த்தேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1983ஆம் ஆண்டும் இரணைமடுக் குளத்தின் நடுக்கட்டுப் பகுதி அப்படியே வடக்குப் பக்கத்தால் ஒருபுறம் தள்ளி விழுந்திருந்தது. அப்பொழுது வட்டக்கச்சி மத்திய கல்லூரியின் சாரண ஆசிரியராக இருந்தவரும் இலங்கையின் சாரண ஆணையாளராக இருந்தவருமான அமரர் புவனேஸ்வரன் அவர்களும் இப்போது சுவிட்சர்லாந்து நாட்டில் வாழும் எனது நண்பனான மணியழகன் அவர்களும் இதனைக் கண்டு, அப்பொழுது இரணைமடுக் குளத்தின் பொறியியலாளராக இருந்த குமாரசாமி ஐயா அவர்களுக்குத் தெரியப்படுத்தினார்கள். அந்த நேரத்தில் முரசுமோட்டை, வட்டக்கச்சி, இராமநாதபுரம் பகுதிகளைச் சேர்ந்த மக்கள் அந்தக் குளத்தைப் புனரமைப்பதிலும் அந்தக் கட்டு உடைந்து தண்ணீர் வெளியேறாதபடி அதனைப் பாதுகாப்பதிலும் முழுமையாக ஈடுபட்டிருந்தார்கள். அந்த நேரத்தில் 15 வயதுடைய பாடசாலை மாணவனாக இருந்த நானும் என்னாலான பங்களிப்பை அதற்கு ஆற்றியிருந்தேன். அந்தக் காலத்தில் வட்டக்கச்சி மத்திய கல்லூரியின் அதிபராக இருந்த அமரர் பொன். சபாபதி அவர்களை நான் இந்த இடத்தில் நினைவுகூருகின்றேன். அவரும் அமரர் குமாரசாமி அவர்களோடு இணைந்து இரணைமடுக் குளத்தைப் புனரமைப்பதில் மிகப் பெரிய பங்காற்றி இருந்தார். இவ்வாறு இவர்கள் எங்களுக்கு வழிகாட்டிகளாக இருந்தார்கள்.

ஏன் நான் அந்தக் காலத்தை நினைவூட்டுகின்றேன் என்றால், இம்முறையும் அதேபோல ஒரு பெரிய வெள்ளம் ஏற்பட்டு, இரணைமடுக் குளத்தின் மிகப் பெரிய அணையையும் தாண்டி - அந்த நேரம் 34 அடியாக இருந்த இரணைமடுக் குளத்தின் அணைக்கட்டு இப்பொழுது 36 அடியாக இருந்தும் கொள்ளளவைத் தாண்டி - உடைப்பெடுக்கக்கூடிய அபாய நிலை ஏற்படலாம் என்ற அச்சம் இருந்ததனால்தான். அந்த அச்சத்தையும் தாண்டி, இரணைமடுக் குளத்தின் வால் கட்டுப் பகுதியில் கிட்டத்தட்ட 15 இடங்களில் தண்ணீர் வெளியேற வேண்டும் என்பதற்காக வெட்டிவிட்டு இருந்தார்கள்.

பொறியியலாளர் கைலாயபிள்ளை பிரகாஷ் அவர்களின் தற்றுணிவையும் தைரியத்தையும் நான் பாராட்டுகின்றேன். அவரோடு இணைந்து செயற்படுகின்ற பிரதி நீர்ப்பாசனப் பணிப்பாளர் இராஜகோபு, அத்துறைசார்ந்த மேலதிகப் பணிப்பாளராக இருக்கின்ற சுதாகரன் ஆகியோரின் பணிகளை நான் அந்த இடத்தில் நேரடியாகப் பார்த்ததோடு, அவர்களோடு உரையாடியும் இருந்தேன். அக்கராயன் குளத்தின் பொறியியலாளர் துஷ்யந்தன் அவர்களையும் நான் அந்தக் களத்தில் பார்த்தேன். இவர்களது ஓயாத உழைப்பும் அந்த நேரம் இவர்கள் எடுத்த முடிவுகளும் மிகத் தெளிவாக இருந்தன. குறிப்பாக, வட்டக்கச்சியில் இருந்து இரணைமடு செல்கின்ற பாதையை வெட்ட வேண்டுமெனச் சொன்னபோது, "இல்லை! கொஞ்சம் பார்க்கலாம்" என்று பொறியியலாளர் பிரகாஷ் அவர்கள் எடுத்த முடிவு இன்றைக்கு அந்த இடத்தை மிகப் பெரியளவில் பாதுகாத்திருக்கிறது. இவ்வாறு கிளிநொச்சி மாவட்டத்தில் மிகப் பெரிய ஆபத்தை விளைவிக்கக் கூடியதாக இருந்த இரணைமடுக் குளத்தைக் காப்பாற்றுவதற்காகவும் அதனோடு இணைந்த பகுதிகளைக் காப்பாற்றுவதற்காகவும் மக்களைக் காப்பாற்றுவதற்காகவும் உழைத்த ஒவ்வொரு பொறியியலாளரையும் நான் இந்த இடத்தில் பாராட்டுகின்றேன்.

நான் நினைக்கின்றேன், கிளிநொச்சி மாவட்டத்தின் அரசாங்க அதிபரான முரளிதரன் அவர்கள் இந்த வெள்ளத்தில் நடக்காத இடமில்லை; சென்று பார்க்காத இடமில்லை. அவர் கிளிநொச்சி மாவட்டத்தின் ஒவ்வொரு பகுதிக்கும் தன்னுடைய பணிகளை ஆற்றியிருக்கிறார். கண்டாவளை பிரதேச செயலாளர் பிருந்தாகரன், பூநகரி பிரதேச செயலாளர் ஆயகுலன், கரைச்சி பிரதேச செயலாளர் முகுந்தன், பச்சிலைப்பள்ளி பிரதேச செயலாளர் ஜெயசீலன் என அங்குள்ள ஒவ்வோர் உத்தியோகத்தரின் பணிகளையும் நான் பார்த்தேன். அவர்களுடைய பணிகளைப் பாராட்டாமல் இருக்க முடியாது. நான் அந்த மாவட்டத்தில் பிறந்து வளர்ந்தவன்; அந்த மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்யும் ஒரு பாராளுமன்ற உறுப்பினர். அங்கு இருக்கின்ற கிராம அலுவலர்கள் உட்பட அனைத்து உத்தியோகத்தர்களும் மிக நேர்த்தியாகப் பணியாற்றினார்கள். அதற்காக அவர்களுக்கு இந்த உயர்ந்த சபையில் நன்றி தெரிவிக்கின்றேன். இவ்வாறு பணியாற்றிய கிராம சேவையாளர்களுக்கு இடையூறுகளும் ஏற்படுத்தப்பட்டன.

பரந்தன் இந்து மகா வித்தியாலயத்தில் மக்களுக்கான பணியைச் செய்துகொண்டிருந்த கிராம அலுவலர் தியாகராசா கலைரூபன் பாராளுமன்ற உறுப்பினர் ஒருவரால் தாக்கப்பட்டார். இதனைக் குறித்துக் கொள்ளுங்கள்! ஏனெனில், இது வரலாற்றில் இடம்பெற்ற மிக மோசமான ஒரு காரியம்! இவ்வாறு மேர்வின் சில்வா அவர்கள் செயற்படுவதைத்தான் நான் பார்த்திருக்கிறேன். மிகக் கடினமாக நேரத்தில் பணியாற்றிய ஓர் அரச உத்தியோகத்தரை ஒரு பாராளுமன்ற உறுப்பினர் தாக்கியது என்பது மிக மிக மோசமான ஒரு விடயம்! இதனை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அவர்கள் இது தொடர்பில் பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்திருக்கிறார்கள். இந்தச் சபையும் சரியான முறையில் அந்தப் பாராளுமன்ற உறுப்பினர் மீதான விசாரணையை மேற்கொள்ள வேண்டுமென நான் வலியுறுத்துகின்றேன்.

எனது சொந்த இடமான, நான் பிறந்து வளர்ந்து அள்ளி விளையாடிய வட்டக்கச்சி மண் கிட்டத்தட்ட மூன்று நாட்களாக ஒரு தீவுபோல் காணப்பட்டது. நானும் அந்த நீரில் அகப்பட்டிருந்தேன். வட்டக்கச்சி, இராமநாதபுரம், கல்மடுநகர் பகுதியிலுள்ள மக்கள் வெளியேற முடியாதவாறு இரணைமடு நீராலும் கல்மடு நீராலும் கிட்டத்தட்ட மூன்று நாட்கள் சூழப்பட்டிருந்தார்கள். அவர்களுக்கு 6 நாட்களாக மின்சாரம் இருக்கவில்லை. இவற்றை எல்லாம் தாண்டி, அந்த மக்கள் பொருமையோடும் நிதானத்தோடும் செயற்பட்டார்கள்.

(கிட்டத்தட்ட அவர்களுக்கு ஆறு நாட்கள் மின்சாரம் இருக்கவில்லை.....)

அவர்கள் மட்டுமல்ல, மாவட்டத்தின் பல பிரதேசங்களிலும் இருக்கின்ற மக்கள் இன்று பாதிக்கப்பட்டு இருக்கிறார்கள். நான் நேரடியாகக் களத்தில் நின்று பார்த்தவன் என்ற வகையிலே இதனைக் குறிப்பிடுகின்றேன். முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்களிலுள்ள பல பிரதேசங்கள் இவ்வாறு வெள்ள நீரால் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றன. யாழ்ப்பாண மாவட்டத்தில் பெரு வெள்ளம் ஏற்பட்டு, மக்கள் இடம்பெயரவில்லை என்றாலும், பல ஊர்களில் மக்களுடைய வீடுகளுக்குள் வெள்ளநீர் புகுந்திருக்கிறது. தீவுப் பகுதி, வலிகாமம், வட்டுக்கோட்டை என்பன தாழ்நிலப் பிரதேசங்களாகும். சாவகச்சேரியின் தாழ்நிலப் பிரதேசங்களில் வெள்ளப் பெருக்கின் தாக்கம் அதிகமாக இருந்தது. வடமராட்சியின் சில பகுதிகள் நீரில் மூழ்கியிருந்தன. இந்த நிலைமை அந்த மக்களைக் கடுமையாகப் பாதித்திருந்தது. திருகோணமலையிலுள்ள வெருகல் பிரதேச செயலாளர் பிரிவு பூரணமாகவே வெள்ளக்காடாக மாறியிருந்தது. 5,000 குடும்பங்கள் முழுமையாக இடம்பெயர்ந்திருந்தன. மூதூர், கிண்ணியா போன்ற பிரதேசங்களில் வாழுகின்ற எங்களுடைய முஸ்லிம் சகோதரர்கள்கூட கடுமையாகப் பாதிக்கப்பட்டார்கள். இவர்களைப்போல செட்டிக்குளம் பகுதியில் இருக்கின்ற எங்களுடைய மக்களும் மிக மோசமாகப் பாதிக்கப்பட்டதுடன், வவுனியா மாவட்டமும் இந்த வெள்ளப்பெருக்கால் பாதிப்பு களைச் சந்தித்தது. மட்டக்களப்பு மாவட்டத்தில் சித்தாண்டி உட்பட பல பிரதேசங்கள் இவ்வாறான பாதிப்புகளுக்கு முகங்கொடுத்தன. அம்பாறையில் பெரிய தாக்கம் இல்லை என்றாலும், வடக்கு, கிழக்கிலுள்ள மாவட்டங்கள் வெள்ளப்பெருக்கின் தாக்கத்தைப் பெருமளவில் உணர்ந்தன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதுவொரு மிகப் பெரிய அனர்த்தம்! நாங்கள் இதை வைத்து அரசியல் செய்ய விரும்பவில்லை. அதேபோல், இதனை அரசாங்கம் ஏற்படுத்திய விஷயமாகவும் பார்க்கவில்லை.

எதிர்வருகின்ற 24ஆம் திகதி சுனாமி நினைவு தினமாகும். இந்த நாட்டில் சுனாமிப் பேரலை ஏற்பட்டபோது பல்லாயிரக்கணக்கான உயிர்கள் காவுகொள்ளப்பட்டன. அப்போது தமிழீழ விடுதலைப் புலிகள், தாங்கள் ஆட்சிசெய்த வடக்கு, கிழக்குப் பகுதிகளில் தங்களுடைய பூரண பங்களிப்பைச் செய்தார்கள். கடற்புலிகளின் தளபதியாக இருந்த சூசை உட்பட பல தளபதிகள் போராளிகளை நேர்த்தியாக வழிநடத்தி, இறந்தவர்களுடைய உடலங்களை எடுப்பதில் முன்னின்று செயற்பட்டார்கள். தலைவர் பிரபாகரன் அவர்களின் தலைமையிலே இது மேற்கொள்ளப் பட்டது. அந்த நேரத்தில் நான் இலங்கை செஞ்சிலுவைச் சங்கத்தின் மாவட்டக் கிளை உறுப்பினராக இருந்து, பச்சிளைப்பள்ளி, வடமராட்சிக் கிழக்குப் பகுதிகளில் ஒரு தொண்டனாக என்னுடைய பணியை ஆற்றியிருந்தேன். அப்போது நேரடியாகப் பார்த்த விடயங்களின் ஊடாக சுனாமியின் மிக மோசமான நிலையை என்னால் உணர முடிந்தது.

நேற்றைய தினம் நான் மலையகத்தின் பல பகுதிகளுக்கும் சென்றிருந்தேன். அங்குள்ள மக்களோடு பேசியபோது, அவர்கள் தங்களுடைய கவலையைச் சொல்லி கண்ணீர் விட்டு அழுதார்கள். மண்சரிவால் அனர்த்தத்துக்கு உள்ளான வீடுகளுக்குள் இறந்துபோன பிள்ளைகளையும் நிலத்தில் புதைந்த மக்களையும் ஒன்றாக அடிக்கி வைத்து அவர்கள் அழுத காட்சி இப்பொழுதும் என்னுடைய நெஞ்சை நெருடுகின்றது. இது மிகப் பெரிய அனர்த்தம்! இது நீங்கள் ஏற்படுத்தியதல்ல. நாங்கள் உங்கள்மீது பழி சொல்லவில்லை. சுனாமி ஏற்பட்ட பின்னர், நாட்டில் சுனாமி ஏற்படுவதற்கான அறிகுறிகளைக் கண்டுபிடிப்பதற்கான வழிகள் தொடர்பில் ஆராயப்பட்டது. 2006ஆம் ஆண்டில் புயல், மழை தொடர்பான ஒரு 'ரேடார்'ஐக் கொண்டுவருவது பற்றி ஆராயப்பட்டு, அதற்கான அனுமதியும் வழங்கப்பட்டது. அதற்குப் பிறகும் இவ்வாறான மிகப் பெரியதோர் இயற்கை அனர்த்தம் ஏற்பட்டு இருக்கின்றது என்றால், சற்று யோசித்துப் பாருங்கள்!

“ இயற்கையை நீ அழித்தால், இயற்கையால் நீ அழிவாய்” என்பது விடுதலைப் புலிகளின் தாரக மந்திரமாக இருந்தது. இந்த வாசகங்களை உள்ளடக்கிய மிகப் பெரிய துண்டுப் பிரசுரம் தலைவர் பிரபாகரனின் காலத்தில் எல்லா இடங்களிலும் ஒட்டப்பட்டது. "மரங்களைத் தறிக்காதீர்கள்; இயற்கையைப் பாதுகாத்துக் கொள்ளுங்கள்; காடுகளைப்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

பேணுங்கள்" என்பது விடுதலைப் புலிகளின் கொள்கையாக இருந்தது. இதன் அடிப்படையில், அவர்கள் மிகப் பெரிய வனவளப் பிரிவையே வைத்திருந்தார்கள். அவர்கள் மரங்களைக்கூட நட்டார்கள். ஆனால், யுத்தத்துக்குப் பிறகு வந்த அரசாங்கம் அவ்வளவு மரங்களையும் தன்னுடைய படைகளை வைத்து அறுத்துச் சென்றுவிட்டது. இதனால் இயற்கை பாதிக்கப்பட்டு இருக்கிறது. இயற்கையின் சீற்றம்தான் இன்றைக்கு இலங்கையில் ஏற்பட்டிருக்கின்ற மிகப் பெரிய அனர்த்தத்துக்குக் காரணமாக அமைந்திருக்கிறது. விக்டோரியா நீர்த்தேக்கம் கட்டப்படும்பொழுதுகூட ஜே.ஆர். ஜெயவர்த்தன அவர்களுக்கு ஒரு பொறியியலாளர் சொல்லியிருக்கிறார், இது மிக ஆபத்தானது என்று. ஆனாலும், அவர் அதை அரசியலுக்காகச் செய்தாரென எழுதுகிறார்கள். சரி, பிழைகளுக்கு அப்பால் நீர்த்தேக்கங்கள் தேவை; மின்சார உற்பத்தி தேவை. நாங்கள் இயற்கையை அழிக்கும்போது, அதனுடைய சீற்றமானது எவ்வளவு தூரம் மக்களைப் பாதிக்கும் என்பதை இன்றைய நாட்டின் நிலைமை சொல்கின்றது. ஏன் இலங்கையிலுள்ள இயற்கைப் பேரிடர்களைக் கையாளுகின்ற அமைப்பு சரியான முறையில் இயங்கவில்லை? என நான் இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையிலுள்ள அனர்த்த முகாமைத்துவ மத்திய நிலையத்தின் அறிக்கைகள் சிங்களத்திலும் ஆங்கிலத்திலும் மட்டுமே வெளியிடப்படுகின்றன. கொழும்பிலிருந்து வெளியிடப்பட்ட அறிக்கைகள்கூட, சிங்களத்திலும் ஆங்கிலத்திலும் இருந்தனவே ஒழிய தமிழில் இருக்கவில்லை. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஏனைய உறுப்பினர்களே, நீங்கள் உன்னிப்பாகக் கவனியுங்கள்! இந்த நாட்டிலுள்ள தமிழர்களும் சரி, சிங்களவர்களும் சரி, முஸ்லிம்களும் சரி, பறங்கியர்களும் சரி, எல்லோருமே பாதிக்கப்பட்டு இருக்கிறார்கள். இந்த நாட்டில் அரச கரும மொழியாக தமிழ் மொழியும் சிங்கள மொழியும் இருக்கின்றது. எனினும், அனர்த்த நிலைமை தொடர்பான அறிக்கைகள் தமிழ் மொழியில் வரவில்லை. இதனால் மக்களுக்குத் தகவல்கள் சரியாகச் சென்றடையவில்லை.

யாழ்ப்பாணப் பல்கலைக்கழகத்தின் புவியியல்துறைப் பேராசிரியர் நாகமுத்து பிரதீபராஜா அவர்களுடைய கருத்துகளை இன்று மக்கள் கடவுளின் வாக்குபோல் மிக உன்னிப்பாகப் பார்க்கிறார்கள். அவருடைய கருத்துகளை வைத்துத்தான் இன்று மக்கள் தீர்மானிக்கின்றார்கள் என்பதை சமூக வலைத்தளங்களைப் பார்த்தால் தெரியும்! காரணம், கடந்த நான்கு ஆண்டுகளாக நாகமுத்து பிரதீபராஜா அவர்கள் வெளியிட்ட கருத்துகளும் அவர் சொன்ன செய்திகளும் அந்த மக்களைக் காப்பாற்றி இருக்கின்றன. அவர் இந்தப் பேரிடர் பற்றியும் சொல்லியிருந்தார். ஆனால், யாரும் அதைக் கவனத்தில் எடுக்கவில்லை. இப்பொழுதுகூட அவர் குறிப்பிட்டு இருக்கிறார், இந்தியாவுக்கும் இலங்கைக்கும் இடையில் நிலதடியில் இருக்கின்ற தகடுகளுக்கு இடையிலான அசைவால் 2.4, 2.5, 2.7 ரிக்டர் என சிறிய அளவிலான நில அதிர்வுகள் ஏற்பட்டாலும்கூட, அது சிலவேளை பெரியளவில் மாறலாம் என்று. நேற்று முதல் மழை தொடங்குமென அவர் சொன்னார். நான் உரையாற்றுகின்ற இந்தச் சந்தர்ப்பத்தில் கூட பெரு மழை பெய்கின்றது. ஆனாலும், இலங்கையிலுள்ள அனர்த்த முகாமைத்துவ மத்திய நிலையம் இதைச் சரியாக வெளியிடத் தயங்குகின்றது. நாகமுத்து பிரதீபராஜா போன்ற நிபுணர்களை உள்ளீர்த்து, இவ்வாறான அனர்த்தங்கள் ஏற்படுவதை முன்கூட்டியே வெளிப்படுத்தும் அரசாங்கத்தின் செயற்பாட்டை ஏன் நீங்கள் சரியாகக் கையாளவில்லை? கடந்த கால அரசாங்கங்கள் பிழைவிட்டு இருக்கின்றன, அவை சரியாகச் செயற்படவில்லை, நீதி நிலைநாட்டப்பட வேண்டும், உண்மை கண்டறிப்பட வேண்டும், ஊழல் நடந்திருக்கிறதென நீங்கள் சொல்கிறீர்கள். ஆனால், இங்கேயும் அதே நிலைமைதான் காணப்படுகின்றது.

நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைப் பாராட்டலாம். ஏனெனில், அவர் விழித்திருந்து ஒவ்வோர் இடமாகச் சென்று பாதிக்கப்பட்ட மக்களைச் சந்தித்து நிலைமைகளைக் கேட்டறிந்து வருகின்றார். அதை நான் வரவேற்கின்றேன். அவர் நாட்டின் சனாதிபதியாகத் தன்னுடைய கடமையைச் செய்கிறார். நாட்டு மக்கள் வாக்களித்து அவரை சனாதிபதியாகத் தெரிவுசெய்தது அந்தக் கடமையைச் செய்வதற்குத்தான். அது அவர் செய்யக்கூடாது என்பதல்ல. அவர் படுத்திருக்க வேண்டும் என்பதல்ல. அது அவருடைய கடமை! ஏனெனில், அவர் இந்த நாட்டின் சனாதிபதி! அதிலும் நிறைவேற்று அதிகாரம் கொண்ட சனாதிபதி! அவருக்குத்தான் அந்த முழுப் பொறுப்பும் உண்டு. அவர் தன்னுடைய கடமையைச் சரியாகச் செய்ய வேண்டும். இயலக்கூடிய அளவுக்கு அவர் செய்திருக்கிறார் என்றே நான் நினைக்கின்றேன். ஆனாலும், அவர் இன்னும் பல விடயங்களில் கரிசனைகொள்ள வேண்டும்.

இயற்கைப் பேரிடர்களை முன்கூட்டியே அறிந்து கொள்வதற்கான சரியான 'ரேடார்' கட்டமைப்பு இந்த நாட்டில் இருக்க வேண்டும். அதேபோல் நல்லதொரு நிபுணர் குழுவும் இருக்க வேண்டும். ஏன் இவற்றை இவ்வளவு காலமும் செய்யவில்லை? ஏன் இந்தப் பேரிடர் பற்றி இலங்கை அரசு முதலிலே சொல்லவில்லை? இந்தியாவில்கூட இது பற்றி அறிவிப்புச் செய்திருந்தார்கள். அதாவது, இவ்வாறான ஒரு பேரிடர் வரப்போகின்றது, அது இந்தியாவைப் பாதிக்கலாம், இந்து சமுத்திரத்தில் தாக்கத்தை ஏற்படுத்தலாம், இலங்கையைப் பாதிக்கலாம் என்றெல்லாம் பலமுறை சொல்லியிருந்தார்கள். ஆனால், இலங்கையில் இது பற்றி யாருமே பேசவில்லையே! ஏன் நீங்கள் அதை முன்கூட்டியே சொல்லவில்லை?

நாட்டு மக்களைப் பாதுகாக்கின்ற முழுப் பொறுப்பும் ஓர் அரசுக்கு உரியது. நீங்கள் ஓரளவுக்கு அந்தப் பொறுப்பை நிறைவேற்றி இருக்கிறீர்கள். இருந்தாலும், உங்களுடைய நடவடிக்கைகளில் சில குறைபாடுகள் இருக்கின்றன என்பதைத்தான் நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அது மிகப் பெரிய குறைபாடு! "மன்னித்துக் கொள்ளுங்கள்" என்று சாதாரணமாகச் சொல்கின்ற விடயம் அல்ல அது. அதற்கான தீர்வை நீங்கள் எவ்வாறு எட்டப் போகின்றீர்கள்? இனிமேலும் இவ்வாறான அனர்த்தம் இலங்கையில் ஏற்படாதவாறு எவ்வாறு தடுக்கப் போகின்றீர்கள்? அதற்கான நிரந்தத் தீர்வு என்ன? இந்த விடயங்கள் பற்றி சற்று சிந்தியுங்கள்!

இந்த அனர்த்தம் ஏற்பட்டபோது, பல நாடுகள் பல்வேறு வழிகளிலும் உதவி செய்தன. குறிப்பாக, இந்தியாவின் மீட்புக் குழுவினர் இலங்கைக்கு வருகை தந்தனர். மலையகத்தில் செல்ல முடியாமல் இருந்த இடங்களுக்குக்கூடச் சென்று அவர்கள் மக்களைக் காப்பாற்றினார்கள். இந்திய தூதுவர் ஸ்ரீ சந்தோஷ் ஜா அவர்களுக்கு நான் இந்த உயர்ந்த சபையில் நன்றி சொல்லக் கடமைப்பட்டு இருக்கின்றேன். காரணம், அவர்களுடைய திடீர் முயற்சியும் அனர்த்த நிலைமையின் போது உதவுகின்ற மனப்பான்மையும்தான். இந்தியப் பிரதமர் நரேந்திரி மோடி அவர்களும் இந்திய வெளியுறவுத்துறை

அமைச்சர் ஜெய்சங்கர் அவர்களும் எடுத்த உடனடி முடிவுகளையும், இலங்கையில் இடர் ஏற்பட்ட பகுதிகளில் அவர்கள் மேற்கொண்ட முன்முயற்சிகளையும் நாங்கள் தமிழர்களாகப் பாராட்டுகின்றோம். காரணம், இந்த நாட்டில் அவர்களுடைய பங்கு மிக முக்கியத்துவம் வாய்ந்தது. அதேபோல், அவர்களுடைய பிரசன்னமும் முக்கியத்துவம் வாய்ந்தது. அந்த வகையில்தான், அவர்கள் கப்பல்களில் நிவாரணப் பொருட்களைக்கூட அனுப்பி வைத்திருக் கிறார்கள்.

இன்னும் பல நாடுகள் எமது நாட்டுக்கு உதவி செய்திருக்கின்றன. மாலைதீவுகூட உதவி செய்திருக்கின்றது. பிரித்தானியா 9 இலட்சம் பிரித்தானிய பவுணை வழங்கியிருக்கின்றது. இதனைவிட, ஐரோப்பிய ஒன்றியமும் வழங்கியிருக்கின்றது. இந்த நாட்டில் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்குவதற்கும் அவர்களுக்கான உதவிகளைச் செய்வதற்கும் இது கட்டாயம் தேவை. அதை யாரும் மறுக்கவில்லை. ஆனால், இந்த நாடுகளின் உதவிகள் அந்தந்த நேரத்தில் தேவையான மக்களைச் சென்றடைய வேண்டும். அதாவது, பயனாளிகள் சரியாகத் தெரிவு செய்யப்பட வேண்டும்; பயனாளிகளின் பாதிப்புக்கு ஏற்ற வகையில் அவை வழங்கப்பட வேண்டும். வெள்ளப் பாதிப்பு என்பது, வீட்டுக்குள் வெள்ளநீர் உட்புகுவது மட்டுமல்ல. அவர்களுடைய உடைமைகளையும் வெள்ளநீர் அடித்துச் சென்றிருக்கிறது. அது மாத்திரமன்றி, அவர்களுடைய ஆடுகள், மாடுகள், கோழிகள் என கால்நடைகளும் இறந்திருக்கின்றன. அவர்களுடைய வாழ்வாதாரம் பாதிக்கப்பட்டு இருக்கின்றது.

இவ்வாறு பூரணமாகப் பாதிக்கப்பட்ட குடும்பத்தினரின் வாழ்வாதாரத்தை மேம்படுத்தக்கூடிய வகையில், அவர்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்லக்கூடிய வகையில், அரசாங்கத்தால் அவர்களுக்கான உதவிகள் சரியாக வழங்கப்பட வேண்டும். அதற்கான சரியான திட்டமிடல் இருக்க வேண்டும். நான் இதனை யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களை மாத்திரம் மையப்படுத்திச் சொல்லவில்லை. யாழ்ப்பாண மாவட்டத்தில் பல இடங்களில் விமர்சனங்கள் இருந்தாலும், யாழ்ப்பாண மாவட்ட அரசாங்க அதிபர் திரு. பிரதீபன் அவர்களும் அவருடன் இணைந்து செயற்பட்ட பிரதேச செயலாளர்கள், கிராம அலுவலர்கள், அபிவிருத்தி உத்தியோகத்தர்கள் அனைவரும் இரவு - பகல் பாராது பணியாற்றினார்கள். நான் யாழ்ப்பாண மற்றும் கிளிநொச்சி மாவட்ட அரசாங்க அதிபர்களோடு அடிக்கடி பேசினேன்; அவர்களைச் சந்தித்தேன்; அவர்களுடன் இந்த விடயங்கள் தொடர்பில் உரையாடினேன். இவற்றை வைத்துத்தான் நான் இதைச் சொல்கின்றேன்.

அடுத்த கட்டம் என்பது, வீடுகளைக் கழுவி அவற்றுக்குள் மக்கள் செல்வது மாத்திரமல்ல. ஏழை மக்களின் வாழ்வாதாரம் மிகப் பெரிய அளவில் பாதிக்கப்பட்டு இருக்கிறது. அவர்களின் வாழ்க்கையில் மாற்றத்தை ஏற்படுத்துவதற்கு மிகப் பெரிய அளவிலான நிதியீட்டம் தேவை. அது பொருளாதார, வாழ்வாதார மேம்படுத்தலாக இருக்க வேண்டும். வெறுமனே வீதிகளைப் புனரமைத்தல், வீடுகளைத் திருத்துதல், வீடுகளுக்கு வெள்ளையடித்தல், கிணறுகளைச் சுத்தப்படுத்து தலுடன் மட்டும் அது நின்றுவிடக் கூடாது. இவையும் முக்கியம்! இவற்றையும் உடனடியாகச் செய்ய வேண்டும். அதேநேரம், அவர்களுடைய வாழ்க்கையை அடுத்த கட்டத்தை நோக்கி நகர்த்துவதற்கான மூலோபாயமும் உருவாக்கப்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எத்தனையோ நெல் வயல்கள் முற்றாக அழிந்திருக்கின்றன. அந்த விவசாயிகள் கண்ணீர்விட்டு அழுகிறார்கள். அவர்களுக்கு உரிய விமோசனம் கிடைக்க வேண்டும்; காப்புறுதி கிடைக்க வேண்டும். கடந்த ஆண்டு கிளிநொச்சியில் ஏற்பட்ட அழிவு தொடர்பில் இந்த மன்றில் நான் வினவியபோது, அதற்குச் சரியான பதில் கிடைக்கவில்லை. அதுமாத்திரமன்றி, பாதிக்கப்பட்டவர்களுக்கு இழப்பீடும் வழங்கப்படவில்லை. அதைவிட மோசமாக இம்முறை நாடு பூராவும் பாதிக்கப்பட்டு இருக்கிறது. அதிலும் விவசாய மாவட்டங்களான மட்டக்களப்பு, மன்னார், முல்லைத்தீவு, கிளிநொச்சி, வவுனியா போன்ற மாவட்டங்கள் மிகப் பெரியளவில் பாதிக்கப்பட்டு இருக்கின்றன. இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற, பொருளாதார வல்லமையாக இருக்கின்ற விவசாயிகளை நீங்கள் எப்படி தூக்கிவிடப் போகின்றீர்கள்? அவர்களிடம் இருக்கின்ற தைரியம் குறைவடைந்து இருக்கிறது. அவர்களைத் தூக்கி விடுவதற்கான உங்களுடைய அடுத்த கட்ட நடவடிக்கை என்ன?

வெங்காயச் செய்கையாளர்கள், மரக்கறிச் செய்கை யாளர்கள் இந்த மழையால் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். சாதாரணமாக கார்த்திகை மாதத்தில் வடமராட்சிப் பகுதியிலும் யாழ்ப்பாணத்தின் அச்சுவேலி, இடைக்காட்டுப் பகுதிகளிலும் மிளகாய்ச் செய்கையில் ஈடுபடுவார்கள். அதேபோன்று, தீவுப் பகுதிகளில் புகையிலை, மிளகாய், வெங்காயச் செய்கையில் ஈடுபடுவார்கள். இந்தப் புயலால் அவர்களுடைய உற்பத்திகள் எல்லாம் பெருமளவில் பாதிக்கப்பட்டு இருக்கின்றன. இவர்கள் தொடர்பில் சரியான திட்டங்கள் இருக்க வேண்டும். அவை நேர்மையானதாக இருக்க வேண்டும் என்பது மிக முக்கியமானது. அரச அதிகாரிகள்மீது பிழை சொல்வதோ அல்லது அவர்களைக் குறை சொல்வதோ எங்களுடைய நோக்கமல்ல. அனர்த்தம் நடைபெற்றிருக்கின்ற இந்த நேரத்தில் உங்களைப் பிழை பிடிக்கின்ற முயற்சியில் நாங்கள் ஈடுபடவில்லை. ஆனால், உங்களிடமும் தவறுகள் இருக்கின்றன என்பதை நீங்கள் ஏற்றுக்கொள்ள வேண்டும். அவற்றை மறைப்பதற்கு நீங்கள் முயற்சி செய்யக் கூடாது. பிழைகளை ஏற்றுக் கொள்ளுங்கள்! இன்னென்ன தவறுகள் இடம்பெற்றிருக்கின்றன; அவற்றை நாங்கள் திருத்திக் கொள்கின்றோம்; அதற்கான விமோசனங்களைச் செய்கின்றோம் என்று சொல்லுங்கள்!

மலையகத்தில் உச்சி மலைகளில் இருந்து சரிந்து விழுந்து பல குடும்பங்கள் காணாமற்போய் இருப்பதுடன், பலருடைய வீடுகளும் இல்லை. மலைச்சரிவு குறைந்த இடங்களில் அல்லது பாதுகாப்பான இடங்களில் அவர்களுக்கு வீடுகளை வழங்குங்கள்! அவர்களுக்கான வீட்டுத்திட்டத்தை உடனே நடைமுறைப்படுத்துங்கள்! அந்தக் குடும்பங்கள் நிம்மதியாக வாழக்கூடிய ஒரு சூழலை உருவாக்குங்கள்! பொறுப்புச் சொல்வதற்கு அல்லது நடந்த அனர்த்தத்தைப் பதிவதற்கு ஒருவர்கூட இல்லாமல் குடும்பமாக இறந்திருக்கிறார்கள். எனக்குத் தெரிய, யுத்தம் நடந்தபொழுது இலங்கை அரசு ஏவிய எறிகணை காரணமாக கிளிநொச்சி மாவட்டத்தின் பாரதிபுரத்தில் இவ்வாறு மூன்று குடும்பங்கள் முழுமையாக இறந்திருக்கின்றன. இன்று அந்தக் குடும்பத்தில் பதிவதற்கு ஒருவரும் இல்லை. அதுபோல, மலையகத்திலும் தங்களுக்கு நடந்த அனர்த்தத்தைப் பதிவுசெய்வதற்கு ஒருவர்கூட இல்லாமல் குடும்பமாக இறந்திருக்கிறார்கள். இவை கண்டறியப்பட்டு உரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். மலையக மக்களுக்கு ஏற்பட்டிருக்கின்ற பாதிப்பு மிக மோசமானது. மனிதாபிமானத்தோடு அவர்களுக்கான

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

உதவிகள் சென்றடைய வேண்டும். அவர்களுக்கான சொந்த நிலத்தையும் வீட்டையும் சரியான முறையில் வழங்குவதற்கு அரசாங்கம் முயற்சிக்க வேண்டும். அவர்களுக்கான சம்பள ஏற்றம் ஒருபுறம் இருந்தாலும், அவர்களுடைய வாழ்க்கையில் மாற்றத்தை ஏற்படுத்துவதற்கான முயற்சிகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென வலியுறுத்தி நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.47]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே நான் இன்றைய தினம் விவாதத்தில் மிகவும் கவலையோடுதான் கலந்துகொள்கின்றேன். ஏனென்றால், எமது இலங்கை நாட்டில் ஏற்பட்ட புயல் மற்றும் வெள்ள அனர்த்தத்தால் பலர் உயிரிழந்து இருக்கிறார்கள். அவர்கள் அனைவரினது குடும்பத்தினருக்கும் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன், உடைமைகளை இழந்து பாரிய பாதிப்புகளுக்கு உள்ளாகியிருக்கின்ற இலங்கை வாழ் மக்கள் அனைவரினது துன்பத்தில் நானும் பங்குகொள்கின்றேன் என்பதைக் கூறிக் கொள்கின்றேன்.

அரசாங்கமானது இந்த அனர்த்தத்தை மிகவும் சாதுரியமான முறையில் கையாண்டிருக்கிறது என்பதைக் கூறிக்கொள்வதில் நாங்கள் பின்நிற்கத் தேவையில்லை. மாண்புமிகு சனாதிபதி அவர்களால் எடுக்கப்பட்ட முடிவுகள், ஏனையவர்களுடன் கலந்தாலோசிக்கப்பட்டு எடுக்கப்பட்ட நடவடிக்கைகள், அமைச்சர்கள், மாவட்ட அரசாங்க அதிபர்கள் உட்பட ஏனைய அரச அதிகாரிகள், Army, Navy, Air Force, Police ஆகியோரால் எடுக்கப்பட்ட நடவடிக்கைகளால் பாதிக்கப்பட்டவர்கள் ஓரளவுக்கு நிம்மதியாக வாழக்கூடிய நிலைமை ஏற்பட்டுள்ளது. மேலும், ஒவ்வொரு குடும்பமும் பாதுகாப்பு நடவடிக்கைகளை மேற்கொண்டன. எமது அயல்நாடுகள் உட்பட பல வெளிநாடுகள் மற்றும் அரச சார்பற்ற தொண்டு நிறுவனங்கள் என்பன உடனடியாக உதவிகளைப் புரிந்தன. அதுமாத்திரமன்றி, இந்த அனர்த்தம் ஏற்பட்டபொழுது இளைஞர்களும் உடனடியாக களத்தில் இறங்கி மக்களுக்கு உதவி செய்தார்கள். இது உண்மையிலேயே பாராட்டக்கூடிய ஒரு விடயமாகும். அதற்காக அவர்களுக்கு எனது நன்றிகளை இந்த இடத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த அனர்த்தத்தால் எமது மன்னார் மாவட்டத்தில் பாரிய அழிவு ஏற்பட்டுள்ளது. அதிலும் குறிப்பாக, நானாட்டான் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட 14 கிராம சேவையாளர் பிரிவுகளைச் சேர்ந்த மக்கள் இடம்பெயர்ந்து இருக்கிறார்கள். அவர்களில் பலர் இன்னமும் முகாம்களில் இருக்கிறார்கள். மடுக்கரை, அறுவைக்குன்று, இசைமலைத்தாழ்வு போன்ற கிராமங்களில் சுனாமி ஏற்பட்டது போன்று சுழற்றி அடிக்கப்பட்டு இருக்கின்றது. அதனால் அங்குள்ள மக்களின் அனைத்து உடைமைகளும் வெள்ளநீரில் அடித்துச் செல்லப்பட்டு பாரிய அழிவுகள் ஏற்பட்டிருக்கின்றன. எனவே, அந்தப் பகுதிகளிலுள்ள மக்களுக்கு மாற்றுக் காணியும் வீடும் வழங்கப்பட வேண்டுமென நான் இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன். அதேபோல, முசலி பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட வேப்பங்குளம், 4ஆம் கட்டை, பூநொச்சிக்குளம், மருதமடு எனப் பல கிராமங்கள் பாதிக்கப்பட்டுள்ளன. அங்கு மக்களின் உடைமைகளும் வெள்ளநீரில் அடித்துச் செல்லப்பட்டு அழிவடைந்திருக்கின்றன. அவர்களுக்கும் பொருத்தமான நஷ்டஈட்டை எதிர்காலத்தில் கொடுக்க வேண்டும்.

மடு பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட குஞ்சுக்குளம், பெரியமுறிப்பு கிராம மக்களின் அனைத்து உடைமைகளும் வெள்ள நீரினால் அழிவடைந்து இருக்கின்றன. பல கிராமங்களில் வெள்ளப்பெருக்கு ஏற்பட்டு பாரிய பொருட்சேதம் ஏற்படாவிட்டாலும், பாதிப்புகள் ஏற்பட்டிருக்கின்றன. மாந்தை மேற்குப் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட கூராய் கிராமத்தில் சுனாமி வந்து சென்றதுபோல்தான் நிலைமை இருக்கின்றது. அந்தளவுக்கு அந்தக் கிராமம் புரட்டிப்போடப்பட்டு இருக்கின்றது. தேத்தாவாடி கிராமத்திலுள்ள மக்களும் தங்களது உடைமைகளை முழுமையாக இழந்துள்ளனர். தேவன்பிட்டி, மூன்றாம் பிட்டி கிராமங்களிலும் பாரிய பாதிப்புகள் ஏற்பட்டு இருக்கின்றன. இந்தக் கிராம மக்களுக்கும் மாற்றுக் காணி வழங்கவேண்டிய கட்டாயத் தேவையிருக்கின்றது. மன்னார் தீவுப் பகுதியில் வெள்ளநீர் வடிந்தோடக்கூடிய வடிகால் அமைப்பு சரியாக இல்லாமையால், உதயபுரம், வசந்தபுரம் கிராமங்கள் ஒவ்வொரு முறையும் வெள்ளப் பாதிப்புக்கு உள்ளாகின்றன. அதேபோல், இம்முறையும் பாதிக்கப்பட்டு இருக்கின்றன.

முல்லைத்தீவின் மாந்தை கிழக்குப் பிரதேச செயலாளர் பிரிவிலும் பாரிய பாதிப்புகள் ஏற்பட்டிருக்கின்றன. அதிலும் குறிப்பாக, சிறாட்டிக்குளம், பாலிநகர், நட்டான்கண்டல் கிராம சேவையாளர் பிரிவுக்குட்பட்ட கிராமங்களில் பாரிய பாதிப்புகள் ஏற்பட்டிருக்கின்றன. அங்குள்ள மக்களுக்கும் மாற்றுக் காணி கொடுக்கப்பட வேண்டிய தேவை காணப்படுகின்றது. மேலும், துணுக்காய்-கரைதுறைப்பற்று பகுதியிலுள்ள நாயாறு, வட்டுவாகல் போன்ற பெரிய பாலங்களும் பாதிக்கப்பட்டு இருக்கின்றன. அது மாத்திரமன்றி, விவசாய நிலங்களும் மேட்டு நிலப் பயிர்ச்செய்கையும் பாதிக்கப்பட்டு இருக்கின்றன. வவுனியா மாவட்டத்திலுள்ள கந்தசாமி நகரில் மக்கள் வாழக்கூடிய நிலைமை இல்லை. அங்கு இருக்கின்றவர்களுக்கும் மாற்றுக் காணிகளைக் கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும். அத்துடன், பழைய வீடுகளில் வாழுகின்றவர்களுக்கு மாற்று வீட்டுத் திட்டத்தையும் வழங்க வேண்டும். அதாவது, அவர்களுக்கு மாற்றுக் காணியுடன் சேர்த்து வீடும் கொடுக்கப்பட வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

வெலிஓயா பிரதேசத்திலுள்ள எலம்பகஸ்வெ, நிக்கவெவ போன்ற இடங்களிலும் பாரியளவு பாதிப்பு ஏற்பட்டுள்ளது. வவுனியாவுக்கும் போகஸ்வெவவுக்கும் இடையிலுள்ள குமாரஓய பாலத்தைப் புனரமைத்துத் தருவதாக கடந்த காலங்களில் சொல்லப்பட்டது. எனினும், இன்றுவரை அந்தப் பாலத்தைப் புனரமைத்துத் தரவில்லை. அந்தப் பாலத்தைப் புனரமைத்தால் பாதிப்புகளை ஓரளவு குறைத்துக் கொள்ளலாம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
ஒரு நிமிடம் தாருங்கள்!

பாதிக்கப்பட்டவர்களுக்கு சில இடங்களில் 3,000 ரூபாயும் இன்னும் சில இடங்களில் 25,000 ரூபாயும் வழங்கப்படுகின்றது. நாடளாவிய ரீதியில் காணப்படுகின்ற இந்த ஏற்றத்தாழ்வு காரணமாக ஊழல் இடம்பெறலாம். பாதிக்கப்பட்ட அளவைப் பார்க்காமல், பாதிக்கப்பட்ட அவனைவருக்கும் அரசாங்கத்தால் வழங்கப்படுகின்ற உதவித் திட்டங்கள் சென்றடைய வேண்டும். வீடுகளுக்குள் வெள்ளநீர் புகுந்தவர்களுக்கும் சரி, காணிகளுக்குள் வெள்ளநீர் புகுந்தவர் களுக்கும் சரி, அனைவருக்கும் 25,000 ரூபாய் கொடுக்கப்பட வேண்டும் என்பதுடன், ஏனைய உதவித் திட்டங்களும் கொடுக்கப்பட வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
மன்னார் கூடுதலாகப் பாதிக்கப்பட்ட பகுதி என்ற அடிப்படையில், அங்குள்ள நிலைமைகளைத் தெரிவிப்பதற்கு எனக்கு இன்னும் 2 நிமிடங்களைத் தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

இந்த அனர்த்தத்தின்போது எமது பகுதிகளிலுள்ள சில அதிகாரிகள் உண்மையிலேயே சிறப்பாகச் செயற்பட்டாலும், சில அதிகாரிகள் தொடர்பில் பிரச்சினைகளும் இருக்கின்றன. "சாமி வரம் கொடுத்தாலும் பூசாரி இடம் கொடுப்பதில்லை" போன்ற நடவடிக்கைகள் நடைபெறுகின்றன. அவ்வாறான நடவடிக்கைகள் நடைபெறாமல், அரசாங்கம் சரியான முறையில் பாதிக்கப்பட்டவர்களை இனங்கண்டு, அவர்களுக்கு எந்தவித பாகுபாடும் இன்றி நிவாரணங்களை வழங்க வேண்டும். பயிர்ச்செய்கை, கால்நடை வளர்ப்பு, மேட்டு நிலப் பயிர்ச்செய்கை என்பன பாதிக்கப்பட்டுள்ளதுடன், பல குளங்களும் உடைந்திருக்கின்றன. அது மாத்திரமன்றி, பல கிராமங்களிலுள்ள வீதிகள் பயன்படுத்த முடியாத நிலையில் இருக்கின்றன. எதிர்காலத்தில் இவற்றை விரைவாகச் சரிசெய்து தர வேண்டுமெனக் கேட்டுக்கொண்டு, இந்த நேரத்தில் அரசாங்கத்தின் சகல திட்டங்களுக்கும் ஆதரவளிப்பேன் எனக் கூறி விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.54]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම බරපතළ ව්‍යසනයක් රටට සිද්ධ වෙලා තිබෙන වෙලාවේ, ඒ ව්‍යසනයෙන් මිය ගිය සියලුදෙනා කෙරෙහි අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරන ගමන් තුවාල ලැබූ සියලුදෙනාට නීරෝගී සම්පත් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම දේපොළ හානි සහ විවිධාකාර දුක් පීඩාවලට පත් වූ අයට ඉක්මනින් තමන්ගේ ජීවිත යථා තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ නීතිය මෙවැනි ව්‍යසනයකට රට මුහුණ දුන් අවස්ථාවකදී ව්‍යවස්ථාදායකය කළ යුත්තේ කුමක්ද, ආණ්ඩුවක් අනුගමනය කළ යුත්තේ කුමක්ද, ජනාධිපතිවරයා අනුගමනය කළ යුත්තේ කුමක්ද කියන පියවර ගැන ඉතාම පැහැදිලිව ලිඛිතව සංගෘහිත කරලා තිබෙනවා. ඒ නීතිය තමයි 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත. මේ පනත මඟින් ව්‍යසන කළමනාකරණ ජාතික සභාවක් පිහිටුවන්න, ව්‍යසන කළමනාකරණ ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවන්න, කාර්මික උපදේශන කමිටුවක් පත් කරන්න, ව්‍යසන කළමනාකරණ කමිටු පිළියෙළ කරන්න, ව්‍යසන තත්ත්වයන් ප්‍රකාශයට පත් කරන්න, වන්දි ප්‍රදානය කරන්න සහ ඒ හා සමඟ බැඳුණු ආනුෂංගික ක්‍රියා සඳහා රජයේ නිලධාරීන්ට අවශ්‍ය බලය දීම සඳහා වූ ප්‍රතිපාදන ඇති කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අපේක්ෂා කරනවා යම් අඩු පාඩුකම් තිබුණත්, ඒ පනත යටතේ වූ අවශ්‍ය පියවර මුල් අවස්ථාවේදීම ගන්න අසමත් වුණා වුණත්, පසු වෙලා හෝ රට වෙනුවෙන් ඒ අවශ්‍ය පියවර ගත යුතුයි කියලා. එහෙම නැත්නම් ව්‍යසන කළමනාකරණය පිළිබඳව රටේ සම්මත වෙලා තිබෙන ඒ නීතිය අනුගමනය නොකළා වෙනවා. ඒ අරමුදල් පාලනය කිරීම පිළිබඳව නෛතික තත්ත්වය ගැන ගැටලු මතු වෙනවා. රටක පළමුවෙන්ම තියෙන්න ඕනෑ දෙය තමයි ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම. ඒ පනතේ 11.(1) වගන්තිය අනුව ජනාධිපතිතුමාට තමයි ඒ බලය තිබෙන්නේ. මම දැන ගන්න කැමැතියි ඇත්ත වශයෙන්ම අද වෙනකොට ගරු ජනාධිපතිතුමා මේ පනත යටතේ එවැනි ප්‍රකාශයක් කරලා තිබෙනවාද කියලා. මම මීට කලින් අද දවසේම පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළා එවැනි ප්‍රකාශයක් කරලා තිබෙනවාද කියලා.

ඒකට හේතුව මේකයි. ඒ පනතේම 11.(3) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "(1)වන උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයක්, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් අනුමත කිරීම සඳහා ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළ දිනයට ඉක්බිතිවම පැවැත්වෙන ප්‍රථම රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය."

ඒ කියන්නේ මේ විපත ගැන අපි 25 දැන ගත්තා. 26, 27 වෙනකොට මේ ගැන අපට අවබෝධය ලැබුණා, හානිය සිදු වෙමින් තිබුණා. 28වෙනි දා පාර්ලිමේන්තුව රැස් වුණා. එදා ඉදිරිපත් වුණේ නැහැ. දැන් අද අපි පාර්ලිමේන්තුව නැවත රැස් වෙනවා. ඒ අතර තුරත් පාර්ලිමේන්තුව රැස් වුණා. නමුත් අද දවසේ අනුමත කර ගැනීමට න්‍යාය පත්‍රයට ඉදිරිපත් කර තිබෙන විෂයයන් අතර තිබෙන්නේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතයක් සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතයක් පමණයි. 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත ප්‍රකාරව ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ යුතුයි ජනාධිපතිතුමා විසින්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඒ වාගේම එම ප්‍රකාශනය පාර්ලිමේන්තුව අනුමත කළ යුතුව තිබෙනවා. එය අනුමත කිරීම ගැන ගැටලුවක් නැහැ. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙන්න ඕනෑ. මම මේ කාරණය පිළිබඳව රජයට කලින් දැනුම් දීලා අද දවසේ මේ කාරණය සිද්ධ වෙනවාද කියලා ඇහුවාම මට දැනගන්න ලැබිච්ච දේ තමයි, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ වූ විධානයක් පිළිබඳව අනුමැතියක් අද පාර්ලිමේන්තුවේ ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නැහැ කියන එක. එහි බරපතළ ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, ගරු ජනාධිපතිතුමා විසින් නීත්‍යනුකූලව; 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ ව්‍යසන තත්ත්වයක් තවමත් මේ රටේ ප්‍රකාශයට පත් කරලා නැද්ද කියන එක. එසේ ප්‍රකාශයට පත් කිරීම අත්‍යවශ්‍යයි. යම් හෙයකින් එය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා නම්, එය පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුයි. මොකද, ආධාර ලබා දීම, ඒ හා සම්බන්ධව රටේ සාමාන්‍ය නීතිවලින් ඔබ්බට ගිහින් ඒ ආයතනවලට සහ නිලධාරින්ට අවශ්‍ය කරන ශක්තිය ලබා දීම, ඒ වාගේම ඒ සඳහා ඒ නිලධාරින්ට අවශ්‍ය කරන ආරක්ෂාව ලබා දීම හා සම්බන්ධ කාරණාවලදී ඉතාම වගකිව යුතු දෙයක් තමයි ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ කොට එම ප්‍රකාශනය පාර්ලිමේන්තුවේදී අනුමත කරවා ගන්න එක.

මේ පාර්ලිමේන්තුව හැටියට අපේ වගකීම අඩු පාඩු ගැන කථා කරන එක හෝ විවේචන සිදු කරන එක නොවෙයි. ඒ ගැන අපට ගොඩක් දේවල් කියන්න තිබෙනවා. හැබැයි එසේ විවේචනය කිරීමෙන් මිය ගිය අයට නැවත ජීවිතය ලැබෙන්නේ නැහැ. ඒ අයගේ ජීවිත නැවත ගොඩනඟා ගැනීමට අවශ්‍ය ප්‍රායෝගික ශක්තිය ලැබෙන්නේ නැහැ. නමුත් රජයට, රජයේ නිලධාරින්ට සහ පෞද්ගලික අංශයෙන් මේවාට සහාය වෙමින් රට තුළ සහ රටින් එළියේ ඉන්න අයගේ යහපතට, ඔවුන්ගේ දැන ගැනීමට අවශ්‍ය කරන නීතිමය වාතාවරණය සකස් කරලා දෙන එක මේ පාර්ලිමේන්තුවේ වගකීමයි. විශේෂයෙන්ම නීතිය දන්නා අය හැටියට, මේ පාර්ලිමේන්තුවේ අත් දැකීම් තිබෙන අය හැටියට අපේ යුතුකමක් වනවා, මෙය පෙන්වා දීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. මේ රජය ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අමතක කරලා තිබෙනවා. එම පනත යටතේ අද අරගෙන තිබෙන පියවර මොනවාද? ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ ගත යුතු අත්‍යවශ්‍ය පියවර ගෙන නැද්ද? ඒ වාගේම, ඒ සඳහා ඉදිරියට ගත යුතු පියවර ගැනීමට අපේක්ෂා කරනවාද? මේ කාරණා පිළිබඳව ඉතාම පැහැදිලි, අවංක අවධානයක් යොමු කිරීම මේ අර්බුදකාරී අවස්ථාවේ රට ඉදිරියට ගෙන යෑම සඳහා අවංක උනන්දුවක් දක්වන කෙනෙකුට අත්‍යවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා, ආපදා සහන සේවා චක්‍රලේඛ අංකය 03/2025 කියලා. ඒක 2025.11.28වැනි දා තමයි නිකුත් කරලා තිබෙන්නේ. දැන් මා ළඟ ඒ නියෝගය තිබෙනවා. මේ නියෝගයට අත්සන් කරලා තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමායි. මේ නියෝගයේ නැහැ, කුමන නීතියක් යටතේද මෙය ඉදිරිපත් කරන්නේ කියලා. මේක ඉදිරිපත් කරන්නේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ද, මේක ඉදිරිපත් කරන්නේ අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ද, මේක ඉදිරිපත් කරන්නේ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ ද කියලා මේ නිවේදනයේ නැහැ.

ඉන් පසුව නිකුත් කරලා තිබෙනවා, 2025 දෙසැම්බර් 02 දරන ගැසට් නිවේදනය. ඒකේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, එය 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ වූ තාවකාලික විධිවිධාන බව. ඒක ජාතික ව්‍යසන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ නිවේදනයක්. ඒක වෙනම එකක්. ඒක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයායි නිකුත් කරන්නේ. ඉන් පසුව නැවත වරක් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා 2025.12.02වැනි දා තවත් නිවේදනයක් නිකුත් කරනවා. වැදගත්ම දේ තමයි, ඒ නිවේදන කිසිවක, ඒ නිවේදන නිකුත් කරන්නේ කුමන නීතිමය ප්‍රතිපාදනයක් යටතේද කියලා සඳහන්ව නොතිබීම. ඒ නිවේදන නිකුත් කරන්නේ මොන පනතක් යටතේද, මොන හදිසි නීති රෙගුලාසි යටතේද, මොන අත්‍යවශ්‍ය සේවා රෙගුලාසි යටතේද කියලා සඳහනක් නැහැ. මම මේ සියලුම රෙගුලාසි ටික ලබා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙතැන පෙනෙනවා, ගැටලුවක් තිබෙන බව. මම මේ ගැටලුව පිළිබඳව මතු කරන්නේ ආණ්ඩුවට එය නිවැරදි කර ගන්න අවස්ථාව ලබා දෙන්නයි. මේ පාර්ලිමේන්තුවේ රජයේ වගකිව යුතු ධුර දරන සියලුදෙනාටත් මම මේ ගැන සඳහන් කළා. මේ කාරණයේදී මා කියන දේ වැරදි නම් හොඳයි. ඒ කියන්නේ, ආණ්ඩුව හරියට වැඩ කරලා. මොනවා හරි අඩු පාඩුවක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කර ගන්න ඕනෑ. මට පෙනෙනවා, අඩු පාඩුවක් වෙලා තිබෙන බවක්. 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත යටතේ ගත යුතු අනිවාර්ය පියවර, අත්‍යවශ්‍ය වූ පියවර අරගෙන නැති බව අපට පෙනෙනවා. එය නිවැරදි කර ගැනීම රටට අත්‍යවශ්‍ය දෙයක් බව වගකීමෙන් කියන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.02]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ කියැවුණා "පාලකයා අධර්මිෂ්ඨ නම් රටට ගංවතුර, නාය යාම්, සුළි සුළං එනවා" කියලා. අපි නොවෙයි එහෙම කිව්වේ. ආණ්ඩුව පැත්තේ ඉස්සරහා පේළියේ එහා කොනේම ඉන්න ඇමතිතුමායි කිව්වේ. අපි නම් එහෙම කියන්නේ නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එයාගේ නම, සමන්ත විද්‍යාරත්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
නම කිව්වොත් මගේ වෙලාව ගනීවි.

අපි නම් කියන්නේ නැහැ, පාලකයා අධර්මිෂ්ඨ නිසා ගංවතුර ආවා කියලා. මේ සුළි කුණාටුව ස්වාභාවිකව එන දෙයක්. හැබැයි, ප්‍රශ්නය වන්නේ මොකක්ද? අපි මේ සම්බන්ධව පසුගිය දවස්වල කිව්වාම අපි බොරු කියනවා කිව්වා. අපි ජනතාව රැවැට්ටුවා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ voice-cuts දාන්න දෙන්නේ නැති නිසා මම ඒවායේ recording එක අරගෙන ආවා. මේ තිබෙන්නේ, නොවැම්බර් මාසයේ 12 වැනි දා කාලගුණ

විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මාධ්‍ය හමුවේදී කරපු අනතුරු ඇඟවීම. මගේ ගාව rushes ඔක්කෝම තිබෙනවා. මේ තිබෙන්නේ, නොවැම්බර් 14 වැනි දා එතුමාගේ ප්‍රකාශය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනතුරු ඇඟවීම දක්වා තිබෙන වීඩියෝ එක මෙහි දාන්න දෙනවා නම්, මට එය දාන්න පුළුවන්. ඉස්සෙල්ලා සුජීව මන්ත්‍රීතුමාට දාන්න නොදීපු හින්දා මම ඒක ටයිප් කරපු කොළ ටික ගෙනාවා.

මේ තිබෙන්නේ, නොවැම්බර් 17 වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ මාධ්‍ය හමුවේදී එතුමා කියපු දේ. මේ අනතුරු ඇඟවීම පැහැදිලිව කර තිබෙනවා. මේ තිබෙන්නේ, ඒ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ දෙවැනියා නොවැම්බර් 22 වැනි දා කරපු අනතුරු ඇඟවීම සඳහන් ලේඛනය. මේ තිබෙන්නේ, එතුමා නොවැම්බර් 23 වැනි දා කරපු අනතුරු ඇඟවීම සඳහන් ලේඛනය. අපි බොරු කියන බව කියනවා නම් මම මේ සියල්ල සභාගත කරන්නම්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නොවැම්බර් 25 වැනි දා BBC නාලිකාවේ කියනවා, මිලිමීටර් 400, 500 මට්ටමට ලංකාවට වහිනවා කියලා. BBC නාලිකාවේ ඒ ප්‍රවෘත්තිය අරගෙන බලන්න පුළුවන්. එදාම "හිරු" නාලිකාවේ ප්‍රවෘත්තිවල කියනවා, ලංකාවේ ගංගා සියල්ලම උතුරා යනවා, මේ සුළි කුණාටුව එනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉහත කී දිනයන්හිදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් කරන ලද අනතුරු ඇඟවීම් සඳහන් ලේඛන, ඉහත කී හිරු ප්‍රවෘත්තිය ඇතුළත් ලේඛනය සහ අංක 03/2025 දරන ආපදා සහන සේවා චක්‍රලේඛය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

දැන් මාධ්‍යයට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ; මාධ්‍යයට දොස් කියලා වැඩක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා කියලා. එතුමා මෙය අහගෙන ඉන්නවා ඇති. මේ වැරැද්ද පිළිගන්න. අඩු පාඩු සිදු වෙනවා, මිනිස්සුන්ගේ අතින්. හැමෝම හැම දේම දන්නේ නැහැ. හැබැයි, වැරැද්ද පිළිගෙන වැරැද්ද හදන්න කියන එක තමයි අප කියන්නේ. ඒක කරනවා වෙනුවට පැලවත්තේ නිවන් සුව මඩ බලකාය දාලා අපට ගැහුවා කියලා අපි කට වහන්නේ නැහැ; අපි භය වෙන්නේත් නැහැ ඒවාට. අපටත් පුළුවන් ඒකට රිටන් එක දෙන්න. හැබැයි, අපි ඒ තැනට යන්නේ නැහැ. අනෙක් එක, පොලිස් ආරක්ෂාව දුන්නු දෙකයි පනහේ යූටියුබ්කාරයෝ දාලා මඩ ගැස්සුවා කියලා අපි යට වෙන්නේ නැහැ. හැබැයි අපි කියන්න ඕනෑ දෙය කෙළින්ම කියනවා. මම ඇත්ත කියන කොට මගේ මිත්‍ර ලාල්කාන්ත ඇමතිතුමාට හිනහාත් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සුළි කුණාටුව නිකම් ආපු එකක් නොවෙයි. එය රහසින් ඇවිල්ලා ලංකාවට ගහලා ගියේ නැහැ. එය මුළු කලාපයටම siren දාගෙන ආවේ. මේ මුළු කලාපයේ හැම රටක්ම ඒක තේරුම් අරගෙන ලැහැස්ති වුණා. ඉන්දියාවේ මරණ තුනක් දක්වා අඩු වුණේ ඒ නිසයි. ඔබතුමන්ලා බුදියාගෙන හිටියා. ඔබතුමන්ලා බුදියාගෙන ඉඳලා විපක්ෂයට බැණලා, විපක්ෂයට කුණු හරුප කියලා, මඩ බලකාය දාලා විපක්ෂයට ගස්සලා මේවා නවත්වන්න බැහැ; මැරිච්ච මිනිසුන්ට ජීවිතය ලබා දෙන්නත් බැහැ; ඉදිරියේදී වන හානි වළක්වා ගන්නත් බැහැ.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙතැනින් එහාට හරි ආණ්ඩුව මේවා හදා ගන්න නම්, මේ ඇත්ත පිළිගන්න ඕනෑ. දැන් ආණ්ඩුව තනිකරම පඹගාලක පැටලිලා ඉන්නවා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් මේ කාරණය කිව්වා. හැබැයි, මමත් කියන්න ඕනෑ. ආරක්ෂක ලේකම්තුමා ආපදාවක් ප්‍රකාශයට පත් කරලා, දිනයක් නැති ලියුමක් දාලා තිබෙනවා. ඊට පස්සේ ඔහු අත් අකුරින් දාලා තිබෙනවා, 11වැනි මාසයේ 28වැනි දා. හැබැයි, ඔහු කියනවා 21වැනි දා සිට බලපාන පරිදි ආපදාවක් තිබෙනවා කියලා. එතකොට අපිද බොරු කිව්වේ? අනෙක් එක තමයි, මේ ලියුමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඔහුට එහෙම අයිතියක් නැහැ. මම ආපදා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙක්. මේ ආණ්ඩුව ආවාට පස්සේ එක්වරක් ආපදා කළමනාකරණ කමිටුව කැඳවූවා. මට මතක විධියට ඒ ජූලි මාසයේදී හෝ අගෝස්තු මාසයේදී ජනාධිපති ලේකම් කාර්යාලයේදී. මමත් ඒකට ගියා. ඊට පස්සේ කැඳවූයේ නැහැ. මේ ලියුමේ නීත්‍යානුකූලභාවයක් නැහැ.

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 5.(1) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "අවශ්‍යයැයි හැඟෙන සියලුම අවස්ථාවන් හි දී සභාවට රැස්විය හැකි අතර, මාස තුනකට එක් වරකට නොඅඩු වන පරිදි එසේ රැස්විය යුතු ය."

ඒ කියන්නේ මාස තුනකට වරක් රැස්වෙන්න ඕනෑ, රැස් වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය හරහා දේශපාලන කුමන්ත්‍රණ කරලා ආණ්ඩුවට ගහලා ආණ්ඩුව වට්ටන්න සමහර අය හිතනවා ඇති. අපට එහෙම වුවමනාවක් නැහැ. මම එදාත් මගේ කථාවේදී කිව්වා, මේ වැරැදි හදාගෙන යන්න ආණ්ඩුවට තව අවුරුදු හතරක් තිබෙනවා කියන එක. අපේ අරමුණ ඒකයි. අගමැතිතුමිය සාක්ෂි, අපට කථා කරපු හැම රැස්වීමකටම අපි ගිහිල්ලා තිබෙනවා. අපි ගිහිල්ලා ඒවා කඩාකප්පල් කරන්න කථා කළේ නැහැ. ඒකේ තිබෙන අඩු පාඩු සහ කළ යුතු දේවල් තමයි කථා කළේ.

මේ අඩු පාඩු මැදත්, 27වැනි දා තමයි ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ව්‍යසන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළේ. ඒ රැස්වීමට අපිත් ගියා. මම එතැනදී යෝජනා කළා, ආපදා කළමනාකරණ කමිටුව වහාම රැස් කරන්න කියලා. "නැහැ, නැහැ, දැන්ම ඕනෑ නැහැ" කිව්වා. දැන්ම ඕනෑ නැහැ කියලා, හැන්දෑවේ 6.30ට call කරනවා, 7.15ට ආරක්ෂක අමාත්‍යාංශයට එන්න කියලා. ඉතින්, මේවා අඩු පාඩු නේ. මේක පිළිගන්න. ඊට පස්සේ අගමැතිතුමිය එදා දහවල් කොළඹ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව පාර්ලිමේන්තුවේ රැස් කළා. අපි ඒකට ගියා. එතැනදී අපි සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නා. ඊළඟ දවසේ කොළොන්නාව සම්බන්ධීකරණ කමිටුව රැස් වුණා. අපි ඒකටත් ගියා. ඒකටත් ගිහිල්ලා අපේ අත් දැකීම්වලින් කියන්න ඕනෑ දේවල් කිව්වා. ජනාධිපතිතුමාගේ රැස්වීමේදී විශේෂයෙන්ම කැලණි ගඟ සම්බන්ධව කියද්දී අපි කිව්වා, "දැන් වැහි වතුරෙන් යට වෙලා තිබෙන්නේ, ඉස්සරහට ගංවතුර එනවා, moving pumps දමන්න" කියලා. ඒකට මොනවත් කළේ නැහැ.

ඊළඟට මම කිව්වා, "ගෙවල්වල ඉන්න අයට රුපියල් 200යි දෙන්නේ, ඒකෙන් කෑම දෙන්න බැහැ, ඒකත් දෙන්නේ නැහැ" කියලා. එතකොට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ආපු පුද්ගලයා බොරු කිව්වා, "නැහැ එහෙම දෙන්න පුළුවන්" කියලා. අපේ කොළොන්නාව සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න මම කියන එක ඇත්තද බොරුද කියලා. එතුමා ඒක තේරුම් කරලා දුන්නා. ඒ නිසා යම් යම් අඩු පාඩු වෙලා තිබෙන බව තේරුම් ගන්න. මේ අඩු පාඩු හරහා විශාල ප්‍රශ්නයක් සිදු වෙලා තිබෙනවා. ඒවා හදා ගන්න. ඒවා හදා ගත්තේ නැත්නම් වැඩක් නැහැ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපිට ආරංචි විධියට යටිතල පහසුකම්වල හානිය රුපියල් බිලියන 900ක් ලු. රුපියල් බිලියන 900ක් කියන්නේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක්. සමහර අය කියනවා, "අර රටෙන් ආධාර ලැබෙනවා, මේ රටෙන් ආධාර ලැබෙනවා" කියලා. ඇමෙරිකාව දුන්නේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 2යි. ඕස්ට්‍රේලියාව දුන්නේ, ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන එකයි. එංගලන්තය දුන්නේ ස්ටර්ලිං පවුම් 890,000යි. චීනය දුන්නේ ඩොලර් මිලියනයයි. නවසීලන්තය දුන්නේ ඩොලර් මිලියනයයි. ඉතින්, එහෙම කීයක් එකතු කරන්නද? ඩොලර් මිලියන 3,000ක් ඕනෑ. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනාවක් කරනවා. මම දන්නා තරමින් මේ වෙච්ච හානිය සම්බන්ධව නිවැරැදි presentation එකක් තවම හදලා නැහැ, ජාත්‍යන්තර ප්‍රජාවට දෙන්න. ඉස්සෙල්ලා නිවැරැදි presentation එකක් හදන්න. ඒක හදලා ජාත්‍යන්තර ප්‍රජාවට යවන්න. ඊට පස්සේ international donor conference එකක් තියන්න. මොකද, ජාත්‍යන්තර මාධ්‍යයෙන් ඔක්කොම ප්‍රචාරය වෙනවා. මම නොවෙයි කියන්නේ, අර ජනාධිපතිතුමාගේ යාළුවා, මේ ආණ්ඩුව බලයට ගේන්න කටයුතු කරපු, විශාල කැප කිරීමක් කරපු උවිඳු කුරුකුලසූරිය මහත්මයාම කියනවා, RTI Act එක යටතේ මේ මඩ බළකාය පිළිබඳ තොරතුරු ඔක්කොම එළියට දමනවා කියලා. අපි නොවෙයි කියන්නේ. ඒ නිසා මඩ ගහලා වැඩක් නැහැ. පක්ෂ විපක්ෂ ඔක්කොම එකතු වෙලා ඉස්සෙල්ලා මේ හානිය පිළිබඳ තක්සේරුවක් කරලා, කළ යුතු දේවල් පිළිබඳ අවබෝධයක් අරගෙන presentation එකක් හදලා, ජාත්‍යන්තර ආධාර සමුළුවක් පවත්වලා ජාත්‍යන්තරයෙන් අපට පුළුවන් මුල්‍ය අනුග්‍රහ ටික ලබා ගන්නවා වාගේම, තවදුරටත් ණය කපා හැරීම් කරන්න පුළුවන් නම් ඒකට අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දේශපාලනය කරන්න යනවා කියලා මඩ බළකාය දාලා අපිට ගැහුවාට අපි දේශපාලනය කළේ නැහැ.

අපට පැත්තකට වෙලා ඉන්න තිබුණා, "ආණ්ඩුවට ඡන්දය දුන්නා, එහෙනම් බලාගන්න" කියලා. අපට පුළුවන් විධියෙන් අපි උපරිම දායකත්වය ලබා දුන්නා කියන එක මම පැහැදිලිව කියනවා. හැබැයි, ආණ්ඩුව තමයි මේ තුළින් දේශපාලනය කරන්න හදන්නේ. ඒක හරි කැතයි.

ඊයේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම්වරයා උපදෙස් දෙනවා ජනතාවට, මේ form එකේ - ග්‍රාම නිලධාරින්ට යවන form එකේ - අත්සන් කළ යුතු නිලධාරින් තිදෙනාට අමතරව ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපතිගේ recommendation එක ඕනෑලු, ඊළඟට ආපදා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයාගේ recommendation එක ඕනෑලු. මොකටද? ජනතාව ඊයේ වෙනකොට තමයි ගෙවල්වලට ගිහිල්ලා තිබෙන්නේ. පුටුවක් නැහැ, මේසයක් නැහැ, ඇඳක් නැහැ. ළමයින්ගේ ඉස්කෝල පොත්පත් ටික නැහැ. මඩ ගුලි පිටින් ගෙවල්වල තිබෙන්නේ. එසේ තිබියදී හරි නම් වහාම මේ සල්ලි දෙන්න ඕනෑ. ඊයේ බැංකු නිවාඩු දිනයක්. එහෙනම්, අද මේ සල්ලි දෙන්න ඕනෑ. ග්‍රාම නිලධාරි තමයි ගමේ ඉන්න රජයේ නියෝජිතයා. එහෙම නැතුව JVP නියෝජිතයා නොවෙයි, රජයේ නියෝජිතයා වෙන්නේ. එතකොට මේ ආපදා කළමනාකරණ කමිටුවේ සහ ප්‍රජා සංවර්ධන කමිටුවේ ඉන්නේ JVP නියෝජිතයෝ. ඒගොල්ලන්ගේ recommendation මොකටද? ගංවතුර ආපු බව හැමෝම දන්නවා. යට වෙච්ච බව හැමෝම දන්නවා. රජයේ නියෝජිතයා වන ග්‍රාම නිලධාරීතුමා ඒ ගැන දන්නවා. එතුමා තමයි බලයලත් නියෝජිතයා. එතකොට මේ කොහේවත් ඉන්න අයගේ recommendation මොකටද? හැබැයි, ඒකෙත් වැඩේ කියන්නේ, ඒ form එකේ ඒක නැහැ . ඒ form එකේ අන්තිම අත්සනින් පස්සේ මේ recommendation එක දාගෙන එන්නලු. කොයි චක්‍රලේඛනයේද එහෙම කරන්න කියලා තිබෙන්නේ? අපි ඕනෑම දිසාපතිවරයෙකුට, ඕනෑම ප්‍රාදේශීය ලේකම්වරයෙකුට කියනවා, මේ නීතිවිරෝධී වැඩේ කෙරුවොත් අනාගතයේදී ඒකට අනිවාර්යයෙන්ම මුහුණ දෙන්න සිද්ධ වේවි කියලා. හොඳට මතක තබාගන්න, කොයි ආණ්ඩුවේත් දේශපාලනඥයෝ උපදෙස් දෙනවා. බලය නැති වුණාම දේශපාලනඥයා මහ හැරලා යනවා. නිලධාරින්ට තමයි තනිවම නඩු කියන්න වෙන්නේ. අතින් වියදම් කරගෙන තමයි ඒවා කරන්න වෙන්නේ. ඒ නිසා මේ රජයේ ග්‍රාම නිලධාරි වෙන්න පුළුවන්, ආපදා නිලධාරි වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සමෘද්ධි නිලධාරි වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ආර්ථික සංවර්ධන නිලධාරි වෙන්න පුළුවන්, එච්චරයි. වෙන කවුරුත් අත්සන් කරන්න ඕනෑ නැහැ. වෙන කාගේවත් recommendation ඕනෑ නැහැ. මොකද, ඒගොල්ලන්ගේ පැලවත්තේ අරමුදලෙන් ගේන සල්ලි ද මේවා? මේවා මේ රටේ මහජනතාවගේ බදු මුදල්වලින් ගෙවන ඒවා.

මෙහෙම ගියොත් මොකද ඊළඟට කරන්න හදන්නේ? රතු තරුව දාලා dry rations ටිකත් බෙදන්න සෙට් වේවි, දේශපාලනය කරන්න. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියන්න කැමතියි, ඔබතුමා සුළුතර ඡන්දයෙන් පත් වෙච්ච ජනාධිපති වුණාට ඔබතුමා මේ රටේ මිලියන 22ක් වන ජනතාවගේ ජනාධිපතිවරයා; රාජ්‍යයේ ජනාධිපතිවරයා; බදු මුදල්වල භාරකාරයා. මේ කවුරුවත් මේ රටේ බදු මුදල්වල හෝ මේ රටේ අයිතිකාරයෝ නොවෙයි. මහින්ද රාජපක්ෂත් ඔහොම තමයි හිතුවේ. එතුමා මේ රටේ අයිතිකාරයා කියලා තමයි හිතුවේ. අයිතිකාරයා කියලා හිතලා තමයි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඒ නිසා හැමෝම භාරකාරයෝ බව තේරුම් ගන්න. මේ ආණ්ඩුවේ sense එකක් ඇතිව වැඩ කරන එකම එක පුද්ගලයා ජනාධිපතිවරයා පමණයි. ඒ නිසා අපි එතුමාට කියන්න කැමතියි, මෙන්න මේ වාගේ දේවල් වෙන්න දෙන්න එපා. දැන් මේ 159, 159 කියලා කයිය ගැහුවාට 159ක් ආවේ ජනාධිපතිවරයාගේ ජනප්‍රියතාවෙන්; ජනාධිපතිවරයාට තිබෙන පිළිගැනීමෙන්. ඒ නිසා මේ 159

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ජනාධිපතිතුමාට. ඒ නිසා, මේක මේ වාගේ දේශපාලනීකරණය කරන්නේ නැතුව ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර වැඩේ වෙලා තිබෙන්නේ. දැන් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ජේන්න නැහැ. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා කිව්වා, ආරක්ෂක ලේකම් තගක් දාලා කියලා. මාර වැඩේ කියන්නේ, දැන් ටිකකට කලින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් කොහේ හෝ කාමරයක හැංගිලා ඉඳගෙන record කරපු කාලගුණ වාර්තාවක් ආවා. ඒ කටහඬ ඇහුවාම එතුමා හරිම බයෙන් ඒ කථාව කරන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හරිම බයෙන් තමයි හෙට දවස ගැන කියන්නේ. මෙහෙම කරලා රටවල් පාලනය කරන්න පුළුවන්ද කියලා මම අහනවා. කුණුහරුප කියලා බන්නලා, මිනිස්සුන්ව බය කරලා රටවල් පාලනය කරන්න පුළුවන්ද? මම දන්නේ නැහැ ජනාධිපතිතුමා මේක සම්බන්ධව දන්නවාද නැද්ද, කින්ද මන්ද,

මොකක්ද කියන එක. ඒ නිසා මේ පිළිබඳවත් ජනාධිපතිවරයාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මොකද, වෙන කාටවත් කියලා වැඩක් නැහැ.

ඒ එක්කම අපි හොඳ දේවල්ට හොඳයි කියන්න කැමැතියි. ගරු අග්‍රාමාත්‍යතුමියට මම ස්තුතිවන්ත වෙනවා. එතුමිය පසුගිය ටිකේ විශාල මහන්සියක් ගත්තා. මම ඒක ඇස් දෙකෙන්ම දැක්කා. ඒ හැම රැස්වීමකටම අපිත් ගියා. එක රැස්වීමකට ගියාම, අගමැතිතුමිය chair කරන meeting එකට LECO එකෙන් කවුරුත් පැමිණ සිටියේ නැහැ. මෙන්න අඩුපාඩු. LECO එකෙන් කවුරුත් නැහැ. ලංකා විදුලිබල මණ්ඩලයෙන් ආපු නිලධාරියා දන්නේ නැහැ කොළොන්නාවට, කඩුවෙලට කවදාද electricity දෙන්නේ කියලා. අපි රාජ්‍ය නිලධාරීන්ට කියනවා, එහෙම අපහසුතාවට ලක් කරන්න එපා. එතුමිය මේ රටේ අගමැතිවරිය. අගමැති chair කරන meeting එකට DGM කෙනෙක් එන්න ඕනෑ, නැත්නම් Chairman එන්න ඕනෑ.

Chairman ඇවිල්ලා ඒකට උත්තර දෙන්න ඕනෑ. ඒ කළේ, අපහාසයක්; ඒ කළේ, අවමානයක්. රාජ්‍ය නිලධාරීන් එහෙම කළ යුතු නැහැ. අඩුම ගානේ දැන්වත් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවන්න. කැඳවලා, සිදුවෙලා තිබෙන හානි පූරණය ගැන හරි කථාව කියන්න. ඒ කථාව කියලා ඊළඟට ගන්නා වූ පියවර මොකක්ද කියන එක සාකච්ඡා කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and THE HON. SPEAKER took the Chair.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු සභාපතිතුමනි, අපි යෝජනා කරන්නේ, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව වහාම කැඳවන්න කියලායි. ඒකට තමයි නීත්‍යනුකූල බලය තිබෙන්නේ. එහෙම නැතුව කොළඹ ඉන්න ව්‍යාපාරිකයෝ දමපු කම්ටුවලට සල්ලි එකතු කරන්නත් බැහැ, ඒගොල්ලන්ට රට ගොඩ දමන්නත් බැහැ. මොකද, නායකයෝ කියන්නේ, තීරණ ගන්න කට්ටිය. Entrepreneursලා කියන්නේ, බිස්නස් කරන කට්ටිය. නායකයන්ට වගකීමක් තිබෙනවා, සමාජ ආර්ථික වෙළඳපොළ සමාජ සේවා සමඟ එකතු කරගෙන යන්න. ඒ නිසා "good bugger, good bugger" කියන කට්ටියම අන්තිමට කියාවි ඔන්න, "Gota part 2", ඔන්න, "Sirisena part 2", "mad bugger" කියලා. එහෙම කියලා දාලා යාවි. ඔය වාගේ දේවල් ඉතිහාසය පුරාම සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තීරණ ගන්න පුළුවන් පක්ෂ විපක්ෂ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරන්න. මේ කම්ටුව කැඳවලා, සැබෑ තොරතුරු දීලා ඊළඟට කරන්නේ මොකක්ද කියන එක පිළිබඳව සැලකිල්ලට ගන්න. හිරේ යන්න ඉන්න කට්ටිය එකට එකතු වෙනවා වාගේ නොවෙයි, රට වෙනුවෙන් විපක්ෂයයි, ආණ්ඩුවයි මොකක්ද කරන්නේ කියන එක සහ ජාත්‍යන්තරයට ඒක කොහොමද present කරන්නේ කියන එක සාකච්ඡා කරන්න අඩුම ගණනේ මෙය අවස්ථාවක් කර ගනිමු. ඒ පිළිබඳව සාකච්ඡා කරලා international donor conference එකක් ගෙනැල්ලා, ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරන්න කියලා යෝජනා කරනවා. අවසාන වශයෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි.

අඹතලේ ඉඳලා සේදවත්ත දක්වාම ඉන්නේ, කුඩා තේ අපනයනකරුවන්. ඔවුන් යට වෙලා. ඔවුන්ගේ කර්මාන්ත ශාලා යට වෙලා. ඔවුන්ගේ මැෂින් විනාශ වෙලා. ඒ බොහෝ දේවල් insure කරලා නැහැ. ඔවුන් එක්ක කොළොන්නාවේ විශාල ජනතාවක් ඒ ආයතනවල වැඩ කරනවා. අද ඔවුන්ට රැකියාව කරගන්න බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. මෙච්චර දවසක් නෑසූ කනින් නේ හිටියේ. මේවා පිළිබඳව දැන්වත් අවබෝධයක් ගන්න. අපි භූමියේ යථාර්ථයයි කියන්නේ. මොකද, මෙතැන ඉන්න හය හත්දෙනෙකු හැරුණාම ඉතිරි අය ඔක්කොම පළමුවෙනි වතාවට පාර්ලිමේන්තුවට ආපු අය. ඔවුන්ට බිම් මට්ටම සම්බන්ධයෙන් හරි හමන් අවබෝධයක් නැහැ. පරණ අය නම් මේ ගැන දන්නවා. ඉතින්, මේ ජනතාවට අඩුම ගානේ moratorium එකක්වත් ලබා දෙන්න කියලා අපි රජයට යෝජනා කරනවා. මේ ආයතනවලට SVAT එකේ VAT refund එක ඉක්මනින් ලබා දෙන්න. ඔවුන්ට දැන් capital එකක් අවශ්‍යයි, නැවත ඒවා ආරම්භ කරන්න. හැබැයි, ඔවුන්ගේ SVAT එක පොඩි පොඩි හේතු අල්ලා දිනපතා ප්‍රමාද කරලා වැඩක් නැහැ. ඔවුන්ට නැවත නැඟී සිටින්න ශක්තියක් ඕනෑ. ඒ වාගේම, වැඩ කරන ජනතාවට තමන්ගේ රැකියාව කරගෙන යන්න නම් ඒ ආයතන නැඟී සිටින්න ඕනෑ.

රුසියාවේ පැවැත්වෙන labeling system එක implement කරන්න ලබන අප්‍රේල් 01වැනි දා ඉඳලා තේ අපනයනකරුවන්ට කාලය දීලා තිබෙනවා. ඒ නිසා තානාපති මට්ටමෙන් සාකච්ඡා කරලා; ඒ රටවල් එක්ක සාකච්ඡා කරලා, ඒ අයට සහන කාලයක් ලබා දෙන්න. මොකද, ඒකට සූදානම් වෙන්න විශාල කාලයක් යනවා. ඒ පිළිබඳව කටයුතු කරලා මේ රට නැවත හරි පාරට ගෙනැල්ලා, ෆීනික්ස් කුරුල්ලා නැඟිට්ටා වාගේ අළු ගසා දමලා මේ රට ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න. උද්ධච්චකම අතහැරලා මේකෙන් හොඳ ජවයක් ගන්න. නොදන්නවා නම් නොදන්න බව පිළිගෙන, වැරදුණා නම් වැරදුණු බව පිළිගෙන, විශේෂඥයන් සහ අත්දැකීම් තිබෙන සියලුදෙනාම එකතු කරගෙන, ජාත්‍යන්තර ආධාර අරගෙන ශ්‍රී ලංකා මාතාව නැවත මේ ලෝකය තුළ බබළවන්න සියලුදෙනාම එකතු වෙලා කටයුතු කළ යුතුයි කියමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Jeevan Thondaman. You have seven minutes.

[பி.ப. 5.20]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ தவிசாளர் அவர்களே, முதலாவதாக நான் சபைக்கு தாமதமாக வந்தமைக்காக மன்னிப்பு கேட்டுக் கொள்கின்றேன். நாங்கள் டிசம்பர் 02ஆம் திகதியிருந்து மக்களுக்கு நிவாரணம் கொடுக்கும் பணியில் ஈடுபட்டுக் கொண்டு இருக்கின்றோம். நேற்றைய தினம் இரவு கொத்மலைக்குப் போயிருந்தேன். கொத்மலை, நான் வளர்ந்த ஊர்; சின்ன வயதில் ஓடிவிளையாடிய ஊர் இன்று மண்ணுக்குள்ளே புதைந்துபோய் இருக்கின்றது. இந்த நிலையில் அங்கிருக்கின்ற மக்களைப் பார்க்கின்றபொழுது, எனக்கு மிகவும் வேதனையாக இருந்தது. நேற்றைய தினம்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා ]

இரவு 2.00 மணியளவில்தான் நான் அங்கிருந்து புறப்பட்டேன். அதனால்தான், சபைக்கு வருவதற்குத் தாமதமானது.

கொத்மலையைப் பொறுத்தவரைக்கும், நான் அரசாங்கத்திடம் ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன் அங்கு இருக்கின்ற AGA சரியான முறையில் மக்களைக் கவனிப்பது கிடையாது. அங்கு இருக்கின்ற கருகஸ்தலாவ හාමුදුරුවෝ உண்மையில் மனிதநேயத்துக்கு ஓர் அடையாளமாவார். அங்குள்ள அனைத்து மக்களுக்கும் சாப்பாடு முதல் அனைத்து உதவிகளையும் செய்து கொண்டிருக்கின்றார். நான் இந்தச் சபையினூடாக அவருக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரத்தில், நுவரெலியா காமினி வித்தியாலயத்தில் தங்கவைக்கப் பட்டிருக்கின்ற 200 குடும்பங்கள் இன்னும் classroom tableஇல்தான் படுத்துறங்குகின்றார்கள். அவர்களுக்கு சாப்பாடு வசதியோ, தங்குவதற்குரிய வசதியோ சரியான முறையில் கிடையாது; மின்சாரம் கிடையாது. இதை கொஞ்சம் அரசாங்கம் கவனத்தில் எடுக்க வேண்டும். எனக்குப் புரிகின்றது, அரசாங்கத்துக்குப் பல்வேறு கஷ்டங்கள் இருக்கும் என்று. தயவுசெய்து இது சம்பந்தமாக நடவடிக்கை எடுக்க வேண்டுமென்று வேண்டுகோள் விடுக்கின்றேன்.

அதுமட்டுமல்லாமல் கடந்த சில நாட்களாக அக்கரபத்தனை, டயகம அதேபோன்று நுவரெலியா பிரதேச சபைக்குட்பட்ட கந்தப்பொல போன்ற பகுதிகளுக்கும் நாங்கள் விஜயம் செய்திருந்தோம். அவர்களுக்கு எங்களால் முடியுமான அளவு நிவாரணங்களை வழங்கியிருந்தோம். ஆனால், அங்கிருக்கின்ற விவசாயிகள் பெரும் கஷ்டத்தில் இருக்கின்றார்கள். விவசாயத் திணைக்களத்தினர் போய் அவர்களைச் சந்தித்திருக்கிறார்கள். அவர்களுக்குத் தேவையான உதவிகளைச் செய்வார்கள் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். அதுமட்டுமன்றி, இன்னும் பல்வேறு இடங்களுக்குச் சென்று பார்வையிடவேண்டி இருக்கின்றது. இந்தச் சபையில், இலங்கை - இந்திய சமுதாய பேரவைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேபோன்று, பல்வேறு நல்லுள்ளங்களுக்கும் நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். நான் எதிர்க்கட்சியைச் சார்ந்தவன்தான். ஆனால், என்னைப் பொறுத்தவரைக்கும் நான் ஓர் இலங்கையன். அதற்கு அப்புறம்தான் ஆளுங்கட்சி, எதிர்க்கட்சி, அமைச்சர் எல்லாமே! அப்படியிருக்கும்போது, 47 இலட்சம் ரூபாய் collect பண்ணியிருந்தோம். அதற்குரிய கணக்கு வழக்குகளை பாராளுமன்றத்தில் கூடிய சீக்கிரம் சமர்ப்பிப்பேன். 47 இலட்சம் ரூபாய் மூலம் கிட்டத்தட்ட 1,000 நிவாரணப் பொதிகளை மக்களுக்கு வழங்க முடிந்தது.

***[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

நான் இந்த நேரத்தில் ஒரேயொரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். நேரம் போதாமையால், பெருந்தோட்டத் தொழிலாளர்களின் சம்பள விடயம் தொடர்பாக நான் கருத்துத் தெரிவிக்க விரும்பவில்லை. ஆனாலும், சம்பளப் பிரச்சினையைப் பொறுத்தவரைக்கும் ஏன் முதலில் அதற்கு எதிர்ப்புத் தெரிவித்தேன் என்பது தொடர்பாக உங்களுக்கும் தெரியும். இன்றைக்கு இலாபமீட்டுகின்ற பெருந்தோட்ட நிறுவனங்களுக்கு அரசாங்க வரிப் பணத்தின் மூலமாக 200 ரூபாய் படி 5 பில்லியன் ரூபாய் கொடுத்து, ஏன் அவர்களை ஊக்குவிக்க வேண்டும் என்பது எனது கேள்வி. அதைத்தவிர, நாங்கள் சம்பள அதிகரிப்புக்கு எதிரானவர்களல்லர்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்தப் புயலை உருவாக்கவில்லை. அதேபோன்று, இந்த மழையையும் வெள்ளத்தையும் அரசாங்கம் உருவாக்கவில்லை. உண்மையில் அரசாங்கம் மிகவும் கஷ்ட நிலையில் இருக்கின்றது. அப்படி இருக்கும்போது, இதை வைத்து அரசியல் செய்ய வேண்டும் என்பது என்னுடைய எண்ணம் கிடையாது. எங்களால் முடிந்தளவு ஒத்துழைத்திருக்கிறோம். இன்னும் தொடர்ச்சியாக ஒத்துழைப்போம். ஆனால், நீங்கள் முன்வைத்திருக்கின்ற வரவு செலவுத்திட்டம் எந்தளவு சாத்தியம் என்று எனக்குத் தெரியவில்லை. நேற்று இரவு நான் கொத்தமலைப் பிரதேசத்தில் ஏற்பட்ட சேதாரத்தை மாத்திரம் பார்க்கும்போது, உண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் அரசாங்கத்துக்கும் பாரிய சாவால் ஒன்று இருக்கிறது என்று புரிந்துகொண்டேன். நாங்கள் என்னதான் உதவி செய்தாலும், அதிகமான மக்கள் வீடுகளைத்தான் கேட்கிறார்கள். எவ்வாறான சேதாரம் ஏற்பட்டாலும், மலையகத்தைப் பொறுத்தவரை அங்குள்ள மக்கள் கேட்பது வீட்டுத்திட்டம் மட்டும்தான். இப்போது உங்களுக்கு ஒரு சந்தர்ப்பம் - வாய்ப்பு - கிடைத்திருக்கின்றது. நான் மலையக மக்களின் பிரதிநிதியாக எதிர்க்கட்சியில் இருந்து சொல்கிறேன், அனைவருக்கும் வீடு கட்ட முடியாது; அது சாத்தியமில்லை.

தற்போது ஒரு வீட்டின் மதிப்பீடு 2,000,000 - 3,000,000 ரூபாயாகும். இந்த சேதாரத்துக்கு மத்தியில் ஒன்றரை இலட்சம் மக்களுக்கு வீடு கட்டுவது சாத்தியமாகாது. ஆனால், அவர்களுக்குக் காணியை வழங்க முடியும். காணி உரிமை வழங்குவதற்குத் தடையாக இருப்பது பெருந்தோட்ட நிறுவனங்கள் மட்டுமே ஒழிய, நீங்களோ, நாங்களோ அல்லர். இங்கே மலையகப் பிரதிநிதிகள் இருக்கிறார்கள். மூத்த அரசியல்வாதி கௌரவ மனோ கணேசன் அவர்களும் இங்கே இருக்கிறார். அவரும் காணி உரிமை வழங்கும் திட்டத்துக்கு முழுமையான ஆதரவு வழங்குவார். காணி உரிமை வழங்குவதற்கு இந்த ஒரு சந்தர்ப்பம்தான் உங்களுக்கு இருக்கின்றது. நாம் ஒரு விடயத்தை ஏற்றுக்கொள்ள வேண்டும். நுவரெலியா மாவட்டத்தில் 2,691 குடும்பங்கள்தான் பாதிக்கப்பட்டிருக்கின்றன என்று பத்திரிகையில் சொல்லப்பட்டிருக்கின்றது. ஆனால், அதையும் தாண்டி மக்கள் பாதிக்கப்பட்டிருப்பது உண்மை. காலம் போகப் போகத்தான் எங்களுக்குப் புரியும். நாங்கள் அதற்கான கால அவகாசத்தை அரசாங்கத்துக்கு வழங்கித்தான் ஆக வேண்டும். மலையகத்தில் நான் சென்ற அனைத்து இடங்களிலும் ஒரேயொரு விடயத்தைத்தான் சொன்னேன். அதாவது, இந்த நேரத்தில் நாங்கள் பொறுமையையும் மனிதாபிமானத்தையும் கடைப்பிடிக்க வேண்டும் என்றுதான் அந்த மக்களிடம் சொன்னேன். புத்தளம், கம்பஹா ஆகிய மாவட்டங்கள் அதிகமாகப் பாதிக்கப்பட்டு இருக்கின்றன. மலையகமும் பாதிக்கப்பட்டு இருக்கின்றது. நாங்கள் பொறுமையாக இருப்போம் என்றுதான் அவர்களிடம் சொன்னேன். காரணம், நாங்கள் கட்டாயம் உங்களுக்கு ஆதாரவை வழங்கியே ஆக வேண்டும் என்பதற்காக.

நான் நிறையப் பேச விரும்பவில்லை. இறுதியாக நான் ஒரேயொரு விடயத்தைச் சொல்ல விரும்புகிறேன். இந்தத் தருணத்தில் அரசியலுக்கு அப்பால் நின்று செயற்பட வேண்டும். ஒவ்வொருவருடைய அரசியல் கொள்கைகளும் வேறு வேறாக இருக்கலாம்; பிரச்சினைகள் வேறு வேறாக இருக்கலாம். உலகமாக இருக்கட்டும் அல்லது இங்கிருக்கின்ற

நாட்டு மக்களாக இருக்கட்டும்! சிங்கள, தமிழ், முஸ்லிம் யாராக இருந்தாலும், இந்தப் புயல், மழை வெள்ளத்துக்கு இனம், மதம், மொழி எதுவுமே தெரியாது. அப்படியிருக்கும்போது, ஓர் இலங்கையன் என்ற வகையில், சனாதிபதிக்கும் இந்த அரசாங்கத்துக்கும் இந்த வாக்கெடுப்புக்கு ஆதரவு தெரிவித்து கட்டாயம் அந்த மக்களுக்கு ஒரு வழியைக் காண்பித்தாக வேண்டும். இது என்னுடைய அபிப்பிராயம். இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் பொதுச் செயலாளராகச் சொல்கிறேன், இந்த அரசாங்கத்துக்கும் சனாதிபதிக்கும் என்னுடைய ஆதரவை நான் முழுமையாக வழங்குவேன். நான் ஏற்கனவே சொன்ன மாதிரி இந்த வரவு செலவுத்திட்டம் சாத்தியமாகுமா, இல்லையா என்று எனக்குத் தெரியாது. ஆனால், உங்கள் எல்லோருக்கும் ஒரு பாரிய பொறுப்பு இருக்கிறது. அதற்கு நாங்கள் முழுமையான ஆதரவை வழங்குகிறோம்.

Sir, I would just like to mention one last matter. First of all, at this point in time, I would like to say that it is not the President who caused the cyclone or the floods. Right now, the Government has a very big challenge ahead of them. Last night, I visited Kotmale, a place where I grew up as a child, and it is a very depressing sight today. People I had known had passed away and it is extremely disheartening. So, I cannot imagine what everybody else had to go through. At this point in time, I really hope that Parliament supports this Budget not because it is financially feasible or it makes sense economically, but because we need to assure that, as a country, we stand together. So, we are standing with the Government right now, giving our support. All I can ask you is, just get us out of this mess.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 5.28]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි අද අය වැය විවාදය යටතේ මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂයත්, ඒ වාගේම පරිපූරක කිහිපයක් පිළිබඳවත්, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය පැනවීම පිළිබඳව යෝජනා සම්මතයත් ආදී අයිතම කිහිපයක් මෙම පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත්, ඒ විෂයයන් පිළිබඳව අවධානය යොමු කරනවාට වඩා අද වැඩිපුර අවධානයට යොමු වී තිබෙන්නේ මේ ගංවතුර ව්‍යසනය පිළිබඳවයි. එය තමයි සමාජයේ වැඩිම අවධානය සහ කථා බහට වාගේම අපේ අවධානයට ලක් විය යුතු ක්ෂේත්‍රය බවටත් පත් වෙලා තිබෙන්නේ.

අපි දන්නවා, අපේ රට මීට පෙරත් බොහෝ අවස්ථාවල මෙවැනි ව්‍යසනවලට මුහුණ දීලා තිබෙන බව. සමහර විට වෙරළ තීරය ආසන්නව මෙවැනි ව්‍යසන ඇති වුණාම කඳුකරයේ ජීවත් වන ජනතාව සහ අනික් ප්‍රදේශවල ජීවත් වන ජනතාව ඒ පිළිබඳව කම්පනයට පත් වනවා. සමහර වෙලාවට මධ්‍යම කඳුකරයේ මේ ව්‍යසනය සිදු වුණාම, අනික් පළාත්වල ජනතාව කම්පනයට පත් වනවා. හැබැයි මේ වෙලාවේ සිදුවී තිබෙන දේ තමයි, දිස්ත්‍රික්ක කිහිපයක් හැරුණුකොට අනික් සියලු දිස්ත්‍රික්කවල විශාල කොටස් ප්‍රමාණයක් මෙම ව්‍යසනයට ගොදුරු වීම. ඒ නිසා පුරවැසියන් තමන්ගේ කම්පනය තමන් තුළ සඟවා ගෙන මේ කාර්යයට මැදිහත් වෙමින් සිටිනවා. අපි දන්නවා, මේ වෙලාවේදීත් අප අතර ජීවත් විය යුතු පිරිසක් මේ ව්‍යසනය නිසා අද අපට අහිමි වී තිබෙන බව. මේ වෙලාවේත් අප අතර හුස්ම ගත යුතු, මේ වෙලාවේත් තමන්ගේ ඥාතීන්, තමන්ගේ දරුවන් සමඟ සමීපව, ළෙන්ගතුව ජීවත් විය යුතු පිරිසක් අද අපට අහිමිව තිබෙනවා. ඒ වාගේම සමහර දිස්ත්‍රික්කවල ගම්මාන පිටින් මේ ව්‍යසනයේ ගොදුරු බවට පත් වී තිබෙනවා. සමහර ප්‍රදේශවල පවුල් පිටින් මෙම ව්‍යසනයේ ගොදුරු බවට පත් වී තිබෙනවා. ඒ නිසා මේ ව්‍යසනය අපේ රටේ මෑතකාලීනව අපි දකින විශාලතම ව්‍යසනයයි. මේ අවස්ථාවේ රටේ ජනතාවගේ හදවත් කම්පනයෙන් පිරිලා තිබෙනවා. ඔවුන්ගේ හැඟුම් කඳුළුවලින් ප්‍රකාශයට පත් කර ගන්න බැරි තරමට වේදනාබරිත වෙලා තිබෙනවා. මෙම ව්‍යසනයෙන් බොහෝදෙනෙක් මිය ගොස් තිබෙනවා; සමහර සිරුරු හම්බ වෙලා තිබෙනවා. මියගොස් තිබෙන සමහර පිරිසකගේ සිරුරුවත් සොයා ගන්න බැරි තරමේ අතුරුදහන්වීමකට භාජන වී තිබෙනවා.

මිනිසුන් අහිමිවීම, මිනිසුන් අතුරුදහන්වීම පිළිබඳව අපේ සමාජයට විශාල කම්පනයක් සහිත ඉතිහාසයක් තිබෙනවා. යුද්ධවලින්, ස්වාභාවික ව්‍යසනවලින් මිනිසුන් අහිමි වූ, අතුරුදහන් වූ කම්පන සහිත ඉතිහාසයක් අපේ රට තුළ ලියවිලා තිබෙනවා. අපි දන්නවා, කෙනෙකුගේ අහිමිවීම තමන්ගේ ඥාතීන්ට, තමන්ගේ මිතුරන්ට, ඒ සමාජයට කොච්චර කම්පනයක් ගෙනැත් දෙනවාද කියලා. අපි එය අත්දැකපු මිනිස්සු. කෙනෙකුගේ අතුරුදහන්වීම මොන තරම් කම්පනයක් ගෙනැත් දෙනවාද මිනිසෙකුට? සාමාන්‍යයෙන් කෙනෙක් අතුරුදහන් වුවාට පසු තමන්ගේ දෙමව්පියන්, ඥාතීන් කිසිසේත්ම ඔහු මිය ගියා කියන එක පිළිගන්න සූදානම් නැහැ. අවුරුදු ගණනාවකින් නැවත ඒවි, නැවත ඒවි කියන බලාපොරොත්තුවෙන් ජීවත් වනවා. ඒක තමයි අතුරුදහන්වූවෙකු සම්බන්ධයෙන් වූ වේදනාව.

අතුරුදහන් වෙලා තිබෙන්නේ දරුවකු නම්, ඒ දෙමව්පියන් කල්පනා කරනවා, දරුවා ජීවිතය බේරාගෙන කොහේ හරි තැනක ඉඳලා නැවත තමන්ගේ දෑස් ඉදිරිපිටට ඒවි කියලා. දෙමව්පියන් නම් අතුරුදහන් වෙලා තිබෙන්නේ, දරුවෝ කල්පනා කරනවා, කුමන හෝ හාස්කමකින් තමන්ගේ දෙමව්පියන් තමන් ඉදිරිපිටට ගෙනැල්ලා දේවි කියලා. අතුරුදහන් වුවන්ගේ කම්පනයෙන් පුරවැසියන් දශක ගණනාවක්, වසර ගණනාවක් තිස්සේ ජීවත් වනවා. පෞද්ගලිකවම මටත් එවැනි අත්දැකීමක් තිබෙනවා. කෙනෙකුගේ අතුරුදහන් වීමක් පවුලකට, ඥාතීන්ට, මිතුරන්ට මොන තරම් කම්පනයක් ඇති කරනවාද? මේ මොහොතේදීත් තමන්ගේ ඥාතීන්, මිතුරන් අහිමි වීමේ වේදනාව සහිතව කම්පනයෙන් ජීවත් වන පිරිසක් ඉන්නවා. තමන්ගේ දරුවන්, ඥාතීන් අතුරුදහන් වීමේ වේදනාව හිතේ තබාගෙන, දෑස් දල්වාගෙන පස් කුහර හාරමින් ජීවත් වන පිරිසක් ඉන්නවා. රටක් හැටියට, සමාජයක් හැටියට අපි පළමුකොටම ඒ සියලුදෙනාට අපේ සංවේගය ප්‍රකාශයට පත් කළ යුතුයි. මා ඔවුන්ට ආණ්ඩුවක් හැටියට අපේ සංවේගය ප්‍රකාශ කර සිටිනවා. මා මීට පෙරත් මේක කිව්වා. මිය ගිය කිසිවෙකුගේ ජීවිත අපට ආපසු දෙන්න බැහැ. ඒක තමයි ඛේදනීය යථාර්ථය. අපට ඒ ජීවිත නැවත ලබා දෙන්න බැහැ. හැබැයි ආණ්ඩුවක් හැටියට, පුරවැසියන් හැටියට අපට

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

තිබෙන වගකීම මොකක්ද? ජීවිත ලබා දීමට නොහැකි වීම වේදනාකාරී යථාර්ථය වුණත්, අපේ අපේක්ෂාව බවට පත් විය යුත්තේ ජීවත් වන අයට මේ තිබෙන රටට වඩා වඩාත් සුදුසු, ගුණාංගවලින් පිරි රාජ්‍යයක් නිර්මාණය කිරීමයි. අපේ ආණ්ඩුව උපරිම ලෙස කැප වී තිබෙනවා, අපේ රටේ ජනතාවට මෙවැනි ඉරණමක් යළි අත්වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමටත්, මීට වඩා හොඳ රාජ්‍යයක් නිර්මාණය කිරීමටත්. අපි ඒ සඳහා උපරිමයෙන් වෙහෙස මහන්සි වී කටයුතු කරන්න ලැහැස්තියි. එය, අප වෙත පවරා ගත් වගකීමක් සහ අත්හැරිය නොහැකි හෘදයංගම බැඳීමක් කියා මම කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, ඕනෑම ව්‍යසනයකදී දේපළ, මිනිස් ජීවිත උදුරාගන්න පුළුවන්. හැබැයි, මෙහිදී අපට එක දෙයක් පසක් කර තිබෙනවා. ලංකාවේ ජනතාව තුළ තිබෙන මනුෂ්‍යත්වය කිසිදු ව්‍යසනයකදී උදුරාගන්න බැරි ප්‍රබලම ගුණාංගයක් බව මෙම ව්‍යසනයේදීත් අපට ඔප්පුකොට තිබෙනවා. ඒ කොහොමද? මේ මොහොතේදීත් මාතර අය බදුල්ලට ගිහිල්ලා ඉන්නවා. ගාල්ලේ අය මහනුවරට ගිහිල්ලා ඉන්නවා. කළුතර අය නුවරඑළියට ගිහිල්ලා ඉන්නවා. හම්බන්තොට අය පුත්තලමට ගිහිල්ලා ඉන්නවා. කවදාවත් තමන් ඇවිදපු නැති පාරක්, තමන් අනාගතයේදී කවදාවත් ඇවිදින්න අපේක්ෂා නොකරපු පාරක් ඔවුන් සුද්ධ කරමින් ඉන්නවා. තමන්ට කවදාවත් නැවතුම් මධ්‍යස්ථානයක් ලෙස උපයෝගී කර ගැනීමට ඉඩක් නොලැබෙන බස් නැවතුම්පොළක් සුද්ධ කරමින් ඉන්නවා. තමන්ගේ ඥාතියෙකු නොවන, තමන්ගේ මිතුරෙකු නොවන, පළමු වතාවට මුණ ගැසුණු පුරවැසියෙකුගේ ගෙදර පිරිසිදු කරමින් ඉන්නවා. ඔවුන්ගේ පානීය ජල අවශ්‍යතාව සපුරන ළිං පිරිසිදු කරමින් ඉන්නවා. ගෙවල් පිරිසිදු කරමින් ඉන්නවා. අවතැන් කඳවුරේ ඉන්න පුරවැසියන් එක්ක උරෙනුර ගැටී කටයුතු කරන ගමන් එම ජනතාවගේ දුක බෙදා ගනිමින් ඉන්නවා. මම හිතන විධියට ඒක තමයි කුමන ව්‍යසනයකදීවත් උදුරාගන්න බැරි අපේ රටේ මිනිසුන් තුළ තිබෙන මනුෂ්‍යත්වය. ඒක, මේ ව්‍යසනයේදීත් අපට ඔප්පු වෙමින් තිබෙනවා. ඉතා කුඩා දරුවන් රුපියල, දෙක වශයෙන් එක්රැස් කරගත් තමන්ගේ කැටය සහන සේවා සඳහා දෝතින් පිරිනමනවා. එක තාත්තා කෙනෙක් කියනවා, මට තිබෙන එකම සම්පත තමයි මගේ වත්තේ තිබෙන කෙසෙල් කැන, මම ඒක ගෙනැල්ලා දෙනවා කියලා.

ඒ වාගේම විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් මේ මොහොතේදීත් අපේ මාතෘ භූමියට සහ අපේ රටේ ජනතාවට ඇති වී තිබෙන මේ ඛේදවාචකය වෙනුවෙන් දිවා රෑ නොබලා වෙහෙසමින් කටයුතු කරනවා. ලේ ප්‍රමාණයක් -ඒකක 1,500ක් වාගේ- අඩුයි කියලා ලේ බැංකුව දැනුම් දුන්නාට පසුව ඒකක 20,000ක් ලබා දීලා තිබෙනවා.

ඒක තමයි, කුමන ව්‍යසනයකදීවත් මකා දමන්න බැරි අපේ රටේ මනුෂ්‍යත්වය. මම දැක්කා, සමහර මන්ත්‍රීවරුන් ඒ මනුෂ්‍යත්වයට උසුළු විසුළු කරනවා; මේ ජනතාව ගිහිල්ලා මොකක්ද කරන්නේ කියලා අහනවා. ඒ, මොකක්ද දන්නවාද? ලෝක ඉතිහාසය තුළ බිඳ වැටුණු සෑම රාජ්‍යයක්ම ගොඩනැඟීමේදී ප්‍රධානතම කාර්යය බවට පත් වුණේ එම ජනතාවගේ අභිලාෂය සහ ධෛර්යයයි. දෙවන ලෝක යුද්ධයේදී ජනතාව විශාල ප්‍රමාණයකට ජීවිත අහිමි වුණා. නමුත්, මිනිසුන්ගේ තිබුණු අප්‍රතිහත ධෛර්යය, කැප කිරීම සහ පරිත්‍යාගයන් තමයි ලෝකයට නැවත සාමය කැටුව ආවේ. දියුණුවේ හිණිපෙත්තට ගමන් කළා යැයි අපි අද කියන බොහෝ රාජ්‍යයන්වල ආර්ථික මාවත, උපාය මාර්ග ඒ සඳහා වැදගත් වුණා වාගේම එම ජනතාව තුළ තිබුණු ධෛර්යවන්ත මැදිහත්වීම තමයි එහි ප්‍රධානම සාධකය බවට පත් වුණේ. එහෙම තමයි ජපානය නැඟිට්ටේ; එහෙම තමයි චීනය නැඟිට්ටේ. හැබැයි, අපේ ජනතාවගේ ධෛර්යවන්තභාවය පිළිබඳව අවබෝධයක්වත් නැති මන්ත්‍රීවරුන්, "මේ අය පාරවල්වල බැහැලා මොකක්ද කරන්නේ?" කියමින් අද උදේත් උසුළු විසුළු කළ ආකාරය මම දැක්කා. නමුත්, ඒ මිනිස්සුන්ගේ ඒ ධෛර්යය, ඒ විශ්වාසය තමයි අපට මේ රට ගොඩනැඟිය හැකියි කියන ආලෝකය සහ මඟ පෙන්වීම කරන්නේ කියන කාරණය හොඳින් තේරුම් ගන්න කියා මා කියන්න කැමැතියි. ඒක තමයි, අපේ විශ්වාසය.

ගරු සභාපතිතුමනි, මේ ව්‍යසනය ඇති වුණු වෙලාවේදී අපේ ජනතාව එයින් මුදා ගැනීම සඳහා අපේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය විශාල වෙහෙසක් දැරුවා. මම දන්නවා, කලා වැවේ පාලම මත හිර වුණු බස් රථයේ සිටි 70කට ආසන්න ප්‍රමාණයක් කොයි මොහොතේ ඔවුන්ගේ ජීවිත නැති වේවිද කියන කම්පනය සහිතවයි හිටියේ කියන එක. සමහර මන්ත්‍රීවරුන් නිවෙස්වල ඉඳිමින් පැයෙන් පැයට ෆේස්බුක් සටහන් ලිව්වා, "දැන් පැය 2යි, දැන් පැය 3යි" කියලා. හැබැයි, ඒ අය එසේ ෆේස්බුක් සටහන් ලියන වෙලාවේදීත් අපේ නාවික හමුදාවේ නිලධාරින් එම ජනතාව මුදා ගැනීමේ විරෝදාර ක්‍රියාදාමයක නිරත වෙලා හිටියේ. ඒ අය පුත්තලම දිසාවෙන් ඇතුළු වුණා. ඔවුන්ට ඒ මහ සැඩ පහරින් පනින්න බැරිව ගියා. ඊට පසුව නොච්චියාගම දිසාවෙන් ඇතුළු වුණා. ඔවුන්ට ඒ සැඩ පහර පනින්නත් බැරිව ගියා. එවන් වූ ඉතාම අසීරු, වෙහෙසකර තත්ත්වයක් යටතේ තමයි නාවික හමුදාවේ නිලධාරි කණ්ඩායමක් එම සැඩ පහර පරාජයට පත් කරලා, එය පියමං කරලා වීරෝදාර ක්‍රියාවක් සිදු කළේ. එහි ප්‍රතිඵලය හැටියට එම බස් රථයේ සිටි පිරිස වහලයක් මතට ගෙනියන්න ඔවුන් සමත් වුණා. වහලයට ගෙනැවිත් ඉතා කෙටි වෙලාවකදී ඒ බස් එක ගහගෙන ගියා. ඊට පසුව සිද්ධ වුණේ මොකක්ද? ඒ නාවික හමුදා නිලධාරින් ගමන් කරපු බෝට්ටුව ද ක්‍රියා විරහිතභාවයට පත් වුණා. අවසානයේදී මොකක්ද සිද්ධ වුණේ? ඒ බෝට්ටුවේ ගියපු නාවික හමුදාවේ නිලධාරීන්ටත් තමන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා එම වහල මතම ඉන්න සිද්ධ වුණා. පැය 18කට අධික කාලයක් 70කට ආසන්න පිරිසක් ඇස්බැස්ටෝස් වහලක් මත හිටියේ. මහ සැඩ පහරක් තුළ ඔවුන්ට ජීවත් වෙන්න ධෛර්යය දුන්නේ නාවික හමුදාවේ එම නිලධාරින් 3දෙනා. ඔවුන් තමයි "මේක කරනවා"ය කියන විශ්වාසය හැදුවේ. අවසානයේදී ගුවන් හමුදාවේ යානා වර්ග 2ක් ආවා. පළමු යානය ටිකක් ලොකු එකක්. ඒක කිට්ටු කරන්න බැරි වුණා. මොකද, එහෙම වුණොත් වහල කඩාගෙන යනවා. දෙවැනි යානයත් ආවා. ඒකත් වහල ළඟට කිට්ටු කරන්න බැහැ, වහල ගලවා ගෙන යනවා. ඊට පසුව එක ගුවන් යානායක් වයිනා බේවලට ගියා, නාවික හමුදාවේ විශේෂ පුහුණුව ලත් නිලධාරින් සහ ඊට අවශ්‍ය වන බෝට්ටු ගෙනෙන්න. හැබැයි, වයිනා බේවලින් එම ගුවන් යානය ගුවන්ගත කරන්න බැරි වුණා, අනුරාධපුරයේ ගොඩබාන්න තරම් කාලගුණ තත්ත්වය සුදුසු නැති නිසා. නැවත ඒ නිලධාරින් ට්‍රක් රථයක නැඟලා ත්‍රිකුණාමලයේ ඉඳලා නොච්චියාගමට ගිහින් තිබුණා. පාන්දර 3.30යි, එම නාවික හමුදා නිලධාරින් නොච්චියාගමට එනකොට. එතකොටත් ඇතැම් මහත්වරුන් ෆේස්බුක් එකේ සටහන් ලියනවා, "දැන් පැය 17යි." කියලා. මතක තබා ගන්න, ඒක ඉතාම දුෂ්කර ව්‍යායාමයක් බව. පළමුවර ඒ ජනතාව බේරා ගන්න ගියා. නමුත් සැඩ පහරට හසු වෙලා ආපසු ආවා.

ඒ ගමේ හිටපු තරුණයින් දෙදෙනෙක් ඒ පාර වෙනුවට වෙනත් පාරක් පෙන්වා දුන්නා. මම ඒ තරුණයින් දෙදෙනාට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒ පාරෙන් ගිහිල්ලා ඒ 70දෙනාම නිරුපද්‍රිතව මුදා ගන්න සමත් වුණා; එක්කෙනෙක් රෝහල්ගත කළාට පසුව මිය ගියා. එවැනි කාර්යක්ෂම ත්‍රිවිධ හමුදාවක් සහ පොලීසියක් අපට ඉන්නවා. විතිකුලිය ෆාම් එකේ හිරවෙලා හිටපු කණ්ඩායම මුදා ගන්න බෝට්ටු දෙකක් ගියා;

දෙකම ක්‍රියා විරහිතභාවයට පත් වුණා. අපේ ආනන්ද විජේපාල ඇමතිතුමා ඒ ගැන දන්නවා. නමුත්, අපි ඒ හිරවෙලා හිටපු කණ්ඩායම මුදා ගැනීම වෙනුවෙන් උත්සාහ කළා. අවසානයේදී පහුව දා උදේ තමයි ඒ අය මුදා ගන්න පුළුවන් වුණේ. නොච්චියාගම ප්‍රදේශයේ ස්ථාන දෙකක ජනතාව අවතැන් වෙලා හිටියා. අනුරාධපුර නගරයේ ගස් උඩත් ජනතාව හිටියා. සමහර තැන්වල පුරවැසියන් පොල් ගස්වලට නැඟලා ජීවිතය බේරා ගැනීම සඳහා උත්සාහ කරමින් හිටියා. කලා ඔය පහළ එහෙම, ජනතාව පොල් ගස්වල හිටියේ. හැබැයි, අපේ ගුවන් හමුදාව ඉතාම වික්‍රමාන්විත සහ වීරෝදාර ලෙස ක්‍රියා කරලා ඒ අය මුදා ගන්න සමත් වුණා. ඊට පස්සේ අපට වාර්තා වුණා, මාවිල් ආරු බැම්ම කඩාගෙන යාමේ අනතුරක් තිබෙනවාය කියලා. මට රාත්‍රී 12.00ට කථා කළා, සේරුවිල අපේ හාමුදුරුවන් වහන්සේ. බැම්ම කඩාගෙන යනවාය කිව්වා, පාන්දර 3.00ට විතර. ඒ වනවිටත් අපේ දේශපාලන අධිකාරිය ඒ සඳහා මැදිහත් වෙමින් තිබුණා. සේරුවිල පන්සල පිහිටා තිබෙන්නේ ඒ ප්‍රදේශයේ උස් බිම් කණ්ඩියක. හමුදාව, පොලීසිය, ප්‍රගතිශීලී පුරවැසියන් මැදිහත් වෙලා, ගෙදර නිදාගෙන හිටපු අය ඇහැරව ඇහැරවා දහස් ගණනක් එතැනට අරගෙන ගියා. එහෙම කටයුතු කළේ කවුද? අපේ රටේ ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය. ඒ මෙහෙයුමේදී, ඒ වික්‍රමාන්විත ක්‍රියාදාමයේදී ඉතාම නිර්භීත ගුවන් හමුදා නිලධාරියෙකු වූ නිර්මාල් සියඹලාපිටිය මහත්මයා ජීවිතක්ෂයට පත් වුණා. එතුමා මිය යන මොහොතේදීත් අනෙකාගේ ජීවිතය ගැන කල්පනා කරමින් මිය ගිය අයෙක්. ඒ නිසා මේ ඉතිහාසය ඒ මිනිසුන්ගේ කථාවලින් ලියවෙන බව හොඳට මතක තබා ගන්න ඕනෑ, මේ වහසි බස් දොඩවන මිනිසුන්ට වඩා.

ඒ වාගේම චුන්ඩිකුලම් ප්‍රදේශයේ මෝය කට කපන්න නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනෙක් ගියා. ඒක ඉතාම වෙහෙසකර ක්‍රියාදාමයක් සහ ඉතාම බිහිසුණු ක්‍රියාවක්. ඒ පළාතේ තමන්ගේ ඥාතියෙක් නැහැ; තමන්ගේ මිතුරෙක් නැහැ. ඒ වුණත් නාවික හමුදාවේ නිලධාරින් පස්දෙනෙක් ඒ සඳහා ගියා. පස්දෙනාම සැඩ පහරට හසු වෙලා අතුරුදහන් වුණා. අපේ උතුරේ දේශපාලනඥයින් මේක තේරුම් ගත යුතුයි. අපි විශාල වෙහෙසක් දැරුවා, ඒ අය හොයා ගන්න. නමුත්, තවමත් ඒ අය හොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම ධර්මදාස කියලා පොලීසියේ මහත්මයෙක් තමන්ගේ රාජකාරිය නිමා කරලා ගෙදර යනකොට මිය ගියා, මේ ව්‍යසනය හේතුකොටගෙන. ඔවුන් මොකක් වෙනුවෙන්ද රාජකාරිය කළේ? මේ රටේ පුරවැසියන් බලා ගැනීම වෙනුවෙන් දිවා රෑ නොබලා රාජකාරිය ඉටු කරන්න ඔවුන් සමත් වුණා.

ඒ වාගේම තමයි, සීගිරියේ අනුරුද්ධ කුමාර කියන විදුලි සේවක මහත්මයා. මේ ආර්ථිකයත්, ජන ජීවිතයත් ඉක්මනින් යථාවත් කරන්න නම් විදුලිය ලබා දීම ඉතාම අත්‍යවශ්‍ය කාරණයක්. ඒ විදුලිය ලබා දීම කියන අත්‍යවශ්‍ය කාරණයේදී සීගිරිය ප්‍රදේශයේ පදිංචි සිටි, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ අනුරුද්ධ කුමාර කියන මහත්මයාට දිවි දෙන්න සිද්ධ වුණා. ඒ ආදී වශයෙන් මේ ව්‍යසනයේදී අපේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ රාජ්‍ය සේවය විශාල කාර්යයක් ඉටු කළා. විශේෂයෙන්ම අපේ දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු සමඟ අපි මධ්‍යම රාත්‍රිය, පාන්දර වෙනකල් සම්බන්ධ වෙමින් සාකච්ඡා කළා. ඔවුන් නිදි වර්ජිතව, ඉතාම වෙහෙසකර, දුෂ්කර ව්‍යායාමයක නිරත වුණා. ප්‍රාදේශීය ලේකම්තුමා කල්පනා කරනවා, තමන්ගේ බල ප්‍රදේශයේ කිසි කෙනෙකුගේ ජීවිතයට අනතුරක් නොවිය යුතුයි කියලා. ග්‍රාම නිලධාරිතුමා කල්පනා කරනවා, තමන්ගේ වසමේ කෙනෙකුට හානියක් නොවිය යුතුයි කියලා. දිස්ත්‍රික් ලේකම්තුමා කල්පනා කරනවා, තමන්ගේ දිස්ත්‍රික්කයේ කෙනෙකුට හානියක් නොවිය යුතුයි කියලා. එහෙම ඒ ජනතාවගේ ජීවිත බේරා ගන්න ඔවුන් විශාල වෙහෙසක් දැරුවා. හැබැයි, කනගාටුවට කරුණ නම්, මේ ව්‍යසන අවස්ථාවේදීත් සීත කාමරවල හිටපු මහත්වරු ලස්සනට ඇඳගෙන, සුවඳ විලවුන් තවරාගෙන ගිහිල්ලා ඒ දිසාපතිවරයාගෙන් ප්‍රශ්න කරන එකයි. ඉතින්, කොතැනද මේ රට තිබෙන්නේ?

ඒ නිසා මේ ව්‍යසනයේදී අපේ රාජ්‍ය සේවය මේ කරන ලද කාර්යභාරය පිළිබඳව අපි බෙහෙවින්ම ස්තුතිවන්ත විය යුතුයි. ඔවුන් විශාල කාර්යයක් ඉටු කරනවා. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය සේවා අංශ ගැනත් සඳහන් කළ යුතුයි. මෙවැනි ව්‍යසනයකදී ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා, ඔවුන් රැක බලා ගැනීම සඳහා විශාල කාර්යක්ෂම සේවයක් සෞඛ්‍ය සේවාවන් විසින් ලබා දිය යුතුයි. ඒ සෞඛ්‍ය සේවාවන් විශාල කාර්යභාරයක් ඉටු කළා. ඔවුන්ටත් අපි බෙහෙවින්ම අපේ ස්තුතිය ප්‍රදානය කළ යුතුයි. මොකද, මේ ව්‍යසනයෙන් අපේ රටේ පුරවැසියන් මුදා ගැනීම සඳහා ඔවුන් කටයුතු කළා.

ඒ වාගේම, මම කලින් කියූ පරිදි විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් හැමවිටම අපේ රටේ කුමන හෝ තත්ත්වයක් ඇති වෙනවා නම්, ඒ පිළිබඳව විශාල කම්පනයකින් යුතුව අපට උදව් කිරීමේ කාර්යයට මැදිහත් වුණා. ඒ පිළිබඳව අපි ඔවුන්ට ස්තුතිවන්ත විය යුතුයි. ඒ වාගේම, අපේ මිතුරු රාජ්‍යයන් මේ ව්‍යසනයේදී අපට උදව් කළා. අපට ඉතා අඩු මුදා ගැනීමේ මෙවලම් තිබෙන්නේ. මම ඒ පිළිබඳව පසුව වාර්තා කරන්නම්. මෙවැනි ව්‍යවසනයකට මුහුණදීමට අවශ්‍ය යටිතල පහසුකම් ඉතාම අඩුවෙන් තමයි අපට තිබෙන්නේ. හැබැයි, අපේ අසල්වැසි රාජ්‍යයන් ඉතා වේගයෙන් අපට ඒ අවශ්‍ය කරන යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම සඳහා හෙලිකොප්ටර්, බෝට්ටු රථ, අනෙකුත් යන්ත්‍රෝපකරණ වාගේම පුහුණු භට පිරිස් සහ පුහුණු සෞඛ්‍ය කාර්ය මණ්ඩල ද අපේ රටට අද එවා තිබෙනවා. එම නිසා මා ඒ සියලු විදෙස් රාජ්‍යයන්ට, අපේ මිතුරන්ට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මේ ඇති වූ අර්බුදයෙන් ශ්‍රී ලංකාව මුදා ගැනීම සඳහා ඔවුන් දරන ලද වෙහෙසට.

ඊළඟට මම කියන්න කැමැතියි, අපේ ප්‍රධාන කාර්යභාරය විධියට, මේ ව්‍යසනයෙන් අපේ රටේ ජනතාව මුදා ගන්න කටයුතු කළේ කොහොමද කියන එක. විශේෂයෙන්ම අපි හදිසි නීතිය පැනවුවා. මම ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ නායකයින් ඇවිල්ලා 28වැනි දා උදේ අප හමුවීම පිළිබඳව. 28වැනි දා උදේ හදිසි නීතිය පනවන්නය කියන ඉල්ලීම කළා. අපි දෙපැත්තක් සාකච්ඡා කරමින් සිටියා, මේ ව්‍යසනයට අපි මුහුණ දෙන්නේ මහජන ආරක්ෂක පනතෙන් අපට ලබා දීලා තිබෙන බලතල අනුවද, අපි මේකට ක්‍රියාත්මක වෙන්නේ ව්‍යසන කළමනාකරණ පනතෙන් ලබා දීලා තිබෙන බලතල අනුවද කියලා. අපි බලපුවාම මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මා දැක්කා එක මන්ත්‍රීවරයකු ඝෝෂා කරනවා, ව්‍යසන කළමනාකරණ පනත අනුව ජනාධිපතිවරයා ඒක කළ යුතුමයි කියලා. නමුත් මා එතුමාටත්, රටටත් දැන ගැනීම වෙනුවෙන් මෙය කියන්න කැමැතියි. ව්‍යසන කළමනාකරණ පනතේ තිබෙන්නේ, "මුළු රටේම ව්‍යසන තත්ත්වයක් පවතින බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය" කියලායි. ජනාධිපතිවරයාට අවශ්‍ය නම් ව්‍යසන කළමනාකරණ පනත යටතේ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ කරන්න පුළුවන්. එහෙම නැත්නම් මහජන ආරක්ෂක පනත යටතේ අපට ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. එතකොට අපි මුහුණ දීපු ප්‍රශ්නය මොකක්ද? ව්‍යසන කළමනාකරණ පනත බැලුවොත්, අවුරුදු 07කට පසුව ව්‍යසන කළමනාකරණ සභාව කැඳවූයේ පසුගිය අගෝස්තු මාසයේ 6වැනි දා. අවුරුදු 07කට පසුවයි කැඳෙව්වේ. විපක්ෂ නායකතුමා ඒ සභාව නියෝජනය කරනවා. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒ සභාව නියෝජනය කරනවා. ගරු මරික්කාර් මැතිතුමා ඇතුළු මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ඒ සභාවට සහභාගි වෙලා හිටියා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

හැබැයි, විපක්ෂ නායකතුමා සහභාගී වුණේ නැහැ. නමුත් මම කියන්න කැමැතියි, මේ ව්‍යසනය සිද්ධ වුණාට පසුව ව්‍යසන කළමනාකරණ සභාව කැඳවූවා. ඒකට විපක්ෂ නායකතුමා සහභාගි වුණා.

අගෝස්තු මාසයේ 6වැනි දා පැවැත්වූ ව්‍යසන කළමනාකරණ සභාවේදී අපි ගත් තීන්දුව මොකක්ද? මේ ව්‍යසන කළමනාකරණ පනත දුබල බව, ඒ නිසා මේ පනත සංශෝධනය කළ යුතු බව තමයි අපේ තීරණය බවට පත් වුණේ. ඒ නිසා ව්‍යසන කළමනාකරණ පනත මෙවැනි අභියෝගයකට මුහුණදීම සඳහා ශක්තිමත් පනතක් නොවෙයි. ඒ විතරක් නොවෙයි. ඒ පනතේ තිබෙනවා, -මම ඒ අවශ්‍ය කොටස විතරක් කියවන්නම්- "ව්‍යසන කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම සෑම අමාත්‍යාංශයකම, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකම සහ රාජ්‍ය සංස්ථාවක කාර්යය වන්නේය" යනුවෙන්. ඒ කියන්නේ, ව්‍යසන කළමනාකරණ පනත ක්‍රියාත්මක කරන්න නම් සෑම අමාත්‍යාංශයක්ම, සෑම දෙපාර්තමේන්තුවක්ම, සෑම ආයතනයක්ම තමන්ගේ ව්‍යසන කළමනාකරණ සැලැස්ම හදලා තිබෙන්න ඕනෑ. හැබැයි, එහෙම සැලැස්මක් නැහැ. එතකොට අපි කල්පනා කළා, ව්‍යසන කළමනාකරණ පනත යටතේ යන එක දුබලයි; ඒ තුළින් මේ අවස්ථාවට මුහුණ දෙන්න බැහැ කියලා. ඒ නිසා වඩාත් ශක්තිමත් වෙන්නේ කුමක්ද? වඩාත් ශක්තිමත් වෙන්නේ මහජන ආරක්ෂක පනතේ 2වැනි අධිකාරය යටතේ තිබෙන බලය ක්‍රියාත්මක කිරීම. ඒ අනුව තමයි විශේෂයෙන්ම විපක්ෂයේ සිටින පක්ෂ නායකයින් ඉල්ලා සිටියේ, හදිසි නීතිය පනවන්න කියලා. මතක ඇති නේ, ඔවුන් ඉල්ලා සිටියා හදිසි නීතිය පනවන්න කියලා.

එම නිසා මහජන ආරක්ෂක පනත යටතේ තමයි අපි ඒ නියෝග පැනෙව්වේ. ඒ නියෝග තමයි අද සම්මත කර දෙන්න කියලා මම ඉල්ලන්නේ. ඇයි ඒ? සාමාන්‍ය නීතිය අපට ප්‍රමාණවත් නැහැ. මෙවැනි ව්‍යසනයකදී එයට මුහුණ දීම සඳහා සාමාන්‍ය නීතිය ප්‍රමාණවත් නැහැ. මෙවැනි ව්‍යසනයකදී සාමාන්‍ය නීතියට උඩින් තිබෙන ශක්තිමත් නීතියක් අපට අවශ්‍යයි. ඒ අනුව තමයි අපට අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්වරයකු පත් කිරීමේ හැකියාව තිබෙන්නේ. ඒ අනුව තමයි අපට මාතර වැඩ කරන RDA එකේ නිලධාරියා බදුල්ලට යවන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ අනුව තමයි මාතර ප්‍රාදේශීය සභාවේ උපකරණ බදුල්ලේ වැඩවලට යවන්න පුළුවන්කම ලැබෙන්නේ. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයෙක් අපි පත් කරන්න ඕනෑ. එම නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, අපි කිසිසේත්ම ව්‍යවස්ථාව හෝ පනත් උල්ලංඝනය කරලා නැහැ කියලා. අපි බැලුවේ මේ ව්‍යසනයට මුහුණ දීම සඳහා වඩාත් යෝග්‍ය පනත කුමක්ද, වඩාත් යෝග්‍ය නීතිය කුමක්ද කියලා. අපි කල්පනා කළා, වඩාත් යෝග්‍ය නීතිය, මහජන ආරක්ෂක පනත කියලා. ඒකට විපක්ෂයේ නායකයන්ගේ සහායත් ලැබුණා. මම ඒ පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

හැබැයි, මම එකක් කියන්න කැමතියි. මහජන ආරක්ෂක පනත කිසිසේත්ම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම සඳහා උපයෝගී කර ගන්නේ නැහැ. මම දැක්කා යම් ප්‍රකාශයක් පිළිබඳව විශාල ලෙස ආන්දෝලනයට තුඩු දෙනවා. කිසිසේත් හිතන්න එපා ඒවා ගණන් ගන්නවා කියලා. මාව හෝ අපේ අමාත්‍යවරු විවේචනය කිරීම අපි ගණන් ගන්නේවත් නැහැ. අවලාද අදාළම නැහැ. මොකටද අවලාදවලට භය වෙන්නේ? පුද්ගලයෙක් මට අවුරුදු 15ක් තිස්සේ අවලාද කියනවා. මම ගණන් ගන්නේ නැහැ. ඒකට සාමාන්‍ය නීතිය යටතේ ක්‍රියාමාර්ග තිබෙනවා. මට ඔය විධියට ලේක්හවුස් ආයතනයෙන් අවලාදයක් නැඟුවා. මම උසාවියට ගියා. මට ලක්ෂ 10ක වන්දියක් ගෙව්වා. ඒ වාගේම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මෝල්ටාවල සල්ලි පිළිබඳව මට අවලාදයක් නැඟුවා. එම මන්ත්‍රීවරයා අධිකරණයේදී සමාව ගත්තා. ලබන වසරේ ජනවාරි මාසයේදීත් එක්කෙනෙක් සමාව ගන්න ඉන්නවා. ඒක තමයි සාමාන්‍ය නීතිය. අපි කිසිසේත්ම මෙම නීතිය උපයෝගි කරගන්නේ නැහැ එවැනි දේවල්වලට. හැබැයි මෙම නීතිය උපයෝගි කර ගන්නවා, ජනතාව බිය වද්දන්න, ජනතාව නොමඟ යවන්න සහ මෙම සාමකාමී තත්ත්වය අවුල් කිරීම සඳහා ප්‍රජාව ඇතුළේ ව්‍යසනකාරී, යම් ගැටුම්කාරී ව්‍යාකූලත්වයක් නිර්මාණය කිරීම සඳහා කවුරු හරි උත්සාහ කරනවා නම්. එය, මෙම ව්‍යසනයෙන් ගොඩ ඒම සඳහා, මෙම ව්‍යසනයෙන් මිදීම සඳහා කරන සැලැස්මට බාධාවක්. ඒ තත්ත්වයේදී පමණයි අපි මෙම නීතිය උපයෝගි කර ගන්නේ. එහෙම නැතුව කිසිසේත්ම ජනතාවගේ අදහස්වලට; ලියන අදහස්, කියන අදහස්වලට බාධාවක් නැහැ. මඩද, අවලාද ද ඕනෑම දෙයක් කියන්න. ඒක ඒගොල්ලන්ට විතරයි. එයාම දානවා, එයාම බලනවා, එයාම හිනා වෙනවා. කමක් නැහැ. ඒවා කිසිසේත්ම අපි සැලකිල්ලට භාජන කරන්නේ නැහැ. නමුත් මෙම ව්‍යසන තත්ත්වයෙන් අපේ රට මුදා ගැනීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග වියවුල් කරන්න දෙන්නේ නැහැ.

එක මන්ත්‍රීවරයෙක් කිව්වා, ගම්පොල ප්‍රදේශයේ 1,000ක් මැරුණා කියලා. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මෙතැන කියන්න පුළුවන්. එළියට ගිහිල්ලා කිව්වොත් නඩු දානවා. රටක් එහෙම කුලප්පු කරන්න දෙන්න බැහැ. කුලප්පු කරන්න දෙන්න ඕනෑද? ගම්පොල ප්‍රදේශයේ 1,000ක් මැරුණා කියලා මෙතැන ඉඳගෙන කෑ ගහලා කියනකොට ගම්පොල ප්‍රදේශයේ ජීවත් වන පුරවැසියෙක් මොකක්ද හිතන්නේ? මොකක්ද කල්පනා කරන්නේ? අපි දන්නවා, ගම්පොල ආශ්‍රිතව මුස්ලිම් ප්‍රජාව ඉන්න බව. එතකොට කට්ටිය කල්පනා කරනවා, මුස්ලිම් ප්‍රජාවට අඩු සැලකිල්ලක් තිබෙන්නේ කියලා. ඒ නිසා පුළුවන් නම් ගිහින් එළියේ කියන්න. අන්න ඒවාට නම් මේ නීතිය උපයෝගී කර ගන්නවා. මේ ව්‍යසනයෙන් ගොඩ ඒම සඳහා සහ මේ රට ගොඩනැඟීම සඳහා අපට ඉතා සාමකාමී, ප්‍රවේශම් සහගත මැදිහත්වීමක් අවශ්‍යයි. එය කඩාකප්පල් කිරීම සඳහා දරන ප්‍රයත්නවලට හැරුණුකොට ඔය කුඩා කුඩා සිදුවීම් මර්දනය කරන්න කිසිසේත්ම මේ නීතිය උපයෝගි කර ගන්නේ නැහැ.

මම දැක්කා පසුගිය 26වැනි දා හෝ 27වැනි දා වාගේ පාර්ලිමේන්තුවේත් විශාල ලෙස ආන්දෝලනයට තුඩු දුන්නා, ප්‍රාදේශීය ලේකම්වරුන්ට මුදල් නිදහස් කරන්න පුළුවන්ද, මුදල් හිතු සේ පාවිච්චි කරන්න පුළුවන්ද කියලා. සමහර අය කියන්න පටන් ගත්තා, රාජ්‍ය සේවය අකර්මණ්‍ය වෙලා තිබෙනවා කියලා; රාජ්‍ය නිලධාරින් වැඩ කරන්න බයයි කියලා. ඒ බොරු. සමහර අය කිව්වා, රාජ්‍ය නිලධාරින්ට මොනවා හරි වුණොත් ඒගොල්ලෝ පෙනී ඉන්නවා කියලා. මම කියන්නම්. මේ ව්‍යායාමයේදී සද්භාවයෙන් මේ කාර්යයන් කිරීම සඳහා මැදිහත් වුණු හැම නිලධාරියෙක්ම ආරක්ෂා කර ගන්නේ අපි. ඒ නිසා අපි මොකද කළේ? අපි ලිහිල් කළ බලයක් දුන්නා.

ලංකාවේ පළමු වතාවට අපි ප්‍රාදේශීය ලේකම්වරයෙකුට රුපියල් ලක්ෂ 500ක් දක්වා වියදම් කිරීමේ බලය දුන්නා; දිස්ත්‍රික් ලේකම්වරයෙකුට රුපියල් ලක්ෂ 1,000ක් දක්වා වියදම් කිරීමේ බලය දුන්නා; අමාත්‍යාංශ ලේකම්වරයෙකුට රුපියල් ලක්ෂ 1,000ක් දක්වා වියදම් කිරීමේ බලය දුන්නා. ඇයි ඒ? අපි විශ්වාස කරනවා, මේ නිලධාරින්. ඔවුන් මෙවැනි ව්‍යසනයකදී මහා විශාල ලෙස අල්ලස, දූෂණය සිදු කරමින් අයථා ලෙස උපයා ගනීවි කියලා අපි හිතන්නේ නැහැ. ඒ, අපි මේ රාජ්‍ය සේවය විශ්වාස කරන නිසා; ප්‍රබල ලෙස විශ්වාස කරන නිසා. එහෙම නැතිව රටකට ඉස්සරහට යන්න බැහැ. හැබැයි, අපට විවේචනයක් තිබෙනවා. කාත් එක්කද? පරණ දේශපාලන වළල්ලත් එක්ක එකතු වෙලා සමහරුන් කරපු විනාශයන් තිබෙනවා. ඒවා අදාළ නීතිමය ක්‍රියාමාර්ග හරහා විසඳේවි.

ඇයි අපි ඒ නිලධාරින්ට එවැනි නිදහසක් දුන්නේ? ගුවන් තොටුපොළ වේගයෙන් ක්‍රියාත්මක කරගන්න ඕනෑකම අපට තිබුණා. වරාය වේගයෙන් සක්‍රිය කර ගන්න ඕනෑකම අපට තිබුණා. හැබැයි, ගුවන් තොටුපොළෙහි සේවකයින්ට එන්න බැරි නම් සේවා ස්ථානයට, වරායේ සේවකයින්ට එන්න බැරි නම් සේවා ස්ථානයට, අපි ලේකම්වරයාට බලයක් දෙනවා, ඔබ ඔබගේ නිලධාරින් ආසන්න හෝටලයක රඳවා ගන්න වියදම් දරන්න කියලා. අපට ඕනෑ ගුවන් තොටුපොළ, වරාය ආදිය සක්‍රිය ලෙස ක්‍රියාත්මක කරන්නයි. අපි ඒ බලය දුන්නා අමාත්‍යාංශ ලේකම්වරුන්ට. ඒ වාගේම ග්‍රාම නිලධාරි මහත්වරුන්ටත් රුපියල් 50,000 දක්වා වියදම් කිරීමේ බලය දුන්නා. ඇයි? සාම්ප්‍රදායික චක්‍රලේඛන තිබෙනවා, සාම්ප්‍රදායික නීති තිබෙනවා. ඒවා තිබිය යුතුයි. හැබැයි, මෙවැනි ව්‍යසනයකදී අප ඒවායේ කොටු වෙන්න ඕනෑ නැහැ කියලා අපි ඒ සියල්ල නිදහස් කරලා දුන්නා, ඒ පුරවැසියන්ට සහන සැපයීම සඳහා අවශ්‍ය කාර්යය ඉටු කරන්න.

ගරු සභාපතිතුමනි, ඊළඟට අපේ ප්‍රධාන මැදිහත්වීම බවට පත් වුණේ දැන් තත්ත්වය පිළිබඳවයි. විශේෂයෙන්ම අපි දන්නවා තවමත් විශාල පිරිසක් අවතැන් කඳවුරුවල ජීවත් වන බව. සාමාන්‍යයෙන් ගත්තොත්, පවුල් 55,747ක් වාගේ සංඛ්‍යාවක් අවතැන්භාවයට පත් වෙලා තිබුණා කියා වාර්තා වෙලා තිබුණා. ඒවායෙන් පවුල් 51,000ක් සුරක්ෂිත මධ්‍යස්ථානවල ඉන්නවා. 4,000කට ආසන්න පවුල් ප්‍රමාණයක් -පුරවැසියන් පිරිසක්- නැවත හිටපු තැන්වලට ගිහිල්ලා තිබෙනවා. අපේ ප්‍රයත්නය වෙලා තිබෙන්නේ ඉතා වේගයෙන් නිවාස, විදුලිය, සන්නිවේදනය සහ අනෙකුත් පහසුකම් සකස් කර දීලා ඒගොල්ලන්ට ඒ තැන්වලට යන්න පුළුවන් වන වටපිටාව හදලා දෙන එකයි. අපි ඒ වටපිටාව සකස් කරමින් තිබෙනවා. අපි ඉතා ඉක්මනින්ම ඒ අය නිදහස් කිරීම සඳහා කටයුතු කරනවා. පූර්ණ හානි වෙලා තිබෙන නිවාස 5,165ක් දැනට වාර්තා වෙලා තිබෙනවා. අර්ධ නිවාස හානි 57,312ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම ලක්ෂ 17කට ආසන්න ප්‍රමාණයක් මේ ව්‍යසනයේ ගොදුරු බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එමඟින් සැලකිය යුතු ප්‍රමාණයකින් අපේ ආර්ථිකයට දරා ගන්න බැරි, ආර්ථිකයට ටිකක් ඔරොත්තු නොදෙන තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

අපි කවුරුත් දන්නවා අපේ රටේ ආර්ථිකය තිබෙන්නේ හොඳම තැනක නොවන බව. අපේ රටේ ආර්ථිකයට බාහිරින් එන කුඩා කම්පනයකටත් ඔරොත්තු දෙන්න බැහැ; අභ්‍යන්තර කම්පනයකටත් ඔරොත්තු දෙන්න බැහැ. අප මේ ආර්ථිකය ඉතාම මැනවින් සීරුවෙන් කළමනාකරණය කරමින් ඉදිරියට යන ගමනක් මේ තිබෙන්නේ. හැබැයි, වියරු මනසක් තිබෙන සමහර අය අපේ ආර්ථිකය ගැන කුරිරු බලාපොරොත්තුවකින් ජීවත් වෙනවා. ඔවුන්ට කුරිරු බලාපොරොත්තුවක් තිබෙනවා. ඔබට මතක ඇති, අපේ ආසන්න රටවල් දෙකක් අතර යුද්ධයක් ඇති විය හැකියි කියන කාරණයක් ආන්දෝලනයකට තුඩු දුන්නා. ඒ වෙලාවේදී සමහරුන්ට කුරිරු බලාපොරොත්තුවක් තිබුණා, කොළඹට බෝම්බ දමාවී කියලා. ඔබතුමන්ලාට එය මතක ඇති. එහෙම බලාපොරොත්තු වෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා. නැවත මැදපෙරදිග කලාපයේ යුදමය තත්ත්වයක් වාර්තා වුණා. එතකොට තෙල් මිල ඉහළ යනවා, ගෑස් මිල ඉහළ යනවා, ඒ නිසා ආර්ථිකය කඩා වැටෙයි කියලා කුරිරු බලාපොරොත්තුවක් තිබුණා. එක්සත් ජනපදය විසින් ඔවුන්ගේම ප්‍රතිපත්තිවලට අනුරූප වන පරිදි බදු ප්‍රතිශත තීරණය කළා. කුරිරු බලාපොරොත්තුවක් තිබුණා, එමඟින් අපේ රටේ කර්මාන්ත කඩා වැටෙයි, අපනයනය කඩා වැටෙයි, ලක්ෂ තුනහමාරකට, හතරකට රැස්සා නැති වෙයි කියලා. ඒ බලාපොරොත්තුවෙන් නටන්න පටන් ගත්තා. ඇයි? කුරිරු බලාපොරොත්තුවක් තිබුණු හින්දා. අන්න ඒ කුරිරු බලාපොරොත්තුවම තමයි සමහර අය මේ ගංවතුර ආපදාවේදීත් පෙන්නුවේ.

විපක්ෂයේ වුණත් මෙහිදී සද්භාවයෙන් මැදිහත්වීම සඳහා අපට කථා කරපු සමහර මන්ත්‍රීවරු ඉන්නවා; අපට පණිවිඩ එවපු සමහර මන්ත්‍රීවරු ඉන්නවා. "සමහර තැන්වල මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා, මොකක් හරි කරන්න" කියලා ඉල්ලීම් කරපු මන්ත්‍රීවරු ඉන්නවා. මම ස්තුතිවන්ත වෙනවා ඒ මන්ත්‍රීවරුන්ට. ඒ හැම දෙනාටම සද්භාවයක් තිබුණා. හැබැයි මේ අතරේ කුරිරු මනසකින් යුතු වියරු බලාපොරොත්තුවකින් ජීවත් වන මන්ත්‍රීවරුන් ඉන්න එක ගැන මේ රට ලජ්ජා විය යුතුයි.

මේ හැම දෙනාම ඒ අයගේ කතිරයෙන් පාර්ලිමේන්තුවට ආපු අය. තමන් මේ පාර්ලිමේන්තුවට එවන්න වැඩ කරපු, කතිරය ගහපු ඒ පුරවැසියන් ඉන්නවා. හැබැයි, ඇතැම් මන්ත්‍රීවරුන්ගේ අභිලාෂය මොකක්ද? ගම්පොළ ප්‍රදේශයෙන් මරණ 1,000යි කිව්වා. මොකක්ද මේ? එවැනි කුරිරු මනසකට අපි ඉඩ දිය යුතුද? ඉඩ දෙන්න බැහැ.

විශේෂයෙන්ම ගත්තොත්, බාහිර බලපෑමකට හෝ කම්පනයකට හෝ ඔරොත්තු දීමේ හැකියාවක් නැහැ, අපේ ආර්ථිකයට. ඒ වාගේම, මෙවැනි අභ්‍යන්තර ව්‍යසනයක් අපේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් එල්ල කරනවා. අපි ඒක දන්නවා. මොකද, අපි සීරුවෙන්, ක්‍රමානුකූලව මේ ආර්ථිකය ගොඩ නඟමින් ඉන්න අවස්ථාවක්, මේක.

1977 වර්ෂයෙන් පස්සේ අඩුම අය වැය හිඟය වාර්තා කරන්නේ මේ 2025 වර්ෂයේදීයි. 1977 වර්ෂයෙන් පස්සේ අවුරුදු 48කට පසුව ලංකාවේ අඩුම අය වැය හිඟය මේ 2025 වර්ෂයේදී වාර්තා කරනවා; අපි නැඟිටිමින් ඉන්නවා. 2007 වර්ෂයෙන් පසුව අපි ලංකාවේ වැඩිම රාජ්‍ය ආදායම වාර්තා කරනවා. 2007දී ආසන්න වශයෙන් සියයට 16.6ක්ව තිබුණා. මේ අවුරුද්දේ අපි සියයට 15.9ක ආදායමක් වාර්තා කරනවා. 1977දී අය වැය හිඟය සියයට 4.5යි. මේ අවුරුද්දේත් අය වැය හිඟය සියයට 4.5 දක්වා අඩු වෙනවා; අපි නැඟිටිමින් ඉන්නවා. අපි එය සියයට 6.8ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණා. ආදායම වැඩි වී තිබෙනවා, පොලී අනුපාතිකය දීර්ඝ කාලයක් තනි ඉලක්කමේ තියා ගන්න අපි සමත් වී තිබෙනවා; අපි නැඟිටිමින් ඉන්නවා. අපේ අපනයන ආදායම වර්ධනය වෙමින් තිබෙනවා; අපි නැඟිටිමින් ඉන්නවා. අපේ සංචාරක ආදායම් වැඩි වෙමින් තිබෙනවා; අපි නැඟිටිමින් ඉන්නවා. අපේ විදෙස් සංචිත වැඩි වෙමින් තිබෙනවා; අපි නැඟිටිමින් ඉන්නවා. ඒ නිසා මම හිතනවා, මේක අප ඉතාම ශක්තිමත්ව නැඟිටිමින් ඉන්න වෙලාවක් කියලා.

විපක්ෂය මේ පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම කරුණු ඉදිරිපත් කරමින් කියනවා මම දැක්කා, ආණ්ඩුව 2025 වර්ෂයේදී වියදම් කරලා නැහැ කියලා. මේ අවුරුද්දේ මාර්තු මාසයේ 21වැනි දා තමයි අපි 2025 අයවැය ලේඛනය සම්මත කළේ. ඊත් සමගම පළාත් පාලන ආයතන මැතිවරණයත් ආවා. ඒ මැතිවරණය පැවැත්වුණේ මැයි මාසයේ 06වන දා. ඒ නිසාත් වියදම් කිරීමේ බාධාවන් තිබුණා. එහෙම නම් අපි වියදම් කරන්න පටන් ගත්තේ මැයි මාසයේ 06වැනි දා. අනෙක් හැම අය වැය ලේඛනයකටම අදාළව ජනවාරි 01වැනි දා ඉඳන් වියදම් කිරීමේ හැකියාව ලැබුණා. නමුත්, අපට වියදම් කිරීමේ හැකියාව ලැබුණේ මැයි මාසයේ 06වැනි දායි. එහෙම වියදම් කරලාත් අපේ ප්‍රාග්ධන වියදම් කොයි මට්ටමේද තිබෙන්නේ? මම එය කියන්නම්. 2021 නොවැම්බර් මාසය වන කොට ප්‍රාග්ධන වියදම් සියයට 41.9යි. නොවැම්බර් දක්වා මුළු කාලයම ක්‍රියාත්මක වෙලාත්, එපමණයි. 2022දී සියයට 43.1යි, 2023දී සියයට 37.4යි, 2024දී සියයට 41.2යි, 2025දී සියයට 45.6යි. වියදම් කිරීම මේ වසරේ මැයි මාසයෙන් ආරම්භ කරලාත්, 2021න් පසුව ප්‍රාග්ධන වියදම් වැඩිපුරම

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

කරපු වර්ෂය බවට පත් වෙලා තිබෙනවා, 2025 අවුරුද්ද. මම හිතනවා, ගොඩක් බිල් මේ දෙසැම්බර් මාසයේ ගෙවීමට නියමිතව තිබෙනවා කියලා. ඒ නිසා මේක තවත් විශාල අගයකින් වැඩි වන බව මට විශ්වාසයි. ඒ අතිනුත්, ඒ කියන්නේ යොදවන ප්‍රාග්ධන වියදම්වලට අදාළ කාර්යයන් කිරීම අතිනුත් වසර ගණනාවකට පස්සේ අපි උඩට එමින් තිබෙනවා. ඒ විධියට නැඟිටිමින් තිබුණු රාජ්‍යයක්, මෙය. හැබැයි, නැඟිටිමින් තිබුණු රාජ්‍යයට මේ ස්වාභාවික ව්‍යසනය විසින් එල්ල කරන ලද ප්‍රහාරය යම් ප්‍රමාණයකින් බලපෑමක් ඇති කරනවා.

අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. අපි නැඟිටිමින් ඉන්නවා. අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් තිබෙන කමිටුවෙන් දැනට රාජ්‍ය සේවයට 76,000ක් බඳවා ගැනීමට තීරණය කර තිබෙනවා. ඒවා අතර රැකියා දොළොස්දහස් ගණනක්ම තිබෙන්නේ උපාධිධාරීන්ට. මා කියන්නේ ඔවුන්ට ඉදිරියේදී ඉතාම හොඳ තරග විභාගයකින්, ඉතා හොඳ රැකියා අනාගතයක් සහිත රැකියාවකට අවතීර්ණ වෙන්න පුළුවන් බවයි. උපාධිධාරීන්ට අනෙක් රැකියාවලට යන්නත් පුළුවන්. හැබැයි, උපාධිය පමණක් සුදුසුකම වන රැකියා 12,000ක් පමණ නිර්මාණය වෙලා තිබෙනවා.

ඒ හැම කෙනාම අද ගිහිල්ලා වාඩි වුණොත්, ඔහුට කරන්න වැඩක් තිබෙනවා. එයාට උසස්වීමක් තිබෙනවා, අනාගතයක් තිබෙනවා. ඒ තත්ත්වය අපි හදලා තිබෙනවා. එලෙස අපි නැඟිටිමින් සිටි වෙලාවක තමයි අපට මේ ප්‍රහාරය එල්ල වුණේ. ඒක සැලකිය යුතු අන්දමින් අපට බලපෑමක් ඇති කරමින් තිබෙනවා.

ඒ වාගේම, අපි අපේ ආදායම් ඉලක්ක ගැන කියනකොට බොහෝ අය අපට කිව්වා, ඇති වෙනකල් බදු ගහලා තමයි මේ ආදායම් ඉලක්ක සපුරා ගත්තේ කියලා. නමුත් මම කියන්න කැමැතියි, 2024දී තිබුණු බදු අපි අඩු කරලා තිබෙන්නේ. වාහන ආනයනය හැරුණු කොට අපි 2025 වර්ෂය සඳහා වෙනත් අමතර බදු පනවලා නැහැ. පැරණි ආණ්ඩුවට 2025 වසරේ සියයට 15.2ක ආදායම් ඉලක්කයක් තිබුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඒ ආණ්ඩුවට ලබා දුන් ආදායම් ඉලක්කයක් තිබුණා. ඒ ආදායම් ඉලක්කය සපුරා ගැනීම සඳහා තිබුණු බදුවලට අමතරව තව බදු යෝජනා වෙලා තිබුණා. ඩිජිටල් සේවා බද්ද පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා ක්‍රියාත්මක වෙන්න තිබුණා. දේපළ බද්දත් අප්‍රේල් මාසයේ ඉඳලා ක්‍රියාත්මක වෙන්න තිබුණා. එහෙම තමයි පැරණි ආණ්ඩුව සියයට 15.2ක ආදායමක් උපයාගන්න සැලසුම් කරලා තිබුණේ. ඩිජිටල් සේවා බද්ද සියයට 30කින් පනවන්න තීරණය කරලා තිබුණේ. අපි මොකද කළේ? අපි ඒක සියයට 15 දක්වා අඩු කළා. එහෙම කරලා ඒ බදු පැනවීම ලබන අවුරුද්දේ අප්‍රේල් දක්වා කල් තැබුවා. එම නිසා ඒ බද්ද 2025 වසරේ ක්‍රියාත්මක වුණේ නැහැ. දේපළ බද්ද පනවන්න නියමිතව තිබුණා. අපි ඒක 2026 වසරේ පනවන්නේත් නැහැ, එය සමාලෝචනය කරමින් ඒ ගැන කල්පනා කරන්නේ 2027දී කියලා අපි ජාත්‍යන්තර අරමුදලට දැනුම් දීලා ඔවුන් එක්ක එකඟතාවට ඇවිල්ලා තිබෙනවා.

අපි අලුතින් බදු පැනවුවේ නැහැ. තිබෙන බදු ඉවත් කළා. PAYE Tax එක අපි සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කළා. මම හිතනවා, ඒක ප්‍රමාණවත් නැහැ කියලා. ඒ නිසා ඊළඟ Budget එකෙන් එය තව ප්‍රමාණයක් අඩු කරන්න අපි අපේක්ෂා කරනවා. කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ යෝගට්වලට පනවා තිබූ බද්ද මුළුමනින්ම ඉවත් කරලා දුන්නා. මම දැක්කා, මෙතැනදී ගොඩක් මන්ත්‍රීවරු කෑ ගහනවා, බදු ගහලා, බදු ගහලා තමයි මේ ආදායම එකතු කර ගත්තේ කියලා. මම ඒ හැමදෙනාටම කියන්න කැමැතියි, වාහනවලින් ගත්ත බදු හැරුණු කොට අනෙක් සියලු බදු ප්‍රතිශත 2024ට වඩා අඩු බව. 2024 වර්ෂයේ පනවා තිබූ බදුවලින් අපි සමහර බදු අයින් කරලා තිබෙනවා. අපේ ශක්තිය බවට පත්වෙලා තිබුණේ මොකක්ද? ඉතාම හොඳ බදු කළමනාකරණයක් අපි සකස් කරලා තිබුණා. ඒ නිසා තමයි පළමු වතාවට අපි අපේක්ෂා කළ ඉලක්ක අභිබවා යන ආදායමක් අපට ලබාගත හැකි වුණේ. ශ්‍රී ලංකා රේගුවේ - Sri Lanka Customs එකේ - ආදායම ගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 59කින් වැඩිවෙලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායමත් ඒ හා සමාන ලෙස වැඩිවෙලා තිබෙනවා. එහි ආදායම සියයට 18කින් විතර වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායමත් වැඩි වුණා.

සුරාබදුවලට අපි අලුත් බද්දක් ගැහුවේ නැහැ, දේශීය ආදායම්වලට අපි අලුත් බද්දක් ගැහුවේ නැහැ. Sri Lanka Customs එකේ බදු වැඩි වීම තේරුම් ගන්න පුළුවන්, වාහන ගෙන්වීම නිසා කියලා. හැබැයි, වාහනවලින් ලැබුණු බදු ප්‍රමාණය අයින් කරලා ගණනය කළත්, Sri Lanka Customs එක එකතු කළ බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? බිඳ වැටී තිබුණු රාජ්‍යය අපි අසීරුවෙන් ගොඩනගමින් තිබෙනවා. අන්න ඒ ගොඩනගන වෙලාවේ තමයි අපට මේ ආර්ථික බලපෑම එල්ල වුණේ. දැන් අපි මොකක්ද කරන්න ඕනෑ? මේ ආර්ථික බලපෑම හමුවේ මේ ව්‍යසනයට මුහුණ දුන් ජනතාවට "ඉවසන්න" කියලා කියන්න අපට පුළුවන්ද? "අපි වැල් පාලමේ ගමන් කරමින් ඉන්නේ, ඒ හින්දා සද්ද නැතුව ඉන්න" කියලා කියන්න අපට පුළුවන්ද? එහෙම කියන්න අපට බැහැ. අපි එවැනි ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා අපි උත්සාහ කරන්නේ මොකක් කරන්නද? ආර්ථිකයේ අර්බුදයක් තිබෙන වෙලාවකදී, ආර්ථිකය වෙනුවෙන් ගනු ලබන කවර හෝ කුඩා වැරදි තීරණයකින් වුවත් ආර්ථිකයට බරපතළ හානියක් සිදු වීමේ අනතුර තිබෙනවා. ඒ කියන්නේ, පොඩි වැරැද්දක් වුවත් මේ ආර්ථිකයට භයානක ප්‍රතිඵල ගෙනැවිත් දෙනවා. එවැනි භයානක ප්‍රතිඵලයක් ලෙස තමයි, 2022දී රාජ්‍ය ආදායම සියයට 8.8ට වැටුණේ. එය ලංකා ඉතිහාසයේ අඩුම ආදායම බවට පත් වුණා. මෙවැනි බිඳ වැටුණු ආර්ථිකයකට, අසීරුවෙන් ගොඩනැඟෙන ආර්ථිකයකට කුඩා වැරැදිත් මාරාන්තික ප්‍රතිඵල ගෙනැවිත් දෙනවා. ශක්තිමත් ආර්ථිකයකට කුඩා අර්බුද විසින් ඇති කරන්නේ කුඩා හානි. හැබැයි, බිඳ වැටුණු ආර්ථිකයකට, ගොඩනැඟෙමින් තිබෙන ආර්ථිකයකට කුඩා හානියත් බරපතළ බලපෑමක් ඇති කරනවා. ඒක අපි තේරුම් අරගෙන තිබෙනවා. ඒ ගැන ඉතා හොඳින් කල්පනා කරමින් අපේ රටේ ජනතාව බලා ගැනීමේ වගකීමක් අපට තිබෙනවා. ඒ බලා ගැනීමේ වගකීම ඉටු කිරීම වෙනුවෙන් මා කියන්නේ, මේ කිසිදු තීරණයක් කිසිසේත්ම ආර්ථිකය අනතුරට හෙළලා, මේ කම්පනය මත හැඟුම්බරව ගන්නා තීන්දු නොවන බවයි.

අපි මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, ඒ ඒ අමාත්‍යාංශවල කණ්ඩායම් කැඳවලා දින ගණනාවක් සාකච්ඡා කළා, කොහොමද ජනතාවට සහනයක් දෙන්නේ කියලා, අපි සකස් කර තිබෙන ආර්ථික සැලසුමට බාධා නොවන පරිදි. එතකොට සමහර අය කරුණු ඉදිරිපත් කරන්න පටන් ගත්තා, මේ අය වැය ලේඛනය නතර කරලා අලුත් අය වැය ලේඛනයක් ගේන්න කියලා. අපි ඒකට සූදානම් නැහැ. අපේ මේ අය වැය ලේඛනයේ සංවර්ධන ඉලක්කයක් තිබෙනවා. ඒක නිකම් දත්ත එකතුවක් නොවෙයි. අපි අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොටත් කිව්වා, මේ අය වැය ලේඛනය සකස් කර

තිබෙන්නේ යම් ආර්ථික උපාය මාර්ගයක් සම්පූර්ණ කර ගැනීමේ අරමුණින් කියලා. ඒ නිසා අපි ඒක අකුළන්නේ නැහැ. තව හිටපු නායකයෙක් කියනවා, අන්තර් කාලීන අය වැයක් ගේන්න කියලා. අපි ගේන්නේ නැහැ. අපි 2026 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය ලේඛනය, තිරසාර ලෙස අපේ රටේ ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීම සඳහා සකස්කොට තිබෙන න්‍යාය පත්‍රයේ කොටසක්. ඒ නිසා අපි ඒක නතර කරන්නේ නැහැ. හැබැයි අපි කල්පනා කරනවා, ඒ අය වැය ලේඛනයේ යම් කොටස් මේ ව්‍යසනයට ප්‍රමුඛතාව දීලා ඒ සඳහා යොදා ගන්න පුළුවන්ද කියලා. ඒ ගැන අපි කල්පනා කරනවා.

මහාමාර්ග අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල්වලින්, - මම හිතන විධියට රුපියල් බිලියන 40කට ආසන්න ප්‍රමාණයක් - කුඩා පාරවල් හදන්න රුපියල් මිලියන 24,000ක් වෙන් කර තිබෙනවා, මාර්ග සංවර්ධන අධිකාරියට. කුඩා පාරවල් හදන්න පළාත් සභාවලට රුපියල් මිලියන 15,000ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 39,000ක් තිබෙනවා, කුඩා පාරවල් හදන්න. ඉතින්, මේ ව්‍යසනයට ලක් වෙලා තිබෙන්නේ ඒ පාරවල් තමයි. එතකොට ඒකෙන් යම් මුදල් ප්‍රමාණයක් මේ සඳහා වැය වෙනවා.

ඒ වාගේම පාරවල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා, මාර්ග සංවර්ධන අධිකාරියට. ඒ මුදල්වලින් යම් ප්‍රමාණයක් මේ මාර්ග ප්‍රතිසංස්කරණයට යොදා ගන්නවා. එම නිසා යොදලා තිබෙන මුදල්වලින් රුපියල් බිලියන 40ක් මේ ආපදාවට ලක් වූ මාර්ග සංවර්ධනය වෙනුවෙන් යොදා ගැනීමේ හැකියාවක් තිබෙනවා. අපි පළාත් සභාවලටත් කියලා තිබෙනවා, වෙන් කරලා තිබෙන මුදල්වලින් යම් ප්‍රමාණයක් මේ ව්‍යසනයට ලක් වුණු ප්‍රදේශවල පාරවල් සංවර්ධනය කිරීමට යොදවන්න කියලා. ඒ කියන්නේ, අපි මේ අය වැය ලේඛනය අකුළන්නේ නැහැ. ඒ ආර්ථික උපාය මාර්ගය සකස් කර ගැනීම එසේම තබා ගනිමින්, මේ අවස්ථාවට ප්‍රමුඛතාව දීලා යම් මුදල් ප්‍රමාණයක් මෙතැනටත් යොදවන්න කල්පනා කර තිබෙනවා.

ඒ ඔක්කෝමත් එක්ක මේ ජනතාව බලා ගන්න ඕනෑ. පළමුවෙනි පියවර විධියට අපි කළේ මොකක්ද? අර වියළි සලාකයේ ගණන වැඩි කළා. මම දැක්කා ඊයේ හෝ අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේගයෙන් කෑ ගහනවා, මේ මුදල් ප්‍රමාණයෙන් ජීවත් වෙන්නේ කොහොමද කියලා. හැබැයි, තිබුණේ කීයද? සාමාජිකයන් 4කින් යුත් පවුලකට සතියකට තිබුණේ රුපියල් 3,200යි. අපි ඒක රුපියල් 8,400 දක්වා වැඩි කළා. ඒක තමයි අපේ ආර්ථිකයට ඔරොත්තු දෙන ප්‍රමාණය. හැබැයි, අපි ඒකත් වැඩි කර තිබෙනවා. පස්දෙනෙකුට වැඩි පවුලකට තිබුණේ රුපියල් 3,600යි. ඒක රුපියල් 10,500 දක්වා වැඩි කළා. තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් ඒ ප්‍රමාණය වැඩි කර තිබෙනවා. ඇයි? සතියකට කොහොමද රුපියල් 3,600න් ජීවත් වෙන්නේ? ඒ නිසා අපි ඒක රුපියල් 10,500 දක්වා වැඩි කළා. හැබැයි, රුපියල් 3,600 දීපු මන්ත්‍රීවරු මෙතැන ඉඳන් කථා කරනවා, ඇයි, මේක මෙහෙම කරන්නේ කියලා.

ඊළඟට, අද අපි රුපියල් බිලියන 50ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. රුපියල් බිලියන 50ක. ඒ රුපියල් බිලියන 50 වෙනුවෙන් අපට කිසිසේත්ම ණය ගැනීමේ වුවමනාවක් නැහැ, ණය සීමාව වැඩි කර ගැනීමේ වුවමනාවක් නැහැ. දැනටමත් අපි වෙන් කරලා තිබෙන මුදල් තිබෙනවා, අපේ ප්‍රතිපාදන තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 50ක පරිපූරක ඇස්තමේන්තුවක් අපි ඉදිරිපත් කර තිබෙනවා.

අපි මේ වෙනකොට දිසාපතිවරුන්ට දැනුම් දීලා තිබෙනවා, තමන්ගේ ප්‍රදේශවල කවර හෝ ගැටලුවක් තිබෙනවා නම් අපට කියන්න, අපි මුදල් එවන්න ලෑස්තියි කියලා. ඒ අනුව රුපියල් මිලියන 10,500කට ආසන්න මුදල් ප්‍රමාණයක් මේ වන කොටත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට නිදහස් කර තිබෙනවා, මේ වෙනකොටත්. මේ වෙනකොටත්! ලංකාවේ කවදාවත් මෙහෙම වෙලා නැහැ, මතක තබා ගන්න. අසීරු ආර්ථිකයක් තිබෙන වෙලාවක රුපියල් මිලියන 10,500ක් මේ වන විටත් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම අනුව නිදහස් කර තිබෙනවා. අපි අද ඉල්ලනවා, අපට තව රුපියල් බිලියන 50ක පරිපූරක ඇස්තමේන්තුවක් මේ පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා දෙන්න කියලා. අපි ළඟ තව රුපියල් බිලියන 22.2ක් තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 72.2ක්, ඉදිරි දින 25 තුළ අපට වියදම් කරන්න තිබෙනවා. ඉදිරි දින 25ට රුපියල් බිලියන 72.2ක් තිබෙනවා. මම හිතන විධියට, ඊට වඩා මුදලක් අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, දෙසැම්බර් මාසයට තිබෙන්නේ තව දින 25යි. එතකොට අපි මොකක්ද කළේ? මේ රුපියල් බිලියන 50 අපි ඉල්ලන්නේ, මේ රුපියල් බිලියන 72.2 අපි වියදම් කරන්න අපේක්ෂා කරන්නේ කුමටද කියලා මම කියන්න කැමතියි.

පළමුවැනි එක, හදිසි ආපදා තත්ත්වය පහව යෑමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වල නිවාස නැවත පදිංචියට යෝජිත පරිදි පිරිසිදු කර ගැනීම සඳහා දැනටමත් අපි රුපියල් 25,000ක දීමනාවක් දීලා තිබෙනවා.

ගංවතුරෙන් හානි වූ හැම නිවසකටම ඒ රුපියල් 25,000ක මුදල ලබා දෙනවා. ඉස්සර දුන්නේ රුපියල් 10,000යි. ඒ රුපියල් 10,000ත් දුන්නේ ප්‍රතිපූරණය කිරීමේ පදනමින්. අර මුල් මුදල දෙනකොට ඒ රුපියල් 10,000 කපනවා. මේ මුදල කපන්නේ නැහැ.

ඒ වාගේම අපි දන්නවා, ගෙවල් දොරවල් විනාශ වෙලා තිබෙනවා කියලා. අඩුම තරමේ ගෑස් සිලින්ඩරයක් ගන්න ඕනෑ; ලිපක් ගන්න ඕනෑ; නිදා ගන්න මෙට්ටයක් ගන්න ඕනෑ. ඒගොල්ලන් නැවත ජීවිතය ආරම්භ කරන්න ඕනෑ. ඒ නිසා අපි දැන් කල්පනා කරනවා, රුපියල් බිලියන 72.2 හරහා ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අත්‍යවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු ආදිය මිලදී ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා -සමහර වෙලාවට කුලී නිවසක ඉන්නවා- එක් නිවාස ඒකකයකට එක වරක් පමණක් ගෙවන රුපියල් 50,000ක දීමනාවක් ලබා දෙන්න. සෑම නිවසකට අර රුපියල් 25,000 දීමනාව අද සහ හෙට දෙනවා. අද කැබිනට් මණ්ඩලය රැස් වෙලා අපි මේ චක්‍රලේඛය සම්මත කරනවා. අද රාත්‍රියේ මේ චක්‍රලේඛය නිකුත් කරනවා. ඒ අනුව, ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන්.

ඊළඟට, නාය ගිහින් අවතැන් වූ පිරිසක් ඉන්නවා නේ. මම කිව්වේ, නිවාස පන්දහස් ගණනක් නාය ගිහිල්ලා තිබෙනවා. ඔවුන් අවතැන් කඳවුරක ඉන්නවා නම්, අපි සියලු පහසුකම් දීලා ඒගොල්ලන් බලා ගන්න කැමැතියි. හැබැයි, සමහරවිට වෙන්න පුළුවන්, මොකක්ද? සමහරවිට ඒගොල්ලන් අවතැන් කඳවුරේ ඉන්න කැමැති නැහැ. අපි දන්නවා, එතැන පොදුයි. එතැන ඉන්න කැමැති නැහැ. ඒගොල්ලන් කැමැතියි, වෙන තැනකට යන්න. හැබැයි, යන්න තමන්ගේ නිවාසය නැහැ. නිවාස නැති කෙනෙකුට, ඒ කියන්නේ නිරත විය නොහැකි පවුල් වෙත මාස 3ක කාලයකට එනම්, 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි, පෙබරවාරි මාස සඳහා ගෙදරකට යාමට රුපියල් 25,000ක් ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා. අවතැන් කඳවුරේ ඉන්න පුළුවන්. නැත්නම් රුපියල් 25,000ක්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

අරගෙන කුලී නිවාසකට යන්න පුළුවන්. අපි මේක මාස 6 දක්වා දීර්ඝ කරන්න අපේක්ෂා කරනවා. මාසයකට රුපියල් 25,000 බැගින් දෙනවා, අවතැන් කඳවුරේ ඉන්නේ නැතිව එයාට ගෙදරකට යන්න පුළුවන්.

හැබැයි, එයාගේ ජීවනෝපායට හානි වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි, **මාර්තු** කියන මාස 3 සඳහා නිවාස අහිමි වෙලා අවතැන් වූ පවුලකට අවතැන් කඳවුරේ සිටියත්, කුලී නිවාසයකට ගියත්, භේදයකින් තොරව රුපියල් 50,000ක මාසික දීමනාවක් ලබා දෙනවා. මාස 3ක් අඛණ්ඩව රුපියල් 50,000 ගණනේ ලබා දෙනවා, ජීවත් වන පුරවැසියන්ට ජීවනෝපාය මාර්ග සකස් කර ගන්න. අර රුපියල් 50,000 දෙන්නේ මෙහෙමයි. පවුලේ ඉන්නේ දෙදෙනායි නම් රුපියල් 25,000යි. දෙදෙනෙකුට වඩා වැඩි නම් රුපියල් 50,000යි. දෙදෙනෙක් නම් ඉන්නේ මාසයකට රුපියල් 25,000ක් දෙනවා. දෙදෙනෙකුට වඩා වැඩියෙන් ඉන්නවා නම්, රුපියල් 50,000ක් දෙනවා. ඒ චක්‍රලේඛය අපි නිකුත් කරනවා.

ඊළඟට, ආපදාවේ බලපෑමට ලක් වූ වී, බඩ ඉරිඟු වැනි ධාන්‍ය වර්ග සඳහා හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක දීමනාවක් ලබා දෙනවා. අපේ අපේක්ෂාව තිබෙන්නේ මොකක්ද? මේ කුඹුරු යළි වගා කරන්න ඕනෑ. ආසන්න වශයෙන් දැනට වාර්තා වෙලා තිබෙනවා, - කෘෂිකර්ම ලේකම්තුමා ඊයේ කිව්වා - හෙක්ටෙයාර 137,000ක් පමණ කියලා. නමුත්, අද වාර්තා වෙලා තිබෙනවා, හෙක්ටෙයාර 160,000ක් පමණ හානියට පත් වෙලා තිබෙනවා කියලා. අපි දන්නවා, තවමත් මහ කන්නය යන්නේ කියලා. මේ කුඹුරුවල පැළ ගොයම තිබුණේ. මාසයකට වඩා අඩු ගොයම තිබෙන්නේ. සාමාන්‍යයෙන් මාසයකට වඩා අඩු ගොයමට ගෙව්වේ අක්කරයකට රුපියල් 16,000යි, රුපියල් 40,000යි ගෙව්වේ. අපට අවශ්‍යයි, මේ හෙක්ටෙයාර 160,000ම යළි වගා කරන්න.

ගොඩක් අය අදහස් ඉදිරිපත් කරනවා මා දැක්කා, හාල් හිඟයක් ඇති වෙයි කියලා. නැහැ, අපි ඒකට මුහුණ දෙන්න තමයි ලෑස්ති වෙන්නේ. බිත්තර වී ප්‍රශ්නයක් තිබෙනවා. අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නා, බිත්තර වී ටික එකතු කරගන්න කියලා. සාමාන්‍යයෙන් බිත්තර වී කිලෝවක් රුපියල් 150ක් විතර වනවා. සාමාන්‍යයෙන් බිත්තර වී කිලෝ සියයක් විතර අවශ්‍ය වනවා, හෙක්ටෙයාරයකට. එතකොට බිත්තර වී කිලෝග්‍රෑම් 100ට රුපියල් 15,000ක් විතර ඕනෑ වෙනවා. අපි ඒක දෙනවා. බිම් සකස් කරන්න දෙනවා. ශ්‍රම කුලිය දෙනවා. ජීවත් වෙන්නත් පොඩි ගණනක් තිබෙනවා. මේ හෙක්ටෙයාර 160,000ම නැවත වගා කරන්න අපි උත්සාහ කරනවා.

සමහර තැන්වල වගා කරන්න බැරි වෙයි. වගා කරන්න බැරි තැන් කිහිපයක් තිබෙනවා. අපි ඒ ගැන වෙනම බලමු. හැබැයි පළමුකොටම රුපියල් 150,000 දෙනවා. ඒ වාගේම, හැමදාමත් මෙවැනි ව්‍යසනයකදී එළවලු ගැන කල්පනා කරන්නේ නැහැ. හෙක්ටෙයාර ගණන් එළවලු වගා කරන්නේ හරි අඩුවෙන්. කුඩා බිම් ප්‍රමාණයක තමයි එළවලු වගා කරන්නේ. එළවලු වගාව සඳහා හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 2ක දීමනාවක් දෙනවා. අද සිට ඒවාට මුදල් ටික වෙන් කරනවා. අද චක්‍රලේඛය නිකුත් කරනවා. හැබැයි අපේ අමාත්‍යාංශයේ නිලධාරීන් මේ කටයුතු කරන්න සමත් වෙන්න ඕනෑ. එළවලු නැවත වගා කරන්න ඕනෑ, කුඹුරුවල නැවත වගා කරන්න ඕනෑ. අපේ අපේක්ෂාව වන්නේ මේ බිඳ වැටුණු ආර්ථිකය නඟාසිටුවීමයි. නිකම් දෑත් දෙක කම්මුල්වලට තියාගෙන"අනේ අපොයි" කියලා බලාගෙන ඉන්න නොවෙයි, අපි මේ ආර්ථිකය සූදානම් කරන්නේ. ආර්ථිකය බිඳ වැටුණු තැනින් යළි නඟාසිටුවන්න ඕනෑ. එසේ නඟාසිටුවද්දී කෘෂිකර්මාන්තය ප්‍රමුඛයි. සාමාන්‍යයෙන් වියළි කලාපවල යල, මහ කන්න දෙකම තිබුණාට උඩරට කලාපයේ යල, මහ කියලා කන්න දෙකක් නැහැ. හැම දාම වගා කරනවා. ඒ නිසා අපි හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 2ක දීමනාවක් දෙනවා. ඔවුන් වගා කරන භූමි ප්‍රමාණය අනුව ඔවුන්ට ඒ මුදල ලබාගන්න පුළුවන්. යළි වගා කරන්න කියලා අපි ගොවි ජනතාවගෙන් ඉල්ලනවා. ඉතා වේගයෙන් මේ සංඛ්‍යා දත්ත හොයාගෙන ගොවි ජනතාවට මේක ලබාදෙන්න කියලා අපේ රාජ්‍ය නිලධාරින්ගෙන් අපි ඉල්ලා සිටිනවා.

ඊළඟට, විශේෂයෙන්ම මේ ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ත්ව පාලන ගොවිපොළවල් සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. හැබැයි, ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම මේ ව්‍යසනයත් එක්ක අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. ඉතා හොඳ, ගොවිපළවල් ලියාපදිංචි කිරීමේ ක්‍රමයක්, සතුන් ප්‍රමාණය තීරණය කිරීම පිළිබඳ ක්‍රමයක් අපට අවශ්‍යයි. හැබැයි, අද අපට එහෙම ක්‍රමයක් නැහැ. නමුත්, පශු වෛද්‍ය කාර්යාලයේ මේ සත්ත්ව ගොවිපළවල් ලියාපදිංචි කර තිබෙනවා. අන්න, ඒ පශු වෛද්‍ය කාර්යාලයේ ලියාපදිංචි කර තිබෙන සෑම සත්ත්ව ගොවිපළකටම; කුකුළු ගොවිපළක් නම් නැවත කුකුළන් ඇති කරන්න, සූකර ගොවිපළක් නම් නැවත පටන් ගන්න රුපියල් ලක්ෂ 2 බැගින් දීමනාවක් ලබා දෙන්න තීරණය කර තිබෙනවා. ආර්ථිකය නැවත පණගන්වන්න ඒ ගොල්ලන්ට අපි එය ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම, අපි ඊයේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා සමඟ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ සාකච්ඡාවක් කළා. මයික්‍රෝ ව්‍යාපාරවලට මෙහෙම දුන්නොත් ඇති, සුළු ව්‍යාපාරවලට මෙහෙම දුන්නොත් ඇති, ටිකක් ලොකු ව්‍යාපාරවලට රුපියල් ලක්ෂ එකහමාරක් දුන්නොත් ඇති කියලා ඔවුන් අපට package එකක් ඉදිරිපත් කළා. අපි කුඩා, මධ්‍යම, ලොකු භේදයකින් තොරව ලියාපදිංචි කර තිබෙන සෑම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයකුටම නැවත තමන්ගේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් ලක්ෂ 2ක දීමනාවක් ලබා දෙනවා. මේවා ආපසු පටන්ගන්න ඕනෑ. අපට අවශ්‍යව තිබෙන්නේ මොකක්ද? මා නැවත කියන්නම්. අපි හුල්ලමින් බලාගෙන ඉඳලා හරියන්නේ නැහැ. අපි මේවාට නැවත පණ දෙන්න ඕනෑ. මල් වගා කරන කෙනෙක් හිටියා නම්, ඔහුගේ මල් ටික ගහගෙන ගිහිල්ලා නම් ඒ මල් වගාවට අපි හයිය දෙන්න ඕනෑ. අපි ඒ ගොවිපළවලට රුපියල් ලක්ෂ 2ක් දෙනවා. සමහර විට තමන්ගේ ගහගෙන ගිය මුළු දේපළම ඒ තරම් නොවටින්න පුළුවන්. හැබැයි, මේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න ඕනෑ. අපි මල් ගස් ගණනට මෙච්චරයි කියලා ලේඛන හැදුවොත් ඕක හොයන්නේ කොහොමද? ඒ නිසා register කරපු - කර්මාන්ත අමාත්‍යාංශයේ මෙහෙම register එකක් තිබෙනවා කියලා ඒගොල්ලන් කිව්වා - අන්න ඒ හැම දෙනාටම මේ ආපදාවට ලක්වෙලා තිබෙනවා නම් රුපියල් ලක්ෂ 2ක දීමනාවක් ලබා දෙනවා.

ඒ වාගේම, ඒ ව්‍යාපාරිකයන්ට බැංකු මට්ටමින් යම් moratorium එකක් දෙන්න කියලා අද මහ බැංකුව චක්‍රලේඛයක් නිකුත් කරනවා. ඒ වාගේම, අපි ඉන්ෂුවරන්ස් සමාගම් එක්ක මේ ගැන සාකච්ඡා කර තිබෙනවා. මේ ඉන්ෂුවරන්ස් සමාගම්වල අය මේ වචන එක්ක එල්ලෙනවා

කියලා අපි දන්නවා. නමුත්, අපි දැනට මුදල් අමාත්‍යාංශය කැඳවමින්, ඉන්ෂුවරන්ස් සමාගම් කැඳවමින් මේවාට රක්ෂණ වාරික ගෙවීම සම්බන්ධයෙන් කල්පනා කරමින් ඉන්නවා.

ඒ වාගේම, නැවත ගොඩනැඟීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ණය දෙන සහන ණය යෝජනා ක්‍රම වෙනුවෙන් මේ 2026 අය වැයෙන් අපි රුපියල් මිලියන 80,000ක් වෙන් කර තිබෙනවා. තරුණ අයට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කාන්තාවන්ට මේ ආදී විවිධ යෝජනා හරහා රුපියල් මිලියන 80,000ක් වෙන් කර තිබෙනවා. අන්න ඒ රුපියල් මිලියන 80,000න් වැඩි ප්‍රමාණයක් ප්‍රමුඛතාවෙන් මේ බිඳ වැටුණු කර්මාන්ත ගොඩනැංවීම සඳහා ණය ආධාර විධියට ලබා දෙන්න කියලා කර්මාන්ත අමාත්‍යාංශයට යෝජනා කරන්න අපි කැමැතියි. එතකොට අපට මේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත යළි නඟාසිටුවන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම, හානියට පත් ධීවර බෝට්ටු නිසා අපේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වෙනවා. අපිට ඕනෑ කරන්නේ කුමක්ද? මේ ආර්ථිකයට යළි පණ දෙන්න. ධීවර බෝට්ටු සියල්ලම register වෙලා නැති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
දැන් register වෙලා තිබෙන්නේ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
දැන් register වෙලා තිබෙන්නේ. Register වෙලා තිබෙන ඕනෑම ධීවර බෝට්ටුවක් පූර්ණ හානියට පත් වෙලා තිබෙනවා නම්, මුහුදු යන්න බැරි නම් අපි ඒ හැම බෝට්ටුවකටම රුපියල් ලක්ෂ 4ක දීමනාවක් දෙන්න යෝජනා කරනවා. අපි මේ පරිපූරක ඇස්තමේන්තුව හරහා ඒ බෝට්ටුවකට රුපියල් ලක්ෂ 4ක දීමනාවක් දෙන්න මුදල් වෙන් කර තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම ආපදාවට ලක් වුණු පාසල් සිසුන්ට යම් දීමනාවක් ලබා දෙනවා. පාසල් සිසුන් සංඛ්‍යාව ආසන්න වශයෙන් ලක්ෂ 16ක් නම් ආපදාවට ලක් වුණු පාසල් සිසුන් ලක්ෂ තුනක්, තුනහමාරක්වත් ඇති කියලා මම හිතනවා. ඔවුන්ට ඊළඟ වසර ආරම්භ කරන්න ඕනෑ. ඔවුන්ගේ බෑග් එක, පොත්පත් ඔක්කොම දියවෙලා තිබෙන්නේ.

ඒ නිසා ආපදාවට ලක් වුණු හැම පාසල් දරුවෙකුටම රුපියල් 15,000ක දීමනාවක් භාණ්ඩාගාරයෙන් දෙනවා. ඊට අමතරව රුපියල් 10,000ක දීමනාවක් ජනාධිපති අරමුදලින් දෙනවා. ඒ දෙකම එකතු කළාම ආපදාවට ලක් වුණු දරුවෙකුට පහසුකම් සහිතව නැවත පාසල් යෑම සඳහා රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙනවා. ඊට අමතරව ළමයි 200ට වඩා අඩුවෙන් සිටින පාසල්වලට යන, අස්වැසුම ලබා ගන්න පවුල්වල දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවා. අනෙක් දීමනා නිසා ඒ දීමනාවට කිසිදු බලපෑමක් ඇති වන්නේ නැහැ. ඒ රුපියල් 6,000 දීමනාවත් ඒ විධියටම ඒ දරුවන්ට ලබා දෙනවා. එතකොට සමහර දරුවන්ට රුපියල් 31,000ක් විතර ලැබෙයි. අපි අපේ දරුවන්ට මේවා දෙන්න ඕනෑ. ඒකට තමයි අපි ආර්ථිකයක් හදලා මුදල් සංචිතයක් එකතු කරගෙන තිබෙන්නේ. මම දැක්කා පාර්ලිමේන්තුවේ හැම වෙලාවේම ඇහුවා, මෙහෙම මුදල් සංචිත තියාගෙන ඉන්නේ ඇයි කියලා. අපි ශක්තිමත්ව, ව්‍යසනයකට මුහුණ දෙන්න පුළුවන් තරමේ නඟාසිටුවීමක් මේ තුළින් ඇති කරලා තිබෙනවා. අපි දන්නවා, අපට මීට වඩා යන්න පුළුවන් කියලා. හැබැයි, මීට වඩා යන්න පුළුවන් තරමට අපි තවමත් ආර්ථිකය ගෙනැල්ලා නැහැ. මේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව තමයි අපි මේ සහන ලබා දෙන්න සැලසුම් කරලා තිබෙන්නේ.

මෙම ආපදාවේ බලපෑම හේතුවෙන් ව්‍යාපාරික ගොඩනැඟිලිවලට හානි වෙලා තිබෙනවා. හැබැයි, ඒවා එක එක ප්‍රමාණයෙන් තිබෙන්නේ, ඒවායේ යම් තක්සේරුවක් අපට අවශ්‍ය වනවා. ඒකකයකට උපරිම රුපියල් ලක්ෂ 50ක් දක්වා හානිපූර්ණ දීමනාවක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. රුපියල් ලක්ෂ 50ක් දෙන්නේ එම ව්‍යාපාරය නැවත ආරම්භ කරන්න; ගොඩනැඟිලි නැවත ඉදිකර ගන්න. ඒ ගොඩනැඟිල්ල හානියට ලක් වෙලා තිබෙන ප්‍රමාණය අනුව රුපියල් ලක්ෂ 50ක් ලබා දෙනවා, එවැනි ගොඩනැඟිල්ලක් නැවත ඉදිකර ගන්න.

ආපදාවේ බලපෑම හේතුවෙන් පූර්ණ වශයෙන් හානි සිදු වී ඇති පදිංචි වීමට නොහැකි නිවාස වෙනුවට නව නිවසක් ඉදිකර ගැනීමට අපි දීමනාවක් ලබා දෙනවා. සමහර තැන්වල නිවස සම්පූර්ණයෙන්ම නාය ගිහිල්ලා තිබෙනවා. තවත් සමහර තැන්වල ගංවතුරට නිවස කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. මෙවැනි දේ සඳහා සාමාන්‍යයෙන් ඉස්සර වන්දි විධියට දුන්නේ කොච්චර මුදලක්ද? සාමාන්‍යයෙන් ඉස්සර දුන්නේ රුපියල් ලක්ෂ 12යි; 16යි. අපි මේ සැරේට පමණක් කොපමණ මුදලක් දෙනවාද? පසුව ගංවතුරක් ආවොත් එතකොට ඒ ගැන බලමු. හැබැයි, මේ සැරේ අපි නිවසක් අහිමි වුණු අයට නැවත නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 50ක් ලබා දෙනවා.

සමහර අයට රුපියල් ලක්ෂ 50ට වඩා අධික වටිනාකම් සහිත නිවාස තිබෙන්න ඇති. සමහර අයට රුපියල් ලක්ෂ 50ට වඩා අඩු වටිනාකම් සහිත නිවාස තිබෙන්න ඇති. හැබැයි, අපට ඒවා නිශ්චිතව ගණනය කරන්න බැහැ. දැන් ඒවා ගහගෙන ගිහිල්ලා ඉවරයි. ඒ නිසා නිවසක් ඉදිකර ගැනීම සඳහා අපි රුපියල් ලක්ෂ 50ක දීමනාවක් දෙනවා. ඉඩමක් නැත්නම් මොකක්ද කරන්නේ? නිවසක් හදාගන්න රුපියල් ලක්ෂ 50ක් දුන්නාට, ඉඩමත් නාය ගිහිල්ලා නම් මොකක්ද කරන්නේ? එහෙම නැත්නම් එතැන අවදානමට ලක් වෙලා තිබෙනවා. එහෙම වුණත් නැවත අවදානම් කලාපයට යන්න උත්සාහ කළාට, ඒ අයට අපි එතැනට නැවත යන්න දෙන්නේ නැහැ. මම සෙනසුරාදා, ඉරිදා දවස්වල ඒ විශේෂ අවදානම් කලාපවලට ගිහිල්ලා ඒ පළාත්වල රජයේ ඉඩම් තිබෙනවාද කියලා හොයා බලන්න කටයුතු කරනවා. මම හෙට උදේ නුවර යනවා, හවස මාතලේ යනවා. ඊට පස්සේ නුවරඑළියට, බදුල්ලට යන්න කල්පනා කරනවා. ඒ පළාත්වල තමයි මේ ඉඩම් ප්‍රශ්නය තිබෙන්නේ. අපි ඒ දිසාපතිතුමන්ලා හම්බ වෙලා රජයේ ඉඩම් තිබෙනවාද කියලා හොයනවා. එහෙම වුණොත් මේ රුපියල් ලක්ෂ 50 ගන්න කෙනාට ගෙයක් හදාගන්න රජයෙන් ඉඩමක් දෙනවා. රජයෙන් දෙන්න ඉඩම් නැත්නම් රුපියල් ලක්ෂ 50 දක්වා දීමනාවක් දෙනවා. නිවසක් හදන්න දීපු රුපියල් ලක්ෂ 50ට අමතරව ඉඩමක් මිලදී ගැනීම සඳහා තවත් රුපියල් ලක්ෂ 50ක් දක්වා දීමනාවක් ලබා දෙනවා. මොකද, ඔවුන් සුරක්ෂිතව යළි පදිංචි කිරීම අපේ රජයේ වගකීමක් කියා අපි සලකන නිසා.

මෙම ආපදාවේ බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් හානි වූ නිවාස පිළිසකර කර ගැනීම සඳහා ගෙවනු ලබන දීමනාව බලන්න. නිවස ආපදාවට ලක් වෙලා තිබෙනවා, හැබැයි මුළුමනින්ම විනාශ වෙලා නැහැ. ඒවා ප්‍රතිසංස්කරණය කර ගන්න පුළුවන්. ඉඩමයි, නිවසයි දෙකම නාය ගියා නම් රුපියල් කෝටියක් හම්බ වනවා. එක්කෝ රුපියල් ලක්ෂ 50යි, ඉඩම මිලදී

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ගැනීම සඳහා රුපියල් ලක්ෂ 50යි. එක්කෝ රුපියල් ලක්ෂ 50යි, ආණ්ඩුවෙන් ඉඩමයි. ඒ, ඇයි? මේ ජන ජීවිත අපි සුරක්ෂිත කරන්න ඕනෑ නිසා. අපි හැම දෙනාම එකතු වෙලා මේ ජනතාව බලාගන්න ඕනෑකම තිබෙනවා. ආපදාවේ බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් නිවාස හානි වෙලා තිබෙනවා නම් ඉස්සර ඒවාට පොඩි පොඩි දීමනා දුන්නේ. තහඩු දෙකක් දාගන්න රුපියල් 5,000ක් දුන්නා. බිත්තියක් බඳින්න රුපියල් 2,000ක් දුන්නා. සාධාරණ නැහැ නේ, මනෝ ගනේෂන් මන්ත්‍රීතුමනි? එහෙම නේ ඉස්සර ගෙව්වේ. හැබැයි, අපි මොකක්ද කරන්නේ? අපි ආපදාවට පත් වෙලා තිබෙන නිවාසයකට උපරිම රුපියල් ලක්ෂ 25ක් දක්වා ඒ ගෙවල් යළි ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා මුදලක් දෙනවා. උපරිම රුපියල් ලක්ෂ 25යි. අපි හිතනවා, ඒක රුපියල් ලක්ෂ 10, 15, 20, 25 කියලා කාණ්ඩ හතරකට කඩන්න. තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10යි. ඇයි ඒ? තහඩුවක් ගියා කියන්නේ එතැන ඔවුන්ට නිවසක් නැහැ. අපි දන්නවා, ඒ පළාත්වල තිබෙන ප්‍රශ්නය. ඒගොල්ලන්ට අපි මොකක්ද කරන්නේ? නැවත ඒ නිවස ප්‍රතිසංස්කරණ කර ගැනීම සඳහා අපි ඔවුන්ට යම් දායකත්වයක් ලබා දෙන්න ඕනෑ. අපි ඒ අය නැවත ගේන්න ඕනෑ හිටපු තැනටම නොවෙයි.

හිටපු තැනට වඩා ටිකක් උඩට අපි ඒ අයව ගේන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි රුපියල් ලක්ෂ 10, 15, 20, 25 කියන කාණ්ඩ 4ක් හදලා, අර්ධ හානි වෙලා තිබෙන නිවාසවලට ඒ මුදල දෙන්න කටයුතු කරනවා. මෙම ආපදාවේදී මිය ගිය අය වෙනුවෙන් - ඔවුන්ගේ ජීවිතවල වටිනාකම මුදලින් තීන්දු කරන්න බැහැ - ඒ අයගේ ඥාතීන් වෙත රුපියල් ලක්ෂ 10ක වන්දියක් ලබා දෙන්න අපි තීරණය කරලා තිබෙනවා.

මේ සියලු කටයුතු සඳහා අපි 2025 අය වැය ලේඛනයෙන් රුපියල් බිලියන 72.2ක් අපේක්ෂා කරනවා. 2026 සඳහා අපි රුපියල් බිලියන 500ක් අපේක්ෂා කරනවා. අපේ ණය සීමාව වැඩි කර ගන්නේ නැතිව මේ රුපියල් බිලියන 500 හොයාගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. අපි අපේ ණය සීමාව ඉදිරිපත් කරලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවට. අපි කිසිසේත්ම පාර්ලිමේන්තුවට දැන් ඉදිරිපත් කරලා තිබෙන ණය සීමාව වැඩි කරන්නේ නැහැ. අපි ඉදිරිපත් කරලා තිබෙන ණය සීමාව තමයි, රුපියල් බිලියන 3,800. මගේ අය වැය කථාවේදී කිව්වා, මේ රුපියල් බිලියන 3,800 ණය සීමාව රුපියල් බිලියන 60කින් අඩු කරන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, ණය සීමාව රුපියල් බිලියන 3,740ක් කරන්න කියලා කිව්වා. හැබැයි, අය වැය කථාවේදී කළ ඒ යෝජනාව අපි අද සංශෝධනයක් ලෙස ඉදිරිපත් කරන්නේ නැහැ. මොකද, අපට ඒ රුපියල් බිලියන 60 අඩු වුණොත් අපේ ණය සීමාව රුපියල් බිලියන 3,740ක් වනවා. නමුත් ඒ රුපියල් බිලියන 3,800ම අපේ ණය සීමාව වශයෙන් තබා ගත යුතුයි කියලා අපි තීරණය කළා. ඒ නිසා ඒ රුපියල් බිලියන 60 අඩු කිරීමේ සංශෝධනය අපි ඉදිරිපත් කරන්නේ නැහැ.

අපට දැන් කාණ්ඩ දෙකක් තිබෙනවා, ක්‍රියාත්මක කරන්න. එකක් තමයි, මේ දින 25ට වියදම් කරන්න රුපියල් බිලියන 72.2ක් තිබෙනවා. අද අපි සම්මත කරන 2026 අය වැය ලේඛනය ජනවාරි මාසයේ ඉඳන් ක්‍රියාත්මක වනවා. ඒ ඉදිරිපත් කරන අය වැයට අපි පරිපූරක ඇස්තමේන්තුවක් ගේන්න බලාපොරොත්තු වනවා, රුපියල් බිලියන 500ක. ඒ රුපියල් බිලියන 500 සඳහා මම කලින් කියන ලද ගොඩක් යෝජනා අපි ඇතුළත් කරලා තිබෙනවා. රුපියල් බිලියන 72.2න් යෝජනා කරන දේවල් අපි ගැසට් නිවේදනයකින් අද නිකුත් කරනවා. එතකොට අපට ප්‍රශ්නයක් පැන නඟිනවා.

අපි කවුරුත් දන්නවා, මේ වනකොටත් අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය යෝජනා ක්‍රමය ඇතුළේ සිටින බව. මම දැක්කා ගොඩක් අය මේ සභාවේ කෑ ගහනවා, ඒ ගිවිසුමෙන් අයින් වෙන්න, අලුත් ගිවිසුම් යෝජනා කරන්න කියලා. ඒ ගිවිසුම් එහෙම යෝජනා කරන්න පුළුවන්, විපක්ෂ නායකතුමායි, සභානායකතුමායි අතර නම් ගහලා තිබෙන්නේ. මේවා එහෙම ඒවා නොවෙයි. මේවා ජාත්‍යන්තර නිර්ණායක මත එළඹෙන ලද එකඟතා. හිටපු මුදල් අමාත්‍ය රවී කරුණානායක මැතිතුමාත් මේ පිළිබඳව දන්නවා. අපට හෙට දවසේ කියන්න පුළුවන්ද, මේ ගිවිසුමෙන් අයින් වෙනවා කියලා? හෙට දවසේ කියන්න පුළුවන්ද, මේ ගිවිසුම කඩන්න කියලා? එහෙම කඩන්න බැහැ. එහෙම කඩන්න නම් අපි මොකක්ද කරන්න ඕනෑ? ඒ එකඟතා බිඳින්නත් සමාලෝචනයක් අවශ්‍යයි. එකඟතා වෙනස් කරන්නත් සමාලෝචනයක් අවශ්‍යයි. මම දැක්කා මේ සභාවේ කෑ ගහලා කියනවා, අපට බැරි නම් ඒ පුද්ගලයා කථා කරන්නම් කියලා. අනේ please, එපා. මම අපහාස කරනවා නොවෙයි. නමුත් එහෙම නොවෙයි ඒවා කරන්නේ. ඒවාට කොන්දේසි තිබෙනවා. කොන්දේසි කියලා කියනවාට වඩා සුදුසුයි අපි මේ සම්බන්ධව යම් එකඟතාවලට ඇවිල්ලා තිබෙන්නේ කිව්වා නම්. අපි ඒ එකඟතාවලට ඇවිල්ලා තිබෙන්නේ කුමක් මතද? ජාත්‍යන්තර එකඟතා කියන්නේ යම් මූලධර්මයක් මත එකඟ වුණු දේවල්. ඒ එකඟතා බිඳිනවා නම් සමාලෝචනයකට යන්න ඕනෑ. දැන් අපි පස්වෙනි සමාලෝචනය අවසන් කරලා තිබෙන්නේ, අපි නිලධාරි මට්ටමේ agreement එක sign කරලා තිබෙන්නේ. එළඹෙන 15වෙනි දා ඒක ඒගොල්ලන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දීමට සැලසුම් කරලා තිබුණා. හැබැයි, දැන් තත්ත්වය වෙනස්.

අපි කලින් එළඹුණු නිලධාරි මට්ටමේ එකඟතාවට වඩා වෙනසක් දැන් ඇති වනවා. වෙනසක් ඇති වනවා නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට යෝජනා කර තිබෙනවා සහ අප අතර කථා බහක් ඇති වී තිබෙනවා, මෙය දෙසැම්බර් මාසයේ Board එකට දාන්නේ නැතිව ජනවාරි හෝ පෙබරවාරි දක්වා කල් තියන්න. ඒකට අපි එකඟයි. හේතුව, දෙසැම්බර් මාසයේ අපට ලැබීමට තිබෙන්නේ ඩොලර් බිලියන 342ක වාරිකයක්. අපි සාකච්ඡා කරමින් ඉන්නවා, ඒ වාරිකය වැඩි කර ගැනීමට. ඒ වාරිකය වැඩි කර ගන්න නම් අපට සාකච්ඡාවක් අවශ්‍යයි, කාලයක් අවශ්‍යයි. මේ, තනි පුද්ගලයකු මුදල් දෙනවා නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සාමාජික රටවලින් එක්රැස් කර ගත් මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ මුදල් වියදම් කිරීම ගැන ඔවුන් ඒ ඒ රාජ්‍යයන්ට වග කියන්න බැඳී සිටිනවා. දැන් අපට ගංවතුර ගැලුවා, අපේ ගාණ වැඩි කරන්න කිව්වාට එහෙම කරන්න බැහැ. ඒකට යම් සමාලෝචන ක්‍රියාවලියක් අවශ්‍යයි. ඒ නිසා මේ දෙසැම්බර් මාසයේ 15වෙනි දා ලබා දීමට නියමිතව තිබූ හයවෙනි වාරිකය උපරිම පෙබරවාරි මාසය දක්වා කල් යනවා. අපි ජනවාරි මාසයේදී නිලධාරි මට්ටමේ සාකච්ඡා පටන් ගන්නවා. පෙබරවාරි මාසයේදී අපට ඒ වාරිකය නිදහස් කර ගන්න පුළුවන් වෙයි. ඒ ඩොලර් බිලියන 342ක වාරික මුදල වැඩි කර ගැනීම පිළිබඳ ඉල්ලීම අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

හැබැයි, එහෙත් අපිට ක්ෂණික ඩොලර් අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා අපි ක්ෂණිකව අරමුදල් සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක සහනයක් ඉල්ලා තිබෙනවා. ඒ සහනය අපිට මේ මාසයේ ලබා දෙන්න කියන ඉල්ලීම අපි කරලා තිබෙනවා. ඔවුන් ඒකට ඵලදායී ප්‍රතිචාර දක්වයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. ඒ හා බැඳුණු ලෙස දැන් අපි ආසියානු සංවර්ධන බැංකුව එක්කත් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින් නැවත නඟාසිටුවීම සඳහා අවශ්‍ය වන

අරමුදල් සම්පාදනය කර ගැනීම වෙනුවෙන්. අද වනකොට අපි ඒ දිසාවෙන් ඒ ජාත්‍යන්තර සංවිධාන එක්ක කථා කරමින්, ඒ කටයුත්ත කරමින් යනවා.

හැබැයි, දැන් අපි මේ පරිපූරක ඇස්තමේන්තුව සකස් කරලා තිබෙනවා. පරිපූරක ඇස්තමේන්තුවේ මුදල අපි තීරණය කරලා තිබෙනවා. හැබැයි, ඒ ව්‍යාපෘති ටික දැන් අපි නම් කර ගන්න ඕනෑ. ඒකට අපිට කාලයක් අවශ්‍යයි. ඒ සඳහා කාලයක් අවශ්‍ය නිසා අද අපිට ඒ පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැහැ. අපි අපේක්ෂා කරනවා, මේ මාසයේ 19වැනි දා පාර්ලිමේන්තුවේදී ඒ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගන්න. මම හිතනවා, විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම ඒ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීම සඳහා සහාය දෙයි කියලා. වෙන දා අය වැය විවාදයෙන් පසුව පාර්ලිමේන්තුව ජනවාරි මාසයේ රැස් වුණත්, මේ අවුරුද්දේ දෙසැම්බර් මාසයේ දිනයක මම හිතන විධියට රැස් වෙන්න වෙයි. ජනවාරි 06වැනි දා දක්වා පාර්ලිමේන්තුව කල් තැබීමට තමයි දැනට අපි එකඟතාව පළ කරලා තිබෙන්නේ. අග්‍රාමාත්‍යතුමියට පුළුවන්, හදිසි තත්ත්වයක් යටතේ පාර්ලිමේන්තුව කැඳවන්න. ඒ පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවේ විවාදයට ගන්න න්‍යාය පුස්තකයට ඇතුළත් විය යුතුව තිබෙනවා. ඊට අනුරූපීව දිනය සකස් කරලා, 19වැනි දා මා මේ කියන ලද පරිපූරක ඇස්තමේන්තුව සම්මත කරලා දෙන්න කියලා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිනවා. කමක් නැහැ නේද? අපට ඒ අවස්ථාව ලබා දෙන්න. මොකද, අපට ඒ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීම අවශ්‍යයි. අපිට ප්‍රමාද වෙන්නත් අවශ්‍ය නැහැ. අපිට කලබල වෙන්න ඕනෑත් නැහැ. අපිට වියදම් කරන්න තිබෙන්නේ ජනවාරි 01වැනි දා ඉඳලා. ප්‍රමාද වෙන්නත් බැහැ, අපිට ජනවාරි 01වැනි දායින් පසුපසට යන්නත් බැහැ. ඒ නිසා අපි මේ හදලා තිබෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඒ පරිපූරක ඇස්තමේන්තුව අවශ්‍යයි. ඇයි, ඒ? අපේ යටිතල පහසුකම්වල විශාල බිඳ වැටීමක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි යටිතල පහසුකම් ටික සංවර්ධනය කරන්න ඕනෑ. මා කලින් කියූ පරිදි ඒකට අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන අපි වෙන් කර ගන්න ඕනෑ. පාලම් 40කට ආසන්න ප්‍රමාණයක් මේ ආපදා තත්ත්වය හේතුවෙන් මුළුමනින්ම විනාශයට පත් වෙලා තිබෙනවා. මේ වනවිට අපි පාලම් 12කට ආසන්න ප්‍රමාණයක් ගොඩනඟලා තිබෙනවා. තව පාලම් 8ක් ගොඩනැඟීම සඳහා සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒවා ඉතා ඉක්මනින් අපිට අවසන් කර ගන්න පුළුවන්. අපි දෙසැම්බර් 31වැනි දා වෙනකොට පාලම් 30ක කටයුතු අවසන් කිරීම සඳහා දැනට සැලසුම් සකස් කරලා තිබෙනවා. මොකද, මේ මාර්ග පද්ධතිය අතර සම්බන්ධය යළි අපි හදන්න ඕනෑ. ඒ මාර්ග පද්ධතිය සකස් කර ගැනීම වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය දැනටමත් ඉතා විධිමත් සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ඒ විධිමත් සැලැස්ම අනුව අපිට හැකියාව තිබෙනවා, මේ බිඳ වැටී තිබෙන මාර්ග පද්ධතිය සංවර්ධනය කරන්න. පාලම් කඩා වැටිලා තිබෙනවා. දැනටමත් අපි සැලකිය යුතු ප්‍රමාණයකින් මේ සම්බන්ධය හදලා තිබෙනවා. හැබැයි, සමහර පාරවල්වලට අපිට ළඟ වෙන්න බැරි තරමේ ප්‍රශ්න මතු වෙලා තිබෙන බව අපි දැක්කා. ඒ නිසා අපි මේ මාර්ග පද්ධතිය ඉතා ඉක්මනින් පිළිසකර කර ගන්න ඕනෑ.

ඊළඟට, විදුලි බලය ගත්තාම, ආරම්භයේදී සියයට 58කට වාගේ තමයි විදුලි බලය තිබුණේ. දැන් සියයට 87කට ආසන්න ප්‍රමාණයකින් විදුලි බලය ලබා දෙන්න අපි සමත් වෙලා තිබෙනවා. අපි දන්නවා, මහියංගනයේ 132 kV විදුලි සම්ප්‍රේෂණ පද්ධතිය බිඳ වැටිලා තිබෙන බව. ඒ නිසා මොකද වෙලා තිබෙන්නේ? අම්පාර, මඩකලපුව, මහියංගනය ආදී ප්‍රදේශවල විදුලි සැපයුම ඇනහිටලා තිබෙනවා. ඒ නිසා ඒක ප්‍රතිසංස්කරණය කළ යුතුයි. දැනට අපි 32 kV යටතේ අඩු ධාරිතාවකින් යුතුව විදුලිය ලබා දෙමින් තිබෙනවා. නමුත්, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ විදුලිය සැපයුම සකස් කර ගැනීම සඳහා අපි වෙහෙස වෙමින් කටයුතු කරනවා. මම හිතන්නේ සතියක්, දෙකක් ඇතුළත අපට විදුලිය සැපයුම මුළුමනින්ම සම්පූර්ණ කරන්න පුළුවන්.

ඒ වාගේම, සන්නිවේදන පහසුකම්වලින් සියයට 94ක් මේ වෙනකොට අපි සම්පූර්ණ කරලා තිබෙනවා. ඉතුරු සන්නිවේදන පද්ධතිය අපිට සම්පූර්ණ කරලා දෙන්න පුළුවන්. ඊළඟට, ජල සම්පාදන හා ජලාපවහන පද්ධතිය ගත්තාම, ඒවාත් කඩා වැටිලා තිබුණා. ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අපි සැලසුම් හදලා තිබෙනවා. ඒ වාගේම රේල් පාරවල් සකස් කළ යුතුව තිබෙනවා. අපිට තවමත් සැලසුම් හදා ගන්න බැහැ, කවදා ඒවායේ කටයුතු අවසන් කරන්න පුළුවන් වෙයිද කියලා. හැබැයි, හැකි සෑම දෙයක්ම අපි විවෘත කරනවා. අපිට අවශ්‍ය වන්නේ මොකක්ද? මේ ව්‍යසනයට මුහුණ දුන්නාට පස්සේ දැන් සමහර අය කියනවා, මේ ව්‍යසනය විසින් කර ගත්ත එකක් කියලා. අනේ, කරුණාකරලා ගිහිල්ලා නඩුවක් දමන්න; කියවන්නේ නැතුව ඉන්න. නඩුවක් දමන්න, අපි ඒකට මුහුණ දෙන්න ලැහැස්තියි. ඒ වෙනුවට මොකක්ද කරන්න ඕනෑ? අපි ඒ පිළිබඳව නම් කිසිම අවධානයක් යොමු කරන්නේ නැහැ.

අපේ ප්‍රමුඛ අවශ්‍යතාව බවට පත් වෙලා තිබෙන්නේ බිඳ වැටුණු ජන ජීවිතය නඟාසිටුවන එකයි. ඒ හැමකෙනාටම හැමදාම අවතැන් කඳවුරුවල ඉන්න බැහැ. හැමකෙනාටම තමන්ගේ ජීවිතයට හෙට මොනවා වෙයිද, අද මොනවා වෙයිද කියලා අවිනිශ්චිතතාවෙන් ජීවත් වෙන්න බැහැ. ඒ නිසා අපේ පළමුවැනි අපේක්ෂාව තමයි, මේ ජනතාවගේ ජීවිතය යළි යථාවත් කිරීම. ඒ සඳහා තමයි මේ යෝජනා හදලා තිබෙන්නේ.

දෙවැනි අපේක්ෂාව මෙකයි. මේ ආර්ථිකය චලනය වෙන්න පටන් ගන්න ඕනෑ. කුඹුරු ටික වගා කරන්න ඕනෑ. සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත ටික පටන් ගන්න ඕනෑ. බැංකු පද්ධතිය සක්‍රිය වෙන්න පටන් ගන්න ඕනෑ. ව්‍යාපාරිකයින්ට බැංකු ණය ගන්න ඕනෑ. ආර්ථිකයේ ප්‍රතිලාභ ගමට ගලා ගෙන යන්න ඕනෑ.

ඒ වෙනුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ටික ගොඩගන්න ඕනෑ. එහෙමයි අර්බුදයකට මුහුණ දෙන්නේ. මම දැක්කා එක් හිටපු නායකයෙක් කියනවා, විපක්ෂයේ ආපදා කළමනාකරණ කමිටුවක් හදනවා ලු, කියලා. කමිටුව රැස් වෙච්ච දිනයක්වත් තවම නැහැ. එහෙම කමිටුවක් හැදුවාද දන්නේ නැහැ. මොනවාද, මේ? මේවා බාල්දි. මේවා රට ගැන හිතලා කරන වැඩ නොවෙයි. අපි රට පිළිබඳව වගකීමෙන් වැඩ කරනවා. ඒ නිසා අපි සියලු සැලසුම් හැදුවා. දිවා රෑ නොබලා මේ පිළිබඳව සැලසුම් හදමින් අපි වැඩ කරමින් ඉන්නවා.

ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය මෙකයි. අපි මේකට යන්ත්‍රණයක් හැදුවා. මම කලින් කිව්වා වාගේ අපට ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත හරහා යන්නත් පුළුවන්, එහෙම නැත්නම් මහජන ආරක්ෂක ආඥාපනත හරහා යන්නත් පුළුවන්. අපි තෝරා ගත්තේ මහජන ආරක්ෂක ආඥාපනත හරහා මේකට යන ප්‍රවේශයයි. අපේ කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා, මේ රට නැවත ගොඩනැංවීම සඳහා අවශ්‍ය වන ජනාධිපති කාර්ය සාධක බලකායක් හදන්න. ඒ ජනාධිපති කාර්ය සාධක බලකාය යටතේ අරමුදල් එක්රැස් කිරීම සඳහා කමිටුවක් හදනවා. පාර්ලිමේන්තුවේ කෑ ගහනවා මම දැක්කා, මේ අරමුදල් වියදම් කිරීම ජාවාරම්කාරයින්ට දීලා කියලා. නැහැ, තවමත් මෙම අරමුදලේ account එක තිබෙන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ නමට. අපේ ඒකාබද්ධ අරමුදලට මුදල් බැර වෙන්නේ. ඒකාබද්ධ අරමුදලට බැර වන මුදල් වියදම් කරන්න ඕනෑ, පාර්ලිමේන්තුව. ඒක කරන්නේ අර තෝරා ගත් අරමුදල් එක්රැස් කර ගැනීමේ කමිටුව නොවෙයි. ඒක තේරුම් ගන්න බැහැ, මේ මහත්වරුන්ට.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

හැබැයි, අපි ව්‍යවස්ථාපිත අරමුදලක් හදනවා. නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව හිතූ හිතූ විධියට අරමුදල් හදන්න බැහැ. ඒක හොඳයි. අලුත් නීතියක් ආවා. අරමුදලක් පිහිටුවනවා නම් පාර්ලිමේන්තුවේ පනතක් ඕනෑ. ඇයි, එහෙම නීති එන්නේ? සුනාමි අරමුදලට වෙච්ච දේවල් දැකලා. මට මතකයි, මුදල් ඇමති වශයෙන් රවී කරුණානායක මැතිතුමා කටයුතු කරපු කාලයේ ඔය අරමුදල් ඔක්කොම භාණ්ඩාගාරයට පවරා ගන්න උත්සාහ කළා. එහෙම උත්සාහ කළා නේද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඒක නේ. මේ අරමුදල්වලට හැම වෙලාවේදීම මොකක්ද වෙන්නේ? මේ අරමුදල් ඉතාම අගතිගාමී ලෙස උපයෝගී වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව අරමුදලක් පිහිටුවිය හැක්කේ පනතකින්. මේ පාර්ලිමේන්තුවේ අනුමැතියකින් විතරයි ව්‍යවස්ථාපිත අරමුදලක් පිහිටුවිය හැක්කේ. ඒක වැදගත් නීතියක්. මෙතැන ආන්දෝලනයට තුඩු දෙනවා මම දැක්කා, මේ නීතිය යටතේ නැතුව හදලා කියලා. අපි එහෙම හදලා නැහැ. අපි අරමුදල් එක්රැස් කර ගැනීම සඳහා කණ්ඩායමක් පත් කර තිබෙනවා. ඒ අරමුදල් එක්රැස් කිරීමේ ආකාර කිහිපයක් පිළිබඳව අපි කල්පනා කර තිබෙනවා. එක ආකාරයක් තමයි, විදෙස් රටවල් සමඟ අපේ තිබෙන සබඳතා එක්ක අරමුදල් එක්රැස් කරන එක. ඒ නිසා තමයි ඒ කමිටුවේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් නියෝජනය කරන්නේ. ඔහු තමයි විදෙස් රටවල් එක්ක සම්බන්ධීකරණ කටයුතු කරන්නේ. ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, UNDP වැනි ඒවා මුදල් අමාත්‍යාංශය එක්ක කටයුතු කරනවා. ඒ නිසා තමයි මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමාත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ඒ කමිටුව නියෝජනය කරන්නේ, ඒ කාර්යය භාර ගන්න. ඒ වාගේම, තවත් අය මුදල් එක්රැස් කරනවා. ඒ, කවුද? විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්. ඒගොල්ලන් සම්බන්ධීකරණය කරන්න තමයි අපේ ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරියෙක් මැදිහත් වන්නේ. ඊළඟට, ආධාර ලබා දෙනවා, B2B - ව්‍යාපාර සහ ව්‍යාපාර අතර - සබඳතාව මාර්ගයෙන්. අපේ රටේ වාණිජ මණ්ඩලය වෙන රටවල තිබෙන වාණිජ මණ්ඩල සමඟ සබඳතා තිබෙනවා. එතකොට ඒ වාණිජ මණ්ඩල එක්ක තිබෙන සබඳතාවලින් ආධාර ලබා ගන්න නම් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිතයෙක් ඉන්න ඕනෑ. ඒ නිසා තමයි, ක්‍රිෂාන් බාලේන්ද්‍ර මැතිතුමා ඒ කමිටුව නියෝජනය කරන්නේ. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා ඒ කමිටුව නියෝජනය කරන්නේ, B2B වශයෙන් අරමුදල් එක්රැස් කර ගැනීම සඳහායි. මොකක්ද, එහි ඇති වැරැද්ද?

ඊළඟට, විවිධ ව්‍යාපාර සංගම් තිබෙනවා. නැව් සමාගම්වල agentsලා ලංකාවේ ඉන්නවා. විශාල නැව් සමාගම්වල agentsලා ලංකාවේ ඉන්නවා; විශාල buyersලාගේ agentsලා ලංකාවේ ඉන්නවා. ඒගොල්ලන්ගෙනුත් අපි යම් මුදල් ප්‍රමාණයක් එකතු කරගන්න උත්සාහ කරන්න ඕනෑ. ඒ අනුව තමයි ඒ කමිටුව හැදුවේ. හැබැයි, ඒ කමිටුව සම්බන්ධයෙනුත් මෙතැන කෑ ගහනවා මම දැක්කා, ජාවාරම්කාරයෝ කියලා. එතුමාම දන්නවා, එතුමා ගැන. එතුමා මේ අවස්ථාවේ හිටියා නම් හොඳයි. එතුමා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා හැටියට කටයුතු කළා, 2018 අවුරුද්දේ. හන්තානේ බංගලාව ජනවසමට අයිතියි. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාට මම යෝජනා කරනවා, ඒ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. ඒක දුන්නේ තමන්ගේ බෑනාට. මාසයකට කුලිය රුපියල් ලක්ෂයයි. 2048 අවුරුද්ද වෙනකල් අවුරුදු 30කට ලබා දුන්නා. ඉතින්, අරමුදල් එනකොට මෙතැන කට්ටියත් එතුමා වාගේයි කියලා හිතනවා. එතුමාට මම කියන්නේ, හන්තානේ ජනවසමට අයිති බංගලාව තමන්ගේ බෑනාට ලබා දුන්නේ මොන පදනමින්ද කියලා කියන ලෙසයි.

ඒ විතරක් නොවෙයි. රවී කරුණානායක මැතිතුමනි, ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ ඉන්න කාලයේ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය එයාර්බස් මිලදී ගැනීමේ ගිවිසුම අහෝසි කළේ කොහොමද? ඒක අහෝසි කරනකොට ඇමති කවුද? මේ "ව්‍යාපාරික ජාවාරම්කරුවන්" කියලා කෑ ගහන කෙනා තමයි ඒ වෙලාවේ ඇමති. ඒක cancel කරන්න ඩොලර් මිලියන 118ක් අපට ගෙවන්න සිදු වුණා. අපට ගුවන් යානා නැහැ, cancel කරන්න. අහිතකර ඒවාට යන්න සිද්ධ වුණා. ඒ හිටපු ඇමති ඇවිල්ලා මෙතැන කියනවා, ජාවාරම්කරුවන් මේකට දාලා කියලා. දැනට ඒකාබද්ධ අරමුදලට තමයි මේ අරමුදලේ මුදල් යන්නේ. මේ පාර්ලිමේන්තුවට තමයි ඒ මුදල් පිළිබඳ බලය තිබෙන්නේ. හැබැයි මෙතැන තිබෙනවා, කුරිරු ආසාවක්. ඇයි ඒ? අරමුදල ගැන සැකය හදනවා. ජාවාරම්කරුවන් එනවා කියලා සැකය හදනවා. මොකක්ද ඒ වුවමනාව? මේ අරමුදල ශක්තිමත් වෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ කියා හිතනවා. බලය පිළිබඳ නොනිසි ආසාවකින් පෙළෙනවා, ඒ මන්ත්‍රීවරයා. ඒක තමයි 1,000ක් මැරුණා කියලා කෑ ගහන්නේ. එතුමා මොකක්ද කියන්නේ? ඒක සාධාරණද? අරමුදල ගැන සැකයක් හදන්න හදනවා.

පුරවැසියන් ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. බාහිර පුද්ගලයන් මීට කලින් කිව්වේ මොකක්ද? ආණ්ඩුවට දෙන්න එපා, වෙන වෙන අයට දෙන්න කියලා කිව්වා. මේ දවස්වල හැම තැනම නැඟෙන හඬ මොකක්ද? වෙන වෙන අයට දෙන්න එපා, ආණ්ඩුවට දෙන්න කියන එක. ඊයේ මම ගංගාරාමයේ නායක හාමුදුරුවන්වහන්සේ මුණ ගැහුණා. උන්වහන්සේ ප්‍රසිද්ධියේ කිව්වා, ආණ්ඩුවට දෙන්න, වෙන අයට දෙන්න එපා කියලා. ආණ්ඩුව කෙරෙහි එහෙම විශ්වාසයක් තිබෙනවා. ඒ විශ්වාසය තමයි මේ අරමුදල ශක්තිමත් කරන්නේ. එතුමාගේ අපේක්ෂාව වුණේ මොකක්ද? ඒ විශ්වාසය බිඳීම. ඒ විශ්වාසය බිඳින්න කුරිරු ආසාවකින් පෙළෙන බවයි මේකෙන් පෙන්නුම් කරන්නේ. ඒ නිසා අපි ඉතාම ශක්තිමත් යන්ත්‍රණයක් හදනවා මේ තත්ත්වයට මුහුණ දෙන්න. එකක්, අපි ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවනවා. මීට අදාළ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ව්‍යාපාරික සංවිධාන, මහජන ව්‍යාපාර නියෝජනය කරන ජනාධිපති කාර්යසාධක බලකායක් හදනවා. ඒ ජනාධිපති කාර්යසාධක බලකාය යටතේ ඒකක 7ක් හදනවා. ඒකේ එකක් තමයි, අරමුදල් එක්රැස් කිරීම. දෙක තමයි recovery plan එක හැදීම. තුන්වැන්න තමයි ඉදිකිරීම් පිළිබඳ කටයුතු කිරීම. ඉදිකිරීම් පිළිබඳ කාර්යභාරය ප්‍රධාන වශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව භාර ගනීවි. මොකද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් ඉක්මනින්ම පණ පොවන්න ඕනෑ. මහ කන්නය ආරම්භ කරන්න වාරි මාර්ගවල කරන්න වැඩ ටිකක් තිබෙනවා. විශේෂයෙන්ම ඇළහැර අමුණ හදන්න ඕනෑ. ඇළහැර අමුණ අවශ්‍යයි. මොකද, අපට ගිරිතලේ වැවේ වතුර ප්‍රමාණවත් වෙන්නේ සති දෙකකට වාගෙයි. ඒ නිසා ඉක්මනින්ම ඇළහැර අමුණ හදන්න ඕනෑ. මොරගහකන්දෙන් එන වතුර අපි යවන්න ඕනෑ. අද ඇළහැර අමුණ හදන්නේ හමුදාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ස්වේච්ඡා සේවකයන් මැදිහත් වෙලා. අපි විශ්වාස කරනවා, දවස් කිහිපයක් ඇතුළත ඇළහැර අමුණ හදලා අවසන් කරන්න පුළුවන් කියලා. මේ මොහොතේත් වැඩ.

ගොවියොත් ඇවිල්ලා වැඩ කරනවා ඇළහැර අමුණ හදන්න. අපි මොකද කරන්නේ? වාරිමාර්ග, මහාමාර්ග, ඉදිකිරීම් පිළිබඳව ඉතා හොඳින් මෙහෙයවීම සඳහා අනු කමිටුවක් පත් කරනවා, ජනාධිපති කාර්යසාධක බලකාය යටතේ.

ඒ වාගේම හොඳ සන්නිවේදන කමිටුවක් අපට අවශ්‍යයි, මේ කථාව කියන්න, ජාත්‍යන්තරයට ගෙනියන්න, පණිවුඩ ගෙනියන්න. ඒ වෙනුවෙන් සන්නිවේදන ඒකකයක් අවශ්‍යයි. Units 7ක් අපි හදනවා. නිවාස ගොඩනැඟීම සඳහා තව ඒකකයක් හදනවා. හැබැයි, ක්‍රියාත්මක වෙන්නේ තිබෙන රාජ්‍ය යන්ත්‍රණය හරහා. නමුත් සැලසුම් ටික හදන්න ඕනෑ. මම ආරාධනා කරනවා, එතැනට එන්න කියලා. මේක අපි හදමු. එච්චරයි අපේ යෝජනාව වෙන්නේ. අපි ඒක හදන්න ලැහැස්තියි. හැබැයි අපි හිතනවා, ජනාධිපති කාර්ය සාධක බලකාය විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියලා. නීතිඥ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරන්න අපි අද රාත්‍රී එකතු වෙනවා. මේ සඳහා අපි විශේෂ විධිවිධාන පනතක් ඉතා ඉක්මනින් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරනවා. මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා අවුරුදු දෙකක, තුනක plan එකක් අපට අවශ්‍යයි. මේ ව්‍යසනය දෙස ඔබ බලන්න. විශාල ව්‍යසනයක් සිදු වී තිබෙනවා. ඒ නිසා අඩුම තරමේ අවුරුදු තුනකවත් අඛණ්ඩ සැලැස්මක් අපට අවශ්‍යයි. ඒ සැලැස්ම සඳහා අවශ්‍ය වන විශේෂ විධිවිධාන පනතක් ගේන්න අපි සැලසුම් කර තිබෙනවා. අපේ plan එක වෙන්නේ, "Rebuilding Sri Lanka" වැඩසටහන. ඒක අපි උඩට ගන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වෙන සැලසුම් ටික සකස් කර තිබෙනවා.

ඒ වාගේම අපට අවශ්‍යයි ස්ථාවර සැලසුම්. මේක මේ විධියට යන්න බැහැ. ස්ථාවර සැලසුම් අවශ්‍යයි. මම හිතනවා අපේ ගුවන් බළගණය ඉතාම දුප්පත් කියලා. අපේ හෙලිකොප්ටර් අවුරුදු 7කට ආසන්න කාලයක් බිම නතර කරලායි තිබෙන්නේ. හෙලිකොප්ටරයක කාලය මනින්නේ, අවුරුදුවලින්. ගතවෙන හැම අවුරුද්දක්ම අපට හානියක්. අවුරුදු 7ක් තිස්සේ අපේ හෙලිකොප්ටර් බළගණය බිමට පහත් කර තිබෙනවා.

ඒකේ Mi-17 කියන හෙලිකොප්ටර් 5ක් අලුත්වැඩියා කරන්න අපි මේ වන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තිබෙනවා. මේවා කලින් කරන්න තිබුණු ඒවා. අපි ඇවිල්ලා, ටෙන්ඩර් කැඳවලා, මේ හෙලිකොප්ටර් 5ක් නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දැනටමත් ටෙන්ඩරය ප්‍රදානය කරලා ඉවරයි.

ඊළඟට, Bell 212 කියන හෙලිකොප්ටරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරලා, ටෙන්ඩරය ප්‍රදානය කරලා තිබෙනවා. තව Mi-17 හෙලිකොප්ටර් 7ක් බිම තිබෙනවා. ඒ 7ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අපි දැන් ආරම්භ කරලා තිබෙන්නේ. මාසයක් දෙකක් ඇතුළත අපට ඒවා ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්න පුළුවන්. එතකොට අපේ හෙලිකොප්ටර් බලඇණිය තව 12කින් වැඩි වෙනවා. එහෙමයි රටක් මුහුණ දෙන්න ඕනෑ. ව්‍යසනවලට කෑ ගහන එක නොවෙයි කරන්න ඕනෑ. අපි මේවා කලින් දැකලා, ගිහිල්ලා බැලුවා, අපේ හෙලිකොප්ටර් බලඇණියේ තිබෙන දුබලකම. අපේ ගුවන් හමුදාවට අපි ගෞරව කරන්න ඕනෑ. ඔවුන්ගේ ජීවිත පිළිබඳ අවදානම නොතකා මේ ගුවන් යානා ගෙනියනවා, මිනිස්සු බේරා ගැනීම වෙනුවෙන්. හැබැයි, වටිනා ගුවන් යානා, හෙලිකොප්ටර් විශාල ප්‍රමාණයක් අවුරුදු ගණන් බිම. අපි ඒවා හදනවා. මේ ව්‍යසනය ආපුවාම නොවෙයි, අපි ඒවා කලින් පටන් ගත්තේ. ව්‍යසනය ආවාම කරන දෙයක් නොවෙයි. ඒකයි මම කිව්වේ, දැනටමත් 5ක්; Mi-17 4ක් සහ Bell 212 කියන හෙලිකොප්ටරයක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරලා තිබෙනවා. ඉතුරු 7 සම්බන්ධයෙනුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අපි පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා අපේ බල ගණයට අලුතෙන් ප්‍රතිසංස්කරණය කරපු හෙලිකොප්ටර් 12ක් ඇතුළත් වෙනවා.

ඊළඟට, මිග් ප්‍රහාරක යානා 4ක් අලුත්වැඩියා කරන්න ඊශ්‍රායලයට දීලා තිබෙනවා. මේ දෙසැම්බර් මාසයේ ඒ අලුත්වැඩියා කටයුතු අවසන් කරලා ලංකාවට ඒ මිග් ප්‍රහාරක යානා 4ම නැවත ලබා ගැනීමට නියමිතයි. අපි අපේ ගුවන් බලඇණිය ශක්තිමත් කිරීමේ අපේක්ෂාවක ඉන්නවා. ඒ නිසා තමයි අපි රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හරහා ඉතාම හොඳ දියුණු ගුවන් යානා අපට ඉල්ලලා තිබෙන්නේ. ඇමෙරිකා එක්සත් ජනපදයෙන් C-130 කියන හොඳ ගුවන් යානයක් 2026දී පරිත්‍යාග කරනවා. ඕස්ට්‍රේලියාවත් අපට පරිත්‍යාග කරනවා. ඇයි, අපට ඕනෑ මෙවැනි ගුවන් යානා. ඒ යුද්ධ කරන්න නොවෙයි. මෙවැනි ව්‍යසනයකට ශක්තිමත් ගුවන් බලඇණියක් අපට අවශ්‍යයි. මේ බලඇණිය ගොඩනැඟීම සඳහා අපි මේ ව්‍යසනය එන්න කලින්ම මේ අවුරුද්ද ඇතුළත තීන්දු අරගෙන තිබෙනවා.

ඊළඟට, අපේ ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට බැකෝ නැහැ; ට්‍රැක්ටර් නැහැ; මෝටර් ග්‍රේඩර් නැහැ. කොහොමද, මේ ව්‍යසනයට මුහුණ දෙන්නේ? අපි මේ ප්‍රශ්නය දැක්කා. දැකලා, මේ අය වැය ලේඛනය එන්නත් කලින්ම, මේ ව්‍යසනය එන්නත් කලින්ම ප්‍රාදේශීය සභාවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර 700ක් ගේන්න රුපියල් කෝටි 770ක් වෙන් කරලා, දැන් එහි ප්‍රසම්පාදන කටයුතු අවසන් කරලායි තිබෙන්නේ. දැන් ඉවරයි. දැන් ටෙන්ඩරය ප්‍රදානය කරන්න තිබෙන්නේ. තව මාස දෙකක් තුනක් යනකොට අපේ ප්‍රාදේශීය සභාවලට අවශ්‍ය කරන බැකෝ යන්ත්‍ර, මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර ගේනවා. අපට ඕනෑ මොකක්ද? අපි කොහොමද මෙවැනි ව්‍යසනයකට මුහුණ දෙන්නේ, ප්‍රාදේශීය සභාවට, නගර සභාවට බැකෝ එකක්, මෝටර් ග්‍රේඩර් එකක් නැතුව? අද නුවර දිසාපතිතුමා කථා කරලා කිව්වේ මොකක්ද? බැකෝ යන්ත්‍ර 8ක් විතර ඕනෑ, කොහේවත් නැහැ කියලා කිව්වා. ඉතින් අපි උත්සාහ කරනවා, හොයලා දෙන්න. ඇයි? ප්‍රාදේශීය සභා, නගර සභා ඔක්කෝම අඩපණ වෙලා තිබෙන්නේ. අපි එහෙම ආයතන මේ ගොඩනඟමින් තිබෙන්නේ. ඒ නිසා තමයි රුපියල් කෝටි 770ක් මේ 2025 වසරේ වෙන් කරලා ටෙන්ඩර් කැඳවලා අවසන් කරලා තිබෙන්නේ. ප්‍රදානය කරනවා, ඉක්මනින්ම. පෙබරවාරි, මාර්තු වෙනකොට ඒ මෝටර් ග්‍රේඩර්, බැකෝ යන්ත්‍ර ඔක්කෝම ගෙනැවිත් මේ රට ස්ථාවර කරනවා, මෙවැනි ව්‍යසනයකට මුහුණ දුන් පසු ඇති වන දුෂ්කරතා වළක්වන්න.

ඊළඟ කාරණය තමයි, මෙවැනි ව්‍යසනයක් ඇතිවීම වළක්වන්න ඕනෑ. විශේෂයෙන් නාය යෑම්. අපේ රටේ ගංගා අසබඩ ගෙවල් ඇති වුණේ කොහොමද? කඳු මුදුන්වල නිවෙස් ඇති වුණේ කොහොමද? මොන ප්‍රාදේශීය සභාවද ඒවාට අනුමැතිය දුන්නේ? මේවාට අනුමැතිය අවශ්‍යයි. ඒ වාගේම NBRI එකේ අනුමැතිය අවශ්‍යයි. නමුත් ඒ අනුමැතින් කොහොමද ලැබුණේ? අද කඳු මුදුන්වල නිවාස ගොඩනැඟිලා තිබෙනවා. ගංගා අසබඩ නිවෙස් ගොඩනැඟිලා තිබෙනවා. පසුගිය කාලේ අපේ රටේ trend එකක් ආවා, කන්දක් මුදුනේ ගෙයක් හදා ගන්න එක; වැවක් අසබඩ නිවසක් හදා ගන්න එක; ගඟක් අසබඩ නිවසක් හදා ගන්න එක ගැන. ඒක ධනවත්භාවයේ ලක්ෂණයක් වාගේ එකක් ආවා. මෙහෙම trend එකක් ආවා. ඇවිල්ලා, මුළු ගං ඉවුරු යට වෙලා තිබෙනවා, කඳු බර වෙලා තිබෙනවා, මේවායින්. වැව් තාවුලු විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මොකද කරන්නේ? අපි දැඩි නීති සම්පාදනය කරනවා. ඒ නිසා අපි ඉතාම ශක්තිමත්ව ඉන්නවා, මතක තබා ගන්න, යළි කිසිදු අනවසර තැනක අපේ රටේ නිවසක් ඉදි කර ගන්න දෙන්නේ නැහැ.

කොළොන්නාවට සිද්ධ වුණේ ඒකයි. කොළොන්නාව අවුරුද්දට කී පාරක් නම් ජලයෙන් යට වෙනවාද? කවුද අවසර

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

දුන්නේ, ඒ ඉදිකිරීම් කරන්න? ඒවා හදන කල් බලාගෙන හිටියා. එක්කෝ, පොඩි ගණනක් දීලා අවසර අරගෙන තිබෙනවා. එහෙම නැත්නම්, සභාපතිගේ ඥාතියා නිසා, සභාපතිට canvassing ගිය කෙනා නිසා අවසර දීලා. එහෙමයි මේ රට මේ ව්‍යසනයට පත් වුණේ. මේවායෙන් මේ රට මුදා ගන්න ඕනෑ.

අපි ඉල්ලා තිබෙනවා, මධ්‍යම කඳුකරයේ ඇත්ත තත්ත්වය අපට නිරීක්ෂණය කරලා දෙන්න කියලා. ආසියානු සංවර්ධන බැංකුව අපට එයට එකඟතාව පළ කර තිබෙනවා. සමහර වාර්තා පළ වෙනවා, මධ්‍යම කඳුකරය ගැන බයයි කියලා. ඒ වාර්තා අනුව අඩි 5,000කට වඩා වැඩි උසකින් ජනතාව ජීවත් වන ප්‍රදේශවල යළි වන වගාව ඇති කරන්න ඕනෑ. අපි එම ඉඩම් සහ දේපළ ආණ්ඩුවෙන් වන්දි දීලා පවරා ගන්න කටයුතු කරනවා. මේ රට යළි ප්‍රතිස්ථාපනය කරන්න ඕනෑ. මොකද, මහා සාරවත්, වටිනාකම් සහිත මධ්‍යම කඳුකරය අපේ ඇස් ඉදිරිපිට නාය යමින් තිබෙනවා; අපේ ඇස් ඉදිරිපිට මිනිස් ජීවිත බිලි ගනිමින් තිබෙනවා. අපි ඇස් ඉදිරිපිට මහා ඛේදවාචකයකට මුහුණ දෙමින් තිබෙනවා. අපි රන්ටැඹේ ජලාශය හැදුවා. හැබැයි, වතුර තිබෙන්නේ සියයට 52කට ආසන්න ප්‍රමාණයක් විතරයි. රන්දෙණිගල ජලාශය හැදුවා. වතුර තිබෙන්නේ සියයට 48කට ආසන්න ප්‍රමාණයක් විතරයි. ඇයි ඒ? ඒවා රොන්මඩවලින් පිරිලා. කඳු සෝදාගෙන වැව්වලට ගිහිල්ලායි තිබෙන්නේ. මේ රටට මෙහෙම වනකල් මෙච්චර කාලයක් බලාගෙන හිටියා. හැබැයි, අපි බලාගෙන ඉන්න සූදානම් නැහැ. ඒ නිසා අපි විපක්ෂයේ හැම දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මේ කාරණයේදී එක්ව කටයුතු කරමු කියලායි. ඒ මිස වෙන මුකුත් නොවෙයි. මේක සත්කාර්යයක්; මේක මේ රටේ ජාතික කාර්යයක්. නැවත අපේ රටට මෙවැනි ව්‍යසනයක් සිදු වුණොත්, එයින් විය හැකි හානිය අවම කරගත යුතුයි. වහින එක නතර කරන්න අපට බැහැ. සුළි කුණාටු එන එක නතර කරන්න අපට බැහැ. හැබැයි, ඒවායෙන් වන හානිය නතර කරන්න අපට පුළුවන්. ඒවායෙන් ජීවිත බිලි ගන්න එක නතර කරන්න අපට පුළුවන්. ඒවා නතර කිරීම සඳහා අවශ්‍ය වන ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් හදන්න අපි සැලසුම් කර තිබෙනවා.

ලෝක බැංකුව අපට දැනටමත් ප්‍රකාශයට පත් කර තිබෙනවා දෙසැම්බර් 15 වනකොට අපට සිදු වුණු මේ හානිය පිළිබඳව දළ ඇස්තමේන්තු වාර්තාවක් -සම්පූර්ණ වාර්තාවක් නොවෙයි- ලබා දෙන්නම් කියලා. දැනට ඒගොල්ලෝ අධීක්ෂණය කරමින් යනවා. සම්පූර්ණ වාර්තාව දෙන්න මාස තුනක් විතර යයි. හැබැයි, දෙසැම්බර් 15 වනකොට මේ සිදු වුණු හානියේ තරම දළ වශයෙන් දැනගන්න අපට පුළුවන්. මෙවැනි හානියක් අපේ රටට ඔරොත්තු දෙයිද; අපේ ජාතියට ඔරොත්තු දෙයිද? මේක ඔරොත්තු දෙන්නේ නැති හානියක්. ඒ නිසා මම හිතනවා, මෙම ප්‍රශ්නයට විසඳුම් සොයා ගැනීම සඳහා ස්ථාවර සැලැස්මකට අප යා යුතුයි කියලා.

ඊළඟට මම විශේෂ යෝජනාවක් කරනවා. අපි මෙතැනින් එහාට යන්නේ කොහොමද? මළමිනී මත නැඟලා දේශපාලනය කරන්න ලැහැස්තිද? කුරිරු බලාපොරොත්තුවලින් දේශපාලනය කරනවාද? උදේ, රාත්‍රියේ විනාශයක් ප්‍රාර්ථනා කරන මනසකින් දේශපාලනය කරනවාද? ආණ්ඩුවත් එක්ක තිබෙන ප්‍රශ්න දේශපාලනයෙන් බේරාගන්න. ආණ්ඩුවත් එක්ක තිබෙන ප්‍රශ්න ආර්ථිකය කඩා වට්ටමින් බේරාගන්න උත්සාහ කරන්න එපා. ආණ්ඩුවත් එක්ක තිබෙන ප්‍රශ්න, ජනතාවගේ ජීවිත විනාශ කරමින් බේරාගන්න උත්සාහ කරන්න එපා. ආණ්ඩුවත් එක්ක තිබෙන ප්‍රශ්න දේශපාලනයෙන් බේරාගන්න. අපි ඒකට ලැහැස්තියි. බලය, ඡන්දයකදී ගන්න. ඒක නේ කරන්න තිබෙන්නේ. ඊට වඩා මාවත් නැහැ, ඔයගොල්ලන්ට. ඒ නිසා ඒකට අවශ්‍ය මනස ලැහැස්ති කර ගන්න. ආණ්ඩුව හෙට වැටෙයි, අනිද්දා වැටෙයි, අසල්වැසි රටවල යුද්ධය පටන් ගත්තාම වැටෙයි, මැදපෙරදිග අර්බුදයෙන් වැටෙයි, American tariff ප්‍රශ්නයෙන් වැටෙයි, ගංවතුරෙන් වැටෙයි කියලා හිතනවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මම දැක්කා සමහර අය ලියා තිබෙනවා, විපක්ෂයට අන්තර් පාලනයකට සූදානම් වෙන්න කියලා. විපක්ෂයට අන්තර් වාර ආණ්ඩුවකට ලැහැස්ති වෙන්න ලු. පාර්ලිමේන්තුවට බලය ගන්න ලු. මේ පාර්ලිමේන්තුවට තමයි බලය තිබෙන්නේ. අපි කිසිසේත්ම මේ පාර්ලිමේන්තුවට පටහැනිව මූල්‍ය බලය උපයෝගී කරගෙන නැහැ. සමහර ඒවාට උපයෝගී කර ගැනීමේ හැකියාව තිබෙනවා, ජනාධිපතිවරයාට. ඒත් අපි පාර්ලිමේන්තුවට යටත්ව තමයි අපේ මූල්‍ය බලය ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව තමයි පාලනය සිදු කරමින් ඉන්නේ. මේ ව්‍යවස්ථාව කැඩුවා කියලා අධිකරණයෙන් තීන්දු ලබපු අය ව්‍යවස්ථාවක් ගැන දැන් අපට කියනවා. වැරැදිකරුවන් වෙලා කියලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් පස්දෙනෙකුගෙන් යුත් විනිසුරු මඬුල්ලකින් තීරණය කරලා තිබෙනවා. ඒ අය ඇවිල්ලා අපට ව්‍යවස්ථාවේ පාඩම් කියලා දෙනවා. මම නම් කියන්නේ, ඒ "කුරිරු මනස" කියලායි. මම ඒ නායකයාට කියනවා, අනේ ඔය පැරැණි රොඩු බොඩු ටික එකතු කර කර දඟලන්නේ නැතිව, කෑම පාර්සල් 10ක් අරගෙන ගිහිල්ලා කොළොන්නාවේ අවතැන් වෙච්ච ජනතාවට දෙන්න කියලා. මම මේ ඉල්ලන්නේ මේ ව්‍යසනයෙන් දේශපාලනය කරන්න එපා කියලායි. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ එවැනි දේශපාලනයක්ද? මේ ආකල්ප අත් හරින්න කියලා අපි ආරාධනා කරනවා.

මේ පාර්ලිමේන්තුවේ සාම්ප්‍රදායික ලෙස විපක්ෂයක් තිබෙනවා, ආණ්ඩුවක් තිබෙනවා. අපි යෝජනා කරනවා, අවුරුදු තුනක න්‍යාය පත්‍රයකට අනුව කටයුතු කරමු කියලා. මේ රටට මේ ව්‍යසනයෙන් ගොඩ එන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, මෙවැනි ව්‍යසන ඇති වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග හදන්න ඕනෑ. මොකද, සමහර නීති ක්‍රියාත්මක කරන කොට, අනවසර තැන්වල ඉදිකිරීම් කරපු කෙනා ඉවත් කරන කොට ජාතික එකමුතුභාවයක් තිබෙන්න ඕනෑ. නැත්නම් ඒක දේශපාලනයක් වෙනවා. මොකද, එතැනට ගිහිල්ලා මිනිස්සු අවුස්සයි, 'ඔයගොල්ලන් ඔතැනින් අයින් කරන්නයි එන්නේ' කියලා. කඳුවල පදිංචි මිනිස්සු අවුස්සයි, 'ඔයගොල්ලන් අයින් කරන්නයි එන්නේ' කියලා. එහෙම කටයුතු කරන්න බැහැ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ සාම්ප්‍රදායිකව තිබෙන ආණ්ඩුව සහ විපක්ෂය කියන බෙදීමෙන් අයින් වෙලා අවුරුදු තුනක්, හතරක් ජාතික සභාවක් ලෙස එකට වැඩ කටයුතු කරමු කියලා මම ඉල්ලා සිටිනවා; ජාතික සභාවක් ලෙස.

ජාතික ප්‍රශ්නයක් තිබෙනවා. අනෙක් දේශපාලන ප්‍රශ්න දේශපාලන පොර පිටියේදී බේරා ගනිමු. දේශපාලන ප්‍රශ්න නුගේගොඩ රැස්වීමක් තියලා බේරා ගනිමු. එහෙම නේද? කවුරු හරි ජනාධිපති කෙනෙක් එයි ඒවා බේරා ගන්න. නමුත් මෙතැන තිබෙන්නේ මොකක්ද? ජාතික සභාවක්. මේ ව්‍යසනය හමුවේවත් පොදු න්‍යාය පත්‍රයකට එමින්, ඇති වී තිබෙන මේ ව්‍යසනය හමුවේ මේ රට ගොඩ නැඟීම සඳහා අප සමත් වෙන්නේ නැත්නම් මොකක්ද වෙන්නේ? මම අහන්නේ එක දෙයයි. මේ රටේ මිනිස්සු මේ පාර්ලිමේන්තුවට තමුන්නාන්සේලා එව්වේ මොකටද? තමන්ගේ වරප්‍රසාද වෙනුවෙන්ද, තමන්ගේ බලයක් වෙනුවෙන්ද, තමන්ගේ සුඛවිහරණය වෙනුවෙන්ද? නැහැ. පොදු ජනතාවගේ වුවමනාව වෙනුවෙන් පාර්ලිමේන්තුවට ආවා කියලා කල්පනා කරන හැම මන්ත්‍රීවරයෙකුටම මම ආරාධනා කරනවා, ඉදිරි අවුරුදු තුනහතරක් යනකල් ඔබ ජාතික සභාවක් හැටියට කල්පනා කරමින් කටයුතු කරන්න කියලා. එතකොට අපට මේ ප්‍රශ්නය තිරසර ලෙස විසඳිය හැකියි.

ඒ වාගේම කර්මාන්තකරුවන්ටත්, ව්‍යාපාරිකයන්ටත් අපි ආරාධනාවක් කරනවා. මා ඒ අයට බෙහෙවින්ම ස්තුතිවන්ත

වෙනවා. සමහර අයට ව්‍යාපාරිකයන් ජාවාරම්කරුවන් ලෙස පෙනුණේ මොකක් නිසාද? ඒගොල්ලන් හිතාගෙන හිටියා, එම ව්‍යාපාරික ලෝකය ඒගොල්ලන්ගේ ලෝකයයි කියලා. ඒගොල්ලන් හිතාගෙන හිටියා, ව්‍යාපාරික ලෝකය කියන්නේ ඒගොල්ලන්ගේ කරට අත දමා ගන්නා ලෝකයයි කියලා. දැන් ඒගොල්ලන්ට මොකද වෙලා තිබෙන්නේ? ඉතාම සද්භාවයෙන් කටයුතු කරන ආණ්ඩුවකට එම ව්‍යාපාරික ප්‍රජාව ඉතා ශක්තිමත්ව සහාය දෙනවා. එතකොට ඒගොල්ලන්ට ඒ ව්‍යාපාරිකයා ජාවාරම්කාරයා වෙනවා. ඇයි? ඒ ව්‍යාපාරිකයන්ගේ ලෝකයට අපි ඇතුළු වුණා. ඒගොල්ලෝ හිතුවේ නැහැ, ඒ ලෝකයට අප ඇතුළු වෙයි කියලා. ඒ නිසා මහා විද්වතුන්ට මෙතැනදී අපහාස කරනවා. ස්වේච්ඡාවෙන් වැඩ කරන මිනිසුන්ට, ශතයකවත් පඩි ගන්නේ නැති මිනිසුන්ට මෙතැනට ඇවිල්ලා උදේ හවා පහර ගහනවා. ඇයි ඒ? ඒ පහර දෙන අය අපේක්ෂා කළේ නැහැ, එවැනි පිරිස් මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ජනතාව වෙනුවෙන් කරන මේ කාර්යයට ස්වේච්ඡාවෙන් මැදිහත් වෙයි කියලා. ඒගොල්ලන්ගේ තොටිල්ල ගැස්සෙනවා නේද? ඒගොල්ලන් හිතපු නැති ලෝකයකට අපි ඇතුළු වෙලා තිබෙනවා; ඒගොල්ලන් හිතපු නැති ව්‍යාපාරික කණ්ඩායම් අපට සහාය දෙමින් තිබෙනවා; න්‍යාය පත්‍ර සකස් කරමින් තිබෙනවා. අපේ රටේ ඉහළම ක්ෂේත්‍රවල සිටින විද්වතුන්, බුද්ධිමතුන් මේ ආණ්ඩුව එක්ක වැඩ කරන්න ස්වේච්ඡාවෙන් මැදිහත් වෙමින් ඉන්නවා. එය හමුවේ ඒගොල්ලන් අපේක්ෂා භංගත්වයට පත් වෙලා ඉන්නවා. ඒ අපේක්ෂා භංගත්වයේ වේදනාව තමයි ඒගොල්ලෝ විටින් විට පිට කරන්නේ. මම දැක්කා, ඒගොල්ලෝ නිරන්තරයෙන් ඇවිල්ලා හාන්ස් විජයසූරිය මහත්මයාට, දුමින්ද හුලංගමුව මහත්මයාට, ගෝමික මහත්මයාට, එයාර්ලංකා එකේ ගනේගොඩ මහත්මයාට, ආණ්ඩුකාර හනිෆ් යූසුෆ් මහත්මයාට පහර ගහනවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? ඒගොල්ලෝ හිතුවේ ඒක ඒගොල්ලන්ට අයිති ලෝකය කියලායි. නැහැ, ඒ හැම පුරවැසියාම යහපත් ආණ්ඩුවකදී තමන්ගේ දැනුම, තමන්ගේ කාලය ස්වේච්ඡාවෙන් වැය කරන්න සූදානම් කියන මාවත තෝරා ගත් මිනිස්සු. මම තවදුරටත් ආරාධනා කරනවා. තමුන්නාන්සේලා ඒකට සූදානම් නැති වුණාට, රට සූදානම් වෙලා තිබෙන්නේ. ඒක තමයි මේ සංඥා ඔක්කෝගෙන්ම එන්නේ. අපි තමුන්නාන්සේලාටත් මේ සඳහා ආරාධනා කරනවා. කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයන්, බුද්ධිමතුන්, විදේශගත ශ්‍රී ලාංකිකයන් ඇතුළු සියලු දෙනාට අපි ආරාධනා කරන්නේ මේ ව්‍යසනය හමුවේ එකතු වෙලා කටයුතු කරමු කියලායි. මේ ව්‍යසනය ඉතාම වේදනාකාරී ව්‍යසනයක්; ඉතාම කනගාටුදායක ව්‍යසනයක්. එහෙත් මේ ව්‍යසනය හමුවේ අපි අලුත් පාරක් තෝරා ගනිමු. අපි හැම දෙනාම එක් වෙලා මේ රාජ්‍යය, යහපත් රාජ්‍යයක් බවට පත් කර ගැනීම සඳහා මැදිහත් වෙමු කියලා ආරාධනා කරමින්, මම නතර වෙනවා.

බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

## වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
## வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சு
MINISTRY OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

| | | |
|---|---|---|
| පුනරාවර්තන | රු. | 2,200,000,000 |
| මූලධන | රු. | 500,000,000 |

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"17 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

' මූලධන රු. 2,250,000,000' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"මූලධන වියදම සඳහා රු. 2,250,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 2,250,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 2,250,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"116 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 500,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

116 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 60,000,000

"116 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 60,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

116 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 500,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 60,000,000

“தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 60,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 500,000,000, for Head 116, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 116, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 60,000,000

Question, "That the sum of Rs. 60,000,000, for Head 116, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 116, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 700,000,000; මූලධන වියදම, රු. 100,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 700,000,000; மூலதனச் செலவு, ரூபாய் 100,000,000

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 700,000,000; Capital Expenditure, Rs. 100,000,000

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 116 වන වැය ශීර්ෂයේ 02 වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"18 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 02
සංවර්ධන වැඩසටහන රු. 700,000,000 රු. 1,600,000,000' "

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අයවැය යෝජනා අංක 26 හා 59 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 116 - වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා සඳහා රු. 1,500,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"116 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 700,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

116 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"116 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,600,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

116 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 700,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 1,600,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 116, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளை யிடப்பட்டது.

Question, "That the sum of Rs. 700,000,000, for Head 116, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 116, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 1,600,000,000, for Head 116, Programme 02, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 116, Programme 02, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**295 වන ශීර්ෂය.- වාණිජ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 326,000,000

"295 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 326,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

295 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 30,000,000

"295 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 30,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

295 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**297 වන ශීර්ෂය.- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 125,000,000

"297 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 125,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

297 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**298 වන ශීර්ෂය.- මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 245,000,000

"298 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 245,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

298 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**299 වන ශීර්ෂය.- ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම රු. 80,000,000

“299 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 80,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

299 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 295.- வாணிபத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 326,000,000

“தலைப்பு 295, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 326,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 295, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 30,000,000

“தலைப்பு 295, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 30,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 295, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 297.- கம்பனிகள் பதிவாளர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 125,000,000

“தலைப்பு 297, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 125,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 297, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 298.- அளவுக்கூறுகள், கட்டளைகள் மற்றும் சேவைகள் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 245,000,000

“தலைப்பு 298, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 245,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 298, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 299.- இலங்கை தேசிய புலமைச் சொத்து அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 80,000,000

“தலைப்பு 299, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 80,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 299, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 295.- DEPARTMENT OF COMMERCE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 326,000,000

Question, "That the sum of Rs. 326,000,000, for Head 295, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 295, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 30,000,000

Question, "That the sum of Rs. 30,000,000, for Head 295, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 295, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 297.- DEPARTMENT OF THE REGISTRAR OF COMPANIES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 125,000,000

Question, "That the sum of Rs. 125,000,000, for Head 297, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 297, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

HEAD 298.- DEPARTMENT OF MEASUREMENT UNITS, STANDARDS AND SERVICES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 245,000,000

Question, "That the sum of Rs. 245,000,000, for Head 298, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 298, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

HEAD 299.- NATIONAL INTELLECTUAL PROPERTY OFFICE OF SRI LANKA

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 80,000,000

Question, "That the sum of Rs. 80,000,000, for Head 299, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 299, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**300 වන ශීර්ෂය.- ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 103,000,000; මූලධන වියදම, රු. 207,000,000

**தலைப்பு 300.- உணவு ஆணையாளர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 103,000,000; மூலதனச் செலவு, ரூபாய் 207,000,000

HEAD 300.- DEPARTMENT OF FOOD COMMISSIONER

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 103,000,000; Capital Expenditure, Rs. 207,000,000

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, 300 වන වැය ශීර්ෂයේ 01වන වැඩසටහන සඳහා මා සංශෝධනය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***මතු පළ වන යෝජනාව සභා සම්මත විය:***
*தீர்மானிக்கப்பட்டது:*
*Resolved:*

"18 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතුය:

'වැඩසටහන 01
මෙහෙයුම් වැඩසටහන රු. 103,000,000 රු. 457,000,000' "

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(මෙම සංශෝධනයේ අභිප්‍රාය වනුයේ අයවැය යෝජනා අංක 24 යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඇතුළත් කරමින්, වැය ශීර්ෂ අංක 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා රු. 250,000,000කින් මූලධන ප්‍රතිපාදන වැඩි කිරීමයි.)

"300 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 103,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

300 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"300 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 457,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

300 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 300, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 103,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 300, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

"தலைப்பு 300, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 457,000,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 300, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு திருத்தப் பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளை யிடப்பட்டது.

Question, "That the sum of Rs. 103,000,000, for Head 300, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 300, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Question, "That the increased sum of Rs. 457,000,000, for Head 300, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 300, Programme 01, Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

**301 වන ශීර්ෂය.- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්)**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 95,000,000

"301 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 95,000000,ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"301 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 102,000,000

"301 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 102,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"301 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**302 වන ශීර්ෂය.- සමුපකාර සේවක කොමිෂන් සභාව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 26,000,000

"302 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 26,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"302 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 1,000,000

"302 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

302 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**தலைப்பு 301.- கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம் (கூட்டுறவுச் சங்கங்களின் பதிவாளர்)**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 95,000,000

"தலைப்பு 301, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 95,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 301, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 102,000,000

"தலைப்பு 301, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 102,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 301, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 302.- கூட்டுறவு ஊழியர்கள் ஆணைக்குழு**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 26,000,000

"தலைப்பு 302, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 26,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 302, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 1,000,000

"தலைப்பு 302, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 1,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 302, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

HEAD 301.- DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT (REGISTRAR OF CO-OPERATIVE SOCIETIES)

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 95,000,000

Question, "That the sum of Rs. 95,000,000, for Head 301, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 301, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 102,000,000

Question, "That the sum of Rs. 102,000,000, for Head 301, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 301, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 302.- CO-OPERATIVE EMPLOYEES COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 26,000,000

Question, "That the sum of Rs. 26,000,000, for Head 302, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 302, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,000,000

Question, "That the sum of Rs. 1,000,000, for Head 302, Programme 01, Capital Expenditure, be inserted in the Schedule "put and agreed to.

Head 302, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
## பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு
MINISTRY OF PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

| | |
|---|---|
| පුනරාවර්තන | රු. 6,000,000,000 |
| මූලධන | රු. 12,000,000,000 |

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා විසර්ජන පනත් කෙටුම්පත, 2026 කාරක සභා අවස්ථාවේදී, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා පහත සඳහන් සංශෝධනය

ඉදිරිපත් කරනවා:

"27 වන පිටුවේ, 17 සහ 18 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කළ යුතු ය:

| | |
|---|---|
| 'පුනරාවර්තන | රු. 13,350,000,000 |
| මූලධන | රු. 11,700,000,000' " |

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කාරක සභාව එකඟ ද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

"පුනරාවර්තන වියදම සඳහා රු. 13,350,000,000 දක්වා වැඩි කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පුනරාවර්තන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"මූලධන වියදම සඳහා රු. 11,700,000,000ක් දක්වා අඩු කළ මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

මූලධන වියදම සංශෝධිතාකාරයෙන් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"மீண்டுவருஞ் செலவுக்கான அதிகரிக்கப்பட்ட ரூபாய் 13,350,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மீண்டுவருஞ் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

“மூலதனச் செலவுக்கான குறைக்கப்பட்ட ரூபாய் 11,700,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

மூலதனச் செலவு திருத்தப்பட்டவாறு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the increased sum of Rs. 13,350,000,000, for Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Recurrent Expenditure, as amended, ordered to stand part of the Schedule.

Question, "That the decreased sum of Rs. 11,700,000,000, for Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Capital Expenditure, as amended, ordered to stand part of the Schedule.

"135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,668,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 176,000,000

"135 වන ශීර්ෂයෙහි 0 1වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 176,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

135 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

“தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபாய் 1,668,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு, ரூபாய் 176,000,000

“தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபாய் 176,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக” எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 135, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs.1,668,000 ,000,for Head 135, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 176,000,000

Question, "That the sum of Rs. 176,000,000, for Head 135, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 135, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,710,000,000; මූලධන වියදම, රු. 10,678,000,000**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,710,000,000; மூலதனச் செலவு, ரூபாய் 10,678,000,000

## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, I move,

> "That the Proclamation made by the President under Section 2 of the Public Security Ordinance (Chapter 40), as amended by Act, No. 8 of 1959 and Law, No. 6 of 1978 of the National State Assembly and Act, No. 28 of 1988, bringing into operation the provisions of Part II of the aforesaid Ordinance throughout Sri Lanka with effect from 28th November, 2025, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, I move,

> "That the Proclamation made and published in Gazette Extraordinary No. 2464/29 of 28th November 2025 and Schedule thereto, by virtue of the powers vested with the President in terms of Section 2 of the Essential Public Services Act, No. 61 of 1979, which was presented on 03.12.2025, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත: නියෝග
## கொழும்பு துறைமுக நகர பொருளாதார ஆணைக்குழுச் சட்டம்: ஒழுங்குவிதிகள்
## COLOMBO PORT CITY ECONOMIC COMMISSION ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මුදල් පනත: නියෝගය
## நிதிச் சட்டம்: ஒழுங்குவிதி
## FINANCE ACT: REGULATION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## එකතු කළ අගය මත බදු පනත: නියෝගය
## சேர் பெறுமதி வரிச் சட்டம்: ஒழுங்குவிதி
## VALUE ADDED TAX ACT: REGULATION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වගන්තිය යටතේ ආනයනය කළ භාණ්ඩවල වටිනාකම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත: නියෝගය
## துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம்: கட்டளை
## PORTS AND AIRPORTS DEVELOPMENT LEVY ACT: ORDER

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## එකතු කළ අගය මත බදු පනත: නියෝග
## சேர் பெறுமதி வரிச் சட்டம்: ஒழுங்குவிதிகள்
## VALUE ADDED TAX ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 71 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 31 දිනැති අංක 2460/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.12.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සුරාබදු ආඥාපනත: රීති
## மதுவரிக் கட்டளைச் சட்டம்: விதிகள்
## EXCISE ORDINANCE: RULES

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025 ඔක්තෝබර් 04 දින පනවන ලදුව, 2025.11.08 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 15 දිනැති අංක 2458/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත: නියමය
## விசேட வியாபாரப் பண்ட அறிவீட்டுச் சட்டம்: கட்டளை
## SPECIAL COMMODITY LEVY ACT: ORDER

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 සහ 5 වගන්ති යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 09 දිනැති අංක 2457/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥාපනත: යෝජනා සම්මතය
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.11.26 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 ඔක්තෝබර් 09 දිනැති අංක 2457/06 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.11.27 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 නොවැම්බර් 07 දිනැති අංක 2461/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 243 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: செலவினத் தலைப்பு 243 - நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 243 - PROGRAMME 01

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස් එක්දහස් පන්සියයක් (රු. 31,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**උපලේඛනය**

| | | |
|---|---|---|
| **ශීර්ෂය 243 -** | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන 01-** | මෙහෙයුම් වැඩසටහන | |
| | පුනරාවර්තන වියදම් | රු. 31,500,000,000 |
| | **මුළු වියදම** | **රු.31,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 249 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: செலவினத் தலைப்பு 249 - நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 249 - PROGRAMME 01

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන දහඅට දහස් පන්සියයක් (රු. 18,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 249 - | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | මූලධන වියදම් | රු. 18,500,000,000 |
| | | මුළු වියදම | රු. 18,500,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 240 - වැඩසටහන 02
## குறைநிரப்புத் தொகை: செலவினத் தலைப்பு 240 - நிகழ்ச்சித்திட்டம் 02
## SUPPLEMENTARY SUM: HEAD 240 - PROGRAMME 02

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන පනස් දහසක් (රු. 50,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **240 -** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | | |
| **වැඩසටහන** | **02 -** | සංවර්ධන වැඩසටහන | | |
| | | පුනරාවර්තන වියදම් | රු. | 20,000,000,000 |
| | | මූලධන වියදම් | රු. | 30,000,000,000 |
| | | **මුළු වියදම** | **රු.** | **50,000,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත: නියෝග
## தேசிய மருந்துகள் ஒழுங்குபடுத்தும் அதிகாரசபைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## NATIONAL MEDICINES REGULATORY AUTHORITY ACT: REGULATIONS

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 04 දිනැති අංක 2452/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.28 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ජාතික සමුපකාර සංවර්ධන ආයතනය: වාර්ෂික වාර්තාව (2023)
## தேசிய கூட்டுறவு அபிவிருத்தி நிறுவகம்: ஆண்டறிக்கை (2023)
## NATIONAL INSTITUTE OF CO-OPERATIVE DEVELOPMENT: ANNUAL REPORT (2023)

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ VI වන කොටසේ 29 වගන්තිය යටතේ 2025.05.09 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා කජු සංස්ථාව: වාර්ෂික වාර්තාව (2019)
## இலங்கை மரமுந்திரிகைக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2019)
## SRI LANKA CASHEW CORPORATION: ANNUAL REPORT (2019)

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

"1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# ශ්‍රී ලංකා කජු සංස්ථාව: වාර්ෂික වාර්තාව (2020)
## இலங்கை மரமுந்திரிகைக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கை (2020)
## SRI LANKA CASHEW CORPORATION: ANNUAL REPORT (2020)

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම: වාර්ෂික වාර්තාව (2022/2023)
## களுபோவிட்டியான தேயிலை தொழிற்சாலை லிமிரெட்: வருடாந்த அறிக்கை (2022/2023)
## KALUBOWITIYANA TEA FACTORY LIMITED: ANNUAL REPORT (2022/2023)

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2025.02.20 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2004 වර්ෂයේ සිදුවූ සුනාමි ව්‍යසනයෙන් පසු මෑත කාලීනව ශ්‍රී ලංකාව මුහුණ දුන් ව්‍යසනකාරීම ස්වාභාවික විපත අත්විඳීමෙන් අනතුරුව, රාජ්‍යයක් ලෙස සහ එකම ශ්‍රී ලාංකික ජාතියක් ලෙස නැවත නැඟී සිටීමට සැවොම එකාවන්ව වෙර දරමින් සිටින මොහොතක, රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය සතු ව්‍යවස්ථාදායකය වෙත පැවරී තිබෙන වගකීම් ඉටු කරමින්, පුරා දින විස්සක කාලයක් පැවැත්වූ 2026 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පතට අදාළ අය වැය විවාදය සාර්ථක අන්දමින් නිමා කර, එහි කටයුතු සමාප්ත කිරීමේ මොහොතට දැන් අපි එළඹ සිටින්නෙමු.

ගරු මන්ත්‍රීවරුනි, ප්‍රථමයෙන් ම පසුගිය දිනවල රට තුළ සිදුවූ හදිසි ස්වාභාවික ආපදාවලින් ජීවිතක්ෂයට පත්වූ අයගේ සියලුම පවුල්වල ඥාතීන් වෙත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සාතිශය සංවේගය පළ කිරීමට මම කැමැත්තෙමි. එසේම, තුවාල ලැබූ සියලු දෙනාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත් කැමැත්තෙමි.

රට තුළ පැන නඟින කාලීන ගැටලු පිළිබඳව සැණෙකින් අප සියලු දෙනා යාවත්කාලීන කරමින්, එම ගැටලු සඳහා විසඳුම් සෙවීමට උත්සාහ ගන්නා අතරම, මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකය වෙත පැවරී ඇති වගකීම් නිසි අන්දමින් අවබෝධ කර ගනිමින් ඒ සඳහා අතිශය සාධනීය අදහස් සහ ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කරමින් අය වැය විවාදයට සම්බන්ධ වූ පක්ෂ, විපක්ෂ ඔබ සැම දැක්වූ සහයෝගය ඉතා ආදර්ශවත් ය.

මූල්‍ය සුපරීක්ෂණය, නිසි යෙදවීම සහ වගවීම තහවුරු කිරීම මඟින් විශ්වාසවන්ත තිරසර සංවර්ධිත අනාගතයක් ගොඩ නැංවීමේ වැඩ පිළිවෙළ සඳහා අප මුලපිරිය යුතුව ඇත. සියලු සිදුවීම් හා බාධා අතරමැද මහජන නියෝජිතයන් ලෙස ඔබ වෙත පැවරුණු වගකීම් ඉටු කරනු වස්, මෙම ගෞරවනීය සභාවට පැමිණි ඔබ සැම මා සිහිපත් කරනුයේ කෘතවේදී හදවතිනි.

විවිධත්වයෙන් යුක්ත මතවාද හා සාරගර්භ විවේචන ඉදිරිපත් වීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකම හරයයි. රටේ ආයතන මෙහෙයවන පාර්ශ්වය සේම විවේචන හරහා වැරැදි පෙන්වා දෙමින් රටේ උත්තරීතර මහජන ආයතනය නිසි මඟට යොමු කිරීමට සෙසු පාර්ශ්ව උත්සාහ ගැනීම ද සිදු විය යුතුම ය. මහජන වරමින් මෙහි පැමිණි ඔබ සැම ආණ්ඩු පාර්ශ්වය හා විරුද්ධ පාර්ශ්වය ලෙස මෙහිදී ඉටු කරනුයේ එකී වගකීමයි.

2026 මුදල් වර්ෂයට අදාළ අය වැය ලේඛනය දෙවැනිවර කියවීම සඳහා 2025.11.07 වැනි දින පස්වරුවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් කරමින්, දැඩි කාර්ය බහුලත්වය මධ්‍යයේ වුවද මෙම සභාවට පැමිණ එළදායී ලෙස අය වැය විවාදයට සම්බන්ධ වී ආදර්ශයක් සැපයූ ගරු ජනාධිපතිතුමාට ප්‍රථමයෙන් ම මාගේ කෘතඥතාව පළ කිරීමට

කැමැත්තෙමි. මෙම වැදගත් වගකීම් සහගත කාර්යය සාර්ථක කර ගැනීම උදෙසා දැඩි කැපවීමෙන්, උනන්දුවෙන් සහ සක්‍රිය ලෙස ක්‍රියා කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, පාර්ලිමේන්තුවේ ගරු සභානායකතුමා, ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා, ගරු අමාත්‍යවරුන්, විශේෂයෙන් කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුළු සියලුම නියෝජ්‍ය අමාත්‍යවරුන්, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සහ ගරු විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මෙම උත්තරීතර සභාව නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටත්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල ලේකම්වරුන් ඇතුළු එම කාර්යාලවල සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ටත් මාගේ හෘදයංගම කෘතඥතාව පළ කරමි.

මූලාසනයේ කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලව මෙහෙයවීමට මාහට නිරන්තරයෙන් සිය උපරිම සහාය ලබා දෙමින් ශක්තියක් වූ ගරු නියෝජ්‍ය කථානායකතුමාටත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියටත්, සභාපති නාමාවලියේ සියලු සාමාජික මන්ත්‍රීවරුන්ට සහ මූලාසනය දරමින් සහාය දැක්වූ සෙසු සියලුම මන්ත්‍රීවරුන්ටත් මාගේ කෘතඥතාව පළ කරමි.

අය වැය විවාදය පැවැති මුළු කාලය තුළදීම සභාවේ කටයුතු ක්‍රමානුකූලව හා කාර්යක්ෂම අන්දමින් පවත්වාගෙන යාම සඳහා එකී සමස්ත ක්‍රියාවලිය පිළිබඳව දැඩි සංයමයකින් හා අඛණ්ඩ කැපවීමකින් කටයුතු කළ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය, නියෝජ්‍ය මහ ලේකම්තුමා, සහකාර මහ ලේකම්තුමා සහ පාර්ලිමේන්තුවේ සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සමස්ත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම අනුබද්ධිත කාර්ය මණ්ඩලවල සාමාජික සාමාජිකාවන් විසින් මෙම මුළු කාලය මුළුල්ලේම සාමාන්‍ය දෛනික කාර්යාල කාල වේලාවන් ඉක්මවා සේවය කිරීමෙන් දක්වන ලද දැඩි කැපවීම වෙනුවෙන් සියලුම දෙනා වෙත මාගේ ප්‍රශංසාව හා ස්තුතිය පුද කරමි.

මෙම වැදගත් හා භාරදූර ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේදී නෛතික හා ව්‍යවස්ථානුකූල කටයුතු සම්බන්ධව ගරු නීතිපතිතුමා, නීති කෙටුම්පත් සම්පාදකතුමිය සහ එම දෙපාර්තමේන්තුවල සියලුම නිලධාරින් විසින් දක්වන ලද සහයෝගය මා බෙහෙවින් අගය කරමි.

මෙම කාර්යය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා නන් අයුරින් දායකත්වය ලබා දුන් ගරු ජනාධිපති ලේකම්තුමාට, ගරු අග්‍රාමාත්‍යතුමියගේ ලේකම්තුමාට, විශේෂයෙන්ම මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ අනෙකුත් අමාත්‍යාංශවල ලේකම්වරුන් ඇතුළු සියලු නිලධාරින්ටද, පාර්ලිමේන්තුවට අනුබද්ධිත සහ නන් අයුරින් සහාය දැක් වූ ත්‍රිවිධ හමුදාවේ, ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින් සහ රජයේ විවිධ ආයතනවල ප්‍රධානීන් ඇතුළු එම ආයතනවල සියලු නිලධාරින්ටද මාගේ ස්තුතිය පළ කර සිටිමි. එපමණක් නොව, අයවැය විවාදය තුළ සභාවේ වැඩ කටයුතු නිවැරදි සහ මධ්‍යස්ථ ආකාරයෙන් සමාජගත කළ සියලු මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය ආයතනවල ප්‍රධානීන් ඇතුළු සියලු මාධ්‍යවේදී සහෘදයන්ගේ සේවය මෙන්ම මෙම සභාවේ කටයුතු පිළිබඳව සජීවී රූපවාහිනී විකාශයේ සමගාමී සංඥා භාෂා විස්තර කවුළුව පවත්වා ගෙන යෑමට සම්පත් දායකත්වය සැපයූ සියලු සංඥා භාෂා පරිවර්තක මහත්ම මහත්මීන්ගේ සේවය ද ඉතා අගය කොට සලකමි.

මෙහිදී නම් සඳහන් කිරීමට නොහැකි වූ හා වෙන් වෙන් වශයෙන් ස්තුතිය ප්‍රකාශ කිරීමට නොහැකි වූ, එහෙත් ප්‍රශංසාව සහ ස්තුතිය හිමි විය යුතු යමෙකු වේ නම්, ඒ සැම පුද්ගලයෙකුටම මෙම වැදගත් කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමට ඒ සැම ලබා දුන් දායකත්වය සහ සහයෝගය සම්බන්ධයෙන් මාගේ අවංක ස්තුතිය පිරිනමමි.

ගරු මන්ත්‍රීවරුනි, විපතට පත් ජනතාවට සහන සැලසීම පමණක් නොව ඔවුන්ට සිය දෛනික ජීවිත අවශ්‍යතා සපුරා ගත හැකි පරිදි ජීවනෝපායන් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ, සිය ළබැඳියන්ගේ වියෝවීම් හේතුවෙන් බිඳ වැටුණු මානසිකත්වය ශක්තිමත් කරවීමේ සහ තිරසර අරමුණු සිහි තබා ගනිමින් ඉදිරි පරම්පරා ගණනාවක් වෙනුවෙන් අනාගතය ගොඩනැඟීමේ භාරදූර වගකීමත් අද දවසේ මහජන නියෝජිතයන් වන අප කරමත ඇති බව ඔබතුමන්ලාට සිහිපත් කර දීමට කැමැත්තෙමි. ඉදිරියේදී උදා වන්නේ රට ගොඩනඟා ගත යුතු කාලයයි. එය අප එක්ව කළ යුතු කාර්යයක්. එකමුතුකමින් සහ සමගියෙන් ලෝකයේ සෙසු රටවල සහාය ලබා ගනිමින් අපි මෙම තාවකාලික බාධක ජය ගනිමු.

අවසාන වශයෙන්, තවත් නොබෝ දිනකින් උදා වන නත්තල පිළිබඳ සුබ ආරංචිය සැම හදවතකටම සමීප වන අසිරිමත් නත්තලක් වේවායි ප්‍රාර්ථනා කරන අතරම, උදා වන 2026 වර්ෂය සැම සිත හා ගත සුවපත් වන සැම සිතට සියලු අභියෝග ජය ගත හැකි ධෛර්යය උපදින සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ඔබ සැමට ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, බැරෑරුම් අභියෝග හමුවේ නොසැලී, රටේ ආර්ථිකය හැසිරවීම අරමුණු කර ගනිමින් සහ සියලු ජනතාව රට සංවර්ධනය කිරීමට සහභාගි කර ගනිමින් ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා, ගරු අග්‍රාමාත්‍යතුමිය ප්‍රමුඛ වත්මන් ආණ්ඩුවේ දෙවන අය වැය වන 2026 අය වැය ලේඛනය ඉදිරිපත් කර ජනතාවාදී ආර්ථික සංකල්පයක් සමඟ රට ඉදිරියට ගෙන යාමට කටයුතු කිරීම පිළිබඳව මුදල් අමාත්‍යතුමා වශයෙන් කටයුතු කරන ගරු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තු ක්‍රියාවලියට දායක වෙමින් අය වැය විවාදය අවස්ථාවේදී තුන් වතාවක් පාර්ලිමේන්තුවට පැමිණ අය වැය විවාදයට සක්‍රියව සහභාගි වීම ගැනත් සභානායකවරයා ලෙස මගේ ස්තුතිය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

පුරා දින 21ක් නමුත්, දින 26කට සමාන කාල ප්‍රමාණයක් ඉතාම ක්‍රියාකාරි ලෙස අය වැය විවාදයට සහභාගි වෙමින් කටයුතු කළ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක නලින්ද ජයතිස්ස සහෝදරයාට ද මා ස්තුතිවන්ත වෙනවා. විවිධ අදහස් උදහස් දක්වමින් අය වැය විවාදයට සහභාගි වෙමින් නිරන්තරයෙන් සහයෝගය ලබා දුන් සියලු අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත් අතිශයින් ස්තුතිවන්ත වෙනවා. මෙම අය වැය විවාදය පවත්වා ගෙන යෑමට සහයෝගය ලබා දුන් ගරු විපක්ෂ නායකතුමාටත්, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියලු මන්ත්‍රීතුමියන් හා මන්ත්‍රීතුමන්ලාටත් විශේෂ ස්තුතියක් පිරිනැමීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා විශේෂ කාර්යභාරයක් ඉෂ්ට කළා. පක්ෂව සහ විපක්ෂව සිදු කරන ලද විවිධ තර්ක විතර්ක මැද මෙම සභාව නිසියාකාරව මෙහෙයවීම ඔබතුමා ඉතා සාර්ථක අන්දමින් සිදු කළා. ඒ වෙනුවෙන් මම ඔබතුමාට ස්තුතිය පළ කර සිටිනවා. ඒ වාගේම, ගරු නියෝජ්‍ය කථානායකතුමාටත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්,

[ගරු බිමල් රත්නායක මහතා]

සභාපති මණ්ඩලයේ ගරු මන්ත්‍රීවරයන්ටත් පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු වගකීමෙන් මෙහෙයවීම පිළිබඳව ස්තුතිය පළ කරනවා. එසේම පාර්ලිමේන්තුවේ ලේකම් මණ්ඩලය මෙන්ම පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අංශ ප්‍රධානීන් ඇතුළු සියලු තරාතිරම්වල සමස්ත කාර්ය මණ්ඩලයට ද මේ සඳහා දක්වන ලද සහයෝගයට ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, සභානායකවරයා වශයෙන් මගේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සහයෝගය ලබා දුන් සභානායක ලේකම්තුමා ඇතුළු සභානායක කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටද, ආණ්ඩුවේ කටයුතු සංවිධානය කරමින් සාර්ථක කර ගැනීමට කටයුතු කළ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටද, විපක්ෂ නායක ලේකම්තුමා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටද මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මේ ආපදා තත්ත්වය තුළත් පාර්ලිමේන්තුවේ කටයුතු සිදු කිරීමට, විශේෂයෙන්ම ප්‍රවාහන දුෂ්කරතා හා අනෙකුත් දහසක් දුෂ්කරතා මැද්දේ, සමහර විට තමන්ගේ සමීපතමයන් විවිධ දුෂ්කරතාවන්ට ලක් වී සිටියදීත් මේ පාර්ලිමේන්තුවේ ඉහළ මැද සහ පහළ යැයි සම්මත සියලු කාර්ය මණ්ඩල විශාල කැපවීමකින්, විශාල දුෂ්කරතා දරා ගනිමින් මුළු අය වැය විවාදයම කිසිදු අඩුවකින් තොරව පවත්වාගෙන යාමට අපට ලබා දුන් සහාය හෘදය සාක්ෂියේ පතුලින්ම අගය කරනවා.

ආණ්ඩුව වශයෙන් අපි පොදුවේ රාජ්‍ය සේවයටත්, ඒ වාගේම පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් ලබා දිය හැකි හැම සහනයක්ම ලබා දෙමිනුත්, දීමට උත්සාහ කරමිනුත් සිටිනවා. ඒ වාගේම මේ දුෂ්කරම අවස්ථාවේදී රටක් වශයෙන් ඉතාම වැදගත් ආයතනයකට නායකත්වය දෙන, මෙහෙයවන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය අතිශය ඉහළ මට්ටමින් අගය කිරීමටත් අපි මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, මෙම කර්තව්‍යය වෙනුවෙන් අය වැය විවාදයේ දායකත්වය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු නිලධාරීන්ටත්, නීතිපතිතුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත්, රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු එම කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන අතර, පාර්ලිමේන්තුවට සම්බන්ධ විවිධ ආයතන වන පොලිසිය, වෛද්‍ය මධ්‍යස්ථානය, බැංකුව, තැපැල් කාර්යාලය, විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව හා අනුබද්ධිත ආයතන සහ ඊට බාහිර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, පාර්ලිමේන්තු සංකීර්ණයේ ආරක්ෂක වැඩ කටයුතු සම්බන්ධයෙන් නිරන්තරයෙන් වෙහෙසෙන පොලිස් විශේෂ කාර්ය බලකාය, දියවන්නා නාවික හමුදාව, යුද්ධ හමුදා සහ ගුවන් හමුදා අනුබණ්ඩ, අවට කලාපවලට අයත් පොලිස් ස්ථාන නිලධාරීන් ඇතුළු ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ ආයතනවල සියලු දෙනාත් මම මේ අවස්ථාවේ කෘතවේදීව සිහිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ගංවතුර තත්ත්වය තුළ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලත් යට වීමට ආසන්න මට්ටමේ තිබියදී එය වැළැක්වීම සඳහා ඉතාම විද්‍යානුකූලව කටයුතු කරපු ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවත්, ඒ වාගේම ඒ කටයුත්ත සාර්ථක කරන්න දායක වෙච්ච හමුදාවත්, ඒ කටයුතු කළමනාකරණය කරපු අපේ Sergeant-at-Arms ඇතුළු එතුමාගේ කාර්ය මණ්ඩලයත් අපි අගය කරනවා. එසේ නොවන්නට සමහර විට අපේ පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලත් යම් ආකාරයකින් ගංවතුර තර්ජනයකට ලක් වීමට ඉඩ තිබුණා.

ගරු කථානායකතුමනි, මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික සමාජ මාධ්‍ය භාවිතයෙන් මෙම කාලය තුළ සභාවේ වැඩ කටයුතු සමාජගත කොට මාධ්‍ය සදාචාරයට අනුව එම කටයුතු මහ ජනතාව වෙත සමීප කිරීමට වෙහෙස මහන්සි වූ සියලු මුද්‍රිත, විද්‍යුත් හා සමාජ මාධ්‍ය ආයතන ප්‍රධානීන් ඇතුළු සියලු මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ගේ සේවය මෙන්ම සභාවේ කටයුතු පිළිබඳ සජීවී රූපවාහිනී විකාශයට සමගාමී සංඥා විස්තර කවුළුව පවත්වාගෙන යාමට දායකත්වය ලබා දුන් සියලු සංඥා භාෂා පරිවර්තක හා භාෂා පරිවර්තක මහත්ම මහත්මීන්ගේ සේවය වෙනුවෙන් ද මගේ ස්තුතිය පිරිනමන්න කැමැතියි. ගරු කථානායකතුමනි, ඒ පරිවර්තන කාර්යය නොවන්නට අපට මේ සභාව ගෙන යන්න බැහැ. මම එක කරුණක් නැවත අවධාරණය කරන්න කැමැතියි. මම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියටත් මෙය දැනුම් දුන්නා. සියලු පරිවර්තකයන් වැදගත්. නමුත්, ඒ අතරේ මා දන්නා තරමින් පාර්ලිමේන්තුවේ දෙමළ භාෂා පරිවර්තකයන් ඉතාම හිඟයි. ඔවුන් ඉතාම විශාල කැපවීමකින් ඒ කටයුත්ත සිදු කරනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාට තිබෙන බලතල සහ රජය සමඟ සාකච්ඡා කරලා අත්‍යවශ්‍ය වන දෙමළ සහ ඒ අදාළ වන පරිවර්තකයන් ලබා ගන්න කියලා. ඔවුන් අතිදුෂ්කර තත්ත්වයක් යටතේ ඒ සියලු කටයුතු සිදු කරනවා. මම ගිය වතාවේත් මේ කාරණය සඳහන් කළා. මම සියලු පරිවර්තකයන්ට ගරුත්වය එක් කරමිනුයි ඒ කාරණය විශේෂයෙන් සඳහන් කළේ.

ගරු කථානායකතුමනි, මම මෙය අවස්ථාවක් කර ගන්නවා, දින කිහිපයකට පෙර අප සියලුදෙනා මුහුණ දුන් ව්‍යසනයෙන් අප රටට වූ හානිය නිසා අපේ රාජ්‍ය ක්‍රියාකාරිත්වයට වුණු හානිය යථා තත්ත්වයට පත් කිරීමට කැප වුණු සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරන්නත්. විශේෂයෙන් මේ අසීරු කාලයේ ජනතාවගේ ආරක්ෂාව සඳහා ඉදිරියෙන්ම සිටිමින් කටයුතු කරන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාට, ත්‍රිවිධ හමුදාපතිවරුන්ට, පොලිසියට, විශේෂ කාර්ය බලකාය ඇතුළු සියලුම සහන සේවා කණ්ඩායම්වලට පාර්ලිමේන්තුව ලෙස අපි ස්තුති කරනවා. ඒ වාගේම ආපදා කළමනාකරණ සේවාවට දායක වන ආණ්ඩුකාරවරුන්, දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරිවරුන් ඇතුළු සියලුදෙනාට ද අපි ස්තුති කරනවා.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාත්, ඔබතුමාත් අප හැම කෙනාම අගය කළ පරිදි අපේ රාජ්‍ය සේවයේදී දිවා රෑ නොබලා අඛණ්ඩ ලෙස ජනතාවට සේවය සපයන රාජ්‍ය සේවකයන්ටත්, අනෙකුත් සියලු දෙනාටත්, ඒ සියලුම සේවාවන් සපයන හැම කෙනාටමත්, පෞද්ගලික අංශයේ සියලු දෙනාටත් අපේ හෘදයංගම ස්තුතිය පළ කරනවා. මොකද, telecommunication connections හදද්දී පෞද්ගලික අංශය සුවිශාල දායකත්වයක් ලබා දුන්නා. ඒ පිළිබඳව මැදිහත් වුණු නිසා මම පෞද්ගලිකවත් ඒ ගැන දන්නවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම මේ වෙලාවේ ස්තුති කරන්නට ඕනෑ අවතැන් වූ ජනතාව වෙනුවෙන් ස්වේච්ඡාවෙන් තමන්ගේ කාලය, මහන්සිය සහ ධනය යොදවන, තරාතිරමක් හැඳුනුම්කමක් නොබලා එකා මෙන් රටේ හැම කොනකින්ම තමන්ට පුළුවන් විධියට උදවු කරන අපේ රටේ ජනතාවට. අප මේ මුහුණ දුන්නේ අපේ ඉතිහාසයේ දැවැන්තම ස්වාභාවික ව්‍යසනයකට. මේකෙන් අපට වුණු හානිය ඉතා විශාල වුවත්, ජන ජීවිතය නැවත ඉක්මනින් යථා තත්ත්වයට පත් කරන්න සහ රට වඩා හොඳ තැනකට ගොඩ නඟන්න ශක්තිය සහ ධෛර්යය ලැබිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, මගේ අත්දැකීම් එකතු කරන්න. සමහරුන්ට මේක තේරෙන්නේ නැහැ.

කවුරු හරි ගිහිල්ලා ස්වේච්ඡාවෙන් ගෙදරක්, පාරක් ශුද්ධ කරන එක, ඉස්කෝලයක්, hospital එකක් ශුද්ධ කරන එක පේන්නේ cleaning service එකක් වාගේ; clean කරනවා වාගේ. සුනාමි වෙලාවේ අපි සයින්දමරුදූවලට ගිහින් ශුද්ධ කරනකොට, - සයින්දමරුදූ ග්‍රාම නිලධාරි වසමේ 1,600ක් මැරුණා- ගෙවල්වල මිනිස්සු බලාගෙන හිටියා. ඒගොල්ලන් සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා හිටියේ. මට තවම මතකයි, එක doctor කෙනෙක් ඇවිල්ලා මගෙන් ඇහුවා, "ඔබතුමා දන්නවාද, ඔබතුමා මොකක්ද ඔය කරන්නේ කියලා?" යනුවෙන්. අපි කිව්වා අපි ගෙවල් ශුද්ධ කරනවා කියලා. එයා ඇහුවා ඇයි ගෙවල් ශුද්ධ කරන්නේ කියලා. මට ඒ ගැන ලොකු තේරුමක් තිබුණේ නැහැ. මම කිව්වා අපි ගෙවල් ශුද්ධ කරන්නේ උදව් කරන්න කියලා. එයා කිව්වා ඔබතුමන්ලා කරන්නේ ගෙවල් ශුද්ධ කරන එක නොවෙයි, අපට ජීවත් වෙන්න බලාපොරොත්තුවක් දෙන එක කියලා. ගරු කථානායකතුමනි, ගෙවල් ශුද්ධ කරන්නේ නැවත ජීවත් වෙන්න. ලංකාවේ කොහේ හරි කෙළවරකින් වෙනත් තැනකට ගිහින් මිනිස්සු උදවු කරනවා කියන්නේ නැවත ජීවත් වෙන්න කරන උදව්වක්, ජීවත් වෙන්න බලාපොරොත්තු හැදීමක්. ඒක කුණු අස් කිරීමද, පාලම් හැදීමද, සෞඛ්‍ය සේවා සැපයීමද ඒ ඕනෑ දෙයක් වෙන්න පුළුවන්. සියල්ල නැති වුණු මිනිස්සුන්ට බලාපොරොත්තුව තමයි මේ අරගෙන යන්නේ. ඒ නිසා ඒක නිකම්ම නිකම් පිරිසිදු කිරීමක් නොවෙයි. සයින්දමරුදූවල ඒ වෛද්‍යවරයා මට දැනුත් සිහිපත් වෙනවා.

ගරු කථානායකතුමනි, මේ විශාල ව්‍යසන අවස්ථාවේ අපේ රටේ පවතින මේ තත්ත්වය හමුවේ විදෙස් තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, විදෙස් රටවල පවතින ශ්‍රී ලාංකික තානාපති කාර්යාල, ශ්‍රී ලංකාවට සහාය දිය හැකි සෑම ආකාරයෙන්ම සම්බන්ධ වෙලා සොයා බලා කටයුතු කළා. අපට මිත්‍රශීලී රටවල් මේ වන විට මේ තත්ත්වයෙන් ගොඩ නැඟීමට උපකාර කරමින් සිටිනවා. ඒ සියලුදෙනාටමත් පාර්ලිමේන්තුව වෙනුවෙන් අපේ හෘදයාංගම ස්තුතිය හා ගෞරවය ප්‍රකාශ කරනවා.

නව අපේක්ෂා සහිතව, ජව සම්පන්නව මෙම අභියෝග ජය ගැනීම සඳහා අප රටේ සියලු පුරවැසියන් එකතු වී ක්‍රියා කරමු කියන ඉල්ලීම කරමින්, 2026 වසරේදී මීට වඩා හොඳ ලංකාවක් ගොඩ නැඟීමට අපේ රටේ සියලු ජනතාවට අවශ්‍ය ශක්තිය, ධෛර්යය ප්‍රාර්ථනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යවරයා ලෙස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනය පිළිබඳව රට තුළ උද්ගත වූ විවිධ අභියෝග සහ බාධක මධ්‍යයේ පුරා දින 21ක් මුළුල්ලේ පැවති විවාදයේදී පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස ඔබතුමා දැක්වූ විශේෂ සහයෝගයට විපක්ෂය වෙනුවෙන් පළමුකොට අපේ ස්තුතිය ඔබතුමාට පුද කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය, මූලාසන මණ්ඩලයේ කටයුතු කළ සියලු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලාටත් මේ මොහොතේ විශේෂ ස්තුතියක් පිරිනමන්නට කැමැතියි.

තම රජයේ දෙවැනි අය වැය ඉදිරිපත් කළ ගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමියටත්, ගරු සභානායකතුමා, සභානායක ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, ආණ්ඩු පක්ෂයේ සංවිධායක කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, සියලු අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියලාට අපේ ස්තුතිය පුද කරනවා.

ඒ වාගේම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය, නියෝජ්‍ය මහ ලේකම්තුමන්, සහකාර මහ ලේකම්තුමන් ඇතුළු සමස්ත පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයටත් විවිධ අභියෝග මධ්‍යයේ දින ගණනාවක් මුළුල්ලේ අය වැය විවාදයේදී ලබා දුන් සියලු සහයෝගයට විපක්ෂයේ අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරන්නට අපි මේ අවස්ථාව යොදා ගන්නවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම චේත්‍රධාරීතුමන්, නියෝජ්‍ය සහ සහකාර චේත්‍රධාරීතුමන්ලාටත්, පාර්ලිමේන්තුවට ආරක්ෂාව සපයන පාර්ලිමේන්තු පොලීසිය, යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය ඇතුළු පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සම්බන්ධව කටයුතු කළ සියලු පාර්ශ්වයන්ටත් අපේ ස්තුතිය පුද කරනවා.

අය වැය විවාද කාලසීමාව තුළ යුහුසුලුව කටයුතු කළ සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ, කැප වී කටයුතු කරපු රාජ්‍ය නිලධාරින්ටත්, විශේෂයෙන් කාරක සභා අවස්ථාවේ වැඩසටහන කඩිනමින් මුද්‍රණය කර දුන් රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු රජයේ මුද්‍රණාලයටත් අපේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ඊට අමතරව, පාර්ලිමේන්තු භෝජනාගාරයේ කාර්ය මණ්ඩලයටත්, මන්ත්‍රීවරුන්ගේ අමුත්තන්ගේ භෝජනාගාරයේ නිලධාරින්ටත්, නිලධාරින්ගේ භෝජනාගාරයේ කාර්ය මණ්ඩලයටත් අපේ විශේෂ ස්තුතිය පුද කළ යුතුවම තිබෙනවා. පුරා දින ගණනාවක් එක දිගට කරන ලද සේවාව වෙනුවෙන් පාර්ලිමේන්තු පුස්තකාලයට, පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශයේ සියලුදෙනාට, හැන්සාඩ් දෙපාර්තමේන්තුවට, සභාලේඛන කාර්යාංශය ඇතුළු පාර්ලිමේන්තුවේ සියලු දෙපාර්තමේන්තුවල නිලධාරින්ට, වෛද්‍ය මධ්‍යස්ථානය, ආයුර්වේද මධ්‍යස්ථානය, තැපැල් කාර්යාලය, බැංකු ශාඛාව, විදුලිය හා ජල සම්පාදන කටයුතු වෙනුවෙන් වගකීම් දරන පිරිස, ඒ වාගේම, ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවටත්, පාර්ලිමේන්තුව පවිත්‍ර කරපු කෝට්ටේ මහ නගර සභාවේ සේවකයන්ටත්, භාෂා පරිවර්තකයන් ඇතුළු හැමදෙනාගෙන්ම ලැබුණු විශිෂ්ට මෙහෙවරට අපේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු කථානායකතුමනි, අය වැය විවාදය දින ගණනාවක් එක දිගට උදෑසන සිට රාත්‍රී කාලය දක්වා පැවති මොහොතේ කාර්ය මණ්ඩලයේ නිලධාරින් නියමිත වේලාවට රාජකාරියට රැගෙන එමින්, සුරක්ෂිතව නැවත නිවෙස් කරා රැගෙන යැමට කැප වූ, පාර්ලිමේන්තුවේ රියදුරු මහතුන් ඇතුළු පාර්ලිමේන්තුවේ ප්‍රවාහන කාර්යාංශයේ කාර්ය මණ්ඩලයටත් අපේ ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මේ සභා ගර්භයේ පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන්ට විශාල සහයෝගයක් ලබා දෙමින්, සභාවේ කටයුතු පහසු කර ගැනීම සඳහා කැප වී සේවය කළ, මේ සභා ගර්භයේ රාජකාරි කරන සියලු සේවක මහත්වරුන්ට මේ මොහොතේ මගේ විශේෂ ස්තුතිය පුද කරනවා. ඇත්ත වශයෙන්ම අපේ පණිවුඩ හුවමාරු කරමින්, ලිපිලේඛන බෙදා හරිමින්, ඒ පිරිස කළ සේවය මේ මොහොතේදී අගය කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මේ සභා ගර්භයේදී ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා, ජනතාව වෙනුවෙන් මතු කරපු අදහස්-උදහස්, යෝජනා-චෝදනා, විටින් විට හට ගත් උණුසුම් තර්ක-විතර්ක, වාද-විවාද ආදී සියලු තොරතුරු, කෙටි පණිවුඩයේ සිට ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය දක්වාත්, දිනපතා සෑම පුවත් පතකම සුවිශේෂී ඉඩක් වෙන් කරමින් පාර්ලිමේන්තුවේ කටයුතුවලට ප්‍රචාරයක් ලබා දුන් පාර්ලිමේන්තු කටයුතු ආවරණය කළ සියලු මාධ්‍යවේදීන්ටත්, සියලු මාධ්‍ය ආයතනවලටත්, සමාජ මාධ්‍ය වේදිකා සියල්ලටත්, ඒවා හසුරුවන මාධ්‍යවේදීන්ටත් විපක්ෂය වෙනුවෙන් අපගේ ළෙන්ගතු ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මේ ස්තුතිය අද මා ඉදිරිපත් කරන්නේ, අය වැය විවාදය අවසානයේ සාම්ප්‍රදායිකව විපක්ෂය වෙනුවෙන් නිසා, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂ නායක කාර්යාලය පිළිබඳව අවසානයට සිහිපත් කරන්නට මම කල්පනා කළා. විපක්ෂය වෙනුවෙන් අය වැය විවාදය පුරාවට විශිෂ්ට නායකත්වයක් ලබා දෙමින්, රට වටා ජනතාව හමුවට ගොස්, පෞද්ගලිකවම ජනතාවගේ ගැටලු හඳුනා ගෙන, අය වැය විවාදය පුරාවට ඒවා ආණ්ඩුවේ අවධානයට ලක් කරමින්, සක්‍රියව, කැප වී කටයුතු කරපු ගරු විපක්ෂ නායකතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න කැමැතියි.

අය වැය විවාදය පුරා විපක්ෂය වෙනුවෙන් ලැබුණු කාලය පිළිබඳව මනා අවබෝධයකින්, ඉතා සුහදව කටයුතු කරමින්, කථික ලැයිස්තු සැකසීමේදී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස මාහට ලබා දුන් කුලුපග සහයෝගයට විපක්ෂයේ සෙසු පක්ෂ නායකතුමන්ලා ඇතුළු විපක්ෂයේ සියලු සහෝදර මන්ත්‍රීතුමන්ලාටත්, මන්ත්‍රීතුමියලාටත් මගේ හෘදයාංගම ස්තුතිය මේ මොහොතේදී ඉතා කෘතවේදීව පළ කරන්නට කැමැතියි.

ඒ වාගේම, අය වැය විවාදය සාර්ථක කර ගැනීම සඳහා දිවා රාත්‍රී වෙහෙස නොබලා සුවිශේෂී සහයෝගයක් ලබා දුන් විපක්ෂ නායක ලේකම් සුරංග රණසිංහ මහතා ඇතුළු විපක්ෂ නායක කාර්යාලයේ සියලු තරාතිරම්වල නිලධාරි මහත්ම මහත්මීන් ඉටු කළ විශිෂ්ට මෙහෙවර මේ මොහොතේදී විශේෂයෙන් අගය කරන්න කැමැතියි. ඔවුන් කළ එම කැපවීම වෙනුවෙන් ගරු විපක්ෂ නායකතුමා හා විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සහ පෞද්ගලිකව මාගේත් විශේෂ ස්තුතිය ඔවුන් වෙත පුද කරනවා.

අය වැය විවාද කාලසීමාවේදී අවශ්‍ය තොරතුරු සහ දත්ත ලබා දෙමින් සහාය ලබා දුන් විද්වතුන්, වෘත්තීයවේදීන්, වෘත්තිය සමිති සමාජිකයන් සහ සම්පත්දායකයන් වෙතද අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, මෙවර අය වැය ඉතිහාසයට එක් වන්නේ අපේ රටේ ජනතාව මුහුණ දුන් දුෂ්කරතම මොහොතක පැවැති අය වැය විවාදයක් ලෙසයි. මේ ශෝකජනක වටපිටාව තුළ තවත් දින කිහිපයකින් උදාවන නත්තල අර්ථවත් නත්තලක් ලෙස ගත කරන්නට මේ සභාවේ සිටින කිතුනු බැතිමතුන්ටත්, රට පුරා සිටින සියලු කිතුනු බැතිමතුන්ටත් හැකි වේවායි කියා මා මේ මොහොතේදී ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ මොහොත, නැවත නැවතත් හිතන්න කියන පණිවුඩය සොබාදහම අපට ලබා දීපු අවස්ථාවක් බව. අපේම ආදරණීයයන් විශාල පිරිසක් මහා ජල කඳකට යට වුණු, තවත් පිරිසක් තවමත් පස් යට මිහිදන් වුණු, ජීවිත කාලය පුරාවටම තමන් උපයා සපයාගත් දේ විනාශ වී ඇඳිවත පමණක් ඉතිරිව සිටින පිරිසක් ඉන්න රටක් බවට මේ රට දැන් පත් වෙලා තිබෙනවා. උදාවන 2026 වසර කරදර, විපත්වලින් තොරව ගත කළ හැකි වසරක් බවට පත් වේවායි ප්‍රාර්ථනා කරන ගමන්, අය වැය විවාදය අවසානයේ විපක්ෂය වෙනුවෙන් සාම්ප්‍රදායිකව පවත්වන ස්තුති කථාව පවත්වන්නට මට අවස්ථාව ලබා දීම ගැන ගරු කථානායකතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.00 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 8.15ට, අද දින සභා සම්මතිය අනුව, 2026 ජනවාරි 06වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 6.00 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 8.15க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2026 சனவரி 06, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.00 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 8.15 p.m. until 9.30 a.m. on Tuesday, 06th January, 2026, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.